# CPA@25:
# ප්‍රතිසංස්කරණය හා සංහිඳියාගතවීම

CPA
Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයක්

# CPA@25:

# ප්‍රතිසංස්කරණය හා සංහිඳියාගතවීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

CPA at 25

**CPA@25: ප්‍රතිසංස්කරණය හා සංහිඳියාගතවීම**

ප්‍රථම මුද්‍රණය : **නොවැම්බර් 2021**

ISBN : 978-624-5914-11-1

සංස්කරණය : **ලයනල් ගුරුගේ**

පරිගණක සැකැස්ම : **වාක්‍යා රූ**

ප්‍රකාශනය **: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

---

මෙම ප්‍රකාශනයේ පළ වන්නේ විද්වතුන්, මාධ්‍ය වෘත්තිකයන් මෙන්ම සමාජ ක්‍රියාකාරීන් ඇතුළු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා එක්ව සිටි හිටපු මෙන්ම වත්මන් කාර්ය මණ්ඩලය ප්‍රමුඛ විවිධ ලේඛක ලේඛිකාවන් විසින් පළකළ ස්වීය අදහස් හා මතවාද රැගත් ලිපි පෙළකි. එහිලා අදාළ ලිපි මඟින් ප්‍රකාශ වන්නේ ඒ ඒ ලේඛකයන් සතු පෞද්ගලික අදහස් වන අතර එමඟින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නිල මතය පිළිඹිබු නොකෙරේ.

---

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්ති පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්ති විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

ලිපිනය : 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05.

දුරකථන : +94112081384,+94112081385,+94112081386

ෆැක්ස් : +94112081

වෙබ් අඩවිය : www.cpalanka.org

ඊමේල් : info@cpalanka.org

ෆේස්බුක් : www.facebook.com/cpasl

ටිවිටර් : @cpasl

# පටුන


| | | | | | |
|---|---|---|---|---|---|
| | සංස්කාරක සටහන | ............ | ............ | ............ | 7 |
| | පෙරවදන - විසිපස් වසරක්!<br>**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු** | ............ | ............ | ............ | 9 |
| | ස්තුතිය | ............ | ............ | ............ | 13 |
| 1. | වසර 25 යි : ආපසු ආරම්භයට<br>**රොහාන් එදිරිසිංහ** | ............ | ............ | ............ | 15 |
| 2 | අභියෝගාත්මක ගමනක ඇරඹුම<br>**මහාචාර්ය ජයදේව උයන්ගොඩ** | ............ | ............ | ............ | 19 |
| 3. | විසිපස් වසරක ප්‍රගාමී මැදිහත්වීම්<br>**තිස්ස ජයතිලක** | ............ | ............ | ............ | 22 |
| 4. | කලා ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වය<br>**මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර** | ............ | ............ | ............ | 25 |
| 5. | අහඹුවක් නොවූ විශිෂ්ටත්වය<br>**සාගරිකා දෙල්ගොඩ** | ............ | ............ | ............ | 28 |
| 6. | විසිපස් වසරක මතක විනිවිද<br>**ලයනල් ගුරුගේ** | ............ | ............ | ............ | 30 |
| 7. | ලංකාවේ පාලනයට දායක වීම<br>**උදයතිලක ඉදිරිමාන්න** | ............ | ............ | ............ | 36 |
| 8. | ස්වර්ණමය මතක සටහන්<br>**අල්තාෆ් හුසේන්** | ............ | ............ | ............ | 38 |
| 9. | ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා දායකත්වය<br>**දේවානන්ද් රාමයියා** | | ............ | ............ | 40 |
| 10. | 'සෝෂල් ඉන්ඩිකේටර්' (*Social Indicator*):<br>සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ගැන අත්හදා බැලීමක්<br>**ආචාර්ය ප්‍රදීප් පීරිස්** | | ............ | ............ | 42 |

11. පළාත් පාලන ක්ෂේත්‍රයට කළ මැදිහත් වීම ............ ............ ............ 45
ශ්‍රියානි රුවනාරා විජේසුන්දර

12. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවාදය ............ ............ 47
ආචාර්ය අසංග වැලිකල

13. 15 වසරක සමාජමාධ්‍ය භූමිකාව ............ ............ ............ 51
සංජන හත්තොටුව

14. ධෛර්යය, නායකත්වය සහ තවත් බොහෝ දේ ............ ............ 54
භවානි ෆොන්සේකා

15. අයිතිවාසිකම් හා ගරුත්වය සමග සාමය දිනාගැනීමේ අරගලය ............ ............ 53
මිරාක් රහීම්

16. විකල්ප මිනිසුන්ගේ වැඩබිම ............ ............ ............ 61
චන්ද්‍රිකා ගාඩියවසම්

17. හඬක් නැතියවුන් වෙනුවෙන් නැගී සිටීම ............ ............ ............ 64
ඉරෝමි පෙරේරා

18. පුංචි මිනිසාගේ පුංචි කතිරය උදෙසා ............ ............ ............ 66
මංජුල ගජනායක

19. සැසඳිය නොහැකි මාධ්‍ය භූමිකාව ............ ............ ............ 71
දේවසේෂන් නේසයියා

20. ඔබ කිසි විටෙකත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හැර නොයයි ............ ............ 73
ආචාර්ය කුමාරවඩිවෙල් ගුරුපරන්

21. විකල්පයක් සොයා ගිය ගමන ............ ............ ............ 75
සම්පත් සමරකෝන්

22. “මාටුම්”: හඬක් නැතියවුන්ගේ වේදිකාව ............ ............ ............ 82
සෙල්වරාජා රාජසේකර්

23. ප්‍රජාතන්ත්‍රවාදය සහ ඒකාධිපතිවාදය අතර ආරක්ෂක පවුර ............ ............ 86
රධිකා කුමාරස්වාමි

24. “විභාෂා” පරිවර්තන වැඩසටහන ............ ............ ............ 88
එස්. සිවගුරුනාදන්

25. විසිපස් වසරක මෙහෙවර ලක්වැසි ජනතාව උදෙසාය ............ ............ 91
එස්. ජී. පුංචිහේවා

26. CPA ගැන මගේ මතකය ............ ............ ............ 95
විමල් ප්‍රනාන්දු

| | | | | | |
|---|---|---|---|---|---|
| | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විවිධ අවස්ථා කැමරා ඇසින් | | ............ | ............ | 99 |
| 27. | විකල්පයක් සොයා යන දිගු ගමනක ආරම්භයක්<br>**මහින්ද හත්තක** | | ............ | ............ | 131 |
| 28. | නීතිමය පා සටහනක්<br>**නීතිඥ විරාන් කොරෙයා** | ............ | ............ | ............ | 134 |
| 29. | අධිකාරී බලයේ වියගහ සහ පැරණි මානසික පරමාධිකාරය බිඳ දැමීම<br>**මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න** | | | ............ | 136 |
| 30. | මහජන යහපත උදෙසා නඩු කීමේ භූමිකාව: විවේචනාත්මක විමසුමක්<br>**වික්ටර් අයිවන්** | | | ............ | 138 |
| 31. | අලුත් ලංකාවේ විකල්ප ප්‍රතිපත්ති<br>**නීතිඥ කේ.ඩබ්ලිව්. ජනරංජන** | ............ | ............ | ............ | 144 |
| 32. | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ සිවිල් සමාජ භූමිකාව<br>**මහාචාර්ය නවරත්න බණ්ඩාර** | | ............ | ............ | 148 |
| 33. | අයිතීන් වෙනුවෙන් නැගී සිටීමට අපේ මනස් සකස් කළ ආයතනයක්<br>**නිමල්කා ප්‍රනාන්දු** | | | ............ | 157 |
| 34. | ආදර්ශමත් සමාජ භූමිකාව<br>**චන්ද්‍රා ජයරත්න** | ............ | ............ | ............ | 159 |
| 35. | මහජන ව්‍යාපාරයක මෙහෙවර ඉටු කළා<br>**කුමුදුනී සැමුවෙල්** | ............ | ............ | ............ | 162 |
| 36. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය ජනගත කිරීම<br>**ආචාර්ය ජයම්පතී වික්‍රමරත්න** | ............ | ............ | ............ | 164 |
| 37. | සිවිල් සමාජයේ භූමිකාව: ගැටලු සහ අභියෝග<br>**මහාචාර්ය උපුල් අබේරත්න** | | ............ | ............ | 166 |
| 38. | රිදී ජුබිලියට උපහාර!<br>**ආචාර්ය විනයා ආරියරත්න** | ............ | ............ | ............ | 170 |
| 39. | සිවිල් සමාජ අවකාශයෙහි නායකත්වය<br>**දිනේෂා ද සිල්වා වික්‍රමනායක** | ............ | ............ | ............ | 172 |
| 40. | ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් වෙනුවෙන් නොසැලී අරගල කළ වසර විසිපහක්<br>**නීතිඥ සුදර්ශන ගුණවර්ධන** | | | ............ | 175 |
| 41. | 'සාම විමර්ශී' මගින් CPA හමුවීම<br>**බ්‍රිටෝ ප්‍රනාන්දු** | ............ | ............ | ............ | 179 |

42. විකල්පයක් සඳහා වූ විකල්පය! ............ ............ ............ 180
**ඌව ශක්ති පදනම**

43. විකල්ප ප්‍රතිපත්ති වෙනුවෙන් දිරිමත්ව පෙනී සිටීම ............ ............ 183
**ෂ්රීන් අබ්දුල් සරූර්**

44. LGBTIQ ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටීම ............ ............ ............ 185
Equal Ground

45. ‘දැක්මේ ප්‍රකාශනය’ ඉක්මවූ බුද්ධි මණ්ඩපය ............ ............ 188
**ඔස්ටින් ප්‍රනාන්දු**

46. ප්‍රතිලිබරල්වාදී පදනමකට යෑම හැර විකල්පයක් නැත! ............ ............ 190
**මහාචාර්ය චරිත හේරත්**

47. විසිපස් වසරක ශේෂ පත්‍රය සහ අනාගත අභියෝග ........... ............ 194
**ශිරාල් ලක්තිලක**

48. ප්‍රජාතන්ත්‍රවාදය හා මානව නිදහස උදෙසා.... ............ ............ 199
**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග**

49. එක්ව හෝ එරෙහිව ක්‍රියා කිරීමේ ශක්තිය ............ ............ ............ 201
**රනිල් වික්‍රමසිංහ**

50. ඉටු කළ මෙහෙවර විශිෂ්ටයි ............ ............ ............ 203
**එම්. ඒ. සුමන්තිරන්**

51. සියලු දෙනාට යුක්තිය සඳහා අඛණ්ඩ ලුහුබැඳීම ............ ............ 205
**රාවුෆ් හකීම්**

52. එකඟ වෙමින් සහ නොවෙමින් ආ ගමනක් ............ ............ ............ 207
**එරාන් වික්‍රමරත්න**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවරන ලද නඩු / මූලික අයිතිවාසිකම් පෙත්සම් ............ 209

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශන අතුරෙන්...... ............ ............ 212

# සංස්කාරක සටහන

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට විසිපස් වසරක් සම්පූර්ණ වීම නිමිති කොටගෙන, එහි ආරම්භක සාමාජිකයින්, විවිධ වකවානුවල දී එහි සේවයේ නිරතවුණු අය, තවමත් එහි සේවයේ නිරත අය මෙන්ම, එහි කටයුතුවලට විවිධාකාරයෙන් දායක වූ අය ද, බැහැර සිට ඒ දෙස බලන විද්වතුන් ද පළ කරන අදහස් මෙම කෘතිය තුළ සංගෘහිත ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිළිබඳව විවිධ දෘෂ්ටිකෝණවලින් විවරණය කෙරෙන ඒ ලිපි සමුච්චය නේක වර්ණ සිතුවමක් මෙනි. එහි අපූර්වත්වය වන්නේ ද එම විවිධත්වය යි.

ආචාර්ය සරවනමුත්තු ඇතුළු කිහිපදෙනෙකුගේ විකල්ප කතිකාවතක ප්‍රතිඵලයක් ලෙස ඇරඹුණු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දසක දෙකහමාරක් ගෙවා ආ අභියෝගාත්මක ගමන් මගෙහි විවිධ සංධිස්ථාන මෙහි නිරූපිත ය. මේ වකවානුව තුළ එහි අපේක්ෂිත අරමුණු සියයට සියයක්ම ඉටු කර ගෙන ඇතැයි නොකිවහැකි වුවද, සමාජය වඩා යහපත් තැනක් කිරීමේ අභිලාෂයෙන් යුත්, අලුත් ඇසකින් ලෝකය දෙස බලන පරපුරකට උත්තේජක වන හා ආදර්ශ ලෙස ගත හැකි මැදිහත්වීම් රැසක් ඒ තුළ හඳුනාගත හැකි ය.

ආයතන බිහි වීමත්, විවිධ පිරිස් ඒ හා සම්බන්ධ වීම හා විවිධ අරමුණු කරා විසිර යෑමත් පොදු ධර්මතාවකි. එහෙත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තරම්, එයට සම්බන්ධවූවන් අතර ආත්මීය බැඳීමක් ඇති කළ වෙනත් ආයතනයක් වේ දැයි සැක සහිත ය. සමස්ත ක්‍රියාකාරිත්වයෙහි ඇති මානුෂීය ප්‍රවේශය හා එකිනෙකා අතර මානුෂීය බැඳීම, ආයතනයෙහි දැක්ම හා මෙහෙවර ප්‍රකාශයට ද ඉහළින් බලපවත්වන අලිඛිත සම්මුතියක් මෙනි. ඕනෑම

ආයතනයක ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විවේචන තිබෙන මුත් විවේචකයින්ගේ පවා ඇගයුමට පාත්‍ර වන ආයතන දුලබ ය. මේ ලිපි සමුච්චයෙන් පිළිබිඹු කෙරෙන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එවැන්නකි.

දේශප්‍රේමය නමින් පෙනී සිටින පසුගාමීත්වය, අන්තවාදය හා නරුම ගෝත්‍රවාදය අභිභවා මානව වර්ගයා විසින් අත්පත් කරගත් විශ්ව ව්‍යාපී වටිනාකම් සමඟ සිටගන්නා විකල්ප දේශප්‍රේමී ක්‍රියාකාරීත්වයක් පිළිබඳ ආදර්ශයක් මෙම ලිපි තුළින් හඳුනාගත හැකි ය.

ඉතිහාසයේ වැදගත් කාලපරිච්ඡේදයකට අදාළව සිය මතක ආවර්ජනය කරමින්, කෙටි කාලයක් තුළ මෙම ලිපි සම්පාදනයට දායක වූ සියලුම ලේඛකයින්ට මම හිස නමා ආචාර කරමි. එමෙන්ම ලේඛකයන්ගේ මුල් අදහසට හැකි තාක් සාධාරණය ඉටු කරමින් ඒවා සිංහලට, දෙමළට හා ඉංග්‍රීසියට පරිවර්තනය කළ සියලුම පරිවර්තකයින්ටත්, කෘතිය පිළිබඳ සිහිනය යථාර්ථයක් බවට පත් කිරීමට නන් අයුරින් සහාය දුන් සියලුම දෙනාටත් මගේ ගෞරවය හා ස්තූතිය පළ කරමි.

**ලයනල් ගුරුගේ**

# පෙරවදන

## විසිපස් වසරක්!

ආචාර්ය
**පාක්‍යසෝති සරවනමුත්තු**

මහජන ළැදියා නීති කටයුතු, මැතිවරණ ප්‍රචණ්ඩත්වය සහ අක්‍රමිකතා, යුද්ධයේ විනාශකාරී ක්‍රියා, ව්‍යවස්ථා කුමන්ත්‍රණයක්, විධායක බලයේ වෙනත් ඉක්මවීම් අතර මරණ තර්ජන සහ ප්‍රසිද්ධ නින්දාකිරීම් ආදී මතකයන් ද ප්‍රතිපත්ති ස්ථාවර ලෙස තබාගනිමින් කෙටි සහ ආකර්ශණීය සිදුවීම් ගැන මතකයන් ද සමග එය; ඉවසිලිවන්ත, ස්ථාවර බව සහ නිතර කලකිරීම් ද ඇති වූ දීර්ඝ ගමනක් වී ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවන ලද්දේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී සිවිල් සමාජයට ඉටු කිරීමට වැදගත් කාර්යභාරයක් ඇති බව පිළිගැනීම නිසා ය. මෙහි දී, සිවිල් සමාජය ක්‍රියාත්මක වන්නේ රාජ්‍ය බලය ලබා ගැනීමට නොව, ඒ වෙනුවට අයිතීන් භුක්ති විඳීමේ, ආරක්ෂා කිරීමේ සහ වර්ධනය කිරීමේ සන්දර්භයක් සහතික කිරීමත් එයට අනුබල දීමත් සඳහා පවතින ආණ්ඩුවකට පිළිගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයක් සැකසීම වෙනුවෙනි. මෙම කෘතියේ නමෙන් පෙන්නුම් කරන පරිදි මෙය, රාජ්‍යයේ උල්ලංඝනයන්ට එරෙහිව පුරවැසියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීමේත්, මූලික අයිතීන් සහ නිදහස අභිෂ්ට සහ ව්‍යවස්ථා විරෝධී ලෙස ආක්‍රමණයට ප්‍රතිරෝධය දැක්වීමේත්, ආයතනික අනුග්‍රහ සහ ආණ්ඩුවේ භාවිතයන් පිළිබඳ බියකින් තොරව නීතියේ ආධිපත්‍යය සහ නීතිය ඉදිරියේ සමානත්වය පිළිගැනීමේ සහ ආයතනගත කිරීමේත්, රාජ්‍ය ප්‍රතිපත්ති න්‍යායපත්‍රයක් සඳහා ප්‍රතිසංස්කරණ සමග විවිධත්වය තුළ ඒකත්වය සමරමින් මෙම දිවයිනේ සියලු ජනයාගේ සංහිඳියාව ඇති කරන ආණ්ඩුකරණයක් පිළිබඳ කතාන්දරයකි. මේ ආකාරයෙන් ගත් විට වසර විසිපහක් ගතවී ඇතත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ කටයුතු හැම විටම පැවතියේ ‘වෙනස’ පිළිබඳ තත්ත්වයක මිස ‘පැවතීම’ පිළිබඳ තත්ත්වයක නොවේ.

**විවේචන**

ආරම්භයේ දී ම, අපට එරහිව එල්ල කරන ඇතැම් විවේචන ගැන කතා කිරීමට මම කැමැත්තෙමි. මේවා අතරින් පළමුවැන්න නම් අප සාමාන්‍ය පුරවැසියන්ට සිදු වන බලපෑම් ගැන නොසැලකිලිමත්, ප්‍රභූ සහ කොළඹ පදනම් කරගත් සංවිධානයක් බව සහ එම තත්ත්වය දිගට ම පවතින බව යි.

අප මූලික අයිතීන්ට ප්‍රමුඛතාව දී ඇති බව ඇත්තකි. මූලික අයිතීන් පිළිබඳ ස්ථාවර ව්‍යවස්ථාමය රාමුවකින් තොරව සාමාන්‍ය පුරවැසියකුට ඔහු හෝ ඇය කැමති සහ ලැබිය යුතු එක්සත් බව, සාමය සහ සමෘද්ධිය ලබාගත නොහැකි බැවින්, අප සටන් කරන්නේ ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් නිසා, මෙය සාමාන්‍ය පුරවැසියන් ගැන සැලකීමක් නොවේ ය යන්න අපි සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරමු. ඇත්තෙන් ම, අප මෙම කරුණ පුළුල් මහජනයාට ප්‍රමාණවත් ලෙස ඒත්තු ගන්වා නැති බව පිළිගත යුතු ය. කෙසේ වෙතත්, අපගේ සියලු කටයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කොට ඇති අතර එය දිගට ම සහතික කරන බවත්, මේ සම්බන්ධයෙන් ගත් විට, දිවයින පුරා පැතිරුණු ජාලයක් සහිතව ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ඒකකයේ සහ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් සිදු කරන්නේ සිංහල හා දෙමළ භාෂාවලින් බවත්, අපගේ විවේචකයන්ට මතක් කර දීමට අපි කැමැත්තෙමු. ඊට අමතරව විකල්ප සහ මාට්‍රම් යන සිංහල සහ දෙමළ වෙබ් අඩවි ද අප සතු ය.

දෙවැනි විවේචනය නම්, ඔවුන් අපගේ ප්‍රධාන මුදල් සපයන්නන් නිසා, අප වැඩ කරන්නේ විදේශ ආණ්ඩුවල න්‍යායපත්‍ර අනුව බව යි. එසේ වුව ද, ඔවුන් අපගේ ප්‍රධාන මුදල් සපයන්නන් වී ඇත්තේ, මානව හිමිකම් සහ ආණ්ඩුකරණ ක්ෂේත්‍රවල සිවිල් සමාජ ක්‍රියාවන්ට මුදල් ලබා ගැනීමේ ක්‍රම ශ්‍රී ලංකාව තුළ නොමැති නිසා ය. එමෙන් ම, අප ඔවුන්ගෙන් මුදල් ලබා ගන්නේ ඔවුන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ය යන චෝදනාව සම්පූර්ණයෙන් අසත්‍ය වන අතර එහි දී සිදු වන්නේ අපගේ ප්‍රමුඛතා හඳුනාගන්නා අප, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් සොයා ගැනීමට කටයුතු කිරීම යි. බටහිර රටවල මුදල් සපයන්නන්ගේ සහ අපගේ ප්‍රමුඛතා අතර ගැළපීමක් ඇති වීම ද අහම්බයක් නොවන්නේ ඔවුන් ද මානව හිමිකම් සුරක්ෂිත, නීතියේ පාලනය ඇති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය සහිත ලෝකයක් සඳහා විධිමත් ලෙස කැප වූ පිරිසක් වීම නිසා ය.

එමෙන් ම, තවත් විවේචනයක් නම්, අප පමණට වඩා ආණ්ඩු සමග ගැටුම්කාරී වන බව සහ විපක්ෂයේ බළල් අතක් වන බව යි. අපගේ ආයතනය පැවති වසර විසිපහක කාලයෙන් වසර විස්සක් පමණ ගත වී ඇත්තේ කුමාරතුංග ජනාධිපතිනිය සහ මහින්ද සහ ගොඨාභය යන රාජපක්ෂ සහෝදරයින් දෙදෙනා නායකත්වය දුන්, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩු යටතේ බව සටහන් කළ යුතු ය. මෙම මුළු කාලය තුළ එක්සත් ජාතික පක්ෂය වසර දොළහකට වඩා කලක් විපක්ෂයේ ද තවත් වසර අටක් ආණ්ඩුවේ ද සිටියේ ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මෙහෙවර සහ වරම වූයේ ප්‍රතිපත්ති පර්යේෂණ සහ උද්දේශන මගින් මානව හිමිකම් ඉදිරි දර්ශනයකින් යුතුව ආණ්ඩුකරණය සහ ගැටුම් පරිවර්තනය නිසා, මෙම කලබලකාරී කාලයේ බලයේ සිටි ආණ්ඩුවලට වඩා විපක්ෂය අපගේ මතය සමග වඩාත් එකඟ වී ය. ඊටත් වඩා වැදගත් කරුණක් වූයේ 2015 ආණ්ඩුව පිහිටුවනු ලද්දේ, අඩු තරමින් දශක දෙකකට වැඩි කාලයක් නිදහස් සිවිල් සමාජය කළ පර්යේෂණ සහ උද්දේශන මගින් අර්ථ දක්වා සැලසුම් කළ ප්‍රතිපත්ති පදනමක් මත වීමත්, එය අත්හැර දැමීමට ඉඩ නොතැබීමේ වගකීමක් නිදහස් සිවිල් සමාජයට තිබීමත් ය. ඒ අනුව, ආණ්ඩුව සමග කටයුතු කිරීම සහ ඔවුන් සඳහා වැඩ කිරීමත්, කෙනෙකුගේ ස්වාධීනත්වය සහ පිළිගැනීම අහිමි වීමට විරුද්ධ වීමත් යන පැවතුම් එකිනෙකින් බෙදා වෙන් කර ගැනීම, එම ආණ්ඩුවේ පාලන කාලය තුළ අප පවත්වාගෙන ගිය පිළිවෙත යි.

ඊට පෙර, 1999 වයඹ මැතිවරණය අවලංගු කිරීමට ඉල්ලා සිටීම සමග කුමාරතුංග ආණ්ඩුව සමග අපගේ සම්බන්ධය පලුදු වූ අතර මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය නිකුත් කරන සෑම මාධ්‍ය නිවේදනයකට ම විරුද්ධ වීමට ප්‍රතිවිරුද්ධ සංවිධානයක් එය බිහි කළේ ය. මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ වගවීමට උද්දේශනය නිසා රාජපක්ෂ පාලනයන් දෙක ම සමග හොඳ සම්බන්ධතාවයක් නොවූ අතර ඇත්තෙන් ම තවමත් නැත. අප එක්සත් ජාතික පක්ෂයට පක්ෂපාතය යන්න, ඔවුන් බලයේ සිටිය දී අපගේ මහජන ළැදියා

නඩු කටයුතු සහ අප දිගට ම කළ මානව හිමිකම් උද්දේශන යන කාරණා සමග සම්පූර්ණයෙන් ම ප්‍රතිවිරුද්ධ වෙයි.

## ජයග්‍රහණ

වසර විසි පහකට වැඩි කලක දී, සමකාලීන ප්‍රතිවිරුද්ධ ආඛ්‍යානයන්ට සහ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මගින් ප්‍රමාණවත් ලෙස හෝ කොහෙත්ම ආවරණය නොකරන ප්‍රවෘත්ති සහ මත සඳහා වේදිකාවක් ලෙස සේවය කරමින්, අපගේ සම්මානලාභී 'ග්‍රවුන්ඩ්වීව්' වෙබ් අඩවිය සමග අපි ශ්‍රී ලංකාවේ පුරවැසි මාධ්‍යයේ පුරෝගාමීන් වූයෙමු. සමකාලීන සමාජ දේශපාලන ප්‍රශ්න පිළිබඳව දිවයින පුරා මහජන මත විමසුම් සිදු කරන එකම සිවිල් සමාජ මත විමසුම් ඒකකය වන්නේ 'සෝෂල් ඉන්ඩිකේටර්' ය. රටේ යුද්ධය සහ සාමය සම්බන්ධයෙන් මහජනයාගේ මතය පිළිබඳව වසර හතක දත්ත ඔවුන් සතුව ඇත. සංවිධානයේ ඉතා ම ප්‍රමුඛ කාර්යය වන මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයෙන් මතු වූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය, අපකීර්තිමත් වයඹ මැතිවරණය අවලංගු කරන ලෙස ඉල්ලා සිටීමත් සමග ආණ්ඩුවේ වාරණයන්ට සහ තහංචිවලට මුහුණ දුන්න ද, අද වන විට එය රටේ ප්‍රධාන මැතිවරණ නිරීක්ෂණ ආයතන දෙකෙන් එකක් ලෙස ජාතික වශයෙන් පිළිගැනීමට ලක්ව ඇත.

පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම, ෆෙඩරල්වාදය සහ බලය බෙදීම ඇතුළු ව්‍යවස්ථාමය ප්‍රශ්න සම්බන්ධයෙන් පොහොසත් දත්ත සංචිතයක් අප සතු අතර අපගේ මහජන ළැදියා නඩු කටයුතු වැඩ සටහන, නඩු දිනීමෙන් සාර්ථකත්වය ලබමින් සමකාලීන වැදගත්කමින් යුත් වඩාත් කැපී පෙනුණු ප්‍රශ්න මතු කොට ඇති අතර අයිතීන් උල්ලංඝනයන් ගැන අවබෝධය වර්ධනය කොට ඇත. විශේෂයෙන් වැදගත් කරුණක් නම් රට පුරා සිවිල් සමාජ සංවිධාන එකට එකතු කරමින්, මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ වගවීම සඳහා උද්දේශනයට මෙහෙය වීම යි.

## සම්භවය සහ ස්තුති

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බිහි වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජී. එල්. පීරිස් විසින් පිහිටුවන ලද ප්‍රතිපත්ති පර්යේෂණ සහ විශ්ලේෂණ මධ්‍යස්ථානයෙනි (*CEPRA* - සෙප්‍රා). 1995 දී *CEPRA* තම ප්‍රථම ප්‍රසිද්ධ රැස්වීම පවත්වන ලද්දේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා ආණ්ඩුවේ යෝජනා සම්බන්ධයෙනි. එබඳු ම රැස්වීමක් සිංහලෙන් පැවැත්වීමට සෙප්‍රා (*CEPRA*)ට අවශ්‍ය වූ විට ශිෂ්‍ය සංගමය අපට කීවේ එසේ කිරීමට අපට ඉඩ නොදෙන බව යි. කුමන හෝ ආකාරයකින්, නවෝත්පාදක පර්යේෂණ ආයතනයක් වීමේ එහි ආරම්භකයින්ගේ අරමුණට ළඟා වීමට විශ්වවිද්‍යාලයේ සහ එහි නිලධාරී තන්ත්‍රයේ ආචාරධර්ම සෙප්‍රාට හරස්ව සිටියේ ය. සෙප්‍රාහි වැඩ කළ අය වන ජයදේව උයන්ගොඩ, රොහාන් එදිරිසිංහ සහ මා යන සියලු දෙනා තීරණය කළේ ඉවතට ගොස්, මෙබඳු අවහිරතාවලට මුහුණ දීමට සිදු නොවන සංවිධානයක් පිහිටුවීමට ය. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළින් සමකාලීන දේශපාලන චින්තනය පිළිබිඹු විය යුතු බවත්, මා එහි විධායක අධ්‍යක්ෂ විය යුතු බවත්, අපි තීරණය කළෙමු. එහි නාමයට සහ මුල් සමාගමික වගන්ති සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උයන්ට (ජයදේව උයන්ගොඩ) ණය ගැති ය. අපගේ ආරම්භක අරමුදල් ලැබුණේ ආසියානු පදනමෙන් සහ ඉන්ෆොර්ම් (*INFORM*) ආයතනයෙන් එහි ආරම්භක අධ්‍යක්ෂ චාලි අබේසේකරගේ පහසුකම් සැපයීමෙන් ලැබුණු ණය මුදලකිනි. ආසියානු පදනමේ නියෝජිත එඩ් ඇන්ඩර්සන්ගෙන් ලැබුණු සහාය සහ සහෝදරත්වයට මා ස්තුතිවන්ත විය යුතු ය.

ආරම්භක අධ්‍යක්ෂවරුන් දෙදෙනකු වන චාලි අබේසේකර සහ බ්‍රැඩ්මන් වීරකෝන් ගැන මගේ අගය කිරීම මම සටහන් කළ යුත්තෙමි. ඔවුන්ගේ අත්දැකීම්වලින් පොහොසත් බව, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අරමුණු සහ වැඩ සම්බන්ධයෙන් ඔවුන්ගේ උද්‍යෝගය, දිරි ගැන්වීම සහ සංවිධානයට ඔවුන්ගේ කැප වීම මිල කළ නොහැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හැම විට ම ඔවුන්ට ණය ගැති ය. එමෙන් ම, විශේෂයෙන් ම, යුද්ධයෙන් වර්ෂ ගණනාවකට පසු සංවිධානය ප්‍රහාරයට ලක් වෙද්දී, අධ්‍යක්ෂ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වශයෙන් ෂෙල්ටන් වනසිංහ සමග වැඩ කිරීම ද විශේෂ සතුටට හේතු වී ය. අද දක්වා ක්‍රියාත්මක කරන මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ක්‍රමවේදය සැලසුම් කිරීම හා, අදටත් බොහෝ දෙනා කතා කරන විභාෂා පරිවර්තන වැඩසටහන සහ පළමු මාධ්‍ය නිරීක්ෂණ වැඩසටහන සම්බන්ධයෙන්, තවත් හිටපු

අධ්‍යක්ෂවරයකු වූ ආචාර්ය අර්ජුන පරාක්‍රමට මා ස්තුතිවන්ත විය යුතු ය. අවසන් වශයෙන්, හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතරින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාම සහ ගැටුම් අංශයේ ප්‍රධානියාව සිටි කේතීස් ලෝගනාදන්ට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ණය ගැති බව මා සඳහන් කළ යුතු ය. ස්වයං තීරණය සඳහා දෙමළ ජනයාගේ අරගලයේ වසර ගණනාවක අත්දැකීම් සහ එල්ටීටීඊ සහ එකල සිටි අනෙක් ගරිල්ලා නායකයින් පිළිබඳව සිය පෞද්ගලික දැනීම ද කේතීස් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට රැගෙන ආවේ ය. ඒ අනුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ඔහුගේ කාලය තුළ, සාමය සහ ගැටුම් ගැනත්, ඇතැම් විට එය පහසු නොවන බවටත්, අපගේ දැනුම ඔහු ගැඹුරු කළේ ය.

දැන් පර්යේෂණ සහ උද්දේශන ඒකකය ලෙස හැඳින්වෙන නීති ඒකකයේ සහ මහජන ළැදියා නඩු කටයුතු වැඩ සටහනේ ආරම්භකයා වූ, ආරම්භක අධ්‍යක්ෂ රොහාන් එදිරිසිංහ ගැන විශේෂ සඳහනක් කළ යුතු ය. ව්‍යවස්ථා සහ පොදු නීතිය සම්බන්ධයෙන් රොහාන්ගේ අතිශය පුළුල් දැනුම නිසා තරුණ පර්යේෂකයින් බොහෝ දෙනෙකු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත ආකර්ෂණය වූ අතර එමගින් ෆෙඩරල්වාදය සහ බලය බෙදීම මෙන් ම දැන් හොඳින් තහවුරු වී ඇති මහජන ළැදියා නඩු කටයුතු වැඩ සටහන සඳහා ද ක්‍රියා කිරීමට පදනම වැටිණි.

පරිපාලන ප්‍රධානී සහ කාර්ය මණ්ඩලයේ නියම මව වූ ජීන් ගොඩ්ලීබ් මහත්මිය ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පැරණි සාමාජිකයින් බොහෝ දෙනෙකුගේ මතකයේ තිබෙනු ඇත. ඇගේ ඉවසීම, කාර්යක්ෂමතාව සහ උණුසුම් බව නිසා ආරම්භයේ සිට ම සංවිධානය සතුටින් වැඩ කරන ස්ථානයක් බවට පත් වී ය.

වසර විසිපහකට වැඩි කාලය තුළ, ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවල, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල සහ විශ්වවිද්‍යාලවල, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට බොහෝ මිතුරෝ සිටියහ. හොඳ කාලවල දී මෙන් ම දුෂ්කර කාලවල දී ද, ඔවුන්ගේ සහයෝගය සහ සහෝදරත්වය ගැන අපගේ ස්තුතිය ඔවුන්ට පුද කරන අතර අවශ්‍යතාව මතු වූ විට අපට නැවතත් එකට වැඩ කළ හැකි වන බවට බලාපොරොත්තු පළ කරමු.

අපගේ වටිනාකම් කෙරෙහි ඔවුන්ගේ කැපවීම සම්බන්ධයෙන් සහ විශිෂ්ට සේවය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමස්ත කාර්ය මණ්ඩලයට සහ අපගේ ජාත්‍යන්තර සහ දේශීය පුහුණුවන්නන්ටත් මා ස්තුති කළ යුතු ය. ඔවුන් අතරින් වැඩි දෙනෙකුට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඔවුන්ගේ පළමු සහ එක ම රැකියාව යි. ඇතැම් සිදුවීම්වල දී අනපේක්ෂිත මට්ටමේ වූ ඔවුන්ගේ අති දක්ෂ වැඩ කටයුතුවලට සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ සහ වටිනාකම් කෙරෙහි ඔවුන්ගේ කැපවීම සහ දිගට ම කළ කැප කිරීම සම්බන්ධයෙන් ලයනල්ට, අසංගට, භවානිට, සංජනට, ප්‍රදීප්ට, දේවිට, මීරාක්ට, ශ්‍රීයානිට සහ රේණුකාට මා විශේෂයෙන් ස්තුති කළ යුතු ය. එක්සත් ජාතීන් සඳහා නේවාසික නියෝජිත සහ මැතිවරණ නිරීක්ෂණ කටයුතුවල, රජයේ ආරක්ෂක නියෝජ්‍ය සහකාර ලේකම් වශයෙන්, අතුරුදන් තැනැත්තන් පිළිබඳ පළමු කාර්යාලය වැනි අපේ ම ජාතික ආයතනවල සහ විදේශවල අධ්‍යාපන ආයතනවලට සේවය සඳහා ගිය ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් විශිෂ්ටයින් බවට පත්ව ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යමණ්ඩලය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගොඩ නැගූ අතර අනෙක් අතට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඔවුන්ගේ ජීවිත වඩා හොඳ තත්ත්වයට වෙනස් කළ බව කිවහොත් ඔවුන් එකඟ වනු ඇතැයි මම විශ්වාස කරමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අනාගතයේ දී ද, එහි වැඩ කටයුතු දිගට ම කරගෙනු යනු ඇතැයි මම බලාපොරොත්තු වන අතර විශ්වාස කරමි. එමෙන් ම එය වඩා හොඳ තත්ත්වයක් සඳහා වැඩ කරනු ඇත. අවසන් වශයෙන් මා ගාන්ධි අනුස්මරණ දේශනය අවස්ථාවේ කළ පරිදි රොබර්ට් බ්‍රව්නින්ග් (*Robert Browning*) කවියාගේ උධෘතයක් ගෙන හැර දැක්වීමට මම කැමැත්තෙමි.

"මිනිසාගේ ප්‍රවේශය ඔහුගේ සීමාව ඉක්මවා යා යුතුය; නැත්නම් ස්වර්ගය කුමක් සඳහා ද?"

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ඉදිරි වසර විසි පහේ දී සහ ඊට පසුව ද එසේ ම වේවා!

# විශේෂ ස්තුතිය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනුවෙන්, මෙම සමරු කලාපයේ සංස්කාරකවරුන් දෙදෙනා වන ෂිමාලි සේනානායක සහ ලයනල් ගුරුගේ වෙත මාගේ හදපිරි ස්තුතිය පුද කරමි. ඒ සම්බන්ධයෙන් ඔවුන් දැක් වූ ඉවසීම, අවබෝධය සහ කැපවීම මෙන්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනුවෙන් ඔවුන් දක්වන කැපවීම අන් කිසිවකටත් නොදෙවෙනි ය. විශේෂයෙන්ම, මෙහි අන්තර්ගත ඡායාරූප ගොනු කිරීමට සුජිත් විසින් වෙහෙස නොබලා ගත් උත්සාහය සම්බන්ධයෙන් මෙන්ම, ආකර්ෂණීය ආවරණ සැලසුම සඳහා අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතාටත් මාගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි. විශිෂ්ට කාර්යභාරයක් ඉටුකළ මුද්‍රණ ආයතනයට සහ ඒ සම්බන්ධයෙන් දැක් වූ නොමසුරු මූල්‍යමය සහයෝගය වෙනුවෙන් ෆ්‍රෙඩ්රික් නියුමන් ස්ටිෆ්ටුන්ග් (*Freidrich Neumann Stiftung - FNst*) ආයතනයට බොහෝ සෙයින් ස්තුති වන්ත වෙමි. වසර ගණනාවක් පුරා ෆ්‍රෙඩ්රික් නියුමන් ස්ටිෆ්ටුන්ග් හි හියුබර්ටස් වොන් වෙල්ක් ගේ දායකත්වයට සහ සහයෝගීතාවයට විශේෂ ස්තුතිය පුද කරමි.

අවසාන වශයෙන්, මේ සඳහා දායකත්වය ලබා දුන් සෑම සියලු දෙනාටම බෙහෙවින්ම ස්තුති වන්ත වන අතර, මෙය අපේක්ෂා කළ පරිදි සමරු ලේඛනයක් බවට පත් කිරීම පමණක් නොව, සිවිල් සමාජ ලෝකය, යහපාලනය සඳහා ඇති අභියෝග හා අවස්ථා, කල් පවත්නා සාමය සහ සෞභාග්‍යය පිළිබඳ අවබෝධයක් ලබා දීම සඳහා ද සුදුසු අන්දමේ අන්තර්ගතයක් සහතික කිරීම ද අතිශයින්ම අගය කරමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි මාගේ සගයින්ට සහ අතීතයේ සහ වර්තමානයේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට මාගේ ඉහළම ස්තුතිය පිරිනැමේ. ඔබ මේ සියල්ල සාර්ථක කළ අතර අනාගතයේදී ද ඔබට එය එසේම අඛණ්ඩව සිදු කළ හැකි වනු ඇත.

**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**

විධායක අධ්‍යක්ෂ



# වසර 25 යි : ආපසු ආරම්භයට

**රොහාන් එදිරිසිංහ**

වැඩක ඉතාමත් වැදගත් කොටස එහි ආරම්භය බවට කියමනක් ඇති නිසා, වසර විසිපහකට පෙර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කිරීම පිළිබඳව නැවත ආවර්ජනය කළ යුතු යැයි මම සිතුවෙමි. 1996 දී එහි ආරම්භයට, දේශපාලන, ආයතනික සහ පුද්ගලයින් පිළිබඳ සිත් ඇද ගන්නා සංයෝජනයක් දායක වී ය. සුවිශේෂී අනන්‍යතාවක්, ගම්‍ය දේශපාලන දිශානතියක් සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මූලධාර්මික ප්‍රවේශයක් සකස් කර ගැනීමට පළමු වසර පහ ඉතා වැදගත් වී ය. මෙමගින් සංවිධානයේ අනාගත සාර්ථකත්වයට ඉතා වැදගත් වූ, කැපවීමෙන් සහ හැකියාවෙන් යුතු තරුණ පිරිසක් සංවිධානයට ඇද ගැනීමට හැකි වී ය.

අපගේ මිත්‍ර චානක අමරතුංගගේ අදහස අනුව, 1981 දී ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සභාව සහ 1987 දී ලිබරල් පක්ෂය ආරම්භ කිරීමෙන් පටන්ගත් ශ්‍රී ලංකාවේ ලිබරල් ව්‍යාපාරයේ, සරාත් මමත් ක්‍රියාකාරීන් ව සිටියෙමු[1]. එහි සම්මන්ත්‍රණ සහ ප්‍රකාශන මගින්, දේශපාලන සහ ව්‍යවස්ථා ප්‍රශ්න පිළිබඳව මහජන සංවාදයට දායක වීමට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සභාවට හැකියාව ලැබුණ ද, මැතිවරණ දේශපාලනය තුළ බලපෑමක් කිරීමට පක්ෂයට අරගලයක් කිරීමට සිදු විය.[2] එහි තේරුම නම්, අදහස් සහ දේශපාලන වශයෙන් බලපෑම් කළ හැකි විශාල පක්ෂ/ කණ්ඩායම් සමග සන්ධානගත වීමට පක්ෂයට සිදු වීම යි. පක්ෂය එබඳු කාර්යභාරයක් ඉටු කිරීමට උදාහරණයක් වන්නේ 1988 ජනාධිපතිවරණයේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට සහාය දුන් පක්ෂ අටකින් සමන්විත ප්‍රජාතන්ත්‍රවාදී පොදුජන පෙරමුණේ මැතිවරණ ප්‍රකාශනය කෙටුම්පත් කිරීම යි. කෙසේ වෙතත්, විශාල පක්ෂ සහ

සන්ධාන සමග සන්ධානගත වීම, නොවැළැක්විය හැකි ලෙස, ප්‍රතිපත්ති සහ උපායමාර්ග පිළිබඳව අභියෝග ඇති කරන අතර, දේශපාලන හවුල්කරුවන්ගේ හැසිරීම සහ ඔවුන්ට බලපෑම් කිරීමේ හැකියාව යන දෙක ම ගැන අනුමාන කරමින්, අවදානම්සහගත අමාරු තීරණ ගැනීමට සිදු වෙයි. 1993 දී, සන්ධාන ගත විය යුත්තේ ප්‍රේමදාසගේ එක්සත් ජාතික පක්ෂය සමග ද නැතහොත් කුමාරතුංගගේ පොදුජන එක්සත් පෙරමුණ සමග ද යන්න තීරණය කිරීම විශේෂයෙන් අමාරු බව ඔප්පු වූ අතර, ප්‍රේමදාසට සහාය දීමට පක්ෂය තීරණය කළ විට, සරා සහ තිස්ස ජයතිලක (පසුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කළ) ඇතුළු අප බොහෝ දෙනෙකු තීරණය කළේ ලිබරල් අදහස් ප්‍රවර්ධනයට වෙනත් මාවත් සොයා ගැනීමට පක්ෂයෙන් ඉවත් වීමට යි.

1993 දී, කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජී.එල්. පීරිස්, ජයදේව උයන්ගොඩගෙන් සහ මගෙන් ඉල්ලා සිටියේ විශ්වවිද්‍යාලය තුළ ප්‍රතිපත්ති අධ්‍යයන සහ විශ්ලේෂණ මධ්‍යස්ථානය (*CEPRA* - සෙප්‍රා) ගොඩ නගා මෙහෙයවන ලෙස යි. එයින් අදහස් වූයේ, අන්තර් ක්ෂේත්‍ර සහයෝගීතාවට පහසුකම් සැපයීම, ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ පර්යේෂණ සහ විශේෂ වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමග එක්ව එච්.අයි.වී. / ඒඩ්ස් සහ මානව හිමිකම් වැඩ සටහනේ කලාපීය කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක වීම යි. 1992 දී එක්සත් රාජධානියේ සිට පැමිණි සරාට අවාසනාවන්ත ලෙස දේශීය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අර්ථාන්විත කාර්යයක් සඳහා ඉඩකඩ ලබා ගැනීමට නොහැකි වී ය. උපදේශකයකු ලෙස සෙප්‍රා (*CEPRA*) ට සම්බන්ධ වන ලෙස අපි ඔහුට ආරාධනා කළෙමු. එය පැවති මුල් වසර කිහිපයේ දී ප්‍රයෝජනවත් වැඩ කොටසක් ඉටු කිරීමට සෙප්‍රාට හැකි වුව ද[3], දේශපාලනය සඳහා ජී.එල්. පීරිස් විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසුව, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ කොටසක් වී ඇති නිතර මතුවන අතාර්කික නිලධාරීවාදී බාධක මගහැර යෑමට අවශ්‍ය ඉහළ සහයෝගය එයට අහිමි වූ අතර අප සියලු දෙනා කලකිරීමට පත්ව කල්පනා කළේ අපගේ මහන්සියේ තරමට ප්‍රතිඵල ලැබෙන්නේ ද යනුවෙනි. "විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිටත සහ රාජ්‍ය නිලධාරීවාදයෙන් නිදහස් සෙප්‍රාවක්" ගැන පිළිබඳව අප කල්පනා කළේ එම අවස්ථාවේ දී ය.

1994 දේශපාලන වෙනසක වසරක් ද විය. ලිබරල් ව්‍යාපාරය ආරම්භ වූයේ ජේ.ආර්. ජයවර්ධන රජය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සිවිල් අයිතිවාසිකම් අහෝසි කිරීම සහ 1982 ජනමත විචාරණය ඇතුළු ව්‍යවස්ථාමය උපාමාරුවල යෙදීම ආරම්භ කළ කාලයක ය. එබැවින් 1994 දී මැතිවරණය තුළින් ආරම්භ වූ ප්‍රජාතන්ත්‍රවාදී වෙනස යහපත් වර්ධනයක් වුව ද, සිවිල් සමාජය ශක්තිමත් කිරීමේ වැදගත්කම අප අතරින් පිරිසකට තේරුම් ගියේ, එසේ කිරීමට සුදුසු කාලයක් එළඹී තිබීමත්, ඊට පෙර වසර විස්සක තිහක කාලය තුළ, වැදගත් කාර්යභාරයක් ඉටු කළ, සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය, මර්ජ් සහ මාර්ග ආයතනය වැනි පැරණි සිවිල් සමාජ ව්‍යාපාරවල බලපෑම අඩු වෙමින් පවතින කාලයක් වූ නිසාත් ය.[4] විසි වසරකට පසුව, ආපසු හැරී බැලීමේ හැකියාව ඇති නිසා මා හිතන්නේ එම තීරණය නිවැරදි බව තහවුරු වී ඇති බව යි.

විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන කාර්යමණ්ඩලයේ උයන්ට සහ මට තිබුණු බැඳීම් නිසා, නව සංවිධානයේ පූර්ණකාලීන ප්‍රධානියා වශයෙන් සරා වගකීම් භාරගත යුතු වන බව මුල සිට ම පැහැදිලි වී ය. ඉදිරියට යා යුතු ආකාරය ගැන උපදෙස් ගැනීම සඳහා, අපට වඩා පළපුරුද්ද සහ දැනුම ඇති දෙදෙනෙකු වෙත යොමු වූ අපි නව ආයතනයේ කොටස්කරුවන් වීමට ඔවුන්ට ආරාධනා කළෙමු. ඒ සුනිල් බැස්ටියන්ට සහ චාල්ස් අබේසේකරට යි. ඔවුන්ගේ ප්‍රඥාව සහ මග පෙන්වීම මිල කළ නොහැකි වූ අතර ඔවුහු වැදගත් කුසලතා රාශියක් කණ්ඩායම වෙත රැගෙන ආහ. ඉන් පසුව අප කල්පනා කළේ, පසුබිම අනුව විවිධ වූ අය අධ්‍යක්ෂ මණ්ඩලයට ගැනීම වැදගත් වන බව යි. 1990 ගණන් මුල දී ප්‍රේමදාස ජනාධිපතිවරයා මුලසුන දැරූ සර්ව පාක්ෂික සමුළුවේ ලේකම් ලෙස කටයුතු කළ කාලයේ අපි බ්‍රැඩ්මන් වීරකෝන් මහතා සමග වැඩ කොට ඇත්තෙමු. ඔහු හැම විට ම එකඟ නොවුව ද, හැම විට ම තේරුම් ගනිමින් ක්‍රියා කළ අතර 1972 දී දේශපාලනීකරණය වීමට පෙර තිබූ උත්කෘෂ්ට ගුණාංගවලින් හෙබි

වෙනස් ආකාරයේ රාජ්‍ය නිලධාරියකු වී ය. ඔහු මෙන් ම, එම ආසන්න කාලයේ එක්සත් රාජධානියේ සිට පැමිණි තරුණ නීතිඥවරියක වූ සයිරිනී සිරිවර්ධන ද[5], අධ්‍යක්ෂ මණ්ඩලයට සම්බන්ධ වීමට අපි පොළඹවා ගතිමු. මෙම කණ්ඩායම, එනම් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පළමු අධ්‍යක්ෂ මණ්ඩලය, ඉන් පසු ඔවුන්ගේ සම්බන්ධතා උපයෝගී කර ගෙන, සංවිධානයේ වැඩ ආරම්භ කිරීම සඳහා පළමු කාර්යමණ්ඩලය රැගෙන ආවේ ය. 'සෙප්‍රා' සමග සම්බන්ධව සිටි පුද්ගලයෝ ගණනාවක් ද එයට ඇතුළත් වූහ. ඔවුන් නම් අල්ටාෆ් හුසේන්, කේතිස් ලෝගනාදන්, සුන්දරී ද අල්විස්, සාවිත්‍රී වලතර සහ පසුව ප්‍රදීප් පීරිස් ය. එලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ ආරම්භ වී ය.

පර්යේෂණ, උද්දේශන, නීති සහ ප්‍රතිපත්ති විවේචනයේ දී නිර්මාණාත්මක විකල්ප සැපයීම සම්බන්ධ කරන ක්‍රම සොයා යමින් සංවිධානය සඳහා සුවිශේෂී අනන්‍යතාවක් ගොඩනගා ගැනීමට විෂය පථ රාශියක් 1990 ගණන්වල පසු භාගයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ලැබුණි[6]. කුමාරතුංග පාලනය ආරම්භ කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය භාරව සිටි අයගේ දුර්වල සහ සිතා ගත නොහැකි නායකත්වය නිසාත්, ගාමිණී දිසානායකගෙන් (ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වඩාත් ප්‍රතිසංස්කරණවාදී ස්ථාවරයක සිටි) පසුව එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට පත් වූ රනිල් වික්‍රමසිංහ නායකත්වයේ වගකීම් රහිත ප්‍රතිචාරය සහ රටේ නීති ප්‍රජාවගේ ගතානුගතික මානසිකත්වය නිසාත්, ඇණහිට තිබිණි. දහතුන් වැනි සංශෝධනයට එහා ගිය විසඳුමක් සඳහා ආණ්ඩුව ප්‍රචාරක ව්‍යාපාරය කරද්දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තවත් ඉදිරියට යමින් ෆෙඩරල් රාජ්‍යයක් සඳහා (1980 ගණන් මුල සිට ලිබරල් ව්‍යාපාරය කළ පරිදි) විවෘතව උද්දේශනය කළ අතර, ෆෙඩරල්වාදය පිළිබඳ ඇති මිථ්‍යා සහ වැරදි ආකල්ප සමග ගැටෙන්නට සූදානම් වී ය[7]. ව්‍යවස්ථාමය පැවැත්ම සහ දෙමළ පක්ෂ සියල්ල ම පාහේ දායක වූ තිම්පු මූලධර්ම අතර පරතරය අඩු කරන ව්‍යවස්ථාමය විකල්ප ගවේෂණය කිරීමට ද වැදගත් කාර්යභාරයක් එමගින් ඉටු කරනු ලැබී ය.

ජනාධිපතිවාදය සහ අධිකරීවාදය අතර සම්බන්ධය පෙන්වා දීම, පාර්ලිමේන්තු විධායකයක් සඳහා ස්ථිරව පෙනී සිටීම, අයිතීන් පිළිබඳ ප්‍රබල පනතක් සහ පනත් සම්බන්ධ අධිකරණ සමාලෝචනය නැවත හඳුන්වා දෙමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය පිළිගැනීම ආදිය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය මගින් අවධාරණය කරනු ලැබී ය. මෙයින් බොහොමයක් 1980 ගණන්වල දී සහ 1990 ගණන් මුල සර්ව පාක්ෂික සමුළු සාකච්ඡාවල දී දිගට ම ලිබරල් ව්‍යාපාරයේ ස්ථාවරයේ කොටස් වී ය. මේ කාලයේ පැවති ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී, සංවෘත තේරීම් කාරක සභා කාමර තුළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සාකච්ඡා කරන දේශපාලන කණ්ඩායම්වල සංකල්පමය නොගැළපීම්, විනිවිදභාවය නොමැති වීම සහ මහජන සහභාගීත්වයක් නොමැති වීම ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ප්‍රතිපත්තිමය විවේචනයක් ද කළේ ය.

ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සහ ශ්‍රී ලංකා විකාශන අධිකාරී පනත්වලට කළ නීතිමය අභියෝග, නිදහස් සහ සාධාරණ මැතිවරණ මූලධර්ම තහවුරු කර ගැනීමට කළ නඩු ගණනාව, අධ්‍යාපනික නිදහස යටපත් කළ හැකි වූ විශ්වවිද්‍යාල පනතේ සංශෝධනවලට එරෙහි පෙත්සම් සඳහා පහසුකම් සැපයීම සහ රටේ නීතියේ පාලනයට විනාශකාරී ප්‍රතිවිපාක ඇති කළ 1999 සරත් සිල්වා අග විනිසුරු ලෙස විවාදාත්මක පත් කිරීමට විරුද්ධ වීම මගින් කේන්ද්‍රයේ නීති උද්දේශන වැඩ කටයුතු පිළිගැනීමක් හිමි කර ගත්තේ ය. ශ්‍රී ලංකාවේ, එක්සත් ජනපදයේ සහ කැනඩාවේ නීති සිසුහු සංවිධානයේ පුහුණුව ලබමින් මහජන අධ්‍යාපනය සඳහා නඩු සටසන් සහ නීති විචාර ලියා මූට් පොයින්ට් වැනි ප්‍රකාශනවල පළ කළහ.

චානක අමරතුංගගේ ඛේදජනක අකල් මරණය සිදු වූ වසරේ ම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කිරීම, රටේ ලිබරල් ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට වසර පහළොවකට පෙර ආරම්භ කළ උත්සාහයේ නව අවදියක් ලෙස දැකිය හැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට චානක අමරතුංගගේ මරණින් පසු විශාල වැදගත්කමක් හිමි වූයේ ව්‍යාපාරය මෙහෙයවීමට ඔහු ගොඩනැගූ සංවිධාන කාලයාගේ ඇවෑමෙන් ව්‍යාපාරයේ ආරම්භක මූලධර්ම අතහැර දමමින්

ක්‍රියාත්මක වූ නව නායකත්වයක් විසින් භාරගනු ලැබූ නිසාය. පැහැදිලිව ම දේශපාලන සංවිධාන වූ සහ ඒ නිසා ම වඩාත් සමස්ත ලිබරල් න්‍යායපත්‍රයක් සඳහා උද්දේශනය කළ හැකි වූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සභාව හෝ ලිබරල් පක්ෂය මෙන් නොව, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් ලිබරල් වටිනාකම් වර්ධනය කරන ලද්දේ, පැහැදිලිව ම ව්‍යවස්ථාමය, දේශපාලන සහ මානව හිමිකම් අංශවලිනි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කිරීම සහ පළමු වසර පහේ දී එහි වැඩ කටයුතු, අනාගතය සඳහා පදනමක් දැමීමේ දී අතිශයින් වැදගත් වී ය. එම කාලයේ පැවති දේශපාලන සන්දර්භය, වෙනත් සංවිධාන මුහුණ දුන් අභියෝග සමග සම්බන්ධතාව සහ පෞද්ගලික සහ සංවිධාන යන දෙආකාරයෙන් ම, විවිධ තත්ත්වයන්ගේ සංයෝජනය ආදිය එහි ආරම්භයට සැලකිය යුතු බලපෑමක් කළේ ය. ඉන්පසු එහි පළමු වසර පහේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සුවිශේෂී සදාචාරයක් සහ අනන්‍යතාවක් ගොඩ නගා ගනිමින් පර්යේෂණ සහ උද්දේශන යන ක්ෂේත්‍ර දෙකෙහි ම, එහි වැඩ කටයුතු පිළිබඳව ප්‍රබල සාධාරණීකරණයක් පෙන්නුම් කළ අතර, එමගින් එහි වැඩ කටයුතු තහවුරු කොට වර්ධනය කිරීමට පරමාදර්ශී, තරුණ සහ සුවිශේෂී කාර්යමණ්ඩලයක් ආකර්ෂණය කර ගත්තේ ය. නව සහස්‍රයේ දී වර්ධනය වීමට සංවිධානයට පදනම දමන ලද්දේ ඒ අයුරිනි.

පාද සටහන්

1. පැහැදිලිව ම ලිබරල් ව්‍යාපාරයක් ගොඩනැගීමේ මීට පෙර අවස්ථාව වන්නේ 1920 ගණන් අග භාගයේ ශ්‍රීමත් ජේම්ස් පීරිස්, ඊ.ඩබ්ලිව්. පෙරේරා, ජී.ජී. පොන්නම්බලම් සහ පෙරී සුන්දරම්ගේ නායකත්වයෙන් ලිබරල් ලීගය පිහිටුවීම යි. ඔවුහු බොහෝ දෙනෙක් 1931 පළමු රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයට ලිබරල්වාදීන් ලෙස තරග කළහ.

2. අද ශ්‍රී ලංකාවේ දේශපාලන විචාරකයින්ගේ විවේචනයට නිතර ලක්වන නව ලිබරල්වාදයට ඉතා කිට්ටු සම්භාව්‍ය ලිබරල්වාදයට එරෙහිව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සභාව සහ ලිබරල් පක්ෂය හඳුන්වන ලද්දේ ප්‍රතිසංස්කරණවාදී හෝ සංශෝධනවාදී ලිබරල්වාදයක් වශයෙනි. බ්‍රිතාන්‍ය සහ කැනඩා ලිබරල් පක්ෂවලට සමාන ලෙස ප්‍රතිසංස්කරණවාදී ලිබරල්වාදය වෙනත් දේ අතර වෙළෙඳපොළ හැසිරවීම, සුබසාධනය, ආර්ථික නැවත බෙදා හැරීම සහ පරිසර ආරක්ෂණය යන ක්ෂේත්‍රවල රජයට වැදගත් කාර්යභාරයක් ඇති බව පිළිගනියි.

3. සංසන්දනාත්මක ව්‍යවස්ථා නීතිය සහ ගැටුම් සමථකරණය, එච්.අයි.වී./ඒඩ්ස් සහ අපකීර්තිය සහ අසාධාරණයට ලක් කිරීම සම්බන්ධයෙන් නීති සහ වෛද්‍ය වෘත්තිකයන් සමග කටයුතු කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය, පළාත් පාලනය සහ හදිසි නීතිය හා මානව හිමිකම් ආදියට අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන්, දේශපාලන නායකයින්, ආණ්ඩුවේ නිලධාරීන් සහ විද්වතුන් සමග සංවාද සංවිධානය කිරීම එයට ඇතුළත් වී ය. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සෙප්‍රා පිහිටා තිබීම, දේශපාලන නායකයින් සහ ආණ්ඩුවේ නිලධාරීන් වෙත ප්‍රවේශය පහසු කළේ ය.

4. ඕනෑම සිවිල් සමාජ සංවිධානයකට තමන්ගේ ජීවිත කාලයක්, එනම් තමන්ගේ වැඩ කටයුතු අවසන් කළ යුතු කාල සීමාවක් තිබේ ද? යන උනන්දුව දනවන සහ අභියෝගාත්මක ප්‍රශ්නය මෙයින් මතු කරයි.

5. 1993 දී කොළඹ දී පවත්වනු ලැබූ *Law Asia* සමුළුවේ වාර්තාකරුවන්ගේ කණ්ඩායමේ ඇය සේවය කළා ය.


6. රාජ්‍ය නොවන සංවිධාන ඕනෑ ම කටයුත්තකට 'හුදෙක් විවේචනය කරනවා' පමණක් යැයි නිතර චෝදනා එල්ල වන නිසා මෙය වැදගත් වී ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එහි ආරම්භයේ සිට මෙම චෝදනාවට සංවේදී වී ය.

7. බලය බෙදා ගැනීම, උපරිම බලය බෙදීම හෝ එවැනි වෙනත් විකල්ප යෙදුම් භාවිත කරනවා වෙනුවට එහි සියලු අංග සමග කෙළින් ම මෙම 'නරක වචනය' යොදා ගැනීමේ තීරණය, 1981 දී ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සභාවත්, 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත්, දැනුවත්ව ගත් තීන්දුවකි. '1908 - 2008 ශ්‍රී ලංකාවේ බලය බෙදීම්' ප්‍රකාශනයේ දී 'බලය බෙදීම' යන යෙදුම භාවිතයට තීරණය කිරීම හිතාමතා ගත්තක් වන්නේ එම ප්‍රකාශනයෙන් පුළුල් පරාසයක ප්‍රශ්න සමාලෝචනය කළ හෙයිනි.

**රොහාන් එදිරිසිංහ**

රොහාන් එදිරිසිංහ කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වන අතර ව්‍යවස්ථා නීතිය පිළිබඳ ප්‍රාමාණික විද්වතෙකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආරම්භක අධ්‍යක්ෂවරයෙකි. නීති විෂය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ ලිපි සහ කෘති ගණනාවක් සම්පාදනය කොට ඇත. දැනට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යවස්ථා නීතිය පිළිබඳ උපදේශකවරයකු ලෙස කටයුතු කරයි.

# අභියෝගාත්මක ගමනක ඇරඹුම



මහාචාර්ය
**ජයදේව උයන්ගොඩ**

1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආරම්භක සාමාජිකයන් අතර මම ද එක් අයකු වීමි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කිරීමට විශේෂ පසුබිමක් තිබිණි. ආරම්භක සාමාජිකයින් අතරින් තිදෙනෙකු වන, පාක්‍යසෝති සරවනමුත්තු, රොහාන් එදිරිසිංහ සහ මම, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්ති පර්යේෂණ සහ විශ්ලේෂණ මධ්‍යස්ථානයට (*CEPRA* - සෙප්‍රා) ක්‍රියාකාරීත්වයේ නියුතුව සිටියෙමු. මා සහ රොහාන් එහි අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරමින් සිටිය දී, සරා එහි උපදේශක සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලෙස කටයුතු කළේ ය. පසුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාම විශ්ලේෂණ අංශයේ ප්‍රධානියා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කළ කේතීස් ලෝගනාදන් ද *CEPRA* හි ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු ලෙස කටයුතු කළේ ය. අනෙක් ආරම්භක සාමාජිකයින් වූයේ, චාල්ස් අබේසේකර, සුනිල් බැස්ටියන්, සිරීන් සිරිවර්ධන සහ බ්‍රැඩ්මන් වීරකෝන් යන අයයි. සුනිල් සහ සිරීන් ද *CEPRA*හි අපගේ පර්යේෂණ සහ සම්පත්දායක කණ්ඩායමේ සිටියහ. මේ වන විට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන සිටි බ්‍රැඩ්මන් *CEPRA* මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සහ සාකච්ඡාවලට නිතිපතා සහභාගී වූවකු විය.

*CEPRA* හි අප කරමින් සිටියේ උද්දේශන, පර්යේෂණ සහ දැනුම බෙදා හැරීම ඇතුළු ප්‍රතිපත්ති කාරණාවලට තරමක් නැඹුරු වැඩ කටයුතු ය. *CEPRA*හි ක්‍රියාකාරීත්වයේ විෂය පථය පුළුල් කිරීමට අපට අවශ්‍ය වූ විට, අත්දැකීම් තුළින් අපට අවබෝධ වූයේ, අපගේ ඉලක්ක සපුරා ගැනීමට ඇතැම් පරිපාලනමය බාධා පවතින බව යි. රජයේ විශ්වවිද්‍යාලයකට සම්බන්ධ ආයතනයක් වශයෙන්, මෙම බාධා ආයතනික, දේශපාලන සහ කළමනාකරණ ස්වරූපයක් ගත් ඒවා විය.

අපගේ අදහස වූයේ, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, සාමය ගොඩනැගීම සහ ක්‍රියාකාරීත්වයට, සෘජුවම කැප වූ සහ රාජ්‍ය නොවන මූලාශ්‍රවල මුදලින් ආධාර ලබන සිවිල් සමාජ ආයතනයක් ලෙස නව ස්වාධීන ආයතනයක් පිහිටුවීම යි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් එතරම් දුරස්ථ නොවූ කොළඹ ඇතුළත මල් පාරේ කාර්යාලයක 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බිහි වන්නේ ඒ අනුව ය. මෙසේ, එක අතකට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කළේ, *CEPRA* හි අප කරමින් සිටි ඇතැම් කටයුතු, වඩාත් මානව සහ ද්‍රව්‍යමය සම්පත් සහිතව වඩා පුළුල් පරිමාණයකින් කරගෙන යෑම යි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවීමෙහි අරමුණ වූයේ 1990 මුල් කාලයේ පටන් වර්ධනය වූ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වයේ පැවති ඇතැම් හිදැස් පියවීම යි. ඉතාම සුළු සංඛ්‍යාවක් හැර, සිවිල් සමාජ සංවිධාන බොහොමයක් තම උද්දේශන සහ ප්‍රජා අධ්‍යාපන කටයුතුවල නිරතව සිටියේ, පර්යේෂණ, ග්‍රන්ථ ප්‍රකාශන, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ රාජ්‍ය නිලධාරීන් සමග සාකච්ඡා සහ සංවාද තම න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගන්නේ නැතිව ය. නිර්මාණාත්මක සිවිල් සමාජ මැදිහත්වීම් සඳහා විශාල ඉඩකඩක් තිබූ සාමාන්‍ය දේශපාලන වාතාවරණයක් තුළ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කළේ මෙම ක්‍රියාකාරීත්වයන් සඳහා ප්‍රමුඛත්වය දීම යි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දියත් කරන ලද නව ක්‍රියාකාරකම් තුනක් වන්නේ (අ) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයට සහ වාර්තාකරණයට ඒකකයක් පිහිටුවීම (සීඑම්ඊවී) (ආ) පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය සහ ආණ්ඩුවේ ඇතැම් ක්‍රියාකාරකම්වල නීත්‍යානුකූලභාවය අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කිරීම (නීති ඒකකය) සහ (ඇ) කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්ති සහ දේශපාලන ප්‍රශ්න ගැන පවත්නා මහජන මතය සම්බන්ධයෙන් නිතිපතා සමීක්ෂණ පැවැත්වීම සහ එම ඒකකය මගින් සමීක්ෂණ වාර්තා ප්‍රකාශයට පත් කිරීම (සෝෂල් ඉන්ඩිකේටර්) යන මේවායි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි නීති ඒකකය ශ්‍රී ලංකාවේ මහජන හිතකර නඩු පැවරීමේ පුරෝගාමීන් විය. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය සහ ප්‍රකාශයට පත් කිරීම, දේශපාලන විසඳුමක් මගින් ජනවාර්ගික ගැටුම විසඳීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා කටයුතු කිරීම මෙන් ම අධිකරණය ඉදිරියේ ආණ්ඩුවට අභියෝග කිරීම ද නිසා සිදු වූයේ ඇතැම් ආණ්ඩු සහ දේශපාලනඥයන්ගේ වෛරය ඇවිලීම යි. එහි ප්‍රතිඵලය වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂවරයා, තර්ජනයට, පොලිස් පරීක්ෂණවලට, ද්වේශසහගත මාධ්‍ය ප්‍රහාරයන්ට සහ වෛරී ප්‍රකාශවලට නිතරම ලක්වීම යි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහ එහි විධායක අධ්‍යක්ෂවරයාගේ සුවිශේෂී අත්දැකීම් මගින්, සමකාලීන ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු වන ඇතැම් අභියෝග සංකේතවත් විය. සර්වෝදය ව්‍යාපාරය සහ එහි නායක ආචාර්ය ඒ. ටී. ආරියරත්න මහතා, එවකට ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා විසින් වසර දෙකක පමණ කාලයක් තිස්සේ හිරිහැරයට ලක් කරන ලද්දේ, පොලිස් පරීක්ෂණ සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජනාධිපති කොමිසමක පරීක්ෂණ මගිනි. සිංහල ජාතිකවාදී දේශපාලන සහ බුද්ධිමතුන්ගේ කණ්ඩායම් මෙන් ම මාධ්‍යයද 1990 ගණන් මුල සිට ම සිවිල් සමාජ කණ්ඩායම් සහ ක්‍රියාකාරීන්ට එරෙහිව නොනවතින ප්‍රචාරයක් ගෙන ගියේ ඔවුන් ද්‍රෝහීන්, විදේශීය හෝ එල්ටීටීඊ ඒජන්තයින් ලෙස ප්‍රසිද්ධියේ නම් කරමිනි. රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් අවිධිමත් රාජ්‍ය නොවන කොමිසන් සභා දෙකක් සහ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පවා පැවති අතර, මෙබඳු මුල පිරුම් ගණනාවක, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නොවරදවාම ප්‍රධාන ඉලක්කයක් බවට පත් වී ය.

මානව හිමිකම් සහ ක්‍රියාවාදී රාජ්‍ය නොවන සංවිධානවලට, සිංහල ජාතිකවාදයේ මෙවැනි සතුරු ප්‍රතිචාර තේරුම් ගත හැකි එක ආකාරයක් වන්නේ එය, විසංවාදයට, විවිධත්වයට සහ බහුත්වවාදයට ඉඩ නොතබන, නොඉවසීම සහ වෛරය නිපදවන ජාතිකවාදී ප්‍රතිපත්තිවල දිගුවක් ලෙස දැකීම යි. දේශපාලන මතවාදී සහ රාජ්‍ය ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ, දේශපාලන පක්ෂ පවත්වාගෙන යන්නට යත්න දරන ආධිපත්‍යයට, සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය තර්ජනයක් ලෙස දකින ජාතිකවාදී දේශපාලන පක්ෂ ප්‍රකාශයට පත්කරන අනාරක්ෂිතභාවයට ද විශේෂිත හේතුව වන්නේ එයයි.

දේශපාලන, ව්‍යවස්ථාමය සහ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රශ්න පිළිබඳ මහජන කතිකාව ගුණාත්මක වශයෙන් පෝෂණය කිරීම,

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කරමින් සිටින තවත් ප්‍රධාන වැඩ කොටසකි. ඉහළ ගුණාත්මකබවින් යුත් ප්‍රකාශන, කාලීන දේශපාලන සහ ප්‍රතිපත්ති ප්‍රශ්න සම්බන්ධයෙන් නිතිපතා සහ හොඳින් සිතා මතා කරන මාධ්‍ය නිවේදන, විශේෂඥයින් මෙන් ම පොදුජන සාමාජිකයන්ගේ ද පුළුල් සහභාගීත්වයකින් යුතු සම්මන්ත්‍රණ ආදිය, සුවිශේෂී ආයතනික අනන්‍යතාවක් ගොඩනගා ගැනීමට සහ පවත්වාගෙන යෑමට ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට අවස්ථාව සැලසූ ක්‍රියාකාරකම් ය.

ප්‍රකාශන වැඩසටහන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ තවත් ප්‍රධාන කාර්යයකි. එහි විශේෂ ලකුණ වන්නේ, අන්තර්ගතය සහ ප්‍රකාශනයේ ගුණාත්මකභාවය මෙන් ම රටේ දේශපාලන සංවාදයේ වැදගත් වන ඉතාමත් කාලීන දේශපාලන සහ ප්‍රතිපත්ති ප්‍රශ්න කෙරෙහි ඒවායේ තේමාත්මක අදාළත්වය යන දෙආකාරයෙන් ම ඉහළ ගුණාත්මකබවින් යුත් ප්‍රකාශන වීම යි. වෙළුම් තුනකින් යුතු 'ශ්‍රී ලංකා ජනරජයට වසර 40 ක් : ව්‍යවස්ථා ඉතිහාසය, න්‍යාය සහ භාවිතය ගැන පරාවර්තන (2012)' ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ දේශපාලන සහ ව්‍යවස්ථාමය ප්‍රශ්න පිළිබඳව ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි විද්වතුන් විසින් ලියන ලද ඉහළ පෙළේ විවේචනාත්මක අධ්‍යයනයන්ගේ සංයුක්තයකි.

මේ අතර, කොළඹ කේන්ද්‍රීය, නාගරික නැඹුරුවක් සහිත සහ ප්‍රභූවාදී යැයි චෝදනා එල්ල වූ විවේචනවලට නිර්මාණාත්මක ලෙස ප්‍රතිචාර දැක්වීමට හැකි වීම විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රයේත් එහි නායකත්වයේත් ගෞරවයට හේතු වන්නකි. මෙය, ඔවුන්ගේ අවධානය වෙනතකට යොමු කරන්නන් විසින් සිවිල් සමාජ සංවිධානවලට එරෙහිව පොදුවේ එල්ල කරන චෝදනාවක් වී ඇත. කොළඹ පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදකයින්, වෘත්තීය ප්‍රජාවන්, ජාත්‍යන්තර ක්‍රියාකාරීන් සහ ශාස්ත්‍රඥයින් සමග වැඩ කරන බව පෙනෙන්නට තිබීම නිසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම චෝදනාවට ගොදුරු වීමේ ඉඩකඩ වැඩි විය. මානව හිමිකම් සහ සාම අධ්‍යාපනය, සංහිඳියාව, ප්‍රජා මට්ටමේ සාමය ගොඩනැගීම, තොරතුරු සඳහා පුරවැසි අයිතිය ආදියේ දී, තෘණ මූල මට්ටමේ සමාජ ක්‍රියාකාරකම්වල යෙදෙමින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ක්‍රියා කරන බව විවේචකයින් අඩුවෙන් දන්නා කාරණයකි. ශ්‍රී ලංකාවේ ගම්බද දිස්ත්‍රික්කවල සිංහල සහ දෙමළ කතාකරන ප්‍රජාවන් සමග පුරවැසියන් බල ගැන්වීමේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා අධ්‍යාපන වැඩසටහන්වල දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යමණ්ඩලයේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයින් අතරින් කෙනෙකු වන ලයනල් ගුරුගේ පුරෝගාමී කාර්යභාරයක් ඉටු කළේ ය.


අවසන් වශයෙන්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ලෙස ආචාර්ය සරවනමුත්තු ලබාදුන් අත්‍යවශ්‍ය වූ නායකත්වයට පිළිගැනීමක් ලබාදීම අවශ්‍ය වෙයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සහ එහි කැපවීමෙන් යුතු කාර්යමණ්ඩලයට ඔහු දක්ෂ ලෙස, ඉවසිලිවන්තව, නිර්භීතව සහ දිගුකාලීන දැක්මකින් යුතුව නායකත්වය දුන්නේ ය. එමගින්, සතුරු පරිසර ගණනාවක් සමග සාර්ථකව ගනුදෙනු කිරීමට සහ එහි ආරම්භක මුලධර්ම හෝ සම්මත පිළිගැනීම් කිසිවකට හානි කර ගැනීමකින් තොරව තම ආරක්ෂාව සලසා ගැනීමටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට හැකියාව ලැබිණි. එලෙස, සරවනමුත්තු මහතා ආදර්ශමත් සිවිල් සමාජ ආයතන ගොඩ නගන්නකු සහ සමාජ ක්‍රියාකාරී නායකයෙකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ඔහුගේ නම සහ පෞද්ගලිකත්වය සමග දැඩි ලෙස අනන්‍ය වන්නේය යන කාරණය, හෘද සාක්ෂියක් සහිත පුරවැසි නායකයකු වශයෙන් ඔහුගේ පුද්ගලිකත්වයට ද ජයග්‍රහණයන්ට ද උපහාරයකි.

---

**මහාචාර්ය ජයදේව උයන්ගොඩ**

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව සහ මහජන ප්‍රතිපත්ති අධ්‍යනාංශයේ හිටපු ජ්‍යේෂ්ඨ මහාචාර්යවරයෙකි. කලක් වමේ දේශපාලන ක්‍රියාධරයකු වන අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආරම්භක සාමජිකයෙකු මෙන්ම අධ්‍යක්‍ෂ මණ්ඩල සමාජිකයකු ද ශ්‍රී ලංකා පදනම් ආයතනයේ හිටපු සභාපතිවරයා ද වේ. ප්‍රවාද සඟරාවේ සම සංස්කාරකවරයා වන අතර දේශපාලන විද්‍යා විෂය පිළිබඳ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් බොහෝ කෘති රචනා කර තිබේ. එසේ ම යාපනය විශ්වවිද්‍යාල කවුන්සිලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයනය කටයුතු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් ද, ජාතික අධ්‍යාපන ආයතනයේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර තිබේ. ඔහු චිත්‍රපට හා කලා විචාරකයෙකි.

# විසිපස් වසරක ප්‍රගාමී මැදිහත්වීම්



**තිස්ස ජයතිලක**

මා මිත්‍ර ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුගේ නායකත්වයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ක්‍රියාශීලී සහ ඵලදායි වසර විසිපහක සේවය මෙම වසරේ සනිටුහන් කරයි. මා ද වසර කිහිපයක් පාලක මණ්ඩලයේ සේවය කර ඇති විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, රටේ ප්‍රජාතන්ත්‍රීය පාලනය සහ ගැටුම් පරිණාමය ඉදිරියට ගෙන යෑම සඳහා වූ ස්වාධීන සහ නිර්-පාක්ෂික සංවිධානයකි. එය තම මූලික භූමිකාව ලෙස දකින්නේ 'ගැටුම් නිරාකරණය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා ප්‍රචණ්ඩකාරී නොවන විකල්ප ප්‍රතිපත්ති සහ පරමාදර්ශ වෙනුවෙන් පෙනී සිටීම අරමුණු කර ගත් ප්‍රගාමී සහ මැදිහත්වීම' සඳහා වූ මහජන ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වීම ය.

වසර විසිපහක කාලය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇටමැස්සෙකුගේ භූමිකාව (සම්මතයට යටත් නොවෙමින් වරද දුටු තැන එළිදරව් කරමින්, පහර දෙමින් නිවැරදි වීමට පාලනයන්ට බල කරන භූමිකාව) ඉටු කළේ ය. එය දේශපාලන ගතානුගතිකත්වයට පහර දුන්නේය, ආණ්ඩු වගවිය යුතු තත්වයට පත් කළේ ය, ප්‍රජාතන්ත්‍රීය පාලනයට හානිකර ව්‍යවස්ථාවන්ට අභියෝග කළේ ය, සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය සඳහා තීරණ ගැනීමට ප්‍රචණ්ඩ නොවන ආකාරයට බලපෑම් කළේ ය. එසේ කිරීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 'පුද්ගලයන්ට වඩා දේශපාලන හේතු සාධක' වෙනුවෙන් පෙනී සිටියේ ය.

එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යයන් පහත සඳහන් වන මූලික ක්ෂේත්‍රයන් වටා ගොනු විය.

අ. සමාජ ගැටලු සහ වෙනසක් සඳහා පෙනී සිටීමට දැනුවත්භාවය නගා සිටුවීම සඳහා පළාත් පාලන සහ ප්‍රජා මූලික සංවිධාන සමග සමීපව වැඩ කිරීමෙන් හැකියාවන් ගොඩනැගීම.

ආ. මූලික අයිතිවාසිකම් මෙන්ම ව්‍යවස්ථා සම්මත කිරීමට පෙර පුනරීක්ෂණය සඳහා නීතිමය පියවර ගැනීමෙන් මහජන වුවමනාවන් වෙනුවෙන් නීති ක්‍රියා මාර්ග ගැනීම.

ඇ. ප්‍රධාන ප්‍රවාහයේ පුරවැසියන්ගේ විශේෂයෙන්ම කොන් කරන ලද සහ බැහැර කරන ලද පුරවැසියන්ගේ විවිධ වූ අදහස් ප්‍රකාශනය සඳහා මාට්‍රම්, විකල්ප සහ ග්‍රවුන්ඩ්වීව්ස් (*Groundviews*) හරහා අවකාශයක් ලබා දීම

ඈ. මහජන ප්‍රතිපත්ති විශ්ලේෂණය කරන පර්යේෂණ සහ මතවාදය වෙනුවෙන් පෙනී සිටීම, ප්‍රජාතන්ත්‍රීය පාලනයේ විශේෂයෙන්ම සාමය සහ මානව අයිතිවාසිකම් මූලික අන්තර්ගතය වන ප්‍රතිපත්ති හඳුනා ගැනීම සහ විකල්ප මත ඉදිරිපත් කිරීම.

ඉ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ ඒකකය, *Social Indicator* හරහා ජනමත විමසුම් පැවැත්වීම. මෙම ආයතනය වරින් වර සමාජ දේශපාලන ගැටලු ගණනාවක් පිළිබඳව ජනමත විමසුම් පවත්වයි. මෙම ජනමත විමසුම්වල සොයා ගැනීම් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ න්‍යායපත්‍රය ශක්තිමත් කිරීමට යොදා ගැනේ. සෝෂල් ඉන්ඩිකේටර් සාමාන්‍ය ජනතාවට තම දෛනික ජීවිතයට බලපාන ගැටලු පිළිබඳව තම ඕනෑ එපාකම් ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ද වේ. මේ ආකාරයට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සෝෂල් ඉන්ඩිකේටර් මැතිවරණ දෙකක් අතර කාලයේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ප්‍රතිපත්ති සම්පාදකයන් කෙරේ බලපෑම් කිරීම බලගැන්වීමේ මාර්ගයක් ද වේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි එකතුව සමග ගොඩනැගූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (*CMEV*) සඳහා ලේකම් කාර්යාලය ලෙස ද ක්‍රියා කරයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ භාෂා පරිවර්තන ඒකකය විභාෂා නමින් වැඩසටහනක් පවත්වන අතර ඉන් භාෂා පරිවර්තන පුහුණුව සහ භාෂා පරිවර්තන අධ්‍යයන පිළිබඳ සහතිකයක් ද ලබා දේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පසුගිය ව්‍යාපෘති සහ වැඩසටහන් අතර පහත සඳහන් ඒවා ද වේ.

- සාම ක්‍රියාවලියට බලපාන සාධක අධීක්ෂණය
- මැතිවරණ සහ සුළුතරය: වත්මන් ප්‍රශ්න සහ අනාගතය සඳහා විකල්ප
- ශ්‍රී ලංකාවේ බලය බෙදා හදා ගැනීම, ආණ්ඩුක්‍රම සහ දේශපාලන ලිපි ලේඛන 1926-2008
- නිවසෙන් පිටත වූ නිවස: ශ්‍රී ලංකාවේ ළමයින්, අවතැන්වීම සහ ආරක්ෂාව. ඊළඟට කුමක් ද?
- ත්‍රිකුණාමලය අධි ආරක්ෂක කලාපය සහ විශේෂ ආර්ථික කලාපය 2008
- ශ්‍රී ලංකාවේ එච්අයිවී/ඒඩ්ස්: ප්‍රතිපත්ති සහ භාවිතාව පිළිබඳ හරස්කඩක් 2007

පවතින සමාජ සහ දේශපාලන ගැටලු ගණනාවක් පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශන ගණනාවක් පවතින අතර ඒ සියල්ල ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුය. ඉන් සමහරක් පහත දැක්වේ:

- කොවිඩ් ප්‍රතිකාරය රෝගයට වඩා නරක ද? ශ්‍රී ලංකාවේ කොවිඩ් පාලනය පිළිබඳ ආවර්ජනයක් (2021) සංස්කරණය: ප්‍රදීප් පීරිස්
- 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කෙටි මාර්ගෝපදේශයක්. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයක්
- සංක්‍රාන්ති යුක්තිය: පොරොන්දුවලින් ඔබ්බට (2017) සංස්කරණය: භවානි ෆොන්සේකා
- 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය- අන්තර්ගතය සහ සන්දර්භය (2016) සංස්කරණය: අසංග වැලිකල
- ශ්‍රී ලංකාවේ ජනාධිපති ක්‍රමය සංශෝධනය කිරීම/ ප්‍රභවය, ප්‍රශ්න සහ අපේක්ෂා - වෙළුම 1 සහ 2 (2015) සංස්කරණය : අසංග වැලිකල
- 40 වසරක් පසු කරන ශ්‍රී ලංකාවේ ජනරජය: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

ඉතිහාසය, න්‍යාය සහ භාවිතාව 1 සහ 2 වෙළුම් (2012) සංස්කරණය: අසංග වැලිකල

- 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ හරය සහ ක්‍රියාවලිය (2011) සංස්කරණය: රොහාන් එදිරිසිංහ සහ අරුණි ජයකොඩි

මහජන ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වඩාත් මෑතකාලීන ප්‍රතිචාර වන්නේ පහත සඳහන් ඒවා ය:

- යෝජිත මුදල් පනතට (2021) එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් ගොනු කිරීම *(SC 28/21)*
- ළමා ශ්‍රමය, ජාවාරම සහ ලිංගික සූරාකෑම පිළිබඳ මුක්තිය අවසන් කරන මෙන් සිවිල් සමාජයෙන් ඉල්ලා සිටීමේ ප්‍රකාශය
- ශ්‍රී ලංකාවේ සෞභාග්‍ය දැක්ම: ලබා දෙන ලද පොරොන්දු ගැන විවේචනය සහ වත්මන් ප්‍රවණතා (2021)
- 2021 වරාය නගරය පනත පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස
- ජනාධිපති විමර්ශන කොමිසම සහ දේශපාලන පළිගැනීම් පිළිබඳ විශේෂ ජනාධිපති විමර්ශන කොමිසම පිළිබඳ අදහසක් (2021)

ඉහතින් දක්වන ලද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ක්‍රියාකාරකම් සලකා බලන විට එහි ආරම්භයේ සිට පසුගිය වසර 25 තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රීය පාලනය, සාමය සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා කරන ලද දායකත්වය අතිවිශාලය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජයග්‍රහණ වඩාත් ප්‍රශංසනීය වන්නේ ඊට හැම විටම තමන් පෙනී සිටි අරමුණු වෙනුවෙන් හිතකර නොවූ සමාජ දේශපාලන පරිසරයක ක්‍රියාත්මක වීමට සිදුවීම සැලකිල්ලට ගැනීමේ දීය. තමන් පෙනී සිටි අරමුණු ඉටු කිරීමේ දී අවස්ථා ගණනාවක දීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට අධිකාරිවාදී ආණ්ඩුවේ තර්ජන, බිය ගැන්වීම්, බලකිරීම් හා එදිරිවාදුකම්වලට මුහුණ දීමට සිදු විය. මෙම ආයතනයේ විධායක අධ්‍යක්ෂකට පසු ගිය කාලයේ දී මරණ තර්ජනවලට පවා මුහුණ දීමට සිදු විය. වෙනත් මිනිසුන් හෝ ගැහැනුන් ඉදිරිපත් වූ බාධක හමුවේ තම වැඩ කටයුතු අතහැර දමනු ඇත. එහෙත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි කාර්යමණ්ඩලය ඒවාට ධෛර්මත්ව මුහුණ දුන්නේ ය. අතිශයෙන්ම දුෂ්කර තත්ත්වයන් යටතේ පවා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී අගයන් වෙනුවෙන් අභීතව පෙනී සිටීමෙන් ඔවුන්ට තම මතවාදය නොසැලී ඉදිරියටම ගෙන යෑමට ධෛර්යයක් තිබිණ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට නැවත වරක් වර්තමානයේ පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා තම සම්පත් වෙන් කිරීමට සිදු විය හැකිය. වත්මන් ආණ්ඩුව ඊට පෙර පැවති ආණ්ඩුවෙන් හඳුන්වා දුන් සමහර ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධන ආපසු හරවා ඇත. 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් නැවත වරක් විධායක ජනාධිපති ක්‍රමය තුළට බලතල ඒකරාශී කර ගැනිණ. ත්‍රස්ත මර්දන නීති දිගටම භාවිත කිරීම, පරිපාලනය හමුදාකරණය කිරීම සහ අධිකරණයේ ස්වාධීනත්වය දුර්වල කිරීම නිසා නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ අනෙකුත් මූලික නිදහස අනතුරට පත් කරයි.

මෙම සන්දර්භයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි සංවිධානවලට ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ආරක්ෂා කිරීමේ සටනට අවතීර්ණ වීමටත් සියලු පුරවැසියන්ගේ සමානත්වය සඳහා සටන් කිරීමටත් නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට බලකිරීමටත් සිදු වනු ඇත.

මේ දක්වා මෙම සංවිධානය අත් කර ගත් ජයග්‍රහණයන්ට මම ශුභාශිංසනය කරමි. ඉදිරි වසරවල දී ද ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශය ශක්තිමත්ව නගා සිටුවීමේ වැදගත් භූමිකාව ඉටු කරනු ඇතැයි විශ්වාස කරමි.

**තිස්ස ජයතලක**

*U.S-Sri lanka Fullbright* කොමිසමේ විධායක අධ්‍යක්‍ෂකවරයා ලෙස කටයුතු කර ඇත. ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයේ සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හිටපු අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඉංග්‍රීසි සහ ඇමරිකානු සාහිත්‍ය පිළිබඳ විශ්වවිද්‍යාල කීපයකම උගන්වා ඇති ඔහු උතුරු කැරොලිනාහි වේක් ෆොරස්ට් විශ්ව විද්‍යාලයෙන් ඉංග්‍රීසි ශාස්ත්‍රපති උපාධිය ද මැසචුසෙට්ස්හි ස්මිත් විද්‍යාලයෙන් පාශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

# කලා ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වය



මහාචාර්ය
**චන්ද්‍රගුප්ත තේනුවර**

ශ්‍රී ලංකාවේ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 25 වැනි සංවත්සරය සමරන අවස්ථාවේ මෙම කෙටි සටහන ලිවීමට ලැබීම ඉමහත් සතුටට කාරණයකි. කලාකරුවකු සහ ක්‍රියාකාරිකයකු වශයෙන්, දේශපාලන අවිනිශ්චිතබව සහ බිය මා වට කොට තිබුණ ද, මහජනයා සහ සිවිල් සමාජ සංවිධාන මා වටා සිටින විට මට ඉතා හොඳ තත්ත්වයක් සහ පහසුවක් දැනෙයි. අනුස්මරණය කළ නොහැකි කළු ජූලි සංහාරය, මගේ දෘශ්‍ය භාෂාවෙන් අනුස්මරණය කිරීමේ වාර්ෂික කලාත්මක මැදිහත්වීම්, 1997 සිට මා සිදු කරන විට, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද පැවතීම ගැන මම සතුටු වෙමි. කෙසේ වෙතත්, 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවන ලද්දේ, ශ්‍රී ලංකාවේ යහපාලනය සහ ගැටුම් පරිවර්තනය සඳහා ආයතන ශක්තිමත් කිරීමට සහ ධාරිතා ගොඩනැගීමට වුව ද, කලාවේ කාර්යභාරය සහ සමාජය මත එහි බලපෑම එය තේරුම් ගත්තේය. විධායක අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තුගේ කාර්යාලය වටා ඇති කලා කෘති මගින් එම තේරුම් ගැනීම ඔප්පු වෙයි. කාර්යමණ්ඩලයේ බොහෝ දෙනෙක්, 1997 සිට සෑම වර්ෂයක ම, මගේ වාර්ෂික ප්‍රදර්ශනයට තවමත් පැමිණෙන බව මම දැක ඇත්තෙමි. සංවිධානයේ ඇති වෙනස එයින් පෙන්නුම් කෙරෙයි. කලාකරුවකු සහ ක්‍රියාකාරිකයකු වශයෙන් මා විශ්වාස කරන්නේ අඩු තරමින් ප්‍රේක්ෂකයින් කිහිප දෙනෙකු සාමාන්‍ය බිත්තියක සැරසිලි අංගයක් ලෙස නොව, අලංකාරය ලෙස හඳුන්වන දෙයින් ඔබ්බට ගොස් කලා කෘතියක් තේරුම් ගැනීම, එම වැඩ කටයුතු දිගට ම කරගෙන යෑමට තීරණාත්මක වන බව යි.

තමන්ගේ මූලික අරමුණු තබා ගනිමින්, සමාජ සංවේදී කලා ක්‍රියාකාරකම්, ප්‍රදර්ශන, වැඩමුළු, සහ සංවාද සංවිධානයට ආධාර කරමින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කලාවට

සැලකිය යුතු දායකත්වයක් ලබා දී තිබේ. උදාහරණයක් වශයෙන් 2010 දී, යුද්ධය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සමකාලීන කලාකරුවන්ගේ ප්‍රතිචාරය ඔවුන්ගේ කෘතීන් තුළින් පෙන්නුම් කිරීමට අවස්ථාව සලසමින් "යුද සමයේ දෘශ්‍ය ප්‍රතිචාරය" කලා ප්‍රදර්ශනය සංවිධානය කිරීමට සහ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උපකාර කළේ ය. නාමාවලිය මගින් සෑම කලාකරුවකුගේ ම නිරූපණ ප්‍රතිජනනය කළ අතර එය ගොඩනගන අවස්ථාවේ කලාකරුවන්ගේ ලිඛිත ප්‍රකාශනයට කලාකරුවෝ විසි දෙදෙනෙක් සහභාගී වූහ. මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ සමකාලීන කලාවේ සුවිශේෂී අවස්ථාවකි.

තවත් උදාහරණයක් නම් දෘශ්‍ය කලා මාධ්‍යය තුළින් සංක්‍රාන්තික යුක්තිය ගවේෂණය කිරීමේ කලාකරුවන්ගේ නේවාසික වැඩමුළුව සහ කලා ප්‍රදර්ශනය යි. එම වසරේ ම පෙබරවාරි මාසයේ භවානි ෆොන්සේකා සහ මා විසින් මෙහෙයවන ලද නේවාසික වැඩමුළුවක දී, ශ්‍රී ලංකාවේ හැම පැත්තකින් ම පැමිණි තරුණ නැගී එන කලාකරුවන් දහ හතර දෙනෙක් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ සංකල්පය සහ ශ්‍රී ලංකාවට එහි අදාළත්වය ගැන සාකච්ඡා සහ විවාද කළහ. වැඩමුළුවෙන් පසු, සාහසික මානව හිමිකම් උල්ලංඝනයන් සහ වින්දිතයින්ගේ ගෞරවය සම්බන්ධයෙන් අවධානය යොමු කළ "සත්‍යයට සත්‍යය" ලෙස නම් කළ ප්‍රදර්ශනය, සත්‍යයට ඇති අයිතිය පිළිබඳ ජාත්‍යන්තර දිනය යෙදුණු 2016 මාර්තු 24 දා ආරම්භ වී ය. මෙය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ විභව් ලලිත කලා ඇකඩමියේ හවුල් උත්සාහයකි.

තීරු ගාස්තු කාණ්ඩ අතරින් 66% කට යුරෝපා සංගමයේ බදු රහිත ප්‍රවේශය ශ්‍රී ලංකාවට ලබා දී තිබූ සහ 2010 සිට තාවකාලිකව අත්හිටුවා තිබූ, සාමාන්‍ය වරණීය යෝජනා ක්‍රමයේ ධන (*GSP* +) තත්ත්වය 2017 මැයි මාසයේ ශ්‍රී ලංකාවට නැවත ලැබීමට පෙර යුරෝපා සංගමය මානව හිමිකම් ප්‍රශ්නය සැලකිල්ලට ගත්තේ ය. රටවල් ජීඑස්පී ප්ලස් ලබාගැනීමට නම් එයට ඇතුළත් වීම සඳහා අවශ්‍ය කොන්දේසි සපුරා ඇති බව ඔවුහු පෙන්නුම් කළ යුත්තෝ ය. එක් කොන්දේසියක සඳහන් වන්නේ 'මානව සහ කම්කරු අයිතීන්, පරිසර ආරක්ෂාව, සහ යහපාලනය සම්බන්ධ ජාත්‍යන්තර සම්මුති 27ක්, එම සම්මුති මගින් තහනම් කොට ඇති කිසිවක් හෝ සම්මුතිවල අරමුණු සහ අවශ්‍යතා සමග නොගැළපෙන කිසිදු ව්‍යතිරේඛයකින් තොරව පිළිගෙන ක්‍රියාත්මක කිරීමට එම රට ක්‍රියා කළ යුතු ය' යන්න යි. අවාසනාවකට ජාතිකවාදීන් සහ දේශප්‍රේමීන් කියන උදවිය විසින් මානව හිමිකම් යන්න සාතන්ගේ වචන ලෙසත්, ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට, ස්වාධිපත්‍යයට, සහ ඒකීය රාජ්‍යයට එරෙහි බටහිර ව්‍යාපෘතියක් ලෙසත්, වැරදි ලෙස අර්ථකථනය කරනු ලැබී ය. එහි ප්‍රතිඵලයක් ලෙස මානව හිමිකම් ක්‍රියාධරයින් ද්‍රෝහීන් ලෙස හංවඩු ගසනු ලැබී ය.

2017 දී, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ මා සභාපතිව සිටිය දී, මානව හිමිකම් පිළිබඳ නොමග යැවූ තත්ත්වය සියලු ම කලා ධාරා මගින් වෙනස් කිරීමට මට හැකි වනු ඇති බවත්, එමගින් සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි වනු ඇති බවත් මම සිතුවෙමි. එබැවින්, දෙසැම්බර් 10 දා ජාත්‍යන්තර මානව හිමිකම් දිනය වෙනස් ආකාරයකින් සැමරීමට 2017 පළමු මානව හිමිකම් කලා ප්‍රදර්ශනයට මුල පුරා මම එය අභිරක්ෂණය කළෙමි. වාර්ෂික කලා කටයුත්තක් ලෙස එය දිගට ම ක්‍රියාත්මක කළ යුතුව තිබිණි. 2018 දී, මා එහි සිටිය දී ම, නව ඇමතිවරයා විසින් වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබී ය. එවිට මතු වූ ප්‍රශ්නය කලා මණ්ඩලයේ සහයෝගය නොමැතිව මා එය කරන්නේ කෙලෙස ද? යන්න යි. මෙම තීරණාත්මක අවස්ථාවේ දෙවැනි මානව හිමිකම් කලා ප්‍රදර්ශනය සංවිධානය කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ නීලන් තිරුචෙල්වම් භාරය උපකාර කළේ ය. ජනාධිපති විසින් අගමැති සහ ආණ්ඩුව ව්‍යවස්ථා විරෝධී ලෙස ඉවත් කරමින් 2018 ඔක්තෝබරයේ ව්‍යවස්ථා කුමන්ත්‍රණ උත්සාහයක් ක්‍රියාත්මක විය. මෑතකාලීන මානව හිමිකම් උල්ලංඝනයන්ට ප්‍රතිචාර දැක්වීමට මාස දෙකක් තුළ කලා කෘති ඉදිරිපත් කිරීමට මගේ සම අභිරක්ෂක ඩේවිඩ් කොටරෙල් *(David Cotterrell)* (ෂෙෆීල්ඩ් හලාම් විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය) සහ මම තීරණය කළෙමු. මානව හිමිකම් පිළිබඳ වැඩ කටයුතු කරන සිවිල් සමාජ සංවිධානවලට සහ ව්‍යවස්ථා කුමන්ත්‍රණය අතරතුර ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කිරීමට හවුල්වීමට එම අවස්ථාවේ බිහි වූ

කණ්ඩායම්වලටත් අපි ආරාධනා කළෙමු. තට්ටු තුනකින් යුතු ගැලරියේ ඉහළ ම තට්ටුව සිවිල් සමාජ ක්‍රියාකාරීන් කරන ලද 'විරෝධතා කලා' (බැනර්, පෝස්ටර්, ප්ලැකාර්ඩ්, ඡායාරූප, ආදිය) සඳහා වෙන් කරන ලද්දේ, මානව හිමිකම් ප්‍රශ්න පිළිබඳව ඔවුන්ගේ සමකාලීන අරගලයේ ප්‍රදර්ශන කුටියක් වශයෙනි. එබැවින්, මෙම ප්‍රදර්ශනයේ අවධානය වූයේ මානව හිමිකම් ප්‍රකාශනයේ 19 වැනි වගන්තිය වන භාෂණයේ නිදහස සහ 21 වගන්තිය වන ප්‍රජාතන්ත්‍රවාදයේ නිදහස යි.

මට සම්බන්ධ සහයෝගීතා හැරුණු කොට, මට මතක හිටින දෘෂ්ටිමය අත්දැකීම් ලබාදුන්, ශක්තිමත් දෘශ්‍යමය ආඛ්‍යාන දෙකක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආධාරයෙන් ඉදිරිපත් වී තිබිණි. පළමුවැන්න, සංජන හත්තොටුව විසින් අභිරක්ෂණය කරන ලද 'බලයේ තීරකයින්' ය. අසංග වැලිකලගේ මෙහෙයවීමෙන් කරන ලද පර්යේෂණ යෙදවුම්, ගෘහ නිර්මාණ ඇඳීම් සහ මාදිලි මගින් දෘෂ්‍යකරණය කරන ලද්දේ, ගෘහ නිර්මාණ ශිල්පී චන්න දාස්වත්ත විසිනි. 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල සහ 13 වන, 18 වන සහ 19 වන සංශෝධනවල ඇතුළත් වූ බල ගතිකයන් පිළිබිඹු කරමින් 1972 සිට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පරිණාමය ප්‍රශ්න කරමින්, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මුහුණ දුන් ගැටුම් සහ මධ්‍යය සහ පරිවාරය අතර ආතතිය නිරූපණය කළ එය විශ්මයජනක දෘෂ්ටිමය අත්දැකීමකි.

දෙවැන්න වූයේ 'තේ කහට' ඡායාරූප ප්‍රදර්ශනය යි. තමන්ගේ ප්‍රජාවේ ජීවනෝපාය, තමන් විසින් ම ග්‍රහණය කර ගනිමින්, ඔවුන්ගේ ම දැක්මෙන් පෙන්වීමට වතුකරයෙන් තෝරාගත් දක්ෂ තරුණයින් හතළිස් දෙනෙකුට අවශ්‍ය ඡායාරූපකරණ පුහුණුව සහ දැනුම ලබා දීම ප්‍රදර්ශනයට සූදානම් වීමේ ක්‍රියාවලියේ දී සිදු කරනු ලැබී ය. ඔවුන්ගේ ජීවිතවල සමාජ, දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික අංශ පිළිබඳ ජනතා විඥානය පුළුල් කිරීම සඳහා ඡායාරූපකරණය යොදා ගනිමින්, කඳුරට දෙමළ ජනතාවගේ ප්‍රකාශ නොකළ ආඛ්‍යානයන් හෙළි කිරීමට දෘශ්‍ය ක්‍රමවේදය යොදාගැනීම ගැන 'තේ කහට' ප්‍රදර්ශනය විශිෂ්ට උදාහරණයකි.

අවසන් වශයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි පුරවැසි මාධ්‍ය ඒකකයේ වෙනත් දායකත්වයක් සහ වැදගත්කමක් සඳහන් කිරීමට මම කැමැත්තෙමි. විශාල සිතුවම්, විශාල මූර්ති සහ ස්ථාපනයන් වැනි මුල් කලා වස්තූන් සමග සංචාරක ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම ශ්‍රී ලංකාවේ දී ඉතා අපහසු ය. කොළඹ දී ප්‍රදර්ශනය කරන ආකාරයට ප්‍රාදේශීයව ඒවා ප්‍රදර්ශනය සඳහා යටිතල පහසුකම් සහ නිසි අවකාශ නැත. තමන් ම වියදම දරන්නේ නම්, දින දෙක තුනකට වඩා ප්‍රදර්ශනයක් පෙන්වීමට අපට හැකියාව නැත. වෙනත් පළාත්වල ජීවත්වන උදවිය ගත් විට, සමකාලීන කෘති බැලීමට මුල් ප්‍රදර්ශන ස්ථාන වෙත යෑමේ සංස්කෘතියක් ඔවුන්ට නැත. කලා කෘති නැරඹීමට හෝ ප්‍රශ්න කිරීමට ප්‍රදර්ශන ස්ථාන වෙත යෑමේ සංස්කෘතිය වියැකෙමින් පවතියි. විභාග සහ සහතික ඉලක්ක කර ගත් අධ්‍යාපනය මේ ආකාරයේ හිඩැසක් නිර්මාණය කොට තිබේ. මෙම තත්ත්වය තුළ, කලාත්මක ප්‍රකාශනය යම් තාක් දුරකට ව්‍යාප්ත කිරීමට මාධ්‍යයට විශාල කාර්යභාරයක් සිදු කළ හැකි ය. එයට ප්‍රතිවිරුද්ධ ලෙස කලාකරුවන්ගේ ඉතා ම විවේචනාත්මක හඬවලට පරණ ධාරාවේ මාධ්‍යයෙන් ඉඩ ලැබෙන්නේ කලාතුරකිනි. මෙහි දී, මගේ වාර්ෂික ප්‍රදර්ශනය වාර්තා කිරීමට සහ විවේචනය කිරීමට ඉඩකඩක් ඔවුන්ගේ ආයතනවලින් ලබාදුන් 'ග්‍රවුන්ඩ් වීව්' සහ 'විකල්ප' යන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කළ පුරවැසි ජනමාධ්‍ය අඩවි ගැන මා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. මගේ ප්‍රදර්ශනයට පමණක් නොව, අනෙකුත් සියලු ම දෘශ්‍ය සහ ප්‍රසාංගික කලා ධාරාවල කැප වූ කලාකරුවන්ගේ විවේචනාත්මක සහ වැදගත් හඬවලට ද, එම අවස්ථා හිමි විය.

---

**මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ, කලා න්‍යායේ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකි. ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ප්‍රදර්ශන ගණනාවක් පවත්වා ඇති චිත්‍ර ශිල්පියෙකි, සිවිල් සමාජ ක්‍රියාධරයෙකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයා ය. කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය ද මොස්කව් ප්‍රාන්ත කලා ආයතනයේ ලලිත කලා ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත. විහව් කලා ඇකඩමියේ ආරම්භක සාමාජිකයෙකි.

# අහඹුවක් නොවූ විශිෂ්ටත්වය



**සාගරිකා දෙල්ගොඩ**

1996 දී මා නිදහස සඳහා වූ ෆෙඩ්රික් න්‍යුමාන් පදනමේ *(Friedrich Naumann Foundation for Freedom) (FNF)* දේශීය නියෝජිත තනතුරේ වැඩ භාර ගත් පසුව මුහුණ දුන් පළමු සහ භාරදූර කාර්යය වූයේ නව සහ අදාළ හවුල්කරුවන් සොයා ගැනීම ය. නිදහස සඳහා වූ ෆෙඩ්රික් න්‍යුමාන් පදනම නිදහස, සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, මානව අයිතිවාසිකම් සහ සමාජ වෙළඳපොළ ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා ලොව පුරා වැඩ කරයි. 'ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක්' පිළිබඳ දැක්මක් ඇති විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අප පදනමේ සමහර වැඩසටහන් සමග සහයෝගයෙන් වැඩ කිරීමට අප වෙත පැමිණි විට එය 'ප්‍රශස්තම' හවුල්කරුවෙකු බවත් දර්ඝකාලීන හවුල්කාරිත්වයක් විය හැකි බවත් අවබෝධ කර ගතිමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ රොහාන් එදිරිසිංහ වැනි සමහර ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් ඔවුන් ආචාර්ය චානක අමරතුංග සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ මණ්ඩලයේ වැඩ කළ සමයේ සිටම දැන සිටියෙමි. අප විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග කළ මුල්ම වැඩසටහන්වලින් එකක් වන්නේ බලය විමධ්‍යගත කිරීම සහ මැතිවරණ සංශෝධන යි. ආරම්භයේ සිටම ප්‍රජාතන්ත්‍රවාදය නගා සිටුවීමට අතිශයින් අදාළ වන මාතෘකා ඉදිරිපත් වූ විට පෙරමුණේම සිටියේත් එවැනි ව්‍යාපෘතිවලට මුල පිරුවේත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යි. මා හැම විටම මෙම ව්‍යාපෘති බොහොමයක් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සුක වූයේ ඒවා පදනමේ අරමුණු සමග ගැළපෙන නිසාම නොව ඒවා පුද්ගලිකවම මා අපේක්ෂා කරන ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් සඳහා සැබැවින්ම අවශ්‍ය කරන නිසා ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ පදනම ක්‍රියාත්මක කළ (*FNF*) ඒකාබද්ධ වැඩසටහන් හරහා ප්‍රජාවන් අතර සංහිඳියාව ගොඩනැගීම පිළිබඳව ආචාර්ය නීලන් තිරුචෙල්වම් වැනි අය සමගත්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව ප්‍රධාන දේශපාලන පක්ෂ අතර එකඟතාවක් ඇති කර ගැනීමට කේතීස් ලෝගනාදන් මහතා සමගත් වැඩ කිරීමේ භාග්‍යය මට අත් විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශන සම්බන්ධයෙන් බලන විට මට ඒවාට *FNF* පදනම වෙනුවෙන් සහයෝගය ලබා දීමට හැකි විය. අපට සමකාලීන ශාස්ත්‍රඥයන්ට පමණක් නොව සමහර විට දේශපාලන විද්‍යාව පිළිබඳ අනාගත ශිෂ්‍යයන්ට ද අගනා ශාස්ත්‍රීය දායකත්වයක් ලබා දීමට ද මෙම කෘති තුළින් හැකි වීම ගැන මම ආඩම්බර වෙමි. 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනය: හරය සහ ක්‍රියාවලිය' සහ 'වසර 40 පසු කරන ජනරජය' යන ප්‍රකාශන දෙක ගැඹුරු ශාස්ත්‍රීය පර්යේෂණයන් මෙන්ම කිසියම් කාල පරිච්ඡේදයක දේශපාලන උභතෝකෝටියකට අදාළ වන්නේයැයි මම විශ්වාස කරමි. මෙම ප්‍රකාශනවල කර්තෘත්වය දැරූ, මගේ පුතාගේ බාලාංශ පංතියේ සිට මා දැන සිටි අසංග වැලිකල සමග වැඩ කිරීම මට මහත් ආශ්වාදයක් විය.

මට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග හවුල් වීමට හැකි වූ විශිෂ්ට සහ සුවිශේෂී ව්‍යාපෘති දෙකක් වන්නේ අන්තර්ජාතික ත්‍යාගලාභී 'බලයේ මංකඩ' (*Corridors of Power*) සහ එහිම කොටසක් වූ 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ත්‍රිමාන දර්ශකය' (*3D Modelling of the Constitution*) යි. ඒ දෙකේම ප්‍රධාන නිර්මාතෘ වූයේ සංජන හත්තොටුව යි.

මා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග හවුල්කරුවෙකු වශයෙන් සම්බන්ධ වී *FNF* පදනමට කරන ලද වැඩ සියල්ල හෝ අඩු වශයෙන් වැඩි කොටසක් සටහන් කරන්නේ නම් එය පොත් පිංචක් වන බව මම දනිමි. එමනිසා දශක දෙකකට ආසන්න කාලයක් පැවති මෙම හවුල්කාරිත්වය මගේ වෘත්තීය ජීවිතයේ වඩාත්ම ඵලදායී සහ ආශ්වාදජනක අත්දැකීමක් බව සටහන් කිරීමට සීමා වන්නෙමි.

මගේ ප්‍රශස්තම සහ හොඳම සටහන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු වෙනුවෙන් වෙන් කරන්නෙමි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ අගනාම බුද්ධි මණ්ඩලයන්ගෙන් එකක් බවට පත් වූයේ, විශේෂයෙන් ස්වාධීන ප්‍රතිපත්ති පර්යේෂණ සහ මතවාද ඉදිරිපත් කිරීමේ ආයතනයක් බවට පත් වූයේ ආචාර්ය සරවනමුත්තුගේ මාර්ගෝපදේශ, හැකියාවන් සහ දායකත්වය නිසාය. ඒ ආකාරයෙන්ම මට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග *FNF* පදනම කළ සැලකිය යුතු වැඩ කොටස ගැන ආඩම්බරයෙන් කතා කළ හැකි වන්නේ ආචාර්ය සරාගේ මාර්ගෝපදේශ, සහයෝගය සහ දායකත්වය නිසා ය.

ආචාර්ය සරා සහ අපගේ හවුල්කාරිත්වය - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය/ *FNF* යන දෙකටම ගැළපෙන ඇරිස්ටෝටල්ගේ උද්ධෘතයකින් මේ සටහන අවසන් කරනු කැමැත්තෙමි.

"විශිෂ්ටත්වය යනු අහඹුවක් නොවේ.

එය හැම විටම උසස් අභිප්‍රායෙහි, අවංක ප්‍රයත්නයෙහි සහ බුද්ධිමත් ක්‍රියාවෙහි ප්‍රතිඵලයකි.

එය බොහෝ වූ විකල්පයන්ගේ බුද්ධිමත් තේරීම නියෝජනය කරයි, තේරීම අහම්බයක් නොව ඔබගේ ඉරණම තීරණය කරන්නකි."

---

**සාගරිකා දෙල්ගොඩ**

*FNF* ආයතනයේ ශ්‍රී ලංකා නියෝජිතවරිය ලෙස වසර ගණනාවක් ම කටයුතු කොට විශ්‍රාම ගොස් ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හිටපු අධ්‍යක්ෂවරියකි. සමාජ ක්‍රියාකාරිනියකි.

# විසිපස් වසරක මතක විනිවිද



ලයනල් ගුරුගේ

කාලය අතින් අල්ලා නතර කළ හැකි යමක් නොවේ. එය ඔහේ ගලාගෙන යයි. අපේ ජීවිත ද ඒ සමඟ සමගාමීව පාව යයි. ජීවිතවලට අරුතක් එක් කරන්නේ ගලා ගිය කාලය තුළ අප කළ වැඩ කොටස ය. වසර 25ක් අඛණ්ඩව විසූ වැඩ බිමක, වැඩ කළ අතීතය දෙස හැරී බලන්නට සිතේ. දැවැන්ත අභියෝග හා හැලහැප්පීම් අතර ගෙවුණු ඒ කාලපරිච්ඡේදය ගැන, එහි ක්‍රියාකාරී ව සිටි චරිත ගැන පොතක් ලියන්නට තරම් අත්දැකීම් සමුදායක් මගේ මතකයේ තැන්පත් ව තිබේ. එහෙත් මේ මොහොතේ කළ හැක්කේ තෝරාගත් කරුණු කිහිපයක් සංක්ෂිප්තව සටහන් කිරීම පමණකි.

### බීර හමුවක ඇති වූ කතා බහ

මගේ මතකය දිව යන්නේ 1996 වර්ෂයේ එක්තරා දිනයකට ය. කොළඹ විශ්වවිද්‍යාලයේ මාගේ ඇදුරුතුමෙකු වූ මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා පණිවිඩයක් එවා තිබුණි, ඒ විගස විත් ඔහු හමු වන්නැයි කියා ය. විශ්වවිද්‍යාල කාලයේ සිටම දැන හැඳුනුම්කමක් ඇති ඔහු අප ආදරය කළ මිනිසෙකි. මම වහා ඔහු හමුවට ගියෙමි. ඔහු සමඟ රොහාන් එදිරිසිංහ මහතා ද විය. උයන්ගොඩ මහතාගේ ආරාධනයෙන් මම ඔවුන් දෙපළ සමඟ ආචාර්යවරුන් සඳහා වන ක්ලබ් එකක දී බීර පානයකට ද එක් වුණෙමි.

අලුතින් ආයතනයක් පිහිටුවා විශේෂ වැඩ කොටසක් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බවත්, තමා ද එහි අධ්‍යක්ෂවරයෙකු වනු ඇති බවත් එම ආයතනයට මා ද සම්බන්ධ වනු දැකීම ඔහුගේ අපේක්ෂාව බවත් උයන්ගොඩ මහතා මට කීවේ ය. පිහිටුවීමට නියමිත ආයතනයේ

විධායක අධ්‍යක්ෂ වන්නේ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු බව ද කී මුත් එදින ආචාර්ය සරවනමුත්තු මා හට මුණ නොගැසිණි.

### 'හොඳට හිතල ගත්ත තීරණයක්'

පසු දිනෙක නීති පීඨයේ උඩ තට්ටුවේ පිහිටි 'සෙග්‍රා' හි දී මටආචාර්ය සරවනමුත්තු හමු විය. එහි දී අප දීර්ඝ වශයෙන් සමාජීය, දේශපාලන කාරණා පිළිබඳ සාකච්ඡා කළෙමු. මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා ද එම සාකච්ඡාවට හවුල් විය. පළමුවෙන් මට යම් දෙගෙඩියාවක් ඇති වූ මුත් මා සිවිල් සමාජයේ වැඩ කරමින් සිටින ක්ෂේත්‍රයට වඩා අලුත් යමක් කළ හැකි වේය යන බලාපොරොත්තුවකින්, නැවුම් හැඟීමකින් මා පිබිදෙන්නට විය. ආචාර්ය සරවනමුත්තු මට පැවසුවේ විධායක අධ්‍යක්ෂ හැටියට ඔහුගේ පඩිය රු. 15,000ක් බවත් මට රු. 10,000ක වැටුපක් ලබා දිය හැකි බවත් ය. අලුත් තැනක වැඩ කිරීම ලැබුණ ආරාධනය සමඟ ම මාගේ ඇතුළු සිත තුළ ගැටුමක් හට ගත්තේ මා ඒ වන විට වැඩ කරමින් සිටි ආයතනයෙන් ගෙයක්, වාහනයක් සමඟ මනා වැටුපක් ලබා දී තිබුණ බැවිනි. ඒ ආර්ථිකමය සමෘද්ධිය අතැර ඒමට යම් චකිතයක් නොතිබුණා ම නොවේ. නමුත් අවසානයේ අලුත් තැන සේවයට යෑමට මම තීන්දුවක් ගතිමි. ඒ සඳහා බිරිඳගේ සහාය ද නොමදව හිමි වීම මා තවත් දිරිමත් කළේ ය.

අලුත් ආයතනයේ වැඩ ඇරඹීම සඳහා අප මුලින්ම පැමිණියේ ලොන්ඩන් පෙදෙසට ය. මා සමග ලිබරල් පක්ෂයේ වර්තමාන නායක නීතිඥ කමල් නිශ්ශංක ද එහි සිටියේ ය. අප වැඩ කළේ ඩොක්ටර් සරාගේ ගෙදරින් ගෙනෙන ලද මේස දෙකක ය.

### විකල්ප ප්‍රතිපත්ති සඳහා වූ කේන්ද්‍රය

ලොන්ඩන් පෙදෙසට පැමිණ අප සිටියේ මාසයක් පමණ කෙටි කාලයක් පමණි. පසුව ෆ්ලවර් රෝඩ්හි 32/3 දරන ස්ථානයකට පැමිණියේ 1997 මුල් කාලයේ ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හරි ආරම්භය සිදු වූයේ මල්පාරේදී ය. එහි සිටියේ පස් හය දෙනෙක් තරම් කුඩා පිරිසකි. ඒ අතර සාවිත්‍රී, ශසී සහ මැණික්ගේ නම් මෙහි දී මගේ සිහියට නැගේ.

අප මෙහි දී සිදු කළ ආරම්භක හා ප්‍රධාන මැදිහත්වීම් අතර මැතිවරණ නිරීක්ෂණය ඉදිරියෙන්ම විය. ඒ සඳහා අප නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා තවත් සංවිධාන සමග එක්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය *(CMEV)* පිහිටුවාගත් අතර අප නිරීක්ෂණය කළ පළමු මැතිවරණය වූයේ 1997 පළාත් පාලන මැතිවරණය යි. ආචාර්ය අර්ජුන පරාක්‍රම එහි නියමුවා ලෙස කටයුතු කළේ ය. ඔහු තොරතුරු ගැනීම පිළිබඳ ක්‍රමවේද හදමින්, අධ්‍යයන කරමින් සියලු කටයුතු සිදු කළේ ය. සනක නම් තරුණයා මෙහි ක්ෂේත්‍ර කටයුතු භාරව කටයුතු කළේ ය. (සනක සමරසිංහ අද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉහළ තනතුරක් ඉසිලීම සතුටකි.) ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී වරුණ කරුණාතිලකද එහි දී අප සමඟ වැඩ කළේ ය.

පසුව "සෝෂල් ඉන්ඩිකේටර්" සහ "මාධ්‍ය ඒකකය" ද මේ ස්ථානයේ දීම ආරම්භ කෙරුණි. ප්‍රදීප්, අස්රා සහ උදිත මේ කාලයේ දී අප හා එක් වූහ. මේ අතරතුර පැවසිය හැකි අතුරු කතන්දර බොහොමයක් තිබුණ ද මේ ඒ සඳහා වේලාව යැයි නොසිතමි. ඒ නිසා ඇවැසිම දේ පමණක් ලියා තබමි.

### වැඩබිමට බැසීම

අප ආයතනයේ කොළඹ කේන්ද්‍රීයව හෝටල්වල සිදු වන සම්මන්ත්‍රණ ආදී වැඩ බහුල වන විට ඊට එහා වන බිම් මට්ටමේ වැඩ කිරීමේ නොතිත් ආශාවකින් මම පසුවීමි. මම ඩොක්ටර් සරා හමුවීමට ගොස් රු. 5,000ක මුදලක් ඉල්ලා සිටියේ කොළඹ මහජන පුස්තකාලය කේන්ද්‍ර කර ගනිමින් විද්වත් සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමට ය. ඔහු ඊට එකඟ විය. එවක අප සමඟ වැඩ කළ තරුණ පිරිස ද ළෙංගතුව සහෘදභාවයකින් වැඩ කළහ. සමාජයේ සිදු වන විවිධ සමාජ දේශපාලනික කාලීන සිදුවීම් අලළා විද්වත් සාකච්ඡා මාලාවක් අපි පැවැත්වූයෙමු. මෙය බිම් මට්ටමේ වැඩ ආරම්භ කළ පළමු අවස්ථාවයි. 1997 සිට අවුරුදු කිහිපයක් ම මෙම සංවාද මාලාව අඛණ්ඩව පැවැත්වීමට හැකි විය. 'වතුර වීදුරුවක් වත් නොදී මෙවැනි සංවාද සඳහා මිනිස්සු සහභාගී වීම ගැන' අප සමඟ වැඩ කළ ඇතැම් පර්යේෂක පර්යේෂිකාවෝ පුදුමයට පත් වූහ. මෙම සංවාද මාලාව බෙහෙවින් ජනප්‍රිය වූ අතර ජාතික පුවත්පත්වලද සාකච්ඡාවට බඳුන් කෙරිණි. සංවාදවලින් පසු ඒ පිළිබඳ යම් ප්‍රකාශනයක් එළිදැක්විය යුතු බව මහාචාර්ය උයන්ගොඩ යෝජනා කළ

අතර මම ඒ සම්බන්ධයෙන් කුඩා පොත් ගණනාවක් සකස් කළෙමි. ඒකී පොත් විවිධ ආයතනවලට සහ පුස්තකාලවලට යැවීමද සිදු කෙරිණි. දෙමළ රැඩිකල් දේශපාලනයේ නායකයකුව සිටි, කේතීෂ් ලෝගනාදන් නැමති බොහෝ අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා ද මේ සඳහා මැදිහත් විය.

සාමය පිළිබඳ සහ නව ව්‍යවස්ථාවක් පිළිබඳ කතිකාව චන්ද්‍රිකා පාලන සමයේ දී වඩාත් තදින් බාහිර සමාජයේ ද අවධානයට ලක් විණ. මහාචාර්ය උයන්ගොඩ සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලෝගනාදන් අතර සංවාදවල දී මේ පිළිබඳ 'නිවුස් ලෙටර්' එකක් කරමු යැයි යෝජනා වූ අතර එය 'සාම කතා' යනුවෙන් නම් කළේ ද මහාචාර්ය උයන්ගොඩ මහතා ය.

### 'සාම විමර්ශී' ඇරඹීම

පසුව කලාප 06කේ යන තෙක් භාෂා තුනෙන් ම විවිධ ලිපි ඇතුළත්ව 'සාම කතා' ප්‍රකාශයට පත් විය. එය දිගින් දිගටම සමාජගත වන අතරේ මාධ්‍යවේදී සුනන්ද දේශප්‍රිය මහතා අප සමඟ සම්බන්ධ වූ අතර මගේ අදහස වූයේ මෙය සඟරාවක් දක්වා සංවර්ධනය කළ යුතු බව ය. ඒ පිළිබඳ සුනන්ද දේශප්‍රිය සමඟ ද සාකච්ඡා කළෙමු. පසුව එය ඩොක්ටර් සරාට ද යෝජනා කළ අතර 'සාම කතා' පසුව 'සාම විමර්ශී' බවට රූපාන්තරණය විය. මා විශ්වවිද්‍යාල සමයේ 'විමර්ශී' යනුවෙන් සඟරාවක් කළ අතර ඒ අභාසයෙන් අවසානයේ 'සාම විමර්ශී' නම තැබීමට කටයුතු කළෙමු. අද දක්වා ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයක් හැටියට පළ වන්නේ එසේ උපත ලැබූ සඟරාව ය. ආරම්භයේ සිට 'සාම විමර්ශී' හි සම කර්තෘවරයෙකු වශයෙන් කටයුතු කරන්නට ලැබීම මා ලැබූ භාග්‍යයකි.

සාම විමර්ශී සඟරාව සිංහල භාෂාවෙන් පළ වූ අතර එහි සහෝදර දෙමළ ප්‍රකාශනය වූ "සමාදාන නෝක්කු" ද පළ කිරීම ඇරඹිණි. සංජන හත්තොටුව අප ආයතනය සමඟ එක් වීමෙන් අනතුරුව 'සාම විමර්ශී' සඟරාව ඉංග්‍රීසියෙන් වෙන ම ප්‍රකාශනයක් හැටියට පළ වූයේ *Peace Monitor* ලෙස ය. එය ද ඉංග්‍රීසි භාෂාව භාවිත කරන ප්‍රජාව අතර මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව අතර ද වඩාත් ජනප්‍රිය විය. විශේෂයෙන් සමාජ මාධ්‍ය විෂයයෙහි සංජනගේ කුසලතාපූර්ණබව අපි එකල හඳුනා ගත්තෙමු.

### කොළඹින් පිටට - මහ පොළවට

මේ අතරතුර කොළඹින් පිට වැඩසටහන්වලට යෑම ආරම්භ කෙරිණි. මා මුලින්ම කොළඹින් පිට බිම් මට්ටමේ වැඩ ආරම්භ කළේ බදුල්ල දිස්ත්‍රික්කයේ ය. එහි වැඩ කිරීම පහසු වූයේ බදුල්ල මා උපන් දිස්ත්‍රික්කය නිසාත්, එහි විවිධ සම්බන්ධකම් තිබුණ නිසාත් ය. ඒ වන විටත් බදුල්ල දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් සහ දේශපාලන ක්‍රියාකාරිකයින් ගණනාවක් හඳුනාගෙන සිටියෙමි. මේ ආදී වශයෙන් බදුල්ල, මොනරාගල අම්පාර ආදී නොයෙක් ප්‍රදේශවලට යමින් විවිධ වැඩසටහන් දියත් කෙරිණි.

ක්ෂේත්‍ර වැඩ අතරතුර දී සිදු වුණ අපූරු සිදුවීමක් මා මතකයට නැගේ. ඒ දිනවල අසංග වැලිකල නම් තරුණයා ද අප සමඟ සම්බන්ධ වී සිටියේ ය. අප විවිධ ප්‍රදේශවල බිම් මට්ටමේ සංවාද පැවැත්වූයෙමු. මෙහි දී මා ප්‍රධාන කථිකයකු නොවූ අතර හුදෙක් වැඩසටහන මෙහෙයවන්නෙක් පමණක් වූයෙමි. සරවනමුත්තු, සුනන්ද සහ අසංග ප්‍රධාන කථිකයන් වශයෙන් සංවාදවලට සහභාගී වූහ. මෙසේ පැවැත් වූ එක් වැඩසටහනකදී භික්ෂූන්වහන්සේලාගෙන් විශාල අභියෝගයක් එල්ල විය. ප්‍රධාන කථිකයන්ට උන්වහන්සේලාට නිසි පිළිතුරක් දීමට නොහැකි වූ අතර උන්වහන්සේලා පාලනය කරගැනීමට බණ අවශ්‍ය විය. එදා එම භික්ෂූන්වහන්සේලාට උත්තර දීමේ හැකියාව තිබුණේ මට පමණි. අග්ගඤ්ඤඵල සූත්‍රය, මහා පරිනිබ්බාන සූත්‍රය ආදී සූත්‍ර හදාරා සිටි මට එදා පැමිණි එදිරිවාදිකම සමනය කිරීම පහසු විය. අප සමඟ ආරවුලට එන භික්ෂූන් වහන්සේලාට මා උත්තර දුන්නේ බෞද්ධ දර්ශනයෙනි. දෙතුන්සීයක සෙනඟක් අතරින් පනස් දෙනෙකුගෙන් පමණ යුත් කණ්ඩායමක් විසින් දිගින් දිගට අපව ප්‍රශ්න කරනු ලැබිණි. අවසන ධර්මය ඔස්සේ ඔවුන්ව මෙල්ල කිරීමට හැකි විය. ජාතිවාදය, කුලවාදය සහ මිනිස්කම ගැන බුදුන්ගේ දේශනා දිගින් දිගටම ඔවුන් ඉදිරියේ කියා පාන විට ප්‍රධාන වේදිකාවේ නොසිටි 'මා කවරෙක්ද' යන්න ඔවුන්ගේ පැනය විය. ඔවුන් පැමිණියේ ආචාර්ය සරවනමුත්තු ඇතුළු පිරිස හෙළාදකිමින් අපහසුතාවට පත් කිරීමට ය. එදා සංවාදය අප හැමගේම ජීවිතවලට අලුත් අත්දැකීමක් වූවා සේම අපේ විවිධ ක්‍රියාකලාපයන් නව මානයකට හරවනු ලැබිණි.

**ධර්ම යුද්ධයෙන් පසු අලුත් මාවත**

එම වැඩසටහන අවසන් කොට පැමිණි අප නතර වූයේ ඇල්ල ප්‍රදේශයේ නවාතැන් පොළක ය. එදා රාත්‍රියේ අපි දිවාකල වූ සංවාදය ගැන දිගින් දිගටම සාකච්ඡා කළෙමු. එකී දීර්ඝ සංවාදයේ ප්‍රතිඵලයක් හැටියට, 'ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය සහ විසඳුම්' කෘතිය නිර්මාණය විය. සරා ඇතුළු පිරිස මට යෝජනා කළේ මෙය සිංහල භාෂාවෙන් රචනා කරන හැටියට ය. පසුව ජන වාර්ගික අර්බුදය සම්බන්ධයෙන් මා කළ වැඩ සහ ලැබූ අත්දැකීම්, කියවූ දෑ ඇසුරු කර ගනිමින් 'ගැටුම් සමථකරණයට බුදුදහම' යනුවෙන් කෘතියක් රචනා කළෙමි. එය රචනා කරන බැව් දන්නා බොහෝ මිතුරන් මට යෝජනා කළේ එය මගේ ස්වාධීන කෘතියක් හැටියට ප්‍රකාශයට පත් කරන ලෙසය. නමුත් මම එය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කෘතියක් හැටියට ප්‍රකාශයට පත් කරන්නට තීරණය කළෙමි.

ඉන් පසුව සාමය, බලය බෙදීම, ගෙඩරල් ආදී විවිධ කාරණා පිළිබඳ වැඩසටහන්, පුහුණු කිරීම් ආදිය ඉතාමත් විධිමත්ව සහ සාර්ථකව බිම් මට්ටමින් සිදු කිරීමේ අවස්ථාව උදා විය. එම වැඩසටහන් ලංකාව පුරා සිදු කිරීමට හැකියාව ලැබිණි. මේ වැඩත් සමගම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රජාව සහභාගී කරගෙන කරන වැඩ පිළිබඳ බාහිර සමාජයේ වැඩි අවධානයක් යොමු විණි. ඒ නිසා ම 'ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් අංශය' නොහොත් "අවුට්රීච්" ආරම්භ කෙරිණි.

**තවදුරටත් ප්‍රජාව සමඟ වැඩ බිමට**

"අවුට්රීච්" හැටියට අප කළ බොහෝ වැඩ පිළිබඳ මතකය අවදි කරන විට මගේ සිත වහා නතර වන තැන් කිහිපයකි. අප පාසල් ළමුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහභාගී කර ගනිමින් අන්තර් සංස්කෘතික හුවමාරු වැඩසටහන් පැවැත්වීම ඉන් වඩාත් සිත් ගන්නා වැඩ කොටසකි. ජනවාර්ගික සුහදත්වය වගා දිගා කිරීම උදෙසා වතුකරයේ දෙමළ දරුවන්, උතුරේ දෙමළ සහ මුස්ලිම් දරුවන්, දකුණේ සිංහල දරුවන් අතර සංස්කෘතික හුවමාරු වැඩසටහන් බොහොමයක් පැවැත්විණි. එය අති සාර්ථක වූ අතර සාම අධ්‍යාපනය සඳහා ද හොඳ පූර්වාදර්ශයක් විය. එවකට පැවති ආණ්ඩුව එය සාධනීය ලෙස භාරගත් බවට ද ඉඟි ලැබිණි. නමුත් ආණ්ඩුව ජවිපෙ සමඟ සන්ධානයකට ගොස් සිටින සමයේ නැවතත් අපගේ වැඩ දෙස වපර ඇසින් බැලූ අවස්ථා නැතිවා ද නොවේ.

මෙම සංස්කෘතික හුවමාරු වැඩසටහන්වල සාධනීය ඵලය වූයේ එදා ශිෂ්‍යයන් හැටියට ඊට සහභාගී වූ පිරිස අද විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හැටියට මෙම එකී හුවමාරු වැඩසටහන් නොයෙක් ප්‍රදේශවල ක්‍රියාත්මක කරනු දැකීම ය.

පසුව ප්‍රධාන කාර්යාලය විවිධ ස්ථානවලට සංක්‍රමණය වන්නට විය. දැන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටා තිබෙන්නේ එසේ තැනින් තැන ගිය ගමනේ සිව් වැනි ස්ථානයේ ය. ෆ්ලවර් රෝඩ් හි කාර්යාලයෙන් පසු 24/2, 28 වන පටුමඟට නැවත මාරු වුණු අතර අප වැඩි කාලයක් ගත කළ තැන එතැන ය. වර්තමාන කාර්යාලය පිහිටා තිබෙන ස්ථානයට අප ආවේ ඉන් පසුව ය. විසිපස් වසරක් ඇතුළත ස්ථාන හතරකට ප්‍රධාන කාර්යාලය මාරු වී තිබේ.

**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැඩ කළ කාලය ඉතාම ඵලදායී බැව් කිව යුතු ය. නීති අණ පනත්වලට පමණක් සීමා වී තිබුණ භාෂා ප්‍රතිපත්තිය ඉන් ඔබ්බට ගෙන ගොස් විවිධ රාජ්‍ය අයතන, සමාජ සංස්ථා ඇතුළු බොහෝ තැන්වල සක්‍රීයව ක්‍රියාත්මක වන තැනට වැඩ කිරීමට අපි වෙහෙසුණෙමු. එක් භාෂාවකින් පමණක් නාමපුවරු තිබුණු බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික ස්ථානවල සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම නාම පුවරු සවි කිරීම සඳහා අපි එම ආයතන සමඟ එක්ව කටයුතු කළෙමු. එසේම බස් රථ නාමපුවරු, දුම්රිය නිවේදන ආදියේද භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් බලපෑම් සහගතව වැඩ කළෙමු. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය යටතේ බොහෝ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු පැවරීම් සඳහා අප මූලිකත්වය ගත් අතර තමන්ගේ භාෂාවෙන් උසස් අධ්‍යාපනය හැදෑරීම සම්බන්ධ විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ නඩුව, ජාතික හැඳුනුම්පත සම්බන්ධයෙන් ගොනු කළ නඩුව ඒ අතරින් සුවිශේෂී වේ. ඉන් ජාතික හැඳුනුම්පත භාෂා දෙකෙන් ම නිකුත් වීම අප ලැබූ ජයග්‍රහණයකි.

ඖෂධ ඇසුරුම්වල සහ භාර්භෝගික භාණ්ඩවල සඳහන් විස්තර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක විය යුතු බවට අප නඩු පැවරූ අතර

පාරිභෝගික භාණ්ඩ ගණනාවක් සම්බන්ධයෙන්, භාෂා ප්‍රතිපත්තියට අනුකූලව තොරතුරු සඳහන් කළ යුතු බවට පසු ගිය දා චක්‍රලේඛ නිකුත් විය. ඖෂධ විස්තර පිළිබඳව වූ නඩුව තවමත් විභාග වෙමින් පවතී. එසේ ම විවිධ රාජ්‍ය ආයතනවල භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විගණනයන්, අධ්‍යයනයන් කොට එහි ඇති අඩුපාඩු හා දුර්වලතා හඳුනාගත් අතර ඒ අතුරින් 2017 දී භාෂා අමාත්‍යාංශය සමඟ එක්ව අමාත්‍යාංශ 49ක රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විගණනයක් සිදු කිරීම සුවිශේෂී වේ. මානව හිමිකම් කොමිසම සහ භාෂා කොමිසම සමඟ එක්ව, අඩපණ වී තිබුණ යාන්ත්‍රණයක් ශක්තිමත් කිරීමට සමත් වීමු. අද දිවයින පුරා ඕනෑම පුරවැසියෙකුට තමන්ගේ භාෂාවෙන් කටයුතු කිරීමේ හැකියාව ඉහළ නැංවී තිබේ. අපට ද ඒ සඳහා දායක වීමට හැකි වූයේ ය යන නිහතමානී සතුට අපි නිතිපතා අත්විඳිමු.

## තොරතුරු දැනගැනීමේ අයිතිය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම තහවුරු කර ගැනීම වෙනුවෙන් සිවිල් සංවිධානයක් හැටියට තොරතුරු අයිතිය පිළිබඳ කතිකාවට ආරම්භයේ සිට ම සම්බන්ධවීමට ලැබීම පිළිබඳව ඇත්තේ ද සතුටකි. අප මේ පිළිබඳ වැඩ කිරීම ආරම්භ කළ මුල් අවදියේ සිහිනයක්ව තිබූ තොරතුරු අයිතිය පසුව පනතක් හැටියට සම්මත වූ පසු ඒ පිළිබඳ රාජ්‍ය නිලධාරීන්, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ජනතා නියෝජිතයන් ඇතුළු පුරවැසියන් දැනුවත් කිරීම සඳහා දිවයිනේ අස්සක් මුල්ලක් නෑර සෑම තැනකම ඇවිද්දෙමු. ඒ බොහෝ තැන්වල පුරවැසියන් තමන්ගේ අයිතීන් තොරතුරු පනත ඔස්සේ ඉල්ලීම් කොට දිනාගෙන තිබෙනු දැකීම මහත් සතුටට හේතුවකි.

## පළාත් සභා යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

එසේ ම විවිධ පළාත් පාලන ආයතන සහ පළාත් සභා සමඟ වැඩ කිරීමට අවස්ථාව ලැබීම ද අපේ වැඩ ඉතිහාසයේ සුන්දරම කාල පරිච්ඡේදයකි. පළාත් සභා ක්‍රමය ශක්තිමත් කර ගැනීම සඳහා විවිධ අධ්‍යයනයන් කරමින් පළාත් සභාවල නිලධාරීන් සමඟ බොහෝ අවස්ථාවල දී වැඩ කළෙමු. පළාත් සභාවල ආණ්ඩුකාරවරු, මහ ඇමතිවරු, ආණ්ඩු පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම මන්ත්‍රීවරු, සහ පරිපාලන නිලධාරීන් සමඟ එක්ව වැඩ කළ අවස්ථා බොහෝ ය. එහි දී ඔවුන් ලබා දුන් නොමඳ සහාය ද සිහිපත් කළ යුතු ය. දැනට ජීවතුන් අතර සිටින සහ නොසිටින බොහෝ මහ ඇමතිවරු අපට එදා සහාය පළ කළහ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිළිබඳ එකල ලාංකීය සමාජයේ දරුණු විවේචන පවතිද්දී ඒ අනුව අප කෙරෙහි දැඩි එදිරිවාදිකමකින් කටයුතු කළ එකල පළාත් සභාවල ආණ්ඩු පක්ෂයේ දේශපාලනඥයන් පවා පළාත් සභා විෂයයෙහි අප කළ අව්‍යාජ වැඩ කොටස පිළිබඳව පැහැදී අපගේ මිතුරන් බවට පත් වූ ආකාරය අපටම පුදුමයක් විය.

මේ වැඩ ලැයිස්තුව ගැන සඳහන් කිරීමේ දී මතකයට එන එක් සුවිශේෂී පුද්ගලයෙකි. ඒ කලකට පෙර දිවියෙන් සමුගත් ගුවන්විදුලි සහ රූපවාහිනී මාධ්‍යවේදී තිලක් ජයරත්න මහතා ය. ඔහු මට බොහෝ අවස්ථාවල පැවසුවේ මේ කරන වැඩ, බිම් මට්ටමේ මිනිසුන් අතරට යෑම අනිවාර්යය විය යුතු බවත් සමාජය සුබදායී ආකාරයට වෙනස් කිරීමට වෙහෙසෙන්නේ නම් ඒ පිළිබඳ සිතන ලෙසත් ය. ඒ අනුව ප්‍රාදේශීය මට්ටමේ ආයතන සමඟ වැඩ කළ බොහෝ ක්‍ෂේත්‍ර කියාකාරකම් ඉන් ඔබ්බට ගෙන යමින් තව දුරටත් මහ පොළවේ ජීවත්වන මිනිසුන් අතරට යෑමට අපි කල්පනා කළෙමු.

## තේ කහට

මෙරට ආර්ථිකය සුපෝෂණ කිරීමෙහිලා සුවිශාල දායකත්වයක් ලබා දෙන පිරිසක් වන්නේ කඳුකර දෙමළ ජනතාව ය. ඔවුන්ගේ පුරවැසි අයිතීන් ශක්තිමත් කිරීම වෙනුවෙන් කළ බොහෝ ක්‍රියාකාරකම් ද අපේ මතකයේ නිධන්ව ඇත. ලිපිනයක් නැති පුරවැසියන්ට ලිපිනයක් දීම එහි ප්‍රධාන ව්‍යාපෘතියකි. විවිධ වතු සමාජවල දිවි ගෙවෙන කම්කරු ජනතාවට නිසි ලිපිනයක් නොමැතිකමින් බොහෝ ප්‍රශ්නවලට මුහුණ පාන බැව් අප ඒ වතුවල ඇවිදීම ඔස්සේ අත්දැකීමෙන් දනිමු. වැදගත් රාජකාරී ලිපි නොලැබීම, විශ්වවිද්‍යාල ප්‍රවේශය වැනි තීරණාත්මක කඩයිම්වලට අදාළ ලිපි නොලැබීම, බැංකු සහ වෙනත් ආයතනවලින් ලැබෙන ලිපි නිසි කලට නොලැබීම යනාදී හේතු මත විවිධ අර්බුදවලට ඒ ප්‍රජාවට මුහුණ දීමට සිදු විය. කිසිදු මිනිස් වාසයක් නොමැති හිත් පිත් නැති කොන්ක්‍රීට් ගොඩනැගිලිවලටත් ලිපිනයන් තිබෙන රටක හුස්ම ගන්නා මිනිස්සුන්ට ලිපිනයක් නොතිබීම මත ඔවුන් විඳින වේදනාව හඳුනාගතිමු. ඒ

අනුව බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්කවල බොහෝ ප්‍රදේශයන්හි ලිපිනයන් ලබාදීමේ වැඩසටහන සාර්ථකව සිදු කිරීමට අපට හැකි විය.

එපමණක් නොව කඳුකර දෙමළ ප්‍රජාවගේ ජන ජීවිතවල හරස්කඩක් දැක්වෙන 'තේ කහට' ඡායාරූප ප්‍රදර්ශනය මෑතකාලීනව අප කළ වඩාත් සාර්ථක වැඩසටහනකි. කඳුකර තරුණ තරුණියන් සවිඥානික කිරීම, කලාව සහ තමන්ගේ ප්‍රශ්න කලාව ඔස්සේ සන්නිවේදනය කිරීම පිළිබඳ සංවාද ගණනාවකින් පසු ජීවිතේ ප්‍රථම වතාවට ඩිජිටල් කැමරාවක් අතින් ඇල්ලූ වතුකරයේ තරුණ තරුණියන් පිරිසක් කොළඹ ලයනල් වෙන්ඩ්ට් හි ජාතික මට්ටමේ ප්‍රදර්ශනයක් දක්වා ගෙන ඒම බොහෝ අයගේ නොමඳ අවධානයට යොමු විය. ඒ ඔස්සේ වතු සමාගම් සහ රාජ්‍ය පරිපාලන ව්‍යුහය කඳුකර වැවිලි කම්කරු ප්‍රජාව ගැන අවධානය යොමු කිරීම එම ප්‍රජාව ලැබූ ජයග්‍රහණයකි.

**යා යුතු මඟ දුරය..**

බොහෝ වැඩ සමඟ කාලය ගෙවී ගියා දැනුණේ නැත. අපි ද කෙමෙන් කෙමෙන් වියපත් වෙමින් සිටිමු. ගෙවුණ විසි පස් වසර ඇතුළත මෙතැන අතැර යන්නට හිතක් නොවුණේ ද දැනුත් රැඳී සිටින්නේ ද රටටත් ජන සමාජයටත් එලදායී යමක් කළ හැකි වූයේ මෙතැන සිටි නිසා බැවිනි. සිංහල දෙමළ මුස්ලිම් ඇතුළු සමස්ත පුරවැසියන් වෙනුවෙන් බොහෝ වැඩ කොටසක් සිදු කළ හැකි වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නම් සහෝදරාත්මක පවුලේ සාමාජිකයකු වූ බැවිනි. එය සුදු වැලි ඇතිරූ මාවතක ගිය ගමනක් නොව බොහෝ දුක්ඛ දෝමනස්සයන් හා ජීවිත තර්ජන මැදින් ගිය අභියෝගාත්මක ගමනකි. රහස් පොලිසියේ හා විවිධ ඔත්තු සේවාවල සුපරීක්ෂාවට හා රාජ උදහසට ලක් වීමටත්, අන්තවාදී කණ්ඩායම්වලින් දේශද්‍රෝහීන් ලෙස හංවඩුගැසීමට ලක් වීමටත්, සෘජු ජීවිත තර්ජනවලට ලක් වීමටත් සිදු විය. අපේ සාර්ථකත්වයෙහි පදනම වූයේ ඒ සියල්ලෙන් ගොඩනැගුණ පන්නරයයි.

අප කළ වැඩ බොහොමයක් ඇතිවා සේම සිදු කිරීමට ඇති වැඩ ද බොහෝ ය. ගෙවී ගිය විසිපස් වසරක අත්දැකීම් මත පාදකව අනාගතය දෙස බලන විට විශේෂයෙන් අවධාරණය කළ යුතු කාරණයක් නම් අපගේ ක්‍රියාකාරීත්වය හා අප අවධානය යොමු කරන විෂය ක්ෂේත්‍ර තවදුරටත් පුළුල් විය යුතු බවයි. ජන ජීවිතයට දැඩි ලෙස අදාළ වන අධ්‍යාපනය, සෞඛ්‍ය යනාදී ක්ෂේත්‍ර පිළිබඳව මෙන් ම ග්‍රාමීය ණයගැතිභාවය, වන විනාශය ඇතුළු පාරිසරික ගැටලු යනාදිය පිළිබඳව ද පර්යේෂණ මෙන්ම ප්‍රජාව සමඟ වැඩ කිරීමද අත්‍යවශ්‍ය කාරණයකි. මේ පිළිබඳව විධායක අධ්‍යක්ෂවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වනු ඇතැයි අපේක්ෂා කරමි.

තව වසර විසි පහක් අඛණ්ඩව මහ පොළවේ මිනිසුන් වෙනුවෙන් වැඩ කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පැවතීම තීරණය වන්නේ අපේ තරුණ පර්යේෂක කණ්ඩායමේ නිර්මාශීලී සක්‍රිය දායකත්වය මත ය. අප නොකළ වැඩ බොහොමයක් CPA හැටියට සිදු කිරීමට ඔවුන්ට ඉතිරිව තිබේ. අප යෂ්ඨිය ඔවුන්ට පිරිනමන්නේ ඒ ගමන අඛණ්ඩව ගෙන යෑමේ බලාපොරොත්තු ඇතිව ය. ඒ සඳහා අවශ්‍ය වන්නේ හෘදයාංගමබව, මනුස්සකම, අවංකබව සහ කැපකිරීම යන කාරණා සහ පොළොවේ වැඩ කිරීමට ඇති සැබෑ උවමනාව පමණි. දැන් ඒ සඳහා වේලාව පැමිණ තිබේ. කටු කොහොල් මැද්දේ ගෙන්දගම් පොළොවේ ඇවිද ආ මතක සුවඳ අතරේ තව අලුත් මාවත් විවර වී තිබේ. ඉතින් අපි ඒ ඔස්සේ ද ඇවිද යමු.

---

**ලයනල් ගුරුගේ**
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකවරයෙකි.

# ලංකාවේ පාලනයට දායක වීම



**උදය ඉදිරිමාන්න**

රාජ්‍යය තුළ සාමාජිකත්වය ලැබීමෙන් පසු පුද්ගලයෙකු පුරවැසියෙකු බවට පත් වෙයි. රාජ්‍යය විසින් ගනු ලබන තීරණයන් පුරවැසියන් වන අපගේ ජීවිතවලට සෘජු බලපෑමක් කරන අතර එමගින් පුරවැසියන්ට ලැබෙන ජීවිත අවකාශය කුමක්දැයි තීරණය වේ.

ඌන සංවර්ධිත රටක ජීවත්වෙමින්, විවිධ දේශපාලනමය, සාමාජීය හා ආර්ථික බලපෑම් තුළ වෙසෙන අපට එහි දේශපාලනමය, ආර්ථික හා සාමාජීය ගතික ස්වභාවය හරි හැටි අවබෝධ කර ගැනීම දුෂ්කර ය. කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් ඒවායේ කොටස්කරුවෙකුව සිටින අවකාශයක් තුළ මධ්‍යස්ථව ඒවා විග්‍රහ කිරීමත් තේරුම් ගැනීමත් දුෂ්කර ය. එවන් පරිසරයක් තුළ හෙම්බත්ව සිටින අපට ඊට හේතු ලෙස බොහොමයක් අවස්ථාවල පෙනෙන්නේ, නායකයින්ගේ, කණ්ඩායම්වල, අනුවණකම් අමනකම් හෝ බලලෝභී ප්‍රවේශයන් ය.

මෙවැනි අවකාශයක් තුළ "ඒ සඳහා පුරවැසි කතිකාවකින්, ශාස්ත්‍රාලීය මැදිහත්වීමකින් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයක් තුළ එම සමාජ, දේශපාලන හා ආර්ථිකමය පීඩනයන්ට මැදිහත්වීමක් සිද්ධ කළ හැකි ය. ඒ වාගේ ම ඉන් එම හේතු සාධකවලට බලපෑමක් ඇති කළ හැකි ය."

එම අදහසට හා ක්‍රියාවලියට වි.ප්‍ර.කේ. පසුගිය වසර 25 පුරාම සක්‍රීය ලෙස මැදිහත් විය. මෙම මාතෘකාව තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මගේ අත්දැකීම එය යි.

රාජ්‍යය හා පුරවැසියා ශක්තිමත් කරන ක්‍රියාවලියකින් තොරව, පවතින ජාතික රාජ්‍යය තුළ පුරවැසියාට මෙන්ම රාජ්‍යයට ද පැවැත්මක්, අනාගතයක් ඇති කර ගැනීම දුෂ්කර වන බව වි.ප්‍ර.කේ. මුල පටන්ම විශ්වාස කළේ ය. ඒ අනුව සමකාලීන සමාජය විමර්ශනය කරමින් පසුගිය

අවුරුදු 25 පුරාම දේශපාලනිකව රට තුළ ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක්, ව්‍යුහයක් නිර්මාණය විය යුතු ය යන මතය සමඟ පොර බදන ලදි. එහි මූලික තේමාව වූයේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ පුරවැසියා හා රාජ්‍යය ශක්තිමත් කිරීම ය.

ඊට අදාළව, පුරවැසියන්, සිවිල් සංවිධාන මෙන්ම ශාස්ත්‍රාලීය මට්ටමින් කරනු ලැබූ මැදිහත්වීම් අතිවිශාල ය. ඒ තුළ ගෙවුණු අවුරුදු 25 තුළ ක්‍රියාවට නංවන ලද වැඩසටහන් එකින් එක ගණනය කළොත් ඊට විශාල අගයක් ලැබෙන බව මාගේ හැඟීම ය.

වසර 25කට කලින් ආරම්භ කරනු ලැබූ එම සංවාදයට, අද එනම් වි.ප්‍ර.කේ. ට වසර 25ක් සම්පූර්ණ වන මේ මොහොතේ පිළිගැනීමක් ලැබී තිබීම සතුටට කාරණයකි. ඉන් ලාංකීය සමාජයට අලුතින් දැකීමට ඇසක් මෙන්ම සිතීමට නව මාවතක් ද විවර කර ඇත.

ලෝකයේ පවතින, ඇති වන අභියෝගයන්ට මුහුණදීමට නම් "ශ්‍රී ලාංකීය ජාතිය හා රාජ්‍ය ගොඩනැංවීමේ ක්‍රියාවලිය" නැවත ගැඹුරු සාකච්ඡාවකට බඳුන් විය යුතුය. මෙය මේ මොහොතේ වි.ප්‍ර.කේ.ට පක්ෂ, විපක්ෂ මෙන්ම මධ්‍යස්ථව අදහස් ප්‍රකාශ කරන බොහෝ දෙනෙකුගේ මෙන්ම කණ්ඩායම්වල ද මතය වී ඇත. ඒ අනුව එවැනි ක්‍රියාවලියට අවශ්‍ය කරන්නා වූ පෙර ගමන්කරුවකුගේ භූමිකාව වි.ප්‍ර.කේ. මඟින් උපරිම මට්ටමින් සිද්ධ කර ඇති හා සිද්ධ කරමින් පවතින බව මම විශ්වාස කරමි. තවද, පසුගිය කාල පරිච්ඡේදය තුළ පුරවැසියන් මුහුණ දුන් සමාජ හා දේශපාලන පීඩනයන්ට එරෙහිව වූ මැදිහත්වීම, ඉන් සමාජයට ලබාදුන් ජයග්‍රහණ සිවිල් සංවිධානයක් ලෙස කරනු ලැබූ මහඟු කාර්යභාරයක් ලෙස මම දකිමි.

විවේචනයන්, ප්‍රහාර හා රළු මාවත් ඔස්සේ පුරා වසර 25ක් ආයතනය පැමිණි ඒ ගමන්මග සරල ක්‍රියාවලියක් නොවී ය. එවන් පරිසරයක් තුළ ආයතනයට නිවැරදි දිශානතියක් ලබා දෙමින් ඉහළ කළමනාකාරිත්වය දැක්වූ දායකත්වයත් අනෙකුත් සාමාජිකයින් ඉටු කළා වූ කාර්යභාරයත් ආයතනයේ ජයග්‍රහණයට ඉවහල් වුණි. ඔවුන් සියලු දෙනා පසුගිය වසර 25 හි ආයතනයේ සාර්ථකත්වයේ සම කොටස්කරුවන් බව මා කියන්නේ කෘතවේදීව ය. එමෙන්ම වසර 25ක කාලයක් වි.ප්‍ර.කේ. සමග කටයුතු කරන්නට ලැබීම මා ලැබූ භාග්‍යයක් යැයි මම සිතමි.

---

**උදය ඉදිරිමාන්න**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හිටපු පර්යේෂකයකු වන අතර මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ජාතික සම්බන්ධීකාරක වශයෙන් ද කටයුතු කර ඇත. එක්සත් ජාතීන්ගේ මැතිවරණ කටයුතුවලදී පශ්චාත් ගැටුම් හා පාලනය පිළිබඳ විශාල අත්දැකීමක් සහ දැනුමක් ඇති අයෙකි. තවද ඇෆ්ගනිස්ථානය, ඉරාකය, ඉරානය, නේපාලනය හා පාකිස්ථානය වැනි විවිධ රටවල පුළුල් සේවා පළ පුරුද්දක් ඇති අයෙකි. එක්සත් ජාතීන්ගේ විවිධ දූත මණ්ඩල සඳහා ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජාතීන්ගේ මෙහෙවර, නේපාලයේ එක්සත් ජාතීන්ගේ මෙහෙවර යන ව්‍යාපෘතිවල කටයතු කර ඇත.

ඇමරිකා එක්සත් ජනපදයේ බ්‍රැන්ඩයි විශ්වවිද්‍යාලයේ සමාජ ප්‍රතිපත්ති හා කළමනාකරණය සඳහා වන හෙලර් පාසලින් තිරසාර ජාත්‍යන්තර සංවර්ධනයට අදාළ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. දැනට සෝමාලියොවේ එක්සත් ජාතීනගේ දූත මෙහෙවරේ මැතිවරණ නිලධාරියකු ලෙස අනුයුක්තව සිටී.

# ස්වර්ණමය මතක සටහන්



**අල්තාෆ් හුසේන්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කර මාස කිහිපයකට පසු මම එයට සම්බන්ධ විය. මට පෙර, ලයනල් ගුරුගේ සම්බන්ධ වී සිටි අතර අපි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මුල්ම සාමාජිකයන් අතර කිහිප දෙනෙක් වෙමු. පළමු කාර්යාලය ඇතුල් මල් පාර නම් ස්ථානයෙහි ස්ථාපිත කරන ලද අතර ඒ වන විට අපට සිටියේ කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකු පමණි. ඒකල සිදුවූ දෑ අමතක නොවන හා ඉතා රසවත් අවස්ථාවන් බොහොමයකින් යුක්ත විය. මා, එවකට කිසිවෙකුටත් හඳුනාගත නොහැකි අන්දමට උඩුබුරලීම අනුකරණය කිරීමට සමත් අයෙකු වූ අතර, මාගේ මිතුරන් ඊට බොහෝ සෙයින් කැමති වූයේ මම එය එතරම් මනා ලෙස එය සිදු කරන්නේ කෙසේද යන්න ගැන ඉතා ඔවුන්ට සිතාගත නොහිකිව බලා සිටිමට වූ නිසාවෙනි! වරක් මා හමුවීමට කාර්යාලයට පැමිණි යෙහෙළියන් දෙදෙනකුට සනක සමරසිංහව නෙත ගැටුණි. ඔහු ඉතා කඩවසම් අයෙකු වූ අතර, ඔවුන් ඔහුව දකින විට බොහෝ සෙයින් සිත් සලිත වූ බවක් පෙන්නුම් කෙරුණි! ඒ කඩවසම් තරුණයා කවුරුන්දැයි ඔවුන් මාගෙන් නිතර ඇසීමෙන් මා වෙහෙසට පත් කිරීම ද මා නැවත එවන් වූ අතීතය කරා ගෙන යන මතකයකි. එය මා අගය කළ විනෝදජනක කාලයක් වූ අතර, අද එවැනි විනෝදජනක සහ උද්යෝගිමත් රාජකාරී පරිසරයක් අත්දැකීම කලාතුරකින් පමණක් දැකිය හැකි දසුනකි.

එක්තරා අවධියක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යාලය පිටත මල් පාරෙහි අංක 28 වන පටුමග වෙත මාරු වූ පසු, අප ආයතනය සැබවින්ම පුළුල් වූ අතර කාර්ය මණ්ඩලය ශීඝ්‍ර ලෙස වර්ධනය විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ තොරතුරු තාක්ෂණ කටයුතු අධීක්ෂණය කිරීමේ මාගේ භූමිකාව තුළ, මට කාර්ය මණ්ඩලය සමඟ බොහෝ අවස්ථාවන්හිදී එක්ව කටයුතු

කිරීමට අවස්ථාව උදා විය. එවකට ආයතනයේ පරිපාලන නිළධාරිණිය වූ ජීන් ගොඩ්ලිබ් සහ මම එක්ව කණ්ඩායමක් වශයෙන් කටයුතු කරන ලදී. අපි විනෝද චාරිකා සහ ක්‍රීඩා දින ඇතුළු අවස්ථාවන් කිහිපයක් සංවිධානය කළෙමු. අපි පළමු වතාවට බෙලිහුල් ඔයේ ජීන්ගේ වත්තට විනෝද චාරිකාවක් ගිය විට, රාත්‍රියේ අධික සීතල නිසාත්, මාගේ පපුව හිර වී මට හුස්ම ගැනීමට නොහැකි වූ නිසාත් එය මා මියැදනේනට තරම් වූ අපහසු එහෙත් අමතක නොවන අත්දැකීමක් විය. එසේම දේව්ගේ සුප්‍රසිද්ධ ''නග්න ස්නානය'' පිළිබඳ සිදුවීම සහ පසුව දේව් සහ ෂිමාලිගේ ප්‍රේමනීය මිතුදමට මුල පිරීමද බෙලිහුල් ඔය ගමනේදී සිදු විය!

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පළුල් වීමට පටන් ගත් පසු, සෑම කෙනෙකුම කාර්යබහුල වූ අතර කාර්ය මණ්ඩලයේ සුහදතාවය වැඩි කළ හැකි විනෝද චාරිකා සහ උත්සව සංවිධානය කිරීම දුෂ්කර වූ බැවින් කාර්ය මණ්ඩලය අතර එවන් සුහද හමුවීම්ද අඩු විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කෙතරම් වර්ධනය වී තිබේද යත් එහි විවිධ ඒකක හයක් සහ කාර්යාල කිහිපයක් තිබූ අතර එය එක් වහලක් යට ඇති එක් සමීප කණ්ඩායමක් වශයෙන් පැවතීම තවදුරටත් දැකිය නොහැකි අත්දැකීමක් විය.

සංවිධානය මේ වන විට සැලකිය යුතු අන්දමේ සුවිසල් බලවේගයක් ලෙස වර්ධනය වී තිබීම සම්බන්ධයෙන් මම සතුටු වෙමි. වෙනත් කිසිදු රාජ්‍ය නොවන සංවිධානයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තරම් ක්‍රියාකාරී නොවේ යැයි පැවසීම අතිශෝක්තියක් නොවේ යැයි සිතමි. පුරවැසියන්ගේ අයිතිවාසිකම් යටපත් කිරීමට උත්සාහ කරන සෑම විටම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එවන් උත්සහයන්ට එරෙහිව ස්වකීය ස්ථාවරයන් පෙන්වා දෙමින් ප්‍රකාශයන් නිකුත් කිරීමෙන්, අධිකරණමය නඩු කටයුතු ගොනු කිරීමෙන් හෝ සමාජ ජාලා මාධ්‍ය හරහා පෙරමුණ ගෙන සිටී. වර්තමාන සමාජ මාධ්‍ය භාවිතයත් සමඟ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ වූ කාලයට වඩා එහි බලපෑම බොහෝ සෙයින් වැඩි වන අතර නිසැකවම සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ සිවිල් සමාජය තුළ වෙනසක් සිදු කර ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බිහිකල මුල් කාලයේ දී ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් කඩවීම් සාමාන්‍ය සිදුවීමක් විය. වසර ගණනාවක් පුරා, මහජනතාව ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව වඩාත් දැනුවත් වී ඇති අතර අන්තර්ජාලය හේතුවෙන් මෙම ප්‍රවණතාවය ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇත. සහශ්‍රයේ ගෝලීය පරම්පරාව වර්තමානයේ මෙම අයිතිවාසිකම් සුළුකොට සැලකුවද එය පහසු සටනක් නොවීය. බොහෝ රාජ්‍ය නොවන සංවිධානවලට කළ හැකි හෝ නොබියව කිරීමට ඉදිරිපත් වූ ප්‍රමාණයට වඩා වැඩි දැනුවත් කිරීමක් කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිසැකවම උපකාර කර ඇත.

මම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයහි සාමාජිකයකු වීම පිළිබඳව උදක්ම සතුටු වන අතර මම සංවිධානය සමඟ සිටි වසර 10 ක කාලය ඉතා රසවත් හා තෘප්තිමත් අත්දැකීම් වලින් සැදුම්ලත් වකවානුවක් විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මට සහ තවත් බොහෝ දෙනෙකුට වෘත්තීයමය වශයෙන් සහ පෞද්ගලිකව ඇති කළ බලපෑම බොහෝය.

ආචාර්ය සරවනමුත්තු මහතා සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි කාර්ය මණ්ඩලය පසුගිය වසර 25 තුළ ඔවුන් කරන ලද අපූරු කාර්යය දිගටම කරගෙන යනු ඇතැයි මම බලාපොරොත්තු වන අතර කාලය පැමිණි විට 50 වැනි සංවත්සරයක් සමරීමේ භාග්‍යය අපට ලැබෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

---

**අල්තාෆ් හුසේන්**

අල්තාෆ් හුසේන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භයේ සිටම එහි සේවය කළ පුරෝගාමී කාර්ය මණ්ඩල සාමාජිකයෙකි. තොරතුරු තාක්ෂණ නිලධාරියකු ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සම්බන්ධ වූ ඔහු පසුව තොරතුරු තාක්ෂණ ඒකකයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය. තම නිල කාර්යයෙන් ඔබ්බට ගොස් ආයතනයේ විවිධාකාර උත්සව හා අවස්ථාවන් සංවිධානය කිරීමට ද ඔහු දායක විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විවිධ ඒකක අතර සමීප සම්බන්ධතාවයක් ඇති කිරීමට විශේෂයෙන් ම දායක වූ ඔහු නිතර ම ප්‍රීතිමත් හැසිරීම් විලාසයකින් යුතුව කටයුතු කළ හා කාර්යාලයීය වටපිටාව උද්යෝගීමත් ආකාරයකින් පවත්වාගෙන යාමට දායකවූවකු විය.

# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා දායකත්වය



**දේවානන්ද් රාමයියා**

"ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රචණ්ඩත්වයේ තර්ජනය, බිය ගැන්වීම හෝ හිරිහැර කිරීම, නැතහොත් වෛරී ප්‍රකාශ මගින් එබඳු ක්‍රියාවන්ට උසිගැන්වීම සහ ආක්‍රමණශීලී දේශපාලන ප්‍රකාශ, ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ සමග නොගැළපෙයි" -යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ සඳහා අත්පොත

පසුගිය වසර 25 හි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ උත්පාදක දායකත්වයන් ගැන මා ආවර්ජනය කරන විට නිසැකව ම වඩාත් වැදගත් සහ බලපෑමෙන් යුතු කාර්යය වන්නේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (සීඑම්ඊවී) පෙරමුණ ගෙන සිදු කළ ශ්‍රී ලංකාවේ නිදහස් සහ සාධාරණ මැතිවරණ ප්‍රවර්ධනය යි.

මැතිවරණ සම්බන්ධ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය සඳහා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සන්ධානය එක්ව, 1997 දී, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවන ලද්දේ ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට / මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට, 1998 දී සම්බන්ධ වූ මට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ඉතාමත් පුරෝගාමී කාර්යයක් වූ, 1999 ජනවාරියේ දී ඉතාමත් අපකීර්තිමත් වයඹ පළාත් සභා මැතිවරණය නිරීක්ෂණය කිරීමේ අවස්ථාව හිමි වී ය. එය කුමන ආකාරයේ මැතිවරණයක් වී ද? ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ ඉතාමත් ප්‍රචණ්ඩ මැතිවරණය එය යි. විශ්ව විද්‍යාලයෙන් එළියට ආ ගමන් තරුණයකු වූ මට එය ගින්නෙන් ලැබූ බෞතීස්මයක් වී ය. නිදහස් සහ සාධාරණ තෝරාගැනීමේ මහජන අයිතිය අනිවාර්යයෙන් යටපත් කළ එම මැතිවරණය අවලංගු කරන ලෙස මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉල්ලා සිටියේ ය.

2021 දී මෙම ලිපිය ලියන විට, ශ්‍රී ලංකාවේ මෑතකාලීන ජාතික මැතිවරණ විශාල ලෙස නිදහස් සහ සාධාරණ බව මට විශ්වාසයෙන් යුතුව කිව හැකි අතර ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ගමන් පථය වෙනස් කිරීමෙහි ලා පරිවර්තනීය බලපෑමක් කිරීමට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ

මධ්‍යස්ථානයට හැකියාව ලැබී ඇත. සංවර්ධන වෘත්තියකයකු වශයෙන් මගෙන් නිතර ම පාහේ ඉල්ලා සිටින්නේ, මුදල්වල, විශේෂයෙන් ආධාර දෙන ආයතනවල දායක මුදල් සම්බන්ධයෙන්, ඒවායේ බලපෑම මැන බලා තහවුරු කරන ලෙස මෙන් ම වටිනාකම පෙන්වා දෙන ලෙස යි. මෙහි දී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය අතිශයින් සාර්ථක වී ඇත. බලපෑම මැන බැලීම සඳහා කෙනෙකු කළ යුතු වන්නේ, කාලයක් තිස්සේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ දත්ත පෙළ ගැස්වීම යි. ප්‍රචණ්ඩ ක්‍රියා විශාල ලෙස අඩු වීම හෝ නොමැති වීම හෝ නිදහස් සහ සාධාරණ මැතිවරණ සම්බන්ධයෙන් නැතහොත් මැතිවරණ දේශපාලනයේ පරිණතභාවය සම්බන්ධයෙන් එක ම නිර්ණායකය ලෙස විවාද කිරීම මගේ අදහස නොවන නමුත්, එක් මිනුමක් වන එය මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වන අතර ප්‍රතිඵල මගින් ම සාර්ථකත්වය පෙන්නුම් කර ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මූලෝපායික දර්ශනය වුයේ, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක් සඳහා අන්තර් සම්බන්ධිත ප්‍රවේශයක් ගැනීම යි. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය එක් මාර්ගයක් වුව ද, නීති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ, මහජන ළැදියා නඩු පැවරීම්, සාමය සහ ගැටුම් හා පුරවැසි මාධ්‍ය සම්බන්ධ මුල පිරීම් මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණ සම්බන්ධ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දායකත්වයන් සමග සමස්තයක් ලෙස තක්සේරු කළ විට ඇත්තේ සැමරුම් කටයුතු බලපෑමකි. මේ සියල්ල ඇත්තේ වසර 25ක් පමණක් වන සංවිධානයකට ය. එසේ වුව ද, ශ්‍රී ලංකාවට ප්‍රජාතන්ත්‍රවාදයේ සම්පූර්ණ විභවය සහ තත්ත්වය ලැබීමට තවත් බොහෝ දේ කළ යුතුව ඇත. වීදුරුවේ පිරී ඇත්තේ හතරෙන් එකක් පමණකි. මේ සම්බන්ධයෙන් අනාගතයේ විශාල කාර්යභාරයක් ඉටු කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සිදු වනු ඇත.

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ මැතිවරණ නිරීක්ෂකයකු ලෙස මගේ පළමු කාර්යය වූයේ ජාතික පොලිස් මූලස්ථානයට ගොස් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා දත්ත වගුගත කිරීම යි. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක වන අතරතුර මා එහි ජාතික සම්බන්ධීකාරක තත්ත්වයට ඉහළ නැගී අතර එම කාලය තුළ මා සංවිධානයේ සියලු ම කාර්යයන්හි නියැලී ඇත. මැතිවරණ අතර කාලයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග සිටි මම සාම සහ ගැටුම් විශ්ලේෂණ ඒකකයේ සහ සෝෂල් ඉන්ඩිකේටර්හි කටයුතුවල නියැලුණෙමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය / මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මගේ පළමු රැකියාව වූ අතර මගේ වෘත්තීය ජීවිතය වැඩෙන යුගය මා ගත කළේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග ය. තරුණ සිත් සකස් කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදය තුළ පුරවැසිභාවය සහ පුරවැසි වගකීම් පිළිබඳ වටිනාකම් ආරෝපණය කිරීම සම්බන්ධයෙන් ගත් විට කිසිදු විශ්වවිද්‍යාලයකට, වෘත්තීය සුදුසුකමකට හෝ පුහුණු වැඩ සටහනකට හෝ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සම තත්ත්වයට පැමිණිය නොහැකි ය. මගේ හොඳ ම අධ්‍යාපනය සහ පළපුරුද්ද ලැබූ තැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යි. මට කවදා හෝ දැනගන්නට ලැබුණු ඉතා ම ඥානවන්ත සහ නිර්භීත මිනිසුන් පිරිසක් වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අයගෙන් මට විශාල ප්‍රතිලාභ අත් වූ අතර ඔවුන් මට ආශිර්වාදයක් ද වී ය. අද දක්වා ම ඔවුහු මගේ මිතුරෝ සහ ගුරුවරු වෙති. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ ජීවත් වූ ඕනෑ ම කෙනෙකුට ස්ථිරසාර වූ සරා මට ද එලෙස ම වී ය.

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ මගේ අත්දැකීම්වල දී අර්ජුන වැදගත් කාර්යභාරයක් ඉටු කළේ ය. මගේ මතකයන්, මිත්‍රකම්, බොහෝ ප්‍රමාණයක් විස්කි සමග අලුයම දක්වා කළ බුද්ධිමය සංවාද, රටේ ඇතැම් දුර බැහැර ප්‍රදේශ වෙත කළ සංචාර, මා අනූ නවයෙන් බේරුණු අවස්ථා සහ සිවිල් යුද්ධයේ උච්චතම අවස්ථාවල අපගේ කටයුතු ආදිය පිළිබඳව මට පොතක් ලිවිය හැකි ය. එම මතකයන් සහ අත්දැකීම් මිල කළ නොහැකි අතර මා කවුදැයි යන්න පිළිබඳව ප්‍රධාන කොටස වශයෙන් තවමත් පවතියි.

කිසිවකු කිසි විට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හැර යන්නේ නැත. වරෙක ඔබ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සම්බන්ධ වූ විට ඔබ එහි ජානවල කොටසක් වන අතර එලෙස ම පවතිනු ඇත. අඩු තරමින් මට හැඟෙන්නේ ඒ ආකාරයෙනි. මා සම්බන්ධයෙන්, මගේ තරුණ කාලයේ දී, මට යා හැකි ඉහළ ම තැන දැකීමේ හැකියාව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මට ලබා දුන්නේ ය. එයට මම හැම විට ම කෘතඥ වෙමි.

---

**දේවානන්ද් රාමයියා**

දේවානන්ද් රාමයියා (දේව්) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (*UNDP*) හා සම්බන්ධ සංවර්ධන කාර්යවේදියෙකි. ඔහු වර්තමානයෙහි *UNDP* හි නියෝජ්‍ය නේවාසික නියෝජිත තනතුරක කටයුතු කරයි. මීට පෙර ඔහු *UNDP* හි සහ රටවල් ගණනාවක එක්සත් ජාතීන්ගේ සාම සාධක දූත මෙහෙවරයන්හි සේවයකොට ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සම්බන්ධවීමට පෙර ඔහු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි පර්යේෂකයකු ලෙස කටයුතු කළේය.

# සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator): සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අත්හදා බැලීමක්



ආචාර්ය
**ප්‍රදීප් පීරිස්**

ශ්‍රී ලංකාවෙහි ජන මතය විමසීම සඳහා ව්‍යුහයක් පිහිටුවීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ආචාර්ය සරවනමුත්තු සහ ප්‍රදානක ආයතන කිහිපයක ඔහුගේ මිතුරන් සමග කලක් තිස්සේ පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් සෝෂල් ඉන්ඩිකේටර් (Social Indicator) වර්ෂ 1999 නොවැම්බර් මස ස්ථාපිත කරන ලදි. කැනේඩියානු අන්තර්ජාතික සංවර්ධන ආධාර වැඩ සටහනේ [Canadian International Development Assistance (CIDA)] ක්‍රියාත්මක කිරීමේ හවුල්කාර පාර්ශ්වය වන රාජ්‍ය පාලනය සහ ආයතන සවිබල ගැන්වීමේ වැඩ සටහන [Governance and Institutional Strengthening Programme (GISP)] ජනමත විමසුම් ඒකකයක් පිහිටුවීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සහාය ලබා දීමට ඉදිරිපත් විය. එම වැඩ සටහන (GISP) නවීන උපාංගවලින් යුත් ජනමත විමසුම් ඒකකයක් පිහිටුවීමට මූලික ප්‍රාග්ධනය ලබා දීමට අමතරව වසර තුනක කාලයක් සඳහා එහි මෙහෙයුම් කටයුතු සඳහා අරමුදල් ලබා දුන්නේය. එම ආයතනය නම්‍යශීලීව නොකඩවාම අරමුදල් ලබා දීම හේතුවෙන් සෝෂල් ඉන්ඩිකේටර් වෙත ස්වකීය නව්‍ය ව්‍යාපෘතිය අත්හදා බැලීමේ කටයුතු සිදු කිරීමට අමතරව ලාභ ඉපයීම සඳහා නොවන මෙරට පළමු ස්වාධීන ජනමත විමසීමේ ආයතනය බවට පත්වීමට ද හැකි විය.

එම කාල වකවානුව තුළදී ජනමත විමසීමට පුරෝගාමී ව්‍යුහයක් පිහිටුවීම ආචාර්ය සරවනමුත්තු වැනි අයෙකු පමණක් ඉදිරිපත් වන අන්දමේ අභීත අත්හදා බැලීමකි. ජනමත විමසීමක් සඳහා විද්‍යාව, තාක්ෂණය සහ අවශ්‍ය කරන මානව සම්පත් 1990 දශකයේ අග භාගයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පමණක් නොව, සමස්ත රට තුළම දුර්ලභ විය.

කෙසේ වුවත්, තමා විශ්වාස කරන ස්ථාවරය පිළිබඳව අවදානමක් දැරීමට ඇති කැමැත්තත්, කලාපය තුළත් ඉන් බැහැරවත් ඔහුට ඇති සම්බන්ධතා ජාලයත් හා බැඳුණු ඔහුගේ පුද්ගලික ආකර්ෂණයත් හේතුවෙන් සෝෂල් ඉන්ඩිකේටර් වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ ස්වකීය වැඩ කටයුතු ආරම්භ කිරීම වැනි නව්‍ය අදහසක් සඳහා මාවත හෙළි කෙරිණි.

**ශ්‍රී ලංකාවේ ජනමත විමසුම් කේෂ්ත්‍රය සඳහා සෝෂල් ඉන්ඩිකේටර්හි දායකත්වය**

මැනිලාවේ පිහිටි සුප්‍රකට ජනමත විමසුම් ආයතනයක් වන සෝෂල් වෙදර් ස්ටේෂන් [Social Weather Station (SWS)] ආයතනය විසින් සෝෂල් ඉන්ඩිකේටර් සඳහා බඳවා ගත් පළමු සමීක්ෂණ කණ්ඩායම පුහුණු කෙරිණි. මෙහෙයුම් ආරම්භ කළ පළමු වසරේ දීම ජනමත විමසුම්කරුවන්ගේ ගෝලීය එකතුවක් වන ජනමත විමසුම් සඳහා වන ලෝක සංවිධානයට [World Association for Public Opinion Research (WAPOR)] සෝෂල් ඉන්ඩිකේටර් ද එක් වූයේ ය. මෙම සහයෝගිතාව හරහා සෝෂල් ඉන්ඩිකේටර් වෙත වෘත්තීයමය සුජාතභාවයක් ලබා දීමට අමතරව එහි කාර්යමණ්ඩලයේ වෘත්තීය දැනුම සංවර්ධනයට ද ඉමහත් සේ දායක විය. එතැන් සිට සෝෂල් ඉන්ඩිකේටර්හි සමීක්ෂකයන්ට ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපය සහ ආසියා ආදී කලාපයන්හි පවත්වන ලද WAPOR සංවිධානයේ වැඩසටහන්වලට සහභාගි වීමෙන් නව ක්‍රමවේද පිළිබඳ සාකච්ඡාවලට සහ ජනමත විමසීමේ අති නවීන තාක්ෂණයට නිරාවරණය වීමට අගනා අවස්ථාවක් ලැබිණ. විදේශ පුහුණුව සහ අත්දැකීම් ද සහිතව සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ජනමත විමසුම් කේෂ්ත්‍රය නව සංස්කෘතියේ රැඩිකල් වෙනසකට මුල පිරුවේ ය. සෝෂල් ඉන්ඩිකේටර්, එහි ආරම්භය වූ වර්ෂ 1999 සිටම, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සමීක්ෂණ ක්‍රමවේද යොදා ගනිමින් විශාල සංඛ්‍යාවක් ඇතුළත් වන පුළුල් නියැදි ආවරණය කරන ලද සමීක්ෂණ, රාජ්‍ය සේවාවන්හි ගුණාත්වය පිළිබඳ සේවාලාභීන්ගේ ප්‍රතිචාර දැක්වෙන සමීක්ෂණ (Report Card Surveys), අවශ්‍යතා තක්සේරු කිරීම් සහ ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාවලිය, දූෂණය සහ ප්‍රජාතන්ත්‍රවාදය, පූර්ව මැතිවරණ ජනමත විමසුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන, පශ්චාත් යුද සමයේ සංහිඳියාව සහ සංක්‍රාන්තික යුක්තිය, කොවිඩ් 19 වසංගතයේ සමාජ ආර්ථික සහ දේශපාලන බලපෑම්, සුනාමියෙන් පසු නැගිටීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය මත සිදු වන ප්‍රචණ්ඩත්වය, ළමා ශ්‍රමය, එච්අයිවී/ඒඩ්ස් සහ ශ්‍රම වෙළඳපොළ සමීක්ෂණ ආදිය ඇතුළත් විවිධාකාර ක්ෂේත්‍ර ගණනාවක අවශ්‍යතා තක්සේරුව, අධීක්ෂණය සහ ඇගයීම් සහ සිතියම්ගත කිරීම් විශාල සංඛ්‍යාවක් පවත්වන ලදි.

සෝෂල් ඉන්ඩිකේටර් මඟින් සැලකිය යුතු ප්‍රමාණයක තමන්ගේම සමීක්ෂණ අධ්‍යයන පවත්වන අතර රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන (දේශීය සහ විදේශීය) මෙන්ම පුද්ගලික සමාගම් සහ නොයෙකුත් අධ්‍යාපනික ආයතන ගණනාවක් සමග ක්ෂේත්‍ර ගණනාවක සමීක්ෂණ සහයෝගිතාවයක් පවත්වා ගනී. හඬක් නැති බහුතරයට තම දෛනික ජීවිතයේ දී  බලපාන ගැටලු පිළිබඳව තම උනන්දුව ප්‍රකාශ කරන මාධ්‍යයක් ලබා දීමෙන් සෝෂල් ඉන්ඩිකේටර් රටේ ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් කරන පළමු ලාභ නොලබන ජනමත විමසුම් ආයතනය ද වේ. ඒ වන විට තම සේවාලිභීන් සඳහා ක්‍රමානුකූල නොවන ජනමත විමසුම් පවත්වන වානිජ මට්ටමේ සමීක්ෂණ ආයතන කීපයක් ද තිබිණ. වසර 2000 මුල් කාලයේ දී සෝෂල් ඉන්ඩිකේටර් බෙහෙවින් ජනප්‍රිය වූ අතර දේශීය සහ අන්තර්ජාතික මාධ්‍යයේ නිරන්තර අවධානයට ද ලක් විය. එවකට පැවති පාලක සහ විපක්ෂ දේශපාලන පක්ෂවල ප්‍රශංසාවට මෙන්ම විවේචනයට ද ලක් විය. මෙම ජනප්‍රියතාවය ප්‍රදානක ආයතන සහ සංවර්ධන ආයතය තුළ බලවත් උනන්දුවක් ඇති කළ අතර විවිධ වූ ස්වකීය වැඩසටහන් මුලපිරුම්වලට සහාය ලබා දීමට පෙර, ඒවා පිළිබඳව පෙරට වඩා ජනමත විමසුම් සමීක්ෂණ යොදා ගැනීමට පියවර ගැනිණි. ඉන් සිවිල් සමාජ සංවිධාන තුළ අරමුදල් ලබා ගැනීමට ඉමහත් උනන්දුවක් ඇති කළ නව මාවතක් විවෘත වූ අතර තාක්ෂණික සහ න්‍යායාත්මක දැනුමකින් තොර රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් ජනමත විමසුම් පැවැත්වීමට එක් විය. රාජ්‍ය නොවන සංවිධානවලට අමතරව වානිජ

මට්ටමේ සමීක්ෂණ ආයතන ගණනාවක් ද සාම ක්‍රියාවලිය, ප්‍රජාතන්ත්‍රවාදය සහ රාජ්‍ය පාලනය වැනි ක්ෂේත්‍රවල ජනමත විමසුම් පැවැත්වීමට එක් විය.

### රට තුළ සහ ඉන් බැහැරව ප්‍රජාතන්ත්‍රීය කතිකාවට දක්වන ලද දායකත්වය

සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භ කරන ලද්දේ ජනමත විමසුම් රටේ ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් කිරීමේ මාධ්‍යයක් ලෙස යොදා ගත හැකිය යන දැඩි විශ්වාසයෙනි. සෝෂල් ඉන්ඩිකේටර් මඟින් හඳුන්වා දුන් අතිනවීන ජනමත විමසුම් ක්‍රමයෙන් ප්‍රතිපත්ති සැලසුම්කරුවන්ට සීමිත කාල පරාසයක් තුළ වඩාත් වැඩි නිරවද්‍යතාවකින් ජන සංඛ්‍යාවෙන් විශාල හරස් කඩක ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අදාළව ජනමතය ග්‍රහණය කර ගැනීමට හැකියාව සැලසුණි. සෝෂල් ඉන්ඩිකේටර් විසින් 2001 දී සාම ක්‍රියාවලිය පිළිබඳව ජනතාවගේ මතවාදය සහ ආකල්ප වෙනස් වීම හසු කර ගැනීමට එහි ප්‍රධානතම සමීක්ෂණ ව්‍යාපාතිය වන සාමය පිළිබඳ විශ්වසනීයත්වයේ දර්ශකය (*Peace Confidence Index* (PCI, 2001-2008) වර්ෂ 2001 දී දියත් කළේ ය. අනතුරුව වසර අටක් පුරා PCI සමීක්ෂණය මෙරටේ ගැටුම් නිරාකරණ ක්‍රියාවලිය පිළිබඳව මහජන කතිකාවට දායක වූයේ ය. පසුගිය වසර විස්සක කාලය තුළ සෝෂල් ඉන්ඩිකේටර් විසින්, පාලනයට අදාළව පවත්වන ලද නොයෙකුත් සමීක්ෂණ, එක් එක් ආණ්ඩුවලින් ලබා දෙන ලද සේවාවන් පිළිබඳව මහජන සංවාදයක් මතු කිරීමට හේතු වීමට අමතරව ආයතනික සංශෝධන පිළිබඳව රටේ පවතින විවාදයට මහජනයා සම්බන්ධ කිරීමේ සහ ඔවුන්ගේ දායකත්වය ලබා දීමේ මාර්ගයක් ද විය. පසුගිය වසර 20ක කාලය තුළ සෝෂල් ඉන්ඩිකේටර් විසින් පවත්වන ලද සමීක්ෂණ වලින් දේශපාලකයන්, මූලික ප්‍රතිපත්ති සම්පාදකයන් සහ නිව්යෝර්ක් ටයිම්ස් සහ ඉකොනොමිස්ට් වැනි අන්තර්ජාතික මාධ්‍ය ආයතන ඇතුළත් මාධ්‍යය සහ සමස්තයක් වශයෙන් අන්තර්ජාතික ප්‍රජාව දැනුවත් කරන ලදි. සෝෂල් ඉන්ඩිකේටර්හි දේශීය සහ ගෝලීය ප්‍රවණතා දත්ත විශ්ලේෂණයේ දී සම්බන්ධ වූ දේශීය සහ විදේශීය විද්වතුන් නම් වශයෙන් සඳහන් කරන්නේ නම්, මහාචාර්ය ඩොනල්ඩ් හොරොවිට්ස්, මහාචාර්ය ක්‍රිස්ටියන් සොකේ, මහාචාර්ය මයිකල් ෂුල්ස්, මහාචාර්ය විලියම් මිෂ්ලර්, මහාචාර්ය අෂුටොෂ් වාර්ෂ්නි, මහාචාර්ය ජයදේව උයන්ගොඩ ඉන් කීප දෙනෙකි.

ලිපිය සැකසීමේ සහාය සඳහා
ගෞරවනීය ස්තුතිය,
**සකිනා මොයිනුඩීන්**
ජ්‍යෙෂ්ඨ පර්යේෂිකා
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

---

**ආචාර්ය ප්‍රදීප් පීරිස්**
කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව සහ මහජන ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයකු සහ අංශාධිපතිවරයා ද වේ. ඔහු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සෝෂල් ඉන්ඩිකේටර් ආයතනයේ පළමු ප්‍රධානියා විය.

CPA at 25

# පළාත් පාලන ක්ෂේත්‍රයට කළ මැදිහත් වීම



**ශ්‍රියානී රුවනාරා විජේසුන්දර**

විචලන දේශපාලන පරිසරයක, ගතික නිලධාරී යාන්ත්‍රණයක් හා යැපුම් ජන සමාජයක් සහිත රටක දශක දෙකහමාරක් සිවිල් සංවිධානයක් සිය විෂය පථයෙහි ක්‍රියාකාරී වීම තුළින් ම එහි සාර්ථකත්වය පැහැදිලි වේ.

වඩාත් ප්‍රායෝගික සහ ශක්‍යතාවක් සහිත වූ තිරසාර වැඩපිළිවෙළක් සඳහා වූ සැලැස්මක් සකස් කිරීමේ හා ජාතික මට්ටම දක්වා බිම් මට්ටමේ සිට කැපවීමේ ප්‍රවේශය ශක්තිමත් කිරීමේ අරමුණින් (2007) මැද භාගයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පළාත් පාලන වැඩසටහන ආරම්භ කරන ලදි. මේ අනුව, ග්‍රාමීය සංවර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනයට අදාළ යාන්ත්‍රණයන් තුළින් සහ අපේක්ෂිත වෙනස්කම් ඇති කිරීමට අවශ්‍ය පරිසරය සැකසෙන ජාතික සංවර්ධනය තුළින් තිරසාර සංවර්ධනය සඳහා සාර්ථක පදනමක් ඇති කිරීම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.

පළාත් පාලන ආයතන තුළ දැනට පවතින සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා නීත්‍යානුකූලව වගකිව යුතු ප්‍රධාන ක්‍රියාකාරී දේශපාලන ව්‍යූහ තුන සමඟ සහයෝගයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම ව්‍යූහ ස්ථරය රාජ්‍ය පරිපාලන ධූරාවලියේ අවසාන ස්ථරය ද වේ. මෙම වැඩසටහනේ ප්‍රතිඵල වශයෙන් මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වැනි ග්‍රාමීය දේශපාලන ආයතන මෙන්ම රාජ්‍ය සේවා ආයතනවල කාර්යයන් සහ ග්‍රාමීය බදු ගෙවන්නන් අතර නවතම දැනුමෙන් සන්නද්ධ වූ ද්විත්ව සේවා යාන්ත්‍රණ කාර්යය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දේශපාලන ආයතන සහ ජනතාව සහ ප්‍රාදේශීය අයවැය ක්‍රියාවලිය සඳහා විනිවිද සහ සහභාගී වීමේ ප්‍රවේශය ශක්තිමත් කිරීම, ග්‍රාමීය ආදායම් කළමනාකරණය සහ අතුරු නීති සැකසීම සඳහා තාක්ෂණික ආධාර සැපයීම සිදු විය. පළාත් පාලන ආයතන නිසි පරිදි

ක්‍රියාත්මක වීමට උපකාරී වන ආඥාපනත්, පනත්, මූල්‍ය රෙගුලාසි, නියෝග සහ විධාන පිළිබඳ සභා සාමාජිකයින්ගේ සහ නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම ද එයින් සිදු විය.

මෙම ක්‍රියාකාරකම් දැනට පවතින පළාත් පාලන ආයතන 341න් 90ක් පමණ ආවරණය කර ඇත. අපගේ මෙම දායකත්වයන් හේතුවෙන් ඇති වූ ධනාත්මක වෙනස්කම් රැසකි. එම වෙනස්කම් සභා තුළ ක්‍රියාත්මක වන නව අයවැය ක්‍රියාවලිය තුළින් සහභාගීත්ව තීරණ ගැනීමේ ක්‍රියාවලියක් දක්වා පරිණාමය වීමේ යාන්ත්‍රණයෙන් හඳුනාගත හැකි අතර එය මීට පෙර නගරාධිපති, සභාපති සහ ලේකම්වරුන් විසින් පමණක් දායක වූ ක්‍රියාවලියක් විය.

පළාත් පාලන සභා බලප්‍රදේශයන්හි විභව සම්පත් උපයෝගී කර ගනිමින් සභාවේ ආදායම් පදනම ප්‍රවර්ධනය කිරීම සඳහා යෝග්‍ය අතුරු නීති පනවා ගැනීම සඳහා සහාය වීම, සභාවල ප්‍රධාන කාරක සභා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම මෙන්ම ඒ සඳහා මහජන සහභාගීත්වය වර්ධනය, සභාවල මහජන ගැලරි පිහිටුවීම සහ නැවත සක්‍රීය කිරීම, සභා ක්‍රියාවලිය සහ සභා වාර්තා නඩත්තු කිරීමට සෘජුවම මැදිහත්වීම, සභා කටයුතු විධිමත් කිරීම, "සභිකවරියන්" තුළින් සභාවේ වැඩි දියුණු කළ විනය සහ සභිකයන්ට ගරුත්වයක් සහිත සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවම පදනමක් ගොඩනැගීම පැහැදිලිවම දැකිය හැකි අනෙකුත් සාධනීය වෙනස්කම් වේ.

ඵලදායී වෙනස විදහා දැක්වූ මෙම ක්‍රියාකාරකම් අතුරින් වඩාත් ආකර්ෂණීය වූයේ ග්‍රාමීය කාන්තාවන්ගේ දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ දේශපාලන ක්‍රියාවලියට ඔවුන්ගේ මැදිහත් වීම හඳුන්වා දීම සඳහා සහාය වූ යාන්ත්‍රණයන් ය. 1931 දී සර්වජන ඡන්ද බලය විසින් ශ්‍රී ලාංකික කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට දොරටුව විවර කළ ද පසුගිය දශක අටක දිගු කාල වකවානුව තුළදී, ඔවුනට නිසි සමානාත්මතාවය සහ යුක්තිය ඉටු වූයේ නැත. එම නිසා දේශපාලනයේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා සහයෝගය සහ ශක්තිමත් කිරීම අරමුණු කරගත් පළාත් පාලන මට්ටමෙන් 25% කෝටාවක් හඳුන්වා දීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පළාත් පාලන වැඩසටහන අනෙකුත් සිවිල් සමාජ සංවිධාන සමගින් දියත් කරන ලද ශ්‍රී ලංකාවේ වැඩිම වපසරියක් ආවරණය කළ ප්‍රචාරණ ව්‍යාපාරය යි.

මෙම පුළුල් ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙන්, පළාත් පාලන මැතිවරණයේදී කාන්තාවන් සඳහා අවශ්‍ය 25% කෝටාව නීතිමය ප්‍රතිපාදන ලෙස පනවන ලදී. නීතිය පිළිපැදීම සඳහා "කාන්තාවකට ඡන්දය දෙන්න" ව්‍යාපාරය දියත් කිරීමේ පුරෝගාමියෙකු වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ දේශපාලන ගමනේ සුවිශේෂී සන්ධිස්ථානයකට ළඟාවීමට "ඇයට" සිය දේශපාලන මඟ විවර කළේය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දරන ලද මෙම උත්සාහය අද දක්වාම පිළිගෙන අගය කරනු ලැබේ.

2011 පළාත් පාලන ඡන්ද විමසීමේදී පළාත් පාලන ආයතනයට ඇතුළත් වූ මුළු සාමාජිකයින් 4486 දෙනාගෙන් සභිකවරියන් 82ක් වූ අතර මෙය 1.83ක් විය. කාන්තා කෝටාව හඳුන්වා දීමෙන් සිදු වූ වෙනස්කම් හේතුවෙන් 2018 පළාත් පාලන ඡන්දය විශේෂ සතුටුදායක වෙනසක් ඇති කළේ ය. මෙම ඡන්ද විමසීමේදී දී තේරී පත් වූ සමස්ත සභිකයින් 8,690 දෙනාගෙන් 1,926 (23.3%) ක් සභිකවරියන් ය. මෙය 2011 දී 1.83% සමග කැපී පෙනෙන වැඩි වීමකි. මෙම සාධනීය ප්‍රතිඵලය සඳහා සටනේ සිටි අනෙකුත් ක්‍රියාකාරීන්, කීර්තිමත් පුරවැසියන්, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා මූල සංවිධාන සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පළාත් පාලන වැඩසටහන මඟින් කරන ලද දායකත්වය අනුබල දුන්නේ ය.

කෙසේ වෙතත්, 2020 අවසානයේ සිදු වූ දේශපාලන වෙනස්කම් හේතුවෙන්, අප ශක්තිමත් කළ කාන්තාවන් සඳහා වූ 25% කෝටාව පිළිබඳ අගයකින් යුතු අවධානය කිසියම් ආකාරයකට පරිහානියට ලක් වෙමින් පවතින බවක් පෙනේ. එම නිසා කාන්තාවන්ගේ දේශපාලන අයිතිවාසිකම් සහ එම කෝටාව ආරක්ෂා කිරීම සඳහා අනෙකුත් සිවිල් සංවිධාන සමඟ නිරන්තර ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය බව අපි අවබෝධ කොටගෙන කැප වී සිටින්නෙමු. මෙහි දැඩි අරමුණ වන්නේ පළාත් සභා හා පාර්ලිමේන්තුව තුළද අවම වශයෙන් 25ක කාන්තා නියෝජනය ස්ථාපිත කිරීමය.

---

**ශ්‍රියානි රුවනාරා විජේසුන්දර**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂිකාවකි. පළාත් පාලන ආයතන කාන්තා අංශ නියෝජනය, අයවැය විනිවිදභාවය සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටී.

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවාදය



ආචාර්ය
**අසංග වැලිකල**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය 25 වැනි සංවත්සරය මෙම රචනා වෙළුම මගින් සමරන විට, එය පැවති කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය හැඩ ගැස්වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දායකත්වය පිළිබිඹු කිරීමට මට අවශ්‍ය ය. පුළුල්ව තේරුම් ගත් විට ව්‍යවස්ථා නීතිය සහ භාවිතය පවතින්නේ, එහි පර්යේෂණ, උද්දේශන සහ ප්‍රචාරක ක්‍රියාමාර්ග මගින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ බලපෑම ප්‍රබල ම ලෙස ඇතැයි කිව හැකි ආයතනික සහ බුද්ධිමය ක්ෂේත්‍රයෙහි ය.

කෙසේ වෙතත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග මගේ සම්බන්ධය ඇති වූ ආකාරය පිළිබඳව පෞද්ගලික මතකයන් කිහිපයකින් ආරම්භ කරන්නට මම කැමැත්තෙමි. 2000 මාර්තු මාසයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සම්බන්ධ වූ මා, පසුගිය වසර විස්සේ වැඩි කාලයක් විදේශයන්හි ගත කළ ද, එයට ඇති සම්බන්ධය කිසි විටෙක අතහැර නොදැමූවෙමි. මගේ ම පෞද්ගලික සහ වෘත්තීය ස්වයං සංවර්ධනය ද, සංවිධානය සහ එය තුළ සිටින සගයින් සමඟ කිට්ටුවෙන් සම්බන්ධ ය. මෙම වසර විසි පහකට වැඩි කාලය තුළ බොහෝ හොඳ කාල මෙන් ම සමහර නරක කාල සහ ඇතැම් බිහිසුණු කාල ද තිබිණි. ඇත්තෙන් ම, මගේ අධ්‍යාපනික නිමවුම් බොහොමයක් විදේශයන්හි සිට මා ප්‍රකාශයට පත් කරන ලද්දේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මඟිනි. එඩින්බරෝ සිට මා මෙය ලියන විටත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහ මා මෙහෙයවන ව්‍යවස්ථා නීතිය පිළිබඳ එඩින්බරෝ මධ්‍යස්ථානයේ කණ්ඩායම්, ඉදිරි කාලයේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රීයකරණයට සැලකිය යුතු බලපෑමක් සිදු කිරීමේ හැකියාව තිබිය හැකි අභිලාෂකාමී පර්යේෂණ ව්‍යාපෘතියක නියැලී සිටී.

මම නීතිඥ විභාගයට පෙනී සිටීමේ අදහසින් නීති විද්‍යාලයේ දේශනවලට සහභාගී වීමට අවධානය යොමු කළෙමි. 2000 ජනවාරියේ දී, කොළඹ දී, කුමාර් පොන්නම්බලම් ඝාතනය කරනු ලැබී ය. ඔහුගේ මරණයෙන් පසු ආසන්න දිනෙක, ආදී තෝමියානුවන්ගේ පිහිනුම් සමාජයේ සැන්දෑ සවාරියකින් පසුව පැමිණි මට නිදාගත නොහැකි වූ විටෙක තවත් එක් දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියාවක ඛේදවාචකය පිළිබඳ මගේ ඇතැම් අදහස් ලියන්නට වීමි. එම සටහන පිළිබඳව මා වැඩි දෙයක් නොසිතූ අතර එය මේසය මත තිබිණි. විශ්වවිද්‍යාල මිතුරකු වූ මංජුක ප්‍රනාන්දුපුල්ලේ ජනාධිපතිවරණය නිරීක්ෂණය සඳහා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට සම්බන්ධ වී සිටියේ ය. දිනක් මගේ මේසය මත තිබූ අතින් ලියූ සටහන දුටු ඔහු කීවේ තමන්ගේ ප්‍රධානියා වන, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට එය පෙන්වීමට ඔහු කැමති බව යි.

ශාන්ත තෝමස් විද්‍යාලය සමග සරවනමුත්තු පවුලට පරම්පරා ගණනාවක් පැවති සම්බන්ධය පිළිබඳව පුරාවෘත්තමය කතා තෝමස් විද්‍යාල සිසුවකු ලෙස මා අසා තිබුණ ද, ඒ අවස්ථාව වන විට මම සරා දැන නොසිටියෙමි. වසර ගණනාවකට පෙර බ්‍රිතාන්‍ය කවුන්සිලයේ පැවති පාසල් විවාදයක් විනිශ්චයට එක් වූ සරා, විලාසය සහ හරය යන දෙආකාරයෙන් ම, අනාගත තෝමියානු සුපිරි මිනිසා කොයි ආකාරයේ විය යුතු ද යන්න ගැන අඩු තරමින් රජ තුන් කට්ටු දර්ශනයක් තෝමියානුවන්ට ලබා දුන්නේය. එබැවින්, කුමාර් පොන්නම්බලම් ගැන මගේ අදහස් සාකච්ඡා කිරීමට සරා හමුවීමේ අවස්ථාවක් ලබා දීමේ මන්ජුකගේ අදහසට මගේ විරුද්ධත්වයක් නොවී ය.

හමු වී කළ සාකච්ඡාව රැකියා ආරාධනයකින් අවසන් වූ අතර මා එය පිළිගැනීමත් සමග එය පත් වූයේ ඊළඟ දශක දෙකහමාරක කාලයේ දී, ආත්ම සංයමයකින් යුතු අධ්‍යාපනයක් සහ අදහස් සමග හැඟීම් බර කුතුහලයේ සහ ආශාවේත් මිශ්‍රණයකටත්, සදාචාරාත්මක බරපතළකම සහ විකාර නරුමවාදයේත් හැම විට ම ඇති වන කුතුහලය දනවන අන්තර් ක්‍රියාකාරීත්වයකටත් මා තදින් ම හුරු පුරුදු වීමකට ය. එම අත්දැකීම, හොඳ ෂැම්පේන් වීදුරුවක කෙනෙකුගේ පළමු තොලගෑමට, චොපින් නොච්චුන් සංගීත ඛණ්ඩයේ පළමු පෙළ කිහිපයට සවන් දීමට හෝ ඔකෙශෝට් වැනි දාර්ශනිකයෙකුගේ හෝ එලියට් වැනි කවියකුගේ අමාරු වචන සහ අදහස්වල සම්පූර්ණ වැදගත්කම තේරුම් ගැනීමට පටන් ගැනීම වැන්නකට සමාන වන අතර එයින් මත් වීම සහ එයට ඇබ්බැහි වීම යන දෙක ම සිදු වෙයි. නීතිඥ වෘත්තියට ඇතුළත් වීමේ හෝ මැතිවරණ දේශපාලනයට සම්බන්ධ වීමේ හෝ මගේ සැලසුම් ගැන මා නැවත බරපතළ ලෙස සැලකිල්ල නොදැක් වූ බවත්, ශ්‍රී ලංකාවේ මගේ වෘත්තීය ජීවිතය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මත සම්පූර්ණයෙන් පදනම් වූ බවත් කීම ප්‍රමාණවත් ය. පොන්නම්බලම් ගැන මගේ ලිපිය, අහම්බෙන් මගේ පළමු පුවත්පත් ලිපිය වූයේ, ශ්‍රී ලංකාව අද පාලනය කරන ජනප්‍රියවාදී අධිකාරීවාදීන් විසින් ඝාතනය කරන ලද, සන්ඩේ ලීඩර් පුවත්පතේ මුරණ්ඩු කර්තෘ ලසන්ත වික්‍රමතුංගට සරා දුරකථනයෙන් කතා කොට පහසුකම් සැපයීමේ ප්‍රතිඵල වශයෙනි.

පසුගිය වසර විසි පහක කාලයේ ව්‍යවස්ථාවාදය සඳහා එහි ප්‍රවේශයේ පුළුල් අදියර දෙකේ පළමුවැනි අවස්ථාවේ සිට, 2000 වසරේ මා සම්බන්ධ වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, අංකුර අවස්ථාවේ පැවති සංවිධානයකි. මගේ ගණන් බැලීම අනුව, එහි පළමු අදියර 1996 දී එහි ආරම්භයේ සිට පශ්චාත් යුද පසු විපාක අවසන් වූ 2014 දක්වා වන අතර, දෙවන අදියර වන්නේ, 2015 ආණ්ඩු වෙනසේ සිට ආරම්භ වී අද දක්වා ගත වෙමින් ඇති කාලය යි. පළමුවැනි අදියර සංලක්ෂිත වූයේ, එය යොදා ගැනීමේ දී, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රීකරණයේ අවශ්‍යතා පිළිබඳ ඉතා ම සන්දර්භයාත්මක තේරුම් ගැනීමක් මත පදනම් වුව ද, පශ්චාත් ශීතල යුද සමයේ මුල් ම කාලයේ පිළිගැනීමේ ඉහළ ම මට්ටමක තිබූ, ලිබරල් ව්‍යවස්ථාවාදයේ ආකෘතිය ඉතාමත් සම්මත ආකාරයෙන් යොදා ගැනීම යි. පශ්චාත් ශීතල යුද්ධ ලිබරල් ව්‍යවස්ථාවාදයේ අන්තර්ජාතික ආකෘතිය සම්බන්ධ වූයේ, ව්‍යවස්ථාවේ උත්තරීතරභාවයට කැපවීම, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ පුළුල්වන නාමාවලිය අනුව සැකසුණු මූලික අයිතීන් පිළිබඳ පුළුල් පනතක්, ශක්තිමත් ආකාරයේ අධිකරණමය සමාලෝචන ක්‍රමයක්, හතරවන කුලුන

නිර්-දේශපාලනීය කිරීමේ රාමුවක්, සහ ඉතා ප්‍රධාන ලෙස ලොක්, රූසෝ, කාන්ට්, මෙඩිසන්, ජේ. එස්. මිල්ස්, රෝල්ස්, ඩ්වොකින්, සහ ජෝන් හාට් එලි ප්‍රධාන වශයෙන් මග පෙන්වූ ආකාරයෙන් දේශපාලන දර්ශනය පිළිබඳ තේරුම් ගැනීමකි. එමෙන් ම, ශ්‍රී ලංකාව ජනවාර්ගික වශයෙන් බහුත්ව, ගැටුම්වලට ගොදුරු වූ සමාජයක් නිසා, විවාදය මෙහෙයවන වාර්ගික ජාතිවාදයේ ස්වභාවය සහ හැසිරීම සමග නිතර ම අපහසුතාවයට පත් වුව ද, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ලිබරල්වාදීහු රටේ ප්‍රධාන ෆෙඩරල්වාදීන් වූ හ.

පළමුවන අදියරේ දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉදිරියට ගෙන ආ මෙන් ම විරුද්ධ වූ ප්‍රතිසංස්කරණ මුලපිරුම් සියල්ලට ම පාහේ මග පෙන්වනු ලැබුවේ ව්‍යවස්ථා මතවාදයේ මෙම පදනම මගිනි. බහුත්වවාදී වාර්ගික ජාතිවාදයට සහ ඒකීය රාජ්‍යයට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විරෝධයටත්, එල්ටීටීඊ වර්ගයේ සුළුතර වාර්ගික ජාතිවාදයේ මිනීමරු යුදවාදයට ප්‍රතිවිරෝධකය ලෙස මානව හිමිකම් ඉදිරියට ගැනීමටත්, පදනම වූයේ මෙම මතවාදය යි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලබාගත් ජයග්‍රහණ මෙන් ම, ඉඳහිට සිදු වූ අසාර්ථක වීම් යන දෙකට ම හේතු වූයේ මෙම ව්‍යවස්ථා මතවාදයේ සම්මත මූලධර්ම කෙරෙහි කැප වී ක්‍රියා කිරීම යි. මෙහි දී ඒ පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයකට අවස්ථාව නැතත්, මෙම දර්ශනය අනුව ක්‍රියා කිරීමේ ප්‍රධාන ජයග්‍රහණ සඳහා නිදර්ශන වන්නේ, මහජන ළැදියා නඩු කටයුතුවල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජයග්‍රහණ රාශියත්, නෝර්වේ පහසුකම් සැපයූ සාම ක්‍රියාවලිය පවතිද්දී එහි ප්‍රධාන සිවිල් සමාජ කාර්යභාරයත්, එක්සත් ජාතීන්ගේ සාකච්ඡා සභාවල දී ඇතුළුව, බලපෑම් සහිත ජාත්‍යන්තර උද්දේශන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සහ බස්නාහිර පළාතෙන් පිටත සිවිල් සමාජය වෙත එහි ප්‍රචාරක වැඩ සටහන්, තොරතුරු දැනගැනීමේ නීතිය සහ භාෂා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ කෙටුම්පත් කිරීමේ දී එහි කාර්යභාරය සහ ශ්‍රී ලංකාවේ චින්තකයින් කිහිප දෙනෙකු පමණක් සාර්ථක වී ඇති ප්‍රතිපත්ති මුල් කරගත් සහ වඩාත් බුද්ධිමය දැනුමක් යන දෙආකාරයෙන් ම සැලකිය යුතු ඒකාග්‍ර දැනුමක් සකස්කරනු ලබන එහි පර්යේෂණ නිපැයුම් ආදියත් ය.

ආපසු හැරී බැලීමේ දෘෂ්ටියකට අනුව බලන කල, සැබවින් ම, සම්මත පාරිශුද්ධියට තරමක් අධික උද්යෝගිමත් කැපවීමේ ප්‍රතිඵලයක් වූ, සැලකිය යුතු අසාර්ථක වීමක් ලෙස 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනතට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විරුද්ධ වීම සැලකිය හැකිය. එම පනත ප්‍රතික්ෂේප වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විරෝධය තීරණාත්මක නොවුව ද, එය ඓතිහාසික වශයෙන් වැරදි ස්ථාවරයක් බව බොහෝ දුරට නිසැක ය. 2000 දී එම පනත රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බවට පත් වූයේ නම්, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා සංවර්ධනයේ ගමන් මග සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රත්‍යස්ථතාවයේ ගමන් පථය සහ එතැන් සිට වූ පසුබෑසීම්, සැලකිය යුතු තරම් විශාල ලෙස වෙනස් වීමට ඉඩ තිබිණි.

කෙසේ වෙතත්, එයින් පාඩම ඉගෙනගත් අතර 2015න් පසු දෙවන අවදියේ දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ව්‍යවස්ථා උද්දේශන වඩාත් ප්‍රායෝගික සහ අඩුවෙන් සම්මතවාදී ලක්ෂණ පිළිබිඹු වූයේ එයිනි. එයින් අදහස් වන්නේ මෙම දෙවන අවදියේ දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හරයාත්මක ව්‍යවස්ථාවාදී මතවාදයට අත්‍යවශ්‍ය අඛණ්ඩතාව අතහැර දැමූ හෝ කැප කළ බව නොවේ. එහි මූලික ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ගුණය රැකගත් බව නිසැක ය. එසේ වුව ද, ව්‍යවස්ථාමය ලිබරල්වාදයට බොහෝ ආකෘති ඇති අතර සම්මතවාදී කැප වීම් අර්ථ දැක්වීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රී ලංකාවේ දේශපාලනයේ යථාර්ථය විසින් පනවා ඇති සීමා තුළ, අතීතයේ දීට වඩා බොහෝ වෙනස්කම් කිරීම්, සියුම් සහ වඩා සජීවී වන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මෙහෙයුම් මතවාදය වෙනස් වී හෝ අඩු තරමින් වෙනස් වෙමින් පවතින බව හෝ මම විශ්වාස කරමි. අත්දැකීම්වලින් තේරුම් ගෙන ඒවා ක්‍රියාවට නැගීමේ එම ගුණය ඇත්තෙන් ම පරිණත වන සංවිධානයක ලක්ෂණයක් වන අතර එමගින් ව්‍යවස්ථාමය සහ රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කිරීමේ එහි කාර්යභාරය වඩා ඵලදායි විය හැකි ය.

එසේ වුව ද එය, එහි පළමු වසර 25 තීරණය කළා වූ සහ ඉදිරි වසර 25 හැඩ ගස්වන්නට ඉඩ ඇති ඉතාමත් වෙනස් වූ ගෝලීය යථාර්ථයන්ගේ පිළිබිඹුවක් ද වෙයි. ශීතල යුද්ධයෙන් බටහිර ලැබූ ජයග්‍රහණයත්, එමගින් ලිබරල් ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය

නගරයේ එකම පිළිගැනීමක් ඇති දැක්ම වීමත් මගින් පළමු අවදිය හැඩ ගස්වනු ලැබී ය. ශීතල යුද්ධය අවසන් වීමෙන් පසු මුළු කාලයේ දී ම නොතිබූ ලෙස, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි සංවිධාන විරුද්ධ විය යුතු ආකාරයේ, තරඟකාරී අධිකාරීවාදී පාලනයන් හදා වඩා ගැනීමට නැගී එන චීනය ආධාර සපයන වඩා විශාල අශුභවාදී පරිසරයක් ඊළඟට බිහි වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා දැන් අවශ්‍ය වී ඇත්තේ වඩ වඩාත් සැබෑ දේශපාලන (සහ අඩුවෙන් පරමාදර්ශ කේන්ද්‍ර කරගත්) ප්‍රවේශයකි. උපායමාර්ගික දේශපාලනය පිළිබඳ වඩා තියුණු දැනුමක්, සන්ධාන ගොඩනැගීමට වඩාත් ළැදියා පදනම් ප්‍රවේශයක්, මෙන් ම ව්‍යවස්ථා ප්‍රජාතන්ත්‍රවාදයේ අන්තර්ගතය ගැන වඩා පිරිපහදු කළ නැවත සංකල්පගත කිරීමක්, ඒ සඳහා අවශ්‍ය වෙයි. ඒ සියල්ලට වඩා, ප්‍රතිසංස්කරණය කළ ප්‍රවේශයක දී තේරුම් ගත යුතු කරුණ වන්නේ කැමති වෙනස සිදු කළ හැක්කේ දැනුවත්ව බලරහිත වන තියුණු ක්‍රියාකාරීත්වයෙන් නොව, දැනුවත්ව දේශපාලන බලය අභ්‍යාස කිරීමෙන් බව යි. සියල්ල එකට ගත් විට, මෙම නැවත හැඩ ගැස්වීම සහ නැවත සකස් කිරීම මගින් සිදු කරනු ඇත්තේ සංවිධානයේ කාර්යභාරය පිළිබඳ ප්‍රවේශයේ විශාල නමුත් ප්‍රතිවිරුද්ධ නොවන වෙනසකි.

සංවිධානයේ ප්‍රත්‍යස්ථතාවය සඳහා මෙන් ම, ගැඹුරු ප්‍රජාතන්ත්‍රකරණයක් සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා සංවර්ධනය හැඩගැස්වීමේ දී සංවිධානයේ විෂය පථය පුළුල් කිරීම, යන දෙආකාරයෙන් ම මෙය හොඳින් ක්‍රියා කරනු ඇතැයි තදින් ම විශ්වාස කරන සහ මෙම නව දිශානතිය පිළිගන්නා කෙනෙකු වන්නේ මා ය. මිනිසෙකුගේ මෙන් ම සංවිධානයක ද තරුණ කාලය පරමාදර්ශවාදයෙන් මෙහෙයවීම හොඳ දෙයක් වුව ද, වැඩිහිටිභාවයේ මිනුම වන්නේ, ප්‍රතිසංස්කරණ සහ යථාර්ථවාදයත්, මූලධර්ම සහ බලයත් සංකලනයට එහි ඇති හැකියාව යි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට වසර 25ක් ගතවන විට, ආචාරධාර්මික ඉහළ තලයක් දේශනා කිරීමේ කාලයේ, පරාජයට හේතු කීමේ ශූරයන් වීමේ, උතුම් පරමාදර්ශවාදයේ දේශපාලනයේ අවසානය ළඟා වී ඇත. එහි ජයග්‍රහණ සහ කැපවීම් මත පදනම් වෙමින්, යුක්තිය උදෙසා නීතිය සහ දේශපාලනය ගොඩ නැගීමටත් සහ දේශීය බල දේශපාලනය සමග ගනුදෙනු කිරීමට එයට ඉදිරියේ පැවරෙන කාර්යභාරය සහ වගකීම බරපතළ ලෙස භාර ගැනීමටත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැන් කාලය පැමිණ ඇත. පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඇති එක ම සත්‍ය සහ ක්‍රියාවට නැගිය හැකි ස්ථානය එය යි. මෙම න්‍යායපත්‍රය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කොතරම් හොඳින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න, සාර්ථක වීම හෝ අසාර්ථක වීම කෙසේ වෙතත්, එහි පැවැත්මේ ඉදිරි වසර 25 දී සංවිධානය කොතරම් අදාළ ද යන්න පිළිබඳ නිර්ණායකය බවට පත් වනු ඇත.

---

**ආචාර්ය අසංග වැලිකල**

එඩින්බරෝ විශ්වවිද්‍යාලයේ නීති පාසලේ පොදු නීතිය පිළිබඳ කථිකාචාර්යවරයකු සහ පොදු නීති අංශයේ ප්‍රධානියා ද වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ එඩින්බරෝ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ද වෙයි. ඔහු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂණ සාමාජිකයෙකි.

# 15 වසරක සමාජ මාධ්‍ය භූමිකාව



**සංජන හත්තොටුව**

2006 නොවැම්බර් 28 වැනිදා *Groundviews*, සම්ප්‍රදායික මුද්‍රිත සහ විකාශන මාධ්‍යය රාමු ගත නොකළ හෝ විශේෂාංගයක් කර නොගත් දැක්මක් වාකරේ සිට ඉදිරිපත් කළේ ය. මෙම ලිපිය ස්වරයෙන් සහ යොමුවෙන් *Groundviews* නියෝජනය කිරීමටත් විකාශය කිරීමටත් අදහස් කරන දෙයෙහි පදනම විය. මුලින්ම එය ත්‍රිභාෂා වෙබ් අඩවියක් විය යුතුයැයි අදහස් කළ ද දෙමළ සහ සිංහල පාඨකයන් තමන්ගේම භාෂාවෙන් සම්බන්ධ වීමට වඩාත් කැමති බව දක්නට ලැබිණ. ශ්‍රී ලංකාවේ මාධ්‍යය සහ තොරතුරු පරිසරය වාර්ගික-භාෂාමය පදනමක් යටතේ ගැඹුරින්ම බෙදී පවතින අතර එය දශක ගණනාවක් තිස්සේ පවතින සමාජ-දේශපාලන බෙදීම් සහ පද්ධතිගත වර්ගවාදය පිළිබිඹු කරයි. සමාජ මාධ්‍යය හෝ සුහුරු දුරකථන (ස්මාර්ට්ෆෝන්) පැමිණීමට පෙර දියත් කළ *Groundviews* 2007 දී විකල්ප සහ 2008 දී මාත්‍රම් ලෙස එළි දැක්විණ. වෙන් වෙන් වශයෙන් හෝ සාමූහිකව ගත් විට ද මෙම වේදිකා තුනම ඒවා දියත් කළ දිනයේ සිට මේ දක්වාම සමාජ මාධ්‍ය පරිසර පද්ධතියේ සුවිශේෂී ය.

දකුණු කොරියාවේ *OhMyNews* හා මැලේසියාවේ *Malaysiakini* ප්‍රකාශනවල ගැඹුරු බලපෑමෙන් යුතුව සහ ඉන් ලැබූ ආශ්වාදයෙන් දියත් කළ *Groundviews* දශක තුනකට ආසන්න කාලයක් පැවති රුධිර ගංගාවකින් අවසන් වු යුද්ධයක් කරා යොමු වූ රටක, පුරවැසි ජනමාධ්‍යවේදීන් විසින් පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව අයිතිවාසිකම්වලට අදාළ කරුණු විමසා පහළ මට්ටමේ පවතින සත්‍යය වාර්තා කිරීමට යොමු විය. හිතවත්කම පවත්වා ගැනීමට හෝ බිය නිසා සම්ප්‍රදායික මුද්‍රිත සහ විකාශන මාධ්‍ය වේදිකා ආණ්ඩුව ගැන විවේචනාත්මක, පාලනයේ ස්වභාවය හෝ හමුදාවේ සීමාන්විත ක්‍රියා පිළිබඳ ලිපි පළ කෙළේ නැත. නැතිනම් පළ

කළ නොහැකි විය. ප්‍රචණ්ඩ ජාතිකවාදය සමග මුසු වූ ආණ්ඩුවේ ප්‍රකාශන සමග ජාතික ආරක්ෂාව මාධ්‍ය ප්‍රකාශනවල ප්‍රමුඛ විය. මීට ප්‍රතිවිරුද්ධ වූ කතිකා විරල ය. පැවතුණත් පිවිසීම දුෂ්කර ය. උතුරු සහ නැගෙනහිර ඇතුළු ශ්‍රී ලංකාව පුරාම වූ ලේඛකයන්ගේ නිර්මාණ නිදහසේ පළ කිරීමට තිබූ එකම වේදිකාව වූයේ ලෝක වෙබ් අඩවි ජාලය යි. (*WWW*) *Groundviews* හි මුල්ම කාලයේ ප්‍රධාන වූයේ ඇසින් දුටුවන්ගේ ප්‍රකාශ, බිම් මට්ටමේ සත්‍ය වාර්තා, සිවිල් සමාජයේ විවේචනාත්මක අදහස් සහ ප්‍රචණ්ඩත්වය, මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අභ්‍යන්තරව අවතැන් වූවන් මුහුණ දුන් අප්‍රසන්න තත්වයන් ඇතුළත් වාර්තා ය. මෙම වාර්තා මාට්‍රම් හෝ විකල්ප හි පළ කිරීමට පිළිවෙළින් දෙමළට සහ සිංහලට පරිවර්තනය කරන ලදි. එමෙන්ම පළමුවෙන් මාට්‍රම් හෝ විකල්ප හි පළ වූ දීර්ඝ ජනමාධ්‍ය වාර්තා ඉංග්‍රීසියට පරිවර්තනය කර *Groundviews* හි පළ කරන ලදි. මාධ්‍ය වෙබ් අඩවියක සංස්කරණය සහ ප්‍රජා සම්බන්ධතා සඳහා වූ මාර්ගෝපදේශ ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට දක්වමින් මෙම වෙබ් අඩවි තුනම ස්වාධීනව සහ එකිනෙකට සාම්‍ය වන ආකාරයෙන් පවතින තත්වයට අභියෝග කරන සහ පැවති සෑම ආණ්ඩුවක්ම අපහසුවට පත් වන ආකාරයේ වාර්තා පළ කරන ලදි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සිවිල් සමාජ ජනමාධ්‍ය මුලපිරුම්වල මාධ්‍ය ස්වභාවය පිළිබඳ හොඳ නිදර්ශනයක් වන්නේ යුද්ධය අවසන් වීමෙන් මාස කිහිපයකට පසුව මැණික් ෆාම් අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ කඳවුරේ පවතින අමානුෂික තත්වය ගැන *Groundviews* හි පළ වූ වාර්තාවයි. 2009 අගෝස්තු 15 වැනි දා කඳවුරේ ඇති වූ ගංවතුර තත්ත්වයක් ගැන ඡායාරූප 7ක් ග්‍රවුන්ඩ්විව්ස් හි පළ කරන ලදි. එහි නිවැසි සිය දහස් දෙනකුට මලාපවහන සහ සනීපාරක්ෂක යටිතල පහසුකම් නොමැති නිසා අපාගත තත්වයකට මුහුණ දීමට සිදු විය. *Groundviews* හි මෙසේ සඳහන් විය: "....දේශීය මුද්‍රිත, විකාශන සහ වෙබ් මාධ්‍ය මෙම වාර්තා පළ කරන්නේ නැත. ඩේලි මිරර් පත්‍රය පමණක් බිබිසී පුවතක් උපුටා නැවත පළ කර තිබිණ. ආණ්ඩුවේ පුවත්පත් හෝ රූපවාහිනී ආයතන අද, මැණික් ෆාම් හි පවතින තත්වය ගැන සඳහනක් හෝ කෙළේ නැත."

ෆේස්බුක් සහ ට්විටර් වේදිකා ස්වාධීන සහ විමර්ශනාත්මක ජනමාධ්‍යය සඳහා යොදා ගැනීමේ විපුල හැකියාවන් අවබෝධ කර ගත් *Groundviews* 2008 දී දකුණු ආසියාවේ ප්‍රථම වරට සිවිල් ජනමාධ්‍යය සඳහා ෆේස්බුක් සහ ට්විටර් ගිණුම් නිර්මාණය කළේ ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමාජ ජනමාධ්‍ය මුලපිරුම්, වෙනත් වෙබ් සහ අන්තර්ජාල තාක්ෂණ යොදා ගැනීමේදී ද පුරෝගාමී වූයේ ය. මුල් වරට සිංහල යුනිකෝඩ් මාධ්‍ය වේදිකාවේ යොදා ගත්තේ 'විකල්ප' යි. එමනිසා විකල්ප වෙබ් අඩවියට මූලික මාධ්‍ය භාවිතය, සුහුරු දුරකථනයට (*Smartphone*) මාරු වීමට වසර ගණනාවකට පෙර ලිපි ලේඛන ජංගම දුරකථනවලට ප්‍රධාන පෙළ සියලු සෙවුම් යන්ත්‍රවල (*Search Engine*) සුචිගත වීමට සහ නිවැරදිව ඉදිරිපත් කිරීමට හැකියාව ලැබිණ. දීර්ඝ ආකාරයේ ජනමාධ්‍ය වාර්තාවල සිට උපහාසාත්මක, අන්තර් ක්‍රියාකාරී, ගැඹුරු, මල්ටිමීඩියා නිෂ්පාදන දක්වාත්, ටැබ්ලට්ස් සහ සුහුරු දුරකතනවලට අන්තර්ගතය ලබා දීමට ඉතාමත් ඉහළ මට්ටමේ වෙබ් වේදිකා සහ සේවා යොදා ගැනීම දක්වාත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමාජ ජනමාධ්‍යවේදය ශ්‍රී ලංකාව තුළත් ඉන් පිටතත් ඉතාමත් පුළුල් පිරිසකට වෙබ්, අන්තර්ජාල සහ සමාජ මාධ්‍ය ලබා ගැනීමේ හැකියාව පහසු කිරීමේ දී නිරන්තරයෙන්ම සම්ප්‍රදායික මාධ්‍යයට වඩා වසර ගණනාවක් ඉදිරියෙන් සිටියේ ය. වැඩි දුරටත් අපහසුවට පත් වෙන සත්‍යය ඉදිරිපත් කිරීමේ තාක්ෂණ ව්‍යුහයන් නිර්මාණය කිරීමෙන් සහ ප්‍රලේඛනගත කිරීමෙන් සමාජ මාධ්‍ය වේදිකා අදම්ටු රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ හිතුවක්කාර වාරණය සහ කඩාකප්පල් කිරීම් හමුවේ ප්‍රත්‍යාස්ථික සමාජ මාධ්‍ය යටිතල ස්ථාපනය කරන්නේ කෙසේද යන්න විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමාජ වේදිකා ගෙනහැර දැක්වී ය.

සියල්ල බලාපොරොත්තු වූ ආකාරයට සිදු වූයේ නැත. විවේචනාත්මක අන්තර්ගතය ලබා ගැනීම වැඩි කිරීමට සමාජ මාධ්‍යයට ඇති හැකියාව ඉක්මනින්ම වෛරය සහ ප්‍රචණ්ඩත්වය හුවා දැක්වීමට යොදාගෙන අපහරණය කරන ලදි. මේ සම්බන්ධයෙන් විකල්ප

ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සිවිල් සමාජ මාධ්‍ය කණ්ඩායම, ඒ කාලයේ මියන්මාරයේ වූ වර්ධනයන් ඒ ආකාරයෙන්ම පිළිබිඹු කරමින් ප්‍රචණ්ඩ බෞද්ධ අන්තවාදීන් විසින් ෆේස්බුක් යොදා ගන්නා ආකාරය පිළිබඳව දිනෙන් දින වැඩි වන සාක්ෂි ඉස්මතු කර දැක්වීමට පළමු තීක්ෂණ පර්යේෂණය 2014 දී දියත් කළේ ය. අනතුරු වසර කීපයේ දී වඩාත් විශාල විෂය ක්ෂේත්‍රයකින් සහ පරිමාවකින් ෆේස්බුක් වේදිකාව අපහරණය කරන ආකාරය පිළිබඳ තවත් වාර්තා දෙකක් අත්ලන්තික් සාගරයේ දෙපසින්ම නිකුත් විය. අන්තර්ගත නිෂ්පාදනය සහ වෙබ් පදනම් ජනමාධ්‍යවේදයේ විශිෂ්ට නව්‍යතා සමග ප්‍රචණ්ඩ අන්තවාදය පිළිබඳව අවධානය යොමු කරමින් (සමාජ) මාධ්‍ය වටපිටාව ගැන එකවරම මූලික සමීක්ෂණ පැවැත්වීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සුවිශේෂී ය. 2018 වසරේ මුල භාගයේ දී අම්පාර සහ දිගන සිදු වූ බියකරු ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ විවෘත ලිපියක් ෆේස්බුක් සමාගමට යැවූ අතර ඔවුන්ගේ පළමු ප්‍රතිචාරය වූයේ ඒ පිළිබඳව පියවර ගැනීම ය. අනතුරුව මානව අයිතිවාසිකම් බලපෑම පිළිබඳව ස්වාධීන තක්සේරුවක් කරන ලදි. ඉන් පසුව ෆේස්බුක් හි ලොව පුරා ඇති නිෂ්පාදන සහ වේදිකා කණ්ඩායම් සමග පැවැත්වූ විවේචනාත්මක සම්බන්ධතාවය නිසා අසත්‍ය තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ වෛරය දනවන තොරතුරුවලට එරෙහිව සමාගමේ වැඩ පිළිවෙළ හැඩ ගැස්වීමට හේතු විය.

2002 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට එක් වූ මම 2020 මැද භාගයේ දී ඉන් ඉල්ලා අස් වූයෙමි. ආයතනයේ ගත කළ වසර 18න් 14ක්ම මම සමාජ මාධ්‍ය කණ්ඩායමේ සමීක්ෂණ අධීක්ෂණය කළ අතර දිනපතාම *Groundviews* පාලනය මෙහෙයවූයෙමි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමාජ මාධ්‍ය වේදිකා පුරාම ඇතුළත් වූ අන්තර්ගතය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී විභවයන් සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ගැනීමට ඉවහල් විය හැකිය යන විශ්වාසයේ එල්බ ගත් පුද්ගල කණ්ඩායමකට නායකත්වය දීමට හැකි වීම සුවිශේෂී භාග්‍යයකි. ඒ සමගම මෙම දීර්ඝකාලීන සම්බන්ධතාව සහ අත්දැකීම ශ්‍රී ලංකාවේ මාධ්‍ය කතිකාව, තනි කතාවක අනතුර නමින් හඳුන්වන තත්ත්වයට කෙතරම් දුරට සමීපව ඇත්දැයි ඉස්මතු කරයි. වර්ධනය වන සංකීර්ණත්වයෙන් හා පැහැදිලි උපායමාර්ගික අරමුණෙන් යුත් වර්ගවාදී ප්‍රචාරණයේ සාර්ථකත්වය වන්නේ වැඩි වැඩියෙන් බෙදුම්වාදී අන්තර්ගතය ලබා දීම පමණක් නොව හමුදාකරණය සහ වර්ගවාදය සාමාන්‍ය කරවන ආකල්පයන් පෝෂණය කිරීමකි.

ප්‍රජාතන්ත්‍රවාදී මංපෙත් සහ කතිකාව විනාශ කරන මෙම පිළිකාව සමග සාර්ථකව සටන් කළ හැකි එකම මාර්ගය වන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පරමාර්ථ - එනම් සමීක්ෂණ සහ මතවාදය ප්‍රචාරය කිරීමේ වැඩසටහන් තුළින් මහජන ප්‍රතිපත්ති විවාදයට ප්‍රගාමීව මැදිහත් වීමට යළි සහතික වීම සහ උත්සාහය දෙගුණ කිරීමයි. මෙම ප්‍රයත්නයේ දී සමාජ මාධ්‍ය සහ උපාය මාර්ගික සන්නිවේදනය හදවත යි. ඊළඟට වන දේ ගැන අපේක්ෂාවෙන් සිටිමි.

---

**සංජන හත්තොටුව**

සාමය, සංහිඳියාව සහ මානව හිමිකම් ශක්තිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය හා සන්නවේදන තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ උපදේශකවරයකු හා නව මාධ්‍ය සාක්ෂරතාව, වෙබ් ක්‍රියාකාරීත්වය, ඩිජිටල් ආරක්ෂාව පිළිබඳ පුහුණු කරුවකු වන අතර *Groundviews* හි ආරම්භක සංස්කාරකවරයාය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මාධ්‍ය ඒකකයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

# ධෛර්යය, නායකත්වය සහ තවත් බොහෝ දේ



**භවානි ෆොන්සේකා**

ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම්, සාමය යුක්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා කැප වූ වසර 25ක් සමරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මෙම වසර විශේෂිත ය. එය ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය වේගයෙන් ඛාදනය වෙමින් පවතින සහ අයිතිවාසිකම්වලට සහ සංහිඳියාවට තර්ජනයක් වන ආකාරයට අධිකාරිවාදී සහ හමුදා පන්නයේ පාලනයකට යොමු වීමේ නොයෙකුත් අභියෝගවලට මුහුණ දෙන වසරකි. ඒවා නව අභියෝග මතු කරවන සහ පැරණි ඒවා වඩාත් බලවත් කරන අතර ගෝලීය වසංගත තත්වයකින් වඩාත් සංකීර්ණ කරයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සවිමත්ව නැගී සිටියේත් විරල වූ හේතු යුක්තියේ හඬ නැගුවේත් වසංගත තත්ත්වයක් සහ නොවිසඳුණ ගැටුම් මධ්‍යයේ ය.

මෙම වසර 25 තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන, මැතිවරණ සංශෝධන, සංක්‍රාන්තික යුක්තිය, භාෂා අයිතිවාසිකම්වල සිට තවත් ප්‍රතිපත්ති පැතිමානයන් රැසක් ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක දේශපාලන සංවාදය පෝෂණය කිරීමේ සහ දැනුවත් කිරීමේ තියුණු පර්යේෂණ සහ මතවාදය ගොඩ නගනු දක්නට ලැබිණ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාරගර්භ සහ විවිධ වූ විශේෂඥතාව, අදහස් සහ විකල්ප යෝජනා ඉදිරිපත් කිරීමේ දී සහ තොරතුරු සමීක්ෂණය, ප්‍රජා සහභාගිත්ව ක්‍රියාකාරකම්, මැතිවරණ නිරීක්ෂණය, පුරවැසි ජනමාධ්‍යවේදය සහ මහජන අයිතිවාසිකම් සඳහා නඩු ගොනු කිරීමේ දී පැහැදිලි විය. වැඩිදුරටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බොහෝ විට තර්ජන සහ වෙනත් අභියෝග හමුවේ ගත් ස්ථිරසාර සහ ප්‍රතිපත්තිගරුක ස්ථාවර ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී අගයන් සහ ගරුත්වය, සමානත්වය, නිදහස සහ යුක්තිය වෙනුවෙන් නැගූ විශ්වාසවන්ත හඬක් සේ පිළිගැනීමට ලක් විය.

පෞද්ගලික මට්ටමේ දී එහි වඩාත් සිත් ගන්නා සහ වාස්තවික බලපෑම වන්නේ මහජන අයිතිවාසිකම් වෙනුවෙන් නඩු ගොනු කිරීමේ දී දැක්වූ නොපසුබස්නා සහ ධෛර්යමත් මැදිහත්වීම් ය. යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන, නීති ප්‍රතිපත්ති සහ අසාධාරණ සහ වෙනස් කොට සැලකීමේ භාවිතා පිළිබඳව පසුගිය දශක දෙකක කාලය තුළ නිරන්තරයෙන්ම ශ්‍රී ලංකාවේ අධිකරණය වෙත යෑමෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලබා දුන් දායකත්වය සැබැවින්ම අගනේ ය. මෙම ක්ෂේත්‍රයේ දායකත්වය සහ වින්දිතයන්ට සහ පීඩාවට පත් ප්‍රජාවන්ට ලබා දුන් සහාය නිසා පුරවැසියන්ගේ සංචරණය සීමා කෙරෙන අවසර පත් ක්‍රමය වැනි හිතුවක්කාර සහ වෙනස් කොට සැලකීමේ භාවිතා, හිතුවක්කාර ලෙස ඉඩම්වලින් ඉවත් කිරීම සහ භාෂා අයිතිවාසිකම් පදනම්ව වෙනස් කොට සැලකීම ඉවත් කිරීමට හේතු විය. ජාතික ආරක්ෂාව හෝ ආර්ථික ක්‍රියාකාරකම් මුවාවෙන් ඉඩම් අත්පත් කර ගැනීමට සෑම ආණ්ඩුවක්ම ගත් උත්සාහයන්ට අභියෝග කිරීම ද ඊට ඇතුළත් ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අතීත කාර්යයන් සහ නොසැලෙන ගුණය දෙස ආපසු හැරී බැලීමේ දී නිමාවක් දැකීමට වසර ගණනාවක්, සමහර විට දශකයක් පමණ කාලයක් ගත වූ නඩු කිහිපයක් ගැන සඳහන් කළ යුතුය. සාම්පූර් හි තත්කාර්ය අධි ආරක්ෂිත කලාපයක් නම් කිරීමෙන් සාම්පූර් හි ජනතාව අවතැන් කිරීම සහ පසුව එම ප්‍රදේශය සංවර්ධන කලාපයක් ලෙස නම් කිරීම පිළිබඳව මෙම ආයතනය අධිකරණයට ඉදිරිපත් කළ පෙත්සම විභාගයෙන් පසුව එම ජනතාවට සිය නිවෙස්වලට පැමිණීමට හැකි වූයේ අවතැන්වීමෙන් දශකයකට පසුව ය. ක්‍රියාත්මක වූයේ නම් නීතියේ ආධිපත්‍යය සහ මූලික අයිතිවාසිකම් යටපත් විය හැකි නීති සහ ප්‍රතිපත්ති අභියෝග කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළේ ය. සාර්ථක වූ අභියෝග කිරීම් ගණනාවක් නිසා බලධාරීන්ට කෙටුම්පත් කළ නීති සහ ප්‍රතිපත්ති අස් කර ගැනීමට සිදු විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නඩු පැවරීමේ මූලික ලක්ෂණයක් වන්නේ නොයෙකුත් තර්ජන සහ පසුබෑම් හමුවේ අභියෝග කිරීමේ දක්ෂතාවය සහ ධෛර්ය යි. එවැනි අවස්ථාවක් වන්නේ 2007 දී එවකට සිටි ආරක්ෂක ලේකම්ගේ නියෝගයක් මත කොළඹ සහ අවට ප්‍රදේශවල ලැගුම්හල්වල සිටි සිය ගණනක් වූ දෙමළ ජනතාව ඉවත් කිරීම ය. එවැනි ක්‍රියා නැවත සිදුවීම වැළැක්වීමට අපි කීප දෙනක් මෙම හිතුවක්කාර පියවර අභියෝගයට ලක් කිරීමට තීරණය කෙළෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ආචාර්ය සරවනමුත්තු උසාවියට පෙත්සමත් ඉදිරිපත් කිරීම නිසා ඉවත් කිරීම නතර කෙරිණ. එය පෙත්සම ඉදිරිපත් කිරීමේ සෘජු ප්‍රතිඵලයකි. වැදගත් වන්නේ මෙවැනි ප්‍රතිඵලයක් අධිකාරිවාදී පාලනයේ උච්චතම අවස්ථාවක දී පවා ලබා ගත හැකි වීම ය.

මෙම ආයතනය දශක දෙකකට අධික කාලයක් තිස්සේ මහජනතාව වෙනුවෙන් නඩු පැවරීමේ ඉතිහාසය දෙස ආපසු හැරී බලන විට එය ශ්‍රී ලංකාවේ නඩු පැවරීමේ අවකාශය කෙරේ බලපෑවේ කෙසේද යන වැදගත් කරුණ ද ඉස්මතු කරයි. මෙය කෙතරම් වාස්තවික බලපෑමක් වූයේ ද යන්න වර්තමානයේ මහජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරන පෙත්සම් සංඛ්‍යාව දෙස බැලීමෙන් සිතා ගත හැකි ය. එහෙත් විශේෂයෙන්ම ආරක්ෂාව පිළිබඳව තර්ජනයක් පවතින තත්වයක් යටතේ බලධාරීන්ට අභියෝග කිරීම සඳහා හැම විටම පෙත්සමක් ගොනු කිරීමට උනන්දුවක් වන්නේ නැත. මෙම බාධක නොතකා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම ක්ෂේත්‍රයේ නොසැලී සිටීම උපකාර කරන්නන්ගේ මෙන්ම විරුද්ධවාදීන්ගේ ද පිළිගැනීමට හේතු විය. දණ්ඩන මුක්තියට විරුද්ධ වීමටත් යුක්තිය, මානව අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීමටත් මෙම ආයතනයේ දීර්ඝකාලීන කැප වීම නිසා උසාවියට පෙත්සමක් ඉදිරිපත් කිරීමට ආරක්ෂාවක් සහ හැකියාවක් ඇතැයි බොහෝ දෙනකු තුළ හැඟීමක් ඇති කරන සංස්කෘතියක් නිර්මාණය කිරීමට හේතු වූ බව නිසැකවම කිව හැකි ය.

වැඩිදුරටත් ප්‍රධාන නීතිමය අභියෝග කිරීමේ අවස්ථා බොහොමයක ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙත්සම් ගොනු කිරීමට නොකඩවාම ඉදිරිපත් වූයේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණය (2018) විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය (2020) සහ පෝර්ට් සිටි පනත (2021) වැනි වඩාත් මෑතක අභියෝගකිරීම්වල දී විවිධ වූ පාර්ශ්ව උසාවියට ඉදිරිපත් විය. මෙම කණ්ඩායම අතර දශක දෙකකට අධික කාලයක් තිස්සේ නොකඩවාම අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළ පාර්ශ්වයන් ගෙන් එකක් වන්නේ විකල්ප ප්‍රතිපත්ති

කේන්ද්‍රයයි. අභියෝග සහ පසුබෑම් කොපමණ වුවත් බලයේ සිටින්නේ කුමන දේශපාලන පක්ෂය වුවත් එය නොසැලී සිටියේය. මහජනතාව වෙනුවෙන් නඩු ගොනු කිරීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හුදකලාව පසු කළ විසි වසරක ගමන් මග දැන් බොහෝ දෙනකු සිටින තැනක් බවට පත් කිරීමට ඒවා හේතු වූ බව පිළිගත යුතු ය. තවද එය භාවිතයන් මහජනතාව වෙනුවෙන් නඩු ගොනු කිරීම වෙනසක් ඇති කළ හැකි මෙවලමක් බව පිළිගන්නා අවකාශයක් හැඩ ගැසීමට ඉවහල් විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ස්ථිරසාරබව සහ ධෛර්යය ශ්‍රී ලංකාව තුළත් ඉන් බැහැරත් වත්මන් සහ අනාගත නීතිවේදීන්, විනිශ්චයකරුවන් ශාස්ත්‍රඥයන් සහ වෙනත් අය දැනුවත් කරන සාරගර්භ නීති සංග්‍රහයක් ඇති කිරීමට හේතු වේ. දැනට අපි කිහිප දෙනෙක් මහජනතාව වෙනුවෙන් නඩු ගොනු කිරීමෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ක්ෂේත්‍ර ගණනාවකට කර ඇති දායකත්වය ඇතුළත් ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේ උත්සාහයක යෙදී සිටිමු. එය අප සියලු දෙනාගේ ජීවිත කාලයෙන් ඔබ්බට යන සුවිශේෂී වැඩ කොටසක නිර්මාණය නිරන්තරයෙන්ම සිහිපත් කිරීමක් මෙන්ම වත්මන් සහ අනාගත පරම්පරාවන්ට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මැදිහත්වීම් පිළිබඳ අද්විතීය සහ සුවිශේෂී දැනුමක් ලබා දෙන සංග්‍රහයක් වනු ඇත.

මේවා සහ තව බොහෝ අත්දැකීම් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පළමු විසිපස් වසරේ ගමන් මග ආශ්වාදයක් බවට පත් කරයි. එය වැඩ නිම කිරීමෙන් පසුව තේ කෝප්පයක රස විඳින අතර ගොඩනැගුණු ජීවිත කාලය පුරාම පවතින මිත්‍රත්වයක් ඇතිව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දොරකඩ පසු කළ සිය ගණනකගේ ගමනකි. බොහෝ දෙනෙකුට එය ජනතාවගේ ජීවිත වෙනස් කළ සහ නෛතික සහ දේශපාලන සංවාද දැනුවත් කළ සිහින ලොවක් සජීවී කළ සුරැකුම් නිවසකි. ඒ සියල්ලට වඩා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය දැක්ම ඊළඟ තලයට ගෙන යන අසමාන වූ පිරිසක් ගොඩ නැගීමට දායක විය. වසර විසි පහකට පෙර දල්වන ලද ගිනි සිළුව තව තවත් දීප්තිමත්ව අද්විතීය වූ අදහස්, අප්‍රමාණ වූ ශක්තිය සහ අසහාය නායකත්වයෙන් තවත් වසර ගණනාවක් පවතිනු ඇත.

---

**භවානි ෆොන්සේකා**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නීති අංශ ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂිකාවකි. නීතිඥවරියකි. ඉඩම්, සංහිඳියාව, උතුරු නැගෙනහිර ජනයාගේ මානව හිමිකම් ඇතුළු විෂයයන් ගණනාවක කෘති හා ලිපි සම්පාදනය කර ඇත. යෞවන මානව හිමිකම් ක්‍රියාකාරිනියක ලෙස සම්මානයට පාත්‍ර වී ඇත.

# අයිතිවාසිකම් සහ ගරුත්වය සමග සාමය ලබා ගැනීමේ අරගලය



**මිරාක් රහීම්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාමය සහ ගැටුම් විශ්ලේෂණ ඒකකයට මා පර්යේෂකයෙකු වශයෙන් සම්බන්ධ වූයේ අපේක්ෂාව සහ ඊට ඉඩකඩ පැවති සමයේ දී ය. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානය අතර 2002 පෙබරවාරි මස සටන් විරාම ගිවිසුමක් අත්සන් කළ අතර දිගු කලක් තිස්සේ පවතින වාර්ගික ගැටුමට සාකච්ඡා මාර්ගයෙන් විසඳුමක් ලබා ගැනීම සඳහා සාම කතාබහ ආරම්භ වී තිබිණ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ සාකච්ඡාමය විසඳුමක් වෙනුවෙන් පෙනී සිටි අනෙකුත් සිවිල් සමාජ සංවිධාන සාම ක්‍රියාවලියට සහාය සඳහා විවිධ ප්‍රයත්න දැරී ය. වාර්ගික ගැටලුවට කල් පවත්නා විසඳුමක් සෙවීම නිදහසින් පසු මෙම දිවයින මුහුණ දුන් බරපතළම අභියෝගය යි. යුද්ධය අවසන්ව දශකයක් ගත වුව ද තත්ත්වය එසේම පවතී.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සාකච්ඡා ක්‍රියාවලියේ පළමු තලයේ (*Tract 1* - ඒ දිනවල නිල රාජ්‍ය තාන්ත්‍රිය කටයුතු හැඳින්වීමට යොදා ගත් වහර) සම්බන්ධ වී සිටි සාකච්ඡාකරුවන්ට සහ අනෙකුත් අයට ප්‍රතිපත්ති විකල්ප සහ අදහස් ලබා දීමේ උපදේශක සහ නිරීක්ෂණ භූමිකාවක සුවිශේෂී තැනක් හිමි විය. ඊට සාම ක්‍රියාවලිය පිළිබඳව ජනතාව තුළ පුළුල් අවබෝධයක් ඇති කරවීමට, මහජන සංවාද ඇති කරවීමට සහ අන්තර්ජාතික ප්‍රජාව සමග මතවාදී ප්‍රචාරයට හැකියාව තිබිණ. මෙම කාර්ය සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, බොහෝ විට 2001 දී පමණ සාමය සහ ගැටුම් විශ්ලේෂණ ඒකකය නමින් විශේෂිත අංශයක් පිහිටුවා තිබිණ. එහි ප්‍රධානියා වූයේ කලින් සටන්කාමී සංවිධානයක් වූ සහ පසුව දේශපාලන පක්ෂයක් වශයෙන් කටයුතු කළ ඊළාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණේ (*EPRLF*) නායකයෙකුව සිට පසුව සාම

ක්‍රියාවලියට එක් වූ පර්යේෂකයෙකු වන කේතීස් ලෝගනාදන් ය. ඔහු වාර්ගික ගැටුමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විසඳුමක් වෙනුවෙන් සහ මානව අයිතිවාසිකම් වෙනුවෙන් දැඩිව පෙනී සිටි අතර එල්ටීටීඊය විවේචනය කළේ ය.

මෙම ඒකකය ස්ථාපනය කළේ ගැටුමට සාමකාමී විසඳුමක් වෙනුවෙන් පෙනී සිටීමේ විශේෂිත මෙහෙවර සඳහා ය. එය පිහිටුවන ලද්දේ ලොව පුරා ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාලවල ගැටුම් නිරාකරණය සහ පරිණාමය ජනප්‍රිය විෂයක්ව පැවති සමයේ ය. දිග්ගැසුණු ගැටුම් සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය පැවති විවිධ සන්දර්භයන් තුළ මෙම සංකල්ප යොදා ගැනීම පිළිබඳ සාකච්ඡා කළ ලිපි ලේඛන සමුදායක් ද තිබිණ. මෙම සංකල්ප යොදා ගන්නා සංවිධාන සාමය පිළිබඳව වැඩ කරන රාජ්‍ය නොවන සංවිධානවල දෙවන පරම්පරාව යි.

මෙම මෙහෙය සපුරාලීම සඳහා අප ඒකකය පර්යේෂණ සහ මතවාදී මෙවලම් ගණනාවක්ම යොදා ගත්තේ ය. සාම ක්‍රියාවලියේ දී මානව අයිතිවාසිකම්වල වැදගත්කම සහ අනෙකුත් සාම ක්‍රියාවලීන්ගෙන් ලබා ගත හැකි පාඩම් වැනි සාමයට අදාළ ගැටලු පිළිබඳ නිර්මාණාත්මක අන්තර්ගතයෙන් යුත් 'සාම විමර්ශී' භාෂා තුනෙන්ම පළ වූ සඟරාවකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අනෙකුත් ඒකක සමග එක්ව සහයෝගිතාවයෙන් සැකසූ මෙම සඟරාව රට පුරාම බෙදා හරින ලදි. ඈත ප්‍රදේශවල අප ක්ෂේත්‍ර කටයුතුවල යෙදෙන විට තම ප්‍රදේශයේ පුස්තකාලයෙන් හෝ ප්‍රජා මූලික සංවිධානයක දී එම සඟරාව කියවන ලද පාඨකයන්ගේ ප්‍රශංසාව අපට ඇසිය හැකි විය. සටන් විරාම සමයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විවිධ දිස්ත්‍රික්කවල ක්‍රියාකාරීන් ඇතුළත් විවිධ පිරිස් සමග වැඩමුළු සංවිධානය කළේ ය. ඒ මගින් ලබා ගත් දැනුම සහ තොරතුරු පදනම්ව ඔවුන්ට තමන් වැඩ කරන ප්‍රදේශයේ ජනතාව සමග වඩාත් දැනුවත්ව සාකච්ඡා කළ හැකි විය. එහෙත් පැහැදිලිවම මෙවැනි බාහිර වැඩ කටයුතු සඳහා වඩාත් වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබිණ.

මෙම ඒකකය ජාතික සහ ප්‍රාදේශීය මට්ටම්වල දී ගැටුමේ විශේෂිත පැතිමානයන් වඩාත් හොඳින් හඳුනා ගැනීමට සමීක්ෂණ පවත්වන ලදි. ප්‍රාදේශීය මට්ටමේ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් හඳුනා ගැනීමට ප්‍රජා මට්ටමේ ගැටුම් ආමන්ත්‍රණය කරන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම සඳහා 2003 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මා විසින් සම්බන්ධීකරණය කළ 'ඊසානදිග සහ පුත්තලමේ ආරවුල් විසඳා ගැනීමේ නොවිධිමත් ක්‍රමය' යනුවෙන් සමීක්ෂණයක් පැවැත්වී ය. 2005 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මහාචාර්ය අෂුතොෂ් වාර්ෂිනි ගේ ප්‍රධානත්වයෙන් ප්‍රජා එකතූන් සහ සම්බන්ධතා මත පදනම් වාර්ගික ප්‍රචණ්ඩත්වය සහ සහජීවනය පිළිබඳ ඔහුගේ නිබන්ධනය යොදා ගනිමින් රටවල් කීපයක් සම්බන්ධ කර ගත් අධ්‍යයනයකට ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සම්බන්ධ විය. එය වාර්ගික 'ගැටුම්' ගණනාවක් පැවති ශ්‍රී ලංකාව වැනි රටකට බෙහෙවින් අදාළ ය.

සාම ක්‍රියාවලියට බලපෑම් කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් මෙම ඒකකය බොහෝ විට සාම සාකච්ඡා වටයකින් පසුව වටමේස සාකච්ඡා ගණනාවක් සංවිධානය කළේ ය. මෙම වටමේස සාකච්ඡා සිවිල් සමාජයේ නියෝජිතයන්ට ආණ්ඩුවේ සාකච්ඡා කණ්ඩායමේ සාමාජිකයන් වෙත පහළ මට්ටමේ ප්‍රශ්න සහ වෙනත් ගැටලු සෘජුවම ඉදිරිපත් කිරීමට අවස්ථාවක් විය. අන්තර්වාර වැඩපිළිවෙළ සහ අවසාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විසඳුමක් පිළිබඳ ප්‍රශ්නවලට අමතරව අවධාරණය වැඩියෙන්ම යොමු වූයේ මානව අයිතිවාසිකම් ගැන ය. උල්ලංඝනය කිරීම් ගණනාවක්, විශේෂයෙන් එල්ටීටීඊය විසින් ළමයින් පැහැර ගෙන යෑම සහ හමුදාවට බඳවා ගැනීම, දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කිරීම සහ සිවිල් වැසියන්ට හිරිහැර කිරීම වැනි මානව අයිතිවාසිකම් පිළිබඳ කරුණු පසු පසට දමා ඇතැයි බලවත් කනස්සල්ලක් තිබිණ. සිවිල් සමාජයේ බලපෑම් (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද ඇතුළත් වූ සාම සහයෝගිතා කණ්ඩායමේ ප්‍රකාශයන් වැනි) සහ අන්තර්ජාතික බලපෑම් නිසා මානව අයිතිවාසිකම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට සිදු විය. සාම සාකච්ඡාවල දී මානව අයිතිවාසිකම් පිළිබඳ උපදේශකයෙකු ලෙස ඉයන් මාර්ටින් පත් කිරීම ද ඒ අනුව සිදු විය. කෙසේ වුවත් සටන් විරාම ගිවිසුම සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් දිගින් දිගටම සිදු වූ අතර සමහර වටමේස සාකච්ඡාවල දී ක්‍රියාකාරීන් පවතින තත්වයේ බරපතළකම

සහ කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම නිසා උණුසුම් තත්වයන් ද ඇති විය.

සමහරුන් තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවිවාදයෙන් ම සාම ක්‍රියාවලිය වෙනුවෙන් පෙනී සිටින්නේ යැයි අදහසක් තිබුණ ද සැබෑ තත්වය වඩාත් සංකීර්ණ ය. 2003 අප්‍රේල් මස ටෝකියෝ ප්‍රදානක සමුළුවේ දී සිවිල් සමාජය නියෝජනය කිරීමට ආචාර්ය සරවනමුත්තුට ආරාධනය කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිවිල් සමාජය තුළ සාම ක්‍රියාවලියේ මූලික සාධකයක් ලෙස පිළිගැනීමේ අවස්ථාවක් නිසා සිවිල් සමාජයට වැදගත් කඩඉමකි. එහෙත් මෙම මැදිහත් වීමේ අරමුණ වූයේ සාකච්ඡා මේසයේ අසුන් ගැනීම පමණක් නොව ක්‍රියාවලියේ ආකෘති රාමුවට සහ එහි ප්‍රතිඵලය කෙරේ බලපෑමක් කිරීම ය. පසු පසට දමා තිබුණ 'අමාරු ප්‍රශ්න'වලට අවධානය යොමු කිරීම හැම විට ම, විශේෂයෙන් ම එල්ටීටීඊය සහ වෙනත් අයගේ අසතුටට හේතු වූයේ අසීරු ක්‍රියාවලියක් වඩාත් සංකීර්ණ කරවන්නේ ය යන අදහසිනි. නිදසුනක් වශයෙන් 2004 දෙසැම්බර් 26 සුනාමි ව්‍යසනයෙන් පසුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සටන් විරාම සමයේ සහ සුනාමි ව්‍යසනයේ අත්දැකීම් පදනම් කර ගෙන නැගෙනහිර පළාතේ මුස්ලිම් ප්‍රජාවගේ ආකල්ප පිළිබඳව වටමේස සාකච්ඡාවක් කැඳවූයේ ය.

සාම කතා බහට මුස්ලිම් ප්‍රජාවගේ නියෝජනය සහ සහභාගිත්වය පිළිබඳ ප්‍රශ්නය එම ක්‍රියාවලිය පසුබෑමට තුඩු දුන් මූලික හේතුවක් විය. 2005 නොවැම්බර් මස ආණ්ඩු වෙනසෙන් පසුව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සාම ක්‍රියාවලිය පිළිබඳව ප්‍රතිපත්ති සැලසුම්කරුවන් සමග සම්බන්ධව සිටියේ ය. සටන් විරාමය පවත්වා ගැනීම සඳහා ජිනීවා හි පැවති සාකච්ඡාවලින් පසුව ඊළඟ සාකච්ඡා වටය සඳහා දැක්මක් ඉදිරිපත් කිරීමට වටමේස සාකච්ඡාවක් පැවැත් වූ අතර ඊට ආණ්ඩුවේ සාකච්ඡා කණ්ඩායමේ සාමාජිකයෙක් ද සහභාගි වූයේ ය.

මා 2003 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට එක් වූයේ මගේ ශාස්ත්‍රපති උපාධියේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර මාස හයක කාලයක් වැඩ කිරීම සඳහා ය. එම කෙටි කාල සීමාව මා තුළ ගැඹුරු බලපෑමක් වූ ආශ්වාදයක් සහ තෘප්තියක් ලබා දුන් වැඩවලින් සනිටුහන් විය. ඒ වන විට වයස විසි ගණන්වල මැද භාගයේ සිටි මට සහෝදරාත්මක සහයෝගිතා පරිසරයක වැඩ කිරීමට ලැබීම ප්‍රීතිමත් අත්දැකීමකි. සරා සහ කේතීස් යන දෙදෙනාම 'දුෂ්කර අවස්ථාවන්ට මුහුණ දීමට සැලැස්වීමෙන්' තම කාර්යමණ්ඩලයට මග පෙන්වීමක් ලබා දීම කෙරේ විශ්වාසය තැබූහ. ඔවුන් අප කෙරේ තැබූ බලාපොරොත්තුව අපගේ විශ්වාසය නගාසිටුවීම හේතු විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අප බොහෝ දෙනකුට ඉගෙන ගනිමින් වර්ධනය වීමට අවකාශය සහ අවස්ථාව සැලසුවේ ය. උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහේ සංචාරය කිරීමේ දී මට භෞතික සහ පරිසර විනාශයත්, මහා පරිමාණයේ අවතැන්වීමේ බලපෑමත්, සාමය බලාපොරොත්තුවෙන් තම ජීවිත නැවත ගොඩ නගා ගැනීමට ප්‍රජාව ගන්නා ප්‍රයත්නයත් දැක ගත හැකි විය. මගේ ජීවන ගමන් මග පැහැදිලි විය. මගේ ප්‍රතිචාරය වූයේ හැකි පමණ ඉක්මණින් මගේ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කොට ආපසු ශ්‍රී ලංකාවට පැමිණ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට එක් වීම ය. මම වසර අටහමාරක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ කෙළෙමි.

මා ආපසු පැමිණියේ සාම ක්‍රියාවලිය අර්බුදයට පත් වෙමින් තිබූ සහ සුනාමි ව්‍යසනය ඇති වීමට මාසයකට පෙර 2004 නොවැම්බර් මාසයේ දීය. අප්‍රකාශිත යුද්ධය 2006 ජූලි මාසයේ දී මහා පරිමාණ යුද්ධයකට පරිවර්තනය වූ අතර සුබවාදී අපේක්ෂා බිඳ වැටිණ. 2006 අගෝස්තු 11 දින කේතීස්ගේ ඛේදනීය ඝාතනය ඇතුළු මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ගණනාවක් දක්නට ලැබිණ. රටේ පැවති තත්වය මත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ යොමුව වෙනස් කිරීමට සිදු විය. ප්‍රචණ්ඩත්වය ප්‍රජාව කෙරේ ඇති කළ බලපෑම ලේඛනගත කිරීම සහ තොරතුරු සෙවීමේ වාර්තා පදනම් කර ගෙන වින්දිතයන් සඳහා සහන ඉල්ලා සිටීම, මහජන අවශ්‍යතා සඳහා නඩු ගොනු කිරීම සහ සටන් අවසන් කරන මෙන් ඉල්ලා සිටීම වැනි කරුණු කෙරේ යොමු විය. සමහර අවස්ථාවල කිසියම් හෝ බලාපොරොත්තුවක් රඳවා ගත නොහැකි විය. උත්සාහය වූයේ නිහැඬියාව, ඉච්ඡා භංගත්වය, ස්වයං වාරණය හා බිය තුරන් කිරීම සහ අයිතිවාසිකම් හා ජීවිතයේ අගය පෙන්වා දීමට ය. බිය සහ තර්ජන පැවති වාතාවරණය තුළ පවා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දිගින්

දිගටම සිය මතය ප්‍රකාශ කරමින් සටන් පාර්ශ්වයන්ගේ ක්‍රියාවන්ට අභියෝග කළේ ය.

2009 මැයි මස යුද්ධය අවසන් වීමත් සමග මෙම ඒකකය බොහෝ විට නීති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඒකකය සමග සමීප සහයෝගිතාවයෙන් වෙනත් කරුණු අතර අවතැන්වීම, සංක්‍රාන්ති යුක්තිය, ඉඩම්, ආගමික සහ වාර්ගික ප්‍රචණ්ඩත්වය ඇතුළත් බරපතළ කරුණු ගැන අවධානය යොමු කිරීමට සහ ඉන් ප්‍රජාවන්ට මුහුණ දීමට සිදු වන තත්වයන් ගැනත් ප්‍රතිපත්ති නිර්දේශ ලබා දීම, පරීක්ෂණ කිරීම සහ මතවාදය ප්‍රකාශ කිරීම දිගටම සිදු කළේ ය. කේ. තෙන්මොෂි, චණ්ඩුල කුඹුක්ගේ, නයිජල් නුගවෙල සහ වෙනත් කාර්යමණ්ඩල සාමාජිකයෝ බොහෝ දෙනෙක් ඒකකය හැඩ ගැසීමට සහ එහි කාර්යයන්ට දායක වූහ. සංවිධානය නවීකරණ වැඩ පිළිවෙළේ කොටසක් වශයෙන් මෙම ඒකකය 2013 දී නීති සහ පර්යේෂණ ඒකකයට සම්බන්ධ කරන ලදි. සාමයට අදාළ කරුණු ගණනාවක් ගැන විශේෂයෙන්ම සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව මතවාදය ඉදිරිපත් කිරීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තවමත් පෙරමුණේ සිටී.

නව සහස්‍රයේ පළමු දශකය දෙස ආපසු හැරී බැලීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, වර්ධනය වන අත්තනෝමතිකත්වය, හමුදාකරණය සහ විසම්මුතිය පාගා දැමීම හමුවේ මහජන සංවාදය, නීතියේ ආධිපත්‍යය සහ පීඩාවට පත් පුද්ගලයන්ගේ සහ ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සහ ගරුත්වයට වඩාත් වැඩි පිළිගැනීමක් ලබා දීම වෙනුවෙන් පෙනී සිටියේ ය. පුද්ගලික මට්ටමේ දී මට ශක්තියක් වූයේ අප සගයන් අතර පැවති සහෝදරත්වයත්, තම ප්‍රශ්න ඉදිරිපත් කරමින් ඒ ගැන පියවර නොගැනීම ගැන අපට අභියෝග කළ වින්දිතයන් සහ ප්‍රජාවන් සමග මුහුණට මුහුණ ලා කටයුතු කිරීමට හැකි වීමත් ය. පීඩාවට පත් ප්‍රජාවන්ගේ ඉල්ලීම්වල මූලික හරය වන්නේ මෙම තත්ත්වය වඩාත් හොඳ විය යුතු බව සහ එසේ කළ හැකි බව ය. අප සියලු දෙනා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී, සාධාරණ, බහුත්වවාදී සහ සාමකාමී ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට වඩාත් දැඩිව අරගල කළ යුතු ය.

---

**මිරාක් රහීම්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකවරයකු වශයෙන් කටයුතු කර ඇත. මානව හිමිකම්, ප්‍රතිසංවිධානය, ඉඩම්, අවතැන්වීම් ගැටලු සහ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව පර්යේෂකයෙකි. සාම අධ්‍යයනය සම්බන්ධව පශ්චාත් උපාධියක් ලබා ඇති ඔහු අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරයෙකි.

# විකල්ප මිනිසුන්ගේ වැඩබිම



**චන්ද්‍රිකා ගාඩියවසම්**

මට මුලින්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගැන අසන්නට ලැබෙන්නේ 1999 දී ගණකාධිකාරී පන්තියේ මිතුරියකගෙනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මැතිවරණ නිරීක්ෂණය කරන බවත් ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳව විමසිල්ලෙන් සිටින පර්යේෂණවලට බර ආයතනයක් බවත් ඇය පැවසුවාය. 'විකල්ප ප්‍රතිපත්ති' යන නම මා කුතුහලයට පත් කළේ ය. මා ප්‍රධාන ධාරාව විශ්වාස නොකරන කෙනෙකු නිසා එය මට ගැළපුණේ ය. ඔවුන් කවුරුන් ද සහ ඔවුන් කුමක් කරනවා ද කියා සොයා බැලීමට මට අවශ්‍ය විය. පසුව මට එහි පරිපාලන අංශයට එක් වීමට අවස්ථාව හිමි විය. ප්‍රජාතන්ත්‍රවාදය, පාලනය, මානව හිමිකම්, බහුත්වවාදය වැනි වෙනත් සිත් ඇදගන්නාසුලු වචන මට අසන්නට ලැබිණි. එම වචනවලින් අදහස් කරන්නේ මොනවා ද? විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අධීක්ෂකයෙකු ලෙස හැඳින්වූයේ ඇයි? අපි කරන දේ ගැන කියවීමට මට වැඩි කාලයක් ලැබේ යැයි බලාපොරොත්තුවෙන් මම ගිණුම්වලින් පුස්තකාලය/ප්‍රලේඛනය වෙත මාරු වීමට කැමති බව ආචාර්ය සාරාට පවසන්නේ මෙවන් පසුබිමක සිට යි!

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අද්විතීය යි, සුවිශේෂී යි. අප සාම්ප්‍රදායික අදහස්වලට අභියෝග කර, රාමුවෙන් පිට සිතන්නත්, යමක් ඇයි කියා විමසන්නත් යමක් එසේ නොවන හේතුව විමසන්නත් යොමු වූ පිරිසකි. බහුතරය විසින් පිළිගත් නිසා හෝ සැම විටම යමක් සිදු වූ පමණින්, එම පවතින තත්ත්වය අප පිළිගත්තේ නැත. අපි ඒ තත්ත්වයන් සාධාරණීකරණය කරන හේතු ඉල්ලා සිටිමු. අප මිථ්‍යාවන්ට යටත් වන්නේ හෝ රැවටීමට හසු වන්නේ නැත. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, සාමය සහ බහුත්වවාදය යන සංකල්ප යටතේ අධීක්ෂණය කරන සහ

විවේචනය කරන සුදුසුකම් ලත්, අනතුරු පිළිබඳ දැනුම් දිය හැකි ප්‍රවීණයන් සහ ලිබරල් චින්තකයින්ගෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සෑදී ඇත. පුරවැසියන් ඉදිරියේ දිගහැරෙන අසාධාරණ සිදුවීම් සහ පදනමක් නොමැති න්‍යායන් අභියෝගයට ලක් කරමින් අනපේක්ෂිත ලෙස අප ඉදිරියට පතිත වන නීති-ප්‍රතිපත්තිවල අවදානම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කිසිම බයකින් තොරව හඬ නැගීම නිසාම වරෙක එය ප්‍රවෘත්ති මවන්නෙකි.

ප්‍රජාතන්ත්‍රවාදය කෙතරම් බිඳෙනසුලු හා සුවිශේෂී ද යන වග ද, අධීක්ෂණය නොමැති නම් මානව හිමිකම් කෙතරම් පහසුවෙන් පසෙකට දැමිය හැකි ද යන්න සහ එවැනි අධීක්ෂණයන් පවත්වා ගැනීම සඳහා කෙතරම් උත්සාහයක් ගත යුතු ද යන වග මේ තේමාවල විද්වතෙකු නොවන මම ඉගෙන ගතිමි. එවැනි කාර්යභාරයක් සඳහා සැම විටම සූදානම්ව සිටීමට නම් කැපවීමකින් යුතු වීම සහ අඛණ්ඩ අධ්‍යයනය කළ යුතු ය. සඳහන් කිරීමට නොහැකි තරම් ජයග්‍රහණයන් අප ලබා ඇති අතර, මගේ පුද්ගලික ප්‍රියතම අවස්ථාවන් නම් අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ට ප්‍රයෝජනයක් වන අතුරුදහන් වීමේ සහතිකය ලැබීම, ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කිරීම සඳහා දශක ගණනාවක් තිස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මූලිකව කළ අරගලය, භාෂා සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමේ කටයුතු සහ නිරන්තර නිරීක්ෂණය හේතුවෙන් බොහෝ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ අක්‍රමිකතා ක්‍රමානුකූලව තුරන් වීම යි .

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගොඩනැගීම, මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදී හා මැතිවරණ ප්‍රතිසංස්කරණය, සංක්‍රාන්ති යුක්තිය, මාධ්‍ය නිදහස සහ මාර්ගගත වෛරී ප්‍රකාශ වැනි ක්ෂේත්‍රයන්හි වසර ගණනාවක් පුරා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දහසකට වැඩි පර්යේෂණ ලිපි ලේඛන සහ ගණන් කළ නොහැකි ප්‍රමාණයක ලිපි, කෙටි විස්තර, තොරතුරු පත්‍රිකා, බහු මාධ්‍ය ක්ලිප් සහ දත්ත සමුදායන් සඳහා දායකත්වය ලබා දී තිබේ. පුස්තකාලයාධිපති වශයෙන් මගේ ඉලක්කය වන්නේ මෙම ක්ෂේත්‍රයන්හි තොරතුරු සෙවීමට අවශ්‍ය පර්යේෂකයන්ට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ මට ප්‍රවේශය ලබා ගත හැකි වෙනත් ප්‍රභවයන්ගෙන් ඔවුන්ට තොරතුරු ලබා ගැනීමට සහයෝගය දැක්වීමයි. අපගේ පර්යේෂණ භාෂා තුනෙන්ම පාසල්, විශ්වවිද්‍යාල, ඩයස්පෝරාව, විද්වතුන්, සම වයසේ මිතුරන් සහ දැන ගැනීමට කැමති ඕනෑම අයෙකු වෙත ලබා ගත හැකි ය. මෙම තේමාවල දැනුම සෙවීම සහ ලබා ගැනීම සඳහා සෑම වසරකම සිය ගණන් සිසුහු අපේ පුස්තකාලය හරහා ගමන් කරති. සෑම මසකම අපගේ වාර්තා සහ යාවත්කාලීන කරන ලද තොරතුරු ඉල්ලමින් ඊමේල්, ලිපි සහ පුද්ගලික ඇමතුම් දුසිම් ගණනක් ලැබේ. වසර ගණනාවක් පුරා බොහෝ දක්ෂ තරුණ තරුණියන් අත්දැකීම් ලබාගැනීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමඟ සම්බන්ධ වී ඇති අතර පසුකාලීනව කීර්තිමත් ආයතන වෙත ගොස් මෙම පොදු පරමාදර්ශයන් අනුව කටයුතු කරගෙන යති. ජාත්‍යන්තරව පිළිගත් ගෝලීය සංවිධාන සෑම වසරකම අධ්‍යයනයන් හුවමාරු කර ගැනීමට සහ අපගේ වැඩ කටයුතුවලදී සහයෝගයෙන් කටයුතු කිරීමට අප හා සම්බන්ධව අදහස් හුවමාරු කර ගනී.

අල් ජසීරා, බීබීසී සහ බ්ලූම්බර්ග් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි විවරණය ලබා දෙන ජාත්‍යන්තර මාධ්‍යවලින් කිහිපයක් පමණි. සාමාන්‍ය සතියක් තුළ අපේ වැඩ කටයුතු ඉස්මතු කර පෙන්වන හෝ අපේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන් සමඟ සම්මුඛ සාකච්ඡා කරන දේශීය පුවත්පත් දුසිම් භාගයක් පමණ අපට හමු වේ. සමහර විට එක් පිටුවකින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත පහර දෙන මාධ්‍ය විසින්ම අපේ සොයාගැනීම් තවත් පිටුවකින් උපුටා දක්වනු ඇත. කාර්යබහුල දිනවල ජනතාව පැහැදිලි කිරීම් එනතෙක් බලා සිටියදී මගේ ගෞරවනීය සගයෝ රූපවාහිනිය ඔස්සේ ප්‍රකාශ සිදු කරමින් හෝ මහ පාරේ සිට විරෝධය දක්වමින් ඔබ නොදකින කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරති. නොසලකා හැරිය යමක් ගැන සලකා බලන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඔබව ධෛර්යමත් කරයි. ඔබ සවන් දෙනවා ද?

සමහරවිට අපට බලධාරීන් විසින් කරනු ලබන ශාරීරික පහරදීම්, හිරිහැර කිරීම්, සිරගත කිරීම් හෝ මරණ තර්ජනවලටද මුහුණ දෙන්නට සිදු වෙයි. ව්‍යවස්ථා විරෝධී තීන්දුවක් ගැන ප්‍රශ්න

කිරීම, මැතිවරණ නිදහස් හා සාධාරණ බව සහතික කිරීම, නැතහොත් නීති කෙටුම්පතක් හොර රහසේ ඉහළට ගෙන යෑමට පෙර ගැඹුරින් අධ්‍යයනය කිරීම, සුළු ජාතීන් වෙනුවෙන් හඬක් නැඟීම හෝ දණ්ඩමුක්තියට එරෙහිව නැගී සිටීම වැනි දේ සඳහා සෑම වසරකම මගේ සගයන් තමන්ගේ අලුත් අවුරුද්ද සහ නත්තල් නිවාඩු, සති අන්ත නිවාඩු, බොහෝ රාත්‍රීන් ඇතුළු දීර්ඝ කාලයක් පූජා කරන අයුරු මම වසරින් වසර ඉතා ගෞරවයෙන් බලා සිටියෙමි. මේ පිළිවෙත නිසා ඔවුන්ගේ සමීපතමයින්ට සිදු වන අහිමිවීම් හා සිත් තැවුල් අපමණ බවත්, ඒ අර්ථයෙන් ඔවුන් ද යහපත් සමාජ අරමුණු වෙනුවෙන් කැපවීම් කළ අය ලෙස ඇගයුමට ලක් විය යුතු බවත් මම සිතමි. කෙතරම් කාර්යබහුල කාලසටහනක් තිබුණත්, අපේ පර්යේෂකයන් සැම විටම පැමිණ සිටින සිසුවෙකුට උපදේශනය කිරීමට, සම වයසේ මිතුරෙකුට සහයෝගය දැක්වීමට හෝ මාධ්‍ය විමසුමකට පිළිතුරක් දීමට මැළි වන්නේ නැත..

බොහෝ දෙනෙකු එඩිතර නොවන තැන්වල මගේ සගයෝ පිළිතුරු සොයමින්, ප්‍රශ්න සොයමින් සහ මිනිසුන් සමහර විට ඇසීමට අකමැති කතන්දර නැවත කරළියට ගෙන එමින් නිර්භීතව ගමන් කරති. මක්නිසාද මෙම කතා ප්‍රසිද්ධ වූයේ නැත්නම් සමහර කතා සැමදා අපට වැළලී පවතී. එසේත් නැතිනම් හඳුනාගත නොහැකි ලෙස විකෘති කරන ලද කතා ලෙස පවතී. අප පෙනී සිටින දේවල් වැරදි ලෙස ඉදිරිපත් කිරීම, අර්ථ දැක්වීම, උපහාසයට ලක් කිරීම සහ අනිසි ලෙස භාවිත කිරීම අනෙක වාරයක් මා දැක ඇත.. එහෙත් සිය සුපිළිපන්භාවය, අව්‍යාජභාවය සහ නිර්භීතභාවය හේතුකොටගෙන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තවදුරටත් පවතී.

කාලයත් සමග මම අයි.එෆ්.ආර්.සී. වෙත සංක්‍රමණය වුවද, ගිය පයින් ආපසු පැමිණ, ස්වාධීනව ලිවීමට යොමු වී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සේවා ඒකකය සඳහා වාර්තා සහ ව්‍යාපෘති යෝජනා ලිවීමටත්, දේශගුණික විපර්යාස සම්බන්ධ ප්‍රමුඛ රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ වැඩ කිරීමටත් යොමු වුණෙමි. ඩේලි මිරර් සහ ඩේලි එෆ්.ටී සමඟ මගේ සංස්කරණ කුසලතා වැඩිදියුණු විය. පසුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමඟ අර්ධකාලීනව රාජකාරි කරමින් සංචාරක ක්ෂේත්‍රයටද පිවිසුණ ද පෞද්ගලික හා වෘත්තීය කටයුතුවල දී මගේ සගයන්ගේ ලිබරල්වාදය, සංවේදනය සහ සාධාරණ සිතිවිලි යන වටිනාකම් සැම විටම හිතේ තබාගතිමි.

ඉඳහිට සමහරු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමච්චලයට ලක් කරන අතර සමහර විට ඔවුන් අහම්බෙන් අසන බොරු එළියට ඇදගෙන අපෙන් පැහැදිලි කිරීම් අසමින් අපහාසයට ලක් කරති. නමුත් ඒ අතරම ආපසු හැරී තම නැදෑයෙකුගේ රැකියා අයදුම්පත ඇතුළත් කළ හැකි දැයි එක හුස්මට අසති. ඒ ඔවුන්ට රැකියාවක් අවශ්‍ය නිසා හෝ අප සමඟ වැඩ කිරීමට කැමති නිසා විය හැක. එත් මට සමාවෙන්න, ඔබට මෙහි එසේ ලෙහෙසියෙන් ඇතුළත් වීමට හැකියාවක් නැත. මෙය වෙනස්ම තැනකි. මෙහි වැඩ කිරීමට නම් අප මුහුණ දෙන අභියෝගයන්ට ඔරොත්තු දීමට සහ අප විශ්වාස කරන දේ සඳහා සටන් කිරීමට අපට ස්ථිර විශ්වාසයක් අවශ්‍ය යි.

එමෙන්ම අප කරන දේ ගැන අපි ආඩම්බර වන්නෙමු.

---

**චන්ද්‍රිකා ගාඩියවසම්**

දැනට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පුස්තකාලයාධිපතිනිය වේ. විවිධ විෂයයන්හි පුවත් පත් ලේඛිකාවකි. සත්ත්ව අහිංසාව පිළිබඳ සමාජ ක්‍රියාකාරිනියකි.

# හඬක් නැතියවුන් වෙනුවෙන් නැගී සිටීම



ඉරෝමි පෙරේරා

ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන මහජන ළැදියා නඩු කටයුතු ගණනාවක් සමග මෙන් ම, කාලයේ ප්‍රධාන ප්‍රශ්න රාශියක් පිළිබඳ උද්දේශන සමග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සන්බන්ධ ය. මට ඉතා ම තීරණාත්මක වූ කාලයක, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නායකත්වය දුන් පර්වර්තනීය පර්යේෂණ සහ උද්දේශන ලැයිස්තුවට, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ, 2013 සිට කොළඹ නාගරික දුප්පත් ප්‍රජාවේ ජනයා ඉවත් කිරීම වටා කළ වැඩ කටයුතු ද ඇතුළත් ය. ප්‍රජාවන්ට ප්‍රවේශ වීම දුෂ්කර වූ, ඉවත් කිරීමට විරුද්ධව සිවිල් සමාජයේ සහ ජාත්‍යන්තරයේ පවා සහයෝගය ගොඩ නැගීම ඉතාමත් දුෂ්කර වූ කාලයක, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (වැඩ කටයුතු සඳහා ඔහුගේ අධිෂ්ඨානය සහ මහන්සි නොදැනෙන ගුණය තීරණාත්මක වූ නැසීගිය විජේ නාගරාජ් සමග) ඉවත් කිරීම් දිගට ම ලේඛනගත කිරීමටත්, ඔවුන්ගේ නඩු කටයුතුවල දී ප්‍රජාවන්ට ආධාර කිරීමටත්, සිදු වන දේ ගැන වාර්තාවක් සකස් වීම සහතික වන ලෙස ප්‍රතිදාන ලබාදීමටත්, කටයුතු කළේ ය. සැලකිය යුතු කරුණ වන්නේ මෙම වැඩ කටයුතු එම කාලයේ සංවර්ධන කතිකාවට ප්‍රතිවිරුද්ධ කතාවක් ලෙස ද සේවය කිරීම වන අතර එය අදට ද අතිශයින් අදාළ ය.

කොළඹ "ලෝක මට්ටමේ නගරයක්" බවට පරිවර්තනය කිරීමේ අභිලාශය යටතේ එවකට සිටි ආරක්ෂක සහ නාගරික සංවර්ධන ඇමතිවරයා සහ ඉන් පසුව මහා නගර සහ බස්නාහිර කලාප සංවර්ධන ඇමතිවරයා මෙහෙය වූ සහ ක්‍රියාත්මක කළ නැවත පදිංචි කිරීමේ වැඩ සටහනේ අරමුණ වූයේ කොළඹ අඩු ආදායම්ලාභී ප්‍රදේශවල නැතහොත් 'වතුවල' පවුල් 65,000ක් ආණ්ඩුව ඉදිකළ තට්ටු නිවාසවල පදිංචි කර වීම ය.

හොඳින් සැලසුම් කොට, මහජන විරෝධයකින් තොරව හෝ ඉතා අඩු විරෝධයකින් කළ හැකිව තිබූ, අගනුවරින් දශලක්ෂ භාගයක ජනකායක් ඉවත් කිරීම, හමුදාව යොදා සිදු කිරීම, ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද කාලීන ආණ්ඩුකරණය සහ සංවර්ධන ගමන් පථය පිළිබඳ ඉතා හොඳ නිදර්ශනයකි. බලපෑමට ලක් වූ ප්‍රජාවට කිසිදු පිළිසරණක් හෝ යුක්තියක් නොවීම නිසා ඔවුන් විරෝධතා, උසාවි, මානව හිමිකම් කොමිසම ආදී විවිධ මාර්ගවලින් විරෝධතා ප්‍රකාශයට උත්සාහ දැරීම

ප්‍රජාතන්ත්‍රවාදයේ පවතින තත්ත්වය පිළිබඳ දර්ශකයක් පමණක් නොව, නගරය තුළ එහි නාගරික දුප්පත් ප්‍රජාවට ඇති තත්ත්වය ද පෙන්නුම් කරයි. 'අලංකාරකරණය' ලෙස වෙස් වළාගෙන පැමිණි දෙයෙහි ප්‍රමාණය සහ ස්වභාවය එසේ තිබිය දීත්, ඒ පිළිබඳව ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තුළ වාර්තා වූයේ ඉතා අඩුවෙන් වන අතර සිවිල් සමාජය සහ සාමාන්‍ය ජනයා අතර ද වූයේ ඉතා අඩු අවබෝධයකි.

වනාතමුල්ලේ පදිංචිකරුවන් සතර දෙනෙකුට ඔවුන්ගේ ඉඩම් වෙනුවෙන් සටන් කිරීමට 2014 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආධාර කළේ ය. 34 වත්තේ දී ප්‍රශ්නය වූයේ නාගරික සංවර්ධන අධිකාරිය විධිමත් ක්‍රියාවලිය අනුගමනය නොකර පුද්ගලික ඉඩම් පවරා ගැනීම සහ යාබද ඉඩමක නාගරික සංවර්ධන අධිකාරිය ඉදිකළ තට්ටු නිවාස සංකීර්ණයක 400කට වැඩි පවුල් සංඛ්‍යාවක් බලහත්කාරයෙන් නැවත පදිංචි කිරීම ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග සම්බන්ධ වීම සහ නඩු පැවරීම අතර කාලය තුළ දී, බලධාරීන්ගෙන් සහ හමුදා නිලධාරීන්ගෙන් ඔවුන්ට එල්ල වූ බිය වැද්දීම් සහ හිරිහැර නිසා, පෙත්සම්කරුවන් සංඛ්‍යාව හතර දෙනෙකු දක්වා අඩු විය. නඩුවේ අවසන් ප්‍රතිඵලය ඉතා හොඳ නොවූවත්, දේශපාලන වශයෙන් අමාරු කාලයක යුක්තිය වෙනුවෙන් ඔවුන් කළ සටනට සහාය දීමට සංවිධානයක් තිබීම සහ ඔවුන්ට සිදු වූ දෙය ගැන දැන් වාර්තා ගතව තිබීමත් නිසා, පෙත්සම්කරුවන් සිව් දෙනාට එය ඉතා ම වැදගත් වී ය. සිවිල් සමාජ සංවිධාන සමග සම්බන්ධතාවක් නැතත්, නගරයේ වෙනත් තැන්වල සිදු වන ක්‍රියා ගැන දැනුවත්ව සිටින, වෙනත් විපතට පත් ප්‍රජාවන් සමග සන්ධාන ගොඩනගා ගැනීමට ද අපට මෙම ආකාරයේ ආධාර කිරීම් උපකාරී වෙයි.

සිදු කළ පර්යේෂණ පිළිබඳව ආපසු හැරී බලන විට, ඉන් පෙරට ආ උද්දේශනය, විපතට ලක් වූ ප්‍රජාවන් කෙරෙහි එයින් ඇති කළ බලපෑම දකින්නට ලැබීම, මා හැම විට ම ආඩම්බරයට පත් වන කාරණයකි. මෙබඳු කාර්යයක් ඉටු කළ හැක්කේ, සරා වැනි කෙනෙකුගේ නායකත්වයක් යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි සංවිධානයකින් පමණක් බවත්, මම දනිමි. අප කරන්නට උත්සාහ කළ ඇතැම් දේ අමාරු සහ අභියෝගවලින් ගහන වී ය. දේශපාලන වාතාවරණය සහ ආරක්ෂක ලේකම්ගේ ඍජු අත පෙවීම් නිසා, ප්‍රකාශයට පත් කිරීම සඳහා තොරතුරු රැස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ඉතාමත් අපහසු වී ය. මුල් වර්ෂවල දී මෙම වැඩ සඳහා මුදල් පවා නොලැබිණි. එසේ වුවත්, ඉදිරියට යෑමට අප අදිටන් කරගෙන සිටි අතර, සරා එසේ කළේ නම් එය සම්පූර්ණයෙන් සාධාරණ වුව ද, ඔහු කිසි විටෙකත්, කොයිම ආකාරයකින් හෝ අපට පසු බසින්නට ඉඩ තැබුවේ නැත.

මා මෙම වැඩ කටයුතු කළේ සෝෂල් ඉන්ඩිකේටර් හි ප්‍රධානත්වය දරමින් වන අතර, පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සමීක්ෂණය වැනි ප්‍රධාන සමීක්ෂණ ඇතුළුව සමීක්ෂණ ගණනාවක් සෑම වසරක ම සිදු කරමිනි. පස්වැනි පටුමගේ සිටි අපූරු කණ්ඩායම මෙන් ම ශ්‍රී ලංකාව පුරා සිටි කැපවීමෙන් යුතු ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය නොවන්නට මේ කිසිවක් කළ නොහැකි වනු ඇත. සෝෂල් ඉන්ඩිකේටර් නායකත්වය ගන්නැයි මගෙන් ඉල්ලා සිටින විට මගේ වයස අවුරුදු 25 හෝ 26 ක් හෝ වූ අතර, මා ගැන විශ්වාසය තබමින් එම අංශය මෙහෙයවීමට මට ඉඩ දුන් සෝෂල් ඉන්ඩිකේටර්හි මා සමග වැඩ කළ සියලු දෙනාට මම කෘතඥ වෙමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මා සම්බන්ධ වූයේ විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ගැනීමෙන් මාසයකට අඩු කාලයක දී වන අතර, මා වැඩ කළ වසර නවය තුළ දී, මගේ ක්‍රියාකාරීත්වයේ විශාල හැඩ ගැස්මක් සිදු වී තිබේ. විශේෂයෙන් ම රටේ තත්ත්වය ඉතා ම අමාරු අවදියක, යුක්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නැගී සිටි පිරිසක් සමග වැඩ කරන්නට ලැබීම ගැන මම ඉතා ම කෘතඥ වන අතර ආඩම්බර වෙමි. වසර ගණනාවක් තිස්සේ අපට දකින්නට ලැබී ඇත්තේ, විශාල දේශපාලන සහ සමාජ හානියක් හෝ ගැටුමක් හෝ නැති අවස්ථාවල සහයෝගය ලබා ගැනීමට සහ ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටීමට කොතරම් පහසු ද යන්න සහ හානි වැඩි වන විට මුහුණ දෙන්නට ඉතිරි වන්නේ කොතරම් සුළු පිරිසක් ද යන්න යි. අනාගත ගමන් මග පිළිබඳව සහ වසර විසි පහක් තිස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කළ ඇදහිය නොහැකි කාර්යභාරය මත තවත් දේ ගොඩ නගන්නේ කෙසේ ද යන්න මෙන් ම, ඉදිරි ගමන් මගෙහි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග එකට සිටගන්නා ශක්තිමත් සගයින් ගොඩනගා ගැනීම පිළිබඳව සොයා බැලීමට, මෙම සංවත්සරය සහ මෙම අවස්ථාව යොදාගත හැකි වෙතැයි මම බලාපොරොත්තු වෙමි.

---

**ඉරෝමි පෙරේරා**

ඉරෝමි පෙරේරා කොළඹ කේන්ද්‍ර කරගත් පර්යේෂකයෙකු සහ ක්‍රියාකාරිනියකි වේ. ඇය පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ අයිතිවාසිකම් අහිමි කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඉඩම් හිමිකම් සහ සාධාරණ සහ යුක්තිසහගත අන්දමින් සම්පත් බෙදී යාමට ඇති අවස්ථාව පිළිබඳව කටයුතු කරයි. ඇය කොළඹ නාගරික විද්‍යාගාරයෙහි (Colombo Urban Lab) නිර්මාතෘවරිය සහ අධ්‍යක්ෂවරිය වන අතර දැනට සංවර්ධන මූල්‍යකරණයේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කරන වොෂින්ටන් කේන්ද්‍ර කරගත් උද්දේශන කණ්ඩායමක් වන බැංකු තොරතුරු කේන්ද්‍රයේ ආසියානු උපදේශකවරිය වේ. වර්ෂ 2008 සිට 2017 දක්වා ඉරෝමි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකවරියක් වූ අතර එහිදී ඇය සෝෂල් ඉන්ඩිකේටර්හි සමීක්ෂණ පර්යේෂණ කටයුතු මෙහෙය වූවාය.

# 'පුංචි මිනිසාගේ පුංචි කතිරය' උදෙසා



**මංජුල ගජනායක**

අප කුඩා කල දුටු සිහින එතරම්ම බහුවිධ ඒවා නොවේ. ඉන් බහුතරයක් කිසිදා හඹා යා නොහැකි සීමාවේ රැඳුණු ඒවා ය. එසේ වුව එලෙස දුටු සිහින අතර වඩාත් සුවබර සිහින ද නැත්තේ නොවේ. මගේ සරසවි ආගමනයත් සමඟ විවිධ සාකච්ජා මණ්ඩප හා රූපවාහිනී තිරය මත්තේ ප්‍රාදුර්භූත තැනැත්තෙකු අත්‍යාලංකාරව හා නිරවද්‍යව ඉංග්‍රීසි බස හසුරුවන අයුරු මා බලා සිටියේ වශීකෘතව ය. ඔහු තෙපලන වදනක් පාසා ඊට ආනුෂාංගිකව කියැවිය හැකි ඔහුගේ ශරීර බසද අලංකෘතය. පෙර කවරෙකුගෙන් හෝ නොදුටුවා සේ ය. තේමාව කවරක් වුවද ඔහුගේ දොඩමළුව තුළ ඇති ලාලිත්‍යයය හා අර්ථවත් භාෂිතය අප හැමකල්හිම ප්‍රමෝදයට පත් කරන්නේ ය. අප දිවියේ කාලත්‍රයම සුපැහැදිලි ඉංග්‍රීසි බසින් සැරසූ ඔහු ලොකු පොඩි සැම හඳුනා ගන්නේ 'සරා' ලෙස ය. කවරදා සැබෑ වේයැයි නොදන්නා අත්පත් කරගත නොහෙන, එසේ වුව සැමදා දකින්නට කැමති සිහිනය නම් සරා වගේ ඉංග්‍රීසි කතා කිරීම බව ද නොලියා ඉන්නේ කෙලෙස ද? අර්වි රොබින්සන් පැවසූ බස නිවැරදි ය. ''ලෝකය ඔබගේ වදනක් ඇසෙන තෙක් සිටී'' (*The world is waiting for your words."- Arvee Robinson*) සරා සැබවින්ම අනුහස් සහිත සමාජ ප්‍රකාශකයෙකි. එවන් වදන් සැරසිල්ලෙන් දුලබ කැරිස්මාවකින් ආලෝලනය වූ ආචාර්ය සරවනමුත්තු විසින් ස්ථාපිත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් අපගේ වෘත්තීය දිවිය ඇරඹීම ම හෙට ද සෙමින් කොඳුරා සැමරිය යුතු සැබෑ වූ සිහිනයකි.

වසර 1996 දී පිහිටවූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙදිනට වසර 25ක් සපුරා ඇත්තේ ය. ශ්‍රී ලාංකේය දේශපාලන සංස්කෘතියේ විකල්ප භාවිතාවන් සඳහා ඇත්තේ අවම ඉඩකි. පශ්චාත් සර්වජන ජන්ද ක්‍රියාවලිය තුළ මෙරටේ පවත්වා ඇති මැතිවරණ 74න් බහුතරයක

ප්‍රතිඵල දෝලනය වූයේ දෙපිරිසක් අතර පමණකි. තට්ටු මාරු දේශපාලනයේදී විකල්පයක් ගැන නොසිතන මෙරටේ ඡන්දදායකයා අන් විකල්ප භාවිතාවන් ගැන ද දක්වන්නේ මාරාන්තික නිහඬ බවකි. එවන් විකල්ප විරෝධී ප්‍රතිපදාවකට කොන්දේසි විරහිතව සහාය දෙන නිද්‍රාශීලී සමාජයක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ බිහිවීම අහම්බයක් නොවේ. උන්නතිකාමීත්වයෙන් මිදුණු, ශ්‍රී ලාංකේය දේශපාලන පරිමණ්ඩලයේ සංචලනයන් නිවැරදිව ග්‍රහණය කරගත් ක්‍රියාධරයන් කිහිපදෙනෙකුගේ ලාලසාත්මක ප්‍රයත්නයක ඵලය යි. ඊට අනුබල දුන් සරා, ශ්‍රී ලාංකේය සිවිල් සමාජය තුළ තබා ඇති මුද්‍රාව කෙතරම් සජීවී එකක්ද යත් ලංකාවේ සිවිල් සමාජය සහ සරා යනු ප්‍රපංච දෙකක් නොව එකක් ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවා මෙදිනට ගතව ඇති කාලය දින 9248කි. මෙම ලියුම්කරු ද මෙකී පුරෝගාමී සංවිධානයෙහි ක්‍රියාකාරී සාමාජිකයකු වන අතර මෙදිනට ගෙවී යන්නේ එහි ගත කරන 5974 වන දිනය යි. යමෙක් මෙකී සංවිධානයෙහි ව්‍යුහය හා විකාශනය සංක්ෂිප්තව දක්වන්න යැයි පැවසුවහොත් මා එකපැහැර දෙන පිළිවදන වන්නේ එය නිසැකවම 'නේක පැහැයෙන් දිදුලන දේදුන්නක්' හා සම බව යි. විවිධ නිසග හැකියාවන් සහ එකිනෙක පරස්පර මතිමතාන්තර දරාගත් චින්තනධාරීන් හා අනලස් ක්‍රියාකාරීන්ගේ අභයභූමියක් වන් එය නොවෙනස් ප්‍රතිපත්තියක් ඔස්සේ සමාජය විනිවිද දකිමින් සිටී. පුද්ගල චරිතයක මතු නොව කවර සංවිධානයක හෝ යසස හා සමාජ අනුමැතිය ලැබීමේ එක් මගක් වන්නේ එය යි. ධම්මපදය එබැවි මෙසේ දක්වා ඇත්තේ ය. 'පඨවි සමෝ නෝ විරුජ්ඣති'. එනම් පොළොව සේ හොඳ නොහොඳ දෙකෙහෙ දී ම නොසෙල්වී සිටීමේ අනුත්තර ගුණය යි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතු ස්වීය අනන්‍යතාව කවරක් ද? එය නිසැකවම එකිනෙක ප්‍රතිවිරුද්ධ විෂය ක්ෂේත්‍ර කෙරෙහි දක්වන විචාරක්ෂිය හා අසීමිත ආලම්භනය යි. පශ්චාත් ගැටුම්කාරී සමාජයක අවශ්‍යයෙන්ම පැවතිය යුතු රාජ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ සිට ජනරජවැසියෙකු සතු එකම අවිය සේ ගිනිය හැකි පරමාධිපත්‍යය බලය දක්වා වූ පුළුල් පරාසයක විහිදුණු වැඩසටහන් දාමයක් සමඟ සමාජය හා අභිමුඛ වීම පෙරකී ස්වීය ගුණය ඉස්මතු කෙරෙන එක් සනිලක්ෂණයකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මුලසුන ගත් එකී මූලාරම්භ සමුදායෙහි එක් විශිෂ්ටතම ප්‍රයත්නයක් වන්නේ මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් පිහිටුවීමයි. එහි නිල නාමය මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය යි. (මැ.ප්‍ර.නි.ම. - *CMEV*).

මැ.ප්‍ර.නි.ම. සමාරම්භය සිදු වන්නේ වසර 1997 දී ය. එය හුදු තවත් එක් සංවිධානයක ලියාපදිංචියක් නොවේ. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ අගයුම් කිසිවක් මායිම් නොකළ හිතුවක්කාර දේශපාලන සනුහරයක දේශපාලන හෙජමොනිය වෙත දුන් අතුල් පහරකි. එදා මෙදා තුර ගෙවී ගිය වසර 24ක කාල පරාසය මැ.ප්‍ර.නි.ම. සියලු වැර යොදා වෑයම් කොට ඇත්තේ මෙ රටේ ඡන්දදායකයා වෙත දෙවන ජනරජ ව්‍යවස්ථාව මඟින් ප්‍රදානය කොට ඇති පුරවැසි අයිතිවාසිකම් තහවුරු කිරීම ය. මැ.ප්‍ර.නි.ම. යෙහි තවත් වෙසෙස් ලකුණක් ඇත්තේ ය. එනම් එය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සංවිධාන ව්‍යුහයෙන් ඔබ්බට ගොස් සංවිධාන ත්‍රිත්වයක ඒකමතික අනුමැතියෙන් පවත්වා ගැනීම යි. ඒ අනෙක් සංවිධාන ද්විත්වය වන්නේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (*FMM*) සහ මානව හිමිකම් පිළිබඳ ප්‍රලේඛන මධ්‍යස්ථානයයි (*INFORM*). පුද්ගලයා සතු ස්වීය අයිතීන් බැහැර කරන ප්‍රජාතන්ත්‍රවාදයක් කෙරෙහි ආසක්ත සමාජයක පුරවැසියාගේ අභිමානය ම පැතූ මානව හිමිකම් ක්‍රියාකාරිනී සුනිලා අබේසේකර වැනි පරාර්ථකාමී සටන්කාමිනියන් ද මැ.ප්‍ර.නි.ම. යෙහි සමාරම්භය පිණිස උර දුන් වග සටහන් කිරීම ඇය වැනි මානවවාදී රැඩිකල් ගැහැනුන්ට දක්වන ගෞරවයකි.

මැ.ප්‍ර.නි.ම. තම ආරම්භක අවස්ථාවේදී තැත් දැරුවේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ පුළුල් නිරීක්ෂණයක් කිරීම හා ප්‍රචණ්ඩ ක්‍රියා හා සබැඳි දත්ත - සංඛ්‍යා ගොනුවක් අඛණ්ඩව යාවත්කාලීන කිරීම යි. එය අද ද එහි එක් අරමුණකි. එමඟින් ආලෝකය ලබන සරසවි විද්‍යාර්ථීන් හා වෙනත් පර්යේෂක ප්‍රජාව සංඛ්‍යාවෙන් අනල්පය. එනමුත් අද වන විට මැ.ප්‍ර.නි.ම. තම අරමුණු හා කාර්යභාරය වඩාත් පුළුල් පරාසයක් වෙත විහිදුවා ඇත. එකී කවර නවෝත්පාදකමය එළඹුම් පැවතියද මැ.ප්‍ර.නි.ම. නිර්මාණය

වූ පසුබිම විචාරාත්මකව විමසීම කාලීන අවශ්‍යතාවක් සේ සැලකීමේ කිසිදු වරදක් නැත.

වසර 1996 දී යාපනය මහනගර සභාව උදෙසා පැවැත්වූ පළාත් පාලන ඡන්ද විමසීම, මැ.ප්‍ර.නි.ම.යෙහි නිරීක්ෂණ චාරිකාව ඇරඹුණු මැතිවරණය විය. ඉන් ඔබ්බේ එනම් වසර 1999 ජනවාරි මස 25 වැනි දින පැවැත්වූ වයඹ පළාත් සභා ඡන්ද විමසීම නිසැකවම මැතිවරණ නිරීක්ෂකයන්හට එවරස්ට් ගිරි දඹ තරණය හා සම තෙහෙට්ටුවක් මෙන්ම භය සංත්‍රාසය දැනවූ මැතිවරණය විය. වයඹ පළාත්බද කුලියාපිටිය නගර මැද්දේ නිරුවතින් මාතාවක් ඇවිද්දවූයේ මෙකී මැතිවරණයේ දී ය. එපමණක් නොව මං පැහැරීම් හා පුද්ගල ඝාතන දක්වා අනීතික මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ රාජ්‍ය අනුග්‍රහය ලත් මැරයන්ගේ අකාරුණික බැල්ම මැතිවරණ නිරීක්ෂකයන් වෙත ද එල්ල වූ පසුබිමකි ඒ. එවන් කාල සමයක වයඹ පළාත් සභා ඡන්ද විමසීම් ප්‍රතිඵල ශූන්‍ය කරන්නැයි අධිකරණය අභිමුවට ගොස් යුක්තිය ඉල්ලා සිටින්නට තරම් ආචාර්ය සරවනමුත්තු සතුව පැවති එඩිය හා දිරිය අප විස්මෘතියට පත් කරන්නේ ය. වත්මන් පරපුරට වුව එකී නිබය ප්‍රතිපදාව කියාදෙන පාඩම අනභිභවනීය ය. පූර්වාදර්ශ සපයන්නේ ය.

වසර 2004 දී පමණ එවකට මැතිවරණ කොමසාරිස්වරයා ව සිටි දයානන්ද දිසානායක මහතා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (*CMEV*) සහ නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය (*PAFFREL*) වෙත මැතිවරණ නිරීක්ෂණයේ නිල අනුමැතිය ලබාදුන් අතර (*Accreditaion*) ඊට පෙර ද, පසු ද මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලිසිය සහ දේශපාලන පක්ෂ මෙන්ම අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ විවේචනාත්මක එහෙත් සහයෝගී ප්‍රවේශයකින් කටයුතු කරමින් සිටී. ඒ කවර කාර්යයකදී වුව මැ.ප්‍ර.නි.ම. තම පළමු සේවාදායකයා ලෙස සලකා ඇත්තේ මෙරටේ ඡන්දදායකයා ය. නිවැරදිව ම හා සරලව දක්වන්නේ නම් සුපතළ රාජ්‍ය තාන්ත්‍රික පෞරුෂයක් හිමි වින්ස්ටන් ලෙනාර්ඩ් ස්පෙන්සර් චර්චිල් දැක්වූවා සේ ය. ඔහු මෙසේ කියයි.

"ප්‍රජාතන්ත්‍රවාදයට පිදෙන සෑම උපහාරයක ම මූලය ඇත්තේ පුංචි මිනිසෙක්, පුංචි පැන්සලක් අතැතිව, පුංචි කුටියක් තුළට ගොස් පුංචි කඩදාසි කැබැල්ලක සලකුණු කරන පුංචි කතිරය මත යි. අන් කුමන ආකාරයේ හෝ සංකථනයක්, විවරණයක් හෝ පෘථුල සංවාදයකින් එම සංකල්පයට ඇති වැදගත්කම කෙරෙහි කිසිදු ආකාරයක බලපෑමක් සිදු කරන්නට බැහැ"

මැතිවරණ, ප්‍රජාතන්ත්‍රවාදයේ මහෝත්සවය යැයි පවසන බස සත්‍යයක් වුවද මැ.ප්‍ර.නි.ම. ආරම්භක සමයේ මැතිවරණ නිරීක්ෂකයා කෙරෙහි පැවතියේ කර්කෂ සමාජ ප්‍රතිචාරයකි. එනමුත් නූතන මැතිවරණ ප්‍රවණතා හමුවේ මැතිවරණ නිරීක්ෂකයා කෙරෙහි එක්රැස්ව පවතින ගෞරවය හා වගකීම මෙන්ම සැලකීම පහසුවෙන් නොසලකා නොහැරිය යුත්තකි. එවැනි සමාජ වෙනසක් උදෙසා චර්චිල් ඇගයූ පුංචි මිනිසාගේ අවිය මුවහත් කරන්නට සිවිල් සමාජ සංවිධාන ගත් ප්‍රයත්නයේ එක් සජීවී සාක්ෂිකරුවකු වන්නේ මැ.ප්‍ර.නි.ම. යි.

මෙකී ආයතනය දෙස් විදෙස් මැතිවරණ හා පර්යේෂණශීලී සත්ජන ප්‍රජාවේ වෙසෙස් අවධානයට ලක්වීමට බලපෑ තවත් හේතු යුගලක් ඇත්තේය. එනම් වේගයෙන් වෙනස් වන නව මාධ්‍ය අවකාශය නිසි ග්‍රහණයට ගැනීම හා මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ වෙහෙස නොබලා නිමග්න වීම යි. මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කාල සමය තුළ සමාජ ජාල මාධ්‍ය අවකාශය මැතිවරණ පැමිණිලි වාර්තාකරණයට යොදාගත් ප්‍රථම නිරීක්ෂණ සංවිධානය යි. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු වූ විගස එය ක්ෂණික තහවුරු කර ගැනීමක් ඔස්සේ ටිවිටර් සහ ෆේස් බුක් ඇතුළු අවකාශ මගින් පතළ කිරීම අවධානමක් වුව ද මැ.ප්‍ර.නි.ම. කලෙක පටන් එය සාර්ථකව භාවිතයට ගනිමින් සිටී. එකී නව මාධ්‍ය භාවිතය හා සබැඳි තාක්ෂණික ප්‍රවේශ මැ.ප්‍ර.නි.ම. වෙත ආරම්භක කාල සමයේ සිට සමීප කරන ලද්දේ නව මාධ්‍ය පිළිබඳ ප්‍රමාණිකයකු වන සංජන හත්තොටුව යි. එපමණක් නොව ක්‍රමවත් මැතිවරණ නිරීක්ෂණයක් සඳහා අවැසි විද්‍යාත්මක දත්ත පද්ධතියක් නිර්මාණහිලා ආචාර්ය අර්ජුන පරාක්‍රම ද ප්‍රමාණවත් දායකත්වයක් දක්වා ඇත්තේ ය.

මැතිවරණ නිරීක්ෂණය යනු මැතිවරණ ප්‍රචාරක කාල සමයක පමණක් සිදු වන ඒකම්තික කාර්යයක් නොවේ. මැතිවරණයක සුපිළිපන් බව මිනීමට නම් නිරීක්ෂණයේ නියෝජනය වසර පුරා පැවතිය යුතුම ය. මැ.ප්‍ර.නි.ම. මැතිවරණ ප්‍රතිසංස්කරණ කාර්යයෙහි මැදිහත්ව ඇත්තේ මෙකී පරමාර්ථයෙනි. එමඟින් සිදු කරන ලද මැදිහත්වීම් අතර වඩා වෙසෙස් තැනක් ගන්නේ අධිකරණය අභිමුවට ඉදිරිපත් කරන ලද මහජන සුභසාධක නඩුකර ප්‍රමාණය යි. ඡන්ද මධ්‍යස්ථානයක් තුළ කවර අක්‍රමිකතාවක් සිදු වුව ද, එහි නැවත ඡන්ද විමසීමක් පැවැත්වීමට නියෝගයක් පැනවීමේ බලය මැතිවරණ කොමසාරිස්වරයාට නොතිබුණු සමයකි ඒ. එකී බලය මැතිවරණ දෙපාර්තමේන්තුවට හිමි වූයේ එවැනි නඩුකරයක් සඳහා මෙම සංවිධානය මෙහෙයවීමට ආචාර්ය සරවනමුත්තු සමත් වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පස්විසි සැමරුම අබියස මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ද තම විසිහතර වැනි වසර සමරන මොහොතේ ඉමහත් අභිමානයෙන් සැමරිය යුතු පිරිසක් සිටී. ඒ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම යි. අව්වැසි, මැසිමදුරු පීඩා මතු නොව රාජ්‍ය ත්‍රස්තවාදය හා නොනිල තුවක්කුකරුවන් මෙන්ම නිල රාජ්‍ය උදහස මැද්දේ පවා මැතිවරණයේ නිදහස් හා සාධාරණ පැවැත්ම උදෙසා අද ද ඔවුන් දක්වමින් සිටින ලාලසාව හා අධිෂ්ඨානය ගොනුකරගන්නට අප පිං කර ඇති බව අගති විරහිතව සටහන් කොට තැබීම වටිනේ ය. වසර 2013 දී පැවැත්වූ උතුරු පළාත් සභා ඡන්ද විමසීමේ දී තර්ජනයට ලක් වූ සමහර මැතිවරණ නිරීක්ෂකයන් නාඳුනන තුවක්කුකරුවන්ට (සැබවින්ම අපි ඔවුන් හඳුනන්නෙමු) බියෙන් සමස්ත මැතිවරණ ප්‍රචාරක කාල සමය පුරා රාත්‍රී කල පහන් කළේ පේදුරුතුඩුව හා අවට ඝන කැලෑබද පෙදෙස්හි මරණය අතින් ගෙන යැයි පැවසීම ලොව කවර හෝ මැතිවරණ නිරීක්ෂකයකු දක්වන දිරිය වෙත පිදිය හැකි ත්‍යාගයක් වන්නේ ය.

මැ.ප්‍ර.නි.ම. අද තම කාර්යභාරය වඩාත් පුළුල් කොට ඇත්තේ එය ලොව අගයන නව මැතිවරණ ප්‍රවණතා හා සසැඳෙන පරිදි ය. එය වසර 2015 දී පමණ අන්තර්කරණයෙන් යුත් මැතිවරණයක් (*Inclusive Election Process*) ප්‍රවර්ධනය කිරීම ආරම්භ කෙරිණ. එහි දී '*Enabled Elections*' නමින් පිහිටුවා ගත් ස්වේච්ඡා කණ්ඩායමක් සමඟ එක්ව ආබාධ සහිත පුද්ගල ප්‍රජාවේ මැතිවරණ සහභාගිත්වය ප්‍රවර්ධනය කෙරිණ. ඊට සමාන්තරව මෙරටේ මෑතකාලීන ඉතිහාසය තුළ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාදාමය තුළ සිදු වූ වඩාත් තීරණාත්මක මැදිහත් වීම වූයේ මැතිවරණ වියදම් පිළිබඳ නිරීක්ෂණය යි. අවසන්වරට පැවති ජනාධිපතිවරණයෙන් (වසර 2019) ඇරඹි එකී දීපව්‍යාප්ත නිරීක්ෂණය පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ දී (2020) ද සංවිධානය කෙරුණි. ක්ෂේත්‍ර හතරක් ඔස්සේ දේශපාලන පක්ෂ තම මැතිවරණ ප්‍රචාරක සමය තුළ දරන ලද වියදම් පිළිබඳව එලෙස ඉදිරිපත් කළ ඇස්තමේන්තුගත වියදම් වාර්තාව නිසැකවම මැතිවරණ වියදම් නියාමනය සඳහා වන උත්සාහයේ ප්‍රගතියට හේතු වනු ඇතැයි යන්න මෙහිලා පැහැදිලි කරුණකි.

අද වන විට කාන්තා සහ තරුණ දේශපාලන නියෝජනය මෙන්ම මැතිවරණ වියදම් නියාමනය හා පූර්ව ඡන්ද භාවිතය ඇතුළු මැතිවරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක අවශ්‍යයෙන්ම පැවතිය යුතු මූලිකාංග පිළිබඳව බොහෝ දෙනා සක්‍රියව කරුණු ඉදිරිපත් කරන අයුරු මැ.ප්‍ර.නි.ම.යෙහි සාමාජිකයන් වන අප බලා සිටිනුයේ ඉමහත් සුපසන් මනසිනි. ඊට හේතුව නම් එකී කරුණු පිළිබඳව මේ රටේ අනෙක් මැතිවරණ නිරීක්ෂකයන් හා එක්ව ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු එහි අවශ්‍යතාව මතු කරමින් කරුණු ඉදිරිපත් කරන ලද්දේ මීට දශක දෙකකට එපිට කලෙක පටන් වීම යි.

අද ද එහි සාමාජිකයන් වන අපි මේ රටේ යහපත් මැතිවරණ සංස්කෘතියක් පිළිබඳ සුබසිහින දකින්නෙමු. ඊට ආසන්නතම නිදසුන නම් පසුගියදා මොනරාගල පළාත්බද මහාධිකරණය ලබාදුන් තීන්දුව යි. පැෆ්රල් සංවිධානය අධිකරණය හමුවේ ගොනුකරන ලද නඩුකරයේ ප්‍රධානතම පැමිණිලිකරු ලෙස අප දක්වන ලද සහාය හමුවේ ලත් ජයග්‍රහණය මේ රටේ අනාගත මැතිවරණ ක්‍රියාවලියේ දිශානතිය වෙනස් කිරීමේ අභියෝගය ජය ගැනීම සඳහා උපස්ථම්භක වේ යැයි අපි විශ්වාස කරන්නෙමු. එකී තීන්දුව මඟින් දක්වා සිටියේ ඡන්දදායකයාට සංග්‍රහ හෝ

අල්ලස් ලබා දීමෙන් ජය ගන්නා කවර අපේක්ෂකයෙකුගේ වුව ජයග්‍රහණය ආපස්සට හැරවිය හැකි බව යි.

මැ.ප්‍ර.නි.ම. ආරම්භ කිරීමේදී මුහුණ පෑ අභියෝග සමහරක් අද වන විට විසඳී තිබෙන බව සැබෑ ය. එනමුත් වෙනත් අභියෝග සමුදායක් සර්පිලාකාර ආකාරයෙන් ඒකරාශී වී ඇති බවද පෙනී යයි. එවන් නව සමාජ හා දේශපාලන සැකසුමක දී ආචාර්ය සරවනමුත්තු සතු අනාගතවාදී දැක්ම මැ.ප්‍ර.නි.ම. සතු දායාදය හා හරුබස්ස වන අතර එහිලා සම කැඳවුම්කරුවන් ලෙස ආදර්ශවත් සහායක් දක්වන උදය කලුපතිරණ හා සීතා රංජනී යන සුලවතුන් ද අපගේ සිහියට නැඟෙන බව දක්වන්නෙමු.

අවසන, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පස්විසි වසර යනු ඩොක්ටර් සරාගේ ස්වර්ණමය අස්වැන්න හා නොබිඳුණු අධිෂ්ඨානය බවත්, එය මේ රටේ සමස්ත සිවිල් සමාජ සංවිධාන අතර වෙසෙස් අනන්‍යතාවක් ගොඩ නඟා ඇත්තේ *NGO* ලංකාවට මොකට ද? යන සුලබ පැනයට පිළිතුරක් සපයමින් බවත් සටහන් කරන්නෙමු.

අවසන් වශයෙන්, *The Paradoxical Prime Minister - Narendra Modi and His India'* යන හිසින් යුත් ග්‍රන්ථයක් රචනා කරන ප්‍රකට ඉන්දියානුවකු වන ශෂී තරූර් එකී පුස්තකය සඳහා රචිත '*The attack on institutions*' නම් ලිපිය සඳහා උපුටා ගෙන ඇති මහත්මා ගාන්ධිගේ වදනක් මෙහිලා සිහි කිරීමට කැමැත්තෙමු.

*The truest test of a democracy is in the ability of anyone to act as he likes "so long as he does not injure the life or property of anyone else"*

ඩොක්ටර් සරා ද, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගොඩනඟමින් මෙතෙක් තැත් දරා ඇත්තේ මෙරටේ පුරවැසියන් ප්‍රජාතන්ත්‍රවාදය වෙත වැඩි වැඩියෙන් ඇබ්බැහි කිරීමට ය. අපේ කාලයේ ලිබරල් වාදියෙකු වූ සමාජ ක්‍රියාකාරිකයෙකුගෙන් ඊටත් වඩා යමක් බලාපොරොත්තු විය නොහැකි ය.

---

**මංජුල ගජනායක**
පර්යේෂකයෙකි, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ *(CMEV)* ජාතික සම්බන්ධීකාරකවරයා ලෙස කටයුතු කරයි. විවිධ මාතෘකා ඔස්සේ විශේෂාංග ලිපි රචකයකු ලෙස ද කටයුතු කරයි.

# සැසඳිය නොහැකි මාධ්‍ය භූමිකාව



ආචාර්ය
**දේවනේෂන් නේසයියා**

මම වසර 35ක් ලංකාවේ රාජ්‍ය සේවයට අනුයුක්තව සේවය කර 1995 අප්‍රේල් මාසයේ දී වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසු විශ්‍රාම ගියෙමි. විශ්‍රාම යෑමෙන් පසු මට විද්වත් හා ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් සමඟ වැඩ කිරීමට අනගි කාලයක් ලැබුණි.

2004 දී මම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සම්බන්ධ වී වසර 10කට ආසන්න කාලයක් එහි සිටිය අතර දැක්ම සහ මෙහෙවර මෙන්ම ශක්තිමත් ස්වාධීනත්වය පිළිබඳ එහි අඛණ්ඩ වාර්තාව ගැන මම ඉතාමත් පැහැදීමකින් කටයුතු කළෙමි. ඉතාමත් අසීරු ආරක්ෂක තත්ත්වයන් මැද වුව ද ඒකාධිපති පාලනවලට නිර්භීතව අභියෝග කිරීමට තමන් නිරතුරුව සූදානම් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම ක්‍රියාවෙන් පෙන්වා දී ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සහ අතුරුදහන් වීම් සම්බන්ධව අර්ථවත් ක්‍රියාමාර්ග ගැනීම වැනි මහජන අවශ්‍යතා සම්බන්ධ වැදගත් කාරණා පිළිබඳව නඩු පැවරීම, කරුණු දැක්වීම සහ උද්දේශනය ඇතුළුව බොහෝ අංශවල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අලුත් මාවත් ඔස්සේ ගමන් කිරීමේ කාර්යයට මම බෙහෙවින් ගරු කළෙමි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවිය වන 'ග්‍රවුන්ඩ්වීව්ස්' ගැන ද මම දැඩි ලෙස පැහැදී සිටියෙමි, එය මම සැම විටම ශ්‍රේණිගත කළේ ලංකාවේ සඟරා අතර සැසඳිය නොහැකිය යන මතයත් සමඟ ය.

දිගු කලක් මම ග්‍රවුන්ඩ්වීව්ස් නිතිපතා කියවන පාඨකයකු වූ අතර එහි අන්තර්ගතය සඳහා ද දායකත්වයක් ද ලබා දුන්නෙමි. වෙනත් නිත්‍ය අන්තර්ගත දායකයෝද ද එයට සිටියහ. අපගේ බොහෝ දායකත්වයන්ට ප්‍රතිචාර ලැබුණු අතර සති ගණනාවක් පුරා එම අදහස් හුවමාරු කර ගැනීමේ මාවත් ආරම්භ විය. රටේ දේශපාලන ජීවිතය කේන්ද්‍රකොටගත් අදහස් හුවමාරු කර ගැනීම සඳහා වූ මෙම සංසදය මම ඉතාමත් අගය කළෙමි. මගේ බොහෝ දායකත්වයන් ලංකාවේ සමාජය හා දේශපාලනය සමග සම්බන්ධ විය. එම නිසා මම දිගු කාලයක් ලංකාවෙන් පිටත සිටිය දී ග්‍රවුන්ඩ්වීව්ස් සමඟ මගේ සම්බන්ධතාව පවත්වා ගැනීම අසීරු විය. එය එතනින් බිඳ වැටුණි. මට දැන් වයස 86කි. දැනට රටින් බැහැරව සිටින නිසා, මට මග හැරුණු බොහෝ දේ අතර, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ග්‍රවුන්ඩ්වීව්ස් ප්‍රමුඛත්වයක් ගනී.

---

**ආචාර්ය දේවනේෂන් නේසයියා**

ජ්‍යෙෂ්ඨ පරිපාලන සේවා නිලධාරියෙකි. හිටපු යාපනේ දිසාපති (විශේෂයෙන් 1983 කාලයේ). පාරිසරික හා ක්‍රීඩා අමාත්‍යංශයේ ලේකම් ලෙස කටයුතු කොට ඇත. ඇමරිකාවේ හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය ලැබූ ඔහු විශ්‍රාම ගැනීමෙන් පසු මාර්ග ආයතනයේ සේවය කළ අතර එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද කටයුතු කළේ ය. 2004 සිට 2014 දක්වා කාලය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ උපදේශකවරයකු ලෙස කටයුතු කරන ලදි.

# ඔබ කිසි විටෙකත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හැර නොයයි



ආචාර්ය
**කුමාරවඩිවෙල් ගුරුපරන්**

2004 දී උසස් පෙළ විභාගය සඳහා මා පෙනී සිට මාස කිහිපයකට පසු දවසක් යාපනයේ ෆෙඩරේෂන් සංසදය සමඟ ඒකාබද්ධව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සංවිධානය කරන ෆෙඩරල් සම්මන්ත්‍රණයක් සඳහා අයදුම්පත් කැඳවා ඇති බව මගේ නෙත ගැටුණු අතර, ඉතාමත් මෑතක පාසල් දිවිය අවසන් කළ ළාබාල තරුණයෙකුගෙන් අයදුම්පතක් ලැබීම ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයද කුතුහලයට පත් වන්නට ඇත. නමුත් ඔවුන් මට වැඩසටහනට ආරාධනා කර තිබිණි. මම සම්මන්ත්‍රණයේදී සම්පූර්ණ නොවූ අර්ධ වශයෙන් තේරුම් සහිත ප්‍රශ්න කිහිපයක් ඇසූ බවට නම් සැකයක් නැත. නමුත් එය කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවස්ථා නීතිය පිළිබඳ මගේ අනාගත කථිකාචාර්යවරයා වූ රොහාන් එදිරිසිංහ මහතාගේ අවධානය දිනා ගැනීමට තරම් ප්‍රමාණවත් විය. කෙටි විරාමයක් අතරතුර මා ඒ වන විට කරන්නේ කුමක්ද කියා රොහාන් එදිරිසිංහ මහතා මගෙන් විමසූ අතර වැඩි කල් නොගොස් මා සහායක පර්යේෂණ නිලධාරියෙකු ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සම්බන්ධ කර ගත්තේ ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමඟ මගේ ඇසුර ආරම්භ වූයේ එලෙසිනි.

එම ආයතනය ගැන මම විශ්මයට පත් ව සිටියෙමි. මා අවට සිටි ඉතා විශාල පෞරුෂයන්ගෙන් සමන්විත වූ පතාක යෝධයන් මධ්‍යයේ මා කුරුමිට්ටෙක් සේ දිස් වුවද, අගනගරයේ ලිබරල් භූමිකාවේ හදවත වූ චින්තන සංචිතයේ කොටස්කරුවෙකු වීමේ භාග්‍යය මට දැනීමට පටන්ගෙන තිබිණි. මම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ දී බොහෝ දේවල් ඉගෙන ගතිමි. කියෙව්වෙමි, පර්යේෂණ කළෙමි, පෝෂණය වී වර්ධනය වුණෙමි..මගේ නිල සම්බන්ධතාව වසරකට පමණක් සීමා වුවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අනෙක් බොහෝ කාර්යමණ්ඩලය

මෙන්ම - ඔබ කවමදාවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අත් හරින්නේ නැත - මා කියා වෙනසක් නොමැත, මම ද එසේම ය.

වසර ගණනාවක් ගත වන විට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි දේශපාලනය පිළිබඳ මගේ දැක්ම පරිණාමය වී ඇති නමුත් එක දෙයක් නම් ස්ථිරව පවතී. එනම්, වසර 25කට පසුවත් සාරාගේ නායකත්වය සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, බලයේ සිටින්නන් වගවීමට ලක් කිරීමටත්, ලිබරල් ප්‍රභේදයේ ව්‍යවස්ථාමය නීතිය සම්බන්ධව පර්යේෂණ සඳහාත් වූ කොළඹ ලිබරල් කතිකාවතෙහි කේන්ද්‍රස්ථානය සහ හදවත වන බව යි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු චින්තන සංචිතයකට වඩා වැඩි යමක් වන බව සමාජ දර්ශකය, විභාෂණ සහ OUTREACH සේවා ඒකකය සාක්ෂි දරනු ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, විශේෂයෙන්ම සාරා සහ රොහාන් ලිබරල්වාදියෙකුගේ සැබෑ ලක්ෂණය ලෙස මම සලකන (එය ලිබරල්වාදීන් යැයි කියා ගන්නා බොහෝ දෙනෙකු තුළ ඔබට සොයා ගත හැකි දෙයක් නොවේ) තමන්ගේ මතවාදය සහ උපාය මාර්ග සමඟ සම්බන්ධ හෝ හවුල් නොවන විවිධ මත දරන පුද්ගලයින්ට ඉඩ ලබා දීම, සැමරීම සහ ප්‍රවර්ධනය කිරීම මම අත්දැක ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම මුල්ම නිවහන වූ සහ එයින් ලබාගත් පන්නරය තුළින් ලොව පුරා යහපත් සහ දක්ෂ ලෙස වැඩ කරන බොහෝ තරුණ තරුණියන් ගැන මම දනිමි. පසුගිය වසර 25 තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ලබා දුන් වඩාත්ම කැපී පෙනෙන දායකත්වය මෙය යැයි මම සිතමි.

ඉදිරි වසර ගණනාවකටම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකාවට අවශ්‍ය බවට මට සැකයක් නැත. අප ජීවත් වන්නේ අර්බුදකාරී කාලයක බව පැවසීම ශ්‍රී ලංකාවේ සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇත. (මගේ ජීවිත කාලය පුරාම මම එය අසා ඇත) නමුත් මම හිතන්නේ වර්තමානය තරම්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි මූලික ලිබරල් වටිනාකම් කිසි කලෙක පීඩනයට සහ බලපෑමට ලක් වී නැති බවයි. මෙය බලයේ සිටින අයගෙන් පමණක් සිදු වන්නක් නොවේ. ලිබරල් වටිනාකම් අදාළ නොවන බව හැඟෙන පුළුල් සමාජය විසින් පවා ලිබරල් මූලික හරයන් බලපෑමකට හසු කර ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය විවිධ පැතිකඩවලින් විශ්වාස කරන අය සඳහා ඇති අභියෝගය නම් මෙවන් අර්බුදකාරී වතාවරණයක් හමුවේ ලිබරල්වාදයේ මූලික කරුණු අමතක නොකර එය ජනප්‍රිය කතිකාවතකට අදාළ කර ගැනීම සඳහා නැවත ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සංකල්පනය කරන්නේ කෙසේද යන්න යි.

මෙම නැවත සිතා බැලීමේ ක්‍රියාවලියට බැරෑරුම් ලෙස අප සම්බන්ධ කරවීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට වැදගත් කාර්යභාරයක් පැවරී ඇතැයි මා විශ්වාස කරන අතර ඔවුන් එසේ කරනු ඇතැයි ද මම බලාපොරොත්තු වෙමි.

---

**ආචාර්ය කුමාරවඩිවෙල් ගුරුපරන්**

නීතිඥවරයෙකි. යාපනය විශ්වවිද්‍යාලයේ නීති අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු මෙන්ම එහි අංශ ප්‍රධානියා වශයෙන් ද කටයුතු කර තිබේ. දෙමළ සිවිල් සංවිධාන එකමුතුවේ සම නිර්මාතෘවරයා වන අතර යාපනය මූලිකව ක්‍රියාත්මක වන *Adayaalam centre for policy research*හි නිර්මාතෘවරයා ද වේ.



# විකල්පයක් සොයා ගිය ගමන

**සම්පත් සමරකෝන්**

1996 වර්ෂයේ ආරම්භ කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය බරසාර ක්‍රියාවලියේ 25වන සැමරුම පැවැත්වීම පිළිබඳව එහි කොටස්කරුවකු ලෙස ආඩම්බරයටත්, සතුටටත් පත් වෙමි. 1994 දේශපාලන වෙනස්වීමකින් වසර 2කට පසුව ඇරඹි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය 25වන සැමරුම පවත්වන්නේ ගෝලීය කොවිඩ් වසංගතයට ලොව සියලු ජනයා මෙන්ම අප ද මුහුණ දෙමින් සිටින මොහොතක ය. එබැවින්, වසංගත තත්ත්වයක වුව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙනීසිටින 'ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී' වටිනාකම් ආරක්ෂා කර ගැනීමත්, ඒවා සුපෝෂණය කිරීමත් අපට අත්හළ නොහැකි වගකීමකි. එම ප්‍රජාතන්ත්‍රීය වටිනාකම්වල අගය මෙවැනි ඛේදවාචකයන් හමුවේ වඩා තීව්‍ර ලෙස සමාජයකට අත්‍යවශ්‍ය වීම නිරායාසයෙන් සිදු වන්නකි. එසේම, නැවත වරක් ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, ප්‍රකාශනයේ නිදහස සහ යුක්තිය ඇතුළු ලාංකීය භූමිය විසින් පුනපුනා වසර ගණනාවක් ඉල්ලා සිටින වටිනාකම් ළඟා කර ගැනීම ප්‍රශ්නසහගත වන 'ලාංකීය දේශපාලනයේ ජාතිකත්වය මත පදනම් වූ ප්‍රවණතා' විසින් රාජ්‍ය බලය හසුරුවන සමයක, සිය 25වන වසර සැමරීමට සිදුවීම ම තවත් විශේෂත්වයකි. ඒ විශේෂත්වය නිසාම, 1996 වසරටත් වඩා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙනී සිටින 'නව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්වල' අවැසි බව ලාංකීය සමාජයට එදාට වඩා අද දැනෙමින් තිබේ. එම නිසා, බුද්ධිමය මණ්ඩපයක්, පර්යේෂණ සහ උද්දේශන වැඩබිමක් ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට, පවතින සමාජ දේශපාලන සංදර්භය තුළ අත්හළ නොහැකි වගකීමක් තවදුරටත් පැවරී ඇති බව 25වන සැමරුම අවස්ථාවේ කල්පනා කරමි.

## අතීත අත්දැකීම්වලින් බිඳක්

ප්‍රජා ගුවන් විදුලි සේවාවන් සමග එක්ව ඈත ගම්මානවල එසේ නැත්නම්, ඇතැම් අය විසින් අර්ථ ගැන්වූ 'මායිම් ගම්මානවල' සිංහල, දෙමළ සහ මුස්ලිම් මිනිසුන්ගේ අයිතිවාසිකම් පාගා දැමීම හේතුවෙන් පීඩාවට පත් ඒ මිනිසුන්ගේ හඬ යම් තාක් දුරට මහා සමාජයට සන්නිවේදනය කිරීමට මීට වසර ගණනාවකට පෙර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මාධ්‍ය ඒකකය විසින් ඇරඹි එක් වැඩසටහනකි. අන්තර්ජාලය ප්‍රචලිත වී නොතිබුණු යුගයක වුව විසඳුම් සෙවීමට සහාය වීමේ පුරවැසි මාධ්‍ය භාවිතාවක් වෙනුවෙන් එම ක්‍රියාවලිය පෙනී සිටියේ ය. ඊට අමතරව සාම්ප්‍රදායික මාධ්‍ය තුළ පළ වන වන සුවිශේෂී අන්තර්ගතයන් නිරීක්ෂණයට ලක්කරමින් එහි ඇති අගතිගාමී ප්‍රවණතා, 'යහපත් මාධ්‍ය අක්ෂයක' සිට විශ්ලේෂණය කළේ ය. විශේෂයෙන් යුද්ධය පැවති සමයේ දෙමළ ජනයාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථා සහ සුළුතර ජනයාගේ අයිතිවාසිකම් සාම්ප්‍රදායික මාධ්‍ය විසින් නොසලකා හරින අන්තර්ගතයන් ප්‍රශ්න කිරීම්වලට ලක් කළේ ය. ඒවා පර්යේෂණ පත්‍රිකා ලෙස මුද්‍රිත පිටපතින් සමාජගත කිරීමට හැකි විය. ඇතැම් ඒවා ලංකාවේ විශ්වවිද්‍යාල තුළ විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතු සඳහා අද ද භාවිතයට ගැනීම අමතක නොකළ යුතු කරුණකි.

එවැනි බොහෝ ක්‍රියාවන් තුළ වූ අත්දැකීම් සහ ප්‍රවණතා තුළින් 'පුරවැසි මාධ්‍යකරණය' පිළිබඳ නව අත්දැකීමක් ලාංකීය මාධ්‍ය සමාජය ඇතුළු, ලාංකීය සමාජයට හඳුන්වා දීමට පුරෝගාමී වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මාධ්‍ය ඒකකයට හැකි වීම ආපසු හැරී බැලීමේ දී සුවිශේෂී සලකුණක් ලෙස සටහන් වන අතරේම, සමාජයේ ප්‍රශ්න විසඳා ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා අන්තර්ජාල අවකාශය භාවිතයට ගන්නේ කෙසේ ද යන්න අදාළ පුරවැසි මාධ්‍යකරණයේ එක් පදනම් අදහසක් විය. ලංකාව පුරා බොහොමයක් සිවිල් සංවිධාන සහ මාධ්‍යවේදීන් සමග එම පුරවැසි මාධ්‍යකරණය තුළ 'නවමාධ්‍ය' අත්දැකීම, පුහුණු කිරීම් ඇතුළු විවිධ ක්‍රමවේදයන් ඔස්සේ බෙදා ගන්නා ලදී. ඒත් සමග විශේෂයෙන් සිවිල් සංවිධාන තුළ ඒ වන විට එතරම් සාකච්ඡා නොවුණු ඒ ඒ සංවිධානවලට අවශ්‍ය 'මාධ්‍ය උපායමාර්ග' පිළිබඳ අදහසක් ඔවුන් තුළ රෝපණය කිරීමට ද අවස්ථාව සැලසිණි.

අන්තර්ජාල අවකාශය (බ්ලොග්, ඊමේල්) තුළ යුනිකෝඩ් අකුරු භාවිතය ප්‍රචලිත වී නොතිබූ සමයක, අනාගත දැක්මකින් යුතුව 'අනාගතය යුනිකෝඩ්' යැයි කීමට අපට ධෛර්යය තිබිණි. ඒ මත පිහිටා අපගේ සියලු අන්තර්ජාල ප්‍රකාශන 'යුනිකෝඩ්' භාවිතයෙන් මුදා හැරියේ ය. යුනිකෝඩ් භාවිතය සඳහා, හැකි සෑම පියවරකින්ම ඉලක්ක සමාජයන් දැනුවත් කළේ ඇතැම් වෙබ් ආශ්‍රිත මාධ්‍යකරුවන්ගේ (එම්බර්ඩඩ් අකුරු භාවිත කරන) උසුළු විසුළු මධ්‍යයේ ය. නමුත් අප එ දවස පුන පුනා කී කරුණ අද සත්‍ය වී, සියලු දෙනා යුනිකෝඩ් භාවිතයට යොමු වී සිටීම සතුටට කරුණකි. එය නැතිවම බැරි තත්ත්වයකට පත් වීම ද, බොහෝ අයගේ උත්සාහය මත සිංහල සහ දෙමළ යුනිකෝඩ් අකුරු ඉතා දියුණු තත්ත්වයක පැවතීම ද පිළිබඳව, අද ඒ දෙස ආපසු හැරී බලන විට අප සියලු දෙනාට සතුටු විය හැකි ය.

## නව ප්‍රවණතා

ලංකාව තුළ පර්යේෂණාත්මක ක්‍රියාවලියකින් පසුව, 'පුරවැසි මාධ්‍යකරණය' පදනම්ව සිංහල යුනිකෝඩ් භාවිතයෙන් 2007 ඇරඹි 'විකල්ප' වෙබ් අඩවිය එහි එක් දීර්ඝ ක්‍රියාවලියක සුවිශේෂී සලකුණකි. 2007 විකල්ප බ්ලොග් අඩවිය ආරම්භයට පෙර *Groundviews* අඩවිය ඇරඹීමත්, පසුව 2014 දී දෙමළ මාධ්‍ය වෙබ් අඩවියක් ලෙස 'මාට්‍රම්' වෙබ් අඩවිය ඇරඹීමත් මාධ්‍ය ඒකකයේ, මග සලකුණු අතර ප්‍රමුඛ අවස්ථාවන් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ 25වන සැමරුමේ දී සටහන් කරමු.

ඒත් සමග විශේෂයෙන් රාජ්‍ය මාධ්‍ය තුළ මහජන සේවා ජනමාධ්‍ය වටිනාකම් ගොඩනැගීම සඳහා ලංකාවේ ප්‍රධාන මාධ්‍ය සංවිධාන සමග එක්ව 'මහජන සේවා ජනමාධ්‍ය භාවිතයක්' ඇති කිරීමට දැරූ උත්සාහයන් ද අතිශය ඉදිරිගාමී පියවරයන් ය. ඒ සඳහා කෙරුණු උත්සාහයන් අතර මහජන සේවා ජනමාධ්‍ය වෙනුවෙන් වූ දැනුවත් කිරීම්, පුහුණු, සංවාද සහ ඒ පිළිබඳව වන විවිධ පර්යෙෂණ පත්‍රිකා ඉදිරිපත් කරමින් එය යථාර්ථයක් බවට පත් කිරීමට ගත් වෙහෙසද සුවිශේෂී

වන්නේ, රාජ්‍ය මාධ්‍ය ඇතුළු බොහෝ අනෙකුත් සාම්ප්‍රදායික මාධ්‍ය තුළ අද වන විට ඇති වී ඇති ද්‍රැවීකරණයට යම් පිළිතුරක් ඒ තුළ ඇති නිසාවෙනි. නමුත් එය යථාර්ථයක් කර ගැනීමට අප සියලු දෙනාට නොහැකි වුවත්, එම අදහසෙහි ඇති හරයාත්මක වටිනාකම, එදාටත් වඩා ඉස්මතු ව පවතින බව අමුතුවෙන් කිව යුතු නොවේ. එසේම, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ලංකාව තුළ ස්ථාපිත කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, අනෙකුත් සංවිධාන කිහිපයක් සමග එක්ව දැරූ වෑයම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිමය කෙටුම්පතක් දක්වා ගමන් කළේ ය. නමුත් එවකට වූ දේශපාලන සමාජය තුළ ඇති වූ විවිධ තත්ත්වයන් හමුවේ එය, එදවස යථාර්ථයක් කර ගැනීමට නොහැකි වුවත්, පසුගිය 2016 වර්ෂයේ දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම නීතියක් ලෙස ලංකාවේ ස්ථාපිත විය. ඒ සඳහා යම් පුරෝගාමී මෙහෙවරක් කිරීමට හැකි වීම 'ප්‍රජාතන්ත්‍රවාදය' අර්ථයෙන් අප පමණක් නොව ලාංකීය සමස්ත සමාජය ම ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

පුරවැසි ජනමාධ්‍යකරණයේ වටිනාකම් පදනම් කර ගනිමින් 2007 ඇරඹි විකල්ප වෙබ් අඩවිය, 2009 යුද්ධයෙන් පසුව උතුරු සහ නැගෙනහිර පීඩිත මිනිසුන්ගේ මානව හිමිකම් කඩවීම්, යුද්ධය විසින් ඇති කළ පීඩාවන්ගේ ජීවිත අත්දැකීම් සිංහල භාෂාවෙන් සංන්නිවේදනය කළේ ය. රටම යුදකාමීත්වයේ අශීලාචාර චර්යාවන්ගෙන් හිරිවට්ටා තිබූ සමයක ඒ හඬක් නොමැති පීඩිත මිනිසාගේ හඬ දකුණේ සහෝදර මිනිසුන් වෙත හැකි පමණ සන්නිවේදනය කිරීමට අපට හැකි විය. එම ක්‍රියාවලිය අප විසින් සිදු කරන ලද්දේ, අධිපතිවාදී මිලිටරියේ විවිධ බලපෑම් හමුවේ ඒ මිනිස් වේදනාවන් සුවපත් කිරීමේ සන්නිවේදන ව්‍යායාමය එවකට පැවති සාම්ප්‍රදායික මාධ්‍ය විසින් නොසලකා හැර තිබූ සමයක ය. කැමරාවක් ඇස ගැසුණු සැණින් සලිත වන උතුරු නැගෙනහිර සිටි හමුදා අප පුරවැසි මාධ්‍ය ක්‍රියාවලියට විශාල අභියෝගයක් විය. විවිධ ප්‍රශ්න කිරීම් තුළ වූ බියකරු බව යුද්ධයේ කෲරත්වය පිළිබඳ යථාව මනාව පිළිබිඹු කළේය. නමුත් අප විසින් උපක්‍රමිකව රැස් කරගත් ඒ පීඩිත මිනිසුන්ගේ කටුක අත්දැකීම්, රට සහ ලෝකය හමුවේ තැබීමට අපට හැකි විය.

එපමණක් ද නොවේ, දකුණේ, විවිධ යෝධ සංවර්ධන ව්‍යාපෘති සහ මිනිසා ඇතුළු සොබාදහම නොසලකා ඇති කරගනු ලබන ප්‍රතිපත්ති නිසා විවිධ අන්දමින් පීඩාවට පත් මිනිසුන්ගේ හඬ ද අපි අන්තර්ජාල අවකාශයට මුදා හැරියෙමු. විඩියෝ, ඡායාරූප ඇතුළු මාධ්‍යයන්ගෙන්, නවතම තාක්ෂණික මෙවලම් භාවිතයෙන් එක් කළ ඒ තොරතුරු අපගේ අන්තර්ජාල ආකයිව්ස් ගබඩාව ඔස්සේ අද ද විවිධ පුද්ගලයන් සහ කණ්ඩායම් විසින් පරිශීලනය කෙරේ. කටුක සත්‍ය ඉස්මතු කර දැක්වෙන එම වාර්තා වැඩසටහන්, පුරවැසි වෘතාන්තයන්, කෙටි චිත්‍රපට මෙන්ම දේශපාලන සංවාද, සාකච්ඡා, සිය ගණනක් විකල්ප පුරවැසි වෙබ් අඩවිය නිෂ්පාදනය කර ඇත. ඒ බොහොමයක් අන්තර්ගතයන් අධිපති සාම්ප්‍රදායික මාධ්‍යයන් විසින් ග්‍රහණය කර නොගන්නා හෝ නොසලකා හරින අන්තර්ගතයන් ය. නමුත් අධිපතිවාදී මතයන්ගෙන් වසා තැබීමට උත්සාහ කරන එම පීඩිත හඬවල්වල 'දේශපාලන අර්ථය' කෙරෙහි අවධානය යොමු කිරීම ලාංකීය භූමිය වඩා ප්‍රජාතන්ත්‍රවාදී භූමියක් කිරීමට අත්‍යවශ්‍ය බව අපගේ හැඟීම යි.

### ඇගයුමට ලක්වීම

අපගේ මාධ්‍ය අවකාශය හරහා හෙළිදරව් කළ අන්තර්ගතයන් පිළිබඳව ජාත්‍යන්තර සංවිධාන පවා සිය අවධානයට ලක් කර තිබේ. ඇමෙරිකා එක්සත් ජනපදය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වන ෆ්‍රීඩම් හවුස් සංවිධානය 2020 දී 'අන්තර්ජාල නිදහස' පිළිබඳව නිකුත් කර තිබූ *Freedom of the Net 2020* නම් වාර්ෂික වාර්තාවේ දී, *Vikalpa, Groundviews, Maatram* වෙබ් අඩවි ගැන මෙසේ සඳහන් කරයි:

''...විවිධ අන්තර්ගතයන් සාමාන්‍යයෙන් *Online* වේදිකාවන් මගින් ලබා ගත හැකි ය. සමාජ මාධ්‍ය, සන්නිවේදන වේදිකා සහ බ්ලොග්, පහසු හා පුළුල් ලෙස ලබා ගත හැකි අතර, මාධ්‍ය භූ දර්ශනය විවිධාංගීකරණය කරමින් දේශීයව විවාදයට ඉඩහසර විවර කර දෙයි. තොරතුරු වාරණය කිරීමේ ඉතිහාසයක් සහ, වාර්තාකරණ කාල සීමාව තුළ අන්තර්ජාල වේදිකාවල ක්‍රියාත්මක වන මාධ්‍යවේදීන් ඉලක්ක කර සිදු වන බිය ගැන්වීම් අතරේ, ඉංග්‍රීසි, සිංහල සහ

දෙමළ භාෂාවෙන් අන්තර්ජාලය හරහා විවිධ තොරතුරු ප්‍රභවයන් ලබා ගැනීමේ හැකියාව ඇත."

"ප්‍රධාන ධාරාවේ මාධ්‍ය විසින් නොසලකා හරිනු ලබන පුරවැසියන් විසින් ජනනය කරන ලද අන්තර්ගතයන් *Vikalpa, Groundviews, Maatram* වැනි වෙබ් අඩවි මගින් එළිදැක්වීම සිදු කෙරේ."

අතුරුදන් කිරීම්, මාධ්‍ය මර්දනය, ජනතාවගේ ඉඩම් අයිතිවාසිකම් උදුරා ගැනීම්, හමුදාකරණය, දේශපාලන සිරකරුවන් පිළිබඳ ප්‍රශ්නය, අභ්‍යන්තර අවතැන් වූවන්, කඳුකරයේ වතුකර ආශ්‍රිත මිනිසුන්ගේ ප්‍රශ්න, 2009 යුද්ධයෙන් පසු ලංකාවේ මුස්ලිම් ජනයා වෙත මුදාහළ ප්‍රචණ්ඩත්වය, ඇතුළු පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් උල්ලංඝනයන් මෙන්ම ඔවුන් මත මුදාහළ පීඩාවන් සහ වෙනස්කොට සැලකීම් පිළිබද වඩා වැඩි අවධානයක් යොමු කිරීම ඉහත කී සංදර්භය තුළ අපගේ වැඩබිමේ එක් ප්‍රධාන ක්‍රියාකාරීත්වයක් විය. එම වැඩබිම තුළ වූ ප්‍රධාන සලකුණු එක් වේදිකාවකට ගෙන ඒමට අපට හැකි විය. එය *Unframed* ඡායාරූප ප්‍රදර්ශනය යි. (*http://unframedsl.org*) 2018 ජනවාරියේ දී මහජනයාට විවෘත වූ *Unframed* ඡායාරූප ප්‍රදර්ශනය ලංකාවේ දිස්ත්‍රික්ක ගණනාවකම සිය අත්දැකීම ජනතාවට සම්මුඛ කරන ලද්දේ 'පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ, යුක්තිය සහ ජීවිතය වෙනුවෙන්' නම් ශිර්ෂය මූලික කර ගෙන ය. එම ඡායාරූප ප්‍රදර්ශනයේ හැඳින්වීමේ දී අප මෙසේ ලීවෙමු.

"...මෙහිදී අරගල රූපගත කිරීම්වලින් පමණක් යුක්තිය ඉටු නොවීම හෝ ඉටු වීම වෙනම කාරණයක්. නමුත් අපට පුළුවන් අරගලයේ ස්වරූපයන් හා ජීවත්වීම් රූප හරහා ජනයාට සම්මුඛ කරන්නට. පින්තූරයක් හා සම්මුඛ වන මොහොතක් කියන්නේම වෙනත් තර්කයක් තබා අපට පැන යෑමට බැරි මොහොතක්. සාමූහිකත්වය පිළිබඳ තමන්ගේ වගකීම නැවත නැවතත් තම මුහුණටම අල්ලා පෙන්වන මොහොතක්.

ඒ නිසා අපි ඔබට මේ මොහොතේ යෝජනා කරන්නේත්, බල කරන්නේත් අරගල කරන මිනිසුන් වෙනුවෙන් යුක්තිය උදෙසා එක පෙළට සිටගන්නට ය. යුක්තිය අවැසි බැව් උණුසුම් හදවත් ඇති තවත් දහස් ගණනක් නිහඬ මිනිසුන්ට අපි කියමු. එවන් හදවත් සමඟ යුක්තිය වෙනුවෙන් අරගල කරමු, අවසන් හුස්ම තෙක්ම අරගල කරමු. එදිනට යුක්තියේත්, ආදරයෙත් සුභාරංචිය අපිට ඇසෙනු ඇති..."

ශිෂ්ටසම්පන්න ලංකාවක් වෙනුවෙන් වූ ඒ ප්‍රයත්නයට ද හැම විටම මෙන් ජාතිවාදීන් විසින් සමාජ මාධ්‍ය තුළ දැවැන්ත ප්‍රහාරයක් එල්ල කළේ ය. එම ප්‍රහාරයන්ගේ දිගුවක් ලෙස, *Unframed* ඡායාරූප ප්‍රදර්ශනය වාරණයට ලක් වූයේ, නව සංස්කෘතික ප්‍රකාශනයන්ගේ සහ නිදහස් මතවාදවල තෝතැන්නක් බවට පත්ව තිබූ පේරාදෙණිය සරසවියේදී ය. යුක්තිය සහ ජීවිතය ඉල්ලන ඡායාරූප සහ අදහස්වල ඇති කැකෑරෙන උණුසුම් බව, ජාතිවාදී මනස් තුළට එල්ලකරන ලද 'බලපෑම' නිසා එසේ වාරණයට ලක් වූ බව අපි විශ්වාස කරමු. එහෙත් බොහෝ තැන්වල උණුසුම් හදවත් ඇති මිනිසුන් එම ඡායාරූප සමග එකාත්මික වූයේ යුක්තිය උදෙසා වන අරගලයට වූ සුබ පැතුම් ද සමග ය.

එසේම 'විකල්ප' වෙබ් අඩවිය ආරම්භ කොට වසර 10ක් ගතවන මොහොතේ අප මෙන්ම ලංකාවේ සැලකිය යුතු පිරිසක් සමාජ මාධ්‍ය වේදිකාවන් තමන්ගේ එක් ප්‍රධාන ප්‍රකාශන අවකාශයක් බවට පත් කර ගනිමින් ඉතා වේගයෙන් ක්‍රියාත්මක වෙමින් සිටී. සමාජ මාධ්‍ය යොදා ගනිමින් සංඛ්‍යාවෙන් සුළුතර ජනකොටස් පීඩාවට පත් කිරීමත්, සුවිශේෂී අනන්‍යතා ඇති සමාජ කොටස් පීඩාවට ලක් කිරීම සහ ඔවුන්ට වෙනස්කොට සැලකීමත් ඉතා වේගයෙන් වර්ධනය වෙමින් පැවතිණි. ඒ තුළ පීඩකයාගේ ඒ අගතිගාමී ක්‍රියා ප්‍රචණ්ඩත්වය දක්වා ඇවිළී ගියේ ය. මිනිස් ජීවිත, දේපළ පවා අහිමි විය. එයට ඇතැම් විට ආණ්ඩු සහාය පවා හිමි වී ඇතැයි හැඟිණි. අන්තර්ජාල අවකාශයන් සහ සමාජ මාධ්‍ය වේදිකාවන් ලංකාව තුළ අවහිර කිරීමට තරම් ඇතැම් අවස්ථාවලදී බලධාරීන් කටයුතු කළේ ය. මේ තත්ත්වය විශ්ලේෂණය කරමින්, වසර 2කට ආසන්න කාලයක් ලංකාව පුරා සංවිධාන 19කගේ දායකත්වයෙන් විවිධ සාකච්ඡා, සංවාද තුළින්, ප්‍රථම වරට 'සමාජ මාධ්‍ය ප්‍රකාශනය එළි දැක්වීමට 2019 අප්‍රේල් මස දී අපට හැකි විය. (*www.socialmedialank.org*) 'වගකීම්සහගත සමාජ මාධ්‍ය භාවිතයක් සඳහා වන මගපෙන්වීම් මාලාව' යන ශීර්ෂය යටතේ සමාජගත කළ එම

ප්‍රකාශනයේ මූලික හරය ගැන අපි මෙසේ ලීවෙමු.

'...ආණ්ඩු සහ සමාජ මාධ්‍ය සමාගම් ඇතුළු වෙනත් අධිකාරීන් සමාජ මාධ්‍ය අයථා භාවිතය පාලනය කිරීම සඳහා දැඩි උත්සාහයක යෙදී සිටියි. එසේ කිරීමද අවදානම්සහගත වන්නේ එමගින් ඒකාධිපති පාලනතන්ත්‍රවලට ව්‍යාජ තොරතුරු පිළිබඳ තර්ජනය හුවා දක්වමින් තමන්ගේම වූ ඩිජිටල් ප්‍රචාරණ යාන්ත්‍රණ උත්පාදනය කිරීමට හෝ නව නීති සම්පාදනය කරමින් විරුද්ධ මත නිහඬ කිරීමට අවස්ථාව සැලසෙන බැවිනි.

මෙම ප්‍රකාශනය සමාජ මාධ්‍ය තුළ හෝ සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් ගත් විට අදහස් පළ කිරීමේ නිදහසෙහි පවත්නා අනුල්ලංඝනීය වැදගත්කම හඳුනා ගැනීමට දරන ප්‍රයත්නයක් වන අතර, ආචාරධර්මීය, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී, මානව අයිතිවාසිකම් මත පදනම් වූ හා සමාජ වගකීමක් සහිත සමාජ මාධ්‍ය භාවිතය දිරි ගන්වන්නක් හා ශක්තිමත් කරන්නක් ද වේ..'

වගකීම්සහගත සමාජ මාධ්‍ය භාවිතාවක් සඳහා සියලුදෙනාට ඩිජිටල් සාක්ෂරතාව සමඟ තොරතුරු සමාජයකට ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කරමින්, සමාජ මාධ්‍ය නිෂේධනාත්මක ලෙස පරිශීලනය කිරීමේ ශක්‍යතා බැහැර කරමින්, සමාජ සාධාරණත්වය, මානව ගරුත්වය ඇතුළු මානව හිමිකම් මත පදනම් වූ උසස් මානව සමාජ ගතිකයන් ආරක්ෂා කරනු වස් සමාජ මාධ්‍ය ප්‍රජාව දිරිගැන්වීම එහි ප්‍රධාන අරමුණ යි.

**නව අභියෝග**

කොවිඩ් වසංගතයත් සමග අද ලොව පුරා අදහස් හුවමාරු කර ගැනීම, සාකච්ඡා, සංවාද ඇතුළු බොහෝ ක්‍රියාකාරීත්වයන් ඔන්ලයින්කරණයට බඳුන් වී ඇති සමයක මෙම ප්‍රකාශනයට ද මේ වන විට සැලකිය යුතු අන්දමේ අවධානයක් යොමුව තිබේ. ලංකාව තුළ සමාජ මාධ්‍ය සඳහා නීති පැනවීමේ උත්සාහයන් ද විටින් විට පාලකයන්ගෙන් ඇසෙන කාලයක මෙහි වටිනාකම ඉහළ යනු ඇත. එසේම, සිවිල් සංවිධාන ද වඩා වැඩි උනන්දුවක් සිය සමාජ මාධ්‍ය වේදිකාවන් සඳහා ලබා දී තිබෙන අවස්ථාවක මෙම ප්‍රකාශනය හෝ මෙවන් ප්‍රකාශනයක වැදගත්කම, ප්‍රකාශනයේ නිදහස, ඩිජිටල් අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් අප සමාජයට වැඩදායක වනු ඇත. ඒ සඳහා පුරෝගාමී වීමට හැකි වීම ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය 25වන වසර සමරන මේ මොහොතේ, එහි මාධ්‍ය ඒකකයට සතුටට කරුණකි.

එසේම, සමාජ මාධ්‍ය සාක්ෂරතාව, අන්තර්ජාල ආරක්ෂාව වැනි විෂයයන් පිළිබඳව ලංකාවේ ප්‍රදේශීයව ක්‍රියාත්මක වන ජනමාධ්‍යවේදීන්, සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් පුහුණු කිරීම් ද පසුගිය කාලය පුරා අප විසින් ක්‍රියාත්මක කෙරිණි. ඔන්ලයින් මාධ්‍යකරණයට අදාළ නව ප්‍රවණතා පිළිබඳව දැනුවත් ආචාරධාර්මික අන්තර්ජාල මාධ්‍ය ක්‍රියාකාරිකයකු ගොඩනැගීම එහි මූලික අදහස විය. ඔන්ලයින් මාධ්‍යකරණයට අදාළ, ලෝකයේ නව ප්‍රවණතා සහ අපගේ පර්යේෂණ දේශීය භාෂාවන්ට පරිවර්තනය කරමින් ඔවුන්ගේ ධාරිතා වර්ධනය කිරීමට උත්සාහ කළෙමු.

එහි දී කොළඹ කේන්ද්‍රීය මෙන්ම කොළඹින් පිට සංවිධාන සමග එක්ව ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට අදාළව සමාජ මාධ්‍ය ඇතුළු ඔන්ලයින් අවකාශයන් භාවිතයට ගැනීම පිළිබඳ දැනුම ලබා දීමටත්, ඒ සංවිධාන සමග ජාලගතව ක්‍රියාත්මක වීමටත් අවස්ථාව සැලසිණි. කෙසේ නමුත් පසුගිය කාලය පුරාම එසේ සිදු කරන ලද පුහුණු කිරීම්වලින් ලැබී ඇති ප්‍රතිඵල පිළිබඳ මේ මොහොතේ සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ නිරීක්ෂණය කිරීමේ දී අපට ඒ තරම් සතුටු විය නොහැකි ය. නමුත් හුදකලාව ගත් විට සමාජ මාධ්‍ය තුළින් පමණක් මෙම අගතිගාමී ප්‍රවණතා බැහැර නොවන බව අපගේ විශ්වාසය යි. ලංකාව තුළ මාධ්‍ය භාවිතය, ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව අයිතීන් තුළ පවතින දුර්වීකරණය එයට බලපා ඇත.

කෙසේ නමුත්, 2007 ඇරඹි විකල්ප වෙබ් අඩවියේ (*www.vikalpa.org*) වැඩබිම මූලික වශයෙන් අන්තර්ජාල අවකාශය විය. එහි දී ඔන්ලයින් මාධ්‍යකරණය තුළ වන නව තාක්ෂණික මෙවලම් දේශීය භාෂාවලින් හඳුන්වාදීමත්, ඒවායේ උපයෝගීතාව, අන්තර්ගතයන් තුළින්ම සමාජගත කිරීමත් සුවිශේෂ වෙයි. එසේම අපගේ අන්තර්ගතයන් නිෂ්පාදනයේදී ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් පිළිබදව වන අරගල පෝෂණය කිරීමට මැදිහත් වීමට උත්සාහ දැරිණි.

විශේෂයෙන් පසුගිය කාලය පුරා ජනමාධ්‍ය ආයතනවලට මෙන්ම ජනමාධ්‍යවේදීන්ට සිදු කළ අපරාධවලට යුක්තිය ලබා ගැනීම වෙනුවෙන් වූ අගලවලට දායක විය. ඇතැම් විට යුක්තිය ලබා ගැනීම සඳහා වන ක්‍රියාකාරීත්වයන් සංවිධානය කිරීමට ද මූලික විය. උතුරේ ද, දකුණේ ද, අතුරුදහන් වූවන්, ඉඩම් අහිමි වූවන්ගේ අරගලවලට දායක විය. හිස ඔසවමින් තිබූ ජාතිවාදී ප්‍රවණතාවලට විරුද්ධව පැවති සාමූහික අරගලවලට සෘජුවම දායක විය. 2009න් අවසන් වූ යුද්ධයෙන් පසු උතුරේ සහ නැගෙනහිර පීඩිත මිනිසුන්ගේ අයිතිවාසිකම් කඩකිරීම් සහ දේශපාලන සහ සමාජ අභිලාෂයන් සිය මාධ්‍ය අවකාශය තුළ රට සහ ලෝකය හමුවේ තැබුවේ ය. සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්, ජනමාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීමේ දී ඔවුන්ට යුක්තිය ඉටු කිරීම උදෙසා පෙනී සිටියේ ය. හඬක් නොමැති පීඩිත මිනිසුන් වෙනුවෙන් සිය මාධ්‍ය ක්‍රියාවලිය සිදුකිරීමට හැකි පමණ උත්සාහ ගනු ලැබිණි. ඇතැම් විට එම ක්‍රියාකාරකම්වලදී, උරණ වූ ආරක්ෂක අංශවල තර්ජනයන්ට ද ගොදුරු විය. කෙසේ නමුත් ඒ අභියෝග හමුවේ වුව ද, පානම, බදුල්ල, මොනරාගල, අම්පාර ආදී ප්‍රදේශවල සිට වව්නියාව, මඩකලපුව. මන්නාරම, යාපනය දක්වා වූ සාමූහික මිනිස් අවකාශයන්ගේ අවිහිංසාවාදී අරගල 'විකල්ප' හි එක් ප්‍රධාන වැඩබිමක් විය. යුක්තිය, අයිතිවාසිකම් ඉල්ලා මහ පාරවල්වල සිට ඈත ගම්දනව් දක්වා 'විකල්ප' පුරවැසි මාධ්‍ය ක්‍රියාවලිය දියත් විය. එසේම, 'විකල්ප මාධ්‍ය භාවිතය' මිනිසුන්ගේ අයිතිවාසිකම් සඳහා වූ අරගලවලින් විතැන් නොවූ ක්‍රියාවලියක් විය. එය මිනිසුන් සමග මිනිසුන්ගේ අවිහිංසාවාදී අරගල, මැදිහත්වීම්වල සිට සිය මාධ්‍යකරණය සිදු කළ පුරවැසි මාධ්‍ය ක්‍රියාවලියකි. ඒ නිසාම, සමාජ මාධ්‍ය අවකාශයේ දැඩි අශීලාචාර තර්ජනයන්, බිය වැද්දීම ඇතුළු බලපෑම්වලට ගොදුරු විය. සමාජ මාධ්‍යයෙන් ඔබ්බට භූමියේ දී එල්ල වුණු තර්ජනයන් නොසලකා හැරිය නොහැකි ය. නමුත්, වඩා යහපත් සමාජයක් වෙනුවෙන් වූ මාධ්‍ය ක්‍රියාවලිය නිසාම 'විකල්ප' වෙබ් අඩවිය සම්මානයට ද පාත්‍ර විය. එසේම *Groundviews* සහ මාටුම් සහෝදර වෙබ් අඩවිද සම්මානයට පාත්‍ර වීම ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය 25 වන සැමරීම සිදුකරන මෙවන් මොහොතක එහි මාධ්‍ය ඒකකය ලෙස අපට ඇත්තේ ආඩම්බරයකි.

**කේන්ද්‍රීය වටිනාකම්**

කෙසේ නමුත්, විකල්ප වෙබ් අඩවිය සහ මාධ්‍ය ඒකකයට මේ වසර ගණනාව පුරා බලපෑම්සගහත ක්‍රියාකාරීත්වයන් දියත් කිරීමට හැකි වූ එක් ප්‍රධාන කරුණක් 25 වන සැමරුමේ දී ලියා තැබිය යුතුම ය. එය නම් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ වන කේන්ද්‍රීය වටිනාකම් ය. විශේෂයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ වන වැඩ සංස්කෘතිය, නිදහස් මතවාද සහ නිදහස් චින්තනයට ඇති අවස්ථා සහ දියුණු අභ්‍යන්තර සංස්කෘතිය නිසා, මේ සියලු දේ මෙලෙස සිදු කිරීමට හැකියාව ලැබිණි. එසේ නොවුවා නම්, ප්‍රතිඵල නොමැති 'වැඩ පමණක්' ඉතිරි වන්නට ඉඩ තිබිණි. එසේ නොවී 'සාමූහික මිනිස් අවකාශයන්'ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිමින්, එහි අභ්‍යන්තරයේ සිට, සිය මාධ්‍ය ක්‍රියාවලිය සිදු කරන්නට අවස්ථාව ලැබීම වසර 25ක් වයසැති විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ, එම වයසින් හරි අඩකට වඩා වැඩියෙන් ක්‍රියාත්මක වූ මට ඇත්තේ නිහතමානී ආඩම්බරයකි. එසේ වුවත්, දැන් අප ඉදිරියේ අභියෝග රැසක් පවතින බව මගේ අදහස යි.

2009 මැයි මසින් අවසන් කළ යුද්ධය නිමා වී වසර 12කට ආසන්න වෙමින් තිබේ. එසේ වුවත්, යුද්ධයේ සෘජු ගොදුරු බවට පත් වූ උතුරු සහ නැගෙනහිර මිනිසුන් ඇතුළු ලංකාවේ පීඩාවට පත් ජනතාවට තවමත් යුක්තිය ඉටු වී නැත. යුද්ධයෙන් පසුව දකුණේ ඇතැම් තැන්හි ඇවිළ ගිය ප්‍රචණ්ඩත්වයෙන් පීඩා විඳි මුස්ලිම් ජනයාට යුක්තිය ඉටු වන බවක් පෙනෙන්නට නැත. එසේම, හලාවත, කටුනායක, රතුපස්වල ඇතුළු ප්‍රදේශවල සාමකාමී විරෝධාවලට එල්ල කළ ප්‍රහාරයන්ගේ ගොදුරු බවට පත් වූවන්ට පිළිගත හැකි සාධාරණයක් ඉටු වී නැත. මේ සඳහන් කළේ කිහිපයක් පමණි. එබැවින් ලංකාව තුළ 'අභ්‍යන්තර යුක්තිය' ඇති කර ගැනීම සඳහා වන ක්‍රියාවලිය අද වන විට ගමන් කර ඇත්තේ ආපස්සට දැයි හැඟීමක් පවතී.

එසේම සමාජ මාධ්‍ය තුළට නව නීති හඳුන්වා දීමේ වෑයමක් වර්තමාන ආණ්ඩුවෙන් මතු වෙමින් පවතින අතර, ලංකාවේ බොහෝ මාධ්‍යයන් සිය වර්ගවාදී

නැඹුරුතාව පෙන්වමින් සිටින්නේ ඉතාමත් නරුමවාදී ලෙස ය. මේ සියලු තත්ත්වයන්ගෙන් තවදුරටත් හැකිළී යන්නේ ප්‍රජාතන්ත්‍රවාදයි. ජනතාවගේ ප්‍රකාශනයේ නිදහස යි. සමස්තයක් ලෙස ගත් කල ශිෂ්ට සමාජයකට අත්‍යවශ්‍යම ප්‍රජාතන්ත්‍රවාදී හර පද්ධතීන් ය. එබැවින් මේ සියලු අගතීන්, ප්‍රශ්න ආමන්ත්‍රණය කරමින්, ශිෂ්ටසම්පන්න ලෙස සාමූහික පිළිතුරක් සොයා ගැනීම සඳහා පුරවැසියන් මෙන්ම ලංකාවේ සිවිල් සංවිධාන ද උපායමාර්ගිකව මැදිහත් වීම අත්‍යවශ්‍ය සාධකයකි. එම නිසා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අපට 25 වසරක අතීතයට වඩා ප්‍රබල ලෙස ප්‍රජාතන්ත්‍රවාදී හර පද්ධතීන් ආරක්ෂා කර ගැනීමටත්, ඒවා ප්‍රතිසංස්කරණය කිරීමටත් දායකත්වය සැපයීම අත්හළ නොහැකි අභියෝගයකි. එසේම ලාංකීය භූමිය පුනපුනා ඉල්ලා සිටින 'අභ්‍යන්තර යුක්තිය' ළඟා කර ගැනීම සඳහා ද ගැඹුරු සහ පළල් මැදිහත්වීමක් සිදුකිරීම ද අපට අත්හළ නොහැකි වගකීමකි.

"අපේ රටේ වගේම ඔබේ රටේත්, ජාතිවාදයට එරෙහි අරගලය මඟින් ඉගන ගත හැකි පාඩමක් වේ නම් ඒ, ජාතිවාදය විචාරශීලීව ඉවසා සිටිය යුතු දෙයක් නොවන අතර එය සවිඥානිකව පරාජය කළ යුතු දෙයක් යන්න යි. ඒ වගේම, මිනිසුන්ගේ මානව හිමිකම් ප්‍රතික්ෂේප කිරීම යනු ඔවුන්ගේ මනුෂ්‍යභාවයට අභියෝග කිරීම යි" නෙල්සන් මැන්ඩෙලා වරක් කීවේ ය. මැන්ඩෙලාගේ එම ප්‍රකාශය ශ්‍රී ලංකාවට අදටත් වලංගු නොවන්නේ ද?


එබැවින් 'ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී' හර පද්ධතින් වෙනුවෙන් වන සක්‍රීය මැදිහත් වීම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පසුගිය 25 වසරට වඩා අද සහ හෙටට නව උපායමාර්ග සමග අත්‍යවශ්‍ය සාධකයක් ම වන්නේ ය.

---

**සම්පත් සමරකෝන්**

විකල්ප වෙබ් අඩවියේ සංස්කාරකවරයා ය. මාධ්‍යවේදියෙකි. සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකි.

# “මාට්‍රම්”: හඬක් නැතියවුන්ගේ වේදිකාව



සෙල්වරාජා රාජසේකර්

වර්ෂ 1996 ජුනි මස ආරම්භ කරන ලද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම වසරේ දී 25 වැනි සංවත්සරය සමරයි. මෙය ශ්‍රී ලංකාවේ යහපාලනය හා රට තුළ පවතින මතභේද තුරන් කිරීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව උද්ගත වී ඇතැයි යන දැඩි විශ්වාසයකින් හා මෙම ක්‍රියාදාමය ගොඩනැගීමෙහිලා ශ්‍රී ලාංකික ප්‍රජාව ද වැදගත් භූමිකාවක් රඟ දැක්විය යුතු ය යන අධිෂ්ඨානයකින් ආරම්භ කරන ලද්දකි.

තවද, පොදු ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විවේචනාත්මකව ගවේෂණ සිදු කිරීම, විකල්ප ක්‍රම හඳුනා ගැනීම සහ එය පුළුල් කිරීමේ අධ්‍යයනයන් හා පීඩනයන් එල්ල කිරීමේ වැඩසටහන් අරමුණු කර ගත් කාර්යයන් සිදු කරන ලදි. නමුත් රටේ පැවති පක්ෂග්‍රාහී මාධ්‍ය සංස්කෘතිය පිළිකුල් කළ ජනතාවගේ විකල්ප මත - විකල්ප අදහස් පළ කළ හැකි වේදිකාවක අඩුවක් තිබෙන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් හඳුනා ගැනිණි.

මෙම අඩුව පිරවීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2006 වසරේ දී සංජන හත්තොටුවගේ ප්‍රධානත්වයෙන් අන්තර්ජාලය පදනම් කර ගත් ජනතා මාධ්‍යයක් ලෙස ‘Groundviews’ ඉංග්‍රීසි වෙබ් අඩවිය ආරම්භ කරන ලදි. මෙය ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද “පුරවැසියන් සඳහා වූ මාධ්‍ය වෙබ් අඩවිය” ලෙස සැලකේ. එහි එක් දිගුවක් ලෙස “විකල්ප” නමැති සිංහල වෙබ් අඩවිය දෙමළ භාෂාවෙන් ලියැවුණු ලිපි කිහිපයක් ද පළ කළේ ය.

දෙමළ භාෂාවෙන් වූ විකල්ප අදහස් ඇතුළත් ලිපි සහ නිර්මාණ පළ කිරීමේ අවශ්‍යතාව තිබූ බැවින් දෙමළ වෙබ් අඩවියක අඩුව දැනෙන්නට විය.

මෙවන් පසුබිමක් තුළ 2014 ජුනි මස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තු මහතාගේ උපදෙස් හා සංජන හත්තොටුව මහතාගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රථම දෙමළ භාෂාව කතා කරන පුරවැසියන් සඳහා වූ මාධ්‍ය වෙබ් අඩවියක් "මාට්‍රම්" යන යමින් ආරම්භ කරන ලදි. සාමය ගොඩනැගීම, පාලන ක්‍රමය, මානව හිමිකම්, කලා හා සාහිත්‍ය සහ වෙනත් කරුණු පිළිබඳ වූ විකල්ප අදහස් වෙනස් වූ නිර්මාණ හා මාධ්‍ය රටාව තුළින් දෙමළ භාෂාවෙන් කියා පෑම "මාට්‍රම්"හි අරමුණ විය. එමෙන්ම සැමවිටම මාධ්‍ය සදාචාරයට පදනම්ව ක්‍රියා කිරීමටත් "මාට්‍රම්" විසින් අධිෂ්ඨාන කර ගන්නා ලදි.

"මාට්‍රම්" විසින් පාදක කරගත් මෙම සදාචාරයන්ට අනුව පසුගිය වසර හතක් තුළ එය මාධ්‍ය ක්ෂේත්‍රය තුළ බොහෝ ජයග්‍රහණ අත් කර ගෙන ඇත. එයින් ඇතැම් ජයග්‍රහණ පහත සඳහන් වේ.

"මාට්‍රම්" ආරම්භ කර ලද දිනයේදීම ශ්‍රී ලංකාවේ වෙබ් මාධ්‍ය තුළ නව විප්ලවයක් සිදු කෙරිණි. ඒ දක්වා දෙමළ භාෂාවෙන් පමණක් නොව අන් කිසිම භාෂාවකින් නිර්මාණය නොකරන ලද "මයික්‍රෝ" අඩවිය හරහා *(Micro site - https://maatram.org/unfinishedwar/)* ජනතාවගේ ගැටලු නව ආකෘතියකින් මතු කර පෙන්වීම යි. යුද්ධය අවසන් වී වසර 5 ක් ගත වී ඇති අවස්ථාවක ආරම්භ කරන ලද "මාට්‍රම්" "අවසානයක් නොමැති යුද්ධය" නම් උදෘතය යටතේ පළ කෙරිණි. අභියෝග රාශියක් මැද ක්ෂේත්‍රයට ගොස් ජනතාව අවතැන් වීම, අතුරුදහන් කරන ලද ඥාතීන් මුහුණ දෙන දුක් වේදනා, හමුදාකරණය, ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳව බහුමාධ්‍ය ආශ්‍රයෙන් වූ සාධක ඇතුළත් ලිපි පළ කරන ලදි.

ශ්‍රී ලංකාවේ අද වන විට වෙබ් අඩවියක ලිපියක් - නිර්මාණයක් ප්‍රසිද්ධ කිරීම සඳහා විවිධ ක්‍රම තිබෙන නමුත් ඒ සියලු ක්‍රමවේදවල ප්‍රමුඛයා වූයේ මෙම "මයික්‍රෝ" අඩවියයි.

**හඬක් නැති අයගේ හඬ ලෙස...**

සමාජයේ විවිධ ආකාරයේ හිංසනවලට ලක් වන පාර්ශ්වයන්ගේ හඬවලට සුවිශේෂී ස්ථානයක් ලබා දීම මාට්‍රම් මුල සිටම අනුගමනය කළ පිළිවෙත විය. විශේෂයෙන් මුස්ලිම් පුද්ගලික නීතිය නිසා පීඩාවට ලක් වූ අය, යුද්ධයෙන් පීඩාවට ලක් වූ අය, වසර 200කට අධික කාලයක සිට ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ කොඳු නාරටියක් ලෙස සිටින නමුත් ජාතික ප්‍රවාහයෙන් දීර්ඝ කාලයක සිට පිටමං කොට සිටින වතුකරයේ දෙමළ සමාජය යනාදී පාර්ශ්වවල ගැටලු පිළිබඳව අඛණ්ඩව එලදායී ආකාරයට ප්‍රශ්න කරමින් තිබේ.

හුදෙක්ම එකී ජනතාවගේ ගැටලු සම්බන්ධයෙන් පැලැස්තර විසඳුම් ලබා නොදී ගැඹුරින් අධ්‍යයනය කොට, පාලන බලයට පැමිණෙන සියලු පාලකයින් විසින් සහ ඔවුන් පාලනය කරනවා යැයි පවසන අය විසින් එකී වතුකරයේ දෙමළ ජනතාව රැවටීමට ලක් කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳව මාට්‍රම් ඔස්සේ හෙළිදරව් කෙරිණි. කම්කරු අයිතීන් වෙනුවෙන් සටන් කරනවා යැයි පවසමින් වෘතිය සමිති විසින් වසරකට කෝටි ගණන් අය කර ගන්නා සාමාජික මුදල් පිළිබඳ විස්තර තොරතුරු දැන ගැනීමේ පනත උපයෝගී කර ගෙන "මාට්‍රම්" විසින් හෙළිදරව් කිරීම ඒ පිළිබඳ කැපී පෙනෙන උදාහරණයකි. *https://maatram.org/?p=7654*.

එමෙන්ම, ශ්‍රී ලංකාව තුළ තේ නිෂ්පාදනය ආරම්භ කොට ඊට වසර 150ක් සම්පූර්ණ වීමේ සැමරුම 2017 දී පැවති මොහොතේ පරම්පරා ගණනාවක් තේ ගස වෙනුවෙන් තම දහඩිය හෙළමින් සිටින එක් කම්කරුවකුට හෝ ආරාධනා නොකිරීම සම්බන්ධයෙන් "මාට්‍රම්" විසින් විශේෂයෙන් අවධානයට ලක් කෙරිණි. මේ සම්බන්ධයෙන් පළ කරන ලද නිර්මාණ අතර "වලිච්චා වෙලක්කෙන්න තාන් මරුන්දු" නම් ඡායාරූප ලිපිය *(https://maatram.org/?p=6260)* දේශීයව පමණක් නොව ජාත්‍යන්තර වෙබ් පිටුවල ද පළ කරනු ලැබ වැඩි අවධානයකට ලක් විය.

ශ්‍රී ලංකාවේ සමස්ත තේ වගා බිමේ 70%ක් මහා පරිමාණ තේ වතු ලෙස සහ 30%ක් කුඩා තේ වතු ලෙස පවතින අතර අපනයන ආදායම ගත් කළ 75%ක තේ අපනයන ආදායම ලබා ගනු ලබන්නේ 99.9% ක් සිංහල අය හිමිකාරීත්වය දරන 30%ක කුඩා තේ වතුවලිනි. 25%ක ආදායම ලබන්නේ 70%ක් ලෙස පවතින මහා පරිමාණ (99.9%ක් වතුකරයේ දෙමළ අය) තේ වතුවලිනි. එම නිසා වතුකරයේ ජනතාව අඛණ්ඩව කම්කරුවන් ලෙස තබා ගැනීම, ආදායම් අවහිර කිරීම,

ජීවනෝපාය එලෙසින්ම තබා ගැනීම මෙය පිටුපස තිබෙන විශාල දේශපාලනමය සිද්ධාන්තය ලෙස පවතී. "මාට්‍රම්" මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන අතර වතුකරයේ සිටින වතු කම්කරුවන් ද කුඩා තේ වතු හිමිකරුවන් බවට පත් කිරීමේ සංවාදය සක්‍රියව පවත්වා ගනිමින් සිටී.

මුස්ලිම් පුද්ගලික නීතිය හේතුවෙන් වෙනස් කොට සලකනු ලබන අයගේ හඬට - එම නීතිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව මාධ්‍ය එතරම් උනන්දුවක් නොදක්වන කාල වකවානුවක, "මාට්‍රම්" විසින් අවකාශ සලසා දෙනු ලැබිණි. "MMDA: යුක්තිය සොයන කාන්තාවෝ" නම් මාතෘකාව යටතේ මුස්ලිම් පුද්ගල නීතිය නිසා අගතියට පත් කාන්තාවන් 12 දෙනා සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා (වීඩියෝ - *https://maatram.org/?p=5248*) "මාට්‍රම්" වෙබ් අඩවියේ පළ කෙරිණි. ඒ වනතුරු කිසිම මාධ්‍යයක ඔවුන්ගේ හඬට අවකාශයක් නොවී ය. මෙම වීඩියෝ පටිගත කිරීම් ප්‍රසිද්ධ කරනු ලැබීම නිසා මුස්ලිම් පුද්ගල නීතිය සංශෝධනය කළ යුතු ය යන බලපෑම තවදුරටත් ශක්තිමත් වෙමින් තිබේ.

## අතුරුදහන් කළ අයගේ කතා

පසුගිය වසර 7ක් තිස්සේ "මාට්‍රම්" බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද ඥාතීන් සමඟ එක්ව ගමන් කළේ ය. ඔවුන් මුහුණපාන දුක් ගැහැට පිළිබඳව විවිධ ආකාරයෙන් සටහන් කළේ ය. ජාත්‍යන්තර දිනය, උද්ඝෝෂණ හා සටන්, අනුස්මරණයන් ආදී වශයෙන් ඔවුන් සමඟ එක්ව ගමන් කරමින් සිටින "මාට්‍රම්" යුක්තිය ළඟා කර ගැනීමේ දීර්ඝ සටනේ දී කිසිම බුරුලක් නොදී අගතියට පත් අය වෙනුවෙන් පෙනී සිටියේ ය. පසුගිය වසර හතක් තිස්සේ අතුරුදහන් වූ අයට යුක්තිය ඉටු කර දීම වෙනුවෙන් අසීමිත ලිපි ගණනක් "මාට්‍රම්" විසින් පළ කරනු ලැබ තිබේ. එයින් විශේෂයෙන් සඳහන් කළ හැකි වැඩි අවධානයකට ලක් වූ ඇතැම් ලිපි මෙසේ සඳහන් කළ හැකඃ

අතුරුදහන් කරන ලද අය සිහි ගැන්වෙන භාණ්ඩ උපයෝගී කර ගනිමින් 2017 වසරේ දී "ඥාතීන් හා ඔවුන් පිළිබඳ මතකයන්" (1 වැනි කොටස - *https://maatram.org/?p=5937* සහ 02 වැනි කොටස - *https://maatram.org/?p=5975*) නම් මාතෘකාව යටතේ පළ වූ විශේෂාංගය විවිධ පාර්ශ්වයන්ගේ අවධානයට පාත්‍ර විය. එය තමන්ගේ සමීපතමයින් පැමිණෙන තුරු, ඔවුන් විසින් භාවිත කරන ලද සහ ඔවුන්ගේ මතකයන් අවදි කරවන භාණ්ඩ ද සමඟ ජීවත්වන ඥාතීන්ගේ සිත් පතුලේ සිර වී තිබෙන වේදනාවන් ගෙන හැර දැක්වී ය. මෙම සටහන *Groundviews* ඇතුළු ජාත්‍යන්තර වෙබ් අඩවිවල ද පළ කරන ලදි.

අවසාන යුද්ධයේ දී අතුරුදහන් කරන ලද සිය මුනුපුරා කොහේ සිටිනවා ද යන්න පිළිබඳව දැන ගැනීමට සිය මහලුභාවයද නොතකා විවිධ උද්ඝෝෂණවලට සහභාගි වූ මවක් මාට්‍රම් හා අදහස් බෙදා හදා ගන්නා ආකාරය *Virtual Reality* ක්‍රමය ඔස්සේ නැරඹිය හැකි 360 වීඩියෝවක් (*https://maatram.org/?p=7089*) "මාට්‍රම්" විසින් පටිගත කරන ලදි. "මා මිය ගිය පසු මාගේ මුනුපුරා සොයා යන්නේ කවුද මහත්තයා" යනුවෙන් හැඬූ කඳුළින් යුතුව අසා සිටි මව පිළිබඳ මතකය තවමත් මතකයේ රැඳී පවතී. අද වන විට එම මව ජීවතුන් අතර නැත. ජනතාවගේ ගැටලු, විශේෂයෙන් අතුරුදහන් කරන ලද අයගේ ඥාතීන් මුහුණ දෙන දුක් වේදනා *Virtual Reality* ක්‍රමය ඔස්සේ නැරඹිය හැකි ආකාරයේ 360 වීඩියෝව මාට්‍රම් අඩවිය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට පටිගත කරනු ලැබීම ගැන විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

එමෙන්ම, ජාති ආගම් සහ ප්‍රදේශ නොසලකා අතුරුදහන් කරනු ලැබ සිටින සිය ඥාතීන්ට කුමක් සිදු වී ඇත් දැයි දැන ගැනීමට අපේක්ෂාවෙන් සිටින අයගේ සිත් වේදනාවන්, කඳුළු හා බලාපොරොත්තුවේ කිසිම වෙනසක් නොවන බව සටහන් කොට තැබීම සඳහා "එකම පැනය, මිනිසුන් දෙදෙනෙක්, එකම වේදනාව" (*https://maatram.org/?p=8065*) නම් ඡායාරූප ලිපිය 2019 වසරේ බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද අය පිළිබඳ ජාත්‍යන්තර දිනයේ දී පළ වී තිබුණි. මෙම ලිපිය ද බොහෝ දෙනාගේ අවධානයට ලක් වූ අතර වෙබ් අඩවි රාශියක එය උපුටා පළ කරන ලදි.

## ලැබී තිබුණු පිළිගැනීම

මෙලෙස "මාට්‍රම්" අභියෝග රාශියක් මැද විවිධ ජන කොටස්වල ගැටලු අනාවරණය කිරීමට වේදිකාව සකසා

දීම හේතුවෙන් ජාත්‍යන්තර දෙමළ මාධ්‍යවේදීන්ගේ සංසදය (International Association of Tamil Journalists) විසින් සම්මාන ප්‍රදානය කොට ඇගැයීමට ලක් කෙරිණි.

පීඩන රාශියක් මැද ජනතාව වෙත නිවැරදි තොරතුරු ලැබිය යුතු ය යන බැඳීමෙන් සහ එඩිතරභාවයකින් හා කැපවීමෙන් මාධ්‍ය මෙහෙවරේ යෙදී සිටින අයට ගෞරවය පුද කිරීමේ අරමුණින් දෙමළ මාධ්‍යවේදීන්ගේ සංසදය විසින් එහි මාට්‍රම් කතෘවරයා වෙත මෙකී සම්මානය ප්‍රදානය කරන ලදි.

ජනතාවගේ විකල්ප අදහස්වලට නිසි තැනක් ලබා දීම, වෙනස් වූ නිර්මාණ හැකියාවන් සහ මාධ්‍ය මෙහෙවර තුළින් ඒ පිළිබඳව අනාවරණය කිරීම, සෑම අවස්ථාවකදීම මාධ්‍ය ආචාරධර්මවලට අනුව ක්‍රියා කරන බවට ස්වයං සදාචාරය අනුගමනය කිරීම ආදිය තුළින් "මාට්‍රම්" ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව ආඩම්බරයෙන් සිහිපත් කරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වසර 25ක් සපුරන මේ මොහොතේ එහි පරමාර්ථයන් ළඟා කර ගැනීම උදෙසා සත්වසරක් තිස්සේ සිය දායකත්වය සැපයීමට හැකි වීම පිළිබඳව "මාට්‍රම්" ස්මරණය කරන්නේ සතුටිනි.

ආයතනීකරණයට ලක් වූ මාධ්‍ය ක්ෂේත්‍රය හා සංසන්දනය කිරීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ "මාට්‍රම්" ජනතාවගේ විකල්ප අදහස්වලට අවස්ථාව ලබා දීම පමණක් සිය එකම රාජකාරිය කොට ගෙන ක්‍රියා කරයි. ඊට අවශ්‍ය කෙරෙන පරිසරය නිර්මාණය කර දුන් අධ්‍යක්ෂවරයාට "මාට්‍රම්" සාඩම්බරයෙන් යුතුව සිය ස්තූතිය හා ප්‍රණාමය පුද කර සිටී.

---

**සෙල්වරාජා රාජසේකර්**

පර්යේෂකයෙකි, මාධ්‍යවේදියෙකි, සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකි. මාට්‍රම් වෙබ් අඩවියේ සංස්කාරකවරයා ය.

# ප්‍රජාතන්ත්‍රවාදය සහ ඒකාධිපතිවාදය අතර ආරක්ෂක පවුර



**රධිකා කුමාරස්වාමි**

පුරාණ ග්‍රීසියේ සිට අන්තෝනියෝ ග්‍රාම්ස්චි දක්වා සියලු චින්තකයෝ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයට ක්‍රියාකාරී සිවිල් සමාජයක් නොමැතිව ක්‍රියාත්මක විය නොහැකි බවත් ක්‍රියාකාරී සිවිල් සමාජයකට කැප වූ පුරවැසියන් නොමැතිව පැවතිය නොහැකි බවත් පෙන්වා දුන්හ. අයිතිවාසිකම් පිළිබඳව දැනුවත්, සවිඥානික, සංවාදශීලී පුරවැසිභාවය සමහර විට ප්‍රජාතන්ත්‍රවාදය සහ ඒකාධිපතිවාදය අතර ආරක්ෂක පවුරකි.

පසුගිය දශක කිහියක් තුළ පැවති සන්නද්ධ ගැටුම් කාල සීමාවේ සහ ඉන් පසුව ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට බලවත් අභියෝගවලට මුහුණ දීමට සිදු විය. 1990 ගණන්වල සිට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අපගේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ ව්‍යුහයන් ගේ ආරක්ෂකයෙකු වශයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී පුරවැසි භූමිකාව ඉටු කළේ ය.

ඔවුන් මෙම භූමිකාව ඉටු කළ මූලික ක්‍රියාමාර්ගවලින් එකක් වන්නේ අධිකරණ නඩු ක්‍රියා මාර්ගය යි. අපගේ කාලයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වූ ඉතා වැදගත් නඩු කීපයකටම සම්බන්ධ විය. යුද සමයේ දෙමළ වැසියන් නීති විරෝධීව ඉවත් කිරීම සහ 2018 “කුමන්ත්‍රණයේ” දී පාර්ලිමේන්තු අයිතිවාසිකම් සහ වරප්‍රසාද වෙනුවෙන් පෙනී සිටීම, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සාධනීය තීන්දු ලබා ගැනීමට සමත් වූ නඩු කිහිපයකි. තවත් සමහර තත්ත්වයන් යටතේ බොහෝ නඩුවල දී ශ්‍රේෂ්ඨාධිකරණය නිෂේධනීය තීරණවලට එළඹියත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එම කරුණු මහජන සංවාදය තුළ පවත්වා ගැනීමට සමත් විය. ඔවුහු එම ව්‍යාපාරය පුවත්පත්වලට ලිපි සැපයීමෙන් සහ දැනුවත්භාවය ඇති කිරීමේ වැඩසටහන් තුළින් පවත්වා ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී කතිකාව ඉතාමත් දුෂ්කර තත්වයන් යටතේ පවා සජීවීව පවත්වා ගැනීමට සමත් වූහ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් වෙනුවෙන් පෙනී සිටි සංවිධාන කිහිපයෙන් එකකි. සටන් විරාම සමයේ සිට ඔවුහු බහුතරයේ ආරක්ෂක වුවමනාවන් තහවුරු කරන අතර භූමි ප්‍රදේශයක ඒකරාශී වූ සුළුතරයේ අයිතිවාසිකම් රැකෙන ආකාරයේ බලය බෙදා හැරීමේ විකල්ප යෝජනා ගොඩනැගූහ. යුද්ධයෙන් පසුව බලය බෙදා හැරීම පිළිබඳව ආණ්ඩුවේ උනන්දුව හීන වූ බවක් දක්නට ලැබුණ ද මෑතක දී අදාළ පාර්ශ්වයන් කළ ප්‍රකාශවලින් ඉදිරියට යෑමේ එකම මාර්ගය බලය බෙදා හදා ගැනීම පදනම් වූ දේශපාලන විසඳුමක් බව දැක්වේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ඊට පෙර *ICES* ආයතනය සකස් කළ පදනම එළඹෙන කිසියම් සාකච්ඡාවක් සඳහා බුද්ධිමය පසුබිම සපයයි.

ආචාර්ය නීලන් තිරුචෙල්වම්ගේ අභාවයෙන් පසුව 2000 ගණන්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සාකච්ඡාවේ සහ සංවාදයේ ප්‍රධාන කේන්ද්‍රය වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යි. විධායක ජනාධිපති ක්‍රමයේ බලතල, මැතිවරණ ක්‍රියාවලියේ ස්වභාවය සහ බලය බෙදා ගැනීමේ වැඩ පිළිවෙළෙහි අන්තර්ගතය පිළිබඳව තියුණු වාද විවාද ඇති විය. මූලික අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ අභියෝග නව තලයකට පත් වූ අතර මෙම කරුණු වටා වූ කතිකාව සහ සංවාදය වඩාත් තියුණු විය. මෙම සංවාදයට ප්‍රධාන පෙළ නීතිවේදීහු සහ නීති විශාරදයෝ එක් වූහ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යුහය වාස්තුවිද්‍යා චිත්‍රයකින් නිර්මාණය කරන පාලමකට යා කිරීමක් වැනි නිර්මාණශීලී නව මංපෙත් සහ මෙම මාතෘකාවේ දැනුවත්භාවය සුපුරුදු වේදිකාවෙන් ඉහළට ඔසවා තැබෙන පරිකල්පනය නව තලයකට නැංවීය.

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පදනම් ගොඩ නැගීමේ ප්‍රමුඛස්ථානය වන පර්යේෂණ සහ ප්‍රතිපත්ති කේන්ද්‍රයක් නිර්මාණය කිරීමේ දැක්මක් තිබිණ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පුහුණු වූ අය දැන් බොහෝ වෘත්තීන්හි යෙදී සිටින අතර ඔවුහු තමන් වැඩ කරන ස්ථානවල ලිබරල් ක්‍රියාවලීන් සහ වඩාත් ප්‍රජාතන්ත්‍රීය වූ ආචාර විධික්‍රම සඳහා බලපෑම් කරති. අද දැඩි තීරණ හරහා සමාජය මෙහෙයවන බලවත් පුද්ගලයන්ගේ ප්‍රබල කතිකාවට මුහුණ දීමට සංවාදශීලී ප්‍රජාතන්ත්‍රවාදී දර්ශනයෙන් ඉදිරිපත් කරන සහයෝගිතා, උපදේශාත්මක පිවිසුම නිසැකයෙන්ම විචක්ෂණශීලී අභියෝගයකි. මධ්‍යම පාන්තිකයන්ගේ පරිකල්පනය ග්‍රහණය කර ගත් විකල්ප, අධිකාරිවාදී සහ ජනප්‍රිය කතිකාව ආචාර්ය සරවනමුත්තුගේ දැක්ම යටපත් කිරීමට අමතරව ඊට අභිමුඛව ප්‍රහාර එල්ල කිරීමට ද ඉදිරිපත් විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දායකත්වය වන්නේ ලිබරල් ගුණාංග සජීවීව පවත්වා ගැනීම, ඒවා යටපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ශ්‍රී ලංකාවේ දේශපාලන අවකාශයේ අනුලංඝනීය සන්නාමයක් බවට පත් කිරීම ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ජාතිවාදයේ පටු ප්‍රාදේශීයත්වයට සහ මූලධර්මවාදයට අභියෝග කරමින් ශ්‍රී ලංකාව නවීන, ආගම්වාදී නොවන විශ්වව්‍යාපී දැක්මක පිහිටු වූයේය. මෙම සම්ප්‍රදායන්ගේ අසීමාන්විතභාවය විනිශ්චය වූයේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙනි. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කෙරෙන සංස්කෘතික භාවිතා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉවසුවේ නැත. ඔවුන්ගේ විශ්වව්‍යාපී ලෝක දැක්ම නිසා ඔවුන්ට ලොව පුරා සිවිල් සමාජ ක්‍රියාකාරකම් සමග පුළුල් සහාගයක් පවත්වා ගැනීමටත් ජාලයන් හා සම්බන්ධ වීමටත් මෙන්ම අපේ කාලයේ ඉතාමත් වැදගත් කරුණු පිළිබඳ සාකච්ඡා සහ සංවාදවලට සහභාගි වීමටත් හැකි විය.

අඳුරුතම කාල සීමාවන්හි පවා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නායකයෝ සහ කාර්ය මණ්ඩලය බුද්ධිමතුන්ගේ සහ ක්‍රියාකාරීන්ගේ පුළුල් ප්‍රජාවට තම කාර්යාල සහ නිවෙස් විවෘත කළහ. ඔවුන්ගේ ආගන්තුග සත්කාරය ජාලයන් සවි ශක්තිමත් කළ අතර ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති අඳුරුතම දිනවල බොහෝ දෙනකුට ශක්තියක් ලබා දුන්නේ ය. මෙම දිරිමත් කිරීමේ සහ ආරක්ෂා කිරීමේ භූමිකාව බොහෝ දෙනකුගේ ඇගයීමට ලක් වූ අතර එම කැලඹිලිකාරී යුගයේ ඉතිහාසය පොත්වල ලියන විට ඒවා වාර්තා වනු ඇත.

---

**රධිකා කුමාරස්වාමි**

නීතිඥවරියකි. ශ්‍රී ලංකා ව්‍යවස්ථා සභාවේ සාමාජිකාවක වූ අතර ළමයින් හා සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරියක වශයෙන් කටයුතු කර ඇත.



# ‘විභාෂා’ පරිවර්තන වැඩසටහන

**එස්. සිවගුරුනාදන්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (*CPA*) මේ වන විට සිය විසිපස් වසරක මෙහෙවර සම්පූර්ණ කර තිබේ. එහි සාර්ථකත්වය පිළිබඳව බෙහෙවින් සතුටට පත් වෙමි. 1996 සිට විවිධ තර්ජන හා අභියෝග හමුවේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය පරමාර්ථයන් ඉටු කරමින් සිටී. ශ්‍රී ලංකාවේ පවතින අභියෝගාත්මක සමාජ - දේශපාලන - ආර්ථික පසුබිමක වසර 25ක් රාජ්‍ය නොවන සංවිධානයක් අඛණ්ඩ කටයුතු කිරීම සුළුපටු කාර්යයක් නොවේ. 1983 සිට 2009 දක්වා ශ්‍රී ලංකාවට සිත් පිත් නැති යුද්ධමය වාතාවරණයකට මුහුණ දීමට සිදු වූ නමුත්, ප්‍රතිපත්ති සම්පාදකයින් අතර සාමය, සංහිඳියාව සහ සාධාරණත්වය අවධාරණය කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නොයෙකුත් වටිනා කාර්යයන් රාශියක් ඉටු කරන ලදි.

දෙමළ ජනතාවට සිදු වූ අසාධාරණයන් ඇතුළුව යුද්ධය ඇති වීමට හේතු බොහොමයක් දක්නට තිබුණි. යුද්ධය පවතින අතර වාරයේ දී සියලු කරුණු පිළිබඳව මැදිහත් විය නොහැකි වුව ද රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ කරුණු, මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, සාමය, සංහිඳියාව, මාධ්‍ය නිදහස, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය, කඳුකරයේ දෙමළ ජනතාව මුහුණ දෙන අසමානකම් සහ දුෂ්කර ජීවන රටාව, භාෂා අයිතිවාසිකම්-භාෂා පරිවර්තනය පිළිබඳව පැවැති දුබලකම් යනාදිය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දැඩි කැපවීමකින් කටයුතු කරන ලදි. වසර 25ක් සම්පූර්ණ කෙරෙන මේ අවස්ථාවේ භාෂා පරිවර්තනය ආශ්‍රිතව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉටු කරන ලද දායකත්වය පිළිබඳව සිහිපත් කිරීම ඉතාමත්ම කාලෝචිත ය. මුල් අවධියේ සිටම සියලු සන්නිවේදන කටයුතු සිංහල - දෙමළ - ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ඉටු කළ යුතු යැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින්

අරමුණු කර ගෙන කටයුතු කරනු ලැබීම අගය කළ යුතු යි.

අප බහුවාර්ගික රටක ජීවත් වූවත් 1956 සිට ශ්‍රී ලංකාවේ සිංහල භාෂාවට පමණක් ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. සිංහල පමණක් රාජ්‍ය භාෂාව ලෙස නීතියෙන් පිළිගන්නා ලදි. 1988න් පසු දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් ලෙස ව්‍යවස්ථාව මගින් පිළිගනු ලැබුව ද රජයන් විසින් ප්‍රායෝගිකව ඊට අදාළ ප්‍රතිකර්ම සද්භාවයකින් නොගන්නා ලදි.

අප රටේ සුදුසුකම් ලැබූ භාෂා සහ භාෂණ පරිවර්තකයින්ගේ හිඟය සමාජයේ සෑම මට්ටමකම පැවතීම බොහෝ සේ දැකිය හැකි විය. එවකට භාෂා පරිවර්තනය සඳහා රජය කිසිම ප්‍රමිතියක් පවත්වා ගෙන නොයන ලදි. භාෂා පරිවර්තන ක්ෂේත්‍රයේ රජය විසින් සීමිත ප්‍රසිද්ධ විභාගයක් පවත්වා දිවුරුම් දුන් භාෂා පරිවර්තකයන් තෝරා ගැනීම සහ උපාධිධාරීන් අතරින් ප්‍රසිද්ධ සීමිත තරග විභාගයක ප්‍රතිඵල මත භාෂා පරිවර්තකයින් බඳවාගැනීම හැරුණු විට, කිසිම නිල සහතිකයක් පරිවර්තන ක්ෂේත්‍රයට නොතිබුණි. මෙවන් තත්ත්වයක් යටතේ එය ශ්‍රී ලංකාවේ බහුභාෂා හා බහුවාර්ගික සංයුතිය තුළ ජීවත්වන සමාජයන් අතර තවදුරටත් දුරස්ථභාවය නිර්මාණය කිරීමට හේතු විය. ජාතීන් අතර ඵලදායී සන්නිවේදනයකට බාධා ඇති කරන ලදි. අප රටේ ජනතාවගේ භාෂා අයිතිවාසිකම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවත් කාර්යක්ෂම වැඩ පිළිවෙළක් ද නොවී ය.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රයේ එකම මාධ්‍ය ආයතනයකට අයිති සිංහල - දෙමළ - ඉංග්‍රීසි ප්‍රකාශන හාත්පසින්ම වෙනස් වූ අදහස් පිළිබිඹු කරන ලදි. එකී පුවත්පත් තමන් අතර කිසිම අදහස් හුවමාරුවක් සිදු නොවන තත්ත්වයක් පැවතුණි. මේ බව පර්යේෂණවලින් තහවුරු වී තිබේ. විශ්වවිද්‍යාලවල පවා ද්විභාෂා ප්‍රවීණත්වය අතීත සිදුවීමක් ලෙස පැවතුණි.

මෙවන් වාතාවරණයක් තුළ 2002 සටන් විරාම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් අනතුරුව, ද්විභාෂා හැකියාව සහිත පුද්ගලයින්ට භාෂා පරිවර්තනය ගැන්වීමට "විභාෂා" යන නමින් වැඩසටහනක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ආරම්භ කරන ලදි. මෙම ව්‍යපෘතිය ආරම්භ කිරීම සඳහා ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු හා ආචාර්ය අර්ජුන පරාක්‍රම යන දෙදෙනා විසින් මූලිකත්වය ගෙන කටයුතු කළහ.

මෑත කාලයේ දී කැලණිය - යාපනය - සබරගමුව යන විශ්වවිද්‍යාලවල සිව් අවුරුදු ගෞරව උපාධි මට්ටමේ, භාෂා පරිවර්තන අධ්‍යයන පාඨමාලා ආරම්භ කරන ලද නමුත්, 2002 දී එවැනි පාඨමාලාවන් දක්නට නොතිබුණි. එම නිසා ප්‍රථම වතාවට සිංහල - දෙමළ, ඉංග්‍රීසි - සිංහල, ඉංග්‍රීසි - දෙමළ යන අංශ තුනෙන්ම, එක් අවුරුදු භාෂා පරිවර්තන අධ්‍යයන පාඨමාලා සිව්වසරක් තිස්සේ, නොමිලේ පැවැත්වීමේ ගෞරවය හිමි වන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට යි.

**විභාෂා දැක්ම**

"විභාෂා යනු ශ්‍රී ලංකාවේ ප්‍රධාන භාෂාත්‍රය අතර අන්තර් පෝෂණය ප්‍රවර්ධනය කිරීම සඳහාත් පරිවර්තනය පිළිබඳ සංස්කෘතියක් හා න්‍යායක් ගොඩනැගීම සඳහාත් බිහි වූ වැඩසටහනකි. පරිවර්තනය පිළිබඳ උනන්දුවක් දක්වන, රටපුරා විසිරී සිටින සියලු දෙනාට ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමේ අවස්ථාවක් ලබා දීමත් එමගින් පිළිගත් සහතික පත්‍රයක් ප්‍රදානය කිරීමත්, පුළුල් හා බහුවිධ වූ ප්‍රජාවකට ප්‍රවේශයක් සපයමින් එම විෂය දැනුම ව්‍යාප්ත කිරීමත් විභාෂා වැඩසටහනේ පරමාර්ථය විය."

මෙම වැඩසටහනේ දී කොළඹ - පේරාදෙණිය - කැලණිය - රුහුණු විශ්වවිද්‍යාලවල මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ නිදහස් ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තකයින් විසින් දායකත්වය සපයන ලද අතර ඔවුන් විසින් පාඨමාලාව හා සම්බන්ධ වී උගැන්වීම සහ පරිවර්තන කටයුතු ඉටු කරන ලදි.

මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ විශේෂත්වය වන්නේ එය සම්පූර්ණයෙන්ම නොමිලේ ප්‍රදානය කිරීමයි. එම නිසා මෙම පාඨමාලාවට වඩාත්ම සුදුසුකම් සපුරා තිබෙන අය තෝරා ගැනීම පිළිබඳව අප විසින් වැඩි අවධානයක් යොමු කරන ලදි. එලෙස ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකයන් ලෙස ජාතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, දිස්ත්‍රික් නියෝජනය, භාෂා පරිවර්තනය පිළිබඳ පළපුරුද්ද, භාෂා හැකියාව, අධ්‍යාපනය

සහ වෘත්තීය සුදුසුකම් අප විසින් සලකන ලදි. අඩු පහසුකම් සහිත දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලද අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ප්‍රධාන ජනකොටස්වල නියෝජනය පවත්වා ගැනීම කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරන ලදි.

එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ක්‍රියාත්මක කරන ලද අතර විභාග පවත්වා සුදුසුකම් ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අදාළ සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී. මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් වැඩි පිරිසක් අද වන විට රජයේ ආයතනවල සහ රාජ්‍ය නොවන සංවිධානවල භාෂා පරිවර්තන - භාෂණ පරිවර්තන කටයුතුවල නිරත වී සිටිති.

ඩිප්ලෝමා අධ්‍යයන පාඨමාලව කොළඹ දී පවත්වන ලද අතර දෙවන භාෂාවන් ලෙස සිංහල සහ දෙමළ ඉගෙන්වීමේ "විභාෂා" ප්‍රාදේශීය මධ්‍යස්ථාන තිස්සමහාරාමය, ගාල්ල, කුරුණෑගල, මහනුවර, අනුරාධපුරය, වව්නියාව ආදී ප්‍රදේශවල පිහිටුවන ලදි. මෙම මධ්‍යස්ථානවල භාෂා පරිවර්තනය - දෙවන භාෂාවට අදාළ කුඩා පුස්තකාල ද ස්ථාපනය කරන ලදි. භාෂා පරිවර්තනය - දෙවන භාෂාව, කලාව හා සාහිත්‍ය ආශ්‍රිත සාකච්ඡාවන් එම මධ්‍යස්ථානවල දී පැවැත්විණි. ඒ සඳහා පැමිණි තරුණ තරුණියන් විසින් සුවිශේෂී දායකත්වයක් සපයන ලදි. එවකට සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වුවත් යාපනය - මන්නාරම - මඩකලපුව යන ප්‍රදේශවල පැවති ගමනාගමනය සීමා කිරීම් - ආරක්ෂක මෙහෙයුම් හේතුවෙන් මෙම ස්ථානවල "විභාෂා" ප්‍රාදේශීය මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට නොහැකි විය.

භාෂා පරිවර්තන සංචිතයක් පුහුණු කිරීමේ අරමුණින් ක්ෂේත්‍ර හයක් සඳහා භාෂා පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලව සංවිධානය කරන ලද අතර එකී පාඨමාලාව පහත ක්ෂේත්‍රයන් වෙනුවෙන් සකසන ලදි.

1. කලාව හා මානව ශාස්ත්‍ර
2. ව්‍යාපාර කළමනාකරණය හා ගිණුම්කරණය
3. පොදු විෂය ක්ෂේත්‍ර (සන්නිවේදන අධ්‍යයන ඇතුළුව)
4. නීතිය හා රාජ්‍ය පරිපාලනය
5. විද්‍යාව හා තාක්ෂණය
6. සමාජ විද්‍යාවන්

ඉහත අංශ මධ්‍යගත විශේෂඥ උපදේශක කමිටු හයක් විසින් නියෝජනය කරන ලදි. මෙම ක්ෂේත්‍ර හය නියෝජනය කරන අධ්‍යාපනඥයන් පනස් දෙදෙනෙක් "විභාෂා" වැඩසටහනට සම්බන්ධ වී කටයුතු කළහ. ඉහත ක්ෂේත්‍ර හයක දක්ෂ භාෂා පරිවර්තනයන් ඇතුළත් කර අත්පොත් හයක් සිංහල - දෙමළ - ඉංග්‍රීසි යන භාෂාවලින් පරිවර්තනය කර ප්‍රකාශයට පත් කෙරිණි. ත්‍රෛමාසිකව "විභාෂා" යන නමින් භාෂා ත්‍රිත්වයෙන් ප්‍රවෘත්ති සඟරාවක් පළ කෙරිණි. මෙය ඩිප්ලෝමා අධ්‍යයන පාඨමාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ දේශකයන්ට හා ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවලට නොමිලේ බෙදා හරින ලද අතර "විභාෂා" ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ද කියවීම සඳහා තබන ලදි.

භාෂා පරිවර්තන පාඨමාලාව සුවිශේෂී ක්ෂේත්‍රයක් ලෙස සාධාරණීකරණය කිරීමේ අරමුණින් භාෂා පරිවර්තන ආචාරධර්ම ප්‍රවර්ධනය කිරීමත් වෘත්තීමය භාෂා පරිවර්තකයින් නිර්මාණය කිරීමත් ඔවුන්ට පිළිගත හැකි සහතික පත්‍රයක් ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවක් ද අවධානයට ලක්විය. එපමණක් නොව ජනතාව අතට පත් වන භාෂා පරිවර්තනවල ප්‍රමිතිය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ද "විභාෂා" ව්‍යාපෘතියේ අරමුණකි. එමෙන්ම රට පුරා භාෂා පරිවර්තන සංකල්පය සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ සංවාදයක් පවත්වා ගෙන යන ලදි. භාෂා පරිවර්තන ආචාරධර්ම නිර්මාණය කිරීමට අත්‍යවශ්‍ය මගපෙන්වීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සැපයිණි. මෙම ව්‍යායාමය ශ්‍රී ලංකාවේ භාෂා පරිවර්තන ඉතිහාසයේ රන් අකුරෙන් ලියැවනු ඇත.

---

**එස්. සිවගුරුනාදන්**

ජ්‍යෙෂ්ඨ භාෂා පරිර්තකයෙකි. සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විභාෂා පුහුණු වැඩසටහන් අංශයේ ප්‍රධාන සම්බන්ධීකාරකයා ද විය.

# විසිපස් වසරක මෙහෙවර ලක්වැසි ජනතාව උදෙසාය



**එස්. ජී. පුංචිහේවා**

ප්‍රසුගිය විසිපස් වසර තිස්සේ ම ඇනුම් බැණුම්, කෝප, ද්වේෂ ආදියට ලක් වූ රාජ්‍ය නොවන සංවිධාන අතර මුලින් ම සිටින්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යි. ඊට මූලික හේතුව එම සංවිධිනය ආණ්ඩුවේ කටයුතු දැඩි ප්‍රශ්න කිරීම්වලට ලක් කිරීම යයි සිතමි. එය මතුපිටට පෙනෙන හේතුව ය. මතුපිටට නොපෙනෙන හේතුව ඊට දර්ශනය සපයන පුරෝගාමියාට දෙමළ නමක් තිබීම ය. ඒ නම පාක්‍යසෝති සරවනමුත්තු ය. රාජ්‍ය ගැති ජනමාධ්‍ය, ආගම්වාදී, ජාතිවාදී කොටස් සහ ඔවුන්ගේ ප්‍රචාරවලින් රැවටුණු පිරිස, එම දෙමළ නමත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යන නමත් ඇසූ දුටු පමණින් ද්වේෂයෙන් ආවේශ වෙති. ආණ්ඩුවල අසාධාරණ නීති රීති, තීන්දුවලට එරෙහිව ක්‍රියා කිරීම නිසා, ආණ්ඩු ඊට විරුද්ධ වීම බලාපොරොත්තු විය හැකි ය. එහෙත් වෙනත් අය විරුද්ධ වන්නේ ආණ්ඩු විරුද්ධ නිසා නොවේ නම් එහි නම් ගම්වලට ය. වැඩ ගැන පක්ෂ හෝ විරුද්ධ වීමට එහි කටයුතු ගැන සොයා බැලීමක් නැත. කොටින් ම එම ආයතනයේ කෙරෙන්නේ සිංහල වැඩි දෙනා, දෙමළ, මුස්ලිම් අය සමග කරන සාමූහික වැඩ කටයුතු ය. ඒ කටයුතු සියල්ල විවෘත ය. සරවනමුත්තු මහතාගේ නම ගැන සමහරුන් විරුද්ධ නමුත්, ඒ නම ඇති පුද්ගලයාගේ විරුද්ධ වීමට දෙයක් ඇත්දැයි සැක සහිත ය. මක්නිසා ද ඔහු සංවිධානයට එන මුදලින් අගනා වාහනයක් ගෙන තම සන්තකයේ තබාගෙන ගමන් බිමන් යන්නේ නැත. සංවිධානයේ වියදමෙන් පෞද්ගලිකව යැපෙන්නේ ද නැත. සංවිධාන අය වැයෙන් අධික වැටුප් ලබන්නෙක් ද නොවේ. එහෙත් රජයේ සමාන්තර වැටුප් ශ්‍රේණිවලට වඩා වැටුප් ලබන සේවක පිරිසක් සිටින බව සැබෑ ය. ඔවුන්ගේ වැඩ පිළිබඳ ප්‍රතිපත්ති සාමූහික වේ. වැඩවල ප්‍රතිඵල ද සාමූහික ය. තනි පුද්ගලයන්ට වුවමනා වැඩවලට

වඩා ප්‍රතිපත්ති මූලික වැඩ ප්‍රධාන වේ. එබඳු සංවිධානයක් ගොඩනැගීම අපේ සමාජ පුරුදු සමග ඉතා දුෂ්කර වූවකි. බොහෝ වැඩසටහන් සාර්ථක ලෙස කරන බව පැහැදිලි ය. එහෙත් එන්.ජී.ඕ.වලට ආවේණික වූ විශාල මුදල් වියදම් කොට සුළු ප්‍රතිඵල සමාජයට ලැබෙන වැඩ ද නැතුවා ම නොවේ.

පසුගිය විසිපස් වසර පුරා ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, රටේ ඇති වන ගැටලු සම්බන්ධව අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලී ඇති බවට සාක්ෂ්‍ය බොහෝ ය. යම් කරුණක් ගැන සමාජ, දේශපාලන, නෛතික තත්ත්වයන් පැහැදිලි කොට නිපදවූ කෘතීන් හා ලිපි ලේඛන අප්‍රමාණ ය. අතිවිශාල මුදල් වියදම් කොට එම පොත් පත් ජනතාව අතර නොමිලේ බෙදා හැර ඇති නිසා ලබාගත් මුදල අපතේ ගොස් නැති බව ප්‍රශංසාත්මක ව කිව යුතු ය.

ඉහතින් කියැවුණේ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දෙස පොදුවේ බලන විට ඇති වූ අදහස් කීපයකි. ඊළඟට නිශ්චිත විෂය ක්ෂේත්‍රයන් සහ වැඩසටහන් ඇසුරෙන් කළ දේ පල දේ දැයි විමසා බලමු.

## ෆෙඩරල් ක්‍රමය

නම ඇසූ පමණින් සර්ප විෂක් තරමට දැනෙන ෆෙඩරල් ක්‍රමය පිළිබඳ අදහස ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් රට පුරාම සංවාද සම්මන්ත්‍රණ ඇති කරන ලදි. එම විසඳුම යෝජනා කළේ යුද්ධයට හා දෙපාර්ශ්වයේ ම ප්‍රචණ්ඩභාවයට විසඳුමක් ලෙස ය.

අද වන විට ලෝකයේ ප්‍රධාන රටවල් විශාල සංඛ්‍යාවක් ෆෙඩරල් ක්‍රමය, සිය පාලන තන්ත්‍රයට ඉතා සාර්ථක ලෙස යොදාගෙන ඇත. එම ක්‍රමය අධ්‍යයනය කොට එහි දියුණු ලක්ෂණ උපුටාගෙන සාර්ථක ලිපි ලේඛන කට්ටලයක් මගින් ජනතාව දැනුම්වත් කිරීමට දැවැන්ත වැඩසටහනක් භාවිත කළේ ය. යම් සංවේදී විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධ තීරණ ගැනීම ඒ ඒ ජාතිකයන්ට පැවරෙන ලෙසත් මූලික රාජ්‍ය බලය ප්‍රධාන පාලනයට පැවරෙන පරිදිත් එම යෝජනා ඉදිරිපත් වී තිබිණ. එවැනි බලතල තිබිය දී බලය උදුරා ගැනීමට සන්නද්ධ අරගලයක යෙදීමටත්, වෙනම රාජ්‍යයක් පිහිටුවීමටත් අවශ්‍යතාවක් ඇති නොවන බව ලෝකයේ රටවල් සීයක පමණ අත්දැකීම ය. එහෙත් ආණ්ඩුවේත්, සන්නද්ධ කණ්ඩායම් දෙක තුනකත් උග්‍ර ප්‍රතිවිරෝධතා නිසා ශාස්ත්‍රීය රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමවේද ප්‍රචණ්ඩභාවයෙන් යටපත් විය. ඊට එකඟතාව දැක් වූ දෙමළ කණ්ඩායම් පවා මර්දනය කළ ප්‍රභාකරන් වෙනම රාජ්‍යයක් සඳහා ම අවි ගැටුම තීව්‍ර කළේ ය. එම අවස්ථාවේ දී රාජ්‍යතාන්ත්‍රික උපක්‍රම මගින් යුද්ධය වළක්වා ගත හැකි වුව ද ප්‍රභාකරන්ගේ ම අන්තවාදී අදහස්වලට සමාන අදහස් තිබූ 'සිංහල බෞද්ධ' සමහරු යුද්ධය ම උත්කර්ෂයට පත් කළහ.

මෙහි දී ආණ්ඩු බලය හැසිරවූ පාර්ශ්වය සිතුවේ නීති පැනවීම මගින් ත්‍රස්තවාදය වැළැක්විය හැකිය කියා ය. ඒ නිසා මහජන ආරක්ෂක පනත යටතේ හදිසි නීතිය පනවා ගති. ඊටත් වඩා උග්‍ර ලෙස ප්‍රචණ්ඩ වීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙන එන ලදි. මුල දී එය දෙමළ කොටි සංවිධානය මර්දනය කිරීමට ගෙන එන ලද බව කියා වසරකට පසු එය සාමාන්‍ය නීති පද්ධතියේ නීතියක් බවට පත් කරන ලදි. ඒ සමග සිදු වූයේ කුමක්ද? ත්‍රස්තවාදය වළක්වනවා වෙනුවට එය සිය ගුණයෙන් උග්‍ර විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට පසුව කොටි සංවිධානයේ සියලු ත්‍රස්තවාදී වැඩ කටයුතු ආරම්භ විය. එය භාවිතයෙන් ම ඔවුහු පුහුණුව ද ලැබූ හ. එම පනතට පසු, කොටි සංවිධානයේ, මුහුදු කොටි, ළමා සොල්දාදුවන්, කාන්තා හමුදාව, මරාගෙන මැරෙන කණ්ඩායම, ගුවන් ප්‍රහාර කණ්ඩායම ආදිය පිහිටැවිණ. ෆෙඩරල් ක්‍රමයක් පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රිකව කරන ගනුදෙනුවක් යටතේ එවැනි තත්ත්වයකට යාමට ඔවුන්ට ඇති ඉඩ කඩ ඉතා සුළු ය. එවැනි තත්ත්වයක් වර්ධනය විය හැක්කේ උග්‍ර ප්‍රතිරෝධයන්ට මුහුණ දීමට ය. ෆෙඩරල් යෝජනාවල ඓතිහාසික නිරවද්‍යතාව, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මේ වන විට ඔප්පු කොට හමාර ය. ඉදිරියේ දී අප එකට සිටීම අවශ්‍ය නම් වෙනස්කම් සහිතව වුවත් එම ෆෙඩරල් මූලධර්ම භාවිත විය යුතු ය. රාජ්‍ය පාලකයන් මෙන් ම අනික් යුධවාදී පිරිස ලජ්ජා විය යුතු කරුණ වන්නේ අද යුද්ධ ජයග්‍රහණය සමග අප ප්‍රශ්නයේ මුලට පැමිණ සිටින බව ය. අනාගත යුද්ධ වැළැක්වීමටත් අවශ්‍ය වන්නේ එම සම්බුද්ධියම ය.

## භාෂා අයිතිවාසිකම

සමාජ ජීවිතයට අත්‍යවශ්‍ය සාධකය වන්නේ භාෂාව ය. එහි දී පුරවැසියෙකු

ලෙස වර්ධනය උදෙසා මාතෘ භාෂා භාවිතයේ අයිතිවාසිකම මූලික ය. තම මව් බස මර්දනය වූ කල්හි පුරවැසියා බාල වර්ගයේ මනුෂ්‍යයෙකු යයි නීතියෙන් ම හංවඩු ගැහෙන්නේ ය. අපේ රට ඉංග්‍රීසි පාලන සමයේ සිංහල දෙමළ පොදු ජනයා දෙවැනි ගණයේ මිනිස්සු වූහ. රාජ්‍ය පාලනය ඉංග්‍රීසියෙනි. රජයේ සියලු කාර්යාල කටයුතු සිදු වුණේ ඉංග්‍රීසි භාෂාවෙනි. උසස් අධ්‍යාපනය ඉංග්‍රීසි නැත්නම් ලැබිය නොහැකි ය. සෞඛ්‍ය සේවා කටයුතු ද එසේ ය. යුක්තිය පසිඳලීම සිංහලෙන් හෝ දෙමළෙන් නොසිදු විය. එවිට සිංහල හෝ දෙමළ සාමාන්‍ය වැසියා ඉබේ ම දෙවැනි ගණයට වැටේ. මේ තත්ත්වය වෙනස් කිරීමට, 1956 ආණ්ඩු පෙරැළියෙන් අවස්ථාවක් ඇති විය. එහෙත් සම්පූර්ණයෙන් භාෂා යුක්තිය ඉටු නොවී ය. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් සම්මත කර ගැනීමත් සමග දෙමළ පුරවැසියා නැවතත් දෙවැනි තත්ත්වයට පත් විය. ඉහත සඳහන් සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රධාන භාෂාව සිංහල විය. රාජ්‍ය පාලනය, කාර්යාල කටයුතු, උසස් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා ආදිය සිංහලෙන් සිදු විය. එවිට දෙමළ පුරවැසියාට රටේ නිදහසේ පූර්ණ වාසිය විඳගැනීම අහිමි වීම සිදු විය. අපේ රටේ දිගුකාලීන යුද්ධයට පදනම වැටුණේ මේ භාෂා අයිතිවාසිකම අහිමි කිරීමෙනි. ඉංග්‍රීසින්ගෙන් නිදහස් වීමට ජාතියක් වශයෙන් හවුල් වූ දෙමළ ජනතාව අනතුරුව සිංහල භාෂා ආධිපත්‍යයට යටත් වීමට සිදුවීමත් සමග ඇති විය හැකි සිතිවිලි කෙබඳු ද යනු සිතාගත නොහැකි වීම මහා ඛේදවාචකයකට මුල පිරී ය.

පසු කලෙක එනම් 1987 ඉන්දු ලංකා ගිවිසුමත් සමග දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගැනිණ. එහෙත් දෙමළ භාෂාවෙන් පාලනය කිරීමට අවශ්‍ය වෙනත් පහසුකම් සැපයීම හැම ආණ්ඩුවක් ම නොතකා හැරියේ ය.

මෙවැනි පසුබිමක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය භාෂා භාවිතය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීය. රට පුරා ඇවිද ඒ පිළිබඳ දත්තයන් සහ නිදසුන් සොයා පළ කළේ ය. ඒ සඳහා අවශ්‍ය ආකල්ප වෙනස් කිරීමට ක්‍රියා කළේ ය. එබඳු දැවැන්ත සොයා බැලීමක් ආණ්ඩුවකට හැර සංවිධානයකට කළ හැකි වීම ම පුදුම සහගත ය. එහි දී යාපනය, මඩකලපුව වැනි දිස්ත්‍රික්කවල සිංහල භාෂාවට දැක්වෙන නොසැලකිල්ල ගැන ද කරුණු හෙළිදරව් විය. ඒ වන විට පරිපාලන ප්‍රදේශ 40ක පමණ ද්විභාෂා (සිංහල-දෙමළ) පාලනයක් ප්‍රකාශයට පත් කර තිබිණ. එහෙත් එම පරිපාලන දිස්ත්‍රික්කවලට ගොස් කළ සමීක්ෂණවල දී හෙළි වූයේ ඊට අවශ්‍ය නිලධාරීන් සහ උපකරණ ආදිය ප්‍රමාණවත් ලෙස සපයා නැති බව ය. රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් සිංහලෙන්-දෙමළෙන් තොරතුරු පළ කිරීමට පටන් ගත්තේ එම සොයා බැලීම්වලින් පසුව ය. (උදා : පාරිභෝගික අධිකාරිය, ඖෂධ නියාමන අධිකාරිය) හැඳුනුම් පත පිළිබඳ ගැටලුව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගිය පසු භාෂා දෙකෙන් තොරතුරු සඳහන් කිරීම පටන් ගැනිණ. කුඩා වතුර බෝතලයේ මිල නිශ්චිත වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මැදිහත් වීමකිනි.

**මැතිවරණ ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණය**

අප රටේ ආණ්ඩු බලය ලබා ගැන්මට ඉදිරිපත් කරන මැතිවරණ ප්‍රකාශනවල සඳහන් වන්නේ මේ රට සුරපුරයක් බවට පත් කරන ආකාරය පිළිබඳ කරුණු ය. එහෙත් බලය ලැබූ පසු ඒ හැම පක්ෂයක් ම ආකාර දෙකකින් ප්‍රචණ්ඩත්වය යෙදූ බව සත්‍යයකි. එකක් නම් එම බලය ලබාගැනීම සඳහා මැතිවරණයට පෙර සහ මැතිවරණය අවස්ථාවේ දී විවිධ බලහත්කාරකම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා යොදා ගැනීමයි. මැතිවරණයෙන් පසු ප්‍රචණ්ඩභාවය නැවතුණේ නැත. එහි ස්වරූපය වෙනස් විය. පොලිසිය, හමුදා, දාමරිකයන්, පාතාලයන් යොදාගෙන ප්‍රචණ්ඩත්වයේ යෙදී ඇති බව ප්‍රකට ය. පොලිසිය, හදිසි නීතිය, ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති යොදාගෙන 'නීත්‍යනුකූල' ප්‍රචණ්ඩත්වයෙහි යෙදිණ.

ලංකාවේ පළමු වරට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය සහ වාර්තා කිරීම ප්‍රචලිත කිරීමට යොමු වුණේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයයි. එසේ ප්‍රචාරය වීමෙන් ඒවා ක්‍රමයෙන් අඩු වුණ බව සත්‍යයකි. එම කාර්යය ඉතා ප්‍රශස්ත මට්ටමකින් පැවැත්වීම නිසා ප්‍රචණ්ඩකාරීන්ට වෙනත් මාර්ග සොයා ගැනීමට සිදු වී ඇත.

### තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම

තොරතුරු යනු ආණ්ඩු කරන හැටි සටහන් කර තැබෙන ලිපි ලේඛන ආදියයි. ආණ්ඩු කරන්නන් පත් කරන්නේ මහජනයා ය. ආණ්ඩු කිරීමට අවශ්‍ය මුදල් බදු මගින් සපයන්නේ ද මහජනයා ය. එහෙයින් ආණ්ඩු කිරීම සම්බන්ධ තොරතුරුවල සැබෑ අයිතිකාරයා මහජනතාව ය. එහෙත් ඉංග්‍රීසි පාලන සමයේ සිට තොරතුරු නොදීම නීතිය බවට පත් වී තිබිණ. කොටින් ම කියතොත් තොරතුරුවල අයිතිය ආණ්ඩු කරන අයත්, නිලධාරීනුත් අත්පත් කරගෙන පැවතිණ. මේ අසාධාරණය ගැන ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන දිගු කාලීන අරගලයක යෙදුණේ ය. එය අවුරුදු 10ක් තරම් දිග් ගැහිණ. කෙසේ වෙතත් එම අරගලවල ප්‍රතිඵලයක් වශයෙන් 2016 තොරතුරු ලබා ගැනීම මහජනතාවට පවරමින් පනතක් සම්මත විය. ඒ සමග තොරතුරු ලබාගැනීම සම්බන්ධ ජනතාව දැනුම්වත් කළේ රාජ්‍ය නොවන සංවිධානයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, සර්වෝදය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් යන සංවිධාන ඒ ගැන පුරෝගාමී මෙහෙවරක් ඉටු කර ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, මහජනතාව මෙන් ම රාජ්‍ය නිලධාරීන් ද දැනුම්වත් කිරීම වසර කීපයක් තිස්සේ ම කරගෙන ගියේ ය. අවශ්‍ය පොත පත මෙන් ම පුහුණුව ද සැපැයිණි. කාර්යාලයක් පිහිටුවා රටපුරා මිනිසුන්ට තොරතුරු සැපයුණු අතර ඒ ගැන ඇගැයීම් ද පසු විපරම් ද කිරීමෙන් පොදු ජනතාවට අප්‍රමාණ ලෙස සහාය විය.

### නෛතික ජයග්‍රහණ කීපයක්

ගැටලු පැන නැගුණු අවස්ථාවන්හි දී ඊට නීතිමය ප්‍රතිකර්ම සෙවීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හැම විට ම ඉදිරිපත් වී ඇත. ඉහතින් සඳහන් කළ පරිදි ජාතික හැඳුනුම්පත සිංහලෙන් සහ දෙමළෙන් නොතිබීම නිසා තමන් යාපනයට ගිය විට සිංහල පමණක් හැඳුනුම්පත නිසා දුෂ්කරතාවලට මුහුණ පෑ ශිෂ්‍යයකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කළ ඉල්ලීම පිළිගැනිණ. ඉන් පසු හැඳුනුම්පත රාජ්‍ය භාෂා දෙකින් ම ලියැවේ.

පසුගිය යුද සමයේ කොළඹ ලොජ් වටලෑමෙන් සිදු වූ අන්තර්ජාතික අපකීර්තිය වැළැකුණේ ඊට එරෙහිව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කළ ඉල්ලීම නිසා ය.

ඖෂධ අධිකාරියෙන් අනුමත විවිධ බෙහෙත්වල විස්තර සඳහන් වූයේ ඉංග්‍රීසියෙන් පමණි. ශ්‍රේෂ්ඨාධිකරණයට දී ඇති පොරොන්දුවක් අනුව ඉදිරි කාලයේ දී අත්‍යවශ්‍ය ඖෂධ විස්තර සිංහල, දෙමළ භාෂාවලින් ද ලැබෙනු ඇත.

මෙවැනි අධිකරණ තීන්දු විශාල ගණනක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලබාගෙන ඇත. ඒ සියල්ල සිංහල, දෙමළ, මුස්ලිම් ආදි සියලු ජාතීන්ගේත්, සියලු ආගමිකයන්ගේත් යහපත පිණිස ය.

---

**එස්.ජී. පුංචිහේවා**

නීතිඥයෙකි, මානව හිමිකම් ක්‍රියාධරයෙකි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම් සභාවේ ආරම්භක කොමසාරිස්වරයෙකි. සාහිත්‍ය ඇතුළු විවිධ විෂයහි කෘති ගණනාවක් ලියා පළ කොට ඇති ප්‍රවීණ ලේඛකයෙකි.

# CPA ගැන මගේ මතකය



**විමල් ප්‍රනාන්දු**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආරම්භයේ සිට අද දක්වාම මට එය සමඟ ඇත්තේ මිත්‍රශීලී සම්බන්ධයකි. එය ආරම්භ වන වකවානුවෙහි මම ද සිවිල් සංවිධාන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටියෙමි. එයට විසිපස් වසරක් සම්පූර්ණ වීම ඉතා සතුටුදායක නිමිත්තක් වන අතර ඒ වෙනුවෙන් යමක් ලියන්නැයි ලැබුණු ආරාධනයද සතුටට කරුණකි. *CPA* ඉතිහාසය හා එය කළ වැඩ ගැන වෙනත් අය විධිමත්ව ලියනු ඇත. එබැවින් එහි ආරම්භක යුගය ගැන මට මේ මොහොතේ මතක් වන අත්දැකීම් කිහිපයක් කීමට මේ අවස්ථාව යොදා ගැනීමට සිතුවෙමි.

ඒ චන්ද්‍රිකා කුමාරතුංගගේ ආණ්ඩුව බලයට පත් වූ මුල් කාල වකවානුව යි. ඒ සමයේ සිවිල් සමාජ සංවිධානවල වැඩි අවධානයක් තිබුණේ මානව හිමිකම් සම්බන්ධයෙනි. 77/78 සිට බලයෙහි සිටි යූඇන්පී ආණ්ඩුව යටතේ සිදු වූ අතුරුදහන්වීම් ගැන නඩු පැවරීම් ආදිය සිදු විය. මා එවකට සම්බන්ධ වී සිටි සංවිධානය, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් රැක ගැනීමේ ව්‍යාපාරය (*MDDR*) යි. මා එහි සංවිධායක ලේකම් ලෙස කටයුතු කළෙමි. නීතිඥ නිමල් පුංචිහේවා එහි නීති අංශය මෙහෙය වූ අතර තවත් නීතිඥයින් ගණනාවක් අප සමඟ කටයුතු කළහ. මට මතක හැටියට අතුරුදන්වීම් සම්බන්ධ නඩු එකසිය ගණනක් *MDDR* මැදිහත්වීම මත පවරා තිබිණි. තවද උතුරේ ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ගැන සාකච්ඡාවක් ඇති වී තිබුණි. යුද විරෝධී ස්ථාවරයක සිට කටයුතු කරන සංවිධාන ගණනාවක් තිබුණු අතර, ඇතැම් අවස්ථාවල ඒවා සාමූහිකවද කටයුතුවල නිරත විය.

*CPA* ආරම්භය සිදු වූයේ එවැනි පසුබිමකය. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨය තුළ ඒ වෙනුවෙන් යම් සාකච්ඡාවක් තිබූ බවත්, පාක්‍යසෝති සරවනමුත්තු, ජයදේව උයන්ගොඩ, රොහාන් එදිරිසිංහ, අර්ජුන පරාක්‍රම වැනි අය එම සාකච්ඡාවල සිටි බවත් මට මතක ය. කොළඹ ඉහළ සමාජයේ පිරිස් මුණගැසෙන තැන් කිහිපයකදී වරින් වර හමුවීම් කිහිපයක් සිදු වූ බවද මතක ය. මේ කණ්ඩායමේ සංවාදයේ විශේෂත්වයක් තිබුණේ ය. සාමාන්‍යයෙන් එතෙක් ක්‍රියාත්මක වූ සංවිධානවල රාමුවට ඔබ්බෙන් යන හා පොදු විද්වත් සාකච්ඡාවලින් ඔබ්බට යන වෙනස් වැඩකට ඔවුන්ගේ සූදානම පෙනෙන්නට තිබිණි.

මේ කතාබස්වලින් පසුව වැඩමුළුවක් සංවිධානය කර තිබුණු අතර, එය වත්තල ප්‍රදේශයේ හෝටලයක පැවැත්විණි. මට කෙසේ ආරාධනා ලැබුණේදැයි මතක නැත. කලින් සඳහන් කළ අය ද, චාල්ස් අබේසේකර, සුනිලා අබේසේකර, ඔස්ටින් ප්‍රනාන්දු ආදී කිහිපදෙනෙක් ද ඊට සහභාගී වූහ. මට මතක හැටියට ආණ්ඩු පෙරළියෙන් පසුව ඔස්ටින් ප්‍රනාන්දු පරිපාලන සංචිතයට මාරු කර, කාර්ය නියමයක් නැතිව සිටියේ ය.

මේ වැඩමුළුව මෙහෙයවූයේ කැනේඩියානු පුහුණුකරුවන් පිරිසකි. ඒ ගැන විශේෂයෙන් මතකයේ රැඳුණේ, ඔවුන් එය ඉතා කාර්යක්ෂමව හා ශූර ලෙස මෙහෙයවූ බැවිනි. සහභාගි වූ අපෙන් ප්‍රශ්න අසමින්, ප්ලිප් චාර්ට්වල පිළිතුරු සටහන් කරමින් එතරම් සාර්ථක ලෙස සාකච්ඡාවක් මෙහෙයවනු මා කලින් දැක තිබුණේ නැත. අපේ මොළ සූරා අදහස් මතු කරගන්නාක් මෙන් දැනුණේය. මට කියන්නට උවමනා වුණේ, *CPA* කටයුතු ආරම්භයේ සිටම ගුණාත්මක හා වෘත්තීයමය වූ බව ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, *(CPA)* ඒ නමින්ම ඇඟවෙන පරිදි පවතින ප්‍රශ්නවලට විකල්ප විසඳුම් යෝජනා කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක විය. එය එතෙක් පැවතුණු සංවිධානවලට වඩා වෙනස් ආකාරයේ සංවිධානයකි. ඊට සම්බන්ධ වූ බොහෝ දෙනෙක් ආචාර්ය උපාධිධාරීන් ය. නීතිය, ප්‍රතිපත්ති සම්පාදනය, දේශපාලනය, සමාජ විද්‍යාව ආදී බොහෝ විෂයයන්ට සම්බන්ධ ප්‍රවීණයන්, දක්ෂ පර්යේෂකයන් මෙන්ම පුහුණුකරුවෝ ද එම එකතුවෙහි වූහ. සමහර අය විදේශවල සේවය කරන අතර මෙහි කටයුතුවලට ද සම්බන්ධ වූවන් ය. අර්ජුන පරාක්‍රම ඉතා දක්ෂ පුහුණුකරුවකු වූ බව මට මතක ය. හොඳ තරුණ උගතුන් පිරිසක් ද මේ අයගේ කටයුතුවලට සම්බන්ධව සිටි අතර, පසුව ඔවුන් තම ක්ෂේත්‍රවල කැපී පෙනෙන පිරිසක් බවට පත් විය.

*CPA* මැතිවරණ නිරීක්ෂණ කටයුතුවලට සම්බන්ධ වීම විශේෂ වැදගත්කමක් දරන කාරණයකි. එකල මැතිවරණ නිරීක්ෂණය ලංකාවට එතරම් හුරු පුරුදු දෙයක් නොවී ය. මැතිවරණ පනතෙන් හෝ රජයෙන් මැතිවරණ නිරීක්ෂණයට පිළිගැනීමක් ලැබී නොතිබිණි. අදටත් පනතෙහි ඒ ගැන සඳහන් වනවා මිස, එය අයිතියක් හැටියට තහවුරු කර නැත. ඒ අනුව, එකල තිබුණු තත්ත්වය සිතාගැනීම අසීරු නොවේ. සුනිලා අබේසේකර නියෝජනය කළ ඉන්ෆෝම් ආයතනයත්, නිදහස් මාධ්‍ය ව්‍යාපාරයත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත් එක්ව 'මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය' (*CMEV*) ආරම්භ කිරීම මැතිවරණ නිරීක්ෂණ ක්ෂේත්‍රයේ වැදගත් ඉදිරි පියවරක් විය. අර්ජුන පරාක්‍රම එහි දී පුරෝගාමී වැඩ කොටසක් ඉටු කළේ ය.

පළමුවරට දකුණේ සිවිල් සංවිධානවල නියෝජිතයන් එක්ව උතුරේ පළාත් පාලන මැතිවරණ නිරීක්ෂණය සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන සම්බන්ධ අත්දැකීම් කිහිපයක් සඳහන් කිරීම වැදගත් වේ යැයි සිතමි.

උතුරේ පළාත් පාලන මැතිවරණ පැවැත්වුණේ යාපනයේ පාලනය හමුදාව විසින් අත්පත් කරගෙන නොබෝ කලකිනි. ඒ වන විට යාපනයේ මුළුමනින්ම හමුදා පාලනය පැවතුණ ද එහි තත්ත්වය සාමාන්‍ය බව පෙන්වීමත්, සිවිල් පරිපාලනය ස්ථාපිත කළ බව පෙන්වීමත් ආණ්ඩුවේ උවමනාව විය. එහෙත් සිවිල් ක්‍රියාකාරිත්වයකට ඉඩක් එහි නොතිබුණි. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ (*TULF*) හැරුණු විට, මැතිවරණයට ඉදිරිපත් වූ සියලු පක්ෂ, *LTTE*යට එරෙහිව රජයේ ආරක්ෂක හමුදාවලට සහාය දෙන සන්නද්ධ කණ්ඩායම් ය. දූපත්වල පාලනය ඩග්ලස් දේවානන්දාගේ *EPDP* සංවිධානය සතු විය. මේ මැතිවරණය කෙබඳු එකක් වනු ඇත්දැයි කල් තියාම පෙනෙන්නට තිබිණි. දකුණේ සිවිල් සමාජය අතර ද,

මේ මැතිවරණය ගැන කතාබහක් ඇති වී තිබිණි.

මැතිවරණ නිරීක්ෂණය පිළිබඳ අදහස දකුණේ සිවිල් සංවිධාන සමඟ කතා කළ විට බොහෝ දෙනෙකුගෙන් ලැබුණේ නිෂේධාත්මක ප්‍රතිචාරයකි. 'යාපනේ ඡන්දයක් පවත්වන්න තත්ත්වයක් නැහැ. ඕක ආණ්ඩුව පුම්බන්න කරන වැඩක්' යන්න ඔවුන්ගේ ප්‍රතිචාරය විය. මගේ අදහස වුණේ, අප කොළඹ සිට මොනවා කිව්වත් වලංගු නොවන බවත්, උතුරේ ජනතාව හමු වී ඔවුන්ගේ අදහස දැනගැනීම වැදගත් වන බවත් ය. සුනිලා අබේසේකර සමඟ මේ ගැන බොහෝ වාද විවාද ඇති වූ බව මට මතක යි. කෙසේ නමුත් පසුව මැතිවරණ නිරීක්ෂණය සඳහා බොහෝ දෙනෙකු එකඟ කර ගත හැකි විය. *MDDR* සම්බන්ධ 20 දෙනෙක් පමණ පිරිසක් ඊට සහභාගී වූහ. තවත් සංවිධාන නියෝජනය කරන අය එක්ව විශාල කණ්ඩායමක් සකස් වූ අතර, උතුර සමඟ සම්බන්ධකම් ඇති පිරිස් සංවිධාන කටයුතු සඳහා සහාය දුන්හ. අපේ මිතුරකු වන එස්. සිවගුරුනාදන්, ඔහුගේ මිතුරන් වූ මහාචාර්ය සිවචන්ද්‍රන් සහ ඔහුගේ බිරිඳ යනාදීන්ගේ උදව් ලැබිණි.

පැෆ්රල් ආයතනයේ අයටත් වෙනම සම්බන්ධකම් තිබිණි. යාපනයේ සිටි ජයකුමාර් පියතුමා වැනි කතෝලික පියතුමන්ලා සහ යාපනය බිෂොප් තුමාගේ සහාය ද ලැබිණි. දැන් කැනඩාවේ ජීවත්වන ආදවන්, උඹව ප්‍රජා මධ්‍යස්ථානයට සම්බන්ධව කටයුතු කළ සෙනෙවිරත්න වැනි අය ද අපේ කණ්ඩායමට ඇතුළත් වූහ.

මට මතක හැටියට එම මැතිවරණය භාරව ක්‍රියා කළේ එවකට සහකාර මැතිවරණ කොමසාරිස්වරයකු වූ මහින්ද දේශප්‍රිය යි. යාපනය දිසාපතිවරයා තේරීම්භාර නිලධාරියා ලෙස කටයුතු කිරීම ප්‍රතික්ෂේප කොට, තනතුරෙන් ඉල්ලා අස් විය. එහෙත් සිවිල් පුද්ගලයකු ලෙස ඔහු ද මැතිවරණ කටයුතුවලට සම්බන්ධ විය. අප යාපනයට යන විට ඒහි තිබුණේ ඉතා දුෂ්කර තත්ත්වයකි. ආණ්ඩුව භාණ්ඩ බොහෝ ගණනකට සීමා පනවා තිබූ නිසා, උග්‍ර බඩු හිඟයක් තිබිණි. පොදු පහසුකම් දුර්වල මට්ටමක තිබිණි. බරපතළ ඉන්ධන හිඟයක් විය. පෙට්‍රල් නොතිබුණ අතර වාහන දිව්වේ භූමිතෙල්වලිනි. අපේ කටයුතුවලට සහාය දුන් ලංකා සභා පියතුමෙක්, ඔහුගේ කොළපැහැති වොක්ස්වැගන් කාර් එකත්, වෑන් රථයකුත් අපට දුන්නේ ය. යුද්ධයෙන් දෙමාපියන් අහිමි වූ දරුවන් රැක බලාගන්නා ආයතනයක් පවත්වාගෙන යන තවත් පූජකවරයකු ගැන මගේ මතකයට එයි. ඒ දරුවන්ගෙන් ඇතැමෙකු මානසික කම්පන *(troma)* තත්වයෙන් පෙළෙන බවත් සෙසු ළමයින් කෙරෙහි ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන බවත්, ඔහු අපට පැවසුවේ ය. පසුව ඔහු විදේශගත විය. යාපනය බිෂොප්වරයා ඉතා බුද්ධිමත් දේශපාලන අවබෝධයකින් යුතු පුද්ගලයෙකි. ඔහු *LTTE*යට සහාය නොදැක්වූ නමුත්, සෙසු බොහෝ පූජකවරුන් *LTTE*යට සහාය දක්වන බවට අදහසක් තිබිණි. ඒ බව අපටද පෙනිණි.

අපේ කණ්ඩායම විවිධ දුෂ්කරතා මැද, කණ්ඩායම් කීපයකට බෙදී, විවිධ ප්‍රදේශවල නිරීක්ෂණ කටයුතුවල නිරත වූ අතර, මා ගියේ කයිට්ස්වල නිරීක්ෂණයටයි. එස්.ජී පුංචිහේවා, නිමල් පුංචිහේවා, සුනිලා ආදී අය යාපනය නගරය නිරීක්ෂණය කළෝය. මැතිවරණය පිළිබඳව ඉතා පැහැදිලි චිත්‍රයක් ලබා ගැනීමට අපට හැකි වූ අතර, නිරීක්ෂණයෙන් පසුව වාර්තාවක් නිකුත් කළෙමු.

යුද්ධයට දේශපාලන විසඳුමක් වෙනුවෙන් ගෙනගිය ව්‍යාපාරවලදී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අප සමඟ බොහෝ අවස්ථාවලදී. එකට වැඩ කළේය.

*'Stop the war'* ව්‍යාපාරය මට මතක ඇති එවැනි වැඩසටහනකි. අපේ සටන්පාඨය වුණේ *'Stop the war now' Don't be the first to start the war''* යන්නයි. (යුද්ධය වහාම නවත්වන්න. නැවත පටන්ගැනීමට මුල් වෙන්න එපා) එයට සිවිල් සංවිධාන පමණක් නොව මහජන පක්ෂය වැනි දේශපාලන පක්ෂද සම්බන්ධ විය. කොළඹ සිට වව්නියාවට ගිය යුද විරෝධී කෝච්චිය විශේෂයෙන් සඳහන් කළ යුතු වැඩසටහනකි.

බදුල්ලේ මානෙල් රත්නායකද ඒ සමයේ යුද විරොධී ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරිකයෙකි. ලොකු රැස්වීම්, පෙළපාලි සංවිධානය කිරීමේ අපූරු හැකියාවක් ඔහුට තිබිණි. මට මතක හැටියට *CPA* සංවිධානයේ කාර්යමණ්ඩල මෙවැනි ක්‍රියාකාරකම්වලට එතරම් සම්බන්ධ නොවුණත් සරා හැම වැඩකටම සම්බන්ධ විය.

අප ආයතන මට්ටමින් එකතු වී කළ කටයුතු ද තිබිණි. වරක් *CPA* මෙහෙයවීමෙන් දිස්ත්‍රික්ක ගණනාවක වැඩසටහන් මාලාවක් පැවැත්වුණු අතර, මට මතක හැටියට ඒවා මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදයට සම්බන්ධ වැඩසටහන් ය. සෙසු ප්‍රදේශවල ඔවුන් එම කටයුත්ත තනිවම කළ නමුත්, යාපනයෙහි පැවැත්වීමට නොහැකි වී තිබිණි. අපි එය සංවිධානය කිරීම භාර ගත්තෙමු. එය ඉතා සාර්ථකව පැවැත්වීමට හැකි වූ අතර, *TNA* මන්ත්‍රීවරු පවා ඊට සහභාගී වූහ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විසිපස් වසර, බොහෝ අභියෝග මැදින් ආ නිර්භීත ගමනකි. භීෂණ කාලයකත් නොසැලී සිටීමට එයට හැකි වූ අතර නඩු කීම් ආදිය මගින් පැවති ආණ්ඩුවලට සිවිල් සංවිධානයක් ලෙස අභියෝග කළ අවස්ථා බොහෝය.

මේ වන විට ලංකාවේ දේශපාලන තත්ත්වය පසුගිය යුගයට වඩා සම්පූර්ණයෙන් වෙනස් එකකි. සමාජය ද බොහෝ සෙයින් වෙනස් වී තිබේ. කොවිඩ් වසංගතය අපට පමණක් නොව මුළු ලෝකයටම අභියෝගයක් වී තිබේ. ලංකාවට මේ මොහොතේ ඇති අනෙක් ප්‍රධානම ප්‍රශ්නය නම් රාජපක්ෂ පවුල්වාදය හා එය ගමන් කරමින් තිබෙන දිසාව යි. මේ වන විට එකම පවුලේ පස් දෙනෙක් කැබිනට් මණ්ඩලය නියෝජනය කරති. ලෝකයේ බහුපාර්ශ්වික, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන කිසිදු රටක, මෙවැනි උදාහරණයක් ඇද්දැයි මම නොදනිමි. මැතිවරණයට ඉදිරිපත් නොවුණු බැසිල් රාජපක්ෂ උන්හිටි ගමන් රටේ මුදල් ඇමති බවට පත් විය.

මේවා බරපතළ කාරණා වන නමුත් ඒ ගැන එතරම් ප්‍රතිචාරයක් සිවිල් සමාජය පැත්තෙන් දක්නට නැත. මා සිතන විදියට මේවා ගැන බැරෑරුම් සාකච්ඡාවක් ගොඩනැගිය යුතු ය. ඒ වගේම ඉදිරියේ අප කරන සියලුම කටයුතුවල දී සිංහල, දෙමළ මුස්ලිම් යන සියලු දෙනාගේ සහභාගීත්වය ඉතා වැදගත් කාරණයක් බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය. අප ක්‍රියාකාරීව සිටි කාලයටත් වඩා දැන් එය අත්‍යවශ්‍ය කාරණයකි. තවදුරටත් ඉදිරි අභියෝගවලට වෙන වෙනම විසඳුම් සෙවීම වලංගු නොවේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට, වත්මන් අර්බුදවලට විකල්ප සෙවීමට හැකි වේවා යි පතමි.

---

**විමල් ප්‍රනාන්දු**

වෘත්තියෙන් ගුරුවරයෙකි. ගුරු සංගම් නායකයෙකි. *MDDR* ආයතනයේ ආරම්භකයකු මෙන් ම සිවිල් සමාජ ක්‍රියාධරයෙකි. ලංකාවේ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන පිහිටුවීමේ පුරෝගාමියෙකි.

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විවිධ අවස්ථා කැමරා ඇසින්



1997 වර්ෂයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක්. සුනිල් බැස්ටියන්, ආචාර්ය ෂෙල්ටන් වනසිංහ, සයිරිනී සිරිවර්ධන,
ආචාර්ය ජයදේව උයන්ගොඩ, බ්‍රැඩ්මන් වීරකෝන් ආචාර්ය පී. සරවනමුත්තු, රොහාන් එදිරිසිංහ



ශෂී මෙන්ඩිස්, කමල් නිශ්ශංක, ලයනල් ගුරුගේ වර්ෂ 1997 අංක 32/3, මල් පාර කාර්යාලයේ දී



දේවි රාමයියා, සුන්දරී ද අල්විස්, සාවිත්‍රී වලතර 1997 වර්ෂයේ මල් පාර කාර්යාලයේ දී



1997 පළාත් පාලන මැතිවරණයෙන් පසු ආචාර්ය අර්ජුන පරාක්‍රම විසින් මෙහෙයවන ලද කාර්ය මණ්ඩල වැඩමුළුවක්
ආචාර්ය අර්ජුන පරාක්‍රම, ශෂී මෙන්ඩිස්, ලයනල් ගුරුගේ, කමල් නිශ්ශංක, උදය ඉදිරිමාන්න, අල්තාෆ් හුසේන්, උදිත, සාවිත්‍රී, දේවි ඇතුළු පිරිස



1997 පළාත් පාලන මැතිවරණයෙන් පසු ආචාර්ය අර්ජුන පරාක්‍රම විසින් මෙහෙයවන ලද කාර්යමණ්ඩල වැඩමුළුවට සහභාගී වූ අල්තාෆ් හුසේන්, සුන්දරී, උදිත, සාවිත්‍රී, දේවී



දේශිනී, මේනකා, දිල්ෂිකා ජයමහ ජීන් ගොඩ්ලීෆ් වර්ෂ 1998 දී අංක 32/3, මල් පාර කාර්යාලයේ දී



පළාත් පාලන මැතිවරණය යාපනය දිස්ත්‍රික්කය - 1998
මැතිවරණයෙන් පසු *CMEV* විසින් කැඳවන ලද මාධ්‍ය සාකච්ඡාව සඳහා සහභාගී වූ සුනන්ද දේශප්‍රිය, වරුණ කරුණාතිලක, ආචාර්ය පී. සරවනමුත්තු සහ ආචාර්ය අර්ජුන පරාක්‍රම



1999 වයඹ ඡන්දයේ දී මැර පිරිසක් විසින් බලහත්කාරයෙන් ඡන්ද පෙට්ටි පුරවන ආකාරය.
මැතිවරණ නිලධාරීහු පසෙකින් බලා සිටිති. CMEV නිරීක්ෂකයකුගේ කැමරා කාචයේ සටහනකි.



වැදි ජනතාවගේ අයිතීන් පිළිබඳ සාකච්ඡාවක් සඳහා 1999 වර්ෂයේ දඹානේ දී. මෙහි සිටින්නේ ආදිවාසී නායක උරුවරිගේ වන්නිලැඇත්තෝ සමග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ එවකට සේවය කළ සමිත හෙට්ටිගේ, ලයනල් ගුරුගේ, සර්දා අල්විස්, ආචාර්ය පී. සරනවනමුත්තු, විජයන්, සිවගුරුනාදන්, නුවන්, සිසිර




1999 වසරේදී අංක 32/3, මල් පාර කාර්යාලයට සාකච්ඡාවකට පැමිණි වන්නිලැඇත්තතෝ සමග ආචාර්ය සරවනමුත්තු



එල්ටීටීඊ සහ ශ්‍රී ලංකා රජය අතර සාම ගිවිසුම සමයේ අන්තර් පාලනය පිළිබඳ පැවති සිවිල් සමාජ අදහස් දැක්වීමේ අවස්ථාවක්
පද්මිණී රාජදුරෙයි, ආචාර්ය පොන්නා විග්නරාජා, ජනාධිපති නීතිඥ ඩෙස්මන්ඩ් ප්‍රනාන්දු, විශාඛා ධර්මදාස,
ශාන්ති සචිත්තානන්දන්, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න ඇතුළු පිරිස



වර්ෂ 2002 දී ඒකාබද්ධ කාර්ය සාධක බලකාය - මාර්ග සිතියම් පළමු රැස්වීමට සහභාගී වූ කේතීෂ් ලෝගනාදන්,
මිලින්ද මොරගොඩ, ආචාර්ය සරවනමුත්තු, රවුෆ් හකීම්, ජී.එල්. පීරිස් හා බර්ගොෆ්හි නෝබට් රූපස්



ශ්‍රී ලංකාවේ මූල්‍ය ෆෙඩරල්වාදය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්මන්ත්‍රණය - 2003.04.07
සුනිල් බැස්ටියන් සහ ආචාර්ය ෂෙල්ටන් වනසිංහ




මානව හිමිකම් සහ සාම ක්‍රියාවලිය පිළිබඳ සිවිල් සමාජ අදහස් විමසීමේ සමීක්ෂණ වාර්තාව පිළිබඳ සාකච්ඡාව
කැනඩාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය නියෝජිත ඉයන් මාටින්, ආචාර්ය පී. සරවනමුත්තු,
මහාචාර්ය ගරු බොබ් රේ - මෙල්බර්න් නීති පීඨය - ශ්‍රී ලංකා පදනම් ආයතනය - 2003.03.11



සාමය සහ සංවර්ධනය - ටොකියෝ සාකච්ඡා සඳහා මාවත - නිමල්කා ප්‍රනාන්දු, කිංස්ලි රොද්‍රිගු - 2003.04.26



අධ්‍යාපනය සහ මාධ්‍ය පිළිබඳ ටුයිටන් වැඩමුළුව - ආචාරධර්ම කළමාණාකරණය - රාධිකා කුමාරස්වාමි මෙනෙවිය- 2003.05.06



මොණරාගල, විපුලානන්ද දෙමළ විද්‍යාලයේ දී පැවති ප්‍රජා නායකයින්ගේ හමුවක් - ආචාර්ය පී. සරවනමුත්තු - 2003.10.11



මොණරාගල, කොටියාගල විද්‍යාලයේ දී පැවති සිවිල් සමාජ රැස්වීමක් - සුනන්ද දේශප්‍රිය - 2003.08.15




ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ පැවති සම්මන්ත්‍රණය - නිකලස් හේසම් - දකුණු අප්‍රිකාවේ මැන්ඩෙලාගේ නීති උපදේශක, ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, මහාචාර්ය සුජිත් චවුද්‍රි, මහාචාර්ය මිකිසන් - 2003.03.26




ශ්‍රී ලංකාවේ මූල්‍ය ෆෙඩරල්වාදය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ සම්මන්ත්‍රණය - 2003.04.07
ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, රොහාන් එදිරිසිංහ, මහාචාර්ය චෙරිල් සෝන්ඩර්ස්, අසංග වැලිකල සහ ජොලි සෝමසුන්දරම්




ෆෙඩරල් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව - බ්‍රවුන්ස් බීච් හෝටලය මීගමුව
එස්. ජී. පුංචිහේවා, එස්. සිවගුරුනාදන් සහ ශිරාල් ලක්තිලක - 2005




ෆෙඩරල්වාදය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව - 2006.02.06



කොළඹ හිල්ටන් හෝටලයේ පැවති අන්තර්වාර පාලනයක් පිළිබඳ රජයේ සහ එල්ටීටීඊ සංවිධානයෙහි යෝජනාවන් පිළිබඳ සාකච්ඡාවට සහභාගී වූ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, ආර් සම්පන්දන්, රොහාන් එදිරිසිංහ, ජී.ජී. පොන්නම්බලම් - 2003.11.07




විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2003.05.19 - ගෞරී පොන්නයියා




විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව සංජන හත්තොටුව - 2003.05.19



විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව - බ්‍රැඩ්මන් වීරකෝන් - 2003.05.19




දැනුම, ආකල්ප හා භාවිතයන් පිළිබඳ සමීක්ෂණයෙහි වාර්තාව ඉදිරිපත් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය
ආචාර්ය ග්වෙන්ඩොලින් බෙව්ස්, ඒඊඩී ආයතනයෙහි හිටපු වැඩසටන් සහකාර, ජෙෆ්රි ලුන්ස්ටෙඩ්, ශ්‍රී ලංකාව හා මාලදිවයින,
ආචාර්ය පී. සරවනමුත්තු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි විධායක අධ්‍යක්ෂ, කිම් ජේ. ඩිරයිඩර්, ආයතන ප්‍රධානී ඒඊඩී ආයතනය ශ්‍රී ලංකාව,
මහාචාර්ය විලියම් මිෂ්ලර්, ඇරිසෝනා විශ්වවිද්‍යාලය, ආචාර්ය පදීප් පීරිස්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සෝෂල් ඉන්ඩිකේටර්හි අංශ ප්‍රධානී



චාල්ස් අබේසේකර



මහාචාර්ය ජයදේව
උයන්ගොඩ



රොහාන් එදිරිසිංහ

## 1996
## පළමු අධ්‍යක්ෂ මණ්ඩලය

25 වසරක අධ

| | |
|---|---|
| චාල්ස් අබේසේකර | සුනන්ද දේශප්‍රිය |
| සුනිල් බැස්ටියන් | ආචාර්ය සුකන්‍යා දේවරාජන් |
| අනූෂා කුමාරස්වාමි | රොහාන් එදිරිසිංහ |
| මොහොමඩ් සමීර් කරීම් | තිස්ස ජයතිලක |
| චන්දන ලාල් ද සිල්වා | සකුන්තලා කදිරගාමර් |
| සාගරිකා දෙල්ගොඩ | කේතීෂ්වරන් ලෝගනාදන් |
| මිනෝලි ද සොයිසා | ෆරාහ් මිහ්ලා |



සුනිල් බැස්ටියන්



සයරිනි සිරිවර්ධන



බ්‍රැඩ්මන් වීරකෝන්



විධායක අධ්‍යක්ෂ 1996
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු



මහාචාර්ය
චන්ද්‍රගුප්ත තේනුවර



අරිත වික්‍රමසිංහ



චන්දන ලාල් ද
සිල්වා



මිනෝලි ද සොයිසා

## ධ්‍යක්ෂ මණ්ඩලය

- ෆායිස් මොහිදීන්
- මහාචාර්ය අර්ජුන පරාක්‍රම
- ආචාර්ය දිනූෂා පණ්ඩිතරත්න
- ගෞරී පොන්නිත්
- ජීන් සැමුවෙල්
- සියරිනී සිරිවර්ධන
- අනූෂා ස්ටැනිස්ලස්
- මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර
- මහාචාර්ය ජයදේව උයන්ගොඩ
- ආචාර්ය ෂෙල්ටන් වනසිංහ
- බ්‍රැඩ්මන් වීරකෝන්
- අරිත්ත ආර්. වික්‍රමනායක
- අරිත වික්‍රමසිංහ
- ජාවෙඩ් යූසුෆ්

# 2021
## වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය



දිනූෂා පණ්ඩිතරත්න



සුකන්‍යා දේවරාජන්



වෛද්‍ය මොහොමඩ්
සමීර් කරීම්



විධායක අධ්‍යක්ෂ 2021
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

# 25 වසරක අභිමානවත් ගමනේ වත්මන් කොටස්කරුවන්

25 වන සංවත්සර දිනය වන විට (2021 ජූනි 7 දිනට අනුව)



ලයනල් ගුරුගේ



දිලුපා අතුලවංශ



හසන්තා හේමාලි



ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු
විධායක අධ්‍යක්ෂක



ධාරණී අරවින්ද්



මංජුල ගජනායක



සුජීන් කුමාර



නාලක ප්‍රියදර්ශන



පී. විජයන්



එස්.එච්.එම්. ෆේරාස්



පී.පී.ජේ. පෙරේරා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී



නිරෝෂා සුභාෂනී



අබ්දුල් වහීඩ් අස්සිරාජ්



චතුරංග සඳරුවන්



අයුධ්‍යා ගජනායක



රෙබෙකා ඩේවිඩ්



දිල්කි මධුෂිකා



ඒ.එම්.එන්. වික්ටර්



මිනෝලි ද සොයිසා


එම්. ක්‍රිෂ්ණා


අයි. රමේෂ්


භවානී ෆොන්සේකා


ශ්‍රියානි විජේසුන්දර


අශෝක හේරත්


එස්. කමලාදේවි


සම්පත් සමරකෝන්


සෙල්වරාජ් රාජසේගර්


සුමේධ කුමාර්


නාලක සමරකෝන්


ශකිනා මොයිනුඩින්


ලූවී ගනේෂ්දාසන්


එම්. ප්‍රදීපන්


ලහිරු කිතලගම


චන්ද්‍රිකා ගාදියවසම්


හර්ෂිණි අමරසිංහ


හිරන්ත ඉසුරංග


නදීකා විට්ටච්චි


උවින් දිසානායක


ඉනෝකා පෙරේරා


නිවේධා ජයසීලන්


කුෂ්මිලා රණසිංහ


චාර්යා සමරකෝන්


ප්‍රනීත් වීරසිංහ


නිරෝෂන් කලුආරච්චි



යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අන්තර් විශ්වවිද්‍යාල විවාදය - ජනමාධ්‍ය වැඩමුළුව
ආචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස, ආචාර්ය ආරියරත්න ඇතුගල, ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන, සුනන්ද දේශප්‍රිය ඇතුළු
ආචාර්යවරුන් සහ සිසුන් පෙනී සිටි සමූහ ඡායාරූපය - 2005.10.30




යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අන්තර් විශ්වවිද්‍යාල විවාදය
සාකච්ඡාවට සහභාගී වූ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, චරිත හේරත් ඇතුළු සරසවි ආචාර්යවරුන් - 2005.10.30



ෆෙඩරල් මතවාදය - ජාතික සම්මන්ත්‍රණය මහාචාර්ය ජයදේව උයන්ගොඩ, ආචාර්ය නේසයියා
බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව - 2006.02.06




යාපනය මහජන පුස්තකාලය - 2006.02.16 - සයිරීනී සිරිවර්ධන




අන්තර් පාසල් සිසු හුවමාරු වැඩසටහන - ලයනල් ගුරුගේ - පස්සර - 2006.09.30



අන්තර් පාසල් සිසු හුවමාරු වැඩසටහන - මංජුල ගජනායක - පස්සර - 2006.09.30




පළාත් සභාවට අවු. 20ක් පිරීම නිමිත්තෙන් සියලුම පළාත් සභාවලින් ඉදිරිපත් කරන ලද සංක්ෂිප්ත යෝජනාවලිය පිළිබඳ වැඩමුළුව
රොහාන් එදිරිසිංහ, දකුණු පළාත් සභා මහ ඇමති ශාන් ලාල් ද සිල්වා, මුස්ලිම් කොංග්‍රස් නායක රවුෆ් හකීම්, ආචාර්ය සරවනමුත්තු, ඇමරිකානු
තානාපතිවරයා, මධ්‍යම පළාත් මහඇමති සරත් ඒකනායක, නීතිඥ එස්. ජී. පුංචිහේවා, එජාප මහලේකම් තිස්ස අත්තනායක (2008)




Power Sharing of CPA Book - කෘතිය එළිදැක්වීමේ උත්සවයේ සහභාගිකයන් අතර
රවුෆ් හකීම්, රනිල් වික්‍රමසිංහ සහ මංගල සමරවීර - '80 Club' හෝටලයේ දී



Power Sharing of CPA Book - කෘතිය එළිදැක්වීමේ උත්සවයේ සහභාගිකයන් අතර තිස්ස ජයතිලක, අනූෂා කුමාරස්වාමි,
බ්‍රැඩ්මන් වීරකෝන්, චන්ද්‍රා ජයරත්න, සුනේත්‍රා බණ්ඩාරනායක, ඌෂා සරවනමුත්තු, කුමුදුනී සරවනමුත්තු '80 Club' හෝටලයේ දී



Power Sharing of CPA Book - කෘතිය එළිදැක්වීමේ උත්සවයේ සහභාගිකයන් අතර
ඔස්ටින් ප්‍රනාන්දු, සංජන හත්තොටුව, විශාඛා ධර්මදාස ඇතුළු පිරිස - '80 Club' හෝටලයේ දී



දකුණු ආසියානු කලාපීය විවෘත අයවැය සමීක්ෂණයෙහි ප්‍රතිඵල ඉදිරිපත් කිරීම - සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය - 2010.11.24
ආචාර්ය ෂෙල්ටන් වනසිංහ, කරු ජයසූරිය



ආරාධිතයන් අතර ඒරාන් වික්‍රමරත්න ශ්‍රියානි විජේසුන්දර



ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු - පුරවැසි සාම සම්මාන උත්සවය - කණ්ඩායම් ඡායාරූපය - 2011.02.28
ශ්‍රී ලංකා පදනම් ආයතනය



ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සමීක්ෂණය - ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වැඩසටහන - 2015
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ සකිනා මොයුනුඩීන්



නුවරඑළිය ඇල්පයින් හෝටලයේ පැවති පළාත් පාලන වැඩමුළුවේ දී ශ්‍රියානි විජේසුන්දර - 2014.05.20



නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ කතිකාවත
මහාචාර්ය උපුල් අබේරත්න ගාල්ලේ පැවති සාකච්ඡාවකට
සහභාගි වෙමින්





බලයෙහි ගමන් මග ප්‍රදර්ශනය - 2015-09-16 - ලයනල් වෙන්ඩ්ට් කලාගාරය - 3 වන මාදිලිය







නුවරඑළිය මොකාවත්ත වතුයායේ මහජනතාව වෙත ලිපිනයන් ලබාදීමේ අවස්ථාවට පෙර
ආචාර්ය පී. සරවනමුත්තු විසින් විවෘත කිරීමේ අවස්ථාවකට සහභාගී වෙමින් - 2016 මාර්තු 05



නුවරඑළිය මොකාවත්ත වතුයායේ මහජනතාව වෙත ලිපිනයන් ලබාදීමේ උත්සවයේ අවස්ථාවක් - 2016 මාර්තු 05




පස්සර ප්‍රදේශයේ ලිපිනයන් ලබා දුන් අවස්ථාවක් - 2016






*Truth to Truth* වැඩසටහන සහභාගී වූ භවානි ෆොන්සේකා, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග, මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර



සියලුම අමාත්‍යාංශවල භාෂා විගණනයක් සඳහා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම,
උදයතිලක එදිරිමාන්න, ආචාර්ය සරවනමුත්තු සහ ලයනල් ගුරුගේ, රංජිත් උයන්ගොඩ, අතිරේක ලේකම් උවයිස්, - 2016



භාෂා විගණනයෙන් පසු ලක්ෂ්මන් කදිරගාමර් මධ්‍යස්ථානයේ පැවති සම්මන්ත්‍රණයට සහභාගී වූ ආචාර්ය පී. සරවනමුත්තු,
නෙදර්ලන්ත තානාපතිතුමිය, එවකට රාජ්‍ය භාෂා අමාත්‍ය මනෝ ගනේෂන්, හිටපු රාජ්‍ය භාෂා අමාත්‍ය වාසුදේව නානායක්කාර,
නීතිඥ එස්. ජී. පුංචිහේවා, ඇතුළු විද්වත් ආරාධිත අමුත්තන් - 2017




ආචාර්ය අසංග වැලිකල - හර්ශාන් කුමාරසිංහම්ගේ 'රෝඩ් ටු ටෙම්පල් ට්‍රීස්' පොත දොරට වැඩීම - ඔරියන්ට් ක්ලබ්



හම්බන්තොට පැවති පළාත් පාලන මන්ත්‍රීවරියන්ගේ දිස්ත්‍රික් සමුළුව - 2017



පර්යේෂණ සහ උද්දේශන කණ්ඩායම ආණ්ඩු කුමන්ත්‍රණය පිළිබඳ නඩුකරය ජයග්‍රහණය කිරීමෙන් මොහොතකට පසුව
වමේ සිට දකුණට: විරාන් කොරයා, පෙරූෂා ක්‍රොසෙට් තම්බයියා, භවානි ෆොන්සේකා,
ජනාධිපති නීතිඥ ආචාර්ය කනග-ඊශ්වරන්, මොහාන් බාලේන්ද්‍ර, එම්. ඒ. සුමන්තිරම්, එර්මිසා ටීගල්, ඉන්ෂිරා ෆාලික්




ගෝලීය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වාර්තාව එළි දැක්වීම, ඉන්ටර්නැෂනල් අයිඩියා ආයතනයෙහි සහයෝගය සහිතව,
ආචාර්ය පී. සරවනමුත්තු, මහාචාර්ය රත්නජීවන් හූල් - 2019 කොළඹ



ජනාධිපතිවරණයේ නිරීක්ෂණය සඳහා ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂකයකයන් ලෙස එක්වූ නිදහස් මැතිවරණ සඳහා වු ආසියානු ජාලය (*ANFREL*), මැතිවරණය අවසන සංවිධානය කළ පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡාවක්
වමේ සිට මහාචාර්ය කපිල් ශ්‍රේෂ්තා-*NEOC*, නේපාලය, සී. දොඩාවත්ත, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, මහින්ද දේශප්‍රිය, හිටපු සභාපති මැතිවරණ කොමිෂන් සභාව, මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාරක-*CMEV*, උදය කළුපතිරණ-*INFORM* ආයතනය,
මහාචාර්ය රත්නජීවන් හූල්-හිටපු සාමාජික, මැතිවරණ කොමිෂන් සභාව, ආචාර්ය පී. සරවනමුත්තු, විධායක අධ්‍යක්ෂ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, රෝහණ හෙට්ටිආරච්චි, විධායක අධ්‍යක්ෂ, පැෆ්රල් සංවිධානය, සී. සවරිමුත්තු, භාණ්ඩාගාරික, පැෆ්රල් සංවිධානය - 2019.11.16




වසර 2020 අගෝස්තු මස පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ ප්‍රචාරක පිරිවැය පිළිබඳව පැවැත්වූ දීප ව්‍යාප්ත නිරීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ මාධ්‍ය සාකච්ඡාව - සීතා රංජනී, උදය කළුපතිරණ, මංජුල ගජනායක, ආචාර්ය පී. සරවනමුත්තු, ඒ. එම්. එන්. වික්ටර්




2021 නොවැම්බර් 15 වැනි දින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ගරු සභාපති මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතා විසින් තේ කහට ඡායාරූප කෘතිය එළි දැක්වූ මොහොත



තේ කහට ඡායාරූප ප්‍රදර්ශනයේ සිසුන් සහ සංවිධායක මණ්ඩලය



*FNF* අනුග්‍රහයෙන් පැවති තොරතුරු දැනගැනීමේ අයිතිය හා මාධ්‍ය භාවිතාව පිළිබඳ සම්මන්ත්‍රණයේ දී ඊට සහභාගී වූ විද්වතුන්
වමේ සිට දිල්රුක්ෂි හඳුන්නෙත්ති, ලක්ෂ්මන් ගුණසේකර, ආචාර්ය පී. සරවනමුත්තු, කාංචන දසනායක, මහාචාර්ය රොහාන් සමරජීව
2021 ජනවාරි 21 කොළඹ රේණුකා හෝටලය




*FNF* අනුග්‍රහයෙන් පැවති තොරතුරු දැනගැනීමේ අයිතිය හා මාධ්‍ය භාවිතාව පිළිබඳ සම්මන්ත්‍රණයේ දී ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී නාලක ගුණවර්ධන



මැතිවරණ ප්‍රතිසංස්කරණ නීති ප්‍රතිශෝධනය සඳහා වූ පාර්ලිමේන්තු කාරක සභාව උදෙසා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය උදෙසා
සකස් කරන ලද යෝජනා මාලාව එම තේරීම් කාරක සභාවේ සභාපති අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ
විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා විසින් බාර දුන් අවස්ථාව - 2021 අගෝස්තු

# විකල්පයක් සොයා යන දිගු ගමනක ආරම්භයක්



**මහින්ද හත්තක**

වසර විසිපහක් යනු මානව ඉතිහාසයේ මද විරාමයක් පමණි. එහෙත් ශ්‍රී ලංකාවේ ගත වූ වසර විසිපහ බොහෝ කරුණු අතින් එහි ඉතිහාසයේ සමාජයීය, ආර්ථික සහ දේශපාලන වශයෙන් තිරණාත්මක කඩඉමකි. රට තුළ වසර තිහක් පැවති සන්නද්ධ ගැටුම්, දේශපාලන චින්තනය මෙන්ම ජන ජීවිතය තුළ ඇති කළ කම්පනය සහ බලපෑම යුද්ධය නිම වී දශකයකට අධික කාලයක් ගත වුවද තවම පහ වී නැත. එවන් යුගයක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වසර විසිපහක් නිම කිරීම අභියෝගාත්මක මෙන්ම නව මංපෙත් හෙළි කරන මාර්ගෝපදේශකයෙකු සේ හැඳින්විය හැකි ය.

ලෝක සම්මතය මෙන්ම නිතිය, සාධාරණත්වය, යුක්තිගරුකත්වය තම පටු දේශපාලන අරමුණු වෙනුවෙන් අලුයම ලූ කෙළ පිඩක් සේ බැහැර කළ යුගයක මනුෂ්‍යත්වය සහ මානව ගරුත්වය වෙනුවෙන් පෙනී සිටීම සහ ශිෂ්ට සමාජයක පැවතිය යුතු මූලික ගුණධර්ම ජන ගත කිරීමට උත්සාහ දැරීම සැබැවින්ම අභියෝගාත්මක මෙන්ම අනතුරුදායක කාර්යයකි. ගත වූ වසර විසිපහක කාලය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉටු කිරීමට කැප වූයේ එවැනි කාර්යයක් යැයි මම සිතමි.

ජාතික ස්වෛරීත්වය සහ ආර්ථික සමෘද්ධිය සඳහා නව ගමන් මගක් ජනතාවට විවෘත කිරීමේ අරමුණෙන් අධිරාජ්‍යවාදී පාලනයෙන් මිදී නිදහස ලබා දශක හතක් ගත වුවද අපට ඒ සියල්ල ක්ෂිතිජයෙන් එහා ඇති අපේක්ෂාසහගත බලාපොරොත්තු පමණි. ශතකයකට ආසන්න කාලයකට පෙර සිටම රටේ ජනතාවට තම කැමැත්ත ඇති පාලකයන් නිදහසේ සම්මත නීති රීති අනුව තෝරා පත් කර ගැනීමට අවස්ථාවක් හිමිව තිබුණ ද ආපසු හැරී බලන

විට නිදහස් ඡන්දයෙන් තෝරා පත් කර ගත් දේශපාලකයෝ ජනතාවගේ සුභසිද්ධිය ගොඩනගා සංයුක්ත සමාජයක් ගොඩනැගීමට කනගාටුදායක සේ අපොහොසත් වූහ. ප්‍රතිපත්තිග රුක දේශපාලනය වෙනුවට අවස්ථාවදී ආත්මාර්ථකාමී ක්‍රියා මාර්ගවලට යොමු වීමෙන් ශ්‍රී ලාංකික ජන සමාජය පෙර කිසි දා නොවූවිරූ සේ භේදභින්නව ඇත. ජනතාවකගේ අනන්‍යතාව සහ ශිෂ්ටත්වය පෙන්නුම් කරන ආගම, ජාතිය සහ භාෂාව ඊට හාත්පසින්ම වෙනස් කෲරත්වය සහ ම්ලේච්ඡත්වය පෙන්නුම් කරන දර්ශක බවට පත් කිරීමට සෑම ජන කොටසකටම අයත් වූ දේශපාලකයන් මග පෙන්වා ඇත. තිස් අවුරුදු යුද්ධය එහි එක් ප්‍රකාශනයක් පමණි.

අප විසින්ම නිර්මාණය කොට පෝෂණය කර ඇති මෙම මෝහයෙන් සහ අන්ධකාරයෙන් මිදීමට මගක් අපට හෙළි පෙහෙළි කර ගැනීමට නොහැකි වීම සැබැවින්ම අභාග්‍යයකි. මහත් බලාපොරොත්තු ඇතිව නිදහස් ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා නායකයන් සහ දේශපාලන කණ්ඩායම් බලය හිමි කර ගත් පසු ඒ සියල්ල අමතක කර දමා ආත්ම අභිවෘද්ධිය සහ පොරොන්දු දී ලබා ගත් බලය තම උරුමයක් බවට පත් කර ගැනීම අපගේ අවාසනාවන්ත අත්දැකීම යි. මේ නිසා අපට අලුතින් තෝරා ගත් ආණ්ඩුවට වඩා ඊට පෙර පැවති තත්ත්වය යහපත් යැයි සුසුම් හෙළීමට සිදු ව ඇත. අහස සිඹින ගොඩනැගිලි සහ අධිවේගී මාර්ග නිර්මාණය කළ ද වඩාත් වේගයෙන් අගාධයකට යමින් සිටිමු. වැටී ඇති අගාධයේ තරම සිහි වන්නේ 'සංවර්ධනයේ නාමයෙන් ලබා ගත් ණය ගෙවා ගත නොහැකිව දකුණු ආසියාවේ දුප්පත්ම රටවලින් එකක් සේ සැලකෙන බංග්ලාදේශයට ද අත පෑමට සිදු වීමෙනි.

ලේ නොසොල්ලා, සැලකිය යුතු ධන සම්පත් ප්‍රමාණයක් සහිතව නිදහස ලබා ගත් අපට එදා පැවති ජීවන තත්වය හෝ පවත්වා ගැනීමට නොහැකි වූයේ ඇයි ද යන්න ගැන ප්‍රධාන ප්‍රවාහයේ දේශපාලනයේ සාකච්ඡාවට ලක් වූයේම නැති තරම් ය. දේශපාලනය තමන්ගේම සෞභාග්‍යය කරා යන ගමනේ වාහකයක් බවට පත් කර ගත් දේශපාලකයන් තම ක්‍රියාමාර්ගවල සහ ප්‍රතිපත්තිවල නොග ළපීම සහ දුර්වලතාව වසා ගැනීමට උත්සාහ ගත්තේ දේශීයත්වය, ජාත්‍යාලය සහ ආගම වැනි කඩතුරාවලිනි. නූතන විද්‍යාත්මක දැනුම සහ ක්‍රමවේද ඔවුන් බැහැර කරන්නේ ජාතිවාදය කරපින්නාගෙන අනෙකුත් ජන කොටස්වල මූලික අයිතිවාසිකම් පවා යටපත් කෙරෙන චින්තනයකින් ය. ඔවුන් එය හේතු යුක්ති කරන්නේ අතීතයේ පැවතියා යැයි කියන ශ්‍රී විභූතියෙනි. මෙහි දී මට ලෝක පූජිත ආර්ථික විද්‍යාඥයෙකු මෙන්ම අග්‍ර ගණයේ දේශපාලන විශ්ලේෂකයෙකු වන අමර්ත්‍යා සෙන් ඔහුගේ *Argumentative Indian* නම් කෘතියේ උපුටා දක්වා ඇති මහා කවි රබීන්ද්‍රනාත් තාගෝර්ගේ කියමනක් සිහි පත් කළ හැකි ය. "අප මිනිසාගේ නිර්මිතයක් තේරුම් ගන්නා සහ වින්දනයක් ලබන හැම විටම එය කුමන ප්‍රදේශයකින් පැමිණිය ද එය අපේම දෙයක් වේ. වෙනත් රටවල කවීන් සහ කලාකරුවන් මගේම අය සේ පිළිගන්නා විට මට මනුෂ්‍යත්වය ගැන උදම් විය හැකිය. මිනිසාගේ විශිෂ්ට නිර්මාණයන් මගේම නිකැලැල් උරුමයක් යැයි දැනීමට ඉඩ හරින්න. එමනිසා බටහිර අධ්‍යාපන ක්‍රමයෙන් මගේ රටට හානියක් සිදු වන්නේ යැයි බටහිර ප්‍රතික්ෂේප කරමින් නැගෙන ඝෝෂාව ඇසෙන විට මා තුළ ඇති වන්නේ ගැඹුරු ශෝකයකි."

අසූවේ දශකයේ සිට මේ රටේ උත්සන්න වූ ප්‍රතිවිරෝධයන් තේරුම් ගැනීමට සහ විසඳුම් සෙවීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලෝකයේ, විශේෂයෙන් බටහිර රටවල සමාජ සම්මතයෙන් නිර්මාණය කරන ලද ප්‍රමිතීන් අදාළ කර ගැනීමට උත්සාහ කළ විට නැගුණේ තාගෝර් ඉන්දියානු සන්දර්භයේ දී විස්තර කළ තත්වයට සමාන විරෝධයකි. මිනිස් ජීවිත පමණක් නොව මනුෂ්‍යත්වයද විනාශයට ලක් කෙරෙමින් උතුරු නැගෙනහිර දිග්ගැසෙන යුද්ධයට සමානත්වය සහ සහෝදරත්වය පදනම් දේශපාලන විසඳුමක් යෝජනා කෙරෙන මතවාදයක් සහ වැඩ පිළිවෙළක් ප්‍රවර්ධනය කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයක් වූ 'සාම විමර්ශී' ඉදිරිපත් වූ විට ද නැගුණේ බටහිර අනු දක්නා විසඳුම් ඉදිරිපත් කිරීමේ දේශ ද්‍රෝහී උත්සාහයක් සේය. එම මතවාදය මෙන්ම එය නිර්මාණය කළ පුද්ගලයන්ට ද දේශ ද්‍රෝහී චෝදනාව එල්ල විය.

වාර්ගික, ආගමික සහ භාෂාමය විවිධතා පවතින බටහිර රටවල් ෆෙඩරල්

ආණ්ඩු ක්‍රමයක් මගින් එම ගැටලු විසඳා ගෙන සාමයත් සමෘද්ධියත් ළඟා කර ගත් අයුරු ශ්‍රී ලාංකික ජනතාවට හඳුන්වා දීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගත් ප්‍රයත්නය සැබවින්ම අගය කළ යුතු ය. රාජ්‍යය ගොඩනැගීමේ අභියෝගය නමින් ඇමරිකා එක්සත් ජනපදයේ පෙඩරල් රජයක් බිහි කිරීමට පාදක වූ ලිපි එකතුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශයක් ලෙස සිංහලෙන් පළ කිරීම මෙරට ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානයට ලක් වූයේ නම් ජිනීවා හි පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ රැස්වීම් ගැන බිය වීමට හේතුවක් නැත.

ජාතිකවාදී උන්මාදයෙන් පෙළෙන අන්තවාදීන් සැනසීමට පිළිගත් සම්මතයන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් නොසලකා නීති සම්පාදනය කරන විට ඊට එරෙහිව අධිකරණයේ දීත් වෙනත් වේදිකාවලත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැගූ හඬ දේශපාලන අඳුරු ගමන් මාර්ගයේ අනතුරු පෙන්වා දීමට දැල් වූ පහනක් සේය. සමහර උත්සාහයන්ට අධිකරණයේ මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවේ අනුමැතිය සහ ආශීර්වාදය ලැබුණ නමුත් පාලකයන් ඒවා සැලකිල්ලට නොගත් අවස්ථා බොහොමයකි. වැදගත් වන්නේ ජනප්‍රිය රැල්ල කුමක් වුවත් යුක්තිය සහ සාධාරණත්වය වෙනුවෙන් නැගී සිටීම ය. පාලකයන් සහ ඔවුන්ගේ සහචරයන් කවර ආකාරයේ තර්ජන සහ බිය වැද්දීම් එල්ල කළත් වැරැද්දට අභියෝග කිරීමටත් නිවැරදි සාධාරණ ගමන් මග පෙන්වා දීමටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කිසි විට පසුබට වූයේ නැත. එවැනි අභීත පියවර ගැනීමේ දී පුද්ගලිකව අත් විය හැකි අතුරු ආන්තරා තැකුවේ නැත.

පසුගිය වසර විසි පහක කාලය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කළ කී හැම දෙයක්ම අපේක්ෂා කළ අරමුණට ළඟා වීමට ප්‍රමාණවත් වූයේ නැත. එහෙත් ඒ සියල්ල සාධාරණ සමාජයක් නිර්මාණය කිරීමටත් නීතිය සහ සාමය පවත්වා ගැනීමට නිවැරදි දේශපාලන ව්‍යුහයන් සකස් කර ගැනීමටත් ගනු ලබන පියවරක නොසැලෙන කුලුනු සේ සැලකිය හැකි ය. පටු අවස්ථාවාදී දේශපාලන අරමුණුවලින් යුත් අයට හානිකර සේ පෙනුණ ද මනුෂ්‍යත්වයට ගරු කරන සාධාරණ සමාජයක් අපේක්ෂා කරන ඒ වෙනුවෙන් කැප වී සිටින අයට එම උත්සාහය ශක්තිමත් මතවාදී සහ ප්‍රායෝගික පදනමකි.

දේශපාලන වශයෙන් නිවැරදි සාධාරණ සමාජයක් බිහි කිරීම සඳහා මතවාදී පදනමක් සකස් කිරීමට ගත් උත්සාහය හැම විටම ආශ්වාදයක් ගෙන දෙන කාර්යයක් වූයේ නැත. අන්තවාදීන්ගේ ගැරහුමටත් පාලකයන්ගේ මර්දනයටත් හැම විටම ගොදුරු විය. එමනිසාම පාලකයන්ගේ උදහස නිසා සමහරුන්ට රට අතහැර යෑමටත් තවත් සමහරුන්ට අනපේක්ෂිත සේ ජීවිතයෙන් සමු ගැනීමටත් සිදු විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එම අභියෝගයන්ට නොසැලී මුහුණ දුන්නේ ය. නිවැරදි සාධාරණ සමාජයක් ගොඩනැගීමේ ගමන් මාර්ගයක් සහ මතවාදයක් පෙන්වා දීමට ගත් උත්සාහය මෙන්ම ඒ වෙනුවෙන් දැක් වූ අධිෂ්ඨාන ශක්තියත් අගය කළ යුතු ය. කෙසේ වුවත් ලියෝ ටෝල්ස්ටෝයි දැක් වූ ආකාරයට අසාධාරණය රජයන සමාජයක යුක්තිය සත්‍යය ගරු කරන මිනිසුන් සිටිය යුත්තේ සිර ගෙදර ය යන්න ඔවුන්ට ආදර්ශයක් වන්නට ඇත.

---

**මහින්ද හත්තක**

ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තකයෙකි, සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකි. ජනමාධ්‍යවේදියකු මෙන්ම ග්‍රන්ථ කතෘවරයෙකි. ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් රැකගැනීමේ ව්‍යාපාරයේ ලේකම්වරයා ය.



# නීතිමය පා සටහනක්

නීතිඥ
**විරාන් කොරෙයා**

පසුගිය දශක දෙකක් වැනි කාලයක් තුළ මම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මුලපුරන ලද හෝ මැදිහත් වූ ඉමහත් ජාතික, මහජන සහ පද්ධතිගත වැදගත්කමකින් යුත් නඩු කටයුතු බොහොමයක් වෙනුවෙන් පෙනී සිටියෙමි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග මෙම වෘත්තීය සම්බන්ධතාව ආරම්භ වූයේ නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥයෙකු වශයෙන් ආරම්භ වූ මගේ වෘත්තීය සේවාව ඉන් අවසන් කොට නැවතත් පුද්ගලික නීතිඥ සේවයට පිවිසි මුල් දිනවලම ය. නීතිපති දෙපාර්තමේන්තුවේ වසර කිහිපයක් මම රජයේ නීතිඥයෙකු වශයෙන් සේවය කෙළෙමි.

ආරම්භයේ සිටම මා සිත් ගත් කරුණක් වූයේ යුක්තිසහගත, ප්‍රජාතන්ත්‍රීය සහ ලිබරල් සමාජයක අවශ්‍යතා තක්සේරුවක් පදනම්ව ජාතික, මහජන සහ පද්ධතිගත වැදගත්කමකින් යුත් ගැටලුවලට මුහුණ දීමේ දී සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට පැවති පුළුල් හිඩැස පිරවීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පසුබට නොවන්නේ ය යන්න යි. එහි ප්‍රතිඵලයක් වශයෙන් විධායක පියවර සහ මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය, අධිකරණයේ ස්වාධීනත්වය සහ නිසියාකාරව ලිබරල්, ප්‍රජාතන්ත්‍රවාදී සහ සියල්ලන් ඇතුළත් වන දැක්මකින් නිසි පරිදි රාමුගත කළ යුතු සුරක්ෂිත ආණ්ඩුක්‍රමය පිළිබඳ ව්‍යවස්ථා, ශ්‍රේෂ්ඨාධිකරණයේ නිසි අවධානයට යොමු කොට අවශ්‍ය ආකාරයට නීතිමය පරීක්ෂාවට ලක් කළ හැකි වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කැපවීම නිසා ය.

පහතින් දැක්වෙන්නේ පසුගිය වසර ගණනාව තුළ මා නීතිඥයෙකු වශයෙන් පෙනී සිටි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගොනු කළ/මැදිහත් වූ කැපී පෙනෙන නඩු ය.

1. *SCFR 217/2007* දෙමළ පුද්ගලයන් කොළඹ පිහිටි පුද්ගලික ‘ලොජ්’වලින් නෙරපා හැරීම සහ දෙමළ පුද්ගලයන් කොළඹ මොනම කොටසකට හෝ ඇතුළුවීම, වාසය කිරීම වැළැක්වීම අභියෝගයට ලක් කළ නඩුව.

2. *SCFR 453/2011* අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වැනි වගන්තිය යටතේ හඳුන්වාදෙනු ලැබූ නව රෙගුලාසීන් අභියෝගයට ලක් කළ නඩුව.
3. *SCSD 6/2012* සහ *SCSD 15/2012* දිවිනැගුම කෙටුම්පත් පනතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කිරීම.
4. *CA Writ 283/2014* බොරැල්ලේ වනාතමුල්ලේ '34 වත්තේ' වැසියන් කණ්ඩායමක් විසින්, තමන් වාසය කරන නිවාසවලින් ඉවත් වී නාගරික සංවර්ධන අධිකාරිය විසින් සපයන ලද විකල්ප ස්ථානයක පදිංචි වන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය කළ නියෝගය අභියෝගයට ලක් කරමින් ගොනු කරන ලද නඩුව.
5. *SCSD 24/2017* පළාත් සභා සඳහා වූ මැතිවරණයන් කල් දැමීමට හේතු වන, 20 වන සංශෝධනය නමින් නම් කරන ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අභියෝගයට ලක් කරනු ලැබූ නඩුව.
6. *SCFR 353/2018* අටවැනි පාර්ලිමේන්තුවෙ නිල කාලය අවසන් වීමට පෙර එය විසුරුවා හැරීමට කළ උත්සාහය අභියෝගයට ලක් කළ නඩුව.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නඩු කටයුතු තීරණය කිරීමේ දී ගත වු කාලය තුළ මා සමග වැඩ කළ පුද්ගලයන් (විශේෂයෙන්ම ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, රොහාන් එදිරිසිංහ, ආචාර්ය අසංග වැලිකල, භවානි ෆොන්සේකා සහ ලුවී ගනේෂන් ඇතුළත්ව) තුළ මා නිරීක්ෂණය කළ දුලබ ගුණාංගයක් වන්නේ අධිකරණය ඉදිරියේ විෂය කරුණක් ඉදිරිපත් කිරීමට සුදුසු යැයි තීරණය කිරීමේ දී එම කරුණ හෝ කරුණු කවරෙකු විසින් හෝ පිළිගන්නේ කෙසේ ද යන්න වැනි වෙනත් කරුණුවලට වඩා එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ නෛතික මූලධර්ම මත ශක්තිමත්ව පවතින්නේ ද යන්න වැදගත් කොට සැලකීම යි. විශේෂයෙන් මෙම අධිෂ්ඨානය එවකට බලයේ සිටින්නේ කවරෙකු ද යන්න නොසලකා, නොසෙල්වී නොවෙනස්ව පැවතීම ය. ඒ අනුව පසුගිය දශක දෙකක කාලය ඇතුළත බලයේ සිටි සෑම ආණ්ඩුවකටම එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය හා නීතියේ ආධිපත්‍යය පිළිබඳ සුවිශේෂී වැදගත්කමකින් යුත් කරුණු පිළිබඳව නොයෙකුත් නඩු ක්‍රියාමාර්ගයන්ට යොමු වීමේ දී නීතිඥයෙකු වශයෙන් මම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනුවෙන් පෙනී සිටියෙමි. මෙම සියලු ප්‍රස්තුතයන්හි දී කිසියම් දේශපාලන පක්ෂයක හෝ කණ්ඩායමක දේශපාලන අවශ්‍යතාව හෝ පෞද්ගලික ආරක්ෂාව මත ඇති ගැටුම, යුක්තිසහගත, ලිබරල් ප්‍රජාතන්ත්‍රීය සමාජයක අවශ්‍යතා පාගා දැමීමේ පෙළඹවීමක් කිසි විටෙකත් නොවූ බව පැවසීමට අපොහොසත් වුවහොත් එම ගුණය ඇගයීමට මා අපොහොසත් වීමක් විය හැකි ය.

රටවැසියන්ගේ දැනුවත්භාවයේ මඳකම හා සෝදිසිමත්භාවයේ අඩුකම නිසා රටවැසියන්ගේ සිත් තුළ සමහර විට වපුරන ලද වැරදි හැඟීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රබල දුෂ්ට බලවේග සහ ඔවුන්ගේ ව්‍යුහයන් එල්ල කරන අපහාසාත්මක ප්‍රහාරයන්ට අනවශ්‍ය අවධානයක් යොමු නොකර (දේශද්‍රෝහීන් යැයි අසාධාරණ ලෙස හෙළා දකිනු ලැබුවත්) නීතියේ ආධිපත්‍යය සහ යුක්තිය වෙනුවෙන් නොසැලී පෙනී සිටීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ඇති කැපවීමට මම ගරු කරමි. මේ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමට සහ නගා සිටුවීමට නඩු පැවරීමේ ක්ෂේත්‍රයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉටු කළ වැඩ කොටස ශ්‍රී ලංකාවේ ජනතාවගේ ශුභසිද්ධිය සඳහා ගත් අත්‍යවශ්‍ය, එඩිතර, ප්‍රතිපත්ති පදනම් සහ සැබැවින්ම දේශප්‍රේමී දායකත්වයක් යැයි මම සිතමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසි වසරක ගමන්මගේ සුවිශේෂී කඩඉමක් පසු කරන මෙම අවස්ථාවේ දී මම ආචාර්ය සරවනමුත්තුට සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කණ්ඩායමට ශ්‍රී ලංකාවේ ජනතාවට නොකඩවා සේවය කිරීමේ අධිෂ්ඨානයෙන් යුත් ඵලදායී අනාගතයක් උදාවේවා යැයි මම පතමි.

---

**විරාන් කොරෙයා**

ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පෙනී සිටින ප්‍රමුඛ නීතිඥවරයෙකි.

# අධිකාරී බලයේ වියගහ සහ පැරණි මානසික පරමාධිකාරය බිඳ දැමීම



මහාචාර්ය
**ජයන්ත සෙනෙවිරත්න**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට වසර 25ක් පිරීම නිමිතිකොටගෙන මෙම කෙටි සටහන ලියන්නට ලැබීම ගැන පළමුව මම සතුටට පත් වෙමි. ගෙවුණු වසර 25 තුළ ඔබ විසින් ගනු ලැබූ නිර්භීත ක්‍රියාමාර්ගවලින් උද්දාමයට පත් වූ කෙනෙකු හැටියටත්, සාමය ගොඩනැගීම පිළිබඳ විෂයයේ දී ශාස්ත්‍රීය ලෝකය වෙත ලබාදුන් දායාද පිළිබඳවත්, ඇතැම් අවස්ථාවල සම්පත්දායකයකු ලෙස කටයුතු කළ අයකු ලෙසත් සිවිල් සමාජයේ දියුණුව, මානව අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය මෙන් ම සාමය වෙනුවෙන් ඉතා අවංකව කටයුතු කළ සංවිධානයකට මෙසේ සුභ පතන්නට ලැබීමත් සතුටකි.

ජෝන් පෝල් ලෙඩරාක් *(John Paul Lederach)* ගේ සාමය ගොඩනැගීම පිළිබඳ පිරමීඩයේ ඉහළ ම තලයේ *(Track I)* කටයුතු කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, රාජ්‍යයට, රාජ්‍යයේ ජනවාර්ගික ප්‍රතිපත්තිය හඳුන්වා දීමට අති විශාල වැඩ කොටසක් ඉටු කළ සංවිධානයකි. ඒ වෙනුවෙන් ඔබ සංවිධානය විසින් සිදු කරනු ලැබූ පර්යේෂණ සිවිල් සමාජයටත් බෙහෙවින් ප්‍රයෝජනවත් වූ බව අමුතුවෙන් කිව යුතු නොවේ. එසේ ම ඔබගේ සියලු ප්‍රකාශන තෙභාෂාවෙන් එළි දැක්වීමට ගත් උත්සාහය අප අගය කරන්නේ ඊට කෘතවේදිත්වය ද සනිටුහන් කරමිනි.

අද අප ජීවත්වන්නේ රාජ්‍යය ඉතා ශීඝ්‍රයෙන් දේශපාලන හා ආගමික අධිකාරීවාදයක් කරා ගමන් කරමින් සිටින යුගයක ය. මේ ගමනේ සමාරම්භය සිදු වන්නේ මෑතක සිට නොවේ. 1970 දශකයේ ආරම්භයේ සිට ය. එදා මෙදා තුර මේ අධිකාරිවාදී පාලනයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ, එල්ටීටීඊ සංවිධානය සහ අන්තවාදී ජිහාඩ් මුස්ලිම් සංවිධානවල සන්නද්ධ ක්‍රියාමාර්ගවලින් පෙන්නුම් කරන්නේ ද මෙම අධිකාරීවාදී ගමනට එරෙහිව තවත් අධිකාරීවාදී දෘෂ්ටියකින් ප්‍රචණ්ඩ ලෙසට ප්‍රතිචාර දැක්වීමට ගත් උත්සාහය යි. නමුත් අවසානයේ සිදු වූයේ රාජ්‍යයේ දේශපාලන හා ආගමික අධිකාරවාදය තව තවත් තහවුරු වීම මිස අන් දෙයක් නොවේ. අද වන විට එදා බ්‍රිතාන්‍ය දේශපාලනඥයකු වූ ඇක්ටන් සාමිවරයාගේ ප්‍රසිද්ධ කියමනක් ව තිබූ “බලය දූෂණය ඇති කරයි.

පරම බලය පරම දූෂණය ඇති කරයි" යන්නත් ඉතා නිර්ලජ්ජිත ලෙස  දක්නට තිබේ.

රාජ්‍යයේ මෙම ගමන් මාර්ගය හීලෑ කිරීමට උත්සාහ කළ යම් සිවිල් සංවිධානයක් වේද එහි ප්‍රමුඛ ස්ථානයේ සිටින්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බවට විවාදයක් ඇත්තේ නැත. දේශීයවත්, ජාත්‍යන්තරවත් ගනු ලැබූ එම උත්සාහයන් නිසා එහි නායකත්වය වෙත එල්ල වූ මරණීය තර්ජන හමුවේ පවා නොසැලී සිටීමට තරම් හැකියාව තිබීම මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය අගයන සියලු ජන කොටස්වලට ඉමහත් ආශ්වාදයක් ගෙන දෙන්නක් විය. මේ නිසා ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් පිළිබඳව පුළුල් අවබෝධයක් ලැබීමට අවස්ථාවක් සැලසුණා සේ ම සිවිල් සමාජ ක්‍රියාකාරීන් හා සාමය ගොඩනගන්නන් වන අප සියල්ලන්ට ම ලැබුණු ධෛර්යය මෙපමණකැයි කිව නොහැකි ය. එසේ ම පසුගිය වසර 25ක කාලය තුළ මර්දනකාරී ආණ්ඩුවලට තම මර්දන ක්‍රියාමාර්ග සහ අණ පනත් පිළිබඳව දෙවරක් සිතන්නටත්, විපක්ෂයට ඒවා හොඳ අවස්ථාවක් කරගන්නටත්, යහපාලනයට අවශ්‍ය වූවා නම් නිර්භීත පියවර තැබීමටත් ඉඩකඩ විවෘත විය. නමුත් එය එසේ සිදු නොවිණි. විපක්ෂය ද, ජාතිවාදී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී මඩ ගොහොරුවකට වැටී අහසේ තරු ගණන් කිරීම පමණක් සිදු කළ නිසා රාජ්‍යය මෙම අවාසනාවන්ත තත්ත්වයෙන් ගොඩ ගැනීමට අපොහොසත් වූයේ ය.

යුද්ධයේ නිමාවත් සමග ලාංකේය සිංහල බෞද්ධ අති බහුතරය රාජ්‍ය බලය පිළිබඳව දක්වන අසීමිත කෑදරකමට හේතුවක් වූයේ ජාතික රාජ්‍යය ඔවුන් වෙත නතු කර ගැනීමේ අරමුණයි. මෙහි දී තම ශාස්තෘන්ගේ ඉගැන්වීමට පටහැනිව යමින් ඔවුහු ලෝභ, ද්වේෂ, මෝහ ඉස්මුදුනින් පිළිගත්තෝ ය. ඒ නිසා ම නන්නත්තාර වූ විපක්ෂයක් සිටින අතර ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් හා සාමය සම්බන්ධයෙන් කුමන ආස්ථානයක් ගත යුතු ද යන කාරණාවල දී ඔවුන් ද අන්දමන්ද ව සිටින බවක් පෙනේ. මෙම හිඩැස සම්පූර්ණ කර ගත හැකි වන්නේ පාර්ලිමේන්තුවෙන් පිටත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි සිවිල් සංවිධානවල ශක්තියෙන් බව අමුතුවෙන් කිව යුතු නොවේ. විපක්ෂයේ මෙම නිෂ්ක්‍රීය වීම අධිකාරවාදී පාලනයට නිදැල්ලේ තම හිතුවක්කාරකම් කිරීමට ඉඩ සැලසීමකි. අපගේ ජනමාධ්‍යය ගත්ත ද රාජ්‍යයේ දෘෂ්ටිවාදය සමග සමගාමී වන බැවින් එය කෙසේවත් නිදහස් ජනමාධ්‍යයක් වන්නේ නැත.

ආගම ද එසේ ම ය. අද අප මේ ගෙවන්නේ ධර්මය සහ ඇදහීම මුළුමණින් ම පටලවාගත් මොහොතක ය. මේ පටලැවිල්ලට රාජ්‍යයේ ආශිර්වාදය ලැබී ඇත්තේය. ඇදහීම යනු විවිධ අභිචාර, සමාචාර, ධූරාවලි, ජනශ්‍රැති, මිථ්‍යා විශ්වාස හා විවිධ බෙදීම්වලින් සමන්විත මිනිසුන්ගේ සැබෑ ජීවිතයේ ප්‍රකාශයට පත් කරනු ලබන්නකි. අප මොන තරම් අන්තර් ආගමික වැඩසටහන් සිදු කළත් මේවා ඔළුගෙඩිවල පවතිනතාක් කල් ධර්මය තේරුම් ගැනීමට බාධාවක් වන්නේ ය. මිනිසුන් තමන්ගේ පරලොව ජීවිතය කෙරෙහි දක්වන බිය මෙවැනි ඇදහිලිවලට හේතුවක් විය හැකි ය. අල්කුරානයේ 'පරලොව ජීවිතය විකුණමින් ලෞකික ජීවිතය මිලට ගන්නවුන් පිළිබඳව' සටහනක් ඇත. (2 සුරා අල් බකරා 86) මේ සටහන අද සෑම ආගමකට ම පොදු වූවකි. ශිෂ්ටාචාරය අලුත් වන්නේ මෙම අධිකාරී බලයේ වියගහ බිඳ දැමීමෙන් සහ පැරණි මානසික පරමාධිකාරය බිඳ දැමීමෙන් පමණි. එහෙත් ඊට ඉඩ නොදෙන සාධකය වී ඇත්තේ ද ආගමයි. තමන්ගේ දේශපාලන අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමට ආගම ජයටම භාවිත කරන්නේ ලංකාවේ පමණක් නොවේ. දේශපාලන, වාර්ගික සහ ආගමික මිශ්‍රණයක් හැටියට අද දක්නට ලැබෙන මෙම අශිෂ්ට ජාතික ව්‍යාපාර මගින් කියැවෙන්නේ තම ජාතියේ හෝ ජනතාවගේ දේශපාලන ඉරණමට ආගම ද සම්බන්ධ කර ගත යුතු බවයි. ඒ නිසා මිනිසාගේ අනන්‍යතාවයේ ප්‍රභවය ලෙසට ආගම පිළිගන්නා ලෙසත්, දේශපාලන, ආර්ථික, නෛතික හා සමාජ - සංස්කෘතික ක්ෂේත්‍රයන්හි තම ආගම ප්‍රමුඛ ස්ථානයේ තබන ලෙසත් මෙම මූලධර්මවාදීන් විසින් බල කරනු ලබන්නේ ය. අප රටේ දැන් සිදුව ඇත්තේ ද එය යි. ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් හා සාමය ඔවුන්ට පිළිකුල් ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ඉදිරි කාලයේ දී කටයුතු කරන්නට සිදුව තිබෙන්නේ මෙවැනි සංදර්භයක් තුළ ය.


සදාචාරාත්මක පුනර්ජීවයක් ඇති කරමින් යුක්තිසහගත සමාජයක් නිර්මාණය කිරීම සඳහා ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුගේ නායකත්වය යටතේ නිර්භීත ලෙස තවදුරටත් කටයුතු කිරීමට ඔබට හැකිවේවායි පතමි. ඒ සඳහා සිවිල් සමාජයේ සියල්ලන් සමග අත්වැල් බැඳ ගැනීමට ඔබට හැකි වේවා කියාත් ප්‍රාර්ථනා කරමි.

---

**මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න**

කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය අධ්‍යනාංශයේ හිටපු මහාචාර්යවරයා ය. සිවිල් සමාජ ක්‍රියාධරයෙකි.  සාමය ගොඩනැංවීම සහ සංහිඳියා කේන්ද්‍රයේ විධායක අධ්‍යක්‍ෂවරයා ය.

# මහජන යහපත උදෙසා නඩු කීමේ භූමිකාව විවේචනාත්මක විමසුමක්



**වික්ටර් අයිවන්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මහජන අයිතිවාසිකම් හෝ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ක්‍රමය වඩාත් විධිමත් කර ගැනීම සඳහා නඩු බොහෝ ගණනක් පැවරීමට මුල් වූ ආයතනයකි. සමහර කාලවල ඒ සඳහා අවශ්‍ය වූ නිර්භීතභාවයද නොඅඩුව පෙන්නුම් කළ ආයතනයක් ලෙස සැලකිය හැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට විසි පස් වසරක් සම්පූර්ණ වීම නිමිත්තෙන් මා කරන අදහස් දැක්වීම සඳහා මා තෝරා ගත්තේ එම සංවිධානයේ මා වඩාත් ප්‍රිය කරන අංගය ලෙස සැලකිය හැකි මහජන ශුභසිද්ධිය හෝ ආණ්ඩුක්‍රමය විධිමත් හා ප්‍රජාතන්ත්‍රවාදී කර ගැනීමේ අරමුණින් එම ආයතනය පවත්වා ගෙන ගිය නඩු පවරන ප්‍රතිපත්තිය ගැන ය.

නිදහසේ පටන්ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයේ ලොකු අවුලක් තියෙන බව හා ඒ අවුල කෙරෙහි පාලකයින්ගේ නූගත්කම මෙන්ම උද්දච්චකමත් බලපා තිබෙන බව කිව හැකි ය. එම තත්ත්වයට ආණ්ඩුකරණයේ ප්‍රධාන බලමණ්ඩල තුන ලෙස සැලකෙන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය අතර තිබිය යුතු සමතුලිතභාවය බිඳවැටීම, එම ආයතන වෙළාගෙන තිබෙන දූෂිතබව වැනි හේතු ද බලපා තිබේ.

ඒ නිසාම 'මහජන හිතකර නඩුකර' විෂය ලංකාවට විශේෂයෙන්ම වැදගත් කොට සැලකිය හැකි ය. එවැනි නඩු කීමේ සම්ප්‍රදායක් සමාජයේ දියුණුවට හේතු වනවා සේම දේශපාලන තලය, එනම් විධායකයේ හා ව්‍යවස්ථාදායකයේ පරිකල්පනය දියුණු කිරීමට ද හේතු වේ. ඊටත් වඩා අධිකරණයේ දැක්ම තියුණු කිරීමට ද හේතු වේ. ඉන්දියාව වැනි වෙනත් රටවල් හා සසඳන විට, ලංකාවේ මේ විෂයට අත ගසන සංඛ්‍යාව ඉතා සීමිත ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඒ

අතර ප්‍රධාන තැනක් ගන්නා ආයතනයක් ලෙස සැලකිය හැකි ය. ඔවුන් විශාල සංඛ්‍යාවක් නඩු පැවරීම් කර තිබෙනවා සේම සමහර නඩු සමාජයට යහපත් ප්‍රතිඵලද ලබා දීමට හේතු වී තිබේ. එහෙත් මා මෙහි දී කතා කිරීමට අපේක්ෂා කරන්නේ ඒ ගැන නොව, එම විෂයෙහි ලංකාව තුළ දක්නට තිබෙන මට පෙනෙන බරපතළ සීමාසහිතකම් ගැන ය.

මට පෙනෙන පළමුවැනි දේ නම් අධිකරණය ඉදිරියට ගෙන යා යුතු ප්‍රධානම ප්‍රශ්න අතරින් අධිකරණය ඉදිරියට ගෙන ගොස් නැති ප්‍රශ්නවල ප්‍රමාණය විශාල බව ය. ඒ නිසා ඒවා අතර තිබෙන, ආණ්ඩුක්‍රමය කෙරෙහි වඩාත්ම බරපතළ හෝ තීරණාත්මක ලෙස බලපාන ප්‍රශ්න තෝරාගෙන පළමුව ඒවා අධිකරණය ඉදිරියට ගෙන යෑම අවශ්‍ය වේ. එහෙත් අධිකරණය ඉදිරියට ප්‍රශ්න ගෙන යෑමේදී ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව වඩා වැදගත් හා ප්‍රමුඛ ප්‍රශ්න ඉදිරියට ගැනීමක් සිදු වන බවක් පෙනෙන්නට නැත. ඒ නිසා අඩු වැදගත්කමක් තිබෙන දේවල් ඉස්මත්තට පැමිණ වැඩි වැදගත්කමක් ඇති දේවල් යටපත් වන බවක් පෙනෙන්නට තිබේ. ඒ සඳහා දැක්විය හැකි නිදර්ශන කිහිපයක් මෙසේ යː

### වස්තු කොල්ලයට ඉඩ හැරීම

1978 සිට ලංකාවේ ජනාධිපති සහ පාර්ලිමේන්තුව මුල් කරගත්, වස්තුව කොල්ල කන ක්‍රමයක් ක්‍රියාත්මක වන බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. මෙය මුළුමනින්ම නීතියට පටහැනි ක්‍රමයකි. මෙයට අදාළ නීතිය තිබෙන්නේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ය. මේ විෂයට අදාළව 72 ව්‍යවස්ථාව හෝ 78 ව්‍යවස්ථාව නීති පනවා නැත. ඒ නිසා මේ විෂයේදී බලපාන්නේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන බව (13.3.ඇ) එම ව්‍යවස්ථා දෙකේම සඳහන්ව තිබේ. ඇල්බට් සිල්වා මන්ත්‍රීවරයා සම්බන්ධ නඩුවේ තීන්දුව එම විෂය සම්බන්ධ එක් පූර්වාදර්ශයකි. 1977 මැතිවරණයේ දී ගාලු ආසනයට තරග කර තේරී පත් වූ ඇල්බට් සිල්වා මන්ත්‍රීවරයාට විරුද්ධව ඊට පෙර එම ආසනයේ මන්ත්‍රීවරයාව සිටි ඩබ්. දහනායක මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කළේ ය. ඇල්බට් සිල්වා නමට රජයෙන් ලබාගත් භූමිතෙල් බලපත්‍රයක් තිබෙන නිසා ඔහුට මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වීමට අයිතියක් නැති බව දහනායක ඉදිරිපත් කළ තර්කය විය. එම තර්කය පිළිගත් එවකට හිටපු අගවිනිසුරු නෙවිල් සමරකෝන් ප්‍රමුඛ විනිසුරු මඬුල්ල ඇල්බට් සිල්වාගේ මන්ත්‍රීධුරය අහෝසි කළේ ය. ඉන් පසුව ජේ.ආර්. ජයවර්ධන කළේ කඹුරුපිටියේ සිටි මන්ත්‍රීවරයාට තනතුරෙන් ඉල්ලා අස් වන ලෙස උපදෙස් දී ඒ පුරප්පාඩුවට ඇල්බට් සිල්වා පත් කිරීම ය. එය රටේ පාලකයකු විසින් කරන ලද බරපතළ නීති විරෝධී ක්‍රියාවක් ලෙස පමණක් නොව, අධිකරණය තීන්දුවක් දුන් අවස්ථාවක දී ඉතාම උද්දච්ච ලෙස අධිකරණයට ද අපහාසයක් කරමින් ඒ වරද තවදුරටත් පවත්වාගෙන යෑම සඳහා අනුගමනය කරන ලද වැරදි හා හිතුවක්කාරී ප්‍රතිපත්තියක් ලෙස ද සැලකිය හැකි ය.

ඉන් පසුව 2000 වසරේදීත් මේ හා සමානම ප්‍රශ්නයක් මතු විය. රාජිත සේනාරත්න මන්ත්‍රීවරයාට අයත් ඖෂධ සමාගමක් රජයත් සමඟ ගනුදෙනු කළේ ය යන චෝදනාව මත ඩිලාන් පෙරේරා ගොනු කළ නඩුවක දී රාජිත සේනාරත්න වැරදිකරු බව තීරණය කොට ඔහුගේ අසුන අහිමි කෙරුණේ ය. මෙහි දී රනිල් වික්‍රමසිංහ, ජේ.ආර්. ජයවර්ධන කළ වරදම කරමින් ඔහු ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු ලෙස නැවත පාර්ලිමේන්තුවට පත් කළේ ය.

අද වන විට ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රමය බරපතළ අර්බුදයකට ලක් වී තිබෙන බව කිව හැකි ය. විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර තිබිය යුතු සමතුලනය මුළුමනින් බිඳවැටී තිබෙන අතර විශේෂයෙන් විධායකය හා ව්‍යවස්ථාදායකය දූෂණයයෙන් කුණු වූ තත්වයකට පත්ව තිබෙන්නේ යැයි කිව හැකි ය. 1978 සිට ජනාධිපතිවරුන් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් සමඟ එකට කල්ලිගැසී කරගෙන යනු ලබන නීති විරෝධී වස්තු කොල්ලය එම ආයතන ක්‍රම දෙකේ ඇති වී තිබෙන කුණු වීම කෙරෙහි බලපා තිබෙන ප්‍රධාන හේතුවක් ලෙස සැලකිය හැකි ය. මෙය රට බංකොලොත් කිරීමට බලපා ඇති එක් වැදගත් හේතුවක් වන අතර, රටේ භාණ්ඩාගාරයට යා යුතු වැදගත්ම ආදායම් මාර්ග අහිමි කොට ඒවා ජනාධිපතිවරුන්ගේ හෝ ජනාධිපතිවරුන් වටා කල්ලි ගැසී සිටින මැතිඇමතිවරුන්ගේ සාක්කුවට යන ක්‍රමයක් ඒ නිසා ස්ථාපිත වී තිබෙන්නේ යැයි කිව හැකි ය. එය එක පැත්තකින්

ආයතන ක්‍රමය මුළුමනින් දූෂ්‍ය කිරීමට හේතු වී තිබෙන අතර, අනෙක් අතට නීතියට තිබෙන පිළිගැනීම මුළුමනින් බිඳ දමා ආණ්ඩුකරණය සහ රටේ ආර්ථික ක්‍රියාකාරීත්වය අවුල් ජාලාවකට පත් කිරීමටත් හේතු වී තිබෙන්නේ යයි කිව හැකි ය.

ඒ ගැන පුරවැසියකු හා විචාරකයකු හැටියට මට තිබෙන ලොකු ප්‍රශ්නයක් වනුයේ මේ ප්‍රශ්නයට සමාජයේ ප්‍රමාණවත් තරමේ අවධානයක් නොලැබීම ය. සමාජයේ පමණක් නොව විශේෂයෙන්ම ආණ්ඩුක්‍රමයේ වැරදි නිවැරදි කර ගැනීම වෙනුවෙන් පෙනී සිටින ආයතන පවා එම බරපතළ ප්‍රශ්නය මුළුමනින් නොසලකාහැර තිබෙන බව කිව හැකි ය. ඉහත නඩු තීන්දු දෙකේදී ම, එනම් ඇල්බට් සිල්වා නඩුවේදීත්, රාජිත සේනාරත්න නඩුවේදීත් ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මහජන නියෝජිතයින්ට අදාළ දූෂණ පිළිබඳ වැරදිවල දී පෙන්නුම් කර තිබෙන නොසැලකිල්ල ගැන බරපතළ විවේචනයක් කර තිබේ. පාර්ලිමේන්තු සදාචාරයට අදාළ එම කාරණය පිළිබඳව පාර්ලිමේන්තුව උවමනාවෙන්ම නීති නොපනවන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ගැන මේ නඩු තීන්දු දෙකේදීම පාර්ලිමේන්තුව දැඩි දෝෂදර්ශනයට ලක් කර තිබෙන්නේ යැයි ද කිව හැකි ය. එම විෂයට අදාළව මෙවැනි තත්ත්වයක් තිබියදීත් සියලු දේශපාලන පක්ෂ එම බරපතළ ප්‍රශ්නය මුළුමනින් නොසලකා හැර තිබෙන බව පැහැදිලිව දැකිය හැකි ය. එමෙන්ම ලංකාවේ දේශපාලන ක්‍රමයේ තිබෙන වැරදි ගැන උනන්දුවක් දක්වන, නඩු පැවරීම් මගින් ඒවා නිවැරදි කර ගැනීම සඳහා උනන්දුවක් දක්වන ආයතනත පවා එම බැරෑරුම් ප්‍රශ්නය ගැන නිසි අවධානයක් නොදැක්වීම හා අධිකරණය ඉදිරියට ගොස් අවශ්‍ය වෙනස්කම් ඇති කර ගැනීමට ක්‍රියා නොකිරීම ආණ්ඩුක්‍රමයේ කොල්ලකාරී ස්වභාවයේ පැවැත්ම ශක්තිමත් කිරීමට හේතු වී තිබේ.

## පක්ෂ මාරු කිරීමට ඉඩ දීම

මගේ දෙවැනි විවේචනය, පොදුවේ නීති ප්‍රජාවටත් මෙවැනි දේවල් වෙනුවෙන් පෙනී සිටින නීතිඥයින්ටත් සීපීඒ ආයතනටත් අදාළ වූවකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම, 1948 සිටම ලංකාවේ සිදු වන වරදකි. ඇත්තවශයෙන්ම විටින් විට බලයට පත් වන පාලක පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සෙල්ලමක් බවට පත් කරගෙන තිබෙන්නේ යයි කිව හැකි ය. විධායකයත්, පාර්ලිමේන්තුවත්, අධිකරණයත් යන තුනම සාමූහිකව ව්‍යවස්ථාව උල්ලංඝනය කළ අවස්ථා ද තිබේ. එමෙන්ම මේ ආණ්ඩුක්‍රමයේ ඉතාම ප්‍රමුඛ ලක්ෂණ මුළුමනින්ම උල්ලංඝනය වන ආකාරයට දේවල් සිදු වී තිබෙන්නේ යයි කිව හැකි ය. උදාහරණයක් ලෙස චන්ද්‍රිකා කුමාරතුංග පාලන කාලයේ දී ඇයට තුනෙන් දෙකක බලයක් නොතිබුණි. ඇය ඒ අඩුව සපුරා ගැනීමට උත්සාහ කළේ තමන්ට පාලනය කළ හැකි අගවිනිසුරුවරයෙකු පත් කොට ගෙන අධිකරණයේ සහාය ඇතිව ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමෙනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මන්ත්‍රීවරයකුට, මන්ත්‍රීධුරය අහිමි කර ගැනීමෙන් තොරව පක්ෂය මාරු කළ නොහැකි ය. එය මේ ආණ්ඩුක්‍රමයේ ස්ථාවරභාවය පවත්වා ගැනීම සඳහා තෝරගෙන තිබෙන ප්‍රධාන කුලුනක් ලෙස සැලකිය හැකි ය. එහෙත් 1999 දී සරත් අමුණුගම ඇතුළු 5 දෙනෙකු ආණ්ඩුවට එකතු වී යූඇන්පීය ඔවුන්ගේ මන්ත්‍රීධුර අහෝසි කළ අවස්ථාවේ දී ඔවුන් අධිකරණයට හමුවට ගිය අතර, අධිකරණය එම පස්දෙනාගේ මන්ත්‍රීකම් ආරක්ෂා කර දෙන පිළිවෙතක් අනුගමනය කළේ ය. එය ඉතා උපක්‍රමශීලී හා සටකපට ආකාරයට දුන් තීන්දුවක් ලෙස සැලකිය හැකි ය. එහි දී සලකා බැලුණේ එම පක්ෂය ඔවුන්ගේ මන්ත්‍රීධුර අහිමි කළේ විධිමත් විනය පරීක්ෂණයකින් පසුව නොවේ ය කියන කාරණය පමණ ය. ඔවුන් පක්ෂ මාරු කිරීමෙන් සිදු වූ ව්‍යවස්ථා උල්ලංඝනය හා එය ආණ්ඩුක්‍රමයේ ඇති කළ විකෘතිය මුළුමනින් නොසලකා හරින ලදි. මේ නිසා මන්ත්‍රීකම් අහිමි නොකරගෙන ආණ්ඩු පක්ෂයට එකතු විය හැකි දුෂ්ට ක්‍රමයක් ස්ථාපිත විය. මෙය ද අද දක්වාම ආණ්ඩුක්‍රමයේ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් උසාවි යන අයගේ අවධානයට ලක් නොවුණු බරපතළ කාරණයක් ලෙස සැලකිය හැකි ය.

## සිංහරාසා නඩු තීන්දුව ඇති කළ විකෘතිය

සිංහරාසා නඩු තීන්දුව ඇති කර තිබෙන විකෘතිය, නිවැරදි කර ගත යුතු තවත් බරපතළ වරදක් ලෙස

සැලකිය හැකි ය. ලංකාවේ තිබෙන ඉහළම අධිකරණයෙනුත් යුක්තිය ඉටු කර ගැනීමට නොලැබුණු අවස්ථාවක දී ජිනීවාහි මානව හිමිකම් කමිටුව වෙත තමන්ට වූ අසාධාරණය සම්බන්ධයෙන් පැමිණිල්ලක් යොමු කිරීමට හෝ නඩුකරයක් ආරම්භ කිරීමට තිබෙන අවස්ථාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ප්‍රඥප්තිය යටතේ ලංකාවේ පුරවැසියන්ට ලැබුණු ඉතාමත් වැදගත් අයිතියක් ලෙස සැලකිය හැකි ය. ඒ මගින් අධිකරණය යොදා ගනිමින් පුරවැසි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට රාජ්‍යයට තිබෙන හැකියාව සීමා කර තිබුණි. එය රටේ මහජනයාට තිබිය යුතු ඉතාම අගනා අයිතියකි.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ප්‍රඥප්තියේ වලංගුතාව ගැන, සිංහරාසා නඩුව වන විට ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දු දෙකක් දී තිබුණි. එකක් දී තිබුණේ විනිසුරු ආචාර්ය ඒ.ආර්.බී අමරසිංහ විසිනි.(*Wickramatunga Vs Anurudha Ratwatte, Minister of Power and Energy SC f/R 228/96 SCM 7th November 1997*) ඊට අදාළ අනෙක් නඩු තීන්දුව ලබා දී තිබෙන්නේ විනිසුරු අචාර්ය මාර්ක් ප්‍රනාන්දු විසිනි. (*Weerawansa Vs Attorney General and others 2001 Sri Lanka LR at page 387-408*) ශ්‍රේෂ්ඨාධිකරණය කලින් දී තිබෙන තීන්දුවකට පටහැනි තීන්දුවක් දෙන අවස්ථාවක දී එසේ කළ යුත්තේ පෙර තීන්දුව නිෂ්ප්‍රභා කිරීමෙන් පසුව ය. එහෙත් සිංහරාසා නඩු තීන්දුවේදී එම පෙර නඩු තීන්දු දෙක ගැන කවර මට්ටමකින්වත් සලකා බැලීමක් සිදු වී නැත. එසේම මෙම නඩුව ඇසීමේ අයිතියක් අගවිනිසුරු සරත් නන්ද සිල්වාට නොතිබුණි. ජිනීවා මානව හිමිකම් කමිටුව ඉදිරියේ නඩු පැවරූ මා ඇතුළු බොහෝ දෙනෙන් නඩු පවරා තිබුණේ අගවිනිසුරු සරත් නන්ද සිල්වාට එරෙහිව ය. මානව හිමිකම් කමිටුව ඒ වන විට ලබා දෙන ලද තීන්දු තුනෙන්, තීන්දු දෙකක්ම දී තිබුණේද සරත් නන්ද සිල්වාට අදාළව ය. ඒ නිසා ඔහු එම ක්‍රමය කඩාකප්පල් කිරීමේ අභිලාෂයක් තිබූ පුද්ගලයකු ලෙස සැලකිය හැකි ය. එය තමාගේ නඩුවක් තමා විසින්ම ඇසීමට සමාන ය. (*Judicature Act 49.3*) අගවිනිසුරු සරත් නන්ද සිල්වා තමන්ගේ ආරක්ෂාව පිණිස කරන ලද එම වරද නිවැරදි කිරීමට අද දක්වා කිසිවකු උත්සාහ දරා නැත.

### 2015 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ සීමා

2015 ආණ්ඩු පෙරළියත් සමඟ සිදු කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වැඩසටහන මා දකින්නේ මෑත කාලයේ සිදු වූ, ලංකාවේ ආණ්ඩුකරණයට අදාළ ඉතාම ඛේදජනක අත්දැකීමක් ලෙස ය. අපේ රටේ දේශපාලන න්‍යායවාදීන් කෙතරම් ලඳ බොළඳ හා මුග්ධ තැනක සිටිනවා ද යන්න, එම ප්‍රතිසංස්කරණ වැඩසටහනින් හොඳින් පෙන්නුම් කරයි. දේශපාලකයින් එසේ වී ඇත්තේ ඇයි ද යන්න තේරුම් ගැනීමට අමාරු නැත. බුද්ධිමය අර්ථයෙන් සෑම අංශයකම විශාල බිඳවැටීමක් තිබේ. එය විචාරබුද්ධියේ බිඳවැටීමක් ලෙස හැඳින්විය හැකි ය. එම තත්ත්වය දේශපාලකයින් කෙරෙහිත් බලපාන බව කිව හැකිය. නමුත් ඉතාම අවාසනාවන්ත දේ වනුයේ දේශපාලන න්‍යායවාදීන්ගේ ඇස් අන්ධ වීමය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත් මෙම මෝඩ ප්‍රතිසංස්කරණ වැඩසටහනේ උපදේශක කාර්යභාරයක් සිදු කළේ ය.

හොඳින් විග්‍රහ කර බැලූ විට පෙනෙන කාරණයක් නම්, 2020 ඇති වූ ආණ්ඩු පෙරළිය හා ඒ ආශ්‍රයෙන් ඇති වුණු අවාසනාවන්ත සිදුවීම්වලට විශාල වශයෙන්ම හේතු වී ඇත්තේ 2015 ඇති කළ මෝඩ ආණ්ඩු ප්‍රතිසංස්කරණ වැඩසටහන බව ය. උදාහරණයක් ලෙස, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු බව 2015 පෙළගැස්මෙහි තිබුණු ප්‍රධානම ඉල්ලීමක් විය. ඒ ඉල්ලීම යට තිබුණු නෛතික පදනම, ‘විධායක ජනාධිපති නීතියට ඉහළින් නොසිටිය යුතුය’ යන කාරණය ලෙස සැලකිය හැකි ය. ලෝකයේ ශීලාචාර රටක, රාජ්‍ය නායකයා නීතියට ඉහළින් සිටිය නොහැකි ය. ලංකාවේ ජනාධිපතිවරයා නීතියට ඉහළින් සිටියා පමණක් නොව විශාල පරිමාණයේ මානව හිමිකම් උල්ලංඝනයන්ට සහ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට එම බලය පාවිච්චි කරනු ලැබූ බවද කිව හැකි ය. සමාජයේ අභිංසක අපේක්ෂාව වූයේ එම තත්ත්වය වෙනස් කිරීම ය. ඒහෙත් මේ සමස්ත ප්‍රතිසංස්කරණය වැඩසටහන තුළම ජනයා රවටන, නැත්නම් මැජික්කාර ගතියක් තිබුණි. ජනාධිපතිවරයාට එරෙහිව නඩු පැවරීමේ හැකියාව ලබා දීම සඳහා 19 වැනි සංශෝධනයට ඇඳූ ප්‍රතිපාදනය ඒ සඳහා දැක්විය හැකි එක නිදර්ශනයකි.

එමගින් 18 වන සංශෝධනයේ හා ඊට පෙර තිබුණු 'ජනාධිපතිවරයාට එරෙහිව නඩු පැවරීමට නොහැකි ය' යන නීතිය වෙනස් කරනු ලැබූ බව මහා හඬින් කියනු ලැබී ය. එමගින් කියැවුණේ ජනාධිපතිවරයාට එරෙහිව, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වල දී ජනාධිපති ලේකම්වරයා හෝ නීතිපතිවරයා විත්තිකරුවකු කරමින් නඩු පැවරීමට හැකි බව ය. එහෙත් එමගින් කරනු ලැබුවේ මහජනයා රැවටීමකි.

ඇත්තවශයෙන්ම ජනාධිපතිවරයා නීතියට පහළින් තැබීමට එවැනි සරල ප්‍රතිපාදනයකින් නොහැකි ය. ජනාධිපති නීතියට යටත් කිරීමට නම්, ජනාධිපති කරන කවර හෝ නීති විරෝධී කටයුත්තක දී, එය බල රහිත කිරීමේ බලය අධිකරණයට දිය යුතු ය. නමුත් 19 වන සංශෝධනයෙන් එවැනි බලයක් අධිකරණයට දුන්නේ නැත. ආපසු 20 වන සංශෝධනයක් පසුවෙන්ම ගෙන ආ හැකි වූයේ ඒ බොරුව නිසා ය. එළුවෙකු බඳින ලණුවකින් හරකෙකු බැඳිය නොහැකි ය. එසේම හරකෙකු බඳින ලණුවකින් අලියෙකු බැඳිය නොහැකි ය. එහි දී සිදු වූයේ හිතාමතාම මහජනයා රැවටීමකි. ඒ වෙනුවෙන් ගෙවන්නට සිදු වූ වන්දිය දැවැන්ත ය.

**මැතිවරණ කොමිසමේ සීමා**

ලෝකයේ මැතිවරණ කොමිෂන් සභා විශාල සංඛ්‍යාවක් තිබෙන්නේ යැයි කිව හැකි ය. මැතිවරණ කොමිසමක් තිබෙන හැම රටකම පාහේ පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා ද යන්න සොයාබැලීමේ වගකීම පවරා දී තිබෙන්නේ මැතිවරණ කොමිෂන් සභාවට යැයි කිව හැකි ය. එසේම පක්ෂ අරමුදල් පරීක්ෂා කිරීමේ බලය විගණකාධිපතිට හෝ මැතිවරණ කොමිෂන් සභාවට හෝ ඒ දෙකටම ලබා දී තිබේ. අසල්වැසි ඉන්දියාවේ පමණක් නොව බංගලාදේශයේ, නේපාලයේ පවා පක්ෂ අරමුදල් සඳහා දැඩි නීතිරීති පවතී. පක්ෂ අරමුදලකට ආධාර කළ හැකි ආකාරය ගැන දැඩි සීමා කිරීම් තිබේ. එමෙන්ම පක්ෂවලට හෝ අපේක්ෂකයින්ට ලැබෙන ආධාර මුදල් හා මැතිවරණ අරමුදල් නිරන්තර විගණනයට ලක් වන ක්‍රම පවතී. නමුත් ලංකාවේ මැතිවරණ කොමිසම නිර්මාණය කර තිබෙන්නේ එම විෂයන් සඳහා කිසිදු බලයක් මැතිවරණ කොමිසමට නොලැබෙන ආකාරයට ය.

1977 දක්වාම මැතිවරණ වියදම් සම්බන්ධයෙන් දැඩි නීති තිබුණි. 77 දක්වාම මැතිවරණයක දී අපේක්ෂකයකුට මැතිවරණ කොට්ඨාසයක් සඳහා වියදම් කළ හැකි උපරිම වියදම් සීමාව තිබුණේ රුපියල් 5000කි. ඊට වඩා වියදම් කර තිබුණොත් ඔහුගේ හෝ ඇයගේ මන්ත්‍රීකම අහිමි කළ හැකිව තිබුණි. ඒ වගේම තරග කරන සෑම අපේක්ෂකයෙක්ම මැතිවරණය අවසන් වූ පසුව තමන්ට ලැබුණු මුදල් හා ඒවා වියදම් කළ ආකාරය ගැන වාර්තාවක් මැතිවරණ දෙපාර්තමේන්තුවටත් විගණකාධිපතිවරයාටත් දිය යුතුව තිබුණි. මැතිවරණ අරමුදල්, ලංකාවේ දේශපාලකයින් දූෂිත කිරීමට හේතු වී තිබෙන ප්‍රධානම සාධකයකි. ජනාධිපතිවරණයක දී ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා ගෙන් කෙනෙකුට සාමාන්‍යයෙන් වැය වන වියදම රුපියල් බිලියන තුනක් බවට මෑතක දී ගණන් බලා තිබුණි. ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනා මේ සා විශාල මුදලක් ලබාගන්නේ කාගෙන් ද? මේ අරමුදල්වල ප්‍රධාන දායකයින් ලෙස ක්‍රියා කරන්නේ කළුසල්ලිකාරයින් ය. බොහෝ විට මත්ද්‍රව්‍ය වැනි ව්‍යාපාරවලට සම්බන්ධ අයයි. ඒ මගින් රටේ ජනාධිපති මිල දී ගැනීමේ හැකියාව කළුසල්ලිකාරයින්ට ලබා දී තිබෙන්නේ යැයි කිව හැකි ය.

ව්‍යවස්ථාව වෙනස් කිරීමට දැරූ එකදු උත්සාහයක් තුළ වත් මේ බරපතළ කාරණාවලට පිළිතුරු සෙවීමට දේශපාලකයින් උත්සාහ කර නොතිබෙනවා සේම, එම ආණ්ඩු ප්‍රතිසංස්කරණ වැඩසටහන්වල දී උපදේශකයින් ලෙස ක්‍රියා කළ නීති විශාරදයින් ද එම මූලික ප්‍රශ්නවලට අත ගැසීමෙන් වැළකී සිටින ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබෙන බව පෙනේ. එසේ වූයේ ඇයි? ඇත්තවශයෙන්ම 2015 දී අධිකරණයට විමර්ශන බලය ද සමග ජනාධිපති කරන නීතියට පටහැනි ඕනෑම ක්‍රියාවක් අවලංගු කිරීමේ බලය දුන්නේ නම් ගෝඨාභයට තබා කිසිවෙකුට ඒකාධිපතිත්වයකට යෑම ඉතා දුෂ්කර වන්නට තිබුණි. එසේ වී නම් ජනාධිපතිවරයාට අද කරන නීතියට පටහැනි දේවල් කළ නොහැකි වන්නට තිබුණි. මක්නිසාදයත් තමන්ට ලැබුණු බලයක් ආපසු ගැනීමට අධිකරණය ඉඩ නොදෙන නිසා ය.

ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන 1982 දී පාර්ලිමේන්තුවේ නිල කාලය දූෂිත ජනමත විචාරණයක් මගින් දීර්ඝ කර ගැනීමෙන් සමස්ත ආණ්ඩු ක්‍රමයෙහි විකෘතියක් ඇති කළේ ය. ඒ ප්‍රතිපාදනය තවමත් ආණ්ඩුක්‍රමය තුළ පවතී. අදත් ඕනෑම ජනාධිපතිවරයකුට එලෙසම පාර්ලිමේන්තුවේ නිල කාලය ජනමත විචාරණයකින් දීර්ඝ කර ගත හැකි ය. ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධි අගමැතිවරියගේ පාලන සමයේ ආණ්ඩුක්‍රමයේ බරපතළ විකෘති කිරීම් සිදු විය. එහෙත් ඉන්දිරා බලයෙන් ඉවත් වූ වහාම ඒ කර තිබූ විකෘති කිරීම් මුළුමනින්ම ඉවත් කරනු ලැබී ය. ඉන්දිරාගේ කොංග්‍රසයේ අය ද ඒ සඳහා සහාය දුන්හ. ඇමෙරිකාවේ ජනාධිපතිවරයෙකුට ධුර කාල දෙකකට වඩා සිටිය නොහැකි ය කියන සම්ප්‍රදාය අයිසන් හවර් ජනාධිපතිවරයා උල්ලංඝනය කළ අවස්ථාවේදී ව්‍යවස්ථා සංශෝධනයක් මගින්, තවත් කෙනෙකුට ඒ වරද කළ නොහැකි අකාරයට එම වරද නිවැරදි කරනු ලැබී ය. එහෙත් එවැනි සම්ප්‍රදායක් වෙනුවෙන් පෙනී සිටින පිරිසක් ගැනවත් අපට ලංකාවෙන් අසන්නට ලැබෙන්නේ නැත.

2015 දී ඇති කළ සියලුම වෙනස්කම් සිදු කර තිබෙන්නේ ඒ සියල්ල නැවත උදැල්ලකින් කණපිට ගැසිය හැකි තරම් සරල ආකාරයට ය. ආණ්ඩුක්‍රමයක් විධිමත් ආකාරයට වෙනස් කළේ නම් එය නැවත කණපිට ගැසීම පහසු දෙයක් නොවන්නට ඉඩ තිබුණි. ඇත්තටම 2015 දී වුණේ අතිවිශාල බොරුවකි. එය මහජනයාට කරන ලද දැවැන්ත වංචාවක් ලෙස සැලකිය හැකි ය. 2020 ප්‍රතිඵලය ඊට ලැබුණු දඬුවම ලෙස සැලකිය හැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 25 වසරක් සමරන මේ මොහොතේ දී රටේ ආණ්ඩුක්‍රමයට අදාළව සිදු වී තිබෙන බරපතළ වැරදි හා අතපසුකිරීම් ගැන නැවත විවේචනාත්මකව කරුණු සලකා බලන තැනකට යා යුතු ය.

---

**වික්ටර් අයිවන්**

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකි, ‘රාවය’ පුවත්පතේ ආරම්භක සංස්කාරකවරයා මෙන්ම වසර 25කට වඩා එම ධුරයෙහි කටයුතු කර ඇත. දේශපාලන විචාරකයෙකි, සිවිල් ක්‍රියාකාරිකයෙකි, දේශපාලනය සහ සමාජීය වශයෙන් වැදගත් ග්‍රන්ථ ගණනාවක් ලියා පළ කොට ඇති කතුවරයෙකි.

# අලුත් ලංකාවේ විකල්ප ප්‍රතිපත්ති



නීතිඥ
**කේ.ඩබ්ලිව්. ජනරංජන**

ලංකාවේ ජාතිකවාදී හා අන්ත ජාතිකවාදී, මතවාදී ප්‍රකාශකයන්ට මෙන් ම ඔවුන්ගේ විවිධ සංවිධානවලටත් එම මතවාද පදනම්කොට ගෙන සිය දේශපාලන ප්‍රතිපත්ති ගොඩනගාගෙන තිබෙන දේශපාලන සංවිධාන හා පක්ෂවලටත් මතු නොව, සාමාන්‍ය සිහිබුද්ධියකින් යුක්ත රටේ සාමාන්‍ය ජනතාවට පවා රජයේ නොවන සංවිධාන වනාහි මැදියම් රැයේ නින්දේදී දකින නපුරු සිහිනයකි. 'එන්ජීඕ' යන්න ඔවුන් උච්චාරණය කරන ආකාරයෙන් ම පවා ඒවා ගැන ඔවුන්ට ඇති අපුල බව පැහැදිලි වෙයි. එහෙත් මේ එකිනෙක ස්තර, රජයේ නොවන සංවිධාන කෙරෙහි ප්‍රතිරෝධය දක්වන්නේ එක පදනමක සිට නොවේ.

ජාතිකවාදී ස්තරයන්ට, රජයේ නොවන සංවිධාන යනු සිය මතවාදයට එරෙහි ප්‍රබලතම බහුත්වවාදී සතුරෙකි. මේ කුලකය තුළට ම ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු තවත් වාමාංශික පක්ෂ හා දැන් ඒවා වටා ගොඩනැගී ඇති ජාතික ජන බලවේගය වැනි සිවිල් සංවිධානවල බුද්ධිමතුන් මෙන්ම ක්‍රියාකාරිකයන්ද එකතු කළ හැකි ය. ඔවුන්ගේ විරෝධය ගොඩනැගී තිබෙන්නේ, රජයේ නොවන සංවිධාන යනු ලිබරල්වාදී හෝ නව ලිබරල්වාදී මතවාද රට තුළ පතුරුවන එනයින් ම වාම-විරෝධී වන ව්‍යාපෘතියක් ය යන කල්පනාව මත ය.

ජාතිකවාදී දේශපාලන පක්ෂ හා සංවිධානවලට, රජයේ නොවන සංවිධාන යනු සිය දේශපාලන බලයට අභියෝග කරන දේශපාලනික එදිරිවාදියෙකි. සිත්ගන්නාසුලු කාරණය වන්නේ සාමාන්‍ය ජනතාවට රජයේ නොවන සංවිධාන ගැන අපුල හැඟීමක් තිබෙන්නේ එවැනි විදග්ධ හේතු මත නොවන බව යි. ඔවුන්ගේ නොපහන්බව ඇති කර තිබෙන්නේ ඔවුන්ගේ ම වූ මතයක් නිසා නොව, හුදෙක් ඉහත කී ස්තර කිහිපය විසින් සමාජය තුළ වපුරනු ලැබ

ඇති ජනප්‍රිය එන්ජීඕ විරෝධී මතවාදය උඩින් පල්ලෙන් අල්ලා ගැනීම නිසා ය. අප එසේ කියන්නේ, එන්ජීඕ විරෝධයට අදාළ නිදන්ගත හේතු හෝ පූර්වාපර සන්ධි හෝ ගළපාගත හැකි තරමට කිසිම පිළිගත හැකි තර්කයක් ඔවුන්ට ඇතැයි නොපෙනෙන නිසා ය. කනගාටුවට මෙන්, ලංකාවේ සිංහල-ඉංග්‍රීසි භාෂිත ජාතික පුවත්පත්වල ප්‍රධාන සංස්කාරකවරුන් බොහෝ දෙනකු අඩු වැඩි වශයෙන් හමු වී ඇති අපට ඔවුන් ද ඇතුළත් කළ හැක්කේ මේ කී 'සාමාන්‍ය ජනතාව' කියන කුලකයට බව තේරුම් ගොස් තිබේ. රටේ ප්‍රධාන ජනමාධ්‍යවලින් ප්‍රකාශ වන රජයේ නොවන සංවිධාන විරෝධී අදහස්වල එක් හේතුවක් වන්නේ සංස්කාරකවරුන්ගේ මේ බුද්ධිමය දිළිඳුකම යි.

ජාතිකවාදී මතවාදී කණ්ඩායම්වලට රජයේ නොවන සංවිධාන විරෝධය මූලික වශයෙන් ඇති වී තිබෙන්නේ, එම සංවිධානවලින් යෝජනා කරන බහුත්වවාදී ප්‍රවේශය නිසා ය. ඊට අමතරව, ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පාලන මූලධර්ම රැකගැනීම, නීතියේ පාලනය පිහිටුවීම, සුළුතර වාර්ගික හා ආගමික කණ්ඩායම් රාජ්‍ය පාලනයට සහභාගි කර ගැනීම, මානව අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම හා ප්‍රවර්ධනය, අධිකරණයේ ස්වාධීනත්වය වැනි ප්‍රමිතීන් ද මේ බහුත්වවාදී ප්‍රවේශය තුළ තිබේ. මේ සංවිධාන, ලිබරල් හා නව ලිබරල්වාදී ප්‍රතිවාදීන් පිරිසක් ලෙස වාමාංශිකයන්ටත්, එවැනි පක්ෂ හා ගැටගැසී තිබෙන ජාතික ජන බලවේගය වැනි සිවිල් පෙරමුණුවලටත් පෙනේ. ඒ අනුව මේ සියලු දෙනා අඩු වැඩි වශයෙන් කල්පනා කරන්නේ, තමන්ට, තමන්ගේ මාතෘභූමියටත් එරෙහිව කුමන්ත්‍රණයක් හැම විට ම රජයේ නොවන සංවිධාන හරහා ක්‍රියාත්මක වන බව යි.

ලංකාවේ ජනවාර්ගික ගැටුම පැවැති කාලයේ, රජයේ නොවන සංවිධාන සැලකුණේ, බටහිර අධිරාජ්‍යවාදීන්ගේ ඒජන්තයන්, එල්ටීටීඊයට සුබපතන්නන් හා සහාය දෙන්නන්, ජාතික ආරක්ෂාව අනතුරේ හෙළන්නන්, ලංකාව ගැන වැරදි චිත්‍රයක් ලෝකයට මවා පෙන්වන්නන් ආදි වශයෙනි. 1996 දී ඇරඹුණු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයද, වාර්ගික ගැටුම කාලයේ මෙවැනි චෝදනාවලට මෙන් ම ඒ හා බැඳුණු භෞතික තර්ජනවලට ද අඩු නැතිව ම ලක් විය. කේන්ද්‍රයටත්, එහි ක්‍රියාකාරීන්ටත් එරෙහි මතවාදීමය ජනමාධ්‍ය ප්‍රහාරවල සිට රැස්වීම් කඩාකප්පල් කිරීම්, මරණ තර්ජන ඇතුළු විවිධාකාර හිංසනයන්ට ලක් වීමට ඊට සිදු විය.

2009 යුද ගැටුම අවසන් වූවාට පසු අද දක්වාමත් රජයේ නොවන සංවිධානවලට එරෙහිව නැගුණු ඉහත චෝදනා ලිහිල් කරන්නට ඒවා නගන්නවුන් සූදානම් නැති බව පෙනේ. අදත් රජයේ නොවන සංවිධාන සැලකෙන්නේ බහුතර-ජාතිකවාදී මතවාදයට එරෙහි වූවක් ලෙසිනි. ජාතික ආරක්ෂාවෙන් අගතැන්පත් ශක්තිමත් ජාතික රාජ්‍යයකට එරෙහිවූවක් ලෙසිනි. මේ ආකාරයට, දීර්ඝ කාලයක පටන්, රජයේ නොවන සංවිධාන වනාහි, සමාජයේ බහුතරවාදී පාර්ශ්ව විසින් තවත් අනෙකකු ලෙස සලකනු ලබන්නක් බව පෙනේ. ඉදිරියටත් එය එසේම වනු ඇත. අවාසනාවකට, රජයේ නොවන සංවිධාන අභ්‍යන්තර සංවාද මණ්ඩපවල අදත් කතාකරන්නට සිදු වී ඇති එක් අභියෝගයක් වන්නේ, මේ චෝදනාවලට පිළිතුරු සැපයීමට කුලකයක් ලෙස තමන් අපොහොසත් වූයේ ඇයි ද යන්න යි. චෝදනා එල්ල කරන්නවුන්ට දෙන්නට ඉතා පැහැදිලි හා බලවත් පිළිතුරු තිබියදීත්, රජයේ නොවන සංවිධානවලට ඒවා ඉස්මතු කරන්නට නොහැකි වී ඇත්තේ ඇයි? සාමාන්‍ය ව්‍යවහාරයෙන් ගත්තොත් 'ඔව්, අපි එන්ජීඕ තමයි, ඇයි මොක ද?' වැනි ප්‍රතිඋත්තරයක් ඉදිරියට ගන්නට ඔවුන්ට නොහැකි වී ඇත්තේ ඇයි?

2015ට පෙර පැවැති ආණ්ඩුව කාලයේත්, 2015-2019 ආණ්ඩුව කාලයේත්, රජයේ නොවන සංවිධානවලට ඇමෙරිකාවෙන් පොම්ප කරන ලද ඩොලර් මිලියන ගණන් ගැන විවිධ සංඛ්‍යාලේඛන, මේ ලියුම්කරු ද සහභාගි වූ විවිධ රූපවාහිනී සාකච්ඡාවල දී ජාතිකවාදී ප්‍රකාශකයන් ඉදිරිපත් කරනු අසන්නට ලැබිණි. විශේෂයෙන් 2015 දී එතෙක් පැවැති දේශප්‍රේමී ආණ්ඩුව පෙරළා දමන්නට, මේ මුදල් කන්දරාව ඇමෙරිකාව වියදම් කර ඇති බවත්, එවකට හිටපු අමෙරිකානු රාජ්‍ය ලේකම්වරයා ඒ බව පිළිගෙන ඇති බවත්, එම අරමුදල්වලින් අහවල් මිලියන ගණන ලැබී ඇත්තේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නමැති සංවිධානයට බවත් ඔවුන් කියන අවස්ථාවල, ඒ අරමුදල්වලින් කොපමණ ප්‍රතිශතයක්, ලංකාවේ ක්‍රියාත්මක වන හුදෙක් සමාජ හා සහන සේවා වැඩවල පමණක් යෙදෙන රජයේ නොවන

සංවිධාන වෙත ලැබී ඇති බව දන්නේ දැයි ඇසූ විට, ඒ ගැන දැනීමක් එවැනි ප්‍රකාශකයන්ට තිබෙන බවක් පෙනුණේ නැත. ඔවුන්ගේ මනසේ හොල්මන් කරන්නේ ලංකාවට පොම්ප කළා යැයි කියන ඇමරිකානු ඩොලර් මිලියන ගණනත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත්, පාක්‍යසෝති සරවනමුත්තුත් ඇතුළත් සමීකරණයක් පමණකි. එයින් පෙනෙන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අධිනිශ්චය වී ඇති තරම යි.

2015 ආණ්ඩුව පෙරළීමට රජයේ නොවන සංවිධානවලට මෙපමණ ඩොලර් මිලියන ගණනක් ලැබී ඇතැයි කියන විට එහි අර්ථය ඉතා පැහැදිලි ය. එනම්, ඒ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, සුළුතර වාර්ගික විරෝධී, මානව අයිතිවාසිකම් විරෝධී, අධිකරණයේ ස්වාධීනත්ව විරෝධී, නීතියේ ආධිපත්‍ය විරෝධී න්‍යාය පත්‍රයට එරෙහිව බලවත් ක්‍රියාකාරිත්වයක් රජයේ නොවන සංවිධානවලින් පෙන්වා ඇති ය යන්න යි.

2015ට පෙර තිබුණු ආණ්ඩුවේ මානව ප්‍රමිති විරෝධී මතවාදවලට මතවාදීමය ලෙස විරුද්ධ වන්නට, ඒ මොහොතේ තිබුණු විරුද්ධ පක්ෂවලට දැක්මක් හෝ කශේරුවක් නොතිබුණු අවස්ථාවක ඒ කාර්යය තමන් වෙත පවරා ගන්නට සිදු වූයේ ද, රජයේ නොවන සංවිධානවලට ය. ඒ මොහොතේ විරුද්ධ පක්ෂ ලෙස තිබී, අදත් විරුද්ධ පක්ෂ ලෙස ම පවතින දේශපාලන පක්ෂවලට, එදත් අදත් මේ මානව ප්‍රමිතීන් වෙනුවෙන් තීරණාත්මකව පෙනී සිටින්නට හැකියාවක් නොතිබුණු/නොතිබෙන බව අලුතෙන් කිව යුතු නොවේ. උදාහරණ ලෙස ඊනියා රණවිරුවන් මෙන් ම මරණ දඬුවම ගැන වර්තමාන විපක්ෂ නායකයා වරින්වර දක්වන පසුගාමී අදහස් මෙන් ම, සුළුතර වාර්ගික අයිතිවාසිකම් ගැන හා මානව ලිංගික දිශානතීන් ගැන ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂ වරින්වර දක්වන පසුගාමී අදහස් ද දැක්විය හැකි ය.

එවැනි පසුබිමක රජයේ නොවන සංවිධාන පවතින්නේ ඇයි ද යන්න ආචාර්ය සරවනමුත්තු පැහැදිලි කරන්නේ මෙසේ ය. 'ඒවා පවතින්නේ රාජ්‍යයන් විසින් ඉටු කළ යුතු යැයි මුල දී අදහස් කරන ලද කර්තව්‍යයන් ඉටු කිරීමට රාජ්‍යයන් අපොහොසත් නිසා බවත්, සමහර රාජ්‍යයන් ඒ කර්තව්‍යයන් ඉටු නොකරන නිසා බවත් පිළිගත යුතුව ඇත. විවිධ අවස්ථාවල දී ආරක්ෂකයන්ගේ හා සැපයුම්කරුවන්ගේ තත්ත්වයෙහි සිට කොල්ලකරුවන්ගේ තත්ත්වයට ගමන් කොට ඇති රාජ්‍යයන්ගෙන් සමන්විත ලෝකයක රජයේ නොවන සංවිධාන කුමන්ත්‍රණයක් නොව අවශ්‍යතාවකි.' (එන්ජීඕ බිල්ලා, සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, 1997)

'ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී' ශ්‍රී ලංකාවක් වෙනුවෙන් පෙනීසිටින විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රවේශය වනාහි සාමාන්‍ය අර්ථයෙන් ප්‍රභූ ප්‍රවේශයකි. එහි මූලික මැදිහත් වීම විකල්ප ප්‍රතිපත්ති සම්පාදනය කිරීමත්, පර්යේෂණ කිරීමත් ඒ ක්ෂෙත්‍රවලදී අවශ්‍ය මැදිහත්වීම් කිරීමත් ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, මෙතෙක් කාලයක් සියලු බාහිර හා සංවිධාන තුළින්ම පැනනගින විවිධ අභියෝග මැද නිරුපද්‍රිතව පවත්වා ගැනීමට බලවත් ලෙස හේතු වූයේද මේ ප්‍රභූත්වයම බව පෙනේ.

ඉහත කී ජාතිකවාදී, වාමවාදී දේශපාලන හා සමාජ සංවිධානවල මෙන් ම එවැනි අයගෙන්ම සමන්විත වර්තමාන ආණ්ඩුවේ ද අනෙකකු බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පත් වී තිබෙන්නේ, බහුත්වවාදී ප්‍රවේශයකින් යුක්තව මානව ප්‍රමිතීන් පොළවේ පිහිටුවීම වෙනුවෙන් එය දක්වන බුද්ධිමය හා ශාස්ත්‍රීය මැදිහත් වීම නිසා යැයි සිතමි. 'විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ යහපාලනය සහ ගැටුම් පරිවර්තනය සඳහා ආයතන සහ ධාරිතාව ගොඩනැගීම සඳහා හදිසි අවශ්‍යතාවක් ඇති බවත්, එහි දී පාක්ෂික නොවන සිවිල් සමාජ කණ්ඩායම්වලට වැදගත් හා නිර්මාණාත්මක දායකත්වයක් ඇති බවත් ගැන දැඩි විශ්වාසයෙනි'යි තමන් පිළිබඳ හැඳින්වීමේ දී කේන්ද්‍රය කියයි.

තෘණමූලික, ජාලකරණ වැඩවලටත් වඩා එවැනි ප්‍රවේශයක් සමාජයේ බුද්ධි ස්තරවලට කරන බලපෑම විශාල ය. කල් පවතිනසුලු ය. බොහෝ දෙනකු බිය දක්වන්නේ, මේ බුද්ධිමය ප්‍රවේශය තමන්ට සැබෑ අභියෝගයක් නිසා ය.

අනෙක් අතට, ව්‍යවස්ථාකරණ ක්‍රියාවලිය පිළිබඳව අවදියෙන් සිටීම හා අවශ්‍ය මැදිහත්වීම් කිරීම හා විකල්ප ප්‍රතිපත්ති හැදීමේ ක්‍රියාවලිය සාමාන්‍ය රජයේ නොවන සංවිධානවලට අතේ දුරෙන් නැති කලාපයකි. ඒ සඳහා අවශ්‍ය බුද්ධිමය සම්ප්‍රදායකුත්, වැඩ කිරීමේ මනසකුත්, කැප වීමකුත්, මූල්‍යමය

ශක්තියකුත් සාමාන්‍ය මට්ටමේ රජයේ නොවන සංවිධාන බොහොමයකට නැත. ඒ ඉඩ පුරවන්නේ වසර විසිපහක් සපුරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත්, එක්තරා දුරකට රටේ පරිසරය සම්බන්ධ රජයේ නොවන සංවිධානත් ය යනුවෙන් කීම අසාධාරණ නැත.

2019 නොවැම්බරයෙන් පසු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු සමාජය තුළ ප්‍රජාතාන්ත්‍රීය මතවාදීමය කාර්යභාරයක් කරන රජයේ නොවන සංවිධානවල අභියෝග අලුත් වී තිබේ. 2015ට පෙර රජයේ නොවන සංවිධානවලට එරෙහි ප්‍රතිවිරෝධයේ දැවැන්ත ප්‍රකාශකයා අද රටේ නායකයා ය. පුරුද්දක් ලෙස රජයේ නොවන සංවිධාන සිය අනෙකා ලෙස සැලකූ පිරිස් අද රාජ්‍ය යාන්ත්‍රණයේ විවිධ වැදගත් තැන්වල ය. 2015-2019 කාලය තුළ අත්පත් කරගත් සියලු ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහණ ආපස්සට හරවමින් තිබේ. ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේත්, ප්‍රජාතාන්ත්‍රීකරණ ක්‍රියාවලියේත් මඟසලකුණු හැටියට පිහිටුවා ගන්නා ලද ස්වාධීන කොමිෂන් සභා මෙන්ම අතුරුදන්වූවන්ගේ කාර්යාලය, හානි පූර්ණ කාර්යාලය වැනි මහජන ආයතන, ඒවායේ මූලික අරමුණට ප්‍රතිවිරුද්ධ චින්තනයක් ඇති පුද්ගලයන් අතට පවරා දී තිබේ. රජයේ නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ වගකීම එවැනි සංවිධානවල පරම හතුරෙකු වන ආවේගශීලී විශ්වවිද්‍යාල ඇදුරකුට පවරා තිබේ. රජයේ නොවන සංවිධාන දැඩි ග්‍රහණයකට ගැනීමේ ව්‍යවස්ථාකරණ ප්‍රයෝග ළඟ එමින් තිබේ. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්ද එන බව කියැවේ. 2015ට පෙර රාජපක්ෂ ආණ්ඩුව යටතේ පත් කරන ලද රජයේ නොවන සංවිධාන පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා වාර්තාවෙන් එම සංවිධානවල ගෙල හිර කරන නිර්දේශ ඉදිරිපත් කළ විජිත හේරත් වැනි වාමාංශික නායකයෝ විපක්ෂ ජනමත නිෂ්පාදනයේ යෙදෙමින් සිටිති. රටේ ප්‍රධාන විපක්ෂය වන සමගි ජන බලවේගයත්, එහි නායකයාත්, රජයේ නොවන සංවිධාන වෙනුවෙන් පෙනීසිටිනු ඇතැයි කිසි ම විශ්වාසයක් නැත. ඔවුහු ද ආත්මීයව රජයේ නොවන සංවිධාන විරෝධීයහ. එනයින් යාත්‍රා කළ යුතු සාගරය අතිශය කැලඹිලි සහිත ය. අභියෝගය පෙර පරිදි ම ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ක්‍රියාකාරිත්වය, මෙවැනි කාලයක පෙරටත් වඩා සමාජයට අවශ්‍ය ය.

---

**කේ.ඩබ්ලිව්. ජනරංජන**

නීතිඥයෙකි, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකි, කාටුන් ශිල්පියෙකි. රාවය පුවත්පතේ හිටපු සංස්කාරකවරයා ය. ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සාමාජිකයෙකි. ‘අනිද්දා’ පුවත්පතේ වත්මන් කර්තෘවරයා ය.

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ සිවිල් සමාජ භූමිකාව



මහාචාර්ය
**නවරත්න බණ්ඩාර**

### 1. හැඳින්වීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මේ වසරේදී වසර විසිපහක් සම්පූර්ණ වෙයි. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට විකල්ප ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ඉදිරිපත් කරමින් වසර විසිපහක් ගත කිරීම පහසු කටයුත්තක් නොවේ. රාජ්‍ය නොවන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධානයක් වශයෙන් එය පමණක් නොව ඒ හා සමාන කාර්යයන් ඉටු කරන අන්‍ය සංවිධානවලට ද අදාළ වන ආකාරයෙන් සාකච්ඡාවක් සිදු කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

### 2. සිවිල් සමාජය හඳුනා ගනිමු

අපට සිවිල් සමාජය තුන් ආකාරයකින් හඳුනාගත හැකි ය. රාජ්‍යය බිහිවීමට පෙර පැවති ස්වභාවික සමාජය එයින් පළමුවැන්න ය. දේශපාලන දර්ශනය තුළ මේ සාකච්ඡාව සිදු කරන්නේ ජෝන් ලොක් ය. ඔහුගේ අදහස අනුව හොඳ නරක හඳුනා ගැනීමට මිනිසාට තිබූ ස්වභාවික හැකියාව මගින් මිනිසාව හැසිර වූ නිසා රාජ්‍යයට පෙර පැවතියේ ශිෂ්ට සමාජයකි. තමන්ගේ හෘදය සාක්ෂිය අනුව තමන් අකමැති දෙය අන්‍යයන්ට සිදු නොකිරීමට මිනිසුන් ස්වභාවයෙන්ම පෙළඹුණ බැවින් සෑම දෙනකුට ම ජීවිතය, දේපළ සහ නිදහස යන අයිතිවාසිකම් හිමි වෙයි. මේ අන්දමට ස්වභාවික නීතියක් ඇති වී යහපත් සමාජයක් ඇති විය. ලොක් මෙම සමාජය හැඳින්වූයේ සිවිල් සමාජය යනුවෙනි.

ලොක්ගේ අදහස අනුව රාජ්‍යය බිහිවූයේ සිවිල් සමාජයට අනතුරුව ය. සමාජ අවශ්‍යතා සංකීර්ණ වීමට පටන් ගැනීම සමග තවදුරටත් සිවිල් සමාජය මගින් පමණක් ප්‍රශ්න විසඳා

ගැනීමට නොහැකි බව මිනිසුන්ට වැටහුණි. මෙයට පිළිතුරු වශයෙන් මිනිස්සු සම්මුතියකින් පාලකයකු පත් කර ගත්හ. එසේ රාජ්‍යය ඇති වන අතර එතෙක් පැවති ස්වභාවික නීතිය නිශ්චිත ලෙස පිළියෙල කර සමාජ ප්‍රශ්න විසඳීමට එම පාලකයාට පැවරීම සිදු විය. එසේ පැන නගින රාජ්‍යයට පැවරුණේ එතෙක් පැවති සිවිල් සමාජය රාජ්‍යය තුළට ගෙන එය ඉදිරියට ගෙන යෑමට ය. ස්වභාවික නීතිය ආරක්ෂා කරමින්, මිනිසුන්ගේ දේපළ, ජීවිතය, නිදහස යන තත්ත්වයන්ට බාධා නොකර ගැටුම් විසඳීමේ මධ්‍යස්ථ විනිශ්චයකරුවකුගේ භූමිකාව ඉටු කිරීම රාජ්‍යයට පැවරිණි. මේ නිසා රාජ්‍යය යනු ව්‍යවස්ථාපිත ලෙස සීමිත බලයක් හිමි ආයතනයකි. මේ ආකාරයට රාජ්‍යය සිවිල් සමාජය බවට පත් විය. ඒ අනුව රාජ්‍යය යනු යහපත් සිවිල් සමාජය දේශපාලන වශයෙන් සංවිධානය කිරීම ය. එය සිවිල් සමාජය පිළිබඳ දෙවන හඳුනා ගැනීම ය.

රාජ්‍යය යනු සිවිල් සමාජය යයි එසේ අර්ථ නිරූපණය කළ ද කාලයාගේ ඇවෑමෙන් රාජ්‍යය එම භූමිකාවට පටහැනිව ක්‍රියා කරමින් පුද්ගලයාගේ ජීවිතය, දේපළ සහ නිදහස ආරක්ෂා කිරීම වෙනුවට ඒවාට බාධා කරන සීමා පනවන බලයක් බවට පෙරළිණ. මෙහි ප්‍රතිඵලය වූයේ සමාජයේ සාමාජිකයන් තම සිවිල් සමාජය ආරක්ෂා කර ගැනීමටත් සමාජයේ ශිෂ්ටබව ආරක්ෂා කර ගැනීමටත් සිවිල් සමාජ සංවිධාන ගොඩනගා ගැනීම ය. මේ සිවිල් සමාජය පිළිබඳ තුන්වන හඳුනා ගැනීම ය. මෙය ඇලෙක්සිස් ඩි. ටොක්විල් සහ තෝමස් පේන් යන දෙදෙනාගේ අදහස්වල සංකලනයකි. සිවිල් සංවිධාන සිවිල් සමාජය ලෙස හඳුනා ගන්නේ රාජ්‍යයට පෙර පැවති යහපත් සමාජය සහ එහි ධර්මතාවන් ආරක්ෂා කර ගැනීම මේ සංවිධානවල වගකීම බවට පත් වන නිසා ය. සිවිල් සමාජ සංවිධාන රාජ්‍යයෙන් බාහිරව පවතින නිසා ඒවා රාජ්‍ය නොවන අංශයට අයත් වෙයි. ඒවා එම නිසා රාජ්‍ය නොවන සංවිධාන යනුවෙන් ද හඳුන්වයි. රාජ්‍ය නොවන අංශයට පෞද්ගලික ව්‍යාපාර ද අයත් වන නිසා මේවා හැඳින්වීමට සුදුසු ම යෙදුම වන්නේ සිවිල් සමාජ සංවිධාන යන්න ය.

## 3. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය

විසිවන සියවස වන විට රාජ්‍ය වගකීම පාලනය කිරීම නොව ප්‍රතිපත්ති සම්පාදනය මගින් සමාජ ගැටලු විසඳීමට මග පෙන්වීම බවට පෙරළුණි. රාජ්‍යය සහ දේශපාලනය ප්‍රතිපත්ති නිර්මාණ ක්‍රියාවක් වශයෙන් හඳුනා ගැනීම ආරම්භ විය. එයට හේතුව සමාජ ගැටලු සංකීර්ණ වීමත් ඒවා විසඳීම සඳහා දැනුම හෙවත් විද්‍යාව යෙදවීමත් අවශ්‍ය වීම ය. කාර්මිකකරණය විසින් රාජ්‍යය, වාණිජ්‍යය සහ වෙළඳපළ යන අංශවලට තාර්කික සංවිධානයක් අවශ්‍ය විය. දාර්ශනිකයන් ප්‍රකාශ කළේ "ලෝකය ප්‍රහේලිකාවලින් පිරී ඇත. ඒවාට විසඳුම් සෙවිය හැක්කේ දැනුම සහ නිවැරදි හේතු යුක්තිය ඒකාබද්ධ කිරීමෙන්" බව ය. චාර්ල්ස් මේනාඩ් කේන්ස් මෙම අදහස ආර්ථික ක්ෂේත්‍රය මුල් කර ගෙන ඉදිරිපත් කළේ ය. ඔහු දැන් බුද්ධි තොරතුරු සංවිධානය කිරීම (*organized intelligence*) මගින් ප්‍රශ්න විසඳීමට මග පෙන්වීම අවශ්‍ය වී තිබෙන බව පෙන්වා දුන්නේ ය. මෙය වෙළඳපළට හෝ පුද්ගලික හෝ සිවිල් උත්සාහයන් මගින් සාර්ථකව කළ නොහැකි ය. එම හැකියාව ඇත්තේ රජයට යයි ඔහු පෙන්වා දුන්නේ ය. මේ අන්දමට විසිවන සියවස වන විට ප්‍රතිපත්ති පැනවීම මගින් ප්‍රශ්න විසඳීමේ යුගයකට රාජ්‍ය පැමිණියේ ය.

සමාජ ප්‍රශ්න ඉලක්කයක් නැතිව අඳුරේ අතපත ගාන ආකාරයෙන් විසඳිය නොහැකි ය. සමාජ ප්‍රශ්න විසඳාගත යුත්තේ දිගුකාලයේ ය. ඒ නිසා ඒවා විසඳීමට ක්‍රමානුකූලව දීර්ඝකාලීන මූලෝපායන් හෙවත් රාජ්‍ය ප්‍රතිපත්ති සැකසිය යුතු ය. රාජ්‍යයට පැවරෙන වගකීම එය යි. විසිවැනි ශතවර්ෂයට පැමිණෙන විට රාජ්‍යය සම්බන්ධ ප්‍රධාන කතිකාව වූයේ ද එය යි. බුද්ධි තොරතුරු සංවිධානය කිරීම පහසු කාරණයක් නොවේ. ඒවා ක්‍රමානුකූලව එකතු කර, ඒවා තාර්කික විශ්ලේෂණයට යොමු කර, විකල්ප විසඳුම් හඳුනා ගත යුතු ය. ඒවා අතර සැසඳීම් සිදු කරමින් ඒවායින් වඩාත් ප්‍රායෝගික වන විකල්පය තෝරා ගැනීම කළ යුතු ය. ප්‍රතිපත්තියක් නිර්මාණය කළ යුත්තේ ඒ අන්දමට ය. මේ ආකාරයට බුද්ධි තොරතුරු පර්යේෂණාත්මකව එකතු කිරීම, ගබඩා කිරීම, අධ්‍යයනය කිරීම, සිදු කරන රාජ්‍යයක අවශ්‍යතාව විසිවන සියවස වන විට පැන නැගුණි. ඊට හේතුව වන්නේ සමාජ ප්‍රශ්නවලට අදාළ සන්දර්භය විවිධ, පුළුල් සහ ගැටලු සහගත වීම ය.

එම සියවස සමග රාජ්‍යය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට එළඹෙන

අතර සමාජය වෙත මැදිහත් වීම විවිධාකාරයෙන් සිදු කරන්නට පටන් ගත්තේ ය. ආර්ථික ප්‍රතිපත්තිය, අධ්‍යාපන ප්‍රතිපත්තිය, සෞඛ්‍ය ප්‍රතිපත්ති, විදේශ ප්‍රතිපත්තිය වැනි ප්‍රතිපත්ති නිර්මාණය මගින් සුබසාධක රාජ්‍යය ඇති වී ඇති කරන ලද මැදිහත් වීම ව්‍යාප්ත වන්නට පටන් ගත්තේ ය. මේ නිසා ම සිදු වූ දෙයක් වන්නේ බලවත් කණ්ඩායම් සහ ව්‍යාපාරික ආයතන රාජ්‍ය බලය හැසිරවීමට මැදිහත් වීම ය. එවිට රාජ්‍යය වඩා වඩාත් බලධාරී තත්ත්වයක් අත් කර ගත්තේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ සිවිල් සමාජය පවත්වා ගැනීමට රාජ්‍යයට පැවරුණු මුල් වගකීම රාජ්‍යය විසින් පැහැර හරින තත්ත්වයක් ඇති වීම ය.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල දී සිවිල් සමාජය වෙනුවෙන් පෙනී සිටීම සඳහා සමාජය විසින් විවිධ ස්වේච්ඡා සංවිධාන ගොඩ නගා ගැනීම ද මේ නිසා සිදු විය. රාජ්‍යය විසින් පුද්ගල නිදහස, දේපළ, අයිතිවාසිකම් වැනි දේවල් උදුරා ගන්නේ නම් ඊට මැදිහත් වීම සඳහා සිවිල් සංවිධාන ක්‍රමිකව ගොඩනැගේ. සමාජයේ සාමාජිකයන් රාජ්‍යයේ මැදිහත් වීමක් රහිතව අන්‍ය සාමාජිකයන් සමග සම්බන්ධව තම අවශ්‍යතා ඉටු කර ගැනීම ද ඕනෑ ම සමාජයක සිදු වෙයි. නිදහස් සමාජයක දී සිවිල් සංවිධාන එම කාර්ය සඳහා ද පැන නගින අතර රාජ්‍යය සිය මැදිහත්වීම් මගින් මෙම නිදහස් ජීවිතයට බලපෑම් කරන්නට පටන් ගතහොත් එම තත්ත්වයන් පාලනය කර ගැනීමට ද මෙම සංවිධාන පිහිටුවයි. මෙම සිවිල් සමාජ සංවිධානවල කාර්යය අද ඉටු කරන්නේ රාජ්‍ය නොවන සංවිධාන ලෙස හඳුන්වන ආයතනයන් ය.

ගුණධර්ම පදනම් කර ගත් ශිෂ්ටසම්පන්න සමාජය හෙවත් සිවිල් සමාජය ආරක්ෂා කිරීමේ වගකීම නූතන ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පැවරෙන්නේ මෙම සංවිධානයන්ටය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යවස්ථාව රාජ්‍ය නොවන සංවිධානවලට නිල පිළිගැනීමක් ලබා දී එහි සමාජ ආර්ථික සහ සංවර්ධන වගකීම් ද මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම් ද සඳහා ඒවා සම්බන්ධ කරගෙන සිටින්නේ එම නිසා ය.

## 4. සිවිල් සමාජය සහ දුර්විනීත සමාජය

අපි සිවිල් සමාජය යන යෙදුම පාවිච්චි කරන්නේ ජෝන් ලොක් පැහැදිලි කළ විනීත සමාජය යන අදහසිනි. නමුත් විනීත සමාජය වෙනුවට දුර්විනීත සමාජය (*uncivil society*) ප්‍රවර්ධනය කරන සංවිධාන ද සමාජයේ තිබේ. බොහෝවිට බල කණ්ඩායම් සහ පාලක පන්තිය සමග සම්බන්ධ වී විවිධ බල අරමුණු සඳහා සමාජය බේද කරන ජාතිවාදය, ආගම්වාදය වැනි කාරණා නඩත්තු කරන සංවිධාන ද සමාජය තුළ ක්‍රියාත්මක වෙයි. මේවා රාජ්‍යයෙන් බැහැරව පවතින නිසා රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් හැඳින්වීමට පුළුවන. නමුත් ඒවා සිවිල් සමාජ සංවිධාන වශයෙන් හැඳින්විය නොහැකි ය. මන්ද ඒවා සිවිල් හෙවත් විනීත සමාජය වෙනුවෙන් නොව දුර්විනීත සමාජය වෙනුවෙන් පෙනී සිටින නිසා ය.

මේ නිසා සිවිල් සමාජ සංවිධාන යනු සමාජයේ පොදු යහපත උදෙසා මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ අනාගත පැවැත්ම සඳහා අවශ්‍ය වන නිදහස් කතිකාව, ප්‍රජාතන්ත්‍රවාදය සහ අයිතිවාසිකම්කම් පිළිබඳ කතිකාව ඉදිරියට ගෙන යන සංවිධානයන් ය. දුර්විනීතභාවය සහ අවිනීතභාවය ප්‍රවර්ධනය කරන සංවිධාන සැබෑ සිවිල් සමාජ සංවිධාන නොවේ. ඒවා වෙනත් ස්වරූපයකින් පෙනී සිටින රාජ්‍යයේම දිගුවන් හෝ බල අවශ්‍යතා අනුව සමාජය අයහපත් මාර්ගවලට ගෙන ගොස් සමාජයේ ශිෂ්ට බව විනාශ කරන සංවිධානයන් ය. ඒවා පෙනී සිටින්නේ රාජ්‍ය බලය හිතුවක්කාරීව භාවිත කරන ඒකාධිපති, හිතුවක්කාර පාලකයන් වෙනුවෙනි.

විනීතභාවය වෙනුවෙන් පෙනී සිටින සිවිල් සමාජ සංවිධානවලට වගකීම් ගණනාවක් පැවරේ. රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය වීමේ දී සමාජයේ පොදු ගැටලු අමතක කොට පක්ෂග්‍රාහී ලෙස ප්‍රතිපත්ති නිර්මාණය කිරීම වළක්වා ගැනීම එක් අවශ්‍යතාවකි. ඒවාට විකල්ප වූ ප්‍රතිපත්ති පිළිබඳ සංවාදයක් සමාජයේ ඇති කළ යුතු ය. රාජ්‍ය ප්‍රතිපත්ති ඔස්සේ ද මිනිසුන්ගේ ජීවිතවලට අත පෙවිය හැකි ය. එනම් රාජ්‍යය ප්‍රතිපත්ති මගින් ඉදිරිපත් වන මූලෝපායික ක්‍රියාමාර්ග මගින් මනුෂ්‍යයාගේ ජීවිතය, දේපළ සහ නිදහසට මැදිහත් වීම හේතුවෙන් මනුෂ්‍යයාගේ නිදහස සහ අයිතිවාසිකම් තර්ජනයට ලක් වේ. එවැනි ප්‍රතිපත්තිවලට විකල්ප වූ ප්‍රතිපත්ති සකස් කිරීමටත් ඒවා පිළිබඳ සැබෑ මහජන මතයක් සකස් කිරීමටත් සිවිල් සමාජ සංවිධානවලට පැවරෙයි.

ප්‍රතිපත්ති නිර්මාණය වීමේ දී සමාජයේ ඇති ශිෂ්ටභාවය සහ විනීතභාවය ආරක්ෂා වීම ද අනිවාර්යය.

ප්‍රතිපත්තිවල ද සදාචාරාත්මක පැත්තක් තිබේ. ප්‍රතිපත්ති නිර්මාණය වීමේ දී සමාජයේ තිබෙන සදාචාරයට ද ඒවා එකඟ විය යුතු ය. ප්‍රතිපත්ති විද්‍යාව හඳුන්වා දුන් මහාචාර්ය හැරල්ඩ් ලාස්වෙල් මේ පිළිබඳව සාකච්ඡා කළේ 1950ස් ගණන්වල දී ය. *Politics: who, what, when, how* යනුවෙන් ඔහු විසින් රචනා කරන කෘතියේ මේ පිළිබද අදහස් දක්වා තිබේ. ඔහු දේශපාලනයේ මූලික කාර්යය ප්‍රතිපත්ති නිර්මාණය යැයි සඳහන් කළේ ය. සෑම රාජ්‍ය ප්‍රතිපත්තියක් ම සමාජයට යම් දෙයක් ලබා දෙන අන්දම තීරණය කරයි. එය කුමක් ද, එය ලැබෙන්නේ කවුරුන්ට ද, කෙසේද, කොයිවෙලේ ද යනාදී කාරණා තීරණය කරන්නේ ප්‍රතිපත්ති විසිනි. එම නිසා ඔහු දේශපාලනය දෙස බැලුවේ අවසානයේ දී ප්‍රතිපත්ති මගින් සමාජ ඵලය බෙදා හැරීම තීරණය කරන ක්‍රියාවක් වශයෙනි. මෙය ප්‍රතිපත්ති පිළිබඳව සමාජ ආර්ථික, සංස්කෘතික සහ බලය පිළිබඳ සාධක බලපාන ආකාරය පැහැදිලි කිරීමකි. සංස්කෘතික සාධක ඔස්සේ ඔහු සමාජයේ සදාචාරාත්මක පිළිගැනීම් ද අනුගමනය කිරීමට රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාපාකයන්ට සිදු වන බව පෙන්වා දුන්නේ ය. පසුව ඔහු ප්‍රතිපත්ති නිර්මාණයට බලපාන දැනුම සංජානනය කිරීමේ මනෝ විද්‍යාත්මක සාධක ගැන ද සාකච්ඡා කළේය. මේ සාකච්ඡාවෙන් මතුවුණ තවත් කාරණයක් වන්නේ ප්‍රතිපත්තිවලින් ප්‍රතිලාබ නොලබන අය ගැන කතා කිරීමට ලබා දෙන ලද මග පෙන්වීම ය. කාට ද ලැබෙන්නේ පමණක් නොව කාට ද නොලැබෙන්නේ, කාට ද වැඩියෙන් ලැබෙන්නේ යන සමාජ අසාධාරණය පිළිබඳ කාරණාව ද වැදගත් ය. සමහර ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සමාජයේ ඇතැම් කණ්ඩායම් එම ප්‍රතිපත්තිය මගින් සලකා නොලබන අවස්ථා ද එමට ය. දුප්පත් මිනිස්සු, පීඩිත ජනකොටස්, පීඩිත සංස්කෘතීන්, සුළුතර ජනවර්ග ඇතැම් ප්‍රතිපත්ති සම්පාදකයන්ට නොපෙනේ. රාජ්‍යය ප්‍රතිපත්ති සකස් කළ විට ඒවායේ ප්‍රතිලාභ වැඩියෙන් ලැබීම, අඩුවෙන් ලැබීම සහ කිසිවක් නොලැබීම යන පැතිවලින් හඳුනාගත හැකි සමාජ කණ්ඩායම් වෙනුවෙන් පෙනී සිටීම ද මේ නිසා සිවිල් සමාජ සංවිධානවලට පැවරෙන වගකීමකි.

ප්‍රතිපත්තියක් යනු එක මොහොතින් තීරණය කළ හැකි යමක් නොවේ. ඒවා දිගුකාලීනව. අධ්‍යයනයන් සහිතව තීරණය කළ යුතු දේවල් ය. සමාජයේ ඇතැම් ප්‍රශ්නවලට උත්තර සකස් කළ යුතු වන්නේ ටිකෙන් ටික ය. ඇතැම් ප්‍රශ්න ඒ තරම් සංකීරණ වේ. සියලු දේ එකට එකතු කොට ලේඛනයක පිටපත් කළ පමණින් ඒවා ප්‍රතිපත්ති බවට පත් නොවේ. සමාජයේ විවිධ පාර්ශ්වයන් සිටින අතර ඒ සියලු අයගේ අවශ්‍යතාවන් තේරුම් ගත හැක්කේ යම් කාලයක් යන විට ය. මේ නිසා ප්‍රතිපත්ති ක්ෂේත්‍රය තුළ මැදිහත් වීමක් සිදු කිරීමට සිවිල් සමාජයට විශාල වගකීමක් තිබේ.

### 5 සිවිල් සමාජ සංවිධානවල සමාජ වගකීම

සිවිල් සමාජ සංවිධානවලට ගැඹුරු වගකීම් ප්‍රමාණයක් තිබේ. රාජ්‍යය නිර්මාණය වන අවස්ථාවේ තිබුණා වූ ශිෂ්ට සමාජය විසින් තමන්ම ස්වභාවික නීති ඔස්සේ ගොඩනගාගෙන තිබුණු දේපළ, අයිතිවාසිකම්, නිදහස, ජීවිතය ආදිය පිළිබද මූලධර්මයන් ආරක්ෂා කරගත යුතු ය. එවා රාජ්‍ය ආක්‍රමණයෙන් බේරාගත යුතු ය. පෙර කී ශිෂ්ටත්වය ඉදිරියට ගෙන යෑමේ පොරොන්දුව මත රාජ්‍යය බිහි විය. ජෝන් ලොක්ට පෙර රාජ්‍යයේ ආරම්භය ගැන කතා කළ තෝමස් හොබ්ස් පවසන පරිදි රාජ්‍යය පැමිණියේ සමාජයට සාමය ගෙන දීමේ පොරොන්දුව මත ය (*peace promised state*). අර්බුද සහිත සමාජයට සාමය ගෙනත් දීමට පොරොන්දු වීමෙන් රාජ්‍ය ඇති වූ බව ඔහු තර්ක කළේ ය. ලොක් නිදහස, ජීවිතය, දේපළ පිළිබද පොරොන්දු ලබා දෙන්නේ ඉන් අනතුරුව ය. මේ අන්දමට රාජ්‍යයට පැවරී තිබෙන සාමය, ජීවිතය, දේපළ හා නිදහස පිළිබඳ වගකීම් නිතර සිහිගන්වමින් රාජ්‍යය සහ නිදහස් පුරවැසියා අතර ඇති සම්බන්ධය පවත්වා ගැනීම ද සිවිල් සමාජ සංවිධානවල වගකීම ය.

මුල දී සඳහන් කළ අන්දමට සිවිල් සමාජ සංවිධානවල වගකීම ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීම මගින් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඒවා සවිබල ගැන්වීමට විශාල කාර්යභාරයක් ඉටු කර ඇත. එහි ව්‍යවස්ථාවෙන් ආර්ථික හා සාමාජික කවුන්සිලයට පවරා තිබෙන වගකීම වන රාජ්‍යය නොවන සංවිධාන ද එකතු කර ගෙන සමාජ ආර්ථික ප්‍රශ්නවලට විසදුම් සෙවීම අද බොහෝ ශක්තිමත් පදනමක් සිවිල් සමාජ සංවිධානවලට ගොඩ නංවා තිබේ. මේ

නිසා ලෝකයේ සියලු ශිෂ්ටසම්පන්න සමාජයක්ම සිවිල් සංවිධාන පිළිගෙන තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම්, සිවිල් නිදහස මත පදනම්ව පවතින සමාජයන් මෙය පිළිගෙන තිබේ.

ඇලසිස් ඩි. ටොක්විල් නැමති දේශපාලන ලේඛකයා එක්දහස් අටසිය ගණන්වල ප්‍රංශයේ සිට ඇමරිකාවට ගොස් එහි විවිධ ප්‍රදේශවල ඇවිද කෘතියක් රචනා කළේ ය. ඔහු එහි සඳහන් කරන්නේ ඇමරිකානුවන් තම අසල්වැසියන් සමග විවිධ කාරණා ඉටු කර ගන්නට ස්වේච්චා සංවිධාන පිහිටුවා ගෙන රාජ්‍යයේ ආධාර හෝ මැදිහත්වීම් නොමැතිව වැඩ කරන බව ය. එක් පුද්ගලයකු මේ අන්දමට සංවිධාන ගණනාවකට සහභාගි වන අතර මේ නිසා සමාජය සිවිල් සමාජ සංවිධාන ජාලයක් මගින් මෙහෙයවන බව දුටු ඔහු සඳහන් කළේ ඇමරිකාව සාංගමිකයන්ගේ ජාතියක් (*nation of joiners*) වශයෙන් හැඳින්විය යුතු බව ය. මේ අන්දමට ඔහු දුටු සිවිල් සමාජය බොහෝ ප්‍රජාතන්ත්‍රවාදයන් තුළ අද දැකිය හැකි ය. රාජ්‍යය මැදිහත් වීමකින් තොරව තමන්ගේ වැඩ කර ගැනීමේ ක්‍රියාවලියක් මේ සමාජයන් තුළම තිබේ. නව ලිබරල්වාදී කතිකාවන් පැමිණීමත් සමග මිනිස්සු ධනය සෙවීම සඳහා අනෙකා පරයා යන්නට ගොස් හුදකලා වෙමින් තමන්ගේ කුටුම්භවලට පමණක සීමා වී සිටින මිනිසුන් පිරිසක් බිහි වී තිබීම නිසා මේ සිවිල් සමාජය දුර්වලවීම මෑත කාලවල දක්නට ඇත. මෙය ඇමරිකානු සමාජය තුළ ද දැකිය හැකි ය. මේ නිසා අද සිවිල් සමාජය නැවත ශක්තිමත් කිරීමත් ඒ සඳහා පුරවැසියන්ගේ සහභාගීත්වය වර්ධනය කිරිමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීමත් සිවිල් සමාජ සංවිධානවල වගකීමක් බවට පත් වී තිබේ. මේ දිනවල පවතින කෝඩ්ඩ් වසංගතය විසින් ද පෙන්වා දී තිබෙන්නේ රජය මත යැපෙන්නේ නැතිව සිවිල් සමාජය තමන්ගේ පුරවැසි සංවිධාන ද සම්බන්ධ කර ගන්නේ නම් එයට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය ගොඩ නගා ගැනීමට හැකි බව ය. මෙයින් පෙන්වා දෙන්නේ සිවිල් සමාජය ඉදිරියට ගෙන යෑම සදහා සිවිල් සංවිධානවල වගකීම අනුල්ලංඝනීය තත්ත්වයක් බව ය.

සිවිල් සමාජ සම්බන්ධතා හරහා ගමන් කරන සංවර්ධන ක්‍රියාදාමය දෙස බලන විට පෙනෙන්නේ සුබසාධනය මත රැඳී නොසිට තමන්ගේ ශක්‍යතාවන් ගොඩනාගා ගනිමින් සවිබලකරණය වීම සඳහා අවස්ථාව සලසා ගැනීමට සිවිල් සමාජ සංවිධාන පසුගිය කාලයේ විශාල කාර්යභාරයක් අපේ රටවල ඉටු කළ බව ය. රාජ්‍යය සංවර්ධනය වෙනුවෙන් වැඩ කරන්නේ තමන්ගේ බලය ව්‍යාප්ත කිරීමේ අරමුණින් ය. ඔවුන් කොළඹ තිබෙන බලය ගම දක්වා ගෙන යන්නට එය යොදා ගනියි. එවිට ගම්වල තිබෙන සිවිල් ක්‍රියාමාර්ග සංස්කෘතික සබඳතා කඩා බිඳ ගෙන යන්නට ඔවුන් කටයුතු කරයි. ඔවුන් සමාජයට ගෙන යන්නේ ඔවුන්ගේ බලයයි. ජාති, සංස්කෘතික සහ ආගමික යනාදී සියලු බැමි කඩා බිඳ දාගෙන ඉදිරියට යෑම ඔවුන්ගේ සිරිත ය. එවිට රාජ්‍යය සංස්කෘතිය සමග ද සමාජය සමග ද ග්‍රාමීය ජනයා සමග ද විවිධ ගැටුම් ඇති කර ගනියි. එවිට ඒවාට එරෙහිව සමාජය සවිබල ගැන්වෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාව පැන නගී. එය පැවරෙන්නේ ද සිවිල් සමාජ සංවිධානවලට ය.

## 6. සිවිල් සමාජ සංවිධාන සහ ශ්‍රී ලංකාව

මෙරට සිවිල් සංවිධානවල ඉතිහාසය බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය දක්වා දිව යයි. පළමු සිවිල් සංවිධාන පැන නගින්නේ ආගමික පුනර්ජීවන ව්‍යාපාරයන් සමග ය. බෞද්ධ පරම විඥානාර්ථ සමාගම, බෞද්ධ හින්දු සහ මුස්ලිම් අධ්‍යාපන සංවිධාන, අමද්‍යප ව්‍යාපාරය, ඉංග්‍රීසි උගතුන්ගේ සහ දේශීය ව්‍යාපාරිකයන්ගේ සංවිධාන සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ සංවිධාන මුල් රාජ්‍ය නොවන සංවිධාන අතර විය. පසුව කම්කරු ව්‍යාපාර සහ වාමාංශික පක්ෂ ඉදිරියට පැමිණි අතර ඔවුන් විසින් සාමාන්‍ය ජනතාව සංවිධානය කිරීම ඇරඹිණි. සුබසාධක රාජ්‍යය තිහේ දශකයේ දී ඉදිරියට පැමිණි අතර ජනතාව රාජ්‍යය දෙසත් දේශපාලන සටන් ව්‍යාපාර දෙසත් බලන්නට පටන් ගත්තේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ රාජ්‍ය නොවන සංවිධාන පැන නැගීම අඩපණ වී ආගමික කණ්ඩායම් තම ආගම්වල ව්‍යාප්තිය සඳහා, තම ආගමික අරමුණු සඳහා යම් සංවිධාන පිහිටුවීමයි.සමාජ සංවර්ධනය ඉලක්ක කර ගෙන 1960 දශකයේ දී සර්වෝදය සංවිධානය පිහිටුවනතුරු රාජ්‍ය නොවන සංවිධාන සිවිල් සමාජ අරමුණු මුල් කර ගෙන ලංකාවේ ක්‍රියාත්මක වූයේ නැත. 1971 තරුණ කැරැල්ල ඇති වී සිවිල් අයිතිවාසිකම්

කඩ වීම් සිදු වන විට මර්ජ් සංවිධානය පිහිටුවීම සිදු විය. එයින් පසුව සිවිල් අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ නැවත ක්‍රියාත්මක වීමක් 1990 දශකයේ දී සිදු විය. මව්වරුන්ගේ සංවිධානය මෙහි දී කැපී පෙනෙන කාර්යයක් ඉටු කළේය.

ලංකාවේ 1980 ගණන්වල සිට 90 ගණන්වලට එන විට රාජ්‍යය මැදිහත් වීමෙන් විශාල අයිතිවාසිකම් කඩවීම් සිදු වන්නට විය. මානව අයිතිවාසිකම් පිළිබඳ කතිකාවක් ඇති වන අතර මේවා පිළිබඳ මැදිහත්වීම් කරන සිවිල් සංවිධාන බිහි විය. ලංකාවේ රාජ්‍ය නොවන අංශයට ජනසවි වැඩසටහන ඔස්සේ විශාල තල්ලුවක් ලැබුණි. එමෙන් ම මානව අයිතිවාසිකම් කඩ වීම, යුද්ධය, ජනවාර්ගික ගැටුම ආදී තත්ත්වයන් හමුවේ රාජ්‍යය ද ත්‍රස්තවාදීන් හා සමාන තත්ත්වයට වැටීම නිසා ද මානව අයිතීන් ආරක්ෂාව සහ සාමය වැනි කාරණා උදෙසා සමාජ සංවිධාන පැන නැගුණි. මේවා ඔස්සේ ද රජයේ ප්‍රතිපත්ති, මූලෝපාය ප්‍රශ්න කිරීමක් සිදු විය.

මා දකින පරිදි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බිහි වන්නේ රජයේ ප්‍රතිපත්ති ප්‍රශ්න කරන විකල්ප විසඳුම් සෙවීමට අවස්ථාව පැන නැගුණ යුගයේ ය. පසුගිය කාලයේ මෙම ආයතනය බොහෝ සමාජ මැදිහත්වීම් සිදු කර තිබේ. සාමය, බලය බෙදා හැරීම, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇති කිරීම, මානව අයිතිවාසිකම් සහ ව්‍යවස්ථා ආරක්ෂා කිරීමේ පැත්තෙන් ද මැදිහත්වීම් සිදු කර තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම් හමුවේ අධිකරණ ක්‍රියාමාර්ගයන්ට ද මෙම ආයතන ගොස් තිබේ. මේ ආකාරයට විවිධ පැතිකඩ ඔස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කටයුතු කර තිබේ.

ලංකාවේ ගැටලුව වන්නේ තමන්ගේ සිරුර තුළම සිටින සිවිල් මිනිසා ගැන පුරවැසියාට හරිහැටි අවබෝධයක් නොමැතිකම ය. නිද්‍රාවක සිටින මේ සිවිල් මිනිසා නැගිටවීමේ ප්‍රශ්නය ද බලපතළ ය. රාජ්‍යය මේ අය විවිධාකාරයෙන් සිය ග්‍රහණයට ගෙන තිබේ. යටත් විජිත කාලයේ සිවිල් සමාජ ආරම්භ වීම ගැන සොයා බල්නේ නම් මේවා පැමිණියේ ආගමික උද්ඝෝෂණ සමග ය. ආගමික උද්ඝෝෂණය හරහා පැමිණි සංවිධාන යටත් විජිත විරෝධයක නිරත විය. බෞද්ධ පුනර්ජීවනය, අමද්‍යප ව්‍යාපාරය වැනි සංවිධාන ඇති විය. පසුව වමේ ව්‍යාපාරය ඉදිරියට පැමිණියේ ය. නිදහස ලැබූ කාලය වන විට රාජ්‍ය මැදිහත් වීම තදබල විය. මේ නිසා ලංකාවේ ජනතාව රාජ්‍යයවාදීන් (*statists*) බවට පත් වී තිබේ. එයින් ප්‍රකාශ කරන්නේ සියලු දේ නිවැරදිව කරන්නේ රාජ්‍යය විසින් ය යන අදහසේ ඔවුන් සිටින බව ය. මේ ක්‍රියාවලියේ දී රාජ්‍යය සිවිල් සමාජ සංවිධානය හඳුන්වා ඇත්තේ රාජ්‍ය ද්‍රෝහී, බටහිර ගැති, විදේශීය අධිරාජ්‍යවාදී උපක්‍රම වෙනුවෙන් පෙනී සිටින අය විදියට ය. 'එන්.ජී.ඕ කාරයෝ' යන යෙදුම පරිභව කරන ආකාරයෙන් ලේබල්කරණය කර තිබෙන්නේ ඒ නිසා ය. මෙය හිතාමතා කරන වැඩකි.

### 7. සිවිල් සංවිධාන සහ ශ්‍රී ලංකාවේ රාජ්‍යය

මෙහි දී අප රාජ්‍යය යන යෙදුම භාවිත කළ ද මෙම ක්‍රියාමාර්ග ගනු ලබන්නේ රාජ්‍යය වෙනුවෙන් මෙය පාලනය කරන ප්‍රභූ කණ්ඩායම ය. නැතිනම් පාලක පංතිය විසින් ය. ඔවුන් සිවිල් සමාජ සංවිධාන දකින්නේ තරඟකාරී ආයතන හැටියට ය. 71 කැරැල්ලේ සිට යම් යම් රාජ්‍ය මැදිහත්වීම් නිසා සමාජයේ අයිතිවාසිකම් උල්ලංඝනය වන විට මර්ජ් වැනි සංවිධාන එදා ඉදිරියට පැමිණියේ ය. ඒ කාලයේ රාජ්‍යයේ පාලක පංතිය මේවා දැක්කේ තමන්ගේ සතුරු කණ්ඩායම් හැටියට ය. යුද සමයේ දී ද එසේ ය. යුද්ධයේ දී මානව අයිතිවාසිකම් කඩවීම් සිදු විය. ඒවා ගැන සඳහන් කරන විට, යුද්ධය දේශපාලන අවියක් සේ පෙන්වා මෙම ගැටුම සිංහල ජනතාවගේ රාජ්‍ය බලයට විරුද්ධව සිදු කරන යුද්ධයක් ලෙස හඳුන්වා, සිවිල් සමාජ සංවිධාන ඒ වෙනුවෙන් පෙනී සිටිනවා යන මතය සමාජය ගත කිරීමට රාජ්‍යය උත්සාහ කරනු ලැබී ය. ඒ ඔස්සේ සාමාන්‍ය සමාජය තුළ සිවිල් සංවිධාන කෙරෙහි අනියත භීතියක් මවා පා තිබේ.

ලංකාව වැනි රටවල රාජ්‍යය සිවිල් සමාජය හඳුනාගන්නේ තමන්ගේ හිතවාදීන් හැටියට නොව සතුරන් හැටියට ය. බොහෝ ආසියාතික රාජ්‍යයන්වල තත්ත්වය මෙසේ ය. නමුත් යුද්ධය පැවති කාලයේ උතුරු නැගෙනහිර පළාත්වල වැඩ කර ගැනීමට සිවිල් සංවිධානවල දායකත්වයෙන් තොරව ආණ්ඩුව පවා අපොහොසත් විය. ඒ නිසා එවැනි සංවිධානවලට වැඩ කිරීමට අවස්ථාව ලැබිණි. සිවිල් සංවිධානවලට වැඩි කිරීම සඳහා ආණ්ඩුවේ ආයතන ද මුදල් සපයනු

ලැබී ය. සේවා ලංකා, වර්ල්ඩ් විෂන් සහ සර්වෝදය වැනි ආයතන ඒ පැතිවල වැඩ කළේ ය. එල්.ටී.ටී.ඊ සංවිධානය ද ඊට කැමති විය. ඒ පෙදෙස්වල මිනිසුන්ගේ ජීවිතවල අවශ්‍යතා සැපිරීමට කවුරුන් හෝ සිටිය යුතු නිසා රාජ්‍යය මෙන්ම එල්ටීටීය ද එසේ කරන ලදි. රාජ්‍යය සිවිල් සංවිධානවල උදව් උපකාර ලබා ගැනීම සිදු විය. වර්තමානයේ දී ද සංවර්ධන ක්ෂේත්‍රයේ වැඩ කිරීමට මේ අකාරයේ උදව් උපකාර ලබා ගනී. ප්‍රාදේශීය නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් වැනි අය එවැනි නොයෙක් වැඩ සිවිල් සංවිධාන ඔස්සේ කර ගැනීම සාමාන්‍ය දෙයකි.

නමුත් සාමාන්‍යයෙන් පවතින රාජ්‍ය කතිකාව තුළ සිවිල් සමාජ සංවිධාන තමන්ගේ හවුල්කරුවකු වශයෙන් දකින්නට රාජ්‍යය අකමැති ය. ජනසවිය සමයේ සර්වෝදයට කළ හිරිහැර ඊට නිදසුන් ය. සර්වෝදය වැනි ආයතනවලට දීර්ඝකාලීනව ඇති සමාජීය පදනම සහ ඔවුන්ගේ උපක්‍රමශීලී බව නිසා ඔවුන්ගේ කටයුතු හොඳින් සිදු වේ. නමුත් ප්‍රේමදාස යුගයේදී එම ආයතනයට නොයෙක් හිරිහැර එල්ල විය. ඉන් පෙනේන්නේ මේ රටවල සිවිල් සමාජය නියෝජනය කරන අයට තැනක් නොමැති බව ය. නමුත් සමාජය දුර්විනීත කරන, සමාජයේ අවිනීතභාවය පතුරුවන සංවිධානවලට ඉඩක් තිබේ. ජාතිවාදය, ආගමික ගැටුම් ඇති කරන සංවිධාන ඉදිරියේ රාජ්‍යය නිහඬය.

## 8. ඉදිරි අභියෝග

මෙවැනි අභියෝග හමුවේ සිවිල් සමාජ සංවිධානවලට උපක්‍රමශීලීව වැඩ කිරීමට සිදු වේ. එක් ගැටලුවක් වන්නේ ඒ සඳහා අවශ්‍ය ශක්තිමත් ආර්ථික පදනමක් නොමැතිකම ය. තමන්ගේ ම වූ ආර්ථික පදනමක් සකස් කර ගැනීම ගැන සිතිය යුතු ය. සිවිල් සමාජ සංවිධානවල සාමූහිකත්වයක් ගොඩ නැගීම මේ සඳහා මුල පිරීමකි. හරි නම් සිදු විය යුතු වන්නේ අනෙක් ශිෂ්ටසම්පන්න රාජ්‍යයන්වල සිදු කරන ආකාරයට රාජ්‍ය විසින් මෙම සංවිධානවලට මූල්‍ය ප්‍රදානයන් ලබා දීම ය. ඒය කවදාවත් මේ රටේ සිදු වන්නේ නැත. ඒ නිසා සිවිල් සංවිධාන තමන්ගේ ස්වාධීන පැවැත්ම පිළිබඳ සිතිය යුතු ය.

එහි දී වැදගත් වන්නේ ස්වාධීන මූල්‍ය සම්පත් සකස් කර ගැනීම ය. එසේ ම මෙම සිවිල් සංවිධාන අතරේ පුළුල් වූ සහයෝගීතාවක් නිර්මාණය විය යුතු ය. අපේ බොහෝ සංවිධාන වැඩ කරන්නේ තනි තනි ව සහ තරඟකාරී ආකාරයට ය. මෙම සංවිධාන එකට එකතු වී යම් පොදු වැඩ පිළිවෙළක් සකස් කර ගෙන එක් සංවිධාන පද්ධතියක් තුළ කටයතු කරන්නේ නම් වඩාත් ශක්තිමත් විය හැකි ය. එකම කාරණා සඳහා විවිධ ආකාරයෙන් කටයුතු කළ ද සමාන වටිනාකම් මත ක්‍රියා කරන බැවින් මූලෝපායික වැඩ සැලස්මක්, පොදු සාමූහිකත්වයක් ගොඩනගා ගත යුතු ය. නැතිනම් මෙවැනි රටක වැඩ කිරීම පහසු නැත.

බොහෝ සිවිල් සංවිධාන කොළඹ කේන්ද්‍රීය වීම සහ එකම කණ්ඩායමක් සමග පමණක් වැඩ කිරීම ද වර්තමානයේ ලංකාව තුළ සිවිල් සංවිධානවල දැකිය හැකි දුර්වලතාවකි. එහි වරදක් නැතත් සමාජයේ පහළ ස්ථරවලට මෙය ව්‍යාප්ත කිරීම ද වඩාත් අවශ්‍ය වෙයි. හොඳ සමාජ ජාලයක් හදා ගැනීම ද අනිවාර්ය ය. නිදසුනක් ලෙස සර්වෝදය වැනි ආයතනවලට එවැනි විසාල ජාලයක් ඇත. එය හොද තත්ත්වයකි. අනෙක් ආයතන එවැනි තත්ත්වයක් කල්පනා කොට නැත. ඊට හේතුව වන්නේ එක් එක් කාල පරිච්ඡේදවල තිබුණ පාලනයන්හි බලපෑමත් සමග විශාල ජාලගතවීම් වලින් වැළකී ක්‍රියා කිරීමය. මෙහි දී සිදු වන්නේ අර්බුදකාරී තත්ත්වයක දී තනි වීම සහ කොළඹට ම සීමා වීම ය. මේ තත්ත්වය වෙනස් වීමට නම් සංවිධානවල සාමූහිකයක් නිර්මාණය වීම අනිවාර්ය අවශ්‍යතාවකි. එසේ ම මේ බොහෝ ආයතනවල අභ්‍යන්තරයේ පවතින වැසුණ බව වෙනුවට විවෘතභාවයකින් වැඩ කිරීම ගැන අවධානය යොමු කළ යුතු ය. බොහෝ ආයතනවල විවෘතභාවයක් නොමැත. එම ආයතන ප්‍රජාතන්ත්‍රවාදය ගැන සාකච්ඡා කළ ද තමන්ගේ සංවිධාන අභ්‍යයන්තරයේ ප්‍රජාතන්ත්‍රවාදයේ අඩු බවක් ද දැකිය හැකි ය. විටෙක ඒවා දේශපාපලන පක්ෂ වැනි ය. ඔවුන්ගේ ද අභ්‍යන්තරයේ නායකත්වය සාමාජිකයන් ඉක්මවා ගොස් තීන්දු තීරණ ගන්නා අතර එළිපිට කතා කරන ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළත නොමැත. රාජ්‍ය නොවන සංවිධාන ද ඒ ඒ ආයතන අතර යම් යම් විවේචන අර්බුදයන්ට මුහුණ දෙන අවස්ථා පැන නගී. ඇතැම් සාමාජිකයින් ඉවත්ව ගිය පසු ඔවුන් පෙර නියෝජනය කළ ආයතන විවේචනය කිරීම වැනි දෑ සිදු කරයි. මෙවැනි අර්බුද විසඳා ගනිමින් මෙම ආයතන විවෘතභාවය පවත්වා ගැනීම, ආර්ථික ස්වාධීනත්වයක් අතපත් කර ගැනීම වැනි කාරණා ඉදිරි පැවැත්ම

සදහා වැදගත් අංග වශයෙන් දැක්විය හැකි ය. එසේ ම පහළින් පවතින සමාජය සමග මනා සබඳතා ඇති කර ගත යුතු ය. සංවර්ධනය වෙනුවෙන් වැඩ කරන බොහෝ ආයතන ගම් පුරා යමින් වැඩ කරන අතර ඔවුන් සාමාන්‍ය ජනයා සමග බැදීමක්, සබඳතාවක් ඇති කර ගෙන තිබේ. ඒ පූර්වාදර්ශ අනෙක් සංවිධාන ද අනුගමනය කිරීම වැදගත් ය.

ඇතැම් සංවිධාන රාජ්‍යයට වඩා පුරවැසියන් වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන්ට මැදිහත් වෙයි. නිදසුනක් ලෙස නව ව්‍යවස්ථා කතිකාව කරළියට පැමිණෙන අවස්ථාවේ සහ තොරතුරු පනත වැනි වඩාත් යහපත් අණ පනත් පැමිණි අවස්ථාවේ ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කරමින් කටයුතු කළේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ තවත් එවැනි සිවිල් සංවිධානයන් ය. නමුත් එම සංවිධානයන්ට පුරවැසියන්ගේ විශ්වාසය දිනා ගැනීම අපහසු වන්නේ පුරවැසියන් රාජ්‍ය මතය දැඩිව නියෝජනය කරන බැවිනි. රාජ්‍යය සමග සෘජු සම්බන්ධතාවක් ඇතැම් විට නොපැවතුණ ද මිනිසුන් සිටින්නේ රාජ්‍ය කේන්ද්‍රීය මතවාදයේ ය. රාජ්‍යය පදනම් කර ගෙන තිබෙන සංකල්පයන් නිති පතා මිනිසුන්ගේ මනසට කාවැද්දීමේ ක්‍රියාවලියක් ජනමාධ්‍යය, කලාව, අධ්‍යාපනය යනාදී මාර්ග මගින් පවත්වා ගෙන යමින් පුරවැසියන් රාජ්‍යය සමග බැඳ තබා ගැනීමේ නිරන්තර ක්‍රියාවලියක් පවතී. මේ මතවාදයට විකල්පීය මතවාදයක් ඉදිරියට ගෙන යන ජනමාධ්‍යය, සමාජ මාධ්‍යය, කලා හා සංස්කෘතික අංශයන් ගොඩ නගා ගැනීමට අවධානය යොමු කිරීම ද වැදගත් ය.

එසේ ම අප රටේ පුරවැසියන්ට පුරවැසිභාවය, රාජ්‍ය ආයතන රාජ්‍ය නොවන ආයතන සම්බන්ධයෙන් ද නිසි පුළුල් අවබෝධක් නොමැත. රජය විසින් පුරවැසියන්ට සපයන සේවා ගැන මම වරක් අධ්‍යයනයක් කළෙමි. රාජ්‍යය විසින් පුරවැසියන්ට බොහෝ සේවා සපයන අවස්ථා තිබුණ ද පුරවැසියන්ට ඒ පිළිබද අවබෝධයක් නොමැත. මා එම අධ්‍යයනයේ දී ග්‍රාමීය පුරවැසි කණ්ඩායමකින්, මිනිසුන්ට සේවා සපයන රාජ්‍ය ආයතන පහක් නම් කරන්නැයි කී විට සියයට හැත්තෑ පහක් පමණ සඳහන් කළේ සර්වෝදය ආයතනය යි. මිනිසුන් එම ආයතනය ගැන සිතා සිටින්නේ ද රාජ්‍යයේ ආයතනයක් හැටියට ය.

ඇරිස්ටෝටල් පුරවැසිභාවය පිළිබද කළ එක් ප්‍රකාශයකදී මෙසේ කියා ඇත. “ඔබ පුරවැසියකු වන්නේ මෙහි ඉපදී සිටින නිසාම නොවේ. මෙහි ඉපදී සිටින විදේශිකයන් සහ දාසයන් ද සිටී. ඔබ සහ ඔවුන් අතර තිබෙන වෙනස කුමක් ද? ඔබ නගරයේ පාලන කටයුතු පිළිබඳ තීරණ ගැනීමටත් අධිකරණ කාර්යයන් ඉටු කිරීමටත් සහභාගි වෙයි”. මෙයින් පෙන්වන්නේ පුරවැසිභාවය යනු උප්පත්තිය හඳුනා ගැනීමක් නොව තමන්ට තිබෙන දේශපාලන සහ සමාජ වගකීම් පවරා ගැනීමක් බව ය. අපේ රටවල මිනිසුන්ට මේ අවබෝධය නොමැත. රාජ්‍යය දේශපාලන සමාජ ක්‍රියාවලියට, ප්‍රතිපත්ති නිර්මාණය කිරීම් ක්‍රියාවලියට සහභාගී වීම පුරවැසියන්ගේ වගකීමකි. මෙය ස්වභාවයෙන් ඇති වන්නක් නොවේ. එය ඔවුන් වෙතට ගෙන යා යුතු ය. ඔවුන් සිටින්නේ නිද්‍රාවක ය. ඔවුන් එම නිද්‍රාවෙන් අවදි කර හෘදය සාක්ෂිය මත පදනම්ව ක්‍රියා කරන තාර්කික සත්ත්වයන් බවට පත් කළ යුතු ය. පසුගිය කාලයේ බොහෝ සිවිල් සමාජ සංවිධාන බොහෝ දුරට මිනිසුන් අතර මේ අවබෝධය ඇති කරන්නට වැඩ කළේ ය. අපේ රටේ මේ අවබෝධය බොහෝ වෙලාවට ඇති වන්නේ දේශපාලන ගැටුම් ඔස්සේ ය. වාමාංශික ව්‍යාපාරය කාලයක් තිස්සේ කළ වර්ජන, පොදු මහජන සංවිධානය කිරීම් ඔස්සේ පුරවැසියාගේ වගකීම් හඳුන්වා දුන් අවස්ථා තිබේ. නමුත් එතැනත් බල ව්‍යාපෘතියක් තිබෙන නිසා බල ව්‍යාපෘති සම්බන්ධ නොවී නිදහස් මිනිසුන් විදියට බැලීමේ අවබෝධය ලබා දීම වඩාත් වැදගත් ය. පුරවැසියන් රාජ්‍යයට ඔබ්බෙන් ඇති සිවිල් සමාජය දෙස බැලීමට ද සූදානම් කළ යුතු ය. ප්‍රජාතන්ත්‍රවාදයට අවශ්‍යම දෙය වන්නේ ‘නිදහස් මිනිසකු’ නිර්මාණය කිරීම ය. නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම, ලිවීම ඒ ඔස්සේ ආණ්ඩුවට බලපෑම් කිරීම අපට ඇති ප්‍රජාතන්ත්‍රවාදය යි. පුරවැසිභාවය යන්න ඉබේ ඇති නොවන අතර එය ගොඩනැගිය යුතු ය.

ජෝන් ලොක් පැවසුවේ මිනිසා ස්වභාවයෙන්ම සමාජ සත්ත්වයෙක් බව ය. රූසෝ පවසන්නේ මිනිසා ළදරු අවධියේ දී එම සමාජ සත්ත්වයා නිද්‍රාවක සිටින බව ය. නිද්‍රාවේ සිටින පුද්ගලයා අවදි කළ යුතු ය. අධ්‍යාපනය තිබෙන්නේ ඒ සඳහා යයි ඔහු සඳහන් කළේය. පුරවැසිභාව පිළිබද සංකල්ප ඉගැන් වූ පමණින් පුරවැසිභාවය යනු

කුමක් ද යන්න පිළිබද ප්‍රායෝගික අවබෝධය නොලැබේ. මෙය ගොඩනැගෙන්නේ සමාජීය අරගල හරහා ය. ජීවන අත්දැකීම් සහ ගැටුම් ඔස්සේ මිනිසාගේ අවබෝධය දියුණු වේ. මේ සදහා කතිකාවක් තිබිය යුතු ය. සිවිල් සමාජයට කාර්යභාර්යක් ඇත්තේ ද මේ නිසා ය. සමාජයට ඉගැන්වීම, දැනුවත් කිරීම සහ මතවාදයක් නඩත්තු කිරීම ආදී කාරණා සිවිල් සමාජ සංවිධාන විසින් කළ යුතු ය. නොකඩවාම මේ කතිකාව පවත්වා ගෙන යෑමට සිදු වේ.

සිවිල් සමාජ බුද්ධිමතුන්ට විකල්පීය මතවාදය නඩත්තු කිරීමේ කාර්යභාරයක් තිබේ. එසේ ම තවදුරටත් මූල්‍ය පදනම සොයා ගැනීම සඳහා සාමූහික එකතුවීම ඔස්සේ තමන්ගේ ම ව්‍යාපෘති ආරම්භ කිරීමට පුළුවන. සිවිල් සමාජ සංවිධාන එකඟතාවක් හදාගෙන තමන්ට මුදල් උපයාගත හැකි ස්වාධීන මාර්ගවලට යෑම අවශ්‍ය ය. වෙළඳපොළ තුළ වැඩ කරන යම් සංවිධාන නිර්මාණය කිරීමට සිදු වේ. අතැම් ව්‍යාපාර කිරීමට සිදු වේ. ඒවා ඔස්සේ ප්‍රාග්ධනය උපයා ගත හැකි ය. ස්වශක්තිය ගොඩනගා ගැනීම සිවිල් සමාජ සංවිධානවලට අත්‍යාවශ්‍ය දෙයකි. හැම මොහොතේ ම ආධාර මත යැපීම අවදානම් වන්නේ ආධාර නැති වීමේ ඉඩකඩ ඇති බැවිනි. ආධාර නතර වූ විට කරමින් සිටී ප්‍රතිපත්තිමය කාර්යයන් නතර කිරීම සිදු කළ නොහැකි ය. ඒ නිසා ස්වශක්තිය ගොඩ නගා ගැනීම දැන් දැන් සිවිල් සංවිධානවලට අත්‍යාවශ්‍ය කාරණාවකි.

එසේ ම තවත් වැදගත් කාරණාවක් වනේනේ රටේ පවතින සංස්කෘතිය සහ සාරධර්ම වශයෙන් ඇති යහපත් දේ සමග සිවිල් සමාජ සංවිධාන කටයුතු කිරීම ය. ඒ ඔස්සේ මිනිස්සු සම්බන්ධ කර ගැනීම සහ ඔවුන් සමග වැඩ කරමින් විස්වාසය දිනා ගැනීමේ හැකියාව පවතී. සමාජය සෑම විටකම දේශපාලපනික නොවේ. සමාජය පතුලේ දේශපාලනික නොවන, ඒ ඒ මිනිස් කණ්ඩායම් ස්වාධීනව සිතන මතන ඒ සඳහා ඔවුන්ව මෙහෙයවන සංස්කෘතික කාරණා පවතී. සමාජය පවතින්නේ එම සංස්කෘතිය නැවත නිෂ්පාදනය කිරීම ඔස්සේ ය. ඒ පිළිබඳ අවධානය යොමු කිරීම බොහෝදුරට සිවිල් සංවිධානවලින් ගිලිහී තිබේ. බොහෝ සංවිධාන වැඩ කරන්නේ උඩුතලයේ පමණි. යටිතලයට කිඳා බැසින්නේ නැත. මේ සඳහා නව උපක්‍රම නිර්මාණය කළ යුතු ය. ලතින් ඇමරිකාව, ඉන්දියාව වැනි රටවල සිවිල් සංවිධාන ආධාර මත පදනම්ව පමණක් ක්‍රියාත්මක නොවේ. ගම්වල නිදහස් ක්‍රියාකාරී මිනිස්සු ස්වේච්ඡාවෙන් වැඩ කරති. ඉන්දියාවේ විශාල රාජ්‍ය නොවන ජාලයක් ක්‍රියාත්මක වන්නේ ආධාර පදනම මත ම නොවේ.

වෙන රටවල රාජ්‍ය නොවන අංශවලට වෙළඳපොළ මගින් ද ආධාර සපයනු ලබයි. අප රටේ එවැනි වෙළඳ පොළක් ද නොමැත. මේ නිසා තමන්ගේ ස්වශක්තිය ගැන සිතමින්, තමන්ගේ ම ආයතන පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය. දැන් විශාල වශයෙන් ආධාර නොලැබේ. ඒ නිසා අලුත් පැති ගැන සෙවීම, ක්‍රමෝපායන් නිර්මාණය කිරීම, ප්‍රධාන ආයතන එකතුව වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීම සිවිල් සංවිධානවලට ඇති මූලික අභියෝගයකි. විශේෂයෙන් ම පවතින කොරෝනා අර්බුදය හමුවේ රාජ්‍යය, පෞද්ගලික අංශය සේ ම රාජ්‍ය නොවන සංවිධානවලට ද විවිධ අභියෝග පවතින බැවින් උක්ත කාරණා ගැන වඩාත් සැලකිලිමත් විය යුතු ය.

**ආචාර්ය නවරත්න බණ්ඩාර**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකි. ශාස්ත්‍රපීඨයේ හිටපු පීඨාධිපතිවරයා ද වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කර එංගලන්තයේ යෝර්ක් විශ්ව විද්‍යාලයෙන් දර්ශන ශූරී උපාධිය හදාරා ඇත. නිපු ආයතනයේ ආරම්භක සාමාජිකයෙකි.

# අයිතීන් වෙනුවෙන් නැගී සිටීමට අපේ මනස සකස් කළ ආයතනයක්



**නිමල්කා ප්‍රනාන්දු**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එහි 25 වැනි සංවත්සරය සමරන අවස්ථාවේ සුබ පැතුම් පණිවිඩයක් ලිවීමට ආරාධනා ලැබීම මට සතුටක් මෙන් ම ගෞරවයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු කුමක් ද? එයට පිළිතුරු රාශියක් තිබිය හැකි ය. ඇතැම් පිළිතුරු ධනාත්මක විය හැකි අතර ඇතැම් ඒවා නිෂේධනාත්මක වීමටත්, රාජ්‍ය නොවන සංවිධාන විරෝධී භීතිකාවෙන් පිරුණු වාතාවරණයක් තුළ විරෝධාකල්පී වීමටත් ඉඩ ඇත. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ, වර්ධනය කිරීමේ සහ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම රැක ගැනීමේ ගමනේ දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සම හවුල්කරුවකු ලෙස කිට්ටුවෙන් වැඩ කිරීමේ වරප්‍රසාදය මට හිමි වී ය. ඇයි? සමහරුන් විග්‍රහ කරන ආකාරයට එසේ වන්නේ අප කිසියම් විශාල ජාත්‍යන්තර කුමන්ත්‍රණයක ඒජන්තයන් නිසා ද? නැතහොත් අපගේ බුද්ධිය සහ අත්දැකීම් විවේචනාත්මක ජනතාව වෙනුවෙන් කැප කරන්නට තරුණ විද්වතුන් සහ ක්‍රියාධරයන් ලෙස අප එදා ගත් තීන්දුව නිසා ද? ජීවිතයේ විකල්ප මාර්ගය සෙවීමට අප ගත් දැනුවත් තෝරාගැනීම මගින් පවතින ක්‍රමය ප්‍රතික්ෂේප කිරීමේ තත්ත්වයට ස්ථිරව ම අපව පත්කොට ඇත. එම ගමනේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විශේෂිත සලකුණ වන්නේ එය අපගේ මාතෘ භූමියේ සිවිල් ක්‍රියාකාරීත්වය සඳහා නව දෘෂ්ටියක් පරීක්ෂා කිරීම තෝරා ගැනීම යි.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය උච්චස්ථානයේ තිබිය දී පෞද්ගලිකව මෙන් ම සංවිධාන ලෙස ද අපි හමු වූයෙමු. දහස් ගණන් ජනයාට උන් හිටි තැන් අහිමි කරන, මරණයට පත් කරන සහ අතුරුදන් කරන, සන්නද්ධ ගැටුමේ අවසානය දැකිය හැකි රටක් ගොඩනැගීම අරමුණු කොට ගත් සාම වේදිකාවේ අපි හමු වූයෙමු. කරුණු පරීක්ෂා කිරීමට සහ තහවුරු කිරීමට අපි

එකට සංචාරය කළෙමු. උද්දේශන සහ පර්යේෂණ සම්බන්ධ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ කටයුතු හැම විට ම පදනම් වූයේ ප්‍රජාවගේ තොරතුරු මත යි. ප්‍රධාන පර්යේෂණ ශික්ෂාවන්ට කැප වූ මෙන් ම සන්නද්ධ කණ්ඩායම්වලින් හෝ රාජ්‍යයෙන් හෝ යන කුමන පාර්ශ්වයකින් වුවත් වන, තර්ජන සහ බිය ගැන්වීම් මධ්‍යයේ වුව ද, නොබියව වින්දිතයින් සොයා යෑමට කැප වූ කාර්යමණ්ඩලයක් ලැබීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වාසනාවන්ත වී ය. එය එසේ වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නායකත්වය, මානව හිමිකම් කඩවීම්වල වින්දිතයින් සමග සිටීමේ දැක්මක් සහ මෙහෙවරක් කොන්දේසි විරහිතව හැඩ ගස්වන ව්‍යාපාරයක අත්දැකීම් තුළින් නොපැමිණි නමුත් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට සහ වේදිකාවලට සවිඥානික පුරවැසිභාවයෙන් සම්බන්ධ වීම නිසා ය. අපගේ හිතවත් මිත්‍ර ලසන්ත 2009 දී ඝාතනය වීමත් සමග අප ගොඩනැගු නිදහසේ වේදිකාවේ කැඳවුම්කරුවන් පස් දෙනාගෙන් ආචාර්ය සරවනමුත්තු එක් අයෙකි. ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් ප්‍රශ්නයක දී සරා කිසි විට අඩියක් පස්සට ගන්නේ නැත. ඔහු එම ජීවය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ලබා දුන්නේ ය.

ප්‍රධාන අධිකරණ ක්‍රියාමාර්ගවලට මැදිහත් වීම ඔස්සේ නීති සහ ප්‍රතිපත්ති වර්ධනයට උත්සාහ දැරීම මගින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වසර 25ක පැවැත්ම තුළින් එය ශ්‍රී ලංකාව තුළ විශ්වාසය ගොඩනැගීමේ සහ අපේ අයිතීන් වෙනුවෙන් නැගී සිටීමට අපේ මනස් සකස් කළ ආයතනයක් බවට පත්ව ඇත. ජනයා තම නවාතැන් පොළවලින් ඉවත් කරමින් ඔවුන්ට කොළඹින් පිටවීමට බලකරනු ලැබූ අවස්ථාව මට හොඳින් මතක ය. එම ප්‍රදේශය බැලීමට භවානි සහ මම ඉක්මනින් එහි ගියෙමු. අපගේ ම පුරවැසියන්ට මුහුණ දීමට වන කරදර සහ බලවත් නින්දාව අපි දුටුවෙමු. පසුවදා ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කොට අතුරු තහනම් නියෝගයක් ලබා ගත්තේ ය.

පසුගිය වසර 25 තුළ දී, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්ෂේත්‍රයේ සහ නීතියේ පාලනයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කළ දායකත්වයට සහ පෙළඹවීමට සහභාගී වීමට හැකි වීම ගැන මම ආඩම්බර වෙමි.

ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ අපගේ මැදිහත්වීම නිසා බිය ගැන්වීම්වලට මුහුණ දෙමින් 2012 මාර්තු 21 දින අප නිකුත් කළ ඒකාබද්ධ ලිපිය මගින් ආචාර්ය සරවනමුත්තුගේ කැපවීම පිළිබිඹු වෙයි. "ශ්‍රී ලංකාව තුළ මුක්තිය පරාජය කිරීමට සහ අතීතයේ දී සිදු කළ හෝ වර්තමානයේ සිදු කරන හෝ, මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරීමේ සහ වගවීමේ ශක්තිමත් ක්‍රමයක් ගොඩනැගීමට ක්‍රියා කරමින් සිටින මානව හිමිකම් ආරක්ෂකයින් වශයෙන්, අපි අපගේ පරමාදර්ශ සහ ඉලක්ක කෙරෙහි කැප වී සිටින්නෙමු. අපගේ අදහස වන්නේ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ශ්‍රී ලංකාව ගැන යෝජනාවක් සම්මත වුවත්, නැතත්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂාව සඳහා අපගේ කටයුතු දිගට ම ක්‍රියාත්මක කළ යුතු සහ කරන බව යි."

මේ රටේ බලධාරීන්ගේ සහ දක්ෂිණාංශික බලවේගවලට මුහුණ දෙමින්, නිර්භීත සහ යටත් නොවූ සංවිධානයක් ලෙස ඔබගේ පැවැත්ම ශක්තිමත් කොට වර්ධනය කරමින් ඉහත මූලධර්ම රැකගත් ආයතනයක් බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පත් කිරීම සම්බන්ධයෙන් ආචාර්ය සරවනමුත්තුටත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කැපවීමෙන් යුතු අතීත හා වර්තමාන කාර්යමණ්ඩලයටත් මම ආචාර කරමි.

---

**නිමල්කා ප්‍රනාන්දු**

නීතිඥවරියකි, කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරිනියකි, *International Movement Against all forms of Discrimination and Racism, women's forum for peace* යන සංවිධානවල සභාපතිවරිය වේ. *ARENA* සංවිධානයේ හිටපු සාමාජිකාවකි.

# ආදර්ශමත් සමාජ භූමිකාව



**චන්ද්‍රා ජයරත්න**

සමාජ අගයන් එකතු කිරීමේ ගමනේ ඉතා වේගයෙන් යමින් සිටින අවස්ථාවක විසිපස් වැනි සංවත්සරය සමරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සුබ පැතුම් සහ අපේ ආශිංසනය පිරිනමමු.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තවම බෙහෙවින් ළා බාල වුවත් එහි නිර්මාතෘ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු (සරා) නියම කර ගත් ඉලක්ක බෙහෙවින් සපුරා ඇත. මෙම අනගි අවස්ථාවට සිවිල් සමාජය ඔබ සමගත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අනෙකුත් සියලු පාර්ශ්වකරුවන් සමගත් එක් වනු ඇත.

සරා, පුද්ගලිකවම ඔබට ජය පතමි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ඓතිහාසික වාර්තාවන් වූ සුවිශේෂී ජයග්‍රහණ සාක්ෂාත් කර ගැනීමට හැකි වූ පසුගිය වසර විසිපහ තුළ ඔබගේ චින්තන නායකත්වය සහ කළමනාකරණ නායකත්වය මම ගෞරවයෙන් සිහිපත් කරමි. "...අප සමාජයක් වශයෙන් සහ පුරවැසියන් වශයෙන් මෙම රටට මාහැඟි වූද, අගනා වූද, ප්‍රයෝජනවත් වූද දේ සුරැකීමට කැප නොවන්නේ නම් අපට දේශප්‍රේමය, ජාතික වුවමනාව හෝ මහජන අවශ්‍යතා වෙනුවෙන් කතා කිරීමට අයිතියක් නැත. අප ඒ වෙනුවෙන් ක්‍රියා කළ යුතු ය" යන අධිෂ්ඨානය අනුගමනය කළ යුතු යැයි ඔබ සෙසු සමාජයට නිර්දේශ කරන විට ඔබ අගය කරන සහ ඔබගේ හදවතට සමීප වූ වටිනාකම් වෙනුවෙන් ජීවත්වීමට ආරක්ෂාව, නිරෝගීභාවය සහ අප්පමාදය ලැබේවා යි පතමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිවිල් සමාජ සංවිධාන අතුරෙන් වඩාත් කෘතහස්ත, අධිෂ්ඨානශීලී, පරිසරයත් සමග වෙනස් වන සහ අවංකත්වය හා වෘත්තීමය අගයන් පවත්වා ගන්නා ආයතනයකි. එය ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන අතරින් අද්විතීය ආදර්ශමත් සමාජ භූමිකාවකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පසුගිය විසිපස් වසර තුළ ඔබගේ ප්‍රබල නායකත්වය යටතේ අන්තර්ග්‍රහණය කර ගත් සමායතන ගති ලක්ෂණ වන්නේ:

**අධිෂ්ඨානශීලීභාවය** සහ බාහිර බලවේගවල අභියෝග නොතකා එහි කේන්ද්‍රීය වටිනාකම් වෙනුවෙන් පෙනී සිටීම.

**වෙනස් වීමේ එඩිතරභාවය** සහ වෙනත් සිවිල් සමාජ සංවිධාන පසුබට වන ක්ෂේත්‍රවලට පිවිසීම- වඩාත්ම මෑතක වූ සිද්ධියක් වන්නේ නව මුදල් පනතට අභියෝග කිරීමේ පියවර යි.

පවතින සමාජ-දේශපාලන-ආර්ථික සහ පරිසර ගතිකයන් සන්දර්භයේ සමාජයේ වෙනස් වන අවශ්‍යතා සපුරාලීමේ නව උපායමාර්ග සකස් කොට යොදා ගැනීමේ **කෘතහස්තභාවය සහ නම්‍යශීලීත්වය.**

ප්‍රජාතන්ත්‍රවාදයේ අනගි හර පද්ධතීන්, නීතියේ ආධිපත්‍යය, අයිතිවාසිකම් සහ නිදහස, සමානාත්මතාව සහ යුක්තිය, සත්‍යය, සාධාරණත්වය සහ යහපාලනය වෙනුවෙන්, අත්විය හැකි ප්‍රතිඵල නොසලකා හැම විට ම පෙනී සිටීමේ **ස්ථිරසාර ආස්ථානය**,

මානව සම්පත් සංවර්ධනයට සහ කණ්ඩායම් ගොඩනැගීමට **කැප වීම**- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සභායට සමාන වූ කෘතහස්තභාවයෙන් යුත් වෘත්තීමය වශයෙන් එඩිතර සාමාජික කණ්ඩායමක් ගොඩනැගීම. ඔවුහු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ මෙන්ම ඉන් පිටත වෙනත් වගකිව යුතු තනතුරුවලදීත් තම හැකියාවන් සහ කැපවීම දීප්තිමත්ව පෙන්නුම් කරති.

පාර්ශ්වකරුවන්ට සේවා සැපයීමේ දී පවතින සම්පත් හිඩැස පිරවීමට මාධ්‍ය සන්නිවේදනයට උපාය මාර්ගිකව පිවිසීමෙන් පෙන්නුම් කරන **නව්‍ය සහ නිර්මාණශීලීභාවය:** ප්‍රධාන මාධ්‍යයේ අවස්ථා වැසී ගිය සහ සමාජ මාධ්‍ය අවස්ථා ප්‍රමාණවත්ව වර්ධනය නොවූ තත්ත්වයක **Groundviews** සහ එහි දේශීය ප්‍රකාශන වන **මාටුම්** සහ **විකල්ප** වැනි බෙහෙවින් පැසසුමට ලක් වු ප්‍රකාශන නිකුත් කිරීම.

**අදීනබව, ස්වාධීන වීමට ඇති ධෛර්යය** සහ බලයේ සිටින අයගේ සහ විරුද්ධ මතධාරීන්ගේ පළිගැනීම්වලට ලක් විය හැකි බවට අනතුරු හැඟවීම් තිබියදී පවා ඉලක්ක කර ගත් මතවාදය, විවාද සහ මහජනතාව වෙනුවෙන් නඩු පැවරීම මගින් බලයේ සිටින පාලකයන්ට අභියෝග කිරීමට නිර්භය වීම.

උපායමාර්ගික සහ මහජන ප්‍රතිපත්ති විශ්ලේෂණයේ හැකියාවන් දැක් වූ, අනාගතය දැකීමේ හැකියාව, ගස් වෙනුවට කැලෑව දැකිය හැකි, ආකාරය වෙනුවට හරය ප්‍රමුඛතා ගත කරන සහ සමාජ දේශපාලන ආර්ථික සන්දර්භයක තම හැකියාවන් විදහා දැක්වූ **ප්‍රධාන පෙළ බුද්ධි මණ්ඩලයක්.**

ඉතාමත් උසස් මට්ටමේ උපායමාර්ගික උපදෙස්, සම්පත් සහාය සහ අනතුරුදායක අවස්ථාවන්හි රැකවරණය ලබා දීමට හැම විටම සූදානම් විවිධ ක්ෂේත්‍රවල ඉහළ මට්ටමේ සම්බන්ධතා ඇති පුද්ගලයන් සහ ආයතන ඇතුළත් **පුළුල් අන්තර්ජාතික ජාලයන්.**

**මතවාදයක් වෙනුවෙන් පෙනී සිටීමේ සහ ඉදිරිපත් කිරීමේ විශිෂ්ටත්වය**- ඉංග්‍රීසියෙන් මෙන්ම දෙමළෙන් සහ සිංහලයෙන් ගුණාත්මකභාවයෙන් උසස්, බලපෑම් සහිත සහ නිශ්චිතව ඉලක්ක කර ගත් මතවාදය සහ ඉදිරිපත් කිරීම්.

අගනා පර්යේෂණ සහ විශ්ලේෂණාත්මක දත්ත ඇතුළත් පුළුල් දත්ත බැංකුවක් සහිත **දැනුම් සහ තොරතුරු කෝෂ්ඨාගාරයක්.**

පහත සඳහන් දර්ශක පදනම්, බලපෑම් තක්සේරු කිරීමේ බුද්ධි මණ්ඩලයක් සහිත උසස් ගුණාත්මකභාවයෙන් යුත් **සංගත කාර්යසාධන නිමැවුම්.**

සම්පත් දර්ශක: මානව සහ මූල්‍යමය සම්පත් ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට සමීපතාව

උපයෝජ්‍ය දර්ශකඃ මාධ්‍ය සහ ප්‍රතිපත්ති බලපෑම් කරන්නන් සමග ඇති කීර්තිය

නිමැවුම් දර්ශකඃ ප්‍රතිපත්ති යෝජනා, අදහස්, ප්‍රකාශන, සම්මන්ත්‍රණ, තොරතුරු උපදෙස් යනාදිය

බලපෑම් දර්ශකඃ 'බුද්ධි මණ්ඩලයේ' කාර්යයන් ප්‍රතිපත්තිය කෙරේ සැබැවින්ම බලපෑ මට්ටම මූලික වශයෙන් පිළිබිඹු කරයි.

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුගේ නායකත්වය යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම සියලු දර්ශක යටතේ තක්සේරු කොට දශමාංශක දහයම ලබා ගෙන ඇත. මෙම අද්විතීය හැකියාවන් නිසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකාවේ ආදර්ශ භූමිකාවක් සේ කැපී පෙනේ. අන්තර්ජාතික බුද්ධි මණ්ඩල තලයේ පවා ඉතාමත් උසස් තැනක් හිමි කර ගනී.

ගත වූ වසර විසිපහ තුළ සමාජ හර පද්ධතියට කරන ලද එකතු කිරීම්වලට ස්තුති කරන අතරම ඉදිරි වසර විසිපහ තුළ ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එම තලයේම රැඳී සිටිනු ඇතැයි උණුසුම් පැතුම් එක් කරමු.

---

**චන්ද්‍රා ජයරත්න**
වාණිජ මණ්ඩලයේ හිටපු සභාපතිවරයා ය. සිවිල් සංවිධාන ක්‍රියාධරයෙකි.

# මහජන ව්‍යාපාරයක මෙහෙවර ඉටු කළා



**කුමුදුනී සැමුවෙල්**

1990 ගණන්වල මුල් කාලයේ දී ජාතීන් අතර යුක්තිය සහ සමානත්වය සඳහා ව්‍යාපාරය (මර්ජ්) වැනි සිවිල් සමාජ සන්ධාන විසින් නිර්මාණය කළ උරුමය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරියට ගෙන ගියේ ය. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ, 'ප්‍රජාතන්ත්‍රවාදය සමග සාමය' සහ 'බියෙන් අත් මිදෙමු' ආදිය එම කාලයේ සිවිල් සමාජ ක්‍රියාකාරීත්වයේ අකුණු - මුගුරු බවට පත්ව තිබිණි. 'ජාතික ප්‍රශ්නය' ලෙස හඳුන්වන දෙයට දිගුකල් පවතින තිරසාර විසඳුමක් සෙවීම හැම විට ම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක පූර්ව කාර්යයක් ලෙස පිළිගැනීම සහ නව ව්‍යවස්ථාවක මුලාකෘතියක් සම්පාදනයට 1992/93 දී 'මර්ජ්' සංවිධානය ආරම්භ කළ කටයුතු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉදිරියට ගෙන ගිය බව මම විශ්වාස කරමි.

1996 දී, එහි ආරම්භයේ සිට ම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා ඔවුන්ගේ උද්දේශනයේ ස්ථිරසාර ලෙස සිටි අතර, කල් පවතින සාමයක් සහ සියලු දෙනා ඇතුළත් කරගත් ප්‍රජාතන්ත්‍රවාදයක් ගවේෂණයේ දී මූලික අංග වන, බහුත්ව ප්‍රජාතන්ත්‍රවාදයක ශක්තිමත් සංස්කෘතියක්, බහු සංස්කෘතික පුරවැසිභාවයක් සහ මානව හිමිකම් සහ නීතියේ පාලනයට ගරු කිරීම ආදිය සක්‍රිය කිරීමේ වැදගත්කම අවධාරණය කළේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන සහ තර්ජන ඇතුළුව ව්‍යවස්ථා නීතිය සහ භාවිතය, බලය බෙදීම සහ ෆෙඩරල්වාදය පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විග්‍රහයන්, ව්‍යවස්ථාමය ආරක්ෂණයන් සහ ව්‍යවස්ථාමය සහ මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය වශයෙන් අපගේ වැඩ කටයුතුවල දී අපට මිල කළ නොහැකි වටිනාකමකින් යුතු වී ය. ප්‍රශ්න රාශියක් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විග්‍රහයන් සහ බුද්ධිමය නිෂ්පාදන අපි

අගය කරන්නෙමු. මේවා මුද්‍රිත මාධ්‍යයේ සිට ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය දක්වා ව්‍යාප්තව ඇති අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පරිණාමය සම්බන්ධයෙන් නැවුම් දෘෂ්ටියක් ලබා දුන් 'කොරිඩෝස් ඔෆ් පවර්' *(Corridors Of Pawer)* (බලයේ තීරකයින්) හි නිර්මාණාත්මක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කළ යුතු ය. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී, ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ ස්ත්‍රී පුරුෂ යුක්තිය සඳහා අපගේ ඉල්ලීම්වල දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහය ලබා ගැනීමට ද අපට හැකියාව ලැබුණි.

මාධ්‍ය නිරීක්ෂණය, අන්තර්ජාල පාලනය සහ භාෂණයේ සහ විසම්මුතියේ නිදහස සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩ කටයුතු ගැන විශේෂයෙන් සඳහන් කළ යුතු වන අතර බියගුළු මාධ්‍යයෙන් වට වූ දේශපාලන සංස්කෘතියක් තුළ, ග්‍රවුන්ඩ්වීව් සහ විකල්ප පුරවැසි ජනමාධ්‍ය ද්වාර, පුළුල් පරාසයක මතවලට ඉතාමත් අවශ්‍ය අවකාශය නිර්මාණය කර දී තිබේ.

නිදහස් සහ සාධාරණ මැතිවරණ සක්‍රිය කිරීම සහ සහතික කිරීම, 1990 ගණන්වල පුරවැසි ක්‍රියාකාරීත්වයේ තවත් තීරණාත්මක අංගයක් වූ අතර, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය *(CMEV)* ආරම්භ කිරීමේ සිට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඒ සඳහා කළ කාර්යභාරය අද ප්‍රශංසාවට ලක්වෙයි. එය මැතිවරණ නිරීක්ෂණයෙන් ඔබ්බට යමින් ස්ත්‍රී සාමාජිකාවන්ට විශේෂ අවධානයක් ලබාදෙමින් විශේෂයෙන් පළාත් පාලන ආයතන මට්ටමින් තේරී පත් වූ නියෝජිතයින් සමග කටයුතු කිරීම දක්වා ඉදිරියට ගියේ ය. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මෙම වැඩ කටයුතුවල දී කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය සමග සහයෝගයෙන් ක්‍රියා කළ අතර රටේ කාන්තා සංවිධාන වසර ගණනාවක අරගලයකින් දිනාගත් ස්ත්‍රීන්ට හිමි පංගුව (කෝටාව) ආරක්ෂා කර ගැනීමේ සහ ශක්තිමත් කිරීමේ අපේ උත්සාහයට ආධාර කළේ ය.

1980 ගණන්වල බිහි වූ විවිධ මහජන ව්‍යාපාර දුර්වල වෙද්දී, විශේෂයෙන් ම මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී සම්මතයන් ආරක්ෂා කිරීමේ දී, පුළුල් දර්ශනයකින් සහ ප්‍රයෝගික මැදිහත්වීමෙන් යුතුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හිඩැස පිරවීමට පැමිණි බව මම විශ්වාස කරමි. පසුගිය 25 වසරේ එය ලබාගත් ජයග්‍රහණයන්ටත්, එහි දැක්මට සහ එය පැකිලීමකින් තොරව ගත් නිර්මාණාත්මක සහ දේශපාලන වශයෙන් තීරණාත්මක ප්‍රතිචාරයන්ටත් මම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සුබ පතමි. කාලය සහ දේශපාලන අවශ්‍යතාව සමග නිර්මාණාත්මකව ඉදිරියට යෑමට එයට දිගට ම ශක්තිය ලැබේවා යි මම ප්‍රර්ථනා කරමි.

---

**කුමුදුනී සැමුවෙල්**
ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ව්‍යාපාරයේ සහ යුද විරෝධී ව්‍යාපාරයේ ක්‍රියාකාරිනියකි. ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් සහ මානව අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරිනියක වන අතර කාන්තා හා මාධ්‍ය සාමූහිකයේ ක්‍රියාකාරිනියකි.

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය ජනගත කිරීම



ආචාර්ය
**ජයම්පතී වික්‍රමරත්න**

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය පිළිබඳව වැඩ කරන සිවිල් සමාජ සංවිධාන අතර නායකත්වයක් ගන්නා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ 25 වැනි සංවත්සරය වෙනුවෙන් වචන කීපයක සටහනක් තැබීමට අවස්ථාවක් ලැබීම ප්‍රීතියකි.

වසර විසිපහකට (සිය වසකින් කාලකට) ආසන්න කාලයක් තිස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉටු කළ වැඩ කොටස ඉමහත් ය, විවිධාකාර ය. එය මහජන ප්‍රතිපත්තිය පිළිබඳ කරුණු ගැන කළ පර්යේෂණ ශ්‍රී ලංකාවේ මහජන ප්‍රතිපත්තිය වෙනස් කිරීමට දායක වූ ආකාරය සුළු පටු නොවේ. එසේ කරන ලද යහපත් වැඩ, වැඩමුළු, සාකච්ඡා සහ මුද්‍රිත මෙන්ම ඉලෙක්ට්‍රොනික මාධ්‍යය හරහා ප්‍රකාශයට පත් කෙරිණ. එමෙන්ම එම කරුණු බොහොමයක් සිංහල සහ දෙමළ භාෂාවෙන් වීම නිසා පුළුල්තම පාඨක පිරිසක් අතට පත් කිරීමට හැකි වීමේ ප්‍රශංසාව ද ඔවුන්ට හිමි විය යුතු ය.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා විශේෂයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලබා දුන් දායකත්වය වෙනුවෙන් මගේ සුභාසිංසන පිරිනැමිය යුතු ය. ඔවුන් යෝජනා කළ සංශෝධන බොහොමයක් මෙතෙක් සාක්ෂාත් කර ගෙන නැති වුව ද ඒවා සඟවා තැබීමට ඉඩ නොහැර සජීවීව පවත්වා ගැනීමට ඔවුන්ට හැකි විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ඉතාමත් වැදගත් දායකත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය *(Constitutionalism)* ජනගත කිරීම යැයි මම සිතමි.

ව්‍යවස්ථාවක් සම්මත කිරීමෙන් පසුව එය අධිකරණයේ විමර්ශනයට ඉඩ ලබා නොදීමෙන් ද, මූලික අයිතිවාසිකම් හා නොගැළපෙන පවතින නීති ප්‍රතිපාදන ඒ ආකාරයෙන්ම පැවතීමට ඉඩ හැරීමෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය නොකර ඊට නොගැළපෙන නීති විශේෂ බහුතරයකින් සම්මත කිරීමට පාර්ලිමේන්තුවට ඉඩ හැරීමෙන් ද 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යන දෙකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර ය යන මූලධර්මයෙන් බැහැරව ගොසිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහනමවැනි සංශෝධනය ගෙන එන තෙක් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නඩු පවරනු නොලැබීමේ මුක්තිය සහිත බලවත් ධුරයක් ජනාධිපතිට ලබා දී තිබිණ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දිගින් දිගටම මෙම ගැටලු මතු කළ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය එහි පූර්විකාවේ වගන්තිවලට සීමා නොකර යථාර්ථයක් විය යුතු යැයි එකඟතාවක් ඇති කිරීමට දායක විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දී සාධනීය දායකත්වයක් ලබා දුන් තවත් ක්ෂේත්‍රයක් වන්නේ වාර්ගික සාමය තහවුරු කිරීමට බලය බෙදා හැරීමේ අවශ්‍යතාව පෙන්වා දීම ය. මූලික වශයෙන්ම වාර්ගික ගැටුම් ඇති වන්නේ නොයෙකුත් ප්‍රජාවන්ට රාජ්‍ය බලය බෙදා හදා ගැනීමට නොහැකි වීමෙනි. බොහෝ බහුතර ප්‍රජා කණ්ඩායම් අඩුම වශයෙන් ආරම්භයේ දී සංඛ්‍යාත්මකව කුඩා ප්‍රජාවන් බලය බෙදා ගැනීමට කරන ඉල්ලීම්වලට විරෝධය පාති. සමහරුන් ඉක්මණින්ම හෝ කලක් ගත වී බෙදී වෙන් වීමක් වැළැක්වීමට රාජ්‍යය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව පිළිගන්නා අතර තවත් සමහරු හිතුවක්කාර ලෙස එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් ගැටුම දිගටම පවත්වා ගැනීමට හෝ බෙදී වෙන් වී යෑමට දායක වෙති. බහුතර ප්‍රජාවකට රාජ්‍ය බලය සම්බන්ධයෙන් ඔවුන්ට ඇති ඒකාධිකාරී බලය අත්හැරීමට අවබෝධ කරවීම පහසු කාර්යයක් නොවේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමාන අදහස් ඇති වෙනත් සංවිධාන සහ පුද්ගලයන් සමග එක්ව එම භාරදූර කාර්යට උර දීමට ඉදිරිපත් වූයේ ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට කළ තවත් වැදගත් දායකත්වයක් වන්නේ අධිකරණමය මැදිහත්වීම් ය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නොගැලපෙන පනත්වලට මෙන්ම විධායකයේ ව්‍යවස්ථා විරෝධී පියවරවලට දිගින් දිගටම විරුද්ධ වූයේ ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පසුගිය ජයග්‍රහණයන්ට සුබ පතන අතරම ඉදිරියේ දී ද සමාජ සාධාරණත්වය සහතික කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන හඳුන්වා දීමේ අවශ්‍යතාව කෙරේ අවධානය යොමු වේවායි මම ප්‍රාර්ථනා කරමි.

---

**ආචාර්ය ජයම්පතී වික්‍රමරත්න**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ නීති විශාරදයෙකි. ව්‍යවස්ථා අධ්‍යයනය පිළිබඳ ආයතනයේ හිටපු අධ්‍යක්ෂකවරයා ය. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි.

# සිවිල් සමාජයේ භූමිකාව ගැටලු සහ අභියෝග



මහාචාර්ය
**උපුල් අබේරත්න**

නූතන ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල සිවිල් පුරවැසියා බලගැන්වීමේ විශාල කාර්යභාරයක් සිවිල් සංවිධානවලට හිමි වී තිබේ. වෙළඳපොළ සහ රජ්‍යය අතර මැද පිහිටා තිබෙන පොදු වසම සිවිල් සමාජය හැටියට හැඳින්විය හැකි ය. මේ පොදු වසමේ සිටින අයගේ තිබෙන විශේෂත්වය වන්නේ ඊට සම්න්ධ වන අය ඉතා ම ස්වේච්ඡා පදනමකින් සම්බන්ධ වීම ය. එකී සම්බන්ධ වීම සිදු වන්නේ පෞද්ගලික තත්ත්වය මුල් කර ගෙන ය. පෞද්ගලිකව සම්බන්ධ වුව ද සිවිල් වසමේ අය සාකච්ඡා කරන්නේ පොදු ගැටලු ය. සිවිල් සමාජ සංවිධානයකට ප්‍රජාතන්ත්‍රීය ව්‍යුහය තුළ කළ හැකි කාර්යය කීපයක් කිබේ. සමාජයේ හඬක් නොමැති අයගේ හඬ මහජන අවකාශය තුළ අසනන්ට සැලැස්වීම ඉන් පළමු වැන්න ය. විශේෂයෙන් ම ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ නූතන ලෝකයේ ඇති බරපතළ ප්‍රශ්නවලින් එකක් වන්නේ සමාජයේ ආන්තීකරණයට ලක් වූ ප්‍රජා කණ්ඩායම්වල අදහස් උදහස්වලට ඇහුම්කන් දීමක් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ සිදු නොවීම ය. එසේ ම පොදු වසම තුළ සිටින ඇතැම් අයට පොදු කාරණා ගැන කතා කිරීමට කාලය හා අවකාශය සොයා ගැනීම අසීරු වී තිබේ. මන්ද පොදු වසම නියෝජනය කරන්නේ ජීවන බරකින් පරපීඩිත මිනිසුන් වීම ය. මේ අයගේ හඬ ඇසිය යුත්තේ ඇයි? මේ අයට අවකාශයක් සපයා දෙන්නේ කෙසේද යන බරපතළ වගකීමක් සිවිල් සමාජ සංවිධානවලට පැවරී තිබේ. මේ කාර්යයේ දී කිහිප ආකාරයකට සිවිල් සංවිධානවලට මැදිහත් විය හැකි ය.

- පොදු වසම පිළිබඳ මිනිසුන්ගේ අවබෝධය ඉහළ මට්ටමකට ගෙන ඒම නොහොත් මහජනතාවගේ අවධානය සමාජයේ දැවෙන ප්‍රශ්න කෙරෙහි යොමු කිරීම.

- එසේ ම හඬක් නොමැති අයට හඬක් ලබා දීම.
- සිවිල් සමාජයේ විසිරී තිබෙන කණ්ඩායම්වලට ඒකාරාශී වීම සඳහා යම් වේදිකාවක් තැනීම.
- ප්‍රතිපත්ති පිළිබඳ උපදේශන කාර්යයේ නියුක්ත වීම.

මෙකී කාරණා සිවිල් සමාජ සංවිධානකට ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ හැකි ය. ලංකාවේ සිවිල් සමාජය පිළිබඳ සාකච්ඡා කරන විට චෝදනාවන් ද තිබේ. සිවිල් සමාජ සංවිධාන නම් මෙම ආයතන විශේෂය යෝගීවරුන් සේ පෙනී සිටිනු ලැබුව ද ඔවුන් යෝගීන් නොවේ. එක් අතකින් මෙම ආයතන හඳුන්වන්නේ මහජන අවකාශයට, මානව උත්ප්‍රේරකයන්ගෙන් පොළඹවන මිනිසුන් පරිත්‍යාග කරන දේවල් පරිභෝජනය කරන ඵලානුභවිකයින් කොටසක් ලෙස ය. නැතිනම් ප්‍රතිලාභීන් පිරිසක් බවට පත්වෙනවා ය යන විවේචනය පවතී. එක් අර්ථයකින් ගත් විට ලංකාවේ පවතින බොහෝ රාජ්‍යය නොවන සංවිධාන සම්බන්ධයෙන් මෙය සාධාරණ විවේචනයක් බව මම කල්පනා කරමි. මන්ද 1970 දශකයෙන් පසුව 80/90 දශකවල සමාජයේ යම් වරප්‍රසාදිත කණ්ඩායමකගේ ජීවනෝපාය සකසා ගැනීම සඳහා සිවිල් සමාජ සංවිධාන බිහිකර ගැනීම ඉතාම ජනප්‍රිය දෙයක් බවට පත් විය. එකී විවේචන අතැම් සංවිධානවලට ආදේශ කළ හැකි වුවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යන සංවිධානයේ ක්‍රියාකාරීත්වය වඩා වෙනස් ස්වරූපයක තිබෙන බව මගේ අදහස යි.

**තීරණාත්මක සමාජ මැදිහත්වීම් කීපයක්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පසුගිය කාලය මුළුල්ලේ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය පුළුල් කිරීම සඳහා සැලකිය යුතු මැදිහත්වීමක් සිදු කර තිබේ. සමාජ යුක්තිය, සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්නවල දී නිර්භීතව ඉදිරිපත් වී ඒ ප්‍රශ්නවලට මැදිහත් වූ ආකාරය ප්‍රශංසනීය ය. විශේෂයෙන් ම ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ එහෙමත් නැතිනම් රාජ්‍යය කරවන යම් යම් රෙජීමයන් ප්‍රජාතන්ත්‍ර විරෝධී අණ පනත් ගෙනවිත්, මහජන පරිමණ්ඩලයේ අදහස් උදහස් යටපත් කර අධිකාරීවාදී පාලන තන්ත්‍රයක් ගොඩනැගීමට දරන ලද ප්‍රයත්නයන්ට විශාල වශයෙන් විරෝධය දක්වමින් මැදිහත්වීම් සිදු කරනු ලැබූ සංවිධානයක් වශයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හඳුනා ගත හැකි ය. ඒ අර්ථයෙන් ගත් විට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පවතින රාජ්‍ය තන්ත්‍රයට නිර්භයව අභියෝග කළ සංවිධානයක් ලෙස දේශපාලන විද්‍යාර්ථියෙකු වශයෙනුත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ යුක්තිය පිළිබඳ කල්පනා කරන පුරවැසියෙකු වශයෙනුත් මට ගෞරවයක් තිබේ.

ඒ සම්බන්ධයෙන් යම් කරුණු කීපයක් මතු කර පෙන්වන්නේ නම් පළමුවෙන් කීමට ඇති කාරණාව වන්නේ මහජන මුදල් රාජ්‍යය තන්ත්‍රය විසින් අවභාවිත කරන්නට උත්සාහ ගන්නා අවස්ථාලදී කරන ලද නිර්භීත මැදිහත්වීම් ය. විශේෂයෙන් ම දිවි නැගුම පනත වැනි පනත් කෙටුම්පත් හරහා අහිංසක දුප්පත් ජනතාව විසින් සමෘද්ධි බැංකුවල ඉතුරු කරන ලද මුදල් අවභාවිත කිරීමට උත්සාහ කරන අවස්ථාවේ දී කරනු ලැබූ මැදිහත් වීම් අප හඳුන්වන්නේ කාලෝචිත මැදිහත් වීම් හැටියට ය. එසේ ම සමීප අතීතයෙන් නිදසුන් කීපයක් ගත් විට, පෝට් සිටි පනත අරබයා මෙම සංවිධානය කරන ලද මැදිහත් වීම ද වැදගත් ය. එවැනි මැදිහත් වීම් නොවුණා නම් දේශපාලනික ප්‍රජාව සතු විය යුතු තම ප්‍රජාවේ කටයුතු පාලනය කර ගැනීම සඳහා තිබෙන ස්වයං නිර්ණය අයිතිය ඉඳුරාම අපෙන් බැහැර වී ගොස් රාජ්‍යයේ අනුග්‍රහය සහිතව ව්‍යසනකාරී ධනවාදී (*Disaster Capitalism*) එළැඹුමේ ගොදුරක් බවට පත් වීමට බොහෝ දුරට ඉඩ තිබිණි. එවැනි අවස්ථාවල කරන ලද මැදිහත් වීම් ඉතාම ප්‍රශංසනීය ය. එසේ ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යෝජනා කරනු ලැබූ විසි වැනි සංශෝධයනය වැනි ඉතාම නරක අණ පනත්වලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් අභියෝග කිරීම ද වැදගත් ක්‍රියාවකි.

ලංකාවේ අධිකරණය ස්වාධීන ද? සැබැවින් ම අධිකරණයේ ගෞරවය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් මැදිහත් වීමක් කරන්නේ ද, වැනි ප්‍රශ්න මා සතුව තිබිය දී ම, ඒ සම්බන්ධයෙන් මා සතුව යම් ශාස්ත්‍රීය විවේචනයන් තිබිය දී ම වුවත් එවැනි අධිකරණමය මැදිහත් වීමක් නොතිබුණේ නම් විසි වැනි සංශෝධනයෙන් යෝජනා වූ අත්තනෝමතික පාලන තන්ත්‍රයකට මඟ පෙන්වීමට ගෙන යන ලද එම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාදාමය යම් ආකාරයකට නතර කිරීමට නොහැකි වන්නට තිබිණි. ඒ නිසා *CPA* සංවිධානය මේ ක්ෂේත්‍රයන් අරබයා කරන ලද මැදිහත් වීම සුවිශේෂ ය.

එසේම ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන තමන් පෙනී සිටින ස්ථාවරයන් ඉතාම අවස්ථාවාදී ලෙස වෙනස් කරන අවස්ථාවන් ද මා දැක තිබේ. විශේෂයෙන් ම මේ රටේ පවතින දැවන ප්‍රශ්නයක් වන්නේ මේ රටේ ජීවත්වන බහුවිධ සමාජ කණ්ඩායම්වලට එකට ජීවත්වීමට හැකි බලතල බෙදා හදා ගත් ක්‍රමවේදයක් හදා ගන්නේ කෙසේ ද යන්න ය. අප සියලු දෙනාට, සියලු සමාජ තීරුවලට එකට ජීවත්විය හැකි දේශපාලන හා සමාජ දර්ශනයක් ලංකාව වෙනුවෙන් සම්පාදනය කර ගන්නේ කෙසේද යන ප්‍රශ්නය ගත් විට ඒ සම්බන්දයෙන් *CPA* ආයතනය කරන ලද මැදිහත්වීම් ද ඉතා වැදගත් ය. මා එය අගය කරන්නේ අතැම් සංවිධානවලට එම ධෛර්යය නොතිබී එය සිඳී බිඳී යද්දී, මෙය ආරක්ෂා කර ගැනමට තිබූ ධෛර්යය නිසා ය; එසේම අඛණ්ඩව මෙම පරමාදර්ශයන් වෙනුවෙන් පෙනී සිටීම නිසා ය.

පවතින බරපතළ අභියෝගවලින් එකක්, ඇලන් බොදීව්ගේ අදහස්වලින් පවස්නේ නම් 'මේ යුගයේ පවතින බරපතළ ප්‍රශ්නවලින් එකක් වන්නේ සමාජ යුක්තිය හා සාධාරණය පිළිබඳ කතා කරන සමාජ කණ්ඩායම්වලට, අත්පත් කර ගත නොහැකියි කියා හිතෙන දේ අත්පත් කර ගැනීම සඳහා ධෛර්යය බොහෝ සිවිල් සමාජ සංවිධානවලින් ගිලිහී ගොස් ඇති බව' ය. 2005 සිට වරින් වර ලංකාවේ සිවිල් සමාජය, ආයතන මේ අභියෝගයට ගොදුරු විය. *CPA* සංවිධානය පිළිබඳ සලකා බලන විට සාධාරණ යුක්තිසහගත සමාජයක් වෙනුවෙන් පෙනී සිටීමේ ධෛර්යය අගය කළ යුතු ය.

මෙම සංවිධානය ප්‍රතිපත්ති උපදේශනයට සීමා නොවී ඉන් ඔබ්බට ගොස් යම් යම් සමාජ මැදිහත් වීම් සිදු කර තිබේ. මට ඇති එක් අත්දැකීමක් වන්නේ, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහනේ උපදේශකයෙකු වශයෙන් කටයුතු කිරීම ය. පළාත් පාලන ආයතනවල පවතින නීතිය පිළිබඳ පළාත් පාලන ආයත සභිකයන්ට සහ ජනතාවට ද අවබෝධයක් නොමැත. එවැනි අවස්ථාවක දී එම අවබෝධය ඉහළ නංවමින් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට යම් මැදිහත් වීමක් කළ අතර එහි දී සමාජයට වැදගත් කෘති කීපයක් පළ කිරීම පමණක් නොව ගමින් ගමට ගොස් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා විවිධ ප්‍රායෝගික වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ලැබී ය.

## CPA හමුවේ ඇති ගැටලු සහ අභියෝග

මෙරට සිවිල් සමාජ සංවිධාන බොහොමයක් පවතී. සාමය, බලය බෙදා හැරීම, යුක්තිය සාධාරණත්වය, බහු සංස්කෘතිකවාදය වෙනුවෙන් පෙනී සිටී ඇතැම් සිවිල් සංවිධාන ආයතනවලට එම පරමාදර්ශවල එල්ලී සිටීමේ ධෛර්යය නොමැති තත්ත්වයක් හඳුනාගත හැකි ය. මෙම ධෛර්යය නොමැති වීම නිසා ම සිවිල් සමාජය විසින් ගොඩනගන ලද යහ ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් ඔවුන් විසින් ම අතැම් අවස්ථාවල සොදාපාළුවට ලක් කිරීමට ඉදිරිපත් වූ - මාවෝවාදී වචනවලින් කියන්නේ නම් 'අතැම් මීයන් සිටින බව' හඳුනාගත හැකි ය. මීයන් යනු නැවට අනතුරක් වන විට අතිශයෙන් කලබලයට පත් වන කොටසකි. මෙය සිවිල් සමාජය සම්බන්ධයෙන් ගත් විට ජාතික දේශපාලනයේ ඇති වන මෙම ආකෘතිය සමඟ මීයන් සේ වැනෙන ඇතැම් සිවිල් සමාජ සංවිධාන තිබේ. ඉතා දීර්ඝ කාලයක් සාමය හා බලය බෙදීම වෙනුවෙන් කතා කළ ඇතැම් සංවිධාන සහ ඇතැම් විද්වතුන් පවා තමන්ට එතැනින් එහා ගමනක් යා නොහැකියැයි සිතා ධෛර්යය බිඳ ගන්නා තත්ත්වයන් පවතී. එම ධෛර්යය බිඳ ගැනීමත් සමඟ ගොඩනගන ලද ප්‍රජාතන්ත්‍රවාදී සමාජ සාධාරණත්වය සඳහා වූ සාකච්ඡාවන් එක රැයින් දෙකින් උඩු යටිකුරු වන තත්ත්වයන් තිබේ. ඊට හේතුව ලෙස මා දකින්නේ සිවිල් සමාජ ක්‍රියාකාරිකයන්ගේ අවස්ථාවාදී බව ය. සමාජ සාධාරණය වෙනුවෙන් පෙනී සිටිනවා යැයි සිතන අයගේ අභ්‍යන්තරයේ උග්‍ර වර්ගෝත්තමවාදී, ආගමික උම්මත්තකවාදී හැඟීම් ඇත. ඔවුන් පොදු අවකාශයේ දී ආගමික සහජීවනය, සමාජ යුක්තිය, ජනවාර්ගික එකමුතුව ආදී දේවල් සාකච්ඡා කළ ද පෞද්ගලික ජීවිතයේ දී අවස්ථාවාදී නැඹුරුතාවන් පෙන්නුම් කරයි.

එක් නිදසුනක් පවසන්නේ නම් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ම සංවිධානය කළ සාමය ගොඩනැගීම, බලය බෙදා හැරීම, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුවකට සහභාගී වී සම්පත්දායකත්වය වෙනුවෙන් ලැබුණ මුදල ද ගෙන හවස කොළඹ පැමිණ 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඉතාම නිර්ලජ්ජිත ලෙස පෙනී සිටි සම්පත්දායකයන් සිටි බව අපට මතක ය. කැප වීමක් තිබෙන මිනිසුන් සමඟ මේ ගමන යන්නේ කෙසේ ද යන්න සිවිල් සමාජය මුහුණ දෙන අභියෝග

යකි. සිවිල් සංවිධාන සමඟ වැඩ කිරීමට පැමිණෙන සියලු දෙනා ම කැප කිරීමක් සහිත අය නොවේ. විශේෂයෙන් ම ලංකාවේ ශාස්ත්‍රාලීය බුද්ධිමතුන් යනු එක්තරා ආකාරයකට කුහක ගතිගුණ සහිත කණ්ඩායමකි. ඒ අය නිරන්තරයෙන් කල්පනා කරන්නේ වැඩසටහන්වලට සම්බන්ධ වීමෙන් තමන්ට ලැබෙන්නේ මොනවා ද යන්න පමණි. ඒ නිසා ලංකාවේ සිවිල් සංවිධාන ආයතනවලට සම්පත්දායකත්වය සපයන අයගේ පරමාදර්ශී කැප වීම සම්බන්ධයෙන් විවිධ ගැටලු පවතී.

සිවිල් සමාජ සංවිධාන පිළිබඳ අනියත බියක් නිර්මාණය කරනු ලබන්නේ ආණ්ඩුව සහ ආණ්ඩුවෙන් යම් යම් වරදාන වරප්‍රසාද ලබන ඊනියා බුද්ධි ජීවීන් විසින් ය. අපට පෙනෙන්නට තිබෙන හමුදාව පොලීසියට අමතරව රාජ්‍යය සමඟ බැඳුණු තවත් මතවාදී තලයක් ඇත. මහජන අවකාශයට ප්‍රවේශ වීමට ඇති මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධතා තිබෙන්නේ ඒ පිරිසට ය. මහජන අවකාශයේ මත නිර්මාණය කිරීම හා ඒවා බෙදා හැරීමේ අවකාශය තිබෙන්නේ රජයට ය. නැතිනම් රජයේ මාධ්‍ය හා රජයේ අනුග්‍රහය ලබන මාධ්‍ය ආයතනයන්ට ය. සිවිල් සමාජ සංවිධාන පිටරටින් මුදල් ගන්නා, විදේශ අවශ්‍යතා වෙනුවෙන් පෙනීසිටින, මේ රටේ සංස්කෘතිය විනාශ කරන, රටේ ඒකීයත්වය විනාශ කරන කණ්ඩායමක් වශයෙන් සමාජගත කරන්නේ මෙම මාධ්‍ය ආයතන ඔස්සේ ය. සිවිල් සමාජ සංවිධාන තුළත් මේ ගැටලුව යම් ආකාරයකින් පවතී. ඉදිරියට *CPA* වැනි සිවිල් සමාජ සංවිධාන පැවැත්මක් ගැන හිතන්නේ නම් තම මූලෝපායන් සකසා ගැනීමේ දී බරපතළ ලෙස කල්පනා කළ යුතු දෙයක් වන්නේ විකල්ප මාධ්‍ය අවකාශය වඩාත් ප්‍රයෝජනවත් ලෙස භාවිත කරන්නේ කෙසේ ද යන්න ය. සමාජ යුක්තිය, සාධාරණත්වය පිළිබඳ පණිවිඩය සමාජගත කිරීම සඳහා විවිධ සමාජ මාධ්‍ය ජාලා භාවිත කළ හැකි ය. එහි ඇති වාසිය වන්නේ කුමන විවේචන ඉදිරිපත් කළ ද විකල්ප අවකාශය මහජනතාවට වඩාත් පහසුවෙන් ප්‍රවේශ වීමට සහ තොරතුරු ලබා ගැනීමට තිබෙන මාධ්‍ය ලෙස ක්‍රියාත්මක් වීම ය. මූලෝපායන් සකස් කිරීමේ දී මේ පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය. සිවිල් සමාජය අරබයා අධිපතිවාදී මාධ්‍ය ලෝකයේ ගොඩනගා තිබෙන සාධනීය නොවන පින්තාරු කිරීම සහ රූපගත කිරීම හා විවිධ පරිකල්පනයන් වැරදි බව වටහා දීමේ යාන්ත්‍රණයක අවශ්‍යතාව දැඩිව පවතී. එසේ නොවුණහොත් සිවිල් සමාජ සංවිධානවලට ක්‍රියාකාරීව ඉදිරියට යෑමේ අපහසුතාවක් නිර්මාණය වේ. එසේ ම සිවිල් සමාජ සංවිධාන ස්වකීය සම්පත්දායකයින් තෝරා ගැනීමේ දී ඉතා ම සුපරීක්ෂාකාරී වීම ද වැදගත් ය. මෙවැනි ආයතනවල වැඩ කරමින් අදාළ පණිවිය සමාජයට ගෙන යෑමට පැමිණෙන බුද්ධි ජීවීන් යැයි පවසන කණ්ඩායම පරමාදර්ශ වෙනුවෙන් කැප වන කණ්ඩායමක්ද නැද්දැයි විමසා බැලීමකින් තොරව සේවය ලබා ගැනීම ප්‍රජාතන්ත්‍රීය සිවිල් සමාජ අවකාශය විනාශ කිරීමට හේතු වනු ඇත. මෙවැනි අය සිවිල් සමාජ වැඩවලදී එක් දෘෂ්ටිවාදයක් වෙනුවෙන් ද පෞද්ගලික ලෝකයේ දී තවත් දෘෂ්ටිවාදයක් වෙනුවෙන් ද පෙනී සිටියහොත් මෙවැනි ආයතන ගෙනයන පණිවිඩයේ ඇති සුජාතභාවය එතැනම ඈවර වේ. සිවිල් සමාජ සංවිධානවලට ඇති අභියෝග දෙයාකාර ය. එක් පැත්තකින් මර්දනකාරී රාජ්‍ය තන්ත්‍රය පවතින අතර අනෙක් පැත්තෙන් සිවිල් සමාජවලට සම්බන්ධ වී වැඩ කරන ක්‍රියාකාරිකයින්ගේ ඇති ව්‍යාජත්වය ය. මේ දෙක අතර මනා සමබරතාවක් පවත්වා ගැනීම සිවිල් සමාජ සංවිධාන හමුවේ ඇති අභියෝග වශයෙන් හඳුනාගත හැකි ය.

කෙසේ වතුදු අවසාන අර්ථයෙන් ගත් විට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දශක තුනකට ආසන්න කාලයක් අල්ලාගෙන සිටිමින් යහපත් සමාජ දේශපාලන හා සංස්කෘතික වටපිටාවක් නිර්මාණය කර ගැනීම සඳහා කරන කාර්යයට අප සුභාසිංසන එකතු කරන්නේ තව ඉදිරියටත් මෙම සමාජ සත්කාරය කරගෙන යෑමට ධෛර්යය ලැබෙන හැටියට ය.

---

**මහාචාර්ය උපුල් අබේරත්නඃ**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව පිලිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය සහ දර්ශනපති උපාධිය ලබා ඇති උපුල් අබේරත්න බැංගලෝර් විශ්වවිද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව පිළිබඳ දර්ශන ශූරි උපාධිය ලබාගෙන ඇත. දැනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපතිවරයා වේ.

# රිදී ජුබිලියට උපහාර



ආචාර්ය
**විනයා ආරියරත්න**

සංවිධානයක හරයාත්මක වටිනාකම් කෙරෙහි කැප වී සිටීම සහ අභියෝගාත්මක තත්ත්වයන් තුළ යුක්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දිගට ම පෙනී සිටීම අපගේ වැනි ජාතියක් සහ දේශපාලනයක් තුළ පහසු නොවේ. ජනවර්ග, ආගම්, පන්ති, භාෂා අනන්‍යතා අතර කියා නිම කළ නොහැකි ලෙස බෙදී ඇති සහ දේශපාලන බලය ලබා ගැනීමට සහ රැක ගැනීමට එබඳු බෙදීම් යොදාගන්නා පසුබිමක, ආධිපත්‍යධාරී දේශපාලන මතවාදයේ සහ ජාතික ප්‍රකාශනයේ පවතින තත්ත්වයට අභියෝග කිරීම, කිව නොහැකි තරම් අපහසු සහ අවදානම් සහිත ද වෙයි. බලයේ සිටි විවිධ ආණ්ඩු යටතේ බහුලව පැවති එබඳු අභියෝග ඉදිරියේ කෙළින් සිටගනිමින්, දිවයිනේ ප්‍රජාතන්ත්‍රවාදය සහ අයිතීන් පදනම් කරගත් ප්‍රවේශයේ පරමාදර්ශවලට දායක වෙමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශ සහ මානව හිමිකම් තහවුරු කිරීමට දායක විය.

හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග නායකත්වය දුන් පොදුජන එක්සත් පෙරමුණ 1994 දී බලය ලබාගත්තේ ශ්‍රී ලංකාවේ දිගුකාලීන සිවිල් ගැටුමට සාකච්ඡා මාර්ගික දේශපාලන විසඳුමක්, පෙර සිදු වූ මානව හිමිකම් අපචාර සම්බන්ධයෙන් ඉහළ වගවීමක් සහ ආණ්ඩුවේ දූෂණ අවසන් කිරීමේ සහතික වීමක් පොරොන්දු වූ ශක්තිමත් මානව හිමිකම් වේදිකාවක් මතිනි. මෙම පොරොන්දුවලට ලැබුණු අතිවිශාල ජනප්‍රියතාව නිසා නව සන්ධානයට, ඔවුන්ට පෙර දහ හත් වසරක් රට පාලනය කළ ආණ්ඩුව පෙරළා දැමීමට හැකියාව ලැබිණි. ජනප්‍රිය අපේක්ෂාව වූයේ ශ්‍රී ලංකාවේ සජීවී ප්‍රජාතන්ත්‍රවාදී භූ දර්ශනයක් සඳහා වන නව යුගයක් උදා වනු ඇති බව යි. එබඳු සන්දර්භයක් තුළ බලපෑම් සහිත සිවිල් සමාජ

මැදිහත්වීමක අවශ්‍යතාව බලවත් ලෙස දැනුණි. එම දැක්ම යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවන ලද්දේ (1996 දී) ප්‍රධාන වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, සාමය සහ මානව හිමිකම් ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහ උද්දේශන මගින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට දායක වෙමින් පෙර කී පරමාදර්ශ ශක්තිමත් කිරීම සඳහා වන අතර එහි ආයතනික දැක්ම වූයේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් ගොඩ නැගීම යි.

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම ලෙස සංවිධානයක් වශයෙන් ඔවුන් විශ්වාස කරන දේ වර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට ස්ථිර සහ තිරසාර කැපවීමක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එහි ආරම්භයේ සිට ම පෙන්නුම් කළ බව සටහන් කිරීම වැදගත් ය. අභියෝගාත්මක තත්ත්වයන් යටතේ පවා ඔවුන් තම මෙහෙවරින් සහ හරයාත්මක වටිනාකම්වලින් කිසි විටෙක අපගමනය වුයේ නැත. දශක දෙකකට වැඩි කාලයක ක්‍රියාකාරීත්වය මගින්, මහජන බුද්ධිමතුන්, ක්‍රියාධරයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, දේශපාලනඥයින්, සහ සාමාන්‍ය පුරවැසියන් අතර, ශ්‍රී ලංකාවේ බහුතරවාදී සීමාවන්ගෙන් ඔබ්බට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ දැක්ම පුළුල් කිරීමට සහ පෝෂණය කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දායක වූ බව නිසැක ය. ඒ අතර, ප්‍රජා මූල සංවිධාන, පළාත් පාලන බලධාරීන් සහ වෙනත් සිවිල් සමාජ හවුල්කරුවන් සමඟ අත්වැල් බැඳගෙන වැඩ කිරීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැක් වූ නම්‍යශීලී බව නිසා බිම් මට්ටමේ දී ප්‍රජාතන්ත්‍රවාදයට සහ අයිතීන්ට ඇති පිළිගැනීමේ විනිවිදීම අර්ථවත් ලෙස ඉහළ නැංවීමට හේතු විය. එපමණක් නොව, තමන්ගේ හවුල්කාර කොටස්කරුවන්ගේ හැකියා විශාල ලෙස වර්ධනය කිරීමට ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උපකාරී වී ඇත.

ස්වාධීන, පක්ෂග්‍රාහී නොවූ සංවිධානයක් ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය බලය බෙදා ගැනීමක් පිළිබඳව පුළුල් පර්යේෂණ, මහජන සංවාද සහ ප්‍රබල උද්දේශන ක්‍රියාවල යෙදුණු අතර ඒ සම්බන්ධයෙන් නිර්මාණාත්මක ප්‍රතිපත්ති විකල්ප රාශියකට දායක වී ඇත. ඊට අමතරව, විකල්ප ප්‍රතිපත්හි කේන්ද්‍රය පෙරමුණ ගත් ප්‍රධාන වශයෙන් මානව හිමිකම් ඉලක්ක කර ගත් මහජන ළැදියා නඩු කටයුතු, ඔවුන් ක්‍රියාත්මක වූ කාලය පුරා ම කැපී පෙනෙන තත්ත්වයේ තිබිණි. රටක අධිකරණයක සුවිශේෂ කැපවීමක් වන්නේ ඒකාග්‍ර ජාතික ක්‍රමයක් තුළ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආරක්ෂා කිරීම සහ විධායක ක්‍රියාවන්ගේ නීත්‍යනුකූලභාවය තක්සේරු කිරීම වන නිසා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවලට, ආණ්ඩුවේ පනත්වලට සහ වැදගත් අවස්ථාවල ආණ්ඩුවේ තීරණවලට අභියෝග කිරීමේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ක්‍රියාමාර්ග මගින් මහජනයාගේ ස්වාධිපත්‍යය සහතික කිරීමට දායක වූයේ, දිවයිනේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඉතිහාසයේ පර්වර්තනයක් සිදු කරමිනි. එම තත්ත්වය තුළ, සිරිසේන ජනාධිපතිවරයාගේ ආණ්ඩු කාලය තුළ, ප්‍රතිසංධානය සඳහා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා මහජන මත විමසුම් කළ අවස්ථාවේ දී, සරා සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග එකට වැඩ කිරීමේ වරප්‍රසාදය මට හිමි විය.

ශ්‍රී ලංකාවේ බහුත්ව, විවිධත්වයෙන් යුතු සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩ නැගීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නොපසුබට කැපවීම මෑත කාලයේ සිවිල් සමාජ මැදිහත්වීමේ ඉතා වටිනා පරිච්ඡේදයක් ලෙස හඳුනා ගත යුතු ය. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ තවදුරටත් පෝෂණය කිරීමට තවත් වසර බොහෝ ගණනක සජීවී සිවිල් සමාජ ක්‍රියාකාරීත්වයක් සඳහා ඔවුන්ගේ ප්‍රශංසනීය සේවය කරගෙන යෑමට සරාට, කැපවීමෙන් යුතු ඔහුගේ කණ්ඩායමට සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මම මගේ උණුසුම් සුබ පැතුම් සහ ආශිර්වාදය පුද කරමි.

---

**ආචාර්ය විනයා ආරියරත්න**

සර්වෝදය ව්‍යාපාරයේ සභාපතිවරයා ය. ශ්‍රී ජයවර්ධන විශ්වවිද්‍යාලයේ ප්‍රජා වෛද්‍ය පීඨයේ කථිකාර්යවරයෙකි. සිවිල් සමජ ක්‍රියාධරයෙකි. ප්‍රජා සෞඛ්‍යය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකි. විවිධ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ ලිපි හා පොත් පළ කර ඇත.

# සිවිල් සමාජ අවකාශයෙහි නායකත්වය



**දිනේෂා ද සිල්වා වික්‍රමනායක**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, එහි 25 වැනි සංවත්සරය සමරන අවස්ථාවේ ආසියානු පදනම වෙනුවෙන් සුබ පැතීමට මම කැමැත්තෙමි. ක්‍රියාකාරී සහ ස්වාධීන ආකාරයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා මැදිහත් වන නව සංවිධානයකට ආධාර ලබාගැනීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ තරුණ කථිකාචාර්යවරුන් කණ්ඩායමක් එවකට ආසියානු පදනමේ ශ්‍රී ලංකාවේ නියෝජිත එඩ්වර්ඩ් ඇන්ඩර්සන් මහතා හමුවීමට පැමිණි 1996 ආරම්භක අවස්ථාවේ සිට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ආධාර කිරීමට ලැබීම අප ලද වරප්‍රසාදයකි.

1996 සැප්තැම්බරයේ පදනමෙන් ලැබුණු ආරම්භ කිරීමේ අරමුදලේ සිට, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගොඩනගා වසර 25ක ගමනක් පැමිණ ඇත්තේ, පර්යේෂණ සහ උද්දේශන මගින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට දායක වෙමින්, බලාපොරොත්තු නොවූ ආකාරයෙන් වර්ධනය වෙමින් සහ විශාල වෙමින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන සිවිල් සමාජ සංවිධානය බවට පත්වෙමින් ය. පදනමේ එකල සිටි වැඩසටහන් නිලධාරී වශයෙන්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කිරීමට මග පෑදු සාකච්ඡාවලට සහ දීමනා ලියැවිලි සැකසීමට මම කිට්ටුවෙන් සම්බන්ධ වූයෙමි. "ශ්‍රී ලංකාවට වැදගත් වන ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සංවාදය දිරිමත් කිරීමට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට කරුණු ලබා දීමට" තම පළමු සම්මන්ත්‍රණ /වැඩමුළු මාලාව පැවැත්වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට හැකි වන පරිදි පදනම සුළු මුදලක් ලබා දුන්නේ ය. පදනමේ සියලු ආධාරවල දී මෙන් ම මෙහි දී ද, තම ප්‍රකාශන සහ වාර්තා පුළුල් ලෙස විකිණීමෙන් මෙම නව සංවිධානයට ද 'තිරසරභාවයට' පත් විය හැකි වනු ඇතැයි අපි නිර්දේශ කළෙමු. එබැවින් එම අභිමානයෙන් යුතුව, ආසියානු පදනමේ වත්මන් ශ්‍රී ලංකාවේ නියෝජිත වශයෙන්, මගේ

පූර්වගාමීන් වන එඩ්වර්ඩ් ඇන්ඩර්සන්, මාක් මැක්කෙන්නා, නීලන් ප්‍රනාන්දු සහ ආසියානු පදනමේ ජ්‍යෙෂ්ඨ නායකත්වය ද වෙනුවෙන්, පසුගිය වසර 25 තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලද අසාමාන්‍ය සාර්ථකත්වය අගය කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කොට කෙටි කලෙක දී, ඔවුන්ගේ යෝජිත වැඩ සැලසුමට 1997 වයඹ පළාත් සභා මැතිවරණය මගින් බාදා සිදු වන්නේ, එහි දී දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් සහ මැතිවරණ දූෂණ පිළිබඳ චෝදනා පෙර නොවූ විරූ මට්ටමකට ඉහළ යෑම සමග ය. ඔවුන්ගේ වරම සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්නයේ තීරණාත්මක වැදගත්කම සැලකිල්ලට ගනිමින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත වතාවක් අප හමු වූයේ දේශපාලන ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණය කිරීම සඳහා මුල පිරුමකට ආධාර ලබා ගැනීම සඳහා ය. මෙම අවදානම් යෝජනාව භාර ගැනීමට වෙනත් ආධාර දෙන සංවිධාන කිසිවක් කැමති නොවූ කාලයක, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි ව්‍යාපාරය සමග හවුල්කාරීත්වයෙන්, දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය *(CMEV)* ආරම්භ කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට හැකි වන පරිදි ආසියානු පදනම ආධාර ලබා දුන්නේ ය. ඉන් පසු සියලු මැතිවරණවල දී දිගට ම සිදු කළ ආකාරයට, එම පළාත් පාලන මැතිවරණයේ දී විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මගින් දිනපතා තොරතුරු ලබා දීමට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය කටයුතු කළේ ය. මෙය, සිද්ධියෙන් පසුව වාර්තාවක් නිකුත් කරන විද්වත් කටයුත්තක් නොවිය යුතු බවත්, ඒ වෙනුවට, දැනුවත් තෝරා ගැනීමකට ඡන්දදායකයාට අවස්ථාව ලබා දෙන ලෙස මැතිවරණ ක්‍රියාවලියට සැලකිය යුතු යෙදවුමක් විය යුතු බවත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රබල අදහස වී ය. මෙම ක්‍රියාශීලී ප්‍රවේශය, එනම්, ප්‍රතිසංස්කරණ සඳහා පර්යේෂණ/ විග්‍රහ සහ නිර්දේශ ලබා දීම සහ ඔවුන්ගේ වැඩ කරන සියලු ක්ෂේත්‍රයන්ට මැදිහත් වීම මගින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ වෙනත් සිවිල් සමාජ සංවිධානවලින් වෙනස් ආයතනයක් බවට පත් වී ය.

පසුගිය වසර දෙකහමාරක කාලය තුළ, ඔවුන්ගේ විශේෂිත ප්‍රකාශන සහ සම්මන්ත්‍රණ/ වැඩමුළු ආදියට අමතරව විවිධ අවස්ථාවල "ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නිරීක්ෂණය" ප්‍රකාශයට පත් කිරීමට, නඩු තීන්දු නිරීක්ෂණයට සහ වාර්තා කිරීමට, නීති ආධාර ලබා දීමට සහ උපායමාර්ගික ලෙස වැදගත් මහජන ළැදියා නඩු ක්‍රියාත්මක කිරීමට, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ආධාර ලබා දීමට ද, පදනමට හැකියාව ලැබිණි. තව ද, අප ආධාර කළ වඩාත් පරිවර්තනීය වැඩ සටහනක් වන්නේ පිලිපීනයේ නිරීක්ෂණ සංචාරයක යෙදෙමින් ආසියානු පදනමේ පිලිපීනයේ දිගු කාලීන මුදල් ලබා දෙන්නකු වන 'සෝෂල් වෙදර් ස්ටේෂන්' *(SWS)* සමග කාලය ගත කිරීමට ආචාර්ය සරවනමුත්තුට අවස්ථාව ලබා දීම යි. එහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය මහාර් මහන්ග ාස් සහ *SWS* කණ්ඩායම සමග අන්තර් ක්‍රියාකාරීත්වය මගින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට තමන්ගේ ම සමාජ විශ්ලේෂණ සහ පර්යේෂණ ආයතනය ලෙස 'සෝෂල් ඉන්ඩිකේටර්' ගොඩනැගීමට හැකි වූ අතර, එමගින් ශ්‍රී ලංකාවේ මහජන මත විමසුම් සහ සමාජ, ආර්ථික සහ දේශපාලන සමීක්ෂණ සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට හැකියාව ලැබිණි.

ශ්‍රී ලංකාවේ පසුගිය දශක තුන, දේශපාලන නායකත්වය පිළිබඳ අර්බුදවලින් ද, ප්‍රජාතන්ත්‍රවාදයට සහ ආණ්ඩුකරණයට විවිධාකාර වූ තර්ජනවලින් ද පිරුණු කාල පරිච්ඡේදයක් වී ය. එම කාලයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වර්ධනය වීම සහ පිබිදීම සිදු වූයේ, ස්වාධීන විචාර, නීතිමය විශ්ලේෂණ සහ විවේචන ලබා දෙමින්, තීරණාත්මක මහජන ළැදියා නඩු මෙහෙයවමින් සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය, ගැටුම් පරිවර්තනය සහ මානව හිමිකම් ක්ෂේත්‍රවල නිර්පාක්ෂික, ප්‍රබල හඬක් ලෙස සේවය කරමින්, සිවිල් සමාජ අවකාශයේ නායකත්වය හිමි කර ගනිමිනි. ඉතාමත් වැදගත් වන්නේ, දේශපාලනීකරණය, පෞද්ගලික වරප්‍රසාද සහ දූෂණය මගින් හැසිරීම් තීරණය වන සංස්කෘතියක් පවතින අතර, හේතුවාදී, ස්වාධීන සහ වගවීමේ ප්‍රබෝධමත් හඬක් බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පත් වීමයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම ස්ථාවරයේ සිටි අතර දුෂ්කර කාලවල දී වඩා ශක්තිමත්ව සිටියේ ය. කැපවුණු

සහ උද්‍යෝගිමත් නායකත්වයක් යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පුහුණුවීමේ හෝ වැඩ කිරීමේ හෝ අවස්ථාවෙන් ප්‍රතිලාභ ලැබීමට අවස්ථාව ලද දේශීය සහ ජාත්‍යන්තර තරුණ තරුණියන් විශාල පිරිසකට එය වටිනා පුහුණු භූමියක් ලෙස ද සේවය කළේ ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ආරම්භය සහ වර්ධනය සඳහා අප කළ කුඩා කාර්යභාරය පිළිබඳව ආසියානු පදනමේ අපි ආඩම්බර වන අතර අනාගතයේ දශක ගණනාවක් තම ඉතා වැදගත් කාර්යයන් කරගෙන යෑමට ආචාර්ය සරවනමුත්තුට සහ විකල්ප ප්‍රතිපත්හි කේන්ද්‍රයේ සමස්ත කාර්ය මණ්ඩලයට අපි අපගේ උණුසුම් සුබ පැතුම් පිළිගන්වන්නෙමු. ඔබගේ දිගු කාලීන සාර්ථකත්වය ප්‍රර්ථනා කරන අපි, ශ්‍රී ලංකාවේ යහපාලනය සහ වගවීම වර්ධනය කිරීමට අපගේ ශක්තිමත් හවුල්කාරීත්වය ගැඹුරු සහ වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වෙමු.

---

**දිනේෂා ද සිල්වා වික්‍රමනායක**

ආසියානු පදනමේ වත්මන් ශ්‍රී ලංකා නියෝජිතවරියයි. ශ්‍රී ලංකා දේශීය ආර්ථික පාලන වැඩසටහනේ කණ්ඩායම් නායිකාව වශයෙන් ද, *Foundation's Washington D.C* කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂකවරිය වශයෙන් ද කටයුතු කර ඇත. ආර්ථික පාලනය, නීතියේ ආධිපත්‍ය, යුක්තිය සඳහා ප්‍රවේශය සහ ගැටුම් නිරාකරණය ආදී ක්ෂේත්‍රවල උනන්දුවක් සහ පළපුරුද්දක් සහිත ඇය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ජෝර්ජ්ටවුන් විශ්වවිද්‍යාලයෙන් *(university of Georgetown)* ද පශ්චාත් උපාධිය කොලුම්බියා විශ්වවිද්‍යාලයෙන් *(university of Columbia)* ද ලබා ඇත.

# ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් වෙනුවෙන් නොසැලී අරගල කළ වසර විසිපහක්



නීතිඥ
**සුදර්ශන ගුණවර්ධන**

විකල්පයක් අවශ්‍ය වන්නේ ඇයි? විකල්පයක් අවශ්‍ය වන්නේ පවතින සම්මතය නොසෑහෙන නිසා ය.

යටත් විජිත පාලනයෙන් ස්වාධීනත්වය ලබා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකාව පශ්චාත්-යටත් විජිත ජාතික ප්‍රතිපත්තියෙක් ගොඩනගා ගැනීම සඳහා අරගලයක නිරත විය. මෙම ජාතික ප්‍රතිපත්තිය ගොඩනැගුණේ එක් පැත්තකින් යටත්විජිතවාදී ස්වාමියා විසින් ගොඩ නගා දෙන ලද ආයතන පද්ධතියත්, අනෙක් පසින් නැග එන තරගකරී ජාතික අභිලාෂයනුත් අතර දෝලනය වෙමිනි.

මෙසේ ගොඩනැගෙමින් පැවැතුණු ජාතික ප්‍රතිපත්තිය නොසෑහෙන බැවින් ඒ සඳහා ජාතිකවාදී විකල්පයන් දකුණෙන් ද, උතුරෙන් ද ඉදිරිපත් විය. එම විකල්ප අතර තරගය හේතුවෙන් ජනවාර්ගික පදනම මත රට ද්‍රැවීකරණය විය. මෙයට විකල්පව පශ්චාත්- යටත්විජිත ජාතික ප්‍රතිපත්තිය විවේචනය කරමින් ඉදිරිපත් වූ තවත් විකල්පයක් වන්නේ සමාජවාදී විකල්පය යි. එමගින් වරප්‍රසාද අහිමි සමාජ පන්තීන් වෙත වාසිදායක වන ලෙස සමාජ පර්යාය නැවත සකස් කිරීමට යෝජනා කෙරිණි. ජාතිකවාදී විකල්පය වඩා ප්‍රබල වීම නිසා පසුකලෙක සමාජවාදී විකල්පය එකී ජාතිකවාදී විකල්පය තුළ ගිලී ගිය ආකාරයක් දක්නට ලැබිණි.

අදින් වසර විසි පහකට පෙර 'විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය' බිහිවන්නේ අසමත් වෙමින් පවතින සම්මත ජාතික ප්‍රතිපත්තිය හුදෙක් විවේචනයට ලක් කිරීමෙන් ඔබ්බට ගොස්, විකල්ප ප්‍රතිපත්ති පිළිබඳ සංවාදයක් දියත් කිරීමේ අරමුණ ඇතිව ය.

1994 පොදු පෙරමුණු මැතිවරණ ජයග්‍රහණයත් සමගම ප්‍රජාතාන්ත්‍රික අවකාශය පුළුල් වූ අතර, සිවිල් සමාජ සංවිධාන වඩාත් ක්‍රියාශීලී භූමිකාවක් රඟපාමින් ආණ්ඩුකරණය පිළිබඳව මැදිහත්වීම් කිරීම් අරඹා තිබුණි. ඒ වන විට පෙරමුණෙහි පැවැති සංවිධානයන් සහ ඒවායේ ප්‍රධාන පෙළේ ක්‍රියාකාරීන් සතු පොදු උරුමයක් වූයේ වාමාංශික සමාජවාදී සම්ප්‍රදාය යි. උතුරු පළාත කේන්ද්‍රකොට ගෙඩනැගුණු සිවිල් සමාජ ව්‍යාපාරය කෙරෙහි දෙමළ ජාතිකවාදී ආභාසය ලැබී තිබිණි. දකුණෙහි ජාතිකවාදී සිවිල් සමාජ ව්‍යාපාරයක්ද එයට ප්‍රතිචාර ලෙස ගොඩනැන්විණි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමාජවාදී හෝ ජාතිකවාදී විකල්පයන් වෙනුවට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත පදනම්වූ විකල්පයක් වෙනුවෙන් පෙනී සිටියේ ය. ලංකාව නමැති රාජ්‍යය සහ සමාජය අද මුහුණ පා සිටින ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අභියෝගයන්ට මුහුණ දිය හැකි, බහුවිධත්වය සහ ඉවසීම මත පදනම් වූ විකල්පයක් ගොඩනැගීමේ සංවාදය වසර විසි පහක කාලයක් තුළ එය විසින් කරන ලද්දේ ය.

රාජ්‍ය පාලනයේ මූලධර්මය ලෙස ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය අප විසින් පිළිගෙන ඇත. එම මූලධර්ම සංගෘහිත කොට ඇත්තේ අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ය. එසේ වුවද අපගේ අධ්‍යාපනය, ආගමික සංස්ථා ආදිය ගොඩනැගී ඇත්තේ අධිකාරවාදී සම්ප්‍රදායක් මත ය. ලිබරල් වටිනාකම් පිළිනොගන්නා සමාජ බලවේග සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් මත ගොඩ නැගුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අතර නිරන්තර ඝට්ටනයක් ඇති වෙයි.

2001 වසරේදී සම්මත කරගත් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මෙන්ම 2015 දී සම්මත වූ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ද දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වඩා ප්‍රජාතන්ත්‍රකරණය කිරීම උදෙසා සිවිල් සමාජය වෙතින් මතු වූ අභිලාෂය ප්‍රකාශ වීමක් ලෙස සැලකිය හැකි ය. පිළිවෙළින් 2010 දී සහ 2019 දී 18 සහ 20 සංශෝධන මගින් එම වෑයම තාවකාලිකව ආපසු හැරවීමට ප්‍රතිගාමී සහ අධිකාරවාදී බලවේග සමත් වුවද ඉහත කී සංශෝධනයන්ගෙන් නිරූපිත සාරධර්ම සාධාරණ සමාජයක් ගොඩනැගීම සඳහා වන මාලිමාවක් බවට පත්ව තිබෙයි. එම සාරධර්ම පෝෂණය කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍ර විසින් කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කරන ලද්දේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කොට තිබේ. එහෙත්, ව්‍යවස්ථාදායකය විසින් එම අයිතිවාසිකම්වලට පටහැනි නීති විසින් සම්මත කරන්නේ නම් හෝ විධායකය විසින් එකී අයිතිවාසිකම් කඩ කෙරෙන ආකාරයේ පියවර ගැනෙන්නේ නම් ඉහත කී අයිතිවාසිකම්වලට අර්ථයක් අහිමි වෙයි. මෙහි දී පුරවැසියන්ට ඇති ප්‍රතිකර්මය වන්නේ එකී යෝජිත නීතිය කෙටුම්පත් අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය හමුවෙහි අභියෝග කිරීම සහ එකී විධායකයේ එකී ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කිරීම යි. පසුගිය වසර විසි පහ තුළ පැවැති සෑම ආණ්ඩුවක් විසින්ම ගනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී පියවරයන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කරමින් පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මැදිහත්ව ඇත. ඒ අභියෝගයන්හි ප්‍රතිඵලයක් ලෙස ලබා ගත් සමහර විනිශ්චිත නඩු තීන්දු මේ වන විට අධිකරණයන් විසින් නීතිමය අධිකාරයන් බවට ද පත් කර තිබේ.

ශ්‍රී ලංකාව තුළ මතුව එන වාර්ගික ජාතිකවාදී කතිකාවට පරස්පරව, ජාතික සමගිය සහ සංවර්ධනය සඳහා වන මාදිලියක් ලෙස කේන්ද්‍රයෙහි දී බලය බෙදා හදා ගැනීම සහ පර්යන්තයට බලය බෙදා හැරීම මත පදනම්වූ 'ෆෙඩරල් අදහස' ඉදිරියට ගැනීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද තවත් වැදගත් සම්ප්‍රදානයක් වෙයි. මෙම වැඩපිළිවෙළ මගින් ඉඩම් බලතල, පොලිස් බලතල සහ මූල්‍ය බලතල බෙදාහැරීම පිළිබඳව පුළුල් හැදෑරීමක් සිදු කරන ලදි. එම සාකච්ඡාව හුදෙක් ඉංග්‍රීසි බසින් පමණක් සීමා නොකොට බහුතර ජනතාවට පැහැදිලි වන අයුරින් සිංහල සහ දෙමළ භාෂාවලින්ද පවත්වාගෙන යෑමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙහෙස විය. එමෙන් ම ජාතීන් අතර යුක්තිය සහ සමානත්වය ප්‍රවර්ධනය කිරීම උදෙසා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අවබෝධ කරගෙන ඒ සඳහා අඛණ්ඩව මැදිහත්වීම ද සිදු විය.

අන්තර්ජාලය ප්‍රචලිත වීමත් සමගම එතෙක් ඇනලොග් යුගයෙහි පැවැති

බහුවිධ සන්නිවේදන මාධ්‍ය එක් ඩිජිටල් වේදිකාවක් මත අතිපිහිතවීම ඇරැඹිණි. මුද්‍රිත අකුරු, ශ්‍රව්‍ය මාධ්‍ය, දෘෂ්‍ය මාධ්‍ය මෙන්ම ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යද එකම වෙබ් අඩවියක් තුළ ඉදිරිපත් කිරීමට ලැබුණු මේ නව හැකියාව කල් තබාම හඳුනා ගෙන එයින් විපුල ඵල නෙළා ගැනීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමත් විය. ග්‍රවුන්ඩ්වීව්ස් පුරවැසි වෙබ් අඩවිය එහි අග්‍ර ඵලයයි. තනි තනි වෙබ් අඩවිවල බලපරාක්‍රමය බිඳගෙන ට්විටර්, ෆේස්බුක්, වට්සැප් ආදී සමාජ ජාලා මාධ්‍ය ප්‍රචලිත වන විට ඒවායෙහි නිසි ස්ථානය ලබා ගැනීමටද ග්‍රවුන්ඩ්වීව්ස් වෙබ් අඩවියට හැකි විය. ඒ අයුරින් විකල්ප ප්‍රත්පත්ති පිළිබඳව විශ්වසනීය මාධ්‍ය කේන්ද්‍රයක් වර්චුවල් අවකාශය තුළ ගොඩනැගිණි.

ප්‍රචණ්ඩත්වයෙන් සහ වංචනික ක්‍රියාවන්ගෙන් දූෂණය වී විශ්වසනීයත්වය බිඳ වැටී තිබුණු ඡන්ද ක්‍රමය ප්‍රතිසංස්කරණය කරනු පිණිස 'මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය හෙවත් සී.එම්.ඊ.වී. ගොඩනැගීමට උපස්ථම්භක වීම වනාහි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමෙහිලා කරන ලද වැදගත් ප්‍රතිපාදනයක් වෙයි. වෘත්තීයභාවයක් සහිතව ඡන්ද විමසීම් නිරීක්ෂණය කිරීමත්, එකී නිරීක්ෂණ ඇසුරෙන් නිර්දේශ ඇතුළත් වාර්තා ප්‍රසිද්ධ කිරීමත්, සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීමට ඇති බාධක නීතිමය වශයෙන් අභියෝග කරමින් අධිකරණමය පූර්වාදර්ශ ගොඩනැංවීමත්, නීති සහ ආයතන ප්‍රතිසංස්කරණයට දායක වීමත් එම වැඩකොටසට අයත් වෙයි. දශක දෙකකට ආසන්න කාලයක් මැතිවරණ දෙපාර්තමේන්තුව සහ පසුව මැතිවරණ කොමිසම විසින් පිළිගත් නිරීක්ෂණ සංවිධානයක් ලෙස සැලකුම් ලබන සිවිල් සමාජ සංවිධාන දෙකෙන් එකක් වන්නේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය යි.


ඉහත කී සියලු දායකත්වයන් අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි මා දකින සුවිශේෂ වැදගත්කම නම් විකල්ප ප්‍රතිපත්ති පිළිබඳ හුදු ඇකඩමික ක්‍රියාකාරකම්වලට සීමා නොවී, එම ප්‍රතිපත්ති මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරගැනීම උදෙසා සෙසු සිවිල් සමාජ සංවිධාන සමග එක්ව පොදු පෙරමුණක් ලෙස කටයුතු කිරීමට එය විසින් කළ මැදිහත් වීම යි. විශේෂයෙන්ම 2009 වසරේදී 'නිදහසේ වේදිකාව' නම් සිවිල් සමාජ වේදිකාව ගොඩනැගීමේ දී එහි කැඳවුම්කරුවෙකු ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු කළ මැදිහත් වීම ඓතිහාසික ය.

රට තුළ ප්‍රතිසංස්කරණ ගෙන ඒම සඳහා දේශපාලන සමාජය සමග විවෘතව එක පෙළට සිට ගෙන කටයුතු කළ යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශ්වාස කළේ ය; එපමණක් නොව ඒ වෙනුවෙන් පෙනී සිටියේ ය. බලයට පත් වූ ඕනෑම ආණ්ඩුවක් ප්‍රජාතාන්ත්‍රීය ප්‍රතිසංස්කරණ ගෙන එන විට ඒවාට සහයෝගය ලබා දීමත්, ඕනෑම ආණ්ඩුවක් වෙතින් ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජන එල්ල වන විට ඒ පිළිබඳව විවෘතව විරෝධය පෑමටත් එයට ශක්තිය තිබිණි. දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකයත්වය සමග කෙතරම් සමීපව වැඩ කටයුතු කළද, ප්‍රතිපත්තිමය වශයෙන් විරුද්ධ විය යුතු තැන අප්‍රමාදීව තම විරෝධය පළ කරන්නට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දෙවරක් කල්පනා කළේ නැත. 'අවසාන ප්‍රතිඵලය හෙවත් අන්තය විසින් මාර්ගය යුක්ති සහගත කරයි' යන ආප්තය පිළිපැදීමට කැමැති වූ වාමාංශික සම්භවයක් සහිත සිවිල් සමාජ සංවිධානවලින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනස් වන්නේ 'මාර්ගයම අන්තය' වන බව එම සංවිධානය විශ්වාස කළ නිසා ය. අසාධාරණයේ දී පවා නිහඬව සිටිමින් ඊනියා මධ්‍යස්ථභාවය ආරක්ෂා කරගැනීමට වෙර දරන ඊනියා සංවිධාන අතරේ අසාධාරණයේදී මධ්‍යස්ථ නොවී, එහෙත් තම ස්වාධීනත්වය ආරක්ෂා කරගෙන අපක්ෂපාතීව සහ වාස්තවිකව කටයුතු කරන ජාතික සිවිල් සමාජ සංවිධානයක් පිළිබඳ කදිම ආදර්ශයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ස්ථාපිත කොට ඇත.

---

**සුදර්ශන ගුණවර්ධන**
හිටපු විධායක අධ්‍යක්ෂ, 'රයිට්ස් නව්' කලෙක්ටිව් ෆො ඩිමොක්‍රසි. සම කැඳවුම්කරු, නිදහසේ වේදිකාව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ හිටපු සභාපති, හිටපු රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්. නීතීඥයෙකි. සිවිල් සමාජ ක්‍රියාධරයෙකි.

# ‘සාම විමර්ශී’ මගින් CPA හමුවීම



**බ්‍රිටෝ ප්‍රනාන්දු**

සිංහල භාෂාවෙන් “විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය” ලෙස හැඳින්වුවත්, එය වඩා ප්‍රසිද්ධ සහ කවරුත් වාගේ හඳුන්වනු ලබන්නේ *CPA* කියල යි.

*CPA* ගැන මම දැනගන්නෙ ‘සාම විමර්ශී’ සඟරාව ලැබීමත් සමග යි. දේශපාලන කටයුතුවල ‘නව සමසමාජ’ ක්‍රියාකාරිකයකු ලෙස නිරත වුණු මට මේ සඟරාව විශාල ප්‍රයෝජනයක් වුණා. යම් විෂයයක් පිළිබඳව විවිධ විද්වතුන්ගේ අදහස් කැටි කර ගත්, සියලුම කරුණු ගැන සාකච්ඡා කෙරෙන වැදගත් වැඩ කොටසක් මේ සඟරාව ඉටු කළා. එමනිසා යම් විෂයයක් ගැඹුරට හදාරන්න මෙය බොහෝ සේ උපකාරී වුණා.

සඟරාව හරහා *CPA* ගැන අසා තිබුණාට එහි ප්‍රධානීන් (සරා, භවානි, ලයනල් වැනි) සමග කිට්ටු ඇසුරකට වැටෙන්නේ 2012 පමණ ඇරඹුණ නිදහසේ වේදිකාවේ කටයුතුත් සමග යි. නිදහසේ වේදිකාවේ *CPA* නියෝජනය වූයේ ආචාර්ය සරවනමුත්තු (සරා) හරහා. ඔහු එහි ප්‍රධාන කථිකයෙක්. ඒ අමාරු කාලයේ (2012 - 2015) *CPA* සංවිධානය ‘නිදහසේ වේදිකාවේ’ මුල් ගලක්. එහෙම නැත්නම් පතාක යෝධයෙක්.

අපි ‘අතුරුදහන් වූවන්ගේ පවුල් එකතුව’ හැටියට බොහෝ ක්‍රියාකාරකම්වල (වීදි සටන්) යෙදුණු අය. බොහෝ පවුල්වල අය හා එක්ව අප අභියෝග කළේ පාරට එමිනුයි. නමුත් පවතින ඕනෑම රජයක්, මොකක් හරි නීතියක් (සමාජයට අහිතකරව බලපාන) ගෙනෙද්දි බොහෝ විට ඒකට නීති මගින් අභියෝග කිරීමට *CPA* හැම වෙලේම ඉදිරිපත් වුණා. ඒ අභියෝගය පැවති හැම ආණ්ඩුවකට ම බලවත් හිසරදයක් වූ බව නම් සත්‍යයි. ඒ වගේ ම ආණ්ඩුවල

එවැනි වූ ක්‍රියාවන් සම්බන්ධව අවම ලෙස ප්‍රකාශයක් මුලින් ම කිරීමට *CPA* එකට ධෛර්යයක් තිබුණා. බොහෝ විට ඒ ප්‍රකාශ, විශාල පරිවර්තනයකට හේතු නොවුණත්, ආණ්ඩුවල එවැනි මානව විරෝධී ක්‍රියාවලට පුද්ගලිකව හෝ සංවිධාන ලෙස විරුද්ධත්වය දක්වන්න උවමනාව තිබුණ සැමට විශාල ධෛර්යයක්, උත්තේජනයක් ගෙන දුන් බව නම් සත්‍යයක්.

අධිකරණ පද්ධතිය පිළිබඳව නීතියේ ආධිපත්‍යය ගැන මොන තරම් කලකිරීම් තිබුණත්, මෙවැනි වූ අභියෝග කිරීම අත්‍යාවශ්‍ය යි. *CPA* සංවිධානය දේව කාරියක් ලෙස එය ඉටු කිරීම පීඩිතයින්, අනෙක් ක්‍රියාකාරීන් වෙනුවෙන් ඉටු කරන යුතුකමක් හැටියටයි මම නම් සලකන්නෙ.

අවුරුදු 25ක් කියන්නෙ පොඩි කාලයක් නම් නෙමේ. දේශපාලන පක්ෂවල, සංවිධානවල ඇති වන විවිධ බෙදීම් දිහා බැලුවහම, සංවිධානයක් ලෙස අවුරුදු 25ක් අඛණ්ඩව පැවතීම ම ලොකු දෙයක්.

*CPA* එකට අවවාදයක් දෙන්න තරම් අපි සුදුසුත් නැහැ. මෝරලත් නැහැ. නමුත් යෝජනාවක් කරන්න කැමතියි. ආණ්ඩුවල නොපනත්කම්වලට විරුද්ධව ප්‍රකාශ මගින්, අධිකරණය තුළ අභියෝග කරන ගමන් ම, ඒ වටා අනෙක් සංවිධාන, ක්‍රියාකාරීන් එකතු කිරීමේ මාධ්‍යයක් ලෙස එය භාවිත කර, පොදු සාමූහික ක්‍රියාවක් දක්වා වර්ධනය කිරීමේ උවමනාව ඉදිරියට ගෙන යෑම සඳහා කළ හැකි දේ ගැනත් අවධානය යොමු කරනව නම් හොඳ යි. මේ වෙලාවෙ විශේෂයෙන් ම පොඩි පොඩි කෙනිත්තිලිවලට වඩා අවශ්‍ය වෙන්නෙ, සමූහ ජන ක්‍රියාකාරිත්වයක්. නඩුවක් වුවත් එවැන්නකට නිමිත්තක් කරගත හැකි යි.

විශේෂයෙන් මානව හිමිකම් පිළිබඳව කටයුතු කරන සිවිල් සංවිධානවල එකතුවක් මේ වෙලාවෙ අත්‍යාවශ්‍ය යි. විශේෂයෙන් ම මානව හිමිකම් සංවිධාන, රට ඩොලර්වලට පාවාදෙන දේශද්‍රෝහීන් ලෙස, පසුගිය කාලෙ විශේෂයෙන් දකුණෙ පතුරපු අදහස තවමත් සම්පූර්ණයෙන් ම සමාජයෙන් ඉවත් වෙලා නැහැ. ඒකනෙ මාර්තු-සැප්තැම්බර්වල ජිනීවා මතක් වෙද්දි මේ ද්‍රෝහී රට පාවාදීමේ කථා එළියට එන්නෙ. හැබැයි ඒක සිංහල බෞද්ධ ජාතිකත්වයෙන් තමයි වහන්න හදන්නෙ. ඒ නිසාම *CPA* වැනි අවුරුදු 25ක ඉතිහාසයක්, අත්දැකීමක් ඇති සංවිධානයක් ලෙස, දැනට නිරත වන වැදගත් වැඩවලට අමතරව, මේ එකතුව නිර්මාණය කිරීමට මූලිකත්වයක් ගන්නව නම් ශ්‍රේෂ්ඨයි. ඉතින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සුභ රිදී ජුබිලියක් ප්‍රාර්ථනා කරනවා.

---

**බ්‍රිටෝ ප්‍රනාන්දු:**
අතුරුදහන් වූවන්ගේ පවුල් එකතුවේ සම නිර්මාතෘවරයා මෙන්ම වත්මන් සභාපතිවරයාද වේ. සිවිල් සමාජ ක්‍රියාධරයෙකි. නිදහසේ වේදිකාවේ කැඳවුම්කරු.

# විකල්පයක් සඳහා වූ විකල්පය !

UVA SHAKTHI FOUNDATION
ඌව ශක්ති පදනම
ஊவா சக்தி நிறுவனம்
USF
"Let us foster neo Lankans through Friendship"

## ඌව ශක්ති පදනම

ශ්‍රී ලාංකික ජනතාව ආදේශක මිස විකල්ප නොහඳුනති. පොදුවේ ජන මනසේ ස්වරූපය වන්නේ සිය අවශ්‍යතා සඳහා සමානත්වය හෝ ආදේශකත්වය උපයෝගී කර ගැනීම මිස ඒ සඳහා විලෝමයක් හෝ විකල්පයක් සොයා ගැනීමට උත්සාහ ගැනීම නොවේ. මේ නිසාම මිනිසුන් සිය අයිතිවාසිකම්වල පරිමාව මෙන්ම යුතුකම්වල භූමිකාව ද නොදැනෙන මෙන්ම නොපෙනෙන ස්වරූපයකට පත්ව ඇත.

සමස්තයක් වශයෙන් ජනතාවගේ සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතිය ද තාර්කික බුද්ධිය, දේශපාලන, නීතිමය හා මැතිවරණ සාක්ෂරතාව ඉතා පහළ මට්ටමක පවතී. මෙවැනි පරිසරයක් තුළ ජනතාව බොහෝ විට අත්දකින අසමාන තත්ත්වයන් සමාන කිරීම සහ ඔවුන්ගේ තාර්කික ඥානය වැඩි දියුණු කිරීම සත්‍යවශයෙන් ම යුගයේ අවශ්‍යතාවක් විය.

ඕනෑ ම ව්‍යසනයක දී, අර්බුදයක දී හෝ ගැටලුකාරී තත්ත්වයන් තුළ ඕනෑ තරම් විසඳුම් තිබිය හැකි ය. නමුත් ඒවා ක්‍රියාත්මක තලයට පත් වීමට නම් අර්බුදයන් තේමා කොට ගත් විසල් ව්‍යාපාරයක් අවැසි වේ. එනමුදු එවැනි ව්‍යාපාරයක් ඕපපාතිකව බිහිවන්නේ ද නැත. ඒ සඳහා වෙනස් වූ විකල්ප වූ උඩුයටිකුරු දැක්මක් අවශ්‍ය ය. එමෙන්ම එවැනි වූ සාරගර්භ අදහසක් එකවර කණ්ඩායමක් තුළ පහළ වන්නේ ද නැත.

ඒ සඳහා විශේෂිත වූ අත්දැකීම්වලින් පිරිපුන් මෙන්ම බුද්ධිමය පරිචයක් අවැසි වේ. එම හිදැස පිරවීමේ අවශ්‍යතාව දැනට විසිපස් වසරකට පෙර එක් පුද්ගලයකුගේ මනසේ උත්පාද විය.

පාක්‍යසෝති සරවනමුත්තු නම් වූ ඔහු විසින් ශ්‍රී ලාංකික ප්‍රජාවට වෙනස්ව සිතිය හැකි මාවතක් පවතින බව අවධාරණය කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයන් අරමුණු කොටගෙන 1996 වසරේදී 'විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය' බිහි කරන ලදි.

කලාව, සෞන්දර්ය, සංස්කෘතිය මූලික කොටගත් මානව දයාවෙන් පිරි මෙන් ම සියලුදෙනා සමානව සැලකීමේ උත්තුංග අභිමතාර්ථයන් සාක්ෂාත් කරගැනීමේ, විපක්ෂ භූමිකාව, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් ක්‍රියාවට නැංවීමෙන් පසුගිය විසිපස් වසර පුරා ශ්‍රී ලාංකිකයින් ලද ජයග්‍රහණ රැසකි.

මෙහි දී එක් අනුවේදනීය සංසිද්ධියක් සිහියට නැගේ. එනම් වසර දෙසීයක් පුරා ලාංකික ආර්ථිකය ශක්තිමත් කිරීමට තම දහදිය, ශ්‍රමය, තම සංස්කෘතික මානයන් සහ වටිනාකම් මෙම භූමියේ පැළපදියම් කළ වර්තමානයේදීත් විවිධ වූ ඉසව් තුළින් රටේ ආර්ථිකය සවිබල ගන්වන එහෙත් වසර දෙසීයක් පුරා කාලය තුළ දෙවැනි පන්තියේ ලා සලකන වතුකර ප්‍රජාවගේ අයිතිවාසිකම් නොසලකා හැරීම ය. ඔවුන්ට නිශ්චිත ලිපිනයක් තිබුණේ නැත. එම තත්ත්වය නිම කොට ඔවුන්ගේ අභිමානය ඉහළ නැංවීමේ එක් උපාය මාර්ගයක් වූයේ ඔවුන්ට ස්ථිර ලිපිනයක් ලබා ගැනීම ය. ඌව ශක්ති පදනම මගින් ආරම්භ කළ 'අපටත් දැන් ලිපිනයක් ඇත' සමාජ ව්‍යාපාරයේ දී වතු ප්‍රජාවගේ නීතිමය තත්වයන් තුලනය කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලබාදුන් තාක්ෂණික සහයෝගය අගනේ ය. එහි සෘජු ප්‍රතිඵලයක් වූයේ වතුකරයේ තරුණ ප්‍රජාවගේ දීර්ඝ කාලයක් සැඟවී පැවති කලාත්මක සහ සෞන්දර්යාත්මක අදහස් පිළිබිඹු වූ ඔවුන් අත්දුටු වතු ජීවිතයේ පීඩාවන් සහ දුක් ගැහැට සමාජයට මෙන්ම ලෝකයට එළිදරව් කිරීමට හැකි වීමය.

මෙහිලා විශිෂ්ට ගණයේ උදාහරණ වන්නේ පුද්ගල භාෂා අයිතිය සුරැකීම මගින් මූලික අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටීම, පොදු ජනයාගේ මූලික හර පද්ධතීන් මෙන්ම අයිතිවාසිකම් උල්ලංඝනය වන අනපනත්වලට එරෙහිව ගත් අධිකරණමය ක්‍රියාමාර්ග, පාරිභෝගික රක්ෂණය වෙනුවෙන් සිදු කළ මැදිහත්වීම්, සාධාරණ මැතිවරණ ක්‍රියාවලිය සාධනය කිරීම සඳහා වූ ව්‍යාපාරයන්, පළාත් පාලන ආයතන තුළ කාන්තා නියෝජනය සඳහා වූ ධාරිතා වර්ධනය කිරීම මාධ්‍ය නිදහස හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනීසිටීම, ජනතාවගෙන් කෙමෙන් මොට වී යන සෞන්දර්යාත්මක හැඟීම් අවදි කිරීම සහ පොදු සංස්කෘතිකමය මිනිසකු ගොඩනැගීම තුළින් සාමයෙන් සහජීවනයෙන් යුතු නව ශ්‍රී ලාංකිකයකු බිහිකිරීමට දරන උත්සාහය යනාදියයි. මෙම මැදිහත් වීම් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම ඔස්සේ 'විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය' නමැති විසල් රුක්ෂයට ශ්‍රී ලාංකික ඉතිහාසයේ හිමි තැන සනිටුහන් කොට හමාර ය.

මෙකී සමස්ත ක්‍රියාවලිය සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අංශ කීපයකින් ක්‍රියාත්මක කළ වැඩසටහන් අතර, ප්‍රජා සහභාගිත්ව වැඩ සටහන්, සාම විමර්ශියෙන් ආරම්භ වූ සමාජ පරිවර්තනය සඳහා වූ කතිකාව, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා වූ දායකත්වය, තොරතුරු දැනගැනීමේ අයිතිය රටේ නීතියක් බවට පරිවර්තනය කිරීම තුළින් යහපත් සහභාගීත්ව පාලනයක් සඳහා පුරවැසියන්ගේ ප්‍රවේශය වර්ධනය කිරීම ආදිය විශේෂ වේ.

ප්‍රචණ්ඩත්වයෙන් තොර සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සහ ඡන්දදායකයන්ට තම ඡන්දය ප්‍රකාශ කිරීම සහ වගවීම තහවුරු කිරීම උදෙසා ඔවුන් නිරීක්ෂණ ක්‍රියාවලියට හවුල් කරවීම, ප්‍රජාතාන්ත්‍රික සහභාගිත්වය ශක්තිමත් කිරීම හා මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට මැදිහත් වීම තවත් එවැනි දායකත්වයන් ය. මෙම ප්‍රවේශයන් තුළින් පළාත් පාලනයේ දී කාන්තාවන් සහ තරුණයින්ගේ දේශපාලන නියෝජනය සහ තීන්දු තීරණ ගැනීමේ අයිතිය තව තවදුරටත් ශක්තිමත්ව පවත්වාගෙන යෑමට හැකි විය.

මෙම කටුක ගමනේ දී උතුරු පළාතේ ප්‍රථම පළාත් පාලන ඡන්දය පැවැති සමයේදී අමතක කළ නොහැකි මතකයන් අප සතු ය. මෙම පළාත් පාලන ඡන්ද විමසීමෙන් තේරී පත් වූ සියලුම නවක පළාත් පාලන සභිකවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවිණි. සභාවේ අසුන් ගැනීමේ ක්‍රියාවලියේ සිට පළාත් පාලන නීතිය, අයවැය සකස් කර ජනතාවට වග වන සහ විනිවිදභාවයෙන් ක්‍රියාත්මක වීමේ ප්‍රවේශය ඔවුන්ට හඳුන්වා දුන් අතර එය ශක්තිමත්ව ක්‍රියාත්මක කළ සභාවන්

බොහෝ ය. මෙම ඡන්දයෙන් තේරී පත් වූ ප්‍රාදේශීය සභා සභාපතිවරුන් අතරින් ළාබාලම සභාපතිවරයා තේරී පත් වූයේ පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවෙනි. ඔහු දේශපාලනය පිළිබඳව කිසිදු අවබෝධයක් නොතිබූ තරුණයකු විය. සහිකවරුන්ගේ ධාරිතා වර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිය වසර හතර නිමා කිරීමට පෙර මෙම සභාපතිවරයා උතුරු පළාතේ කීර්තිමත් පළාත් පාලන ආයතන ප්‍රධානියකු බවට පරිවර්තනය වීම සුවිශේෂී නිදර්ශනයකි. එමෙන්ම උතුරු-දකුණු පළාත් පාලන ආයතන අත්දැකීම් හුවමාරු කර ගැනීම ද එම දෙපාර්ශ්වයේ ම පළාත් පාලන ආයතනවල වෙනස්කම් රැසක් ඇති කරවීමට සමත් විය.

එනමුදු කාර්යභාරය නිම නැත. කළ හැකි වන්නේ සහ කළ යුතු වන්නේ ජනතාව පරිකල්පන වෙනසකට යොමු කිරීමට සමත් තිරසාර නායකත්වයක් සඳහා දායකත්වය සැපයීම ය. මිනිසාට ඉගැන්විය නොහැකි ය. නමුත් සිතීම සඳහා පෙළඹවිය හැකි ය.

සක්‍රීය පුරවැසි ක්‍රියාකරණයෙන් සාධනීය පාලනයක් සඳහා හඬ නගන ඌව ශක්ති පදනමේ සහෘදයන්ගේ උණුසුම් සුබ පැතුම්.

---

**ඌව ශක්ති පදනම:**

ඌව පළාත් කේන්ද්‍රකර ගත් සිවිල් සංවිධානයකි. ජාතීන් අතර සංහිඳියාව ගොඩනැගීම සහ සංවර්ධනය සඳහා සම අවස්ථා ලබා දීම වෙනුවෙන් කටයුතු කරයි. අන්තර් පාසල් සිසු හමුව, පළාත් පාලන ආයතන වැඩසටහන්, භාෂා අයිතිවාසිකම් වැඩසටහන්, පුරවැසි සභා සහ තොරතුරු දැනගැනීමේ වැඩසටහන්, මැතිවරණ නිරීක්ෂණ කටයුතු, වතුකරයේ ජනතාවට ලිපිනයන් ලබාදීම සහ තේ කහට ඡායාරූප ප්‍රදර්ශනයේ දී පූර්ණ දායත්වය ලබා දී ඇත.

# විකල්ප ප්‍රතිපත්ති වෙනුවෙන් දිරිමත්ව පෙනී සිටීම



ෂ්‍රීන් අබ්දුල් සරූර්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය විසිපස් වැනි සංවත්සරය පවත්වන අවස්ථාවේ මා මෙම සටහන තබන්නේ මහත් ප්‍රීතියෙනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග මගේ පළමු සම්බන්ධතාව වූයේ 1999 දී අභාවප්‍රාප්ත කේතීස් ලෝගනාදන් හරහා 'යහපාලනය' යන ඉංග්‍රීසි වචනයට වඩාත් උචිත දෙමළ වචනය සෙවීමේ දී ය. එතැන් පටන් මම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, පාලනය සම්බන්ධයෙන් අත්‍යාවශ්‍ය වූ හඬක් නැගීම දක්වා කැපී පෙනෙන වර්ධනයක් අත් කර ගනු දුටුවෙමි.

ගෙවී ගිය වසර 25 තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කෙනෙකු දුර්මුඛ කෙරෙන බලවත් අභියෝග සහ පෞද්ගලික අවදානම් තත්වයක් තුළ අවතැන්වූවන්ගේ හා අතුරුදහන්වූවන්ගේ අයිතීන්, මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්, මුක්තිය ලබා දීමේ සංස්කෘතිය, වගවීම තහවුරු කිරීම, මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ඇතුළත් නීතියේ ආධිපත්‍යය පවත්වා ගැනීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම හා විකල්ප ප්‍රතිපත්ති ප්‍රවර්ධනය වෙනුවෙන් දිරිමත්ව පෙනී සිටියේ ය. ඔවුන් එය සිදු කෙළේ වෙනස් කොට සැලකීමේ භාවිතාවන්ට එරෙහිව නීතියෙන් සෘජුවම අභියෝග කරමින්, සිවිල් සමාජයේ සමාන අදහස් ඇති අය සහ ක්‍රියාකාරීන් සංවිධානය කිරීමෙන් සහ දේශීය සහ විදේශීය වශයෙන් මතවාදී ප්‍රචාරයට නායකත්වය දීම තුළිනි.

පවතින අභියෝගවලට මුහුණ දෙමින් සහ සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරීත්වයේ විෂය පථය පුළුල් කරමින් පුරවැසි විද්‍යුත් මාධ්‍ය සඟරාවක් පළ කිරීම, විකල්ප සමාජ මාධ්‍ය වේදිකාවක් ගොඩනැංගීම, මැතිවරණ නිරීක්ෂණ ආයතනයක් ඇති කිරීම සහ සමීක්ෂණ

පැවැත්වීමට ව්‍යුහයන් සකස් කිරීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පුරෝගාමියෙකු වූයේ ය. එවකට ආරක්ෂක ලේකම් සහ වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ 2007 දී කොළඹට පැමිණෙන සහ ස්ථිරව පදිංචි නොවූ දෙමළ ජනතාව නගරයෙන් ඉවත් කිරීමට ගත් පිළිකුල් සහ අවඥාසහගත උත්සාහයේ දී එය නතර කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නීතියෙන් අභියෝග කිරීමට ගත් සාර්ථක, අභීත පියවර මගේ සිත තුළ තවමත් සටහන්ව ඇත. ශ්‍රී ලංකාව එක්සත්ව පවත්වා ගැනීම වෙනුවෙන් වූ මෙම නිර්භීත ක්‍රියාවට සමස්ත රටම කෘතවේදී විය යුතු ය.

2009 දී යුද්ධය අවසන් වුවද සිය දහස් ගණන් ජනතාව අතුරුදහන්ව සිටිති. සත්‍යය සොයා ගැනීම, සහන ලබා ගැනීම හෝ යුක්තිය ඉටු කර ගැනීමට යුද්ධයෙන් පීඩාවට පත් සහ වින්දිතයන් ගත් උත්සාහය තවමත් නිෂ්ඵල ය. මියගිය අය සිහිපත් කිරීමේ අයිතිය පවා වළක්වා ඇත. මෙවැනි වාතාවරණයක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වගවීමෙන් සහ අර්ථාන්විත සංහිඳියාවෙන් අතීතය පිළිබඳව කටයුතු කිරීමට රජය යොමු කිරීමට ස්ථිරසාර නායකත්වයක් ලබා දී ඇත.

බොහෝ තරුණයන්, කැපී පෙනෙන අදහස් පළ කරන්නන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිවේදීන්, නීති විශ්ලේෂකයන්, නිර්මාණශීලී විවේචකයන්, සමාජ ක්‍රියාකාරීන්, මංපෙත් හෙළිකරන්නන්, සහ විශේෂයෙන් දැනට සමාජයේ අදීනව නැගී සිටින පුද්ගලයන් වීමට හැකි කරවන පරිසරයක් සකසා දීම ගැන ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතාට සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සුවිශේෂී කීර්තියක් හිමි වන බව ද පිළිගත යුතු ය.

බලයේ සිටි කිසිම ආණ්ඩුවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ප්‍රිය කෙළේ නැත. දැනට බලයේ සිටින ආණ්ඩුව ද මෙම සංවිධානයට නිදහසේ ක්‍රියා කිරීමට ඉඩ දීමට සූදානම් නැත. සිවිල් සමාජ සංවිධාන නිහඬ කර සීමා පැනවීමට දැඩි නීති ගෙන ඒමේ සූදානම, ප්‍රජාතන්ත්‍රවාදය පසු පසට තල්ලු කිරීම, සිවිල් පරිපාලනය වැඩි වැඩියෙන් හමුදාකරණය කිරීම වැනි තත්ත්වයන් යටතේ ඒ පිළිබඳ ශක්තිමත් පියවර ගැනීමේ දී වෙනත් සිවිල් සමාජ සංවිධාන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නායකත්වය අපේක්ෂා කරනු ඇත. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුගේ විචක්ෂණ නායකත්වය යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම අභියෝගයට මුහුණ දෙන නොසැලෙන මිතුරෙකු වන ඇතැයි මම විශ්වාසයෙන් යුතුව ප්‍රාර්ථනා කරමි. සිවිල් සමාජය, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ වින්දිත ප්‍රජාව ශක්තිමත්ව එකට බැඳී සිටිය යුතු ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඔබට ස්තුතියි. මගේ සුබ පැතුම්. හද පත්ලෙන්ම සුබ අනාගතයක් පතමි.

---

**ෂ්රීන් අබ්දුල් සරූර්:**
සාමය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරිනියකි. මන්නාරම කාන්තා සංවර්ධන සම්මේලනයේ නිර්මාතෘවරිය ද වේ.

# LGBTIQ ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටීම

**EQUAL GROUND**

*EQUAL GROUND* හි පුළුල් ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් අතර සහමතියෙන් සිදු වන සමරිසි ලිංගික සම්බන්ධතා නිර්සාපරාධීකරණය කිරීම සහ ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 අ වගන්ති අහෝසි කිරීම යි. නිර්සාපරාධීකරණය කිරීම සහ *LGBTIQ* ප්‍රජාවට සමාන අයිතීන් ලබා ගැනීම සඳහා වන අපගේ අරගලයේ දී, අපට සහාය දක්වන සගයින්ගේ ජාලයක් පැවතීම අතිශයින් වැදගත් ය. මෙහි දී , 2004 දී *EQUAL GROUND* ආරම්භ කළ අවස්ථාවේ සිට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය *(Centre for Policy Alternatives (CPA))* නිරන්තරයෙන් ආධාර සහ ශක්තිය ලබා දේ.

පසුගිය වසර 25ක් තිස්සේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධානයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ *LGBTIQ* ප්‍රජාව ඇතුළු සුළුතර කණ්ඩායම්වලට කෙරෙන අසාධාරණයන්ට එරෙහිව බලගතු හඬක් බවට *CPA* ආයතනය නිරන්තරයෙන් පත් වී ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගොඩනගන ලද්දේ යහපාලනය, ප්‍රජාත්නත්‍රවාදය, සාමය ගොඩනැගීම සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම යන වටිනාකම් පදනම් කරගෙන වන අතර එමගින් සිදු කරන වැඩ කටයුතුවලින් මෙම වටිනාකම් පරමාදර්ශයට පත්කොට ඇත. *EQUAL GROUND* විසින් සංවිධානය කෙරෙන වැඩසටහන් හා සාකච්ඡාවන්ට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ ඔහුගේ කණ්ඩායම ක්‍රියාකාරීව සහභාගී වූ අතර අපගේ සංවිධානය වඩා ශක්තිමත්ව ගොඩ නැගීමට මහඟු දායකත්වයක් ලබා දුන්නේ ය.

ශ්‍රී ලංකා රජය, පාර්ලිමේන්තුව සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදන මණ්ඩල සහ ආයතන සඳහා ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ සමාජ සාධාරණත්වය ශක්තිමත් කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වූ ඵලදායී ප්‍රතිපත්ති විකල්ප යෝජනා කිරීම *CPA* හි එක් අරමුණකි. මේ අරමුණ සඳහා, සාධනීය ප්‍රතිපත්ති විකල්පයන් වෙනුවෙන් පෙනී සිටීම මෙන් ම, ප්‍රතිපත්ති සම්පාදකයන්ට බලපෑම් කිරීමට සහ මහජන මතය වෙනස් කිරීමට කේන්ද්‍රය ගත් උත්සාහයන් ප්‍රශංසනීය වෙයි. මේ සම්බන්ධයෙන් කැපී පෙනෙන දායකත්වයක් නම්, *CPA* විසින් එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට (*UN-CCPR*) එහි එක් නිදේශයක් ලෙස ශ්‍රී ලංකාවේ *LGBTIQ* ප්‍රජාවේ අයිතීන් සහතික කිරීමට සහ ආරක්ෂා කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණවල වැදගත්කම අවධාරණය කිරීම යි.

තව ද *EQUAL GROUND* ඇතුළු අනෙකුත් සිවිල් සමාජ සහ මානව හිමිකම් සංවිධානවල උත්සාහයන් ඉදිරියට ගෙන යෑමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති උද්දේශන උපකාරී වී ය. රාජ්‍ය ප්‍රතිපත්ති ගැන දිගින් දිගට කළ අධ්‍යයනයන් සහ විවිධ මාතෘකා පිළිබඳව පර්යේෂණ ව්‍යාප්ත කිරීම, සමාන තත්ත්වයේ ක්‍රියාත්මක වෙනත් සංවිධානවලට ඔවුන්ගේ උත්සාහයන් ගොඩනැගීම සහ පුළුල් කිරීමට මනා පදනමක් සැපයී ය.

වැදගත්ම දෙය නම්, රාජ්‍ය ප්‍රතිපත්ති සහ සමාජ සාධාරණත්වය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් වැදගත් සහ කාලීන සංවාදයකට ඔවුන් සම්බන්ධ කර ගැනීම සඳහා, දේශපාලන ක්‍රියාකාරිකයින්ගේ මෙන් ම දේශීය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, බහුපාර්ශ්වික සංවිධාන වැනි වෙනත් පාර්ශ්වකරුවන්ගේ ද උපදෙස් ලබා ගැනීමේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙරමුණේ ම සිටීම යි. අවස්ථා ගණනාවක දී මෙම සාකච්ඡාවලට *EQUAL GROUND* ආයතනය සම්බන්ධ වූ අතර අපගේ අදහස් සහ නිර්දේශ හැම විට ම ඉහළ ම පිළිගැනීමකින් සහ ගෞරවයකින් සැලකිල්ලට ගනු ලැබී ය. මානව හිමිකම් සහ සමාජ යුක්තිය පිළිබඳ පුළුල් පරාසය තුළ *LGBTIQ* ප්‍රජාවේ අයිතීන් පසෙකට කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කිසිවිට ක්‍රියා නොකිරීම ගැන අපි සතුටු වෙමු. කිසිදු සුළුතර කණ්ඩායමක් තමන්ගේ විෂය පථයෙන් ඉවත් නොකිරීමේ වැදගත්කම මුල සිට ම තේරුම් ගෙන සිටි කේන්ද්‍රය, තමන්ගේ වෙනත් කටයුතුවලට ලබාදෙන වැදගත්කම ම දෙමින් ශ්‍රී ලංකාවේ *LGBTIQ* ප්‍රජාවේ සමානාත්මතාව සහ අයිතීන් වෙනුවෙන් ද සෑම විට ම පෙනී සිටියේ ය.

සමානත්වය සහ සමාජ සාධාරණත්වය තනිව දිනාගත නොහැකි ය. වසර ගණනාවක් තිස්සේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමඟ හවුල්ව කටයුතු කිරීමට හැකි වීම ගැන *EQUAL GROUND* හි අපි ආඩම්බර වන අතර අනාගතයේ දී අඛණ්ඩව සහයෝගය දැක්වීමට ද අපි බලාපොරොත්තු වෙමු. එමෙන්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සියලුම ඉදිරි කටයුතු සඳහා සුභ පැතුම් එක් කරමු.

---

**Equal Ground:**

ඊක්වල් ග්‍රවුන්ඩ් යනු ලාභය උදෙසා නොවන සංවිධානයක් වන අතර ශ්‍රී ලංකාවේ ලෙස්බියන්, ගේ, ද්විලිංගික, සංක්‍රාන්තික ලිංගික, *Intersex and Questioning/Queer (LGBTIQ)* ප්‍රජාවේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් උදෙසා එය ක්‍රියාත්මක වෙයි. එය 2004 වසරේදී පිහිටුවනු ලැබූ අතර අප රටේ මේ අකාරයේ ක්‍රියාත්මක සංවිධාන අතරින් පැරණිතම සංවිධානය ද වෙයි. *LGBTIQ* ප්‍රජාවේ පුද්ගලයන් හට මානසික යහපැවැත්ම, ආර්ථික සමාජයීය සහ දේශපාලන බලගැන්වීම, සෞඛ්‍යයට අධ්‍යාපනයට සහ නිවාසවලට ඇති ප්‍රවේශය සහ නීතිමය ආරක්ෂාව යනාදිය ඔවුන් ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයන් වේ.

CPA at 25

# ‘දැක්මේ ප්‍රකාශනය’ ඉක්මවූ බුද්ධි මණ්ඩපය



**ඔස්ටින් ප්‍රනාන්දු**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග මගේ සම්බන්ධය සංවිධානයේ ආරම්භය දක්වා දිවෙයි. එය ආරම්භ වන්නේ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සමග මා වර්ධනය කරගන්නා පෞද්ගලික සම්බන්ධතාවයෙනි. මා එය සිහිපත් කරන විට, එබඳු සම්බන්ධතාවක් වර්ධනයට වෙනත් පසුබිම් තත්ත්වයක් ද පැවති බව පිළිගත යුතු වෙයි. අසූ ගණන් මැද භාගයේ පුනරුත්ථාපන අමාත්‍යංශයේ ලේකම් ලෙස, විශේෂයෙන් ම, උතුරු නැගෙනහිර පළාත්වල පුනරුත්ථාපන කටයුතුවලට මගේ සම්බන්ධය මගින්, ව්‍යවස්ථා සම්පාදනය, පුනරුත්ථාපනය, ආණ්ඩුකරණය, සාමය ගොඩනැගීම, මානව හිමිකම් වැනි අරමුණු ඔස්සේ ක්‍රියාත්මකව සිටි රාධිකා කුමාරස්වාමි මෙනෙවිය, ආචාර්ය ජයදේව උයන්ගොඩ, ආචාර්ය රොහාන් එදිරිසිංහ වැනි අය සමග මට සම්බන්ධතා ඇති විය. ඔවුහු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවීමේ ප්‍රමුඛයෝ වූහ. ඔවුන්ගේ සම්බන්ධයෙන් සහ ඔවුන් සමග වැඩ කිරීමෙන් එක් රැස් වූ තීක්ෂණ බුද්ධිය මා ප්‍රබෝධමත් කළ අතර එය මට ආශ්වාදයේ මූලයක්, දැනුම පුළුල් කිරීමක් සහ ආකල්ප වෙනසකට හේතුවක් විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් මට හිමි වූ යහපත එබඳු ය. එයට මා වටිනාකම් ලබා දෙන්නේ වඩා පුළුල් හැඟීමකිනි. එසේ වන්නේ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අපගේ සමාජයට කළ සේවය කෙනෙකු අගය කරන ප්‍රමාණය අනුව ය. තමන්ගේ දැක්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තේරුම් ගන්නේ “මානව හිමිකම්වලට පුළුල් ම ප්‍රමුඛතාව ලබා දෙමින්, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ සාමය පිළිබඳ ක්ෂේත්‍රවල පර්යේෂණ සහ උද්දේශන ක්‍රියා මාර්ග මගින්, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට සිවිල් සමාජ දායකත්වය ශක්තිමත් කිරීම” වශයෙනි. විකල්ප ප්‍රතිපත්ති

කේන්ද්‍රය ඉටු කළ කාර්යභාරයත්, සමාජ, දේශපාලන, නීතිමය, අයිතීන්, ආණ්ඩුකරණ අවශ්‍යතා ආදී ක්ෂේත්‍රවල ලබා දුන් විශාල ප්‍රමාණයේ සේවයත් පරීක්ෂා කරන විට, විශේෂයෙන් ම මහජන ළැදියා නීති ක්‍රියාමාර්ග සහ රාජ්‍ය ආයතන ගොඩනැගීමට දායකත්වයේ දී, ඒවා සජීවී වෙයි. මෙම අංශයේ දී වෙනත් ඕනෑ ම රාජ්‍ය නොවන සංවිධානයක් ඉක්මවා එය කැපී පෙනෙන බව මම විශ්වාස කරමි. පැවති ආණ්ඩුවල නීති සම්පාදන කටයුතු සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කළ හෝ සම්බන්ධ වූ හෝ නඩු ගණනාව සහ ආණ්ඩුකරණ සහ අයිතීන් ක්ෂේත්‍රයෙහි සිදු කොට ඇති ප්‍රකාශන, ඉහත කී ප්‍රකාශය තහවුරු කරන සාක්ෂි වෙයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙය ආරම්භ කරන ලද්දේ සිවිල් සමාජයේ දායකත්වයක් වශයෙන් වුව ද, ඇතැම් විට ඒවා වැරදි ලෙස අර්ථ නිරූපණය කරන ලද්දේ, ස්ථාපිත ආයතනවලට අභියෝග කිරීමක් වශයෙනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තමන්ගේ දැක්මේ ප්‍රකාශනය ඉක්මවා ගියේ දැයි, එබඳු දර්ශනයක් තුළ යම් කෙනෙකු ප්‍රශ්න කළ හැකි ය. "ඔව්, රටේ යහපත සඳහා එසේ කළේ ය" යි මම පිළිතුරු දෙමි. එය ගොඩනැගූ අවකාශයේ නායකත්වය ලබා ගැනීමේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාර්ථකත්වය, මගේ පිළිතුරට කරන හේතු දැක්වීම සහ පැහැදිලි කිරීම තුළ ගැබ්ව ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්ථාපිත බුද්ධි මණ්ඩපයකි. බුද්ධි මණ්ඩප, කිසිදු ජනවර්ගයකට, දේශපාලන පක්ෂයකට හෝ නැඹුරුවකට, ආගමික කණ්ඩායමකට හෝ එවැනි වෙනත් කිසිවකට හෝ බැඳීමක් ඇති කර ගන්නේ නැත. බුද්ධි මණ්ඩප මගින්, සමාජ ප්‍රතිපත්ති, දේශපාලන උපායමාර්ග වැනි මාතෘකා සම්බන්ධයෙන් ස්වාධීන පර්යේෂණ සහ උද්දේශන කරමින් එබඳු ක්‍රියාමාර්ග ඔස්සේ ලබා ගන්නා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු වන්නේ, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ දේශපාලනඥයින්ට පවා මග පෙන්වීම සඳහා ය. රාජ්‍ය හෝ පෞද්ගලික හෝ වෙනත් ඕනෑ ම ආයතනයක හෝ ක්‍රියා නැතහොත් පුරවැසි ජීවිතවලට බලපාන ක්‍රියාකාරකම් ගැන ඔවුහු සාකච්ඡා කළ යුත්තෝ ය.

රජයේ, පෞද්ගලික අංශයේ, හමුදාවේ සහ සිවිල් සමාජයේ සම්භවයකින් අත්දැකීම් ලත් උදවිය, ප්‍රතිපත්ති, නීති, දේශපාලන, සමාජ ප්‍රශ්න ආදිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ඉන්දියාව මෙයට ආදර්ශයකි. ඔවුන් දැඩි ලෙස කෙළින් ක්‍රියා කරන අතර අභියෝගවලට බිය වන්නේ නැත. රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම, වාර්තා, අධ්‍යයන පළ කිරීම, රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන විවේචනය කිරීම සහ හමුදා ක්‍රියාමාර්ග සමාලෝචනය පවා ඔවුහු කරති. චීනය සමග සන්නාමගත දේශපාලන සතුරුකමක් තිබිය දී , පිළිගැනීමක් සහිත බුද්ධි මණ්ඩප මගින් ඉන්දියානු බුද්ධිමතුන් සමග අන්තර් ක්‍රියාකාරීත්වයකට චීන බුද්ධිමතුන්ට ද අවකාශ ලැබී තිබීම සටහන් කිරීමට සිත්ගන්නාසුලු ය. මෙය ශ්‍රී ලංකාව ද පෝෂණය කළ යුතු පාඩමක් විය හැකි අතර ඉන්දියානු තත්ත්වයට ළඟා වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද තම වැඩ කටයුතු පුළුල් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

ප්‍රතිපත්ති සමාලෝචනය හා ආණ්ඩුකරණයේ දී රාජ්‍ය වගවීමට දායක වීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නීති සම්පාදනය, ප්‍රතිපත්ති සම්පාදනය, ආයතනික ව්‍යුහ කළමනාකරණය ආදිය පිළිබඳව අවදියෙන් සිටිය යුතු ය. එක් අතෙකින් සමාජීය අවබෝධය ගොඩනැගීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ක්‍රියා කළ යුතු අතර අධිකරණමය මැදිහත්වීම් ලබාගැනීමට, උචිත ආකාරයේ අධිකරණවලට ප්‍රශ්න ඉදිරිපත් කළ යුතු වෙයි. මේ සඳහා, ශාස්ත්‍රීය මෙන් ම, ප්‍රායෝගිකව එම ස්ථානයේ ම කරන ගැඹුරු අධ්‍යයන සහ පර්යේෂණ අවශ්‍ය වෙයි. විශේෂඥයින් යොදා ගනිමින් එබඳු පර්යේෂණ ක්‍රියාත්මක කරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, විශ්ලේෂණය කළ ප්‍රතිඵල පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා යොදා ගනියි. එහි මැදිහත්වීම්, කරුණු සහිත ඉදිරිපත්කිරීම් වීම මෙමගින් සහතික කරයි. එබඳු ඉදිරිපත්කිරීම් අපහසුතා ඇති කරන විට, විශේෂයෙන් ආණ්ඩුවේ තත්ත්වයට අභියෝග කරන අවස්ථාවල, එයින් සතුටුදායක පරිසරයක් ගොඩනැගෙන්නේ නැත. එමගින් නීති සම්පාදන සහ පරිපාලන ආයතන සමග ගැටුම් ඇති කරන අතර එබැවින්, අභියෝගවලට මුහුණ දීමට ශක්තිමත් විශ්වාසනීය හැඟීමක් අවශ්‍ය ය.

ප්‍රජාතන්ත්‍රවාදය, බහුත්වවාදය, නීතියේ ආධිපත්‍යය, මානව සහ මානුෂවාදී

ආරක්ෂණයන් රැක ගැනීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මැදිහත්වීම්, ඇතැම් විට විවේචනයට සහ හෙළා දැකීමට ලක් වී ඇත්තේ සමස්තයක් ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශාල ප්‍රමාණයේ අගය කිරීමකට හා ප්‍රණාමයට ලක්ව තිබිය දී ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙරමුණු ගණනාවක දී, ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් රැක ගත්තේ ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තුළ සවිස්තරාත්මක සාකච්ඡාවක් සිදු වූ, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ප්‍රශ්නය මට උපුටා දැක්විය හැකි ය. බලය බෙදීම සම්බන්ධයෙන්, විශේෂයෙන් ප්‍රකාශන හා ලියකියවිලි සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දායකත්වයට ආණ්ඩුවේ දායකත්වය පවා පරාජය කළ හැකි ය. සාමය ගොඩනැගීම, මානව හිමිකම් ආදියේ දී පවා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ බොහෝ ප්‍රකාශන සංසරණයේ පවතියි.

ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ තවත් අංගයක් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ගොඩනැගීමෙන් පිළිබිඹු වෙයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහි සන්ධානය එක්ව 1997 දී එය, මැතිවරණ සම්බන්ධ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කරන ස්වාධීන සහ පක්ෂග්‍රාහී නොවන සංවිධානයක් ලෙස පිහිටුවන ලද අතර මැතිවරණ කොමිසම සහ වෙනත් අදාළ සංවිධාන සමග එක්ව එය ප්‍රයෝජනවත් සේවාවක් ඉටු කළේ ය. එමගින් කළ සේවය ප්‍රජාතන්ත්‍රවාදයට උත්තේජකයක් ලෙස මම සලකමි. එමෙන් ම, තොරතුරු රැස් කරන ඕනෑ ම ප්‍රධාන විදේශීය සංවිධානයක් (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම වැනි) විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ උපදෙස් ලබාගැනීම මග හැරෙන්නට ඉඩ නොදුන්නේ, අයිතීන් සඳහා දායක වීමේ එහි හැකියාව දන්නා නිසා ය. මෙහි දී, මට දකින්නට ලැබුණේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තරුණ පෙළ හැඩගස්වා ගෙන ඇත්තේ අනාගත පැවැත්මක් ද සහතික වන අයුරින් බව යි.

ප්‍රධාන සිවිල් සමාජ සංවිධානයක් ලෙස වසර විසි පහක පැවැත්ම මගින්, එහි පැවැත්ම සමාජයට සහ ජාත්‍යන්තරව පවා දැනෙන තත්ත්වයට පත් වීම විශාල ජයග්‍රහණයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට වසර පනහ එළඹෙනු අපගෙන් සමහරුන්ට දකින්නට නොලැබෙනු ඇති වුව ද, එය ක්‍රියාත්මක වන ආකාරය අනුව බලවත් අනාගතයක් ගැන අපට පුරෝකථනය කළ හැකි ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - මගේ ඉහළ ම සුබ පැතුම් ඔබ සමග ය.

---

**ඔස්ටින් ප්‍රනාන්දු**

හිටපු ජනාධිපති ලේකම්වරයෙකි. නැගෙනහිර පළාත් හිටපු ආණ්ඩුකාරවරයා ය. රාජ්‍ය නිලධාරියෙක ලෙස ආරක්ෂක ලේකම් ධූරය ඇතුළු තනතුරු ගණනාවක් දරා ඇත. ඉන්දියානු මහකොමසාරිස් ධූරයෙහි ද කටයුතු කර ඇත.

# ප්‍රතිලිබරල්වාදී පදනමකට යෑම හැර විකල්පයක් නැත!



මහාචාර්ය
**චරිත හේරත්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමඟ සෘජු සම්බන්ධයක් මට නොතිබුණි. ඒ කියන්නේ මට ඔවුන්ගේ ආයතනයේ වැඩවලට සම්බන්ධයක් නොතිබුණු බව යි. එහෙත් එයට සම්බන්ධ අය සමඟ මට නිරන්තර දේශපාලන සංවාදයක් තිබිණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට විසි පස් වසරක් සපිරීම නිමිති කරගෙන මා අදහස් දක්වන්නේ, ඇතුළත සිට ඒ දෙස බලන කෙනෙකු ලෙස නොව පිටත සිට බලන කෙනෙකුගේ දෘෂ්ටිකෝණයෙනි. *(Outsiders Approach)*

ලංකාවේ 1977 ආරම්භ වූ දේශපාලන ව්‍යාපාරය පරාජයට පත් වී, ප්‍රධාන ධාරාවේ දේශපාලනය තුළ නව දේශපාලන අවකාශයක් විවර වීම 1994දී සිදු විය. 1994 මහ මැතිවරණය ඒ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය නිර්මාණය කළ සංධිස්ථානය ලෙස සැලකිය හැකි ය. එම අවකාශය, අපේ සමාජයේ පැති ගණනාවකට විශාල බලපෑමක් ඇති කළේ ය. ප්‍රධාන ම කරුණක් වූයේ, විවෘත වෙළෙඳපොළ ක්‍රමය යටතේ සකස් වූ ආර්ථිකය යම් දුරකට නැවත රාජ්‍යය සමඟ මිශ්‍ර කළ යුතු ය යන සංකල්පය පෙරට පැමිණීම යි. මෙය සංකල්පීය වශයෙන්, 77-94 දක්වා පැවති වෙළෙඳපොළ ප්‍රමුඛ කරගත් ලිබරල් සංකල්පයේ සිට සමාජ ප්‍රජාතන්ත්‍රවාදය දෙසට නැඹුරු වීමක් ලෙස සැලකිය හැකි ය.

77-94 වන තෙක්ම පැවතුණේ සම්පූර්ණයෙන්ම වෙළෙඳපොළ ප්‍රමුඛත්වය ගත්, රාජ්‍යය ඉතා කුඩා පරිමාණයකට හැකිළෙමින් තිබුණු ක්‍රමයකි. මෙයට ප්‍රතිවිරුද්ධ අදහසක් අනූ හතරේ දේශපාලන ජයග්‍රහණය තුළ තිබිණි. එනම් රාජ්‍යයේ මැදිහත්වීම වෙළෙඳපොළ හා සමානව ම ඉදිරියට ගත යුතු ය යන සංකල්පය යි. දෙවැනි වැදගත් කරුණ නම්, 77 සිට 94 දක්වා පැවති ආණ්ඩුකරණය තුළ තිබුණු විශාල ප්‍රජාතන්ත්‍රීය පරිහානියට එරෙහි වීම යි.

එතෙක් පැවති එක්සත් ජාතික පක්ෂයේ පාලනය තුළ විශාල ප්‍රජාතන්ත්‍රීය පරිහානියක් තිබුණි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම, එමගින් විධායක ජනාධිපති ක්‍රමයක් ඇති කිරීම, ඒ ඔස්සේ අධිකරණය සම්පූර්ණයෙන් පාලනය කිරීම, ඉන් පසුව 83 කළු ජූලිය යනුවෙන් හැඳින්වුණු දැවැන්ත ප්‍රහාරය දෙමළ සමාජයට එල්ල කිරීම හා ඊට ආණ්ඩුවේ සම්බන්ධය ප්‍රකට වීම, 88-89 පළාත් සභා ක්‍රමය ඉතාම බරපතළ බලහත්කාරයක් ඔස්සේ පාර්ලිමේන්තුවට ගෙන ඒම, ඊට විරුද්ධව විශාල ජන නැගිටීමක් 89 වසරේදී මතු වීම වැනි කාරණා මේ කාලයේ සිදු වූ ප්‍රජාතන්ත්‍රීය පරිහානියේ නිදර්ශන ලෙස දැක්විය හැකි ය. මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී භාවිතාවන්ට එරෙහි වීමක්ද 94 ජයග්‍රහණය තුළ තිබිණි. වෙනත් ආකාරයකින් කිවහොත් නව ප්‍රජාතන්ත්‍රීය අවකාශයක් පිළිබඳ අපේක්ෂාවක් එය තුළ තිබුණි. තුන්වෙනුව, විශේෂයෙන්ම ලංකාවේ දකුණේ තරුණයන්ගේ නැගිටීමෙන් ඇති කර තිබුණු බලපෑමත් උතුරේ දේශපාලන බලපෑමත් යන දෙකටම විසඳුම් ගෙන ආ යුතුය යන අදහසද 94 ආණ්ඩුව තුළ තිබිණි.

### ලිබරල්වාදී බුද්ධි මණ්ඩපයක්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බිහි වන්නේ මෙබඳු පසුබිමක ය. මා එය දකින්නේ, 77න් ආරම්භ වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධීභාවය, ජනවර්ග අතර ගැටුම, බරපතළ ආකාරයෙන් ඇති කළ වෙළෙඳපොළ ක්‍රමය යන මේවාට විරුද්ධව මතු වූ 94 චන්ද්‍රිකා ආණ්ඩුවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ගතිකය විසින් වෙළෙඳපොළ ක්‍රමය හා ලිබරල් ක්‍රමය දැඩි ලෙස යටපත් කරනු ඇති බව දැක, එය යම් දුරකට න්‍යායිකව ආරක්ෂා කරගැනීමේ අරමුණින් රැස් වූ බුද්ධි මණ්ඩපයක් (*Think Tank*) ලෙස යි. මෙයට සම්බන්ධ වූ ප්‍රමුඛයින් කිහිපදෙනෙක්ම එවකට පැවති ලිබරල් පක්ෂය සමඟ ද සමීප සම්බන්ධකම් පැවති අය වූ බවද සත්‍යයකි. සැබැවින්ම මෙහි මූලය වූයේ එය යි. එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලනයේ නිරත වූ අය ලෙසත්, විශේෂයෙන් ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියක් තුළ ආණ්ඩුව ක්‍රියාත්මක විය යුතු ය යන මතය දැරූ අය ලෙසත් අපගේ තේරුම් ගැනීම වූයේ එය යි.

ඉන් පසුව විවිධ මානයන් ඔස්සේ ක්‍රියාත්මක වන, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි තවත් ආයතන ගණනාවක් කොළඹ නගරයෙන් මතු විය. සමාජ විද්‍යාඥයින්ගේ සංගමයද ඉන් එකකි. ඒහෙත් ඒ සියල්ලටම වඩා බලවත් ලෙස තමන්ගේ ලිබරල් ප්‍රතිපත්ති වෙනුවෙන් ක්‍රියාත්මක වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමත් විය. එය නෛතික කලාපය, න්‍යායික කලාපය සහ ප්‍රතිපත්තිමය කලාපය (*Legal domain, Theoretical domain and Procedural domain* (*Policy domain*) යන කලාප තුනෙහිම ක්‍රියාකාරී විය. එහෙත් සමාජයීය කලාපය (*Social domain*) තුළ එහි ක්‍රියාකාරිත්වය එතරම් ශක්තිමත් එකක් නොවීය. එය විශේෂයෙන් අවධාරණය කළ යුතු කරුණකි. *(They are working on those three domain, But not in the Social domain)* ඒ නිසා හැම විටම එය කොළඹ කේන්ද්‍රීය විය. ශ්‍රීලනිප දේශපාලනය තුළ සිට බලන විට අපට පෙනුණේ එය 'පිටගංකාරයකු' ලෙසිනි.

එය ලිබරල්වාදය, වෙළෙඳපොළ ක්‍රමය, නීති හා ප්‍රතිපත්ති යනාදිය ගැන තාක්ෂණික වචනමාලාවක් (*Technical vocabulary*) භාවිත කරන, දැඩි ශාස්ත්‍රීය නැඹුරුවක් සහිත ආයතනයක් මිස සමාජීය කලාපය තුළ මිනිස්සුන්ගේ බිම් තලයේ ප්‍රශ්න සමඟ වැඩ කරන ආයතනයක් නොවී ය. වර්තමානයේද එහි වෙනසක් නැත. ඉරක් ඇඳ සලකුණු කළොත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිටින්නේ මා නියෝජනය කරන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කලාපය තුළ නොව, ඉරෙන් එහා පැත්තේ ලිබරල්, නෛතික, තාක්ෂණික කලාපයක් තුළය.

ඒහෙත් ඔවුන් තුළ තිබුණු ඉතා හොඳ ලක්ෂණයක් නම්, ඔවුන් කරුණු මත පදනම්ව (*Factually*) කටයුතු කරනු මිස ලාංකීය සමාජයේ තිබෙන අගතිගාමී විරුද්ධවාදීකම්වලින් (*Prejudism*) බැහැර වීමයි. භාෂාව, ජාතිය හෝ කුලය පදනම් කර ගත් අගතිගාමී බව ලංකාවේ බොහෝ සමාජ බුද්ධි මණ්ඩපවල කැපී පෙනෙන ලක්ෂණයකි. මින් බැහැර වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉතා දක්ෂ, තරුණ බුද්ධිමය පරපුරක් බිහි කිරීමට දායක විය. මගේ වයසේ සමකාලීනයන් වූ අසංග වැලිකල, සංජන හත්තොටුව, භවානි ෆොන්සේකා, ප්‍රදීප් පීරිස් වැනි අයට තමන් නිරත ක්ෂේත්‍ර තුළ දැවැන්තයින් ලෙස ගොඩනැඟීමට මෙම ආයතනය ඉවහල් විය.

*CPA* හි අධ්‍යයනයන්, අධිකරණය ඉදිරියේ නඩු පැවරීම් යනාදිය සාරගර්භ වූ අතර ප්‍රදීප් පීරිස් ලයනල් ගුරුගේ වැනි අය කරගෙන ගිය 'සෝෂල් ඉන්ඩිකේටර්' ව්‍යාපෘතිය ඉතා හොඳ දත්තමය මැදිහත්වීමක් විශේෂයෙන් මැතිවරණවලදී සිදු කළේය. එමෙන්ම හොඳ ප්‍රකාශන රැසක් පළ කෙරිණි. ඒ අනුව පසුගිය අවුරුදු 25ක කාලය තුළ ලංකා දේශපාලනයේ ලිබරල්වාදයේ න්‍යායික පදනමට විශාල එකතු කිරීමක් කළ ආයතනයක් ලෙස එය නම් කළ හැකි ය.

**ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සීමාව**

ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන හා ක්‍රියාකාරී වන ආයතනයක් ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ භාවිතාව පිළිබඳව ද මගේ විශේෂ නිරීක්ෂණයක් තිබේ. එය මඳක් පැහැදිලි කළ යුතු කාරණයකි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ න්‍යායික ප්‍රවේශයන් දෙකක් තිබේ. එනම් පටිපාටිගත ප්‍රජාතන්තවාදය (*Procedural Democracy*) සහ සාංගමික ප්‍රජාතන්ත්‍රවාදය (*Associational Democracy*) යනුවෙනි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන *CPA* හි කියැවීම නැතහොත් ප්‍රවේශය මුළුමනින්ම පටිපාටිගත (*Procedural*) එකකි. මෙහි දී සිදු වන්නේ විගණනයකදී මෙන් අනුකූලබව (*Compliance*) පරීක්ෂා කර බැලීමයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන දේශපාලන විගණනයක් (*A political audit*) කිරීමට උත්සාහ කළේ ය. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අනෙක් මානය, එනම් සාංගමික ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් සමාජ එකඟතා ගොඩනැගීම ඔවුන්ගේ අවධානයට හසු වූයේ නැත. එබැවින් *CPA* හි ප්‍රජාතන්ත්‍රවාය යනු අර්ධ නිර්වචනීය තත්ත්වයකි. (*Half bake*) එයට පටිපාටිගත ප්‍රජාතන්ත්‍රවාදයෙහි සුපිරි වැඩකරුවකු වීමට හැකි වුවත් සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයෙහි සිදු කළ හැකි බලපෑම ඉතා අල්ප ය.

අවශ්‍ය නම් මේ විවේචනය තවදුරටත් දිගු කළ හැකිය. ඒ ඔවුන්ගේ තෝරාගැනීම් සම්බන්ධයෙනි. 1994න් පසු එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි අවස්ථා දෙකක් තිබිණි. එහෙත් ශ්‍රීලනිප ආණ්ඩුවක් බලයේ සිටින විටත් එජාප ආණ්ඩුවක් බලයේ සිටින විටත් *CPA* හි ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ පිළිවෙත සමාන වූයේ නැත. ශ්‍රීලනිප ආණ්ඩුවක් බලයේ සිටින විට එහි ක්‍රියාකාරකම්වලට එරෙහිව කළ වේගවත් මැදිහත්වීම අනිත් පැත්තට දක්නට නොලැබිණි. තමන්ගේ දේශපාලන දහමට ගැළපෙන පක්ෂයක් බලයට ආ විට ඊට උදව් කිරීමට ඔවුන්ට ඇති අයිතියට මා එරෙහි වන්නේ නැත. නමුත් මා අවධාරණය කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් පෙන්නුම් කරන පළල් ආකෘතිය, භාවිතයේදී එලෙසම නොමැති බව යි.

මීට දිය හැකි හොඳම නිදර්ශනය අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක සම්බන්ධයෙන් මතු වූ අර්බුදයයි. මගේ තේරුම් ගැනීමට අනුව ශිරානි බණ්ඩාරනායක ධුරයෙන් පහ කිරීම ව්‍යවස්ථාවට අනුව (තාක්ෂණිකව) නිවැරදි නමුත් දේශපාලනිකව නිවැරදි නැත. එමෙන්ම ශිරානි බණ්ඩාරනායක නැවත තනතුරෙහි පිහිටුවීම දේශපාලනිකව නිවැරදි විය හැකි නමුත් තාක්ෂණිකව වැරදි ය. ඒසේ වුවද පළමුවැනි අවස්ථාවේ දී දැඩි හඬක් නැගූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දෙවැනි අවස්ථාවේදී වචනයක්වත් කතා කළේ නැත.

සාංගමික ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් *CPA* දක්වන අවධානය සීමිත වීම, ඔවුන්ගේ මැදිහත්වීම්වල ඵලදායීබව කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳු දැයි, ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය සඳහා ඔවුන් දැරූ උත්සාහයන් ආශ්‍රයෙන් වටහාගත හැකිය.

**ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය**

78 ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් සකස් කිරීම පිළිබඳ අදහස 1994දී ප්‍රබල ලෙස ඉදිරිපත් වූ අතර 2000, 2001, 2004, 2010, 2015 ආදී වශයෙන් නැවත නැවත මතු විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද දිගටම මේ අවශ්‍යතාව වෙනුවෙන් පෙනී සිටියේය. එහෙත් ඔවුන් මේ ප්‍රශ්නයට සෙව්වේ බොහෝදුරට තාක්ෂණික පිළිතුරකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු සරල ලියවිල්ලක් නොව සංකීර්ණ ලියවිල්ලකි. *CPA*හි අවධානය යොමු වූයේ මේ සංකීර්ණ ලියවිල්ල කෙටුම්පත් කිරීම සම්බන්ධයෙනි. ඒ සඳහා වන උත්සාහයේදී විදෙස් විශේෂඥයින් සම්බන්ධ කරමින් එය සාර්ථක කර ගැනීමට වෙහෙස විය. නමුත් ඒ වෑයම බිම් තලය සමඟ සම්බන්ධ වූවක් නොවේ. මහජන මතය සමග ගනුදෙනු කරන බිම්තලයේ නැත්නම් සාංගමික තලයේදී සිය වෑයම තහවුරු කිරීමට ඔවුන්ට හැකියාවක් නොවීය. මේ වන විට 94-2000 දක්වා සිදු වූ සංවාදයෙන් සකස් කළ ව්‍යවස්ථා කෙටුම්පතත් 2015-2019 සමයේ සකස් කෙරුණු ව්‍යවස්ථා කෙටුම්පත් වශයෙන් ව්‍යවස්ථා කෙටුම්පත් දෙකක් අප සතුව තිබේ. එහෙත් තවමත් අදාළ අරමුණ සාර්ථක කර ගැනීමට හැකි වී නැත.

එමෙන්ම එම වකවානුව තුළ 17, 18, 19, 20 යන බරපතළ ව්‍යවස්ථා සංශෝධන හතරක් සම්මත කෙරිණි. මේ අවස්ථා හතරේදීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඒවාට පක්ෂව හෝ විපක්ෂව- මතවාදීව හා නඩු කීම් ආදියෙන් විශාල වශයෙන් මැදිහත් විය. 17ට පක්ෂවත්, 18ට විරුද්ධවත්, නැවත 19ට පක්ෂවත්, 20ට විරුද්ධවත් වශයෙනි. එහෙත් මේ මැදිහත්වීම් සියල්ල සිදු වූයේ පෙර කී පටිපාටිගත ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙනි. බිම් තලයට ඒවායින් සිදු වන බලපෑම අල්ප ය.

සමාජයීය කාරණා දෙස බලන දෘෂ්ටිකෝණය සම්බන්ධයෙන් විකල්ප

ප්‍රතිපත්ති කේන්ද්‍රය දරන ලිබරල් අදහසත් මා දරන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අදහසත් එකිනෙකට වෙනස් ය. උදාහරණයකට, දේශපාලනයෙන් ආගමත්, ජාතියත් ඉතිහාසයත් ඉවත් කොට එය සම්පූර්ණයෙන්ම දත්ත මත පදනම් වූ දෙයක් ලෙස සැලකීම ලිබරල්වාදයේ උත්සාහය යි. නමුත් එය කිරීමට වෑයම් කරන විට සමාජ සම්මුති සියල්ල කැඩී යයි. ලිබරල්වාදීන්ට දත්ත ගැන මිස මේ සම්මුති ගැන විශ්වාසයක් නැත. මම එක් වරක් මගේ ලිපියක දී එය මෙසේ පැහැදිලි කළෙමි: ලිබරල්වාදීන් කල්පනා කරන පරිදි සියලු මිනිසුන් එක සමාන ය. හැම මිනිසකුටම සමාන අයිතිවාසිකම් ඇති අතර සියලු දෙනාම නීතිය අනුව ද සමාන ය. එහෙත් අප සමාජය තුළ වැඩ කරන විට අපට පෙනී යන දෙයක් නම් එය එතරම්ම සරල නොවන බව යි. සමහර ජන කණ්ඩායම් අනිත් ජන කණ්ඩායම්වලට වඩා ඒ භූමියට පරණ ය. සමහර ජන කණ්ඩායම්වල ඇදහීම් හා විශ්වාසයන් වෙනස්ය. සමාජ විද්‍යානුකූලව බලන විට පෙනෙන චිත්‍රය දත්ත අනුව බලන විට පෙනෙන තරම් සරල නොවේ. උදාහරණයක් ලෙස 'උතුරුමැද පළාතේ තිබෙන ගස්' යන හැඳින්වීමට සියලුම ගස් වර්ග අයත් වේ. ඒ අනුව ශ්‍රී මහා බෝධිය ද උතුරු මැද පළාතේ තිබෙන ගසකි. නමුත් එක ජනවර්ගයක සංස්කෘතියට හා ශිෂ්ටාචාරයට මේ ගසෙහි විශාල සම්බන්ධයක් තිබේ. උතුරුමැද පළාතේ ශ්‍රී මහා බෝධියට සමාජ සම්මුතියෙන් විශේෂ ඉඩක් තිබෙනවා සේම යාපනයට ගිය විට අනිත් ගොඩනැගිලිවලට වඩා නල්ලූර් කෝවිලට සමාජ සම්මුතියෙන් වෙනම අගයක් තිබේ. ජාතීන් පිළිබඳ ප්‍රශ්නය ද එලෙසම ය. උතුරු නැගෙනහිර වෙසෙන දෙමළ ජනතාව කල්පනා කරන්නේ තමන් සිංහලයන්ට වඩා ඒ ප්‍රදේශවල පැරණි පදිංචිකරුවන් බව යි. දකුණේ සිංහල අය, සෙසු ජාතීන්ට වඩා තමන් දකුණේ උරුමකරුවන් බව සිතති. එහෙත් සියල්ලන් සමාන යැයි සිතන හුදු ලිබරලිබරල්වාදී තර්කනයට මේ කිසිවක් හසු වන්නේ නැත. ඒවා පෙනෙන්නේ සමාජ සම්මුතිවාදී තර්කයකට ගිය විට පමණි. මගේ තේරුම් ගැනීම අනුව *CPA* වැනි සංවිධානවලට වරදින තැනක් නම් මේ සමාජ සම්මුතිවාදී දෘෂ්ටිය බැහැර කොට, ලිබරල්වාදී දත්තමය පදනමකින් යම් සමානාත්මතාවක් විශ්වාස කිරීම ය.

### ගත යුතු මග කුමක් ද?

දර්ශන විද්‍යාවේ යථාභූතවාදී ප්‍රවේශය (*Positivistic approach*) සහ විචාරාත්මක ප්‍රවේශය (*Critical approach*) යනුවෙන් ධාරාවන් දෙකක් තිබේ. යථාභූතවාදී ප්‍රවේශය යනුවෙන් අදහස් කෙරෙන්නේ යමක් දෙස 'ගස් ඔක්කොම සමානයි' ආදී ලෙස දත්තමය ආකාරයෙන් බැලීම ය. එහෙත් සමාජය ගමන් කරන රිද්මය හඳුනාගත හැක්කේ මේ ප්‍රවේශය ඔස්සේ නොව විවේචනාත්මක ප්‍රවේශය ඔස්සේ ය. මෙම පැත්තෙහි සිටින අප වැනි අයට පෙනෙන දෙයක් නම්, හැම විටම *CPA* වැනි සංවිධාන එක් කොටසක් අමතක කර යන බව යි. ඔවුන්ට මඟහැරුණු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී, සම්මුතිවාදී, සංස්කෘතික කලාපය තුළ වැඩ කළ හැකි විශාල අවකාශයක් තිබේ. එහෙත් ඒ දෙසට පය තැබීමට හැකි වන්නේ, 'ලෝකයට ප්‍රශ්නයක් ඇත, අප ළඟ පිළිතුරක් ඇත' යන ලිබරල්වාදී දෘෂ්ටියෙන් මිදී 'ලෝකයට ප්‍රශ්න ඇත, ඒවාට විවිධ පිළිතුරු ඇත' යනුවෙන් සිතීමට හැකි නම් පමණකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පසුගිය 25වසර තුළ කටයුතු කළ සුසමාදර්ශය (*Pardigm*) ඔස්සේ යා හැකි උපරිම දුර ගොස් ඇති බව මගේ අදහස යි. කලින් කළ දේවල්ම නැවත නැවතත් කිරීම හැර ඒ කලාපය තුළ තවදුරටත් යා හැකි ඉදිරි ගමනක් නැත. එහි සීමාව කෙතරම් පැහැදිලි ලෙස සලකුණු වී ඇත් ද යත් මේ වන විට පවතින හෙජමොනික බලය හමුවේ ලංකාවේ ලිබරල්වාදය තීරණාත්මක ලෙසම පරාජය වී තිබේ. රනිල් වික්‍රමසිංහගේ පරාජය විසින් සංකේතවත් කරන්නේ එය නියෝජනය කළ දේශපාලන කඳවුරේ පරාජය යි. මා යෝජනා කරන්නේ මතවාදයක් ලෙස ලිබරල්වාදය පරාජය වීම මෙන්ම තම කලාපයේ දේශපාලන ව්‍යාපෘතිය අසාර්ථක වීම ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බැරෑරුම් ලෙස සලකා බැලිය යුතු බව යි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙතැනින් ඉදිරියට යෑමට නම් එය නව ප්‍රවේශයකට, එනම් ප්‍රතිලිබරල්වාදී පදනමකට යා යුතු බව මගේ යෝජනාව ය.

---

**මහාචාර්ය චරිත හේරත්**

වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. කෝප් කමිටුවේ සභාපතිවරයා ය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ හිටපු මහාචාර්යවරයෙකි. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයකු මෙන්ම උපදේශකවරයකු වශයෙන් ද කටයුතු කර ඇත. ජාතික පරිසර අධිකාරියේ හිටපු සභාපතිවරයා ද වේ.

# විසිපස් වසරක ශේෂ පත්‍රය සහ අනාගත අභියෝග



**ශිරාල් ලක්තිලක**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමඟ ඉතා සමීපව කටයුතු කළ පුද්ගලයකු ලෙස, මා එම ආයතනය සලකන්නේ ඉතාම අසීරු තත්ත්වයන් යටතේ ලංකාවේ දේශපාලනික සහ සමාජීය වශයෙන් නව අදහස්වලට පවතින විකර්ෂණය, ඝර්ෂණය පුළුල් කිරීම සඳහා අසීරු කටයුත්තක් ඉදිරියට ගෙන යන සංවිධානයක් ලෙස ය. එනයින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ලංකාවේ ලිබරල් චින්තනය නියෝජනය කරන පර්යේෂණවලට සම්බන්ධ ක්‍රියාකාරී ආයතනයකි. ලිබරල් චින්තනය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නොවේ. සමාජගත වී ද නොමැත. ලංකාව තුළ වැඩි වශයෙන් පැළපැදියම් වී ඇත්තේ වාම ජාතිකවාදය ය. වාම ජාතිකවාදයක් පවතින රටක - විශේෂයෙන් ගත් කල සිංහල සමාජය තුළ - ලිබරල් චින්තනය ඉදිරියට ගෙන යෑම අසීරු කරුණකි. එම අසීරු තත්ත්වයන් යටතේ මෙම ආයතනය විසිපස් වසරක් තිස්සේ කළ කාර්යය පිළිබඳ මා බෙහෙවින් සතුටු වන අතර ඒ වෙනුවෙන් මගේ සුබ පැතුම් එක් කරන්නෙමි.

### ප්‍රතිපත්ති සම්පාදනය මුල් කර ගත් ආයතන අතර CPA ආයතනයේ භූමිකාව සහ බලපෑම

වාම ජාතිකවාදය මුල්බැස පවතින සමාජයක ලිබරල් චින්තනය මත ප්‍රතිපත්ති හැදීම, ප්‍රතිපත්ති යෝජනා කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හෝ ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති යෝජනා කිරීම පවා අසීරු ය. එවැනි පරිසරයක් තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට ඇති එක් ප්‍රධාන අභියෝගයක් වන්නේ එය රාජ්‍ය නොවන සංවිධානයක් වීම ය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳ පෙර කී වාම ජාතිකවාදී චින්තනය ලේබල්කරණයකට ලක්

කර තිබෙන්නේ *NGO* නමිනි. සාමාන්‍ය සමාජය *NGO* දෙස බලන්නේ අතිශය වපර ඇසකිනි. *NGO* යන්න නාමකරණය වී තිබෙන්නේ ලංකාවේ ස්වාධිපත්‍යයට, ලංකාවේ උරුමයට, ලංකාවේ ස්වාභාවික චින්තනයට එදිරිව යන සංකල්ප නිපදවන, එසේ ම විදේශීය න්‍යාය පත්‍රයන්ට අනුව කටයුතු කරන කුලකයක් ලෙස ය.

මෙවැනි පසුබිමක් තුළ වසර 25ක කාලයක් ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා නොපසුබට ධෛර්යෙන් ක්‍රියා කිරීම පිළිබඳ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතාට අපගේ ප්‍රණාමය හිමි විය යුතු ය. එම ආයතනය පවතින්නේ ඔහුගේ ධෛර්ය සහ කැපවීම හේතුවෙනි. දෙවනුව ඔහු අයත් වන සමාජ පංතිය ඉහළ ධනේශ්වර පංතිය යි. එම පංතිය සාමාන්‍ය සමාජය සමඟ සම්බන්ධ නොවීම හේතුවෙන් ඔහුට එය දැරීමට හැකි විය. වැරදීමකින් හෝ ඔහු මේ සමාජය තුළ ජීවත් වුණා නම් ඔහුට මෙම කටයුත්ත අඛණ්ඩව සිදු කිරීම අසීරු කාර්යයක් වනු ඇත. තෙවනුව, ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන දෙවර්ගයක් පවතී. එක් වර්ගයක් සංවර්ධනය මුල් කර ගත් සංවිධාන වන අතර අනෙක් වර්ගය ප්‍රතිපත්ති සම්පාදනය ගැන කතා කරන රාජ්‍ය නොවන සංවිධානයන් ය. ශ්‍රී ලංකාවේ වාම ජාතිකවාදීන්ට වහකදුරු වී තිබෙන්නේ ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා කරන සංවිධාන මිස සංවර්ධන කටයතුවලට අදාළව වැඩ කරන සංවිධාන නොවේ. එම නිසා *NGO* ලේබලය නිසි පරිදි, නිසි ලෙස අලවන්නේ ප්‍රතිපත්ති සම්පාදනය වෙනුවෙන් පෙනී සිටින රාජ්‍ය නොවන සංවිධානවලට ය. ඒ අර්ථයෙන් ගත් විට නැවතත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලිබරල් ප්‍රතිපත්ති ගැන කතා කරන සංවිධානයක් හැටියට අභියෝගයට ලක් වී තිබේ. එසේ ම එහි ප්‍රධානියා දෙමළ ජාතිකයකු වීම ද තවත් සුවිශේෂී කාරණයකි. ඔහු දෙමළ ජාතිකයකු හැටියට සැලකීමට මම අකමැත්තෙමි. ඔහු ශ්‍රී ලාංකිකයෙකි. නමුත් ඔහුගේ ජනවර්ගය දෙමළ වීම මෙම ගැටලුව උත්සන්න වීමට බලපා තිබේ.

70 දශකයේ අග භාගයේ ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සංකල්පය කරළියට පැමිණිය ද එය සැබෑ ලෙස ම ගොඩ නැගුණේ විමධ්‍යගතකරණය නැත්නම් *Decentralization* නැමති සංකල්පය තුළ ය. එහි හතරවෙනි මාදිලිය ලෙස ය. එහි පළමුවැන්න වූයේ පරිපාලනය විමධ්‍යගත කිරීම ය; *(Deconcentraion)* දෙවැන්න බලය අභිනියෝජනය කිරීම ය; තුන්වැන්න බලය බෙදා ගැනීම ය; සිව්වැන්න වන්නේ පුද්ගලිකකරණය ය. රාජ්‍ය නොවන සංවිධානවලට, රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීම සඳහා භූමිකාවක් ඇතැයි යන කතිකාව පැන නැගුණේ, පුද්ගලිකකරණය තුළ ය. මේ සංකල්පය රට තුළ බරපතළ ලෙස අභියෝගයට ලක් වී තිබේ.

ලංකාවේ දේශපාලනය අතිශය කේන්ද්‍රීය ය. රාජාණ්ඩු විකාශනයක පරිවර්තනයකින් පසු යටත්විජිත පරිපාලනයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයකට හිමිකම් කියන රටක, රජෙකු වැනි කේන්ද්‍රීය පාලනයක් විශ්වාස කිරීම එතරම් අමුත්තක් නොවේ. එහෙයින් කේන්ද්‍රය තුළ ම සෑම බලයක් ම තියා ගත යුතු යැයි විශ්වාස කරන සමාජයක විමධ්‍යගතකරණ සංකල්පයක් කෙරෙහි යොමු කිරීම අතිශය දුෂ්කර කටයුත්කි. එහි යම් හෝ අවම අවකාශයක් පවතින්නේ පරිපාලනය විමධ්‍යගත කිරීමට සහ බලය අභිනියෝජනය කිරීමට පමණි. නමුත් පළාත් සභා හරහා බලය බෙදා ගැනීමට සිංහල සමාජය කිසිසේත් ම සූදානම් නැති පසුබිමක රාජ්‍ය නොවන සංවිධාන ද ඒ සංකල්පීය රාමුව තුළ ඉදිරියට එන විට අප පෙර සඳහන් කළ ලේබල්කරණයට අමතරව සංකල්පීය විරෝධතාවක් පැන නගින අතර එය අභියෝගාත්මක තත්ත්වයක් වීම සාමාන්‍ය කරුණකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වභාවයෙන් ම, චින්තනයෙන්, ක්‍රියාවෙන්, පරිපාලනය කිරීමෙන් සහ එහි මූලික ආයතනික ස්වරූපයෙන් ම ලංකාවේ සමාජය විශ්වාස කරන වාම ජාතිකවාදයට විරුද්ධව යන සංවිධානයකි. එවැනි සංවිධානයක් අවුරුදු 25ක් පවත්වාගෙන ඒ මම වනාහි ප්‍රශංසාත්මක කාරණයක් ලෙස සැලකිය හැකි ය.

### ප්‍රතිපත්ති සම්පාදන ආයතනවලට සාමාන්‍ය පුරවැසියන්ගේ විශ්වාසය දිනාගැනීමට නොහැකි වීමේ අභියෝගය.

ලිබරල් චින්තනය ලංකාවේ සමාජගත කිරීමට මෙරට සිටි ලිබරල්වාදීන්ට පවා නොහැකි විය. ඩඩ්ලි සේනානායකගේ සිට එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන දක්වා, නායකයින්ට තමන්ගේ දේශපාලනයට ලිබරල් ජනපදනමක් ගොඩනගා ගැනීමට නොහැකි විය. එය පැරණි වම වැනි ය. මිනිසුන් ඒ තුළ

ජීවත් වුව ද එය වැළඳ නොගත්තේ ය. ඊට ප්‍රධානම හේතුව වන්නේ ප්‍රධාන දේශපාලන ධාරාවක් ඒ මතවාදය වෙනුවෙන් පෙනී නොසිටීම ය. දේශපාලන ධාරාවක් පෙනී නොසිටීමේ තේරුම වන්නේ ඊට ලංකාවේ පුරවැසියන් නොමැතිකම ය. ලංකාවේ සිටින්නේ පුරවැසියන් නොව ඡන්ද දායකයන් ය. මෙරට සිවිල් සමාජයක් නොමැති අතර සිවිල් අවකාශය පුරවා ඇත්තේ ද ඡන්ද දායකයන්ගෙනි. පවුල සහ රාජ්‍ය අතර තිබෙන අවකාශයට අප සිවිල් අවකාශය යැයි කියන්නේ නම් එහි සිටින්නේ ඡන්ද දායකයින් පමණි. අවුරුදු හැත්තෑවක් තිස්සේම පුරවැසියන් ලෙස ක්‍රියාත්මක වන ක්‍රියාධරයින් ගොඩනගන්නට අපට නොහැකි වී තිබේ. අප පවා සිවිල් සමාජයේ ක්‍රියාකාරිකයන් හැටියට පැමිණ පසුව පක්ෂ දේශපාලනයට සම්බන්ධ වුණ අයයි. බොහොමයක් සංවිධාන ද එසේ ය. සමාජයේ පවතින බොහෝ සංවිධාන බොහෝ විට කටයුතු කරන්නේ දේශපාලන පක්ෂ සමඟ අනන්‍ය වීමෙන් ය. කවුරුත් දන්නා කාරණයක් නම්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පවා බොහෝ දුරට එක්සත් ජාතික පක්ෂය සමඟ අනන්‍යව කටයුතු කරන ප්‍රතිපත්ති සංවිධානයකි. එවැනි තත්ත්වයක් තුළ අභියෝග නැවතත් පැමිණේ.

පුරවැසියන් නොවන අයට පුරවැසි න්‍යාය පත්‍රයක් ලබා දීම අපහසු ය. එය ග්‍රහණය කර නොගන්නේ ය. ප්‍රතිපත්ති නිර්මාණය කරන ව්‍යවස්ථාදායකයේ කොටස්කරුවන් ලිබරල් ප්‍රතිපත්ති විශ්වාස නොකරන අතර ලිබරල්වාදීන් ලෙස පෙනී සිටින බහුතරයක් දෙනා පැරණි වාමාංශිකයෝ ය. ඔවුහු බොහෝ දුරට සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෝ ය. ලංකාවේ ලිබරල් චින්තනය කිඳාබැස තිබෙන්නේ මෙම ව්‍යාකූල චින්තනය තුළ ය. එවැනි තත්ත්වයක් තුළ මිනිසුන් ලිබරල් චින්තනය කුමක්දැයි හඳුනන්නේ නැත. ඉදිරියේ දී එන ආර්ථික ව්‍යසනයන්ට පිළිතුරු තිබෙන්නේ ද ලිබරල් චින්තනය තුළ පමණි. මෙරට ලිබරල් චින්තනය ව්‍යාකූල කළේ රනිල් වික්‍රමසිංහ ය. ලිබරල් චින්තනය සහ *Conservative* චින්තනය යනු දෙකකි. ලංකාවේ ඇතැම් සමාජීය කොටස් හිතන්නේ *Conservative* වාදය යනු ලිබරල් චින්තනය කියා ය. එය වැරදි ය. විශේෂයෙන්ම ලිබරල් චින්තනයේ ආර්ථික කොටස, *Conservative* වාදයේ ආර්ථිකයේ දිගුවක් වූවද නව ලිබරල්වාදයේ ආර්ථිකය වැනි කොටසක් නොවේ. නමුත් මිනිසුන් සිතන්නේ මෙය ලිබරල් චින්තනයේ ම කොටසක් යනුවෙන් ය. මෙවැනි සංකීර්ණ පසුබිමක් තුළ අවසාන ශේෂපත්‍රයේදී අපට දක්නට ලැබෙන්නේ ලිබරල් චින්තනය ඔප නොදමන ලද මැණිකක් ලෙස මෙරට පවතින බව ය.

## නව ප්‍රතිපත්ති හා සංකල්ප සමාජගත කිරීම සහ එහි බලපෑම

මෙවැනි සංවිධාන විසින් වසර ගණනාවක් තිස්සේ සාකච්ඡා කළ ප්‍රතිපත්තිමය කාරණා සමාජගත වී ඇත්දැයි තීරණය කළ හැක්කේ එම සංකල්ප ආයතනගත වී තිබේද යන කාරණය මත ය. අවුරුදු 25ක් තිස්සේ *CPA* සංවිධානය විවිධ සංකල්ප - බලය බෙදීම, ලිබරල් අයිතවාසිකම් ගැන, නීතියේ ආධිපත්‍ය ගැන, යනාදී බොහෝ දේ පිළිබඳව සාකච්ඡා කොට තිබේ. මෙවැනි සංකල්ප සමාජයට මුදා හැර තිබේ. එසේ සංකල්ප මුදා හැරීම තුළ, එම සංකල්පවල පිළිබිඹුවක් (*Visibility*) පවත්වා ගැනීමට හැකි විය. නමුත් ඒවා ආයතනගත වී ඇත් ද යන ප්‍රශ්නයේ දී අපට කිව හැක්කේ එසේ වී නොමැති බවය. *CPA* වැනි ආයතන පමණක් නොව අප පවා දරන මතයන් ආයතනගත වී ඇති ආකාරය දෙස බැලූ විට අපට සෑහීමකට පත් විය නොහැකි ය. නමුත් බලය බෙදීම වැනි යම් යම් සංවාද මෙවැනි පුංචි දූපතක පවත්වාගෙන ගොස් තිබෙන්නේ *CPA* වැනි ආයතනවලින් සිදු කරන නිහඬ අරගලවල ප්‍රතිඵල ලෙසිනි.

සමස්තයක් හැටියට ගත් විට *CPA* ආයතනය මෙන්ම මා සම්බන්ධ වූ බොහෝ ආයතනවල තිබුණු ලක්ෂණය වන්නේ ඔවුන්ට ලැබුණු සම්පත් ප්‍රමාණයට සාපේක්ෂව ඔවුන් නිර්මාණශීලී නොවීම ය. ඔවුන්ගේ මූලෝපායන් වැරදි ය. උදාහරණයක් හැටියට, පහුගිය කාලේ කුමාර් රූපසිංහට ලැබුණ මුදල් සම්භාරය, විමල් වීරවංශ වැනි කෙනෙකුට ලැබුණා යැයි අපි සිතමු. එසේ නම් විමල් වීරවංශ මේ රට අල්ලාගෙන ය. *CPA* සංවිධානය සහ අනෙකුත් බොහෝ සංවිධානවලට බොහෝ සම්පත් ඇති නමුත් ඔවුන් යොදවන්නේ අවම මූලෝපායන් ය. එය, එම ක්‍රියාධරයන්ගේ, මානව සම්පත් පරිහරණය කරන නායකයින්ගේ තිබෙන ගැටලුවකි. මෙවැනි ආයතන ඉදිරියට කටයුතු කිරීමේ දී එවන් අභියෝග තිබේ. කෙසේ නමුත් ලංකාවට ලිබරල් චින්තනය අත්‍යාවශ්‍ය ය. එහිදී *CPA* සංවිධානය කාටූන් චිත්‍රයකට නගන්නේ නම් මට මැවෙන්නේ නහය මට්ටමට මුහුදේ ගිලුණ

මිනිහෙක් ලිබරල් කොඩිය ඔසවාගෙන සිටිනවා වැනි චිත්‍රයකි.

## සමාජ කාර්යභාරයක් වෙනුවෙන් අවධානය යොමු කළ යුතු නව මානයන්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු අදේශපාලනික හෝ නිර්දේශපාලනික සංවිධානයක් නොවේ. එය දේශපාලනික සංවිධානයකි. තමන්ට ම ආවේණික වූ චින්තනයක් සහිත එකී චිනත්නයට අනුපාතිකව ප්‍රතිපත්ති ගොඩ නැගීම සහ එම ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීමට වැර දරන ආයනයකි. එය දේශපාලනික ක්‍රියාවකි. මට අනුව දේශපාලන පක්ෂයක් සහ *CPA* ආයතනය අතර වෙනසක් නොමැත. නමුත් *CPA* ආයතනය සිටින්නේ දෙලොවක අතරමං වීය. ඊට හේතුව වන්නේ තමන් ස්වාධීන, අදේශපාලනික සංවිධානයක් යැයි පෙන්නුම් කරන්නට උත්සාහ කරමින් දේශපාලනික අරමුණක් වෙනුවෙන් කටයුතු කිරීම ය. මෙම ආයතනය රටේ සංදර්භයට සාපේක්ෂව දේශපාලනික සංවිධානයකි. දේශපාලනික සංවිධානකයක් ලෙස කටයුතු කිරීම, තමන්ගේ චින්තනය තුළ ප්‍රතිපත්ති ගොඩනැගීම වැනි කාරණා දේශපාලනික නම් වැඩ කළ යුත්තේ ද දේශපාලනික ස්වරූපයෙනි. එම කොටස *CPA* ආයතනයට නොමැත. *CPA* ආයතනයට සිටින්නේ ඉංග්‍රීසි කතා කරන කොළඹ නගරයට සීමා වුණ කණ්ඩායමකි. ඒ කණ්ඩායමට සාමාන්‍ය මිනිස්සුන්ගේ ගඳ සුවඳ නොතේරේ. මිනිස් දාඩිය ගඳ නොතේරෙන අයට දේශපාලන මූලෝපාය හිතීම අසීරු ය. මෙම ප්‍රශ්නය විසඳා ගැනීමට මෙම ආයතනට හැකි වේ දැයි මම නොදනිමි. නමුත් *CPA* ආයතනය ආනාගතය ගැන සිතන්නේ නම්, විශාල වශයෙන් රට පුරා පුද්ගලික පාසල් හරහා ගොඩනැගෙන ඉංග්‍රීසියෙන් හිතන කතාකරන සමාජය එකතු කර ගත යුතු ය. ඒ බොහෝ අය සාමාන්‍ය පංතියේ දෙමාපියන්ගේ දරුවන් ය. ඔවුන් සමඟ වැඩ කරන්නේ නම් අනාගතය සඳහා ප්‍රවේශයක් තිබේ. දැන් පවතින ප්‍රවේශය ඔස්සේ ඉදිරියට යෑම මා සිතන ආකාරයට අසීරු ය.

එසේම ආචාර්ය සරවනමුත්තු මහතා හැරුණු විට දේශපාලනිකව සිතිය හැකි චරිතයක් මෙම සංවිධානය නිර්මාණය කොට නැත. ඉතිහාසය දිහා බැලූ විට රොහාන් එදිරිසිංහ සහ අසංග වැලිකල වැන්නවුන් සිටි මුත් වෙන කිසිදු චරිතයක් නොමැත. මෙරටට බුදුදහම රැගෙන එන අවස්ථාවේ මිහිඳු හාමුදුරුවන් පැවසූයේ, ‘බුදු දහම පැවතීමට නම් ස්වදේශිකයකු මහණ කළ යුතුය’ කියා ය. නමුත් සාමාන්‍ය සිංහල සමාජයට සම්බන්ධ ලිබරල්වාදියකු ගොඩනැගීමට සරවනමුත්තු මහත්මා ඇතුළු එම මතවාදය වෙනුවෙන් වෙහෙසෙන්නන් අපොහොසත් වී ඇත. ලිබරල් චින්තනය සහිත සාමාන්‍ය සමාජයේ චරිතයක් ගොඩනැගිය හැකි නම් ඉදිරියේ දී වැඩ කිරීමට හැකි ය. ප්‍රතිපත්ති ‘මාකට්’ කරමින් සමාජගත කළ යුතු ය. ප්‍රතිපත්ති ‘මාකට්’ කිරීමට නම් ඒ ප්‍රතිපත්ති අදාළ වන සාමාන්‍ය පංතිය සමඟ ගනුදෙනු කිරීම අත්‍යවශ්‍ය ය.

ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් අංශය නමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ඇති අංශය ආභරණයක් පමණි. එය පුංචි ප්‍රයෝගයක් හැටියට පමණි, මම දකින්නේ. ඒ තුළ සැබෑ අරමුණු නියෝජනය නොවේ. *CPA* ආයතනයට තිබෙන ප්‍රමුඛ අභියෝගයක් වන්නේ ස්වදේශික බුද්ධිමතෙකු නිර්මාණය කිරීම ය. සිංහලෙන් හිතන, දෙමළෙන් හිතන, අවශ්‍ය නම් මුස්ලිම් ලෙස හිතන, සාමාන්‍ය මිනිසුන් සමඟ ජීවත් වන, ස්වදේශික බුද්ධිමතකු නිර්මාණය කළ යුතු ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙනී සිටින අරමුණ ඉටු කර ගැනීමට නම් එවැනි එක් අයෙකු හෝ නිර්මාණ කළ යුතු ය. එය පහසු කටයුත්තක් නොවනු ඇත. සිංහල සමාජයෙන් පිට ජීවත්වන පුද්ගලයෙකුට ලිබරල් මතය දාරාගෙන සිටීම පහසු ය. නමුත් සිංහල සමාජය තුළ සිටිමින් වාම ජාතිකවාදීන්ගේ පීඩනයත් සමඟ දියාරු වීමට ඇති ඉඩකඩ වැඩි ය.

## ව්‍යාපෘති මානසිකත්වයෙන් මිදී කටයුතු කිරීමේ අවශ්‍යතාව

බොහෝ විට සමාන්‍ය ජනයා මෙවැනි ප්‍රතිපත්ති නිර්මාණය කරන ආයතනවලින් දුරස් වීමට හේතු වී තිබෙන්නේ, ව්‍යාපෘති සංකල්පය නිසා ය. විදේශ ව්‍යාපෘති ගොඩනැගී තිබෙන්නේ එක්තරා ව්‍යාපාරයක් හැටියට ය. ලෝකයේ ධනවත් රටවල් තමන්ගේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට එකක් හෝ දෙකක් සද්භාවයෙන් වැඩ කරන මාතෘකා වෙනුවෙන් ආයෝජනය කරයි. ඒවා ලබා ගන්නා තවත් අතරමැදි ආයතන තිබේ. ඒවා පිට හෝ ඒ රටවල ම ආයතනයන් ය. එවැනි විවිධ අය අප වැනි රටවලට ව්‍යපෘති ගෙන එනු ලැබේ. නමුත් එම ව්‍යාපෘති ගෙනෙන කිසි ම නිලධාරියෙකුට එකී ව්‍යාපෘතිවලට පදනම් වුණ මූලික හරයන් පිළිබඳ අවබෝධයක්

හෝ එහි අරමුණු පිළිබඳ වගකීමක් නොමැත. ඔවුන්ගේ රාජකාරිය වන්නේ තමන්ට දී තිබෙන *Overall Objectives* අනුව ව්‍යාපෘති ක්‍රියා කරන්නේ ද? ඊට අදාළ *Indicators* සම්පූර්ණ වුණාද නැද්ද ආදිය සොයා බැලීම ය. ඒ අය සමාන්‍ය මිනිසුන් ගැන හිතන්නේ චෙස් බෝඩ් එකක ඉත්තන් හැටියට ය. නමුත් මිනිසුන් යනු චෙස් බෝඩ් එකක ඉත්තන් නොවේ. යම් හෙයකින් ඉත්තෙකු වුව ද ඉත්තා එකතැන ඉන්නේ නැත. එහේ මෙහේ සංචරණය වේ. එකී ස්වරූපය තේරුම් ගැනීමට දේශීය හෝ විදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්ට හැකියාවක් නොමැත. ඔවුන් සිදු කරන්නේ අදාළ මුදල වෙන් කර අදාළ කාලය අවසන් වූ පසු, ව්‍යාපෘතියට අදාළ *impact* සහ *outcome* යනුවෙන් යම් කිසි බොරුවක් ලිවීම සහ එය ඉහළ දක්වා යැවීම ය. එකී ක්‍රියාවලිය අප හඳුන්වන්නේ *Dragonology* යනුවෙන් ය. එය ලෝකය පුරාම පැතිරුණ විශාල ව්‍යාපාරයක කොටසකි. නමුත් ලිබරල් ප්‍රතිපත්ති ලංකාවේ ක්‍රියාත්මක කිරීම පෙර කී *Dragonology* වල කොටසක් නොවේ. එය සැබැවින් ම මිනිසුන්ට අවශ්‍ය දෙයකි. මෙකී තත්ත්වය වෙනස් කර ගැනීමට නොහැකි වීම ව්‍යාපෘති මානසිකත්වයේ තිබෙන දරුණුම සෘණ ප්‍රතිඵලය වේ. එය සමාජයට තේරුම් ගිය පසු සමාජය එවැනි ව්‍යාපෘති විස්වාස නොකරන්නේ ය.

**ඇතැම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී දේශීය සන්දර්භය තේරුම් නොගැනීම**

එසේ ම බොහෝ ව්‍යාපෘති මෙරට සන්දර්භයට අනුව ක්‍රියාත්මක නොකිරීම ද ගැටලු සහගත තත්ත්වයකි. සරල උදාහරණයක් ගනිමු. *Secularism* නැත්නම් වෛහිකවාදය කියන සංකල්පය ලෝකයට බිහි වුණේ කෙසේ ද? එය පල්ලිය කේන්ද්‍ර කරගත් යුරෝපානු සමාජයේ පල්ලියට විරුද්ධව සහ රජුට විරුද්ධව බිහි වූ සංකල්පයකි. ඒ සංකල්පය ලංකාවේ සන්දර්භයට ගෙඩිය පිටින් ගෙන ඒමට නොහැකි ය. එම සංකල්පය ඉන්දියාවේ ඊට වෙනස් ස්වරූපයෙන් අර්ථ නිරූපණය කළේ ය. නමුත් ලංකාවේ සිටින ලිබරල්වාදීන් එම සංකල්ප ඒ ආකෘතිවලින් ම, යුරෝපීය සන්දර්භයෙන් ම මෙරට පැලපදියම් කිරීමට දැරීම අවාසනාවන්ත තත්ත්වයකි.

සමාජීය හා ආර්ථික අයිතිවාසිකම් යන සාකච්ඡාව ද එසේ ය. මා දන්නා පරිදි *CPA* ආයතනය ඊට විරුද්ධ ය. නමුත් මා පවසන්නේ රාජ්‍යයක් තුළ එකවර සිදු කළ නොහැකි දේවල් නාමපුවරු ලෙස ගෙන ඒමේ ඇති ඵලය කුමක් ද? මා සඳහන් කළේ අන්ත දෙකක ප්‍රශ්න දෙකකි. මෙවැනි දෑ දීර්ඝව සාකච්ඡා කොට, පර්යේෂණ කොට ඉදිරිපත් කළ යුතු ප්‍රතිපත්තීන් ය. ඒවා ගෙඩිය පිටින් වැමෑරිය යුතු නැත. මේ පිළිබඳ අපට ඉන්දියාවෙන් ඉගෙනගැනීමට බොහෝ දේ පවතී. ලිබරල් සංකල්ප සමාජ සන්දර්භය අනුව ගෙනෙන්නේ කෙසේ දැයි කියා අම්බෙඩ්කාර් වැනි විද්වතුන්ගෙන් ඉගෙනගත හැකි ය. ඒවා නොදත් ගිරව් ලංකාවේ සිටින අතර එම ගිරව් කරන හානිය ලිබරල් නොවී සිටීමට වඩා බරපතළ ය. බලය බෙදීම වැනි කතිකාවක් සම්බන්ධව ද කිව යුත්තේ එය ම ය. බලය බෙදීම වැනි කාරණාවක් ගැන මීට අවුරුදු 25කට පෙර අප කතා කළ සංකල්ප අද ලෝකයේ ද වෙනස් වී තිබේ. මේ රට තුළ ද සන්දර්භීය වශයෙනුත් ආකල්පමය වශයෙනුත් වෙනස් වී ඇත. 1987-90 දී බලය බෙදීම, දෙමළ ජාතික ප්‍රශ්නය ගැන කතා කළ කෝණයෙන් අද ඒවා සාකච්ඡා කළ නොහැකි ය. ඒවා බොහෝ වෙනස් වී තිබේ. එම වෙනස්කම් නොදන්නා ව්‍යාපෘතිවාදී ලිබරල්වරු මෙම සංකල්පවලට කරන හානිය, එම සංකල්පවලට විරුද්ධ වීම හෝ සංකල්ප ගැන කතා නොකිරීමට වඩා වැඩි ය. එහෙයින් මෙම වෙනස්කම පිළිබඳ අවබෝධ කර ගන්නා ස්වභාවය මත ඒ සඳහා උපයෝගී කර ගන්නා මූලෝපායන් කෙතරම් දුරට සාමාන්‍ය ශ්‍රී ලාංකික ඡන්දදායකයා සමීපවන්නේද යන කරුණු ද්විත්වය මත මෙම මතවාදයේ සාර්ථක අසාර්ථකභාවය හෝ පැවැත්ම තීරණය වනු ඇත.

---

**ශිරාල් ලක්තිලක**

නීතිඥවරයෙකි, දේශපාලන ක්‍රියාධරයෙකි, හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකි, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයාගේ උපදේශකවරයෙකි. කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධිධාරියෙක් වන අතර ගැටුම් අධ්‍යනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකි. සිවිල් සංවිධාන ගණනාවක ක්‍රියාධරයකු ලෙස කටයුතු කර ඇත.

# ප්‍රජාතන්ත්‍රවාදය හා මානව නිදහස උදෙසා



**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග**
ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ 25 වැනි උපන් දිනයට මා මෙම පණිවිඩය එවන්නේ ඉමහත් සතුටිනි.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල නිසි ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රධාන අධීක්ෂණ කණ්ඩායමක් වශයෙන්, තනිව වැදගත් වූ කාර්යභාරයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉටු කළේ ය.

එහි වසර විසිපහක් දිග ගමනේ දී, ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව නිදහස අරක්ෂා කිරීමේ එහි අරමුණුවල කැපී පෙනෙන සාර්ථකත්වයක් එය ලබා ගත්තේ ය. එය, එහි මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණ සහතික කිරීමේ ක්ෂේත්‍රයේ ද, ආණ්ඩුවලට එරෙහි නීතිමය සටන් ඇතුළු මහජන ළැදියා නීති ක්‍රියාමාර්ග රාශියක නියැලීමෙන් ද, දූෂිත භාවිතයන් පිළිබඳ සිදුවීම් හෝ අධිකරණයේ ස්වාධීනත්වයට එරෙහිව මුක්තිය සහිතව ආණ්ඩු ක්‍රියා කළ අවස්ථාවල මෙන් ම, රටේ සියලු ප්‍රජාවන්ගේ යුක්තිය සහ සාධාරණත්වය සහතික කිරීමේ නීති ක්‍රියා මාර්ග ගැනීමේ දී ද එසේ ම වී ය.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මෙන් ම, වාර්ගික සහ ආගමික සුළුතරයන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය සහ අසාධාරණයන් පිළිබඳ ප්‍රශ්නවලට අදාළ කරුණු සම්බන්ධයෙන් ද, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පුළුල් ලෙස ක්‍රියාත්මක වී ය.

මාධ්‍ය නිදහස සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ බොහෝ ක්‍රියාකාරකම්වල ද, කේන්ද්‍රය සාර්ථකව නියැලුණි. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය විසින් නොතකා හරින ලද හෝ රජයේ විවිධාකාර බියගැන්වීම් නිසා තහනමට ලක් වූ විෂයයන් සම්බන්ධයෙන්, තොරතුරු සහ විද්වත් මත බෙදාහැරීමෙන් සහ සංවාද වර්ධනය කිරීමෙන්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන භාෂා තුනෙන් ම ඇති, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජනප්‍රිය වෙබ් අඩවිය වන "*groundview*" කැපී පෙනෙන සාර්ථකත්වයක් අත්කර ගත්තේ ය.

ඔවුන්ගේ ගමන් මගේ දී, විවිධාකාර ආණ්ඩුවලින් එල්ල වූ බොහෝ අභියෝගවලට මුහුණ දීම සැලකිල්ලට ගත් විට, අපගේ මෙම දේශයේ ප්‍රජාතන්ත්‍රවාදය ලබා දීම සහතික කිරීමේ දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලබා ගත් සාර්ථකත්වය ප්‍රශංසනීය වෙයි.

ඔවුන්ගේ දුර්ලභ කැපවීමට සහ ධෛර්යයට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමාරම්භක විධායක අධ්‍යක්ෂ ආචාර්ය පී. සරවනමුත්තුට සහ ඔහුගේ කාර්යමණ්ඩලයට සහ හවුල්කරුවන්ටත්, මගේ අවංක සුබපැතුම් පිරිනමන්නෙමි.

ඔබගේ යහපත් සෞඛ්‍යයත්, දිගට ම සාර්ථකත්වය ලැබීම මෙන් ම, ප්‍රජාතන්ත්‍රවාදය සහ නිදහස සඳහා ඔබගේ සටන්වල දී මුහුණ දීමට කැඳවන බලධාරීන්ගේ කෝපයෙන් ඔබගේ ආරක්ෂාවත් මම ප්‍රාර්ථනා කරමි.


2021 සැප්තැම්බර් 20

---

**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පස් වැනි විධායක ජනාධිපතිනියයි. එසේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු සභාපති ලෙස ද කටයුතු කොට තිබේ.

# එක්ව හෝ එරෙහිව ක්‍රියා කිරීමේ ශක්තිය



**රනිල් වික්‍රමසිංහ**
*ශ්‍රී ලංකාවේ හිටපු අග්‍රාමාත්‍ය*

එල්ටීටීඊ සංවිධානය සහ ශ්‍රී ලංකා ආණ්ඩුව අතර දිග්ගැසුණු යුද ගැටුම් මැද, 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කරන ලද්දේ, ගැටුමට සහ ආණ්ඩුකරණයට ඉතා දියුණු ප්‍රතිපත්ති විකල්ප ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ය. එය, දේශපාලන පර්යේෂණ, උද්දේශන, ක්‍රියාකාරකම්, සංවිධාන ඉතා සුළු සංඛ්‍යාවක් විසින් පමණක් කළ පරිසරයක, ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ ඔහුගේ සගයින් කිහිප දෙනෙකු විසින් හඳුන්වා දෙනු ලැබූ නිර්භීත ව්‍යාපාරයකි. මෙම මුලපිරුම මගින් ඔවුන් “ආයුධ අතර නීතිය නිහඬ වෙයි” යන උපකල්පනයට අභියෝග කරමින් නීතියේ පාලනය ආරක්ෂා කිරීමට සහ වර්ධනය කිරීමට ක්‍රියා කළේ ය.

ඔවුන්ගේ කැනේඩියානු සගයින් මෙන් ආර්ථික සහ සමාජ ප්‍රතිපත්තිවලට අවධානය යොමු කරනවා වෙනුවට, ශ්‍රී ලංකාවේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වඩාත් කරදර සහිත ක්ෂේත්‍රයකට, එනම්, දේශපාලන, ව්‍යවස්ථාමය සහ නීතිමය ප්‍රශ්න වෙත තම ව්‍යාපාරය මෙහෙය වී ය. එම කාලයේ වෙනත් සංවිධාන විසින් මගහරිනු ලැබූ, විවාදාත්මක දේශපාලන මාතෘකා සහ ආන්තික නීතිමය ප්‍රශ්න බොහොමයකට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මුහුණ දුන් බව සහ තස්තවාදය හෙළා දැකීමට සහ මානව හිමිකම් ප්‍රවර්ධනයට ඔවුන්ගේ වැඩ කටයුතු ව්‍යාප්ත කළ බවත් මට නොබිය ව කිව හැකි ය. වඩාත් වැදගත් වන්නේ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගැටුම් සමථකරණය පිළිබඳ සංකල්පය පෝෂණය කිරීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ දේශපාලනයට ගැටුම් සමථකරණ ක්‍රමවේද අන්තර්ග්‍රහණය කිරීම සඳහා උද්ඝෝෂණය කිරීමත් ය.

ගැටුම් සමථකරණය හැරුණු විට, බලය බෙදා හැරීම, මානව හිමිකම්, මාධ්‍ය නිදහස, මැතිවරණ නිරීක්ෂණය, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ සංක්‍රාන්තික යුක්තිය ආදිය සම්බන්ධයෙන් කාලයට වඩා බොහෝ ඉදිරියට ගිය - ප්‍රජාතන්ත්‍රවාදී අදහස්, වටිනාකම් සහ ආකෘති විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දියුණු කරනු ලැබී ය. පසුගිය වසර විසිපහක කාලය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ, තම සංවිධානය කළ ප්‍රගතිශීලී කාර්යභාරය පිළිබඳව, ආඩම්බරයෙන් සහ ජයග්‍රාහී හැඟීමකින් යුතුව ආපසු හැරී බැලීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට අද හැකි බව මම විශ්වාස කරමි.

ඕනෑ ම ස්වාධීන දේශපාලන සංවිධානයක් ක්‍රියා කරන ආකාරයට, ඕනෑ ම අවස්ථාවක ඕනෑ ම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තමන්ගේ දේශපාලන ස්ථාවරය අනුව දේශපාලන ආයතනයක් සමග හෝ එයට එරෙහිව හෝ ක්‍රියා කිරීමේ ස්වාධීනත්වය සහ හැකියාව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුව තිබිණි. මා දේශපාලනයේ නියුතුව සිටි කාලය තුළ, මා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග එකතුව කටයුතු කළ බොහෝ අවස්ථා තිබුණා මෙන් ම එජාප ආණ්ඩුවට එරෙහිව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නීතිමය පියවර ගත් අවස්ථා ගණනාවක් ද වෙයි. සහයෝගිතාව පැවති ක්ෂේත්‍රවලට, 2001 සාම ක්‍රියාවලිය, මාධ්‍ය නිදහස, තොරතුරු දැන ගැනීමේ පනත, සාපරාධී අපහාස නීතිය ඉවත් කිරීම, ස්වාධීන කොමිසන් සභා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය, අතුරුදන්වූවන්ගේ ඥාතීන්ට වන්දි ගෙවීම, ආදිය වෙයි. ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවට, විශේෂයෙන් මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වටිනා සේවයක් ලබා දුන්නේ ය. එම උත්සාහයන්හි දී, ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුගේ අත්‍යවශ්‍ය වූ දායකත්වය ගැන මෙන් ම ඔහුගේ උද්‍යෝගිමත් දේශපාලන තීක්ෂණ බුද්ධිය පිළිබඳව සඳහන් කිරීම සහ අගය කිරීම මා කළ යුතු ය.

"ප්‍රංශ විප්ලවය සමයේ ඔබ කුමක් කළේ දැ"යි, 18 වැනි සියවසේ ප්‍රධාන දේශපාලන චින්තකයකු වූ අබේ සෙයියෙස් *(Abbe Sieyes)* ගෙන් විමසූ විට ඔහුගේ පිළිතුර වූයේ "මම බේරිලා හිටියා" යන්න යි. ඉතා ම දුෂ්කර කාලයක විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බේරී සිටීමට වැඩි දෙයක් කළේ ය. ඇත්තෙන් ම, අප ආදරයෙන් රැක බලා ගන්නා දේශපාලන සහ සිවිල් නිදහස ආරක්ෂා කරන ආයතන ශක්තිමත් කිරීමේ ජීවය වූවෝ ඔවුහු ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මගේ උණුසුම් සුබපැතුම් පිරිනමන අතර ඉදිරි වසරවල දී, ඔවුන් තවත් ජයග්‍රහණ රාශියක් සමරනු ඇති බවට මට කිසිදු සැකයක් නැත.

---

**රනිල් වික්‍රමසිංහ**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු දස වැනි අගමැතිවරයාය. එක්සත් ජාතික පක්ෂයේ නායකයා වන අතර වත්මන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකි.



# ඉටු කළ මෙහෙවර විශිෂ්ටයි

**එම්.ඒ. සුමන්තිරන්**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රටට කළ සියවස් කාලක ආදර්ශවත් සහ අද්විතීය සේවය සමරන අවස්ථාවේ සුබ පැතුම් පණිවිඩයක් එවීමට සහ සුබ පැතුම් එක් කිරීමට ලැබීම ගැන මම අතිශයින් සතුටු වෙමි. මෙම 25 වසර පුරා ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග කිට්ටුවෙන් සම්බන්ධ වී සිටීම ගැන මම විශේෂයෙන් සතුටු වෙමි.

සරා (ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු) මට මුලින් ම හමු වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ සෙප්රා (*CEPRA*) කාර්යාලයේ දී රොහාන් එදිරිසිංහ මහතා සමග ය. (සෙප්රා (*CEPRA*) යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පූර්වගාමී සංවිධානය යි). 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආරම්භ කරන විට, පර්යේෂණ, උද්දේශන, සහ මහජන ළැදියා නඩු මෙවලම් ලෙස යොදාගෙන ප්‍රතිපත්ති සහ ආණ්ඩුකරණ ප්‍රශ්න ගැන ක්‍රියාකරන මේ ආකාරයේ වෙනත් ආයතනයක් ශ්‍රී ලංකාවේ නොතිබිණි. ඇත්තෙන් ම, වසර 25කට පසුව අදටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සමාන්තර වෙනත් ආයතනයක් නැත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග මගේ සම්බන්ධය ප්‍රධාන වශයෙන් පැවතියේ ඔවුන්ගේ නඩු කටයුතු උත්සාහයන්හි දී ය. මගේ වෘත්තීය ජීවිතයේ මුල් කාලයේ දී ම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මා ඔවුන්ගේ නීතිඥයකු ලෙස යොදා ගත්තේ තවත් නීතිඥයකු සමග ය. මහජන ළැදියා නඩු කටයුතු සම්බන්ධ මගේ මැදිහත් වීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කටයුතු සමග එකට බැඳී පැවති බව කිවහොත් එය අතිශයෝක්තියක් නොවනු ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ජයග්‍රහණය කළ සුවිශේෂී සටන් රාශියක් ඇති අතර ඉන් ගණනාවක ඔවුන්ගේ නීතිඥයා වීමේ වරප්‍රසාදය මට හිමි වී ය. මෙම ඉහළින් සටහන් වන සිද්ධීන් අතර කැපී

පෙනෙන සිදුවීමක් වන්නේ එවකට ආරක්ෂක ලේකම් ගොඨාභය රාජපක්ෂ මහතාගේ නියෝග මත, කොළඹ දෙමළ ජනයා බලහත්කාරයෙන් ඉවත් කිරීම නැවත්වීමට, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ සරා 2007 ජුනි මාසයේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම යි. ඉවත්කිරීම්වලින් පැය ගණනක් ඇතුළත ගොනු කළ මෙම පෙත්සමේ දී නීතිඥ මොහාන් බාලේන්ද්‍ර මහතා විසින් සාක්ෂි ලෙස ඉදිරිපත් කරන ලද්දේ පුවත්පත් වාර්තා පමණකි. පෙත්සම ගොනු කළ දිනයේ ම විවෘත අධිකරණයේ මා ඒ වෙනුවෙන් කරුණු දැක්වූ අතර ශ්‍රේෂ්ඨාධිකරණය ඓතිහාසික අතුරු නියෝගයක් දෙමින් නීති විරෝධී ඉවත් කිරීම් වහා ම අත් හිටුවීමට නියෝග කළ අතර උතුරු නැගෙනහිර ප්‍රදේශවලට බස් රථ මගින් රැගෙන ගිය අය ආපසු රැගෙන ඒමටත් බලධාරීන්ට නියෝග කළේ ය. ආණ්ඩුවේ මෙම ක්‍රියාවට පාර්ලිමේන්තුවේ දී සමාව ඉල්ලීමට එවකට අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මහතා පෙළඹවීමට හේතු වූයේ එය යි. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට සහ පවත්වාගෙන යෑමට දැනෙන බලපෑමක් කරමින් සහ දේශපාලන වගවීම වර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ නීතියේ කොටසක් බවට පත් වූ තවත් විශිෂ්ට ජයග්‍රහණ රාශියක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතු ය.

මහජන ළැදියා නඩු කටයුතු හැරුණු විට වෙනත් විවිධ මාර්ග මගින් රටේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ ආණ්ඩුකරණයට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශිෂ්ට සේවයක් කර ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ බොහෝ ප්‍රකාශන මගින් ද මහජන දැනුම පෝෂණය කොට තිබේ. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාවේ දෙමළ ජාතික ප්‍රශ්නය ගැන ලියවුණු සියලු වැදගත් ලේඛනවල එකතුවක් වන “ශ්‍රී ලංකාවේ බලය බෙදීම, 1926 සිට 2008 දක්වා ව්‍යවස්ථාමය සහ දේශපාලන ලේඛන” ප්‍රකාශනය දේශපාලන විසඳුමක් සෙවීමේ දී අතිමහත් වටිනාකමකින් යුක්ත ය.

රටේ ජාතික ජීවිතයට දිගට ම දායකත්වය ලබා දීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මම සියලු සුබ පැතුම් එක් කරමි.

---

**එම්.ඒ සුමන්තිරන්**
වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. මානව අයිතිවාසිකම් සහ ව්‍යවස්ථා නීතිය පිළිබඳ ප්‍රමුඛ පෙළේ නීතිඥවරයෙකි.

# ‘සියලු දෙනාට යුක්තිය’ සඳහා අඛණ්ඩ ලුහුබැඳීම



රාවුෆ් හකීම්

"නිදහස සඳහා පහසු මාවතක් නැති බව අපි තේරුම් ගෙන ඇත්තෙමු. අප කවුරුන් හෝ තනිව ම ක්‍රියා කිරීමෙන් සාර්ථකත්වය ලබා ගත නොහැකි බව අපි හොඳින් දනිමු. එබැවින් ජාතික සංහිඳියාව සඳහා, ජාතිය ගොඩනැගීම සඳහා, නව ලෝකයක් බිහිකිරීම සඳහා එක්සත් ජනතාවක් ලෙස අපි එක්ව ක්‍රියා කළ යුත්තෙමු." - නෙල්සන් මැන්ඩෙලා

නෙල්සන් මැන්ඩෙලාගේ පෙර කී ප්‍රකාශය මගින් පෙන්වා දෙන මතවාදය වන්නේ, අනවරත අරගලයක් අවශ්‍ය වන නිසා, නිදහස පහසුවෙන් සාක්ෂාත් කරගත නොහැකි බව යි. පසුගිය වසර 25කට වැඩි කලක් තිස්සේ හඬක් නැති ජනයාගේ හඬ ලෙස අඛණ්ඩව සේවය කරමින් ‘සියලු දෙනාට යුක්තිය’ ලුහුබැඳීමේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වැඩෙන ජයග්‍රහණ එමගින් හොඳින් විස්තර කෙරෙයි.

මානව හිමිකම් සඳහා සමස්ත ප්‍රමුඛතාව හිමි වන නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී ජාතියක් සඳහා වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මහා ගුණය සහ දර්ශනය යටතේ, අයිතීන් සහ නිදහස සඳහා ශ්‍රී ලංකාවේ සියලු ආකාරයේ මානව අරගලවලට ආරක්ෂාව හිමි වී ය. මානව වර්ගයා වෙනුවෙන් මෙම යටින් දිවෙන විශ්වාසයන්ගේ පූර්වගාමීන් වෙමින් ඉන් ඇති වන ප්‍රතිවිපාකයන්ට මුහුණ දීමට, යම් පිරිසක් එය ඔවුන්ගේ ජීවන දැක්ම සහ අරමුණ බවට පත්කර ගනිති. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, එහි නායකයින් සහ කණ්ඩායම ද ඔප්පු කර ඇත්තේ එය යි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තමන්ගේ ඉතාමත් තෘප්තිමත් 25 වසර සමරන මේ අවස්ථාවේ, එම ආයතනය මත තම අධිෂ්ඨානශීලී මුද්‍රාව තැබූ එහි විධායක අධ්‍යක්ෂ, මගේ මුරණ්ඩු මිත්‍ර

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට, ඔහුව අගය කිරීමේ දී කිසි සේත් ම නොපැකිලෙන්නෙකු ලෙස මාගේ ගැඹුරු ප්‍රණාමය සහ සුබ පැතුම් පිළිග ැන්වීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ඔවුන්ගේ කැපී පෙනෙන සහ වර්ධනය වන ජයග්‍රහණවලට, ධෛර්යයට සහ කැප වීමට, භවානි ෆොන්සේකා මෙනෙවියට සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වර්තමාන සහ අතීත සියලු සගයින්ටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කීර්තිමත් අධ්‍යක්ෂ මණ්ඩලයටත් සුබ පැතීමට කැමැත්තෙමි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ඔවුන්ගේ සුවිශේෂී බුද්ධිමය දායකත්වයට සහ ප්‍රතිරාව නංවන උරුමයට එහි කීර්තිමත් නීති ආචාර්ය රොහාන් එදිරිසිංහට (ආරම්භක අධ්‍යක්ෂවරයකු සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නීති අංශයේ ප්‍රධානී) සහ ආචාර්ය අසංග වැලිකලට ද මගේ උණුසුම් සුබ පැතුම් හිමි වෙයි. වැඩ කටයුතුවල සථිරභාවය සහ ස්ථාවරභාවය සම්බන්ධයෙන් විශේෂයෙන් මානව හිමිකම් සඳහා ප්‍රමුඛතාව දීමේ ප්‍රතිපාදන සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් මා පෞද්ගලිකව ආශ්වාදය ලැබූ බව කිව යුතු නැත.

අද පවතින බහුතරවාදී දේශපාලනය, බහුතරයේ පමණක් ඡන්දය දිනා ගැනීමට කපටි උපක්‍රම ක්‍රියාවට නගන විට, ජනවාර්ගික හෝ වෙනත් ඕනෑ ම සුළුතරයකට දැනෙන්නේ විශ්මය, වික්ෂිප්තබව සහ කරදරකාරී හැඟීම් ය. එබඳු අවස්ථාවල, පොදු ජනයාගේ පැත්ත ගැනීමට සහ කිසිදු විශේෂ ජන වර්ගයක්, කිසිදු විශේෂ පන්තියක් හෝ උනන්දු කණ්ඩායමක් නියෝජනය නොකරමින් යුක්තිය වෙනුවෙන් පෙනී සිටීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එතන වී ය. යුක්තිය, යහ පාලනය, සාමය සහ සංහිඳියාව හඹා යෑමේ දී එය කීවේ “ජනතාව” නියෝජනය කරන බව පමණකි.

මානව හිමිකම් ආරක්ෂකයකු ලෙස එහි කටයුතු තුළ සිවිල් සමාජය ශක්තිමත් කිරීමට සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ උද්දේශන මගින් බොහෝ දෙනාට ප්‍රතිලාභ අත් වී ය. වසර ගණනාවක් තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කළ වැඩ කටයුතුවල ඉහළ ම ප්‍රතිඵල, උද්දේශන සම්බන්ධ වැඩ කටයුතු ගණනාවකින් ද, යුක්තිය, යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය හඹා යෑම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අධිකරණයට ඉදිරිපත් කළ මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් නඩු මගින් ද, පෙන්නුම් කෙරෙයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යුක්තිය, මානව හිමිකම්, යහපාලනය, සහ ප්‍රජාතන්ත්‍රවාදය හඹා යාමට කැප වී පෙනී සිටියා සේ ම, අර්ථවත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් සාක්ෂාත් කර ගැනීමේ හරය වන්නේ සාමය සහ සංහිඳියාව බව දිගට ම විශ්වාස කළේ ය යන්න ප්‍රකාශ කිරීමට ලැබීම මට ඉතා සතුටට කාරණයකි.

මෙම ක්‍රියාමාර්ග ධනාත්මක ලෙස හඹා ගියහොත් එය, සියලු පුරවැසියන්ට සමාන ලෙස තම වගකීම් ඉටු කිරීමටත්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති පරිදි මානව හිමිකම් සහ ආගමික නිදහස පවත්වා ගැනීමටත්, ශ්‍රී ලංකා ආණ්ඩුවට දැනෙන මතක් කිරීමක් ලෙස ක්‍රියා කරනු ඇති බවට සැකයක් නැති බව අපි විශ්වාස කරමු. සියලු ප්‍රජාවන්ගේ වැඩි දියුණුව වෙනුවෙන් තවත් වසර බොහෝ ගණනක සාර්ථකත්වය සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට සුබ පතමි.

---

**රවුෆ් හකීම්**

මුස්ලිම් කොංග්‍රයේ නායකයා වන අතර වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. හිටපු අමාත්‍යවරයෙකි. නීතිඥයෙකි.

# එකඟ වෙමින් සහ නොවෙමින් ආ ගමනක්



**එරාන් වික්‍රමරත්න**

වසර 25 කට පෙර විකල්ප ප්‍රතිපති කේන්ද්‍රය පිහිටුවන ලද්දේ, ගැටුම් සමථකරණයට සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට, විකල්ප ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ ක්‍රියාශීලී සහ මැදිහත්වීම්වාදී ආයතනයක් වශයෙනි. මෙම වසර 25 තුළ දී, දිග්ගැසුණු යුද්ධයක් සහ ශක්තිමත් සිවිල් සමාජයක පැවැත්ම අවශ්‍ය වූ, මතභේද පැවති සහ ඒවාට සීමා නොවූ, කාල වකවානු ගණනාවක් ශ්‍රී ලංකාවට අත්දකින්නට ලැබිණි. ව්‍යවස්ථා සහ නීති ප්‍රතිසංස්කරණ, මානව හිමිකම් ආරක්ෂා කිරීම, උද්දේශන සහ පුරවැසි මාධ්‍ය යන ක්ෂේත්‍රවල, සිවිල් සමාජ අවකාශය තුළ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තීරණාත්මක කාර්යභාරයක් ස්ථාවර ලෙස ඉටු කරන්නේ මෙම තත්ත්වය යටතේ ය. මහජන ළැදියා නීති ක්‍රියාමාර්ග, ප්‍රචාරණ ඇතුළු ධාරිතා පුළුල් පරාසයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රැස් කරගෙන ඇති අතර එමගින් ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති කතිකාවේ සිට තෘණ මූල මට්ටමේ සංවිධාන දක්වා බලමුළු ගැන්වීම සහ බලපෑමට ලක් කිරීම සිදු කොට තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මෙහෙයුමේ ඉතා වැදගත් අවස්ථාවක් වන්නේ, 2018 ව්‍යවස්ථා අර්බුදය අවස්ථාවේ අධිකරණ ක්‍රියාවලියේ එය ඉටු කළ කාර්යභාරය යි. එතැන් සිට, අසාධාරණයන්ට එරෙහිව පෙත්සම් ඉදිරිපත් කිරීමේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දැඩි ලෙස ආරක්ෂා කිරීමේ ආකාරයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම මැදිහත්වීම් දිගට ම කර ගෙන යන්නේ, උද්දේශන, ක්‍රියාවාදී සහ පුරවැසි මාධ්‍යවේදී කාර්යයන් ද දිගට ම කරගෙන යමින් ය.

ප්‍රතිපත්ති සහ ඒවායේ විවාදාත්මක සන්දර්භ පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කලින් කලට, මහජනයාට සහ නීති සම්පාදකයින්ට පැහැදිලි කළේ ය. විශේෂයෙන් ම, තමන්ගේ සමාජ ගිවිසුම සහ සිවිල් වගකීම් පිළිබඳ හැඟීම නැවත පණ ගන්වන බව පෙනෙන්නට තිබෙන තරුණයන් ඇතුළු සාමාන්‍ය ජනයා සමග ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති කතිකාව ප්‍රාදේශීයකරණයට එහි දායකත්වය නිසා, මෙම උත්සාහයන් ප්‍රශංසා කටයුතු වෙයි. මා වැනි නීති සම්පාදකයින්ට මෙම දායකත්වය විශේෂයෙන් අදාළ වී ය. අප හැම විට ම එකඟ විය යුතු නැති වුව ද, විද්‍යාත්මක විමර්ශනයක දී බොහෝ මූලාශ්‍ර සහ ඉදිරි දර්ශන අපේක්ෂා කරයි.

ප්‍රජාතන්ත්‍රවාදී මහජන කතිකාව ප්‍රතික්ෂේප කිරීමට උත්සාහ දරන බලවේග සමග, ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහ ඒ සඳහා වූ ආයතන වැඩි වැඩියෙන් තර්ජනයට ලක්වන සන්දර්භයක් තුළ, අපව නිර්වචනය කරන වටිනාකම් ආරක්ෂා කර ගැනීමේ අපගේ සටනේ දී, අප ද මංසන්ධියක සිටින බව අපට දැනෙයි. එබඳු අවස්ථාවල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැනි සිවිල් සමාජ සංවිධාන සතු කාර්යභාරය අති විශාල සහ අත්‍යවශ්‍ය ය. 25 වැනි සංවත්සරයේ දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිටුපස සිටි සියලුදෙනාට සුබ පැතීමට එය අවස්ථාවක් කරගන්නා අතර ම, ඉදිරියේ ඇති කාර්යභාරය සඳහා මගේ ඉහළ ම සුබපැතුම් පිරිනැමීමට මම කැමැත්තෙමි. එකඟ වීමට සහ විරුද්ධ වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් සහතික කිරීම සඳහා, එකඟ වෙමින් සහ විරුද්ධ වෙමින් අපගේ සංවාදය දිගට ම කරගෙන යමු.

---

**එරාන් වික්‍රමරත්න**

හිටපු අමාත්‍යවරයෙකි. වත්මන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකි.


# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවරන ලද නඩු / මූලික අයිතිවාසිකම් පෙත්සම්

- යෝජිත මුදල් පනත් කෙටුම්පතට එරෙහිව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කළ පෙත්සම - (SC SD 28/2021)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනය සම්බන්ධයෙන් වන නඩුකරය (SC SD 03/2020)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - අටවන පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සහ නව වන පාර්ලිමේන්තුව සඳහා මැතිවරණය වර්ෂ 2020 ජූනි මස 20 දින පැවැත්වීමට ගත් තීරණය අභියෝගයට ලක් කරමින් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් අයදුම්පත
- සුනිල් රත්නායකට සමාව ලබා දීමට ගත් තීරණය අභියෝගයට ලක් කරමින් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් අයදුම්පත
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් වන චෝදනා විමර්ශනය කිරීමට පත් කළ පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දුන් සමහර බලතල අභියෝගයට ලක් කරමින් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් අයදුම්පත (SC FR 32/2020)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනය සම්බන්ධයෙන් වන නඩුව (SC FR 199/2019)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අභියෝගයට ලක් කරමින් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් අයදුම්පත (SC FR 353/2018)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - මංගල සමරවීර සහ තවත් දෙදෙනකු (SC FR 34/2018) භවානි ෆොන්සේකා සහ තවත් හතර දෙනකු (SC FR 33/2018)
- උදය ප්‍රභාත් ගම්මන්පිල එදිරිව නීතිපති (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මැදිහත්කාර පෙත්සම්කරුවකු වශයෙන්)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ නඩුකරය (SC SD 24/2017)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව කබීර් හෂීම් සහ තවත් අය - ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත No. 54/2016
- සංජීව සුදත් පෙරේරා සහ තවත් දෙදෙනකු එදිරිව ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන (SC FR 67/2016) ජාතික ගීයෙහි දෙමළ භාෂා අනුවාදය සම්බන්ධයෙන් වන මූලික අයිතිවාසිකම් අයදුම්පත
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - දණ්ඩ නීති සංග්‍රහයෙහි 291 වගන්තිය පිළිබඳ සංශෝධනය (SC SD 28/2015)

- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - (SC SD 7/2017)
- වර්ෂ 2013 නොවැම්බර් 4 වන දින විභාගයට නියමිතව තිබූ විසර්ජන පනත් කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කළ පෙත්සම
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (විසර්ජන පනත් කෙටුම්පත) - (SC SD 19/2013)
- අරුණාසලම් කුණබාලසිංහම් සහ තවත් 1473 දෙනකු එදිරිව ඒ. සිවස්වාමි සහ තවත් දෙදෙනකු - අභියාචනාධිකරණය (රිට්) 125/2013
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - (SC SD 3/2013)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ තවත් අයෙකු එදිරිව ඩී. එම්. ජයරත්න සහ වෙනත් අය - සිරිසේන (SC FR 23/2013)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (විසර්ජන පනත් කෙටුම්පත) - (SC SD 15/2012)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (දිවිනැගුම පනත් කෙටුම්පත) - (SC SD 6/2012)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (දිවිනැගුම පනත් කෙටුම්පත (2)) - (SC SD 15/2012)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (දිවිනැගුම පනත් කෙටුම්පත (1)) - (SC SD 3/2012)
- විනයාගමූර්ති කොහිලම්පාල් එදිරිව ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ (SC FR 309/2012) මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සහාය ලබා දීම
- කේ කේ පී. ආර්. අමරසිංහ එදිරිව නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය - අභියාචනාධිකරණය (රිට්) 156/2012 - රිට් අයදුම්පතක් ගොනු කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සහාය ලබා දීම
- අබ්දුල් මජීඩ් අබ්දුල් ෆරීඩ් එදිරිව චන්ද්‍රප්‍රපාලිනී ක්‍රිෂ්ණගෝපාල් සහ වෙනත් අය - අභියාචනාධිකරණය (රිට්) 135/2012 - රිට් අයදුම්පතක් ගොනු කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සහාය ලබා දීම
- ජෝවිතා අරුලනාන්තම් එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය (SC FR 40/2012) මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සහය ලබාදීම
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (නගර හා රාජ්‍ය සැලසුම් පනත් කෙටුම්පත (1)) - (SC SD 3/2011)
- එම්. ඒ. සුමන්තිරම් එදිරිව ආර්. පී. ආර්. රාජපක්ෂ සහ වෙනත් අය (ඉඩම් චක්‍රලේඛය පිළිබඳ පෙත්සම) (SC FR 494/2011) සහ (රිට්) 620/2011
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව ගෝඨාභය රාජපක්ෂ සහ වෙනත් අය - (SC FR 453/2011)
- එච්. එම්. එම්. සම්පත් කුමාර එදිරිව කටුනායක පොලිස් ස්ථානාධිපති - 265/2011 සහ අනෙකුත් නිදහස් වෙළඳ කලාප නඩු - SC FR 266 267 268 269 270 271 272 273 274 346 347 348 / 2011
- ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු එදිරිව මහින්ද දේශප්‍රිය (SC FR 251/2011)
- ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු එදිරිව මහින්ද දේශප්‍රිය (SC FR 161/2011)


- මරියතාස් බැසිල්රාජ් එදිරිව ගෝඨාභය රාජපක්ෂ SC FR 387/2011 – සහ නවන්තුරෙයි අනෙකුත් මූලික අයිතිවාසිකම් අයදුම්පත් - SC FR 387 388 389 391 396 395 407 408 399 397 398 402 405 406 400 401 384 385 392 393 414/2011
- මාවෙයි සෝමසුන්දරම් සේනාතිරාජා එදිරිව ගෝඨාභය රාජපක්ෂ (උතුරේ ලියාපදිංචි වීම්) (SC FR 73/2011)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (පළාත් පාලන සංශෝධන පනත් කෙටුම්පතට අදාළ පෙත්සම් - (SC SD 10/2010)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - (SC SD 05/2010)
- ඇන්ටන් ජූඩ් එදිරිව ඕපන්තෙයි කඳවුරේ ස්ථානභාර නිලධාරී (SC FR 389/10)
- ගුණරතිනම් මනිවානම් එදිරිව ඩී. එම්. ජයරත්න සහ වෙනත් අය (SCFR අයදුම්පත් අංකය 393/2010)
- අමිතා ප්‍රියන්ති එදිරිව පොලිස්පති (SC FR 155/10)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව මැතිවරණ කොමසාරිස් - (SC FR 111/10)
- අලගියවන්න එදිරිව රූපවාහිනී (SC FR 73/10)
- ලංකා ගුරු සංගමය එදිරිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව (SC FR 367/09)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව ආරක්ෂක අමාත්‍ය - (SC FR 457/09)
- ජයලත් ජයවර්ධන එදිරිව නීතිපති - (SC FR 396/09)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - (SC FR 578/2008)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව දයානන්ද දිසානායක - (SC FR 378/08)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - (SC Ref: No.1/2008)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍ය (478/2008)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් (SC FR 351/2008)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති - (SC FR 359/2008)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව ආරක්ෂක අමාත්‍ය - (SC FR 424/07)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව ආරක්ෂක අමාත්‍ය - (218/07)
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව පොලිස්පති - (SCFR 177/2007)
- කන්දස්වාමි රාසලිංගම් එදිරිව පොලිස්පති - (219/2007)
- ගුණාමුත්තු එදිරිව නීතිපති

# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශන අතුරෙන්......






















































VALUES AND ATTITUDES SURVEY ON
70 YEARS OF INDEPENDENCE
IN SRI LANKA
TOPLINE REPORT
1948 70 2018
FEBRUARY 2019
CENTRE FOR POLICY ALTERNATIVES – SOCIAL INDICATOR



PEACE CONFIDENCE INDEX (PCI)
2001 - 2004
SOCIAL INDICATOR
CENTRE FOR POLICY ALTERNATIVES


PEACE CONFIDENCE INDEX (PCI)
2005 - 2008
SOCIAL INDICATOR
CENTRE FOR POLICY ALTERNATIVES



SURVEY ON DEMOCRACY IN
POST-WAR SRI LANKA
TOP LINE REPORT | JULY 2011
SOCIAL INDICATOR – CENTRE FOR POLICY ALTERNATIVES


LIVING IT DOWN: LIFE AFTER
RELOCATION IN COLOMBO'S
HIGH RISES
A SURVEY OF HOUSEHOLDS RELOCATED BY
THE URBAN REGENERATION PROJECT
IROMI PERERA
CENTRE FOR POLICY ALTERNATIVES
NOVEMBER 2016



POTENTIAL FOR PEACE
SOCIAL INDICATOR - CENTRE FOR POLICY ALTERNATIVES
2004



2020
THE NEED
FOR PRISON REFORMS
IN SRI LANKA
CENTRE FOR POLICY ALTERNATIVES
JUNE 2020



SURVEY ON DEMOCRACY IN
POST-WAR SRI LANKA
TOP LINE REPORT | JULY 2011
SOCIAL INDICATOR – CENTRE FOR POLICY ALTERNATIVES



Less Than Six Months
Less than One Year
In 1-2 Years
2-5 Years
More than 5 years
No Answer
Don't Know/Not Sure
An Opinion Survey
on the
LLRC Report
Based on Views of some Witnesses of the Lessons Learnt
and Reconciliation Commission and the
Participants in Awareness Workshops


POLITICAL SOLUTIONS
MILITARY SOLUTIONS
KARUNA FACTOR
INDIA & SRI LANKA
THE BUDGET
TAMILNADU
13TH AMENDMENT
EASTERN PROVINCE
PEACE CONFIDENCE INDEX
NOVEMBER 2008



CONSUMPTION & PERCEPTIONS OF
MAINSTREAM & SOCIAL MEDIA
IN THE WESTERN PROVINCE
TOP LINE REPORT
SOCIAL INDICATOR
CENTRE FOR POLICY ALTERNATIVES
JANUARY 2016





சமாதானம் பற்றிய யாழ்ப்பாணத்தின்
தோற்றப்பாடு
சோஷல் இன்டிகேட்டர்
ஒக்டோபர் 2002




Assessment of Eastern
Province Recovery
The Public Perspective
2010
SOCIAL INDICATOR-CENTRE FOR POLICY ALTERNATIVES




Broadening gender:
Why masculinities
matter
Attitudes, practices and gender-based violence in four districts in Sri Lanka
care
partners for prevention







ඡන්දය දෙන ස්ථානයට
வாக்கெடுப்பு நிலையத்துக்கு
TO THE POLLING STATION
PRESIDENTIAL ELECTION 2015
PRE ELECTION OPINION POLL
TOP LINE REPORT
SOCIAL INDICATOR - CENTRE FOR POLICY ALTERNATIVES
DECEMBER 2014


පුරවැසි
කතිකාවතකට
පෙරවදනක්
ලයනල් ගුරුගේ



LAND IN THE EASTERN PROVINCE
POLITICS, POLICY AND CONFLICT
Bhavani Fonseka and Mirak Raheem
Centre for Policy Alternatives
May 2010

Reporting on Human Rights in Sri Lanka
A handbook for media professionals

උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ නිර්දේශ
(LLRC)
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය


இலங்கையில் தமிழ் மொழி உரிமைகள்
CPA

පූර්ව ජනාධිපතිවරණය - 2010 ජනවාරි
LIVING IT DOWN: LIFE AFTER RELOCATION IN COLOMBO'S HIGH RISES
A SURVEY OF HOUSEHOLDS RELOCATED BY THE URBAN REGENERATION PROJECT
IROMI PERERA
CENTRE FOR POLICY ALTERNATIVES
NOVEMBER 2016

භාෂාව සහ මනුෂ්‍යත්වය
එස්. ජී. පුංචිහේවා
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

DEMOCRACY IN POST-WAR SRI LANKA
TOP LINE REPORT
SOCIAL INDICATOR - CENTRE FOR POLICY ALTERNATIVES
OCTOBER 2014

LIVING IT DOWN: LIFE AFTER RELOCATION IN COLOMBO'S HIGH RISES
A SURVEY OF HOUSEHOLDS RELOCATED BY THE URBAN REGENERATION PROJECT
IROMI PERERA
CENTRE FOR POLICY ALTERNATIVES
NOVEMBER 2016

Accounting
Procedures for Pradeshiya Sabha
Governance Programme
Centre for Policy Alternatives
Colombo 07
USAID
FROM THE AMERICAN PEOPLE
CPA

විභාෂා

THE NINETEENTH AMENDMENT TO THE CONSTITUTION
CONTENT AND CONTEXT
EDITED BY ASANGA WELIKALA

THE EIGHTEENTH AMENDMENT TO THE CONSTITUTION
SUBSTANCE AND PROCESS
EDITED BY ROHAN EDRISINHA AND ARUNI JAYAKODY
CENTRE FOR POLICY ALTERNATIVES

A NEW DEVOLUTION SETTLEMENT FOR SRI LANKA
August 2016
Proceedings and Outcomes, Conference of Provincial Councils
Edited by Asanga Welikala
Centre for Policy Alternatives www.cpalanka.org

A Brief Guide on the Draft Legislation to Establish an Office on Missing Persons
Centre for Policy Alternatives
July 2016

TRANSITIONAL JUSTICE IN SRI LANKA
Moving Beyond Promises
Edited By Bhavani Fonseka


Reforming Sri Lankan Presidentialism
Provenance, Problems and Prospects



Victim-Centred Transitional Justice in Sri Lanka: What Does It Really Mean?
DISCUSSION PAPER
BHAVANI FONSEKA AND JOANNA NAPLES-MITCHELL
CENTRE FOR POLICY ALTERNATIVES – SOCIAL INDICATOR



නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක
ජනතා සිහිනය සහ
යථාර්ථය


තොරතුරු
අයිතිවාසිකම පිළිබඳ
තොරතුරු
CPA
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි



VOTE
ඡන්දය
ඔබේ බලයයි !



20 YEARS
CPA
1996-2016
THE IDEA OF CONSTITUTIONAL INCREMENTALISM
CPA Working Papers on Constitutional Reform No.14, January 2017
Asanga Welikala



The Need for Accountability in Sri Lanka's Criminal Justice System
A Glance at Seven Emblematic Cases
Centre for Policy Alternatives
March 2019



FORCED EVICTIONS IN COLOMBO
THE UGLY PRICE OF BEAUTIFICATION
CENTRE FOR POLICY ALTERNATIVES
APRIL 2014


CPA
Centre for Policy Alternatives
Brief Guide II
Structures to Deal with COVID-19 in Sri Lanka:
A Brief Comment on the Presidential Task Force
April 2020



CORRIDORS OF POWER: DRAWING AND MODELLING SRI LANKA'S TRYST WITH DEMOCRACY



An Opinion Poll on Peace
Peace Confidence Index (PCI)
Top-Line Results
May 2006
Social Indicator
Also In This Wave ...


ශ්‍රී ලංකාවේ
පෙඩරල් අදහසෙහි
ගමන් මග
(1926-2005)


ශ්‍රී ලංකාවේ
ජනවාර්ගික ගැටලුව සහ
විසඳුම්



சமாதான நோக்கு
2020
பொதுத் தேர்தலும்
அதன் பின்னரும்...









An Analysis of the Local Government Budget Process in Sri Lanka
Ben Fowler
Sriyanie Wijesundara
Manjula Gajanayake
Governance Programme
Centre for Policy Alternatives
Colombo 07
USAID
SOCIAL INDICATOR-CENTRE FOR POLICY ALTERNATIVES


ගැටුම් සමථනය
සහ
බුදුදහම
ලයනල් ගුරුගේ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය






ක්‍රිෂාන්ති කුමාරස්වාමි ඝාතන නඩුව සහ
ඇඹිලිපිටිය සිසු ඝාතන නඩුවෙන් පසු
මානව අයිතිවාසිකම්
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය


PUBLIC OPINION POLL
ON SRI LANKA'S CONSTITUTIONAL REFORM
MAY 2019
CENTRE FOR POLICY ALTERNATIVES - SOCIAL INDICATOR



C P A
HIV / AIDS in Sri Lanka
A Profile on Policy and Practice
July 2007

சமஷ்டி அரசுகள்
ஜேர்மனியின் சமஷ்டிச் சீர்திருத்தம்

Media Monitor

Speeches and Writings of Sir Ponnambalam Arunachalam
Introduced by H. Kumarasingham

The Sri Lankan Republic at 40: Reflections on Constitutional History, Theory and Practice
Edited by Asanga Welikala
Volume I

POWER-SHARING IN SRI LANKA
Constitutional and Political Documents
1926-2008
EDITORS:
ROHAN EDRISINHA
MARIO GOMEZ
V.T. THAMILMARAN
ASANGA WELIKALA

සංවේදී ජනමාධ්‍ය භාවිතාව

ධනය බලය මැතිවරණය සහ ඡන්දදායකයා

VOLUME 6
moot point
Legal Review 2002
Centre for Policy Alternatives


தகவல் அறியும் உரிமை மற்றும் ஊடகப் பயன்பாடு

கிழக்கு மாகாணத்தில் அதிகாரத்தைப் பகிர்தல்:

සාම ක්‍රියාවලිය පිළිබඳ
මත විමසුමක්

LAND AND PROPERTY RIGHTS OF INTERNALLY DISPLACED PERSONS
CENTRE FOR POLICY ALTERNATIVES
FEBRUARY 2003
PROJECT FUNDED BY NOVIB


Law
Human Rights
and
HIV/AIDS
A Guide
Centre for Policy Alternatives


විලාසම
விலாசம்
Vilasam





UNHRC


THE ORIGIN OF THE STATEMENT
PUNCHI



P. SARAVANAMUTTU
JEFFREY




Sunday Observer - 2011-03-13




ceylon-today-23-07-2015




Dinamina 2016-02-20




දිවි නැගුම පනත පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉදිරිපත් කළ ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සම ජයග්‍රහණයෙන් පසු මෙම මඩ පෝස්ටරය කිසියම් කණ්ඩායමක් විසින් ලංකාව පුරා අලවා තිබිණි.

25 YEARS
1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

ISBN 978-624-5914-11-1